අට්ඨ ක ථා චා ර්ය

අනුබුද්ධ බුද්ධඝොෂ මහාස්ථවිරවරප්‍රණීත

# විශුද්ධි මාර්ගය.

Sidhartha Men's Training School,
Balapitiya.

## ද්විතීය භාගය.

කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු

මහරජාණන් විසින් කරනලද

විස්තර පදාර්ථව්‍යාඛ්‍යානයෙන්

සමුපලක්ෂිතයි.

---

පෑලියගොඩ විද්‍යාලඞ්කාර මහාවිද්‍යාලයෙහි

උපාචාර්ය ධුරන්ධර

කඹුරුපිටියේ ධම්මරතන ස්ථවිරපාදයන්වහන්සේ

වි සි න්

ලේඛක දෝෂාපහරණයෙන් සකස්කරනලදී.

ජේ. ඩී. ප්‍රනාන්දුගේ
පොත්
වෙළඳ ශාලාව.
වෙල්ලවීථිය කොළඹ

---

කඹුරුපිටියේ

ඩී. සී. ඇස්. වික්‍රමරත්න මහතාණන්

වි සි න්

මහාබොධියන්ත්‍රාලයෙහි මුද්‍රාපිතයි.

---

ශ්‍රී: බු: ව: 2472.

ශ: ව: 1851.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

Sidhartha Men's ...
Balapitiya.

# කඳවුරු සිරිත

නම

# පරාක්‍රමබාහු දින චර්‍ය්‍යාව.

විශුද්ධිමාර්ගී සන්න කර්තෘවූ පණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණන්ගේ ජීවන චරිතය පිළිබඳව අප විසින් සම්පාදිත විස්තර වාක්‍යයක් මුද්‍රිත ප්‍රථම භාගයෙහි ප්‍රාරම්භ ලිපියක් වශයෙන් යොදනලදි. මේ මහරජතුමන්ගේ දින චරියාව දක්වන "කඳවුරු සිරිත" නම් පොතක් ලොන්ඩන් නුවර බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට අයත් මහා පුස්තකාලයේ තිබී මීට හවුරුදු කීපයකට ප්‍රථම එහිදී අපට දකින්ට ලැබී එයින් පිටපතක් ලියාගතිමු. අපේ වීර වික්‍රමාන්විත ප්‍රඥාසම්පන්න මහරජතුමකු දවස් පතා සවකීය කාලය ඒ ඒ කටයුත්තෙහි යෙදූ පිළිවෙළ දැනගැන්ම අතිශයින් ප්‍රයෝජනවත් හෙයින් මේ පොත ප්‍රමාණයෙන් කුඩාවුවත් අගනා කෘතියක් ලෙස සැලකිය හැකියි. එය කියවීම සිංහල ජාතියට අයත් කාටත් ප්‍රීතිජනක වියයුතු බැවින් පරාක්‍රමබාහු මහරජාණන් විසින් නිපදවනලද උසස් ග්‍රන්ථයක්වූ විශුද්ධිමාර්ගී සන්නයත් සමඟ මේ දිනචර්‍ය්‍යාව පළකිරීම යෝග්‍ය බැව් වැටහුණ හෙයින් එය මෙහි යෙදීමු.

තවද ප්‍රථම භාගයෙහි පළවූ චරිතාත්මක වාක්‍යයෙහි මේ මහරජතුමන්ට වීසිදෙවැන්නෙහි පැමිණි කායික ආබාධයක් ගැන තොරතුරු අලුත්නුවර දේවාලය සම්බන්ධ පුරාණ ලිපියකින් ගෙන දැක්වීමු. ඒ කරුණ පිළිබඳ මූලපාඨයම කඳවුරු සිරිත අවසානයෙහි බහාලීමු.

D. B. J

16-4-1929
කොළඹදීය.

# කඳවුරු සිරිත.

## නමොබුද්ධාය.

තුනුරුවන් පිහිටි මේ ශ්‍රී ලඞ්කාද්වීපයෙහි සකල නගරාඞ්ග සම්පත්තීන් සම්පූර්ණවූ කඳවුරු නුවර රාජ්‍යප්‍රාප්ත කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහරජ්ජුරුවන් වහන්සේ ශාස්ත්‍රක්‍රම නොවරදවා දවස් පතා පැවැති දිනචර්‍ය්‍යා ක්‍රමය නම්:—

පාන්වන්නට පළමු පස්පැයක් තබා ප්‍රබුද්ධවූ ශ්‍රී යහන් මැද පද්මාසනයෙන් වැඩහිඳ අනිත්‍යය දුඃඛය අනාත්මය යන ත්‍රිලක්‍ෂණ භාවනායෙන් යෙදී තුන්පැයක් පුරා යෙළ පැයක් සූත්‍ර බණ සිහිකැරූ වැඩහුන් කල්හි පුරෝහිත බ්‍රාහ්මණයන් විසින් එළවනලද කුශ තණ හා මන්ත්‍ර ජලයෙන් යුත් සකක් ගෙන ජයමඞ්ගල ඝෝෂායෙන් දකුම්දී සක අත් පහරවා මන්ත්‍ර බැණ දුටු සවපන විචාරා ඊට නිසි ශාන්ති විධි යොදා දෙරට බටකල මහ වෙදනාවෝ දැක ශරීරප්‍රකෘති විචාරා ඊට සුදුසු ප්‍රතික්‍රියා යොදති. අරුණෝදයෙහි ශරීර ශුද්ධි සපයා ස්නාන ශාලාවේදී දැහැටි කිස සපයා මහ දොරනාවන් වැඩූ ශුද්ධ සුගන්ධ ජලයෙන් මුව සුද්ධි සපයා නව අරහාදී බුදුගුණ සිහිකැරූ ජීවමාන බුදුන් දක්නට යන්නාක් මෙන් දළදා ගෙයි මතුමාලට වැඩ රන් බැඳි සවරි මුස්නෙන් ඇමදූ රුවන් දෙවු පුදා ස්නාන ආසන පුෂ්පාදි ෂොඩශොපචාරයෙන් පූජාකැරූ පෙරූ පිනිදිය පිඳු පිඳූ මලට ඉසූ භක්තිශ්‍රද්ධාතිශයෙන් ශ්‍රී දන්ත ධාතූන්වහන්සේට පසඟ පිහිටුවා වැඳැ සිල් සමාදන්වූ දාන ශීල භාවනාදි දශ පුණ්‍යක්‍රියා වස්තු පුරා පිරිත් පැන් ගෙනැ ගිතෙල් පාත්‍රයැ වත බලා එහි තෙල් මහණ බමුණන්ට දෙවා දෙවැනිවැ යට මාලට වැඩ දැස්වර[1] පෙති පිළිමවහන්සේ දැකැ රන් තෙලි ගෙනැ සිතියරු අත රන් උත්තේ ගලා ඇස් තබා බණ පොත් දැකැ බණ අසා ශාසනාභිවෘද්ධිය පිණිස සන්තොෂවැ වැඳපුදනු වන්ට පෙතිපිළිම දී පය්‍ර්‍යාප්ති ශාසනය වඩනා පිණිස බණ පුහුණු කරන තැනට පොත් දෙවා අභිමුඛයෙහි මණ්ඩපයට පැමිණ දළදාවසුන් ලාබත් පෝබත් ගිලන්බත් ආගන්තුකබත් ගමිකබත් මල් මැලි පසඟුල් සඳුන් බෙහෙත් සත් පෙරහන්කඩ කතුරුයටි දෙවා පෙරවි බමුණන් දුන් මන්ත්‍රාෂ්ටක ගෙනැ මුඛදන්ත තිලපාත්‍ර දානාදී කාලොචිත දන් දී ව්‍යාධිත[2] අයට බෙහෙත් පස දී ප්‍රතික්‍රියා කරවා ගර්භිණීන්ට දෙළු හා පිළී ගිතෙල් මිරිස් හා බාලයන්ට මධුරාහාරපාන හා වෘද්ධයන්ට අඳුන් තෙල් හා ගෙරින්ට කුසතණ හා සුනඛයන්ට කැඳිති හා කවුඩු කුරුකුහුඹුවන්ට ප්‍රණීතාහාර දෙවා මෙසේ කියනලද සුචරිතයෙන්

1. දැස්වර, දවස්වර.

2. ව්‍යාධිසත, ව්‍යධිඡ්ඡ.

තුන් පැයක් පුරා මේ අතුරේ නවගුණ පන්සියයක් (වර) පිරුවා රා හි භවනයට වැඩමකැරැ මහවෙදනාවන් හා මූලගිනාවන් දෙදෙනා විසින් එළවන ලද මේ නිමවා කැටපත් ගෙට වැඩමකැරැ ඉරිඳ දවස්වුව කුංකුමවණී සළු වඩා පදමරාග ආභරණ පැලඳැ කුංකුමාදී අංගරාග ගල්වා මහනෙල් මල් පැලඳැ සඳුදා දවස්වුව සුදු සළු වඩා මුතු අබරණ පැලඳැ සඳුන් වඩා දූසමන් ඉද්ද මල් පැලැඳැ අඟහරුවාදා දවස්වුව රත් සළු වඩා ප්‍රවාලාභරණ පැලඳැ රත්සඳුන් තිලක දී මහනෙල් පළොල් මල් පැලඳැ බදාදා දවස්වුව මරුවන් සළු වඩා මරකත ආභරණ පැලඳ සුවඳ සඳුන් විලෙවුන් ගෙනැ තමලු ලියමුසු මල්සෝළු පැලැඳැ බෘහස්පතින්දා දවස්වුව රන්වන් සළු වඩා පුෂ්පරාග ආභරණ පැලඳැ සුවඳ කොකුම් මුසු සඳුන් ගල්වා සපුමල් සෝළු පැලඳැ සිකුරාදා දවස්වුව සුදු සළු වඩා විදුරැ පලඳනා හෝ මුක්තාභරණ හෝ පැලඳැ කපුරැ සුදුසඳුන් විලෙවුන් ගෙනැ සිහිනිද්ද සුදු සෙව්වන්දි මල්කඩ පැලැඳැ සෙනසුරාදා දවස්වුව නිල් සළු වඩා ඉන්ද්‍රනීල ආභරණ පැලඳැ අගරු අංගරාග ගල්වා නිලුපුල් මල්කඩ පළඳිනු ඉසා මඟුල් කඩුවක් ශ්‍රී හස්තයෙන් ධරා රන් වැඩුඹු ලියෙන් පියවිළිපිටින් වැඩැ සිංහාසනාරූඪවැ හිඳ දානශාලාවෙහි ලේකම් පලමුවෙන් අසා භාණ්ඩාරයෙහි අය වියදම් ඒ දවස් අත්සුරැ අසා සත්පැ සමාරක් පිරුණුකල ආසථානේ[1] සිංහාසනාරූඪවැ වැඩහිඳ සක් පඩධුරයෙන් යුක්ත රාජප්‍රතාපයෙන් දෙවෙන්ද්‍රලීලා දක්වා රජයුවරජ සෙනෙවිරත් ඇපා මාපා පංචප්‍රධාන[2] මහසෙනඟ දකුම් දී සිටිසඳ ඒ ඒ ධුරයෙහි නියුක්තයන් විසින්....රාජධුර ඡන්දාදී සතර අගතියෙන් අපායගාමී නොවැ මධ්‍යසථවැ ඊට සුදුසු ව්‍යවසථා වදරා දෙපැ සමාරකින් නැඟී මෙසේ දසපැ පිරුණුකල ආයුධ අභ්‍යාස කොට මෙවඩන ගතියෙන් දෙන ප්‍රතාපපසි සහිත තුන්සිය සැටක් වසුන් දෙවා දොළොස් පැ පිරුණු පසු මහනැකතිනාවන් විෂ ඝටිකා දොෂ රහිත වේලා දැන්වූ කල්හි මූලගිනාවන් මහවෙදනාවන් සමඟවැ එළවූ රත්හැල් නැහි...අටබත් තුන්සියඅටමාළු සූප එළ පාන වර්ගයෙන් මෙහෙ නිමවනකල නිති දවස්පතා රජගෙයි වළඳන සඟසියක්දෙනා වහන්සේට අග්‍රභොජන ආදී දෙවා මහවෙදනාවන් කී නියායෙන් මෙහෙ නිමවා පාවාඩ බත් කන දහසකට හා තුන් සියයක්[3] ඇතුළු වැසියන්ට බත් අඩුක්තු දෙවනු ඉසා—එයින් නැඟී සළු පෙරළා සළු වඩා නවගුණ පිරුවා සියක් පියවර නොහඹු සක්මන් කොට බුලත් වඩා[4] රාමකුල යහන් වැඩ හොත්කල බැමිණියෝ කෙස් නිය පහරවති. තෙසු හැමදෙනා පවන් වඩති. ශ්‍රීපාදය වඩති. යහන් ගෙදොරකඩ රැකවල්ගෙන සිටිති. මෙසේ දෙපැසමාරක් යවා එයින් ශෘඞ්ගාර මඩපයේ කොකිල හෝවිලි යහනේ වැඩහිඳැ දවල් මූරපුර

1. ආස්තානේ.
2. රජ යුවරජ සිටු සෙනෙවිරත් ඇපාමපා ආදිවූ පංච ප්‍රධාන.
3. තුන්දහස් තුන්සියයක්.
4. රාමකුලයන්.

ගෙන්වා කෙළිගොෂ්ඨිකොට පස්පෑ පුරා නැඟී රජපා තෙලෙහි අතුල රන් යහන් තෙලේ වැඩහිඳ හුන්සියසැටක් ගොෂ්ඨී ගෙන්වා චිත්තානුකූල ගොෂ්ඨියෙන් වැඩහිඳ විසිදෙපැය සමාරක් පුරා එසින් නැඟී සිංහාසනා රූඪවැ වැඩහිඳ සෙනානායක එකනායක භණ්ඩාරනායක දිශානායක අධිකරණනායක සාමන්තනායක අශ්වනායක ගජනායක රටනායක මුදල්නායක බදුනායක දගම්පසක්නා මහවියත්නා මහනැකැතිනා මහවෙදනා සිඟානා දහම්ගෙයිනා මහවෙළදනා සිටුනා මුලගිනා අරක්මේනා මහදෙරනා කිලිංනා [1] කපුනා මේආදීන් පිරිවරා රටකොට ගම් නියම්ගම් ආදිවූ අමුතු පත්පනත් අසා කොපප්‍රසාදවැ ඒට සුදුසු සතිටු හන් වදරා මෙසේ....පැපුරා ඕලක්කම් මඬපයට වැඩැ දෙහල මඟුලැතුන් අසුන් ගෙන්වා දකුණු දෙස සිටුවා තිරවටා රන්රිදී දෙහල වෙදනාවන් කීපරිද්දෙන් රජබොජුන් දෙවා දෙහලකයන් [2] ගෙන්වා ලේකම් අසා දුටු පතනට කොපප්‍රසාදවැ සඳුන් පිනිදිය මල්වඩම් දෙවා විසිසත්පැ සමාරක් පුරා සඳලු වැඩැ දිය වඩා සළු පෙරළා දවස්වර සළු පළදනා වඩා තෙමල්කඩ පැලැඳැ තිස්පෑ පිරුණු සඳ බුදුන්වැඳ අටතුරුසියක් වර නවගුණ පිරුවා ආලත්ති මඬපය දොර වැඩසිටැ සඞ්ඝයාධුර කරවා එක්දහස් අටසියයක් සත්‍රීන් ලවා තුන්වරෙක ආලත්ති බාවා නැවත බලි හරවා දුස්සිරි හැර පැයක් ගියකල නාටකශාලාවේ සිංහාසනා රූඪවැ වැඩහිඳ නාටකාධිපතීන් [3] දක්වනලද නෘත්‍යගීත වාදනයෙන් සන්තොෂවැ උන්ට මල්කඩ දෙවා පස්පැපුරා මහනැකැතිනාවන් [4] පිළිවිසැ බොජුන්ගෙට වැඩැ මෙහෙ නිඃවා සක්මන්කැර නවඅරහාදී බුදුගුණ සිහිකර යහන් නැඟී බුලත් වඩා මෙසේ පස්පැ සමාරක් යවා බිසෝ රජගෙට වැඩැ පස්පැයක් පුරා එයින් නැඟී සඳලු වැඩැ අඟ වින්‍යාස කොට සතලිස් පැයක් ගියකල මුරපතත් අත්සුරු අසා ශ්‍රීයහන් ගබඩා ගෙට වැඩැ දහම් සිහිකර දසපැයක් නිඳ සැතපෙනු ඉසා...

මේ සිරිත්වූලෙස නොවරදවා මතුරජවූ මේ ශ්‍රී ලඞ්කාවීපයෙහි සිරිසැපත් විඳිනා පින්වත් ශ්‍රද්ධාබුද්ධි සම්පන්න රාජෝත්තමයාණන් වහන්සේ විසින් සියලු සත්ත්වයන් කෙරෙහි හිතාධ්‍යාශයෙන් යුක්ත වැ සිරිත්වූලෙස රජසිරිසැපත් විඳැ ලෝසසුන් වඩනය කෙරෙමින් අනන්තරය විඝාතකොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳැ කෙළවර නිවන් සම්පත් ලබන්ට උත්සාහ සිතුව යහපති...

මේ සිරිත් වූ ලෙස තුනුරුවන් අයත් මේ ශ්‍රී ලඞ්කාවීපයෙහි මෙ තැන්පටන් මතුමත්තෙහි රජපැමිණ රජසිරි විඳිනා තමහට වැඩ කැමැති පින්වත් රජුන් විසින් ලෝ සසුන් වඩා සියලු සත්ත්වයන් කෙරෙහි හිත චිත්තයෙන් යුක්තවැ නොබද කරවූවර නොගෙනැ යුතු අය පඹුරු ගෙනැ මල් නොසිඳ රොන් ගන්නා බඹරුන් මෙන් සතර සඞ්ග්‍රහ වස්තුයෙන් වියෝ නොවැ ජනරංජනය කෙරෙමින් දශරාජ

1. කිලිනා.
2. දෙහෙලකයන්.
3. නාටකාදියන්පතින් නටනලද.
4. මහනැකැතිනාවන් විසින් පිළිවිසි.

ධර්මයෙන් යුක්තවූ රාජ්‍යශ්‍රීසම්පත් අනුභවකොට කෙළවර දිව්‍ය මනුෂ්‍ය සම්පත් සාධාදී සුගතිසම්පත්ති හා අමෘතමහා නිර්වාණ සම්පත්ති ප්‍රතිලාභ යට පැමිණෙන ලෙස උත්සාහ සිතුව යනපති.

---

( ii )

“ස්වර්ග මර්ත්‍ය පාතාල සංඛ්‍යාත භුවනත්‍රය වාසිවූ සමස්ත සත්ත්වවර්ගය හට පිතරෙපම හිතකාරිවූ අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකොට අමෘත මහා නිර්වාණ ප්‍රවිෂ්ටකරවා නිරුපධිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන්පෑ වදාල අපමහා ගෞතම සර්වඥ රාජෝත්තමයාණන් වහන් සේගේ ශ්‍රී බුද්ධ වර්ෂයෙන් එක්දහස් සත්සිය සැත්තෑනවවැනි අවුරුද් දේදී මේ ශ්‍රී ලඞ්කාද්වීපයෙහි නොඑක් දෙමළ සටන්කොට පර සතුරන් සාධා තුන්රජය එකච්ඡත්‍ර කොට ලොකශාසනානුරක්ෂණයෙහි දක්ෂ නෛක දිග්ව්‍යාපත තෙජෝබල පරාක්‍රම ත්‍යාග ප්‍රතාප ඓශ්වර්ය කීර්ත්‍යාදි ගුණයෙන් යුක්තවූ සකලකලා සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු නම් මහ රජු සකල නගරාඞ්ග සම්පත්ති සම්භාරයෙන් සමෘද්ධවූ ජම්බුද්‍රොණී නම් පුරවරයෙහි රාජ්‍ය ශ්‍රී පුරුදුවූ ශක්‍රදෙවෙන්ද්‍ර ලීලායෙන් විජෘම්භමාණවූ දෙවිසි වන අවුරුද්දෙහි කිසියම් කායිකා බාධයක් මූලිකවූ මදක්බස චික්කල්වූ කථා අක්කල්වූ ගිය හෙයින් වෛද්‍ය ප්‍රයොගාදි ශාන්ති විධිකරවා ශමනගුණයක් නොපැනුණු හෙයින් රජ යුවරජ සිටු සෙනෙවිරත් ඇපා මාපා පචප්‍රධාන මන්ත්‍රීශ්වරයන් රාජසභාවට රැස්වූ සාකච්ඡාකොට බොධිසත්ත්ව චාරිත්‍ර ඇති ශ්‍රද්ධාබුද්ධි සම්පන්න අපගේ ලඞ්කෙශ්වරවූ මහරජ්ජුරුවන් වහන්සේට පැමිණි මේ පිරි (පත) එාසු අඑාසු වන බව ලඞ්කාරක්ෂායෙහි නියුක්ත උත්පල වර්ණ දෙවිරජ්ජුරුවන් වහන්සේට පෙනෙවූ වැතිරුණුකල්හි පෙන්වූ කාරුණාවකින් දූනගනුම්හ යන අභිප්‍රායෙන් රජ්ජුරුවන්ට සැලකොට එකලට එම මහරජහට අගමෙහෙසුන් තැන්පත් ගිරිවසා සුනෙත්‍රා මහා දෙවී යන රාජමහිෂිකාවන්ට බිසෝපත්තුවට තුබූ මායා රජයෙන් ඒ අවධියේ පද්දූවෙල නම්වූ දූන් මේ අලුත්නුවර ගමත් අලපලාවල හා දම්පැල්ගොඩත් පරිවාර ජනයා හා සමඟ හිරසඳ පමුණුකොට දෙවියන්ට පවත්නා පත්තට ඒ රජතුමාගේ අදහස් හැඳින තුන් රජයකින් යුක්ත මේ ශ්‍රී ලංකාද්වීපයෙහි සියලු රාජකෘත්‍යය සිද්ධකොටදී පවත්නාවූ බුදුබව ප්‍රාර්ථනාකොට රොපණයකැරවූ පොල්ගෙඩියෙහි තුන් ඇස්සෙන් තුන් පැළයක් නැංවූ අඹු දරුවන් පවා යාචකයන්ට දන්දී ලොකප්‍රසිද්ධ රත්නත්‍රය ශරණපරායණ අශරණ ශරණගත වජ්‍ර පඤ්ජරායමාන දුනුකේවතු වංශාභිජාත දෙල්ගස් [ගමුවේ] දෙව ප්‍රතිරාජ නම් අග්‍ර අමාත්‍යයාණන්ට යට කියන ලද පුදපඬුරු සියල්ලම භාරකොට එම අවුරුද්දේ ඇසළ පූජා පෙරහර පුද ඔිලක්කම් ආදිවූ සියල්ලත් අපගේ නාමයෙන් පවත්වාලවයි දෙවුනුවර ගමන්කරවූ තැන මන්ත්‍රීශ්වරයාණන් ගොස් පළමු දවසට දියුණුකොට ඇසළ පූජාත් කරවා ගෙන්වාගිය පුදපඬුරුත් ගම්වලට දූන් සන්නස් පත්‍ර

ලෙඛ්‍යයත් දෙව් රජහට පෙන්වාදී ඉක්බිති එක් නානුමුර දිනයෙක්හි ඒ දෙව ප්‍රතිරජ නම් අමාත්‍යයාණන් ඉස් සෝධා නා සුපවිත්‍රවැ අටසිල් සමාදන්වැ දෙවියන්ට ආරාධනාකොට පෙහෙවැ වැතුරුණු ඒ දවසේ මධ්‍යම රාත්‍රියෙහි විශෙෂතර රූපශ්‍රීන් යුක්තවූ බ්‍රාහමණ වෙෂයකින් දෙවියන් අවුත් ඉස්දෙර පෙනීසිට 'කෙකටිය මලෙහි වක හැරෙන නමුත් තොපගේ රජ්ජුරුවන්ගේ බසෙහි වික්නලු නොහැරෙයි' කවියක් බැඳෑ සවපනයෙන් පෙන්වා කීහෙයින් ඒ පනත මන්ත්‍රීශ්වරයන් නොනැවත දඹදෙණි නුවරට ගොසින් පණ්ඩිත පරාක්‍රමබාහු රජහට සැලකලතැන අපගේ පූර්ජතියෙහි විපාක දී ශෙෂවැ සිටි අකුශලය දූත් කොයි පනතේ උත්සාහකළත් ශාන්තනොවන රඟ දෙවිමහ රජ්ජුරුවන්වහන්සේ පෙන්නුවා මහත්වූ උපකාරයෙකැයි යම් වැණියක් පැහැදූ දෙවිසිවන අවුරුද්දෙහි අභිෂෙක මඞගලයෙහි කැරවූ දෙවුරජපෙත්තත් දෙවුනුවරින් ගෙනා රන් ආයුධත් ගම්වල අයවිය දම් දෙක කරවන පනතට සන්හස් පරම්පරාවෙන් ලියන කෙනකුනුත් රාජපුරුෂයනුත් කැටිවැ සලස්වා එවා දෙවි රජගෙට ඉදිරිපිට ගල් ලෙන්විහාරයෙහි ගෙනා රන් ආයුධ හා දෙව්රජපෙත්ත වඩා පුද පඬුරු ආදිවූ දෙයක් ලැබ එමින්සිටි..."

# විශුද්ධිමාර්ගය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

## 3.

(අ) ඉදානි යස්මා එවං ධුතඞ්ගපරිහරණසම්පාදිතෙහි අප්පිච්ඡතාදීහි ගුණෙහි පරියොදාතෙ ඉමස්මිං සීලෙ පතිට්ඨිතෙන "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො, චිත්තං පඤ්ඤඤ්ච භාවයන්ති" වචනතො චිත්තසීසෙන නිද්දිට්ඨො සමාධි භාවෙතබ්බො, සො ච අතිසඞ්ඛෙපදෙසිතත්තා විඤ්ඤාතුම්පි තාව න සුකරො, පගෙව භාවෙතුං. තස්මා තස්ස විත්ථාරඤ්ච භාවනානයඤ්ච දස්සෙතුං ඉදං පඤ්හකම්මං හොති—

(ආ) කො සමාධි, කෙනට්ඨෙන සමාධි? කානස්ස ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානි? කතිවිධො සමාධි? කො චස්ස සඞ්කිලෙසො? කිං වොදානං? කථං භාවෙතබ්බො? සමාධිභාවනාය කො ආනිසංසොති?

---

(අ) ඉදානි, දැන්; යස්මා, යම්හෙයකින්; එවං, මෙසේ; ධුතඞ්ගපරිහරණසම්පාදිතෙහි, ධුතාඞ්ගපරිහරණයෙන් සපයනලද; අප්පිච්ඡතාදීහි ගුණෙහි, අල්පෙච්ඡභාවාදිගුණයෙන්; පරියොදාතෙ, පරිශුද්ධවූ (නිරුපක්ලෙශවූ); ඉමස්මිං සීලෙ පතිට්ඨිතෙන, යථොක්ත චතුෂ්පාරිශුද්ධි ශීලයෙහි පිහිටියහු විසින්; සීලෙ—පෙ—වචනතො, "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං"යි වදාළ බැවින්; චිත්තසීසෙන නිද්දිට්ඨො සමාධි, චිත්තශීර්ෂයෙන් දක්වනලද සමාධිතෙමෙ; භාවෙතබ්බො, වැඩියයුතුය; සො ච, හෙද; අතිසඞ්ඛෙපදෙසිතත්තා, "චිත්තං භාවයං"යි අතිසංක්ෂෙපකොට දෙසූ බැවින්; විඤ්ඤාතුම්පි තාව න සුකරො, දන්නට පොවා සුවනොවෙයි; පගෙව භාවෙතුං, භාවනාකරන්නට කොහිමද; තස්මා, එහෙයින්; තස්ස, ඒ සමාධිහුගෙ; විත්ථාරඤ්ච, ප්‍රභෙද විසින් විස්තාරයද; භාවනානයඤ්ච, එසේ විස්තර කරනලද සමාධිහුගෙ භාවනානයද; දස්සෙතුං, දක්වනු පිණිස; ඉදං පඤ්හකම්මං හොති, මේ ප්‍රශ්නකර්ම නම් වේ.

(ආ) කො සමාධි, සමාධි නම් කිමෙක්ද; කෙනට්ඨෙන සමාධි, කවර අර්ථයෙන් සමාධියයි කියන ලැබේද; ("සමාධි"යයි යනපදය කවර අභිධෙයයක් නිසා පවතීද යන අර්ථයි.) අස්ස, ඒ සමාධිහුගෙ; ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානි, ලක්ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය

(අ) තත්‍රිදං විස්සජ්ජනං:- කො සමාධීති? සමාධි බහුවිධො නානප්පකාරකො, තං සබ්බං විභාවෙතුං ආරබ්භමානං විස්සජ්ජනං අධිප්පෙතඤ්චෙව අත්ථං න සාධෙය්‍ය උත්තරිඤ්ච වික්ඛෙපාය සංවත්තෙය්‍ය, තස්මා ඉධාධිප්පෙතමෙව සන්ධාය වදාම.

(ආ) කුසලචිත්තෙකග්ගතා සමාධි. කෙනට්ඨෙන සමාධීති? සමාධානට්ඨෙන සමාධි. කිමිදං සමාධානං නාම? එකාරම්මණෙ චිත්තචෙතසිකානං සමං සම්මා ච ආධානං ඨපනන්ති වුත්තං හොති, තස්මා

---

පදස්ථානය යන මොහු; කානි, කවරහ; කතිවිධො සමාධි, සමාධිය කතිප්‍රකාරවේද; අස්ස, ඒ සමාධිහුගෙ; සඞ්කිලෙසො කො, සකිලිටු බව කිමෙක් ද; කිං වොදානං, පිරිසුදුබව කිමෙක් ද; කථං භාවෙතබ්බො, කෙසේ හැවිය යුතු ද; සමාධිභාවනාය කො ආනිසංසො, සමාධිභාවනාවෙහි අනුසස් කිමෙක් ද;

(අ) තත්‍ර, ඒ ප්‍රශ්නකර්මයෙහි; ඉදං විස්සජ්ජනං, මේ විසඳීමයි. "කො සමාධි" යන්නෙහි; සමාධි, සමාධිතෙමෙ; බහුවිධො, කුශලාදි විසින් අනෙකප්‍රකාර වේ; නානප්පකාරකො, (ආලම්බනය මනසිකාරය ඡන්දය ප්‍රණිධිය අධිමොක්ෂය අභිනීහාරය ප්‍රඥය යන මොවුන්ගෙ නානාත්වාදියෙන්)නානාප්‍රකාර වේ; තං සබ්බං, ඒ සියලු ප්‍රකාරය; විභාවෙතුං, පහළකරන්නට; ආරබ්භමානං විස්සජ්ජනං, ආරම්භකරන ලබන විසර්ජනය තෙමෙ; අධිප්පෙතඤ්චෙව අත්ථං න සාධෙය්‍ය, ලෞකික භාවනා සඞ්ඛ්‍යාත අභිප්‍රෙතාර්ථයද නොසාධන්නෙය;(ධ්‍යානවිමොක්ෂාදි යෙහි සමාධිහු උද්ධරණය කොට ඔහුගෙ ලභ්‍යමාන විභාග වශයෙන් විසර්ජනය කරනුලබන කල්හි ධ්‍යානවිභඞ්ගාදියෙහි ආගත සියලු සමාධි ප්‍රභෙදය විසදියයුතු වෙයි. එසේ කල්හි අභිමත ලෞකික සමාධිභාවනා විධිහුගෙ විසඳීමට අවසරම නොවන්නෙය යන අර්ථයි.) උත්තරිඤ්ච, මතුයෙහිදු; වික්ඛෙපාය සංවත්තෙය්‍ය, වික්ෂෙප පිණිස වන්නෙයි; (සමාධිහුගෙ ත්‍රිකචතුෂ්කධ්‍යානිකවූ හීනාදි භෙදභින්නවූ යම් ප්‍රවෘත්ති විභාගයකින් බ්‍රහ්මපාරිෂද්‍යාදි නවවිධවූ යම් භවප්‍රභෙදයෙක් නිෂ්පන්න වෙද පඤ්චමධ්‍යානිකවූ යම් ප්‍රවෘත්ති විභාගයෙකින් වෘහත්ඵලාදි විසින් දශවිධවූ එකාදශවිධවූ හෝ යම් භවප්‍රභෙදයෙක් නිෂ්පන්න වෙද ඒ සියලු විභාගය වෙන වෙන නිර්ධාරණය කොට කියනු ලබන්නේ වික්ෂෙපකර වේ යන අර්ථයි.)තස්මා, එහෙයින්; ඉධාධිප්පෙතමෙව සන්ධාය වදාම, මෙතන අභිමතවූම සමාධිහු සඳහාම කියමු.

(අ) කුසලචිත්තෙකග්ගතා සමාධි, අනවද්‍යසුඛවිපාකලක්ෂණවූ චිත්තෙකාග්‍රතාතොමෙ සමාධි නම් වේ; ("සමං සම්මා ආධානං" යනු වේ.) කිමිදං සමාධානං නාම, මේ සමාධාන නම් කිමෙක්ද; එකාරම්මණෙ, එක අරමුණෙහි; චිත්තචෙතසිකානං, චිත්තචෛතසික යන්ගෙ; සමං, නොවිසිර; (පිඬුව) ආධානං, පිහිටවීම; සම්මාච, නානා

යස්ස ධම්මස්සානුභාවෙන එකාරම්මණෙ චිත්තචෙතසිකා සමං සම්මා ච අවික්ඛිප්පමානා අවිප්පකිණ්ණා ච හුත්වා තිට්ඨන්ති ඉදං සමාධානන්ති වෙදිතබ්බං. **කානස්ස ලක්ඛණරසපච්චුපට්ඨානපදට්ඨානානීති?** එත්ථ පන අවික්ඛෙපලක්ඛණො සමාධි, වික්ඛෙපවිද්ධංසනරසො, අවිකම්පනපච්චුපට්ඨානො, "**සුඛිනො චිත්තං සමාධියතී**"ති වචනතො පන සුඛමස්ස පදට්ඨානං. **කතිවිධො සමාධීති?** අවික්ඛෙපලක්ඛණෙන තාව එකවිධො, උපචාරඅප්පණාවසෙන දුවිධො. තථා ලොකියලොකුත්තරවසෙන, සප්පීතික නිප්පීතිකවසෙන, සුඛසහගත උපෙක්ඛාසහගත වසෙන ච.

---

ලම්බනයෙහි අවික්ෂෙප වශයෙන්; ආධානං, පිහිටවීම; ඨපනන්ති වුත්තං හොති, තිබීම යයි කී තියායි; තස්මා, එහෙයින්; යස්ස ධම්මස්සානුභාවෙන, යම් ධර්මයක්හුගෙ බලයෙන්; එකාරම්මණෙ, එක අරමුණෙහි; චිත්තචෙතසිකා, චිත්තචෛතසිකයෝ; සමං, සමව; සම්මා ච, මනාව; අවික්ඛිප්පමානා, නොදවිසෙරෙන ලදුව; (වූපසම මානා යන අර්ථයි.) අවිප්පකිණ්ණාච හුත්වා, නොදවිසිර; ("අවික්ඛිප්පමානා"යනු යෙන් සමාධිහු වික්ෂෙපප්‍රතිපක්ෂබව දක්වූහු. "අවිප්පකිණ්ණා" යනු යෙන් අවිසාරලක්ෂණබව දක්වූහු.) තිට්ඨන්ති, සිටිද්ද; ඉදං, මේ; සමාධානන්ති වෙදිතබ්බං, සමාධානයයි දතයුතු; "කානස්ස ලක්ඛණරසපච්චුපට්ඨාන පදට්ඨානානීති" යන; එත්ථ පන, මෙහි වනාහි; අවික්ඛෙපලක්ඛණො, නානාලම්බනයෙහි නොවිසිරෙනබව ලක්ෂණ කොට ඇත්තෙ; සමාධි, සමාධි නම් වේ; ("**සයං න වික්ඛිපති සම්පයුත්තා වා න වික්ඛිපන්ති එතෙනාති අවික්ඛෙපො, සො ලක්ඛණං එතස්සාති අවික්ඛෙපලක්ඛණො**"යි ගත්තේ.) වික්ඛෙපවිද්ධංසනරසො, වික්ෂෙපය නැසීම කෘත්‍යකොට ඇත්තේයි. නොහොත්: වික්ෂෙප විධ්වංසනය සම්පත් කොට ඇත්තේයි; ("**වික්ඛෙපං විද්ධංසෙති තථා, වා සම්පජ්ජතීති වික්ඛෙපවිද්ධංසනරසො**"යනු ටීකායි.) අවිකම්පන පච්චුපට්ඨානො, උද්ධච්චහෙතුවෙන් කම්පාවක් නැතිබව වැටහීම් කොට ඇත්තේයි; (සම්ප්‍රයුක්තයන්ට හෝ අවිකම්පනය එළවීම වැටහීම් කොට ඇත්තේයි—"**උද්ධච්චෙ ච අවිකම්පනවසෙන පච්චුපතිට්ඨති සම්පයුත්තානං වා තං පච්චුපට්ඨපෙතීති අවිකම්පනපච්චුපට්ඨානො**"යනු ටීකායි.) සුඛිනො චිත්තං සමාධියතීති වචනතො "සුඛිනො චිත්තං සමාධියතී"යි කී බැවින්; සුඛං, නිරාමිෂසුඛය තෙමෙ අස්ස පදට්ඨානං, මෝහට ආසන්න කාරණ වෙ; "කතිවිධො සමාධි" යන්නෙහි;[තාව, පළමුකොට;]අවික්ඛෙපලක්ඛණෙන, අවික්ෂෙප ලක්ෂණ යෙන්; එකවිධො, එකප්‍රකාර වේ; උපචාරඅප්පණාවසෙන, උපචාර සමාධි අර්පණාසමාධි වශයෙන්; දුවිධො, ද්විප්‍රකාර වෙ; තථා, එසේම; ලොකියලොකුත්තරවසෙන, ලෞකිකසමාධි ලොකුත්තරසමාධි විසින්ද; සප්පීතික නිප්පීතිකවසෙන, සප්‍රීතිකසමාධි නිෂ්ප්‍රීතිකසමාධි විසින්ද; සුඛසහගත උපෙක්ඛාසහගත වසෙන ච, සුඛසහගත සමාධි උපෙක්ෂා සහගතසමාධි විසින් ද (ද්විප්‍රකාර වේ);

**(අ) තිවිධො හීනමජ්ඣිමපණීතවසෙන, තථා සවිතක්කසවිචාරාදිවසෙන, පීතිසහගතාදිවසෙන, පරිත්තමහග්ගතාප්පමාණවසෙන ච. චතුබ්බිධො දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදිවසෙන, තථා පරිත්තපරිත්තාරම්මණාදිවසෙන, චතුජ්ඣානඞ්ගවසෙන, හානභාගියාදිවසෙන, කාමාවචරාදිවසෙන, අධිපතිවසෙන ච. පඤ්චවිධො පඤ්චකනයෙ පඤ්චජ්ඣානඞ්ගවසෙනාති.**

**(ආ) තත්‍ථ එකවිධකොට්ඨාසො උත්තානත්ථොයෙව. දුවිධකොට්ඨාසෙ ඡන්නං අනුස්සතිට්ඨානානං මරණස්සතියා උපසමානුස්සතියා ආහාරෙ පටික්කූලසඤ්ඤාය චතුධාතුවවත්ථානස්සාති ඉමෙසං වසෙන ලද්ධචිත්තෙකග්ගතා, යා ච අප්පනාසමාධීනං පුබ්බභාගෙ එකග්ගතා, අයං**

---

(අ) **හීනමජ්ඣිමපණීතවසෙන,** හීනසමාධි මධ්‍යමසමාධි ප්‍රණීත සමාධි විසින්; **තිවිධො,** ත්‍රිප්‍රකාර වේ; **තථා,** එසේම; **සවිතක්කසවිචාරාදිවසෙන,** සවිතර්කසවිචාරසමාධි ය අවිතර්කවිචාරමාත්‍රසමාධි ය යනාදි විසින්ද; **පීතිසහගතාදිවසෙන,** ප්‍රීතිසහගතසමාධි ය සුඛසහගතසමාධි ය යනාදි විසින්ද; **පරිත්ත මහග්ගතාප්පමාණවසෙන ච,** පරිත්තසමාධි ය මහග්ගතසමාධි ය යනාදි විසින්ද (ත්‍රිවිධ වේ); **දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාදිවසෙන,** දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාය දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤාය යනාදි විසින්ද; **පරිත්ත පරිත්තාරම්මණාදිවසෙන ච,** පරිත්තපරිත්තාරම්මණසමාධිය පරිත්ත අප්පමාණාරම්මණසමාධිය යනාදි විසින්ද; **චතුජ්ඣානඞ්ගවසෙන,** සතරධ්‍යානයට අඞ්ගවන සමාධි විසින්ද; (චතුෂ්කනය හෙයින් කීහු.) **හානභාගියාදිවසෙන** හානභාගියසමාධි ය ඨිතිභාගියසමාධි ය යනාදි විසින්ද; **කාමාවචරාදිවසෙන,** කාමාවචරසමාධි ය රූපාවචරසමාධි ය යනාදි විසින්ද; **අධිපතිවසෙන ච,** ඡන්දසමාධිය විරියසමාධිය යනාදි අධිපතිවිසින්ද (චතුෂ් ප්‍රකාරවේ); **පඤ්චකනයෙ,** පඤ්චකනයෙහි; **පඤ්චජ්ඣානඞ්ගවසෙන,** පඤ්චධ්‍යානයට අඞ්ග විසින්; **පඤ්චවිධො,** පඤ්චප්‍රකාර වේ.

(ආ) **තත්‍ථ,** ඒ එකවිධාදි නයෙහි; **එකවිධකොට්ඨාසො,** එකප්‍රකාරය යන කොටස; **උත්තානත්ථොයෙව,** අගම්භීරවූ අර්ථ ඇත්තේමැයි; **දුවිධකොට්ඨාසෙ,** ද්විප්‍රකාරවෙයි යන කොටසැ; **ඡන්නං අනුස්සතිට්ඨානානං,** බුද්ධානුස්මෘති ආදිවූ අනුස්මෘතිකර්මස්ථානයන් සදෙනාගෙ; **මරණස්සතියා,** මරණානුස්මෘතියගෙ; **උපසමානුස්සතියා,** උපසමානුස්මෘතියගෙ; **ආහාරෙ පටික්කූලසඤ්ඤාය,** ආහාරයෙහි ප්‍රතිකූලසංඥවගෙ; **චතුධාතුවවත්ථානස්සාති,** චතුර්ධාතුව්‍යවස්ථානයාගෙය යන; **ඉමෙසං වසෙන,** මේ දශකර්මස්ථානයන්ගෙ වශයෙන්; **ලද්ධචිත්තෙකග්ගතා,** ලද්දචිත්තෛකාග්‍රතාවද; **අප්පනාසමාධීනං පුබ්බභාගෙ,** අර්පණා සමාධීන්ට පූර්වභාගයෙහි; **යා ච එකග්ගතා,** යම් එකාග්‍රතාවක්ද; (මෙයින් අර්පණාවට උපකාරකවූ නානාවර්ජනොපචාරයාගෙද සඞ්ග්‍රහය දතයුතු—එකාවර්ජනොපචාරයාගෙ මතුනොවෙයි හඟවනේ.) **අයං,** මේ; **උපචාරසමාධි,** උපචාරසමාධි නම් වේ; **පඨමස්ස ඣානස්ස,**

උපචාරසමාධි, "**පඨමස්ස ඣානස්ස පරිකම්මං පඨමස්ස ඣානස්ස අනන්තරපච්චයෙන පච්චයො**"ති ආදිවචනතො පන යා පරිකම්මානන්තරා එකග්ගතා, අයං අප්පනාසමාධීති එවං උපචාරප්පනාවසෙන දුවිධො. දුතියදුකෙ-තීසු භූමීසු කුසලචිත්තෙකග්ගතා ලොකියො සමාධි, අරියමග්ගසම්පයුත්තා එකග්ගතා ලොකුත්තරො සමාධීති එවං ලොකියලොකුත්තරවසෙන දුවිධො. තතියදුකෙ-චතුක්කනයෙ ද්වීසු පඤ්චකනයෙ තීසු ඣානෙසු එකග්ගතා සප්පීතිකො සමාධි, අවසෙසෙසු ද්වීසු ඣානෙසු එකග්ගතා නිප්පීතිකො සමාධි, උපචාරසමාධි පන සියා සප්පීතිකො සියා නිප්පීතිකොති එවං සප්පීතිකනිප්පීතිකවසෙන දුවිධො. චතුත්ථදුකෙ-චතුක්කනයෙ තීසු පඤ්චකනයෙ චතූසු ඣානෙසු එකග්ගතා සුඛසහගතො සමාධි, අවසෙසස්මිං උපෙක්ඛාසහගතො, උපචාරසමාධි පන සියා සුඛසහගතො සියා උපෙක්ඛාසහගතො ති එවං සුඛසහගත උපෙක්ඛා සහගත වසෙන දුවිධො෴

---

ප්‍රථමධ්‍යානයාගෙ; පරිකම්මං, ගොත්‍රභූ සඞ්ඛ්‍යාත පරිකර්මය; පඨමස්ස ඣානස්ස, ප්‍රථමධ්‍යානයට; අනන්තරපච්චයෙන පච්චයොති ආදිවචනතො පන, අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවෙයි යනාදි වදාළ බැවින් වනාහි; යා පරිකම්මානන්තරා එකග්ගතා, ගොත්‍රභූ සඞ්ඛ්‍යාත පරිකර්මයට අනන්තරවූ යම් එකාග්‍රතාවක් ඇද්ද; අයං, මේ තොමො; අප්පනාසමාධීති, අර්පණාසමාධියයි; එවං උපචාරප්පනාවසෙන, මෙසේ උපචාර සමාධි අර්පණාසමාධි විසින්; දුවිධො, ද්විප්‍රකාර වේ; දුතියදුකෙ, ද්විතීය ද්විකයෙහි; තීසු භූමීසු කුසලචිත්තෙකග්ගතා, කාමභූමි රූපභූමි අරූපභූමි යන තුන්බුමුයෙහි කුශලචිත්තෛකාග්‍රතා තොමො; ලොකියො සමාධි, ලෞකිකසමාධි නම් වේ; අරියමග්ගසම්පයුත්තා එකග්ගතා, ආර්‍ය්‍යමාර්ගීග සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාතොමො; (මෙතැන කුශලසමාධි යම කියන බැවින්; "අරියමග්ගසම්පයුත්තා"යි කීහු.) ලොකුත්තරො සමාධීති, ලොකොත්තර සමාධියයි෴පෙ෴චතුක්කනයෙ, චතුෂ්කනයෙහි; ද්වීසු, ප්‍රථම ද්විතීය ධ්‍යාන දෙක්හිදු; පඤ්චකනයෙ, පඤ්චකනයෙහි; තීසු ඣානෙසු, ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානතුනෙහිදු; එකග්ගතා, එකාග්‍රතාතොමො; සප්පීතිකො සමාධි, සප්‍රීතික සමාධි නම; අවසෙසෙසු ද්වීසු ඣානෙසු, චතුෂ්කනයෙහි තුන්වනු සතරවනුවූ පඤ්චකනයෙහි සතරවනු පස්වනුවූ සෙසු ධ්‍යාන දෙක්හි; එකග්ගතා නිප්පීතිකො සමාධි, එකාග්‍රතාතොමො නිෂ්ප්‍රීතික සමාධි නම්; උපචාරසමාධි පන, උපචාරසමාධි වනාහි; සියා සප්පීතිකො සියා නිප්පීතිකො, සප්‍රීතිකද වෙයි නිෂ්ප්‍රීතිකද වෙයි;-(සියලු ධ්‍යානයන්ගෙම නානාවර්ජන වීථියෙහි උපචාර සමාධිය සප්‍රීතිකද වෙයි නිෂ්ප්‍රීතිකද වේ එකාවර්ජන වීථියෙහි වනාහි වෙදනාපරිවර්තන නැති බැවින් ආදියෙහි ද්විකත්‍රිකධ්‍යානයන්ගෙ උපචාර සමාධිය සප්‍රීතිකම වෙයි සෙසු තෘතීය චතුර්ථ පඤ්චම ධ්‍යානයෙහි ද උපචාර සමාධිය නිෂ්ප්‍රීතිකම වෙයි.)චතුත්ථදුකෙ, චතුර්ථ ද්විකයෙහි; චතුක්කනයෙ තීසු, චතුෂ්කනයෙහි ආදියෙහි තුන්ධ්‍යාන්හිද;

(අ) තිකෙසු පඨමත්තිකෙ–පටිලද්ධමත්තො හීනො, නාතිසුභාවිතො මජ්ඣිමො, සුභාවිතො වසිප්පත්තො පණීතොති එවං හීනමජ්ඣිම පණීතවසෙන තිවිධො. දුතියත්තිකෙ– පඨමජ්ඣානසමාධි සද්ධිං උපචාරසමාධිනා සවිතක්කසවිචාරො, පඤ්චකනයෙ දුතියජ්ඣානසමාධි අවිතක්කවිචාරමත්තො, යො හි විතක්කමත්තෙ යෙව ආදීනවං දිස්වා විචාරෙ අදිස්වා කෙවලං විතක්කප්පහානමත්තං ආකඞ්ඛමානො පඨමජ්ඣානං අතික්කමති, සො අවිතක්ක විචාරමත්තං සමාධිං පටිලභති. තං සන්ධායෙතං වුත්තං.

(ආ) චතුක්කනයෙ පන දුතියාදිසු පඤ්චකනයෙ ච තතියාදිසු තීසු ඣානෙසු එකග්ගතා අවිතක්කාවිචාරො සමාධීති එවං සවිතක්කසවි

---

පඤ්චකනයෙ චතූසු ඣානෙසු, පඤ්චකනයෙහි ආදියෙහි සතරධ්‍යාන්හිද; එකග්ගතා, එකාග්‍රතාතොමෙ; සුඛසහගතො සමාධි, සුඛසහගත සමාධි නම් වේ; අවසෙසස්මිං, චතුෂ්කනයෙහි චතුර්ථධ්‍යාන්හිද පඤ්චකනයෙහි පඤ්චමධ්‍යාන්හිද එකාග්‍රතාතොමෙ; උපෙක්ඛාසහගතො සමාධි, උපෙක්ෂාසහගතසමාධි නම්; උපචාරසමාධි පන, උපචාර සමාධි වනාහි; සියා සුඛසහගතො සියා උපෙක්ඛාසහගතො, සප්‍රීතික ද්වකයෙහි කී නයින්ම සුඛසහගතද වෙයි උපෙක්ෂාසහගතද වෙයි;-

(අ) තිකෙසු, ත්‍රිකයන් කෙරෙහි; පඨමත්තිකෙ, ප්‍රථමත්‍රිකයෙහි; පටිලද්ධමත්තො, ප්‍රතිලබ්ධමාත්‍රවූයේ;(අනාසෙවිතවූයේ යනඅර්ථයි.)හීනො, පරිදුර්බල බැවින් හීන නම් වේ; නාතිසුභාවිතො, අතිශය ප්‍රගුණබවට නොපමුණුවනලද්දේ; මජ්ඣිමො, මධ්‍යම නම් වේ; සුභාවිතො, මනා කොටම ප්‍රගුණකරනලද්දෙ; වසිප්පත්තො, වසිතාවට පමුණුවන ලද්දේ; පණීතො, ප්‍රණීත නම්; දුතියත්තිකෙ, ද්විතීයත්‍රිකයෙහි; පඨම ජ්ඣානසමාධි, ප්‍රථමධ්‍යානසමාධිය; සද්ධිං උපචාරසමාධිනා, උපචාර සමාධිය හා සමග; සවිතක්කසවිචාරො, සවිතර්ක සවිචාර නම් වේ; පඤ්චකනයෙ, පඤ්චකනයෙහි; දුතියජ්ඣානසමාධි, ද්විතීයධ්‍යාන සමාධිය; අවිතක්කවිචාරමත්තො, අවිතර්කවිචාරමාත්‍ර නම්; යො හි, යමෙක් වනාහි; විතක්කමත්තෙයෙව ආදීනවං දිස්වා, විතර්කමාත්‍රයෙහිම (චිත්තක්ෂොභකාරයයි) ආදීනව දැක; විචාරෙ අදිස්වා, විචාරයෙහි ආදීනව නොදැක; (විචාරය ශාන්තහෙයින් දැකයයි සේයි.) කෙවලං, හුදෙක්; විතක්කප්පහානමත්තං ආකඞ්ඛමානො, විතර්කප්‍රහාණමාත්‍ර යකැමැත්තෙ; පඨමජ්ඣානං අතික්කමති, ප්‍රථමධ්‍යානය ඉක්මේද; සො, හෙතෙමෙ; අවිතක්කවිචාරමත්තං සමාධිං පටිලභති, අවිතර්ක විචාරමාත්‍රධ්‍යානය ලැබේ; තං සන්ධාය, මෙසේ ලද සමාධිය සඳහා; එතං වුත්තං,"අවිතක්කවිචාරමත්තො සමාධි"යන දෙවන පදය කියන ලදී.

(ආ) චතුක්කනයෙ පන, චතුෂ්කනයෙහි වනාහි; (දුතියාදිසු තීසු ඣානෙසු සි–යොදනු.)දුතියාදිසු, ද්විතීයාදි තුන්ධ්‍යානයෙහිද; පඤ්චකනයෙ ච, පඤ්චකනයෙහිද; තතියාදිසු තීසු ඣානෙසු, තෘතීයාදි තුන්

චාරාදිවසෙන තිවිධො. තතියතතිකෙ-චතුක්කනයෙ ආදිතො විසු පඤ්චකනයෙ ච තීසු ඣානෙසු එකග්ගතා පීතිසහගතො සමාධි, තෙසෙව තතියෙ චතුත්ථෙ ච ඣානෙ එකග්ගතා සුඛසහගතො සමාධි, අවසානෙ උපෙක්ඛා සහගතො. උපචාරසමාධි පන පීතිසුඛ සහගතො වා හොති උපෙක්ඛාසහගතොවාති එවං පීතිසහගතාදිවසෙන තිවිධො. චතුත්ථතතිකෙ-උපචාරභූමියං එකග්ගතා පරිත්තො සමාධි, රූපාවචරාරූපාවචර කුසලෙ එකග්ගතා මහග්ගතො සමාධි, අරියමග්ගසම්පයුත්තා එකග්ගතා අප්පමාණො සමාධීති-එවං පරිත්තමහග්ගතාප්පමාණවසෙන තිවිධො.

(අ) චතුක්කෙසු-පඨමචතුක්කෙ-අත්ථි සමාධි දුක්ඛාපටිපදො දන්ධාභිඤ්ඤො, අත්ථි සමාධි දුක්ඛාපටිපදො ඛිප්පාභිඤ්ඤො, අත්ථි සමාධි සුඛාපටිපදො දන්ධාභිඤ්ඤො, අත්ථි සමාධි සුඛාපටිපදො ඛිප්පාභිඤ්ඤොති,

---

ධ්‍යානයෙහිද; එකග්ගතා, එකාග්‍රතා තොමෝ; අවිතක්කාවිචාරො සමාධීති, අතර්කාවිචාර සමාධියයි;-තතියතතිකෙ, තෘතීයත්‍රිකයෙහි; චතුක්කනයෙ, චතුෂ්කනයෙහි; ආදිතො විසු, ආදියෙහි ධ්‍යානදෙක්හිද; පඤ්චකනයෙ, පඤ්චකනයෙහි; තීසු ඣානෙසු, ආදියෙහි තුන් ධ්‍යානයෙහිද; එකග්ගතා, එකාග්‍රතාතොමෝ; පීතිසහගතො සමාධි, ප්‍රීතිසහගත සමාධි නම් වේ; තෙසෙව, එම චතුෂ්කපඤ්චකනයෙහි; තතියෙ චතුත්ථෙ ච ඣානෙ එකග්ගතා, චතුෂ්කනයෙහි තෘතීයධ්‍යානයෙහි පඤ්චකනයෙහි චතුර්ථධ්‍යානයෙහි එකාග්‍රතාතොමෝ; සුඛසහගතො සමාධි, සුඛසහගත සමාධි නම් වේ; අවසානෙ, දෙනයෙහිම පර්‍යවසානවූ සතරවන පස්වන ධ්‍යානයෙහි එකාග්‍රතා තොමෝ; උපෙක්ඛාසහගතො, උපෙක්‍ෂාසහගත සමාධි නම් වේ; උපචාරසමාධි පන, උපචාරසමාධිය වනාහි; පීතිසුඛසහගතො වා හොති, ප්‍රීතිසුඛ දෙකින්ම සහගියා හෝ වෙයි; උපෙක්ඛාසහගතො වා, උපෙක්‍ෂාසහගියා හෝ වේ;-චතුත්ථතතිකෙ, සතරවන ත්‍රිකයෙහි; උපචාරභූමියං එකග්ගතා, උපචාරධ්‍යානසම්ප්‍රයුක්ත චිත්තොත්පාදයෙහි එකාග්‍රතා තොමෝ; (හේ වනාහි සහගත ධර්‍මයන්ට උත්පත්ති ස්ථාන බැවින් භූමියයි කියනුලැබේ.) පරිත්තො සමාධි, කාමාවචර සමාධි බැවින් පරිත්තසමාධි නම් වේ; රූපාවචරාරූපාවචර කුසලෙ එකග්ගතා, රූපාවචර අරූපාවචර කුශලයෙහි එකාග්‍රතාතොමෝ; මහග්ගතො සමාධි, මහද්ගතසමාධි නම් වේ; අරියමග්ගසම්පයුත්තා එකග්ගතා, ආර්‍ය්‍යමාර්ග සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාතොමෝ; අප්පමාණො සමාධීති, අප්‍රමාණ සමාධි නම් වෙයි.පෙ.

(අ) චතුක්කෙසු,චතුෂ්කයන්කෙරෙහි; පඨමචතුක්කෙ, ප්‍රථමචතුෂ්කයෙහි දුක්ඛාපටිපදො, දුඃඛවූ ප්‍රතිපත්ති ඇති; දන්ධාභිඤ්ඤො, ලස්වූ ඥාන ඇති; සමාධි අත්ථි, සමාධියෙක් ඇති; දුක්ඛාපටිපදො, දුඃඛවූ ප්‍රතිපත්ති ඇති; ඛිප්පාභිඤ්ඤො, තීක්‍ෂණවූ ඥාන ඇති; සමාධි අත්ථි, සමාධියෙක් ඇති; සුඛාපටිපදො, සුඛප්‍රතිපත්ති ඇති; දන්ධාභිඤ්ඤො, ලස්වූ ඥාන

(අ) තත්‍ථ, පඨමසමන්නාහාරතො පට්ඨාය යාව තස්ස තස්ස ඣානස්ස උපචාරං උප්පජ්ජති, තාව පවත්තා සමාධිභාවනා පටිපදාති වුච්චති, උපචාරතො පන පට්ඨාය යාව අප්පණා තාව පවත්තා පඤ්ඤා අභිඤ්ඤාති වුච්චති. සා පනෙසා පටිපදා එකච්චස්ස දුක්ඛා හොති, නීවරණාදිපච්චනීකධම්මසමුදාචාරගහණතාය කිච්ඡා, අසුඛසෙවනාති අත්‍ථො, එකච්චස්ස තදභාවෙන සුඛා අභිඤ්ඤාපි එකච්චස්ස දන්‍ධා හොති මන්‍දා අසීඝප්පවත්තිනී, එකච්චස්ස ඛිප්පා අමන්‍දා සීඝප්පවත්තිනී තත්‍ථ යානි පරතො සප්පායාසප්පායානි ච පලිබොධුපච්ඡෙදාදීනි පුබ්බකිච්චානි ච අප්පණා කොසල්ලානි ච වණ්ණයිස්සාම තෙසු යො අසප්පායසෙවී හොති, තස්ස දුක්ඛාපටිපදා දන්‍ධා ච අභිඤ්ඤා හොති. සප්පායසෙවිනො

---

ඇති; සමාධි අත්‍ථි, සමාධියෙක් ඇති; සුඛාපටිපදෙ, සුඛප්‍රතිපත්ති ඇති; ඛිප්පාභිඤ්ඤෙ, තීක්ෂණවූ ඥාන ඇති; සමාධි අත්‍ථි, සමාධියෙක් ඇති.

(අ) තත්‍ථ, ඒ චතුෂ්කයෙහි; පඨමසමන්නාහාරතො පට්ඨාය, (භාවනාරම්භය කරන්නහුගේ "පඨවී පඨවී" යනාදීන් කරන කම්මට්ඨානයෙහි) ප්‍රථමාභිනිවෙසයෙහි පටන්; යාව, යම් තාක්; තස්ස තස්ස ඣානස්ස උපචාරං උප්පජ්ජති, ඒ ඒ ධ්‍යානයාගෙ උපචාරය උපදීද; තාව, ඒ තාක්; පවත්තා සමාධිභාවනා, (ඒ උපචාරයට පූර්වයෙහි) ප්‍රවෘත්තවූ සමාධිභාවනාතොමෝ; පටිපදාති වුච්චති, පටිපදා නමැයි කියනු ලැබේ; උපචාරතො පන පට්ඨාය, උපචාරයෙහි පටන් ගෙන වනාහි; යාව අප්පණා, යම්තාක් අර්පණාව උපදීද; තාව, ඒතාක්; පවත්තා පඤ්ඤා; (ඒ අර්පණාවට පූර්වයෙහි) උපන් තාක් ප්‍රඥාතොමෝ; අභිඤ්ඤා, අභිඥා නමු;-(පූර්වභාග ප්‍රඥාවටම අභිඥාභාවය කිවද අර්පණාප්‍රඥාවද අභිඥා නම් වේ. "**යදග්ගෙන හි පුබ්බභාගපඤ්ඤාය දන්‍ධසීඝතා තදග්ගෙන අප්පණා පඤ්ඤාය**" යනු ටීකා බැවින්.) සා පනෙසා පටිපදා, ඒ මේ ප්‍රතිපත්තිතොමෝ; එකච්චස්ස, එකක්හට; දුක්ඛා හොති, දුක් වේ; නීවරණාදි පච්චනීකධම්මං, නීවරණ විතර්ක විචාරාදි ප්‍රතිපක්ෂධර්මයන්ගෙ; සමුදාචාර ගහණතාය, සමුදාචාරය ගහණ බැවින්; (ප්‍රවෘත්ති බහුල බැවින යන අර්ථයි.) කිච්ඡා, කෘච්ඡ්‍රය; අසුඛසෙවනාති අත්‍ථො, නොසුවවූ භාවනා ඇත්තීය යන අර්ථයි; එකච්චස්ස, සමහරක් හට; තදභාවෙන, ප්‍රත්‍යනීක ධර්ම සමුදාචාරගහණ නොවන බැවින්; සුඛා, සුව වේ; අභිඤ්ඤාපි, අභිඥාද; එකච්චස්ස, එකක්හට; දන්‍ධා හොති, ලස්වෙයි; මන්‍දා, මඳවෙයි; අසීඝප්පවත්තිනී, ශීඝ්‍රව නොපවතී; එකච්චස්ස, එකක්හට; ඛිප්පා, ක්ෂිප්‍ර වෙයි; අමන්‍දා, මඳනොවෙයි; සීඝප්පවත්තිනී, ශීඝ්‍රව පවතී; තත්‍ථ, ඒ ප්‍රතිපදාභිඥාවන් කෙරෙහි; යානි, යම්; පරතො, මත්තෙහි; සප්පායාසප්පායානි ච, සැපනොසැප කෙනෙක්ද; පලිබොධුපච්ඡෙදාදීනි, පලිබොධූපච්ඡෙද භාවනා විධානයාගෙ අපරිහානිය යනාදි; පුබ්බකිච්චානි ච, පූර්වකෘත්‍යයන්ද; අප්පණාකොසල්ලානි ච වණ්ණයිස්සාම, අර්පණා කෞශල්‍යයන්ද වර්ණනාකරමො ද; තෙසු, ඔවුන් කෙරෙහි; යො අසප්පායසෙවී හොති, යමෙක් ආවාසාදී සත්වණක් නොසැප සෙවීද;

සුඛාපටිපදා ඛිප්පා ච අභිඤ්ඤා. යො පන පුබ්බභාගෙ අසප්පායං සෙවිත්වා අපරභාගෙ සප්පායසෙවී හොති, පුබ්බභාගෙ වා සප්පායං සෙවිත්වා අපරභාගෙ අසප්පායසෙවී, තස්ස වොමිස්සකතා වෙදිතබ්බා. තථා පලිබොධුපච්ඡෙදාදිකං පුබ්බකිච්චං අසම්පාදෙත්වා භාවනමනුයුත්තස්ස දුක්ඛාපටිපදා හොති. විපරියයෙන සුඛා෴

(අ) අප්පණාකොසල්ලානි පන අසම්පාදෙන්තස්ස දන්ධාභිඤ්ඤා හොති, සම්පාදෙන්තස්ස ඛිප්පා, අපි ච තණ්හාඅවිජ්ජාවසෙන සමථවිපස්සනාධිකාරවසෙන වාපි එතාසං පභෙදො වෙදිතබ්බො:-තණ්හාභිභූතස්ස හි දුක්ඛා පටිපදා හොති. අනභිභූතස්ස සුඛා. අවිජ්ජාභිභූතස්ස හි දන්ධාභිඤ්ඤා හොති, අනභිභූතස්ස ඛිප්පා. යො ච සමථෙ අකතාධිකාරො,

---

තස්ස, ඔහට; දුක්ඛාපටිපදා, දුක්වූ ප්‍රතිපත්තිය වෙයි; දන්ධා ච අභිඤ්ඤා හොති, ලස්වූ අභිඥද වෙයි; සප්පායසෙවිනො, උක්තප්‍රකාරයෙන් සැපසෙවුනාහට; සුඛාපටිපදා, සුව වූ ප්‍රතිපත්ති වෙයි; ඛිප්පා ච අභිඤ්ඤා, ක්ෂිප්‍ර වූ අභිඥා ද වෙයි; යො පන, යමෙක් වනාහි; පුබ්බභාගෙ අසප්පායං සෙවිත්වා, පූර්වභාගයෙහි නොසැප සෙව; අපරභාගෙ සප්පාය සෙවී හොති,අපරභාගයෙහි සැප සෙවුනේද;-තස්ස,ඔහට;වොමිස්සකතා, (පළමු කොට නොසැප සෙව පසුව සැප සෙවියහුට දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා වෙයි පළමුකොට සැපසෙව පසුව නොසැප සෙවියහුට සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා වෙයි. මෙසේ ප්‍රථම චතුර්ථයන් හා ද්විතීය තෘතීය යන්ගේ) මිශ්‍රබව; වෙදිතබ්බා, දතයුතුයි; තථා, එසේම; පලිබොධුපච්ඡෙදාදිකං පුබ්බකිච්චං, පලිබොධ පසිඳීම් ආදි පූර්වකෘත්‍යය; අසම්පාදෙත්වා, නොසපයා; භාවනමනුයුත්තස්ස, භාවනායෙහි යෙදුනහුට; දුක්ඛාපටිපදා හොති, පරිපන්ථයන් ඇති බැවින් දුක්වූ ප්‍රතිපත්ති වේ; විපරියයෙන, පලිබොධ පසිඳීම් ආදිවූ පූර්වකෘත්‍යය සැපවූවාහට පරිපන්ථ නැති බැවින්; සුඛා, සුව වේ෴

(අ) අප්පණාකොසල්ලානි පන අසම්පාදෙන්තස්ස, දශවිධ අර්පණා කෞශල්‍යයන් නො සපයන්නාහට; දන්ධාභිඤ්ඤා හොති, ඥානය අවිසද බැවින් ලස්වූ අභිඥා වේ; සම්පාදෙන්තස්ස, ඒ දශවිධ අර්පණාකෞශල්‍ය යන් සපයන්නාහට; ඛිප්පා [භිඤ්ඤා], ඥානය විසදවන හෙයින් ක්ෂිප්‍රවූ අභිඥාවේ; අපි ච, අනිකෙකුදු ඇත්; තණ්හා අවිජ්ජාවසෙන, තෘෂ්ණා අවිද්‍යා දෙදෙනාගේ අභිභවන අනභිභවනවශයෙන්; සමථවිපස්සනාධිකාරවසෙනවාපි, සමථවිදර්ශනාවෙහි අභියොගවශයෙන්ද; එතාසං, මොවුන්ගේ; පභෙදො වෙදිතබ්බො,ප්‍රභෙදය දතයුත්තේයි. තණ්හාභිභූතස්ස, වැඩිසිටි තෘෂ්ණා ඇත්තහුට; (තෘෂ්ණාධිකයහටයයි සේයි.) දුක්ඛා පටිපදා හොති, තෘෂ්ණාව සමාධියට සෘජුප්‍රතිපක්ෂ බැවින් දුක්වූ ප්‍රතිපත්තිවේ; අනභිභූතස්ස, වැඩිසිටිතෘෂ්ණා නැත්තාහට; සුඛා, සුවවේ; අවිජ්ජාභිභූතස්ස, වැඩිසිටි අවිද්‍යාඇත්තාහට; දන්ධාභිඤ්ඤා හොති (අවිද්‍යාව ප්‍රඥාවට සෘජු ප්‍රතිපක්ෂ බැවින්) ලස්වූ අභිඥාවෙයි; අනභිභූතස්ස, වැඩිසිටි අවිද්‍යානැත්තාහට; ඛිප්පා, ක්ෂිප්‍රවූ අභිඥාවෙයි;

තසස දුකඛා පටිපදා හොති, කතාධිකාරසස සුඛා, යො පන විපසස
නාය අකතාධිකාරො හොති, තසස දන්ධාභිඤ්ඤා හොති. කතාධි
කාරසස ඛිපපා, කිලෙසින්ද්‍රියවසෙනවාපි එතාසං පභෙදො වෙදි
තබෙබා:- තිබබකිලෙසසස හි මුදින්ද්‍රියසස දුකඛා පටිපදා හොති දන්ධා ච
අභිඤ්ඤා, තිකඛින්ද්‍රියසස පන ඛිපපාභිඤ්ඤා, මන්දකිලෙසසස ච මුදින්ද්‍රි
යසස සුඛාපටිපදා හොති දන්ධා ච අභිඤ්ඤා, තිකඛින්ද්‍රියසස පන ඛිපපා
අභිඤ්ඤාති-ඉති ඉමාසු පටිපදාභිඤ්ඤාසු යො පුගගලො දුකඛාය පටි
පදාය දන්ධාය ච අභිඤ්ඤාය සමාධිං පාපුණාති, තසස සො සමාධි දුකඛා
පටිපදො දන්ධාභිඤ්ඤොති වුචචති. එසනයො සෙසතතයෙපීති එවං
දුකඛාපටිපදා දන්ධාභිඤ්ඤාදිවසෙන චතුබබිධො.

---

යො ච, යමෙක්වනාහි; සමථෙ අකතාධිකාරො, සමථයෙහි (භවාන්තර
යෙහි) නොකරනලද පරිචයඇත්තේද; (සන්නයෙහි ඉක්බිති ජාති
යෙහි නොකළ අභියොග ඇත්තේදැයි කීහු.) තසස, ඔහට; දුකඛා
පටිපදා හොති, දුඃඛප්‍රතිපත්තිවේ; කතාධිකාරසස, (භවාන්තරයෙහි)
කරනලද පරිචයඇත්තාහට; සුඛා, සුවවේ; යො පන, යමෙක් වනාහි;
විපසසනාය අකතාධිකාරො හොති, විදර්ශනාවෙහි (භවාන්තරයෙහි)
නොකරනලද පරිචය ඇත්තේවීනම්; තසස, ඔහට; දන්ධාභිඤ්ඤා
හොති, ලස්වූ අභිඥා වේ; කතාධිකාරසස, කරනලද පරිචයඇත්තාහට;
ඛිපපා, ක්ෂිප්‍රවූ අභිඥා වේ; කිලෙසින්ද්‍රියවසෙන වාපි, (තීක්ෂණාතීක්ෂණ)
කෙලශයන් හා ඉන්ද්‍රියයන්ගේ වශයෙන්ද; එතාසං, මේ ප්‍රතිපදාභිඥ
වන්ගේ; පභෙදො වෙදිතබෙබා, ප්‍රභෙදය දතයුත්තේයි:- තිබබකිලෙසසස
හි, තීව්‍රවූකාමච්ඡන්දාදි කෙලශයන් ඇති; මුදින්ද්‍රියසස, මෘදුවූශ්‍රද්ධාදි
ඉන්ද්‍රියයන් ඇත්තාහට; දුකඛාපටිපදා හොති, දුඃඛවූ ප්‍රතිපත්තිය වේ;
දන්ධා ච අභිඤ්ඤා, ලස්වූ අභිඥාද වේ; තිකඛින්ද්‍රියසස පන, තීක්ෂණවූ
ඉන්ද්‍රියයන්ඇත්තාහට වනාහි; ඛිපපාභිඤ්ඤා, ක්ෂිප්‍රවූ අභිඥාවේ; මන්ද
කිලෙසසස මුදින්ද්‍රියසස ච, මඳවූ කෙලෙසුන්ඇති මෘදුවූ ඉඳුරන්
ඇත්තාහට ද; සුඛාපටිපදා හොති, සුවවූ ප්‍රතිපදාවෙයි; දන්ධා ච
අභිඤ්ඤා, ලස්වූඅභිඥාද වේ; තිකඛින්ද්‍රියසස පන, තීක්ෂණවූ ඉන්ද්‍රියයන්
ඇත්තාහට වනාහි; ඛිපපාඅභිඤ්ඤාති, ක්ෂිප්‍රවූඅභිඥා වේයයි; ඉති, මෙසේ;
ඉමාසු පටිපදාභිඤ්ඤාසු, මේ ප්‍රතිපදාභිඥාවන්කෙරෙහි; යො පුගගලො,
යම් පුද්ගලයෙක්; දුකඛාය පටිපදාය, දුකඛප්‍රතිපත්තියෙන්ද; දන්ධාය ච
අභිඤ්ඤාය, ලස්වූ අභිඥාවෙන්ද; සමාධිං පාපුණාති, සමාධියට පැමි
ණේද; තසස, ඔහුගේ; සො සමාධි, ඒ සමාධිය; දුකඛා පටිපදො,
දුක්වූ පිළිවෙත් ඇත්තේය; දන්ධාභිඤ්ඤොති, ලස්වූ අභිඥා ඇත්තේ
යයි; වුචචති, කියනුලැබෙයි; එසනයො සෙසතතයෙපීති, දුකඛා පටි
පදො ඛිපපාභිඤ්ඤො යනාදි සෙසු තුනෙහිදු මෙම නයයි; එවං, මෙසේ;
දුකඛාපටිපදා දන්ධාභිඤ්ඤාදිවසෙන, දුකඛාපටිපදා දන්ධාභිඤ්ඤාදි වශ
යෙන්; චතුබබිධො, සතරප්‍රකාර වේ.

(ඈ) දුතියචතුක්කෙ-අත්ථි සමාධි පරිත්තො පරිත්තාරම්මණො, අත්ථි සමාධි පරිත්තො අප්පමාණාරම්මණො, අත්ථි සමාධි අප්පමාණො පරිත්තාරම්මණො, අත්ථිසමාධි අප්පමාණො අප්පමාණාරම්මණොති, තත්ථ යො සමාධි අප්පගුණො උපරිඣානස්ස පච්චයො භවිතුං න සක්කොති, අයං පරිත්තො යො පන අවඩ්ඪිතෙ ආරම්මණෙ පවත්තො අයම්පි පරිත්තාරම්මණො, යො පගුණො සුභාවිතො උපරි ඣානස්ස පච්චයො භවිතුං සක්කොති, අයං අප්පමාණො, යො ච වඩ්ඪිතෙ ආරම්මණෙ පවත්තො, අයං අප්පමාණාරම්මණො, වුත්තලක්ඛණවොමිස්සකතාය පන වොමිස්සකනයො වෙදිතබ්බොති-එවං පරිත්තපරිත්තාරම්මණාදිවසෙන චතුබ්බිධො.

---

(ඈ) දුතියචතුක්කෙ, දෙවන චතුෂ්කයෙහි; පරිත්තො, අප්‍රගුණවූ; පරිත්තාරම්මණො, නොවැඩූ අරමුණු ඇති; ("සමාධි අත්ථි" යොදනු— සමාධියෙක් ඇත යන අර්ථයි; මතුයෙහිදු මෙම නයයි.)-අප්පමාණො, මහත්වූ; (සුභාවිතවූ යන අර්ථයි.)-අප්පමාණාරම්මණො, වැඩූ අරමුණු ඇති...පෙ...තත්ථ, ඒ චතුෂ්කයෙහි; යො සමාධි, යම් සමාධියෙක්; අප්පගුණො, මනාකොට නොවඩනලද්දේ; (වසීතාවට නොපමුණුවන ලද්දේ යයි සේයි.) උපරිඣානස්ස පච්චයො භවිතුං න සක්කොති, මතුයෙහි ධ්‍යානයකට ප්‍රත්‍යයවන්නට නොපොහොසත්ද; අයං, මේ සමාධිතෙමෙ; පරිත්තො, අල්පානුභාව බැවින් පරිත්ත නම් වේ;- අවඩ්ඪිතෙ ආරම්මණෙ,(අඟලක් දෙඅඟලක් පමණද) නොවඩනලද කිසුණු අරමුණෙහි;-(අඟලක් දෙඅඟලකුදු වැඩූ අරමුණෙහි අප්‍රමාණයයිම යෙත්."පගුණො සුභාවිතො"යි කියා නැවත"උපරිඣානස්ස පච්චයො භවිතුං සක්කොති"යි යන මෙයින් ප්‍රගුණවූද සමාධියතෙමේ මත්තෙහි ධ්‍යානයට ප්‍රත්‍යයවන්නට අසමර්ථවූයේ පරිත්ත නම් වේද අප්‍රමාණ නම් නොවේද එසේම ඤාණොත්තරයොගීහු එක අස්නෙහිම හිඳ මතුයෙහි ධ්‍යානයන් උපදවන කල්හි නාතිසුභාවිතවූ සමාධිය තෙමේ මතුයෙහි ධ්‍යානයට ප්‍රත්‍යයභාව සඞ්ඛ්‍යාත සුභාවිත කෘත්‍ය සිද්ධියෙන් අප්‍රමාණයයිම කියනුලැබේ. සමහරු වනාහි ඉදින් සුභාවිත වී නම් මතුයෙහි ධ්‍යානයට ප්‍රත්‍යය නොවන්නේද ප්‍රමාණකර රාගාදීන්ට අතිදූරබැවින් අප්‍රමාණ නම් වෙයි සේයි.) යො, යම් සමාධියෙක් තෙමේ; පගුණො, ප්‍රගුණද; සුභාවිතො, මනා කොට බවනලදද; උපරිඣානස්ස පච්චයො භවිතුං සක්කොති, මතුයෙහි ධ්‍යානයට ප්‍රත්‍යය වන්නට පොහොසත්ද; අයං, මේ සමාධිය; අප්පමාණො, අප්‍රමාණ නම; යො ච, යමෙක් වනාහි; වඩ්ඪිතෙ ආරම්මණෙ පවත්තො, වැඩූ අරමුණෙහි ප්‍රවෘත්තද; අයං, මේ සමාධිය; අප්පමාණාරම්මණො, අප්‍රමාණාරම්මණ නම්; වුත්තලක්ඛණවොමිස්සකතාය පන, ප්‍රථම චතුර්ථ සමාධීන්ට කියනලද ලක්‍ෂණයන්ගේ ව්‍යතිමිශ්‍රක නයින් වනාහි; වොමිස්සකනයො වෙදිතබ්බො, ද්විතීය තෘතීය සමාධිසඞ්ග්‍රාහකවූ ව්‍යතිමිශ්‍රකනය දතයුතු; එවං, මෙසේ; පරිත්තපරිත්තාරම්මණාදිවසෙන, පරිත්තපරිත්තාරම්මණාදි වශයෙන්; චතුබ්බිධො, චතුර්විධ වේ.

(අ) තතියචතුක්කෙ–වික්ඛම්භිතනීවරණානං විතක්කවිචාර පීතිසුඛ සමාධීනං වසෙන පඤ්චඞ්ගිකං පඨමං ඣානං, තතො වූපසන්තවිතක්ක විචාරං තිවඞ්ගිකං දුතියං, තතො විරත්තපීතිකං දුවඞ්ගිකං තතියං, තතො පහීණසුඛඋපෙක්ඛාවෙදනාසහිතස්ස සමාධිනො වසෙන දුවඞ්ගිකං චතුත්ථං. ඉති ඉමෙසං චතුන්නං ඣානානං අඞ්ගභූතා චත්තාරො සමාධී හොන්ති. එවං චතුජ්ඣානඞ්ගවසෙන චතුබ්බිධො. චතුත්ථ චතුක්කෙ–අත්ථි සමාධි හානභාගියො, අත්ථි ඨිතිභාගියො, අත්ථි විසෙසභාගියො, අත්ථි නිබ්බෙධභාගියොති. තත්ථ පච්චනීකසමුදාචාරවසෙන හානභාගියතා, තදනුධම්මතාය සතියා සණ්ඨානවසෙන ඨිතිභාගියතා, උපරි විසෙසාධිගමවසෙන විසෙසභාගියතා, නිබ්බිදාසහගතසඤ්ඤාමනසිකාරසමුදාචාරවසෙන නිබ්බෙධභාගියතා ච වෙදිතබ්බා.

---

(අ) තතියචතුක්කෙ, තෘතීය චතුෂ්කයෙහි; වික්ඛම්භිතනීවරණානං, විෂ්කම්භනය කරනලද නීවරණයන් ඇති; විතක්කවිචාරපීතිසුඛ සමාධීනං වසෙන, විතර්කවිචාරප්‍රීතිසුඛ සමාධීන්ගේ වශයෙන්; පඤ්චඞ්ගිකං, පඤ්චාඞ්ගයක් ඇති; පඨමං ඣානං, ප්‍රථමධ්‍යානය; තතො, ඒ ප්‍රථම ධ්‍යානයෙන් ඉක්බිතිවූ; වූපසන්තවිතක්කවිචාරං, සන්හුන්නාවූ විතර්ක විචාරයන් ඇති; තිවඞ්ගිකං, තුන් අඟක් ඇති; දුතියං, ද්විතීයධ්‍යාන යයි; තතො, ඉක්බිත්තෙන්; විරත්තපීතිකං, විරක්තවූ (අතික්‍රාන්තවූ) ප්‍රීති ඇති; දුවඞ්ගිකං, දෙයඟක් ඇති; තතියං, තුන්වන ධ්‍යානය; තතො, එයින්; පහීණසුඛ, ප්‍රහීණවූ සුඛවෙදනා ඇති; උපෙක්ඛාවෙදනාසහිතස්ස සමාධිනො වසෙන, උපෙක්ෂාවෙදනා සහිතවූ සමාධිහුගේ වශයෙන්; දුවඞ්ගිකං චතුත්ථං, දෙයඟක් ඇති සතරවන ධ්‍යානයයි; ඉති, මෙසේ; ඉමෙසං චතුන්නං ඣානානං අඞ්ගභූතා, (සෙනාඞ්ගය රථාඞ්ගය යනු මෙන්)සතරධ්‍යානයන්ට අඞ්ගවූ; චත්තාරො සමාධී හොන්ති, සතරසමාධීහු වෙත්; එවං, මෙසේ; චතුජ්ඣානඞ්ග වසෙන, සතරධ්‍යානයට අඞ්ගවශයෙන්; චතුබ්බිධො, චතුර්විධ වේ.— හානභාගියො, පරිහානිය සෙවුනාවූ; ඨිතිභාගියො, ස්ථිතිය සෙවුනා වූ;–විසෙසභාගියො, විශෙෂය සෙවුනා වූ;–නිබ්බෙධභාගියො, නිර්වේධය සෙවුනාවූ;–තත්ථ, ඒ චතුර්විධ නයෙහි; පච්චනීකසමුදාචාර වසෙන, ඒ ඒ ධ්‍යානයට ප්‍රතිපක්ෂවූ නීවරණවිතර්කවිචාරාදීන්ගේ ප්‍රවෘත්ති වශයෙන්; හානභාගියතා, හානභාගියබව; ("වෙදිතබ්බා"යි යෙ: දනු.) තදනුධම්මතාය සතියා, තදනුරූපවූ ස්මෘතියගේ; සණ්ඨානවසෙන, පිහිටීම් වශයෙන්; ඨිතිභාගියතා, ස්ථිතිභාගියබව; (ස්මෘති නම් ඒ ඒ ධ්‍යානයට නිසිවූ ධ්‍යානනිකාන්ති තෘෂ්ණා වෙයි. "තදස්සාදසම්පයුත්තතණ්හාසඞ්ඛාතා වා මිච්ඡාසති" යනු විභඞ්ගඅටුවායි ටීකාචාර්‍ය්‍යයෝ ලදධ්‍යානයෙහි සාපෙක්ෂයා මතුයෙහි විශෙෂාධිගමයට නොපෝසත් වන බැවින් අවිගතවූ නිකාන්ති ඇති තද් තද් ධ්‍යානපරිහරණයකරන ස්මෘතියම සතියයිදු කියත් වටි. එහෙයින්ම "සතියා වා" "නිකාන්ති

(අ) යථාහ:-"පඨමස්ස ඣානස්ස ලාභිනො කාමසහගතසඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති හානභාගිනී පඤ්ඤා, තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගිනී පඤ්ඤා, අවිතක්කසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤා, නිබ්බිදාසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා නිබ්බෙධභාගිනී පඤ්ඤාති තාය පන පඤ්ඤාය සම්පයුත්තා සමාධීපි චත්තාරො හොන්තී"ති එවං හානභාගියාදිවසෙන චතුබ්බිධො.

(ආ) පඤ්චමචතුක්කෙ- කාමාවචරසමාධි- රූපාවචරො- අරූපාවචරො-අපරියාපන්නොති එවං චත්තාරො සමාධී. තත්ථ සබ්බාපි උපචාරෙකග්ගතා කාමාවචරසමාධි, රූපාවචරාදි කුසලචිත්තෙකග්ගතා

---

යා වා"යන විකල්පවචනය ද යුක්ත වෙයි යෙත්.) උපරිවිසෙසාධිගම වසෙන, මතුයෙහි විශෙෂාධිගමයට ප්‍රත්‍යයභාව වශයෙන්; (විශෙෂභාගීබව නොහොත් "විසෙසං වා අධිගච්ඡති එතෙනාති විසෙසාධිගමො තස්ස වසෙන"යි ගන්නේ.) නිබ්බිදාසහගත සඤ්ඤාමනසිකාර සමුදාචාරවසෙන, ආදීනවදර්ශනය පෙරදැරි කොට ඇති නිර්වේධඥානසම්ප්‍රයුක්ත සංඥමනසකාර දෙදෙනාගේ ප්‍රවෘත්ති වශයෙන්;(සංඥ වශයෙන් ජවන්සිත් ගත්හ. මනසිකාර යනුයෙන් ජවනයට පෙර අවජුන් සිත්ගත්හු.) නිබ්බෙධභාගියතා ච වෙදිතබ්බා, නිර්වේධභාගිය බවද දතයුතු; (සත්‍යනිර්වේධය හෙවත්: ප්‍රතිවෙධය කරන විදර්ශනාවට කාරණ හෙයින් නිර්වේධභාගී බව දතයුතුයයි සේයි.

(අ) යථාහ, වදාළේමැනු; පඨමස්ස ඣානස්ස ලාභිනො, ප්‍රථමධ්‍යාන ලාභීහට; කාමසහගතසඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති, කාමාසවාද යෙන් කාමාලම්බනවූ සංඥමනසකාරයෝ පවතිත් නම්; හානභාගිනී පඤ්ඤා, පරිහානිය සෙවුනා ප්‍රඥ වේ; තදනුධම්මතා සති සන්තිට්ඨති, තදනුරූපවූ සමෘතිය සිටී නම්; ඨිතිභාගිනී පඤ්ඤා, සම්තිය සෙවුනා ප්‍රඥ වේ; අවිතක්කසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති, (විතර්ක සහගත ධ්‍යානය කෙසේ වේදැයි හෝයි මෙසේ)අවිතර්කාලම්බනවූ සංඥ මනසකාරයෝ පවතිත් නම්; විසෙසභාගිනී පඤ්ඤා [හොති], මතුයෙහි විශෙෂය සෙවුනාවූ ප්‍රඥ වේ; නිබ්බිදා සහගතා, නිර්වේදසහගතවූ; සඤ්ඤාමනසිකාරා, සංඥ මනසකාරයෝ; විරාගූපසංහිතා, බලවත් විදර්ශනාව හා යුක්තවූවාහු; සමුදාචරන්ති, පවතිත් නම්; නිබ්බෙධ භාගිනී පඤ්ඤාති, නිර්වේධයසෙවුනා ප්‍රඥ වේ; තාය පන පඤ්ඤාය සම්පයුත්තා, ඒ ප්‍රඥව හා සැපියයුතුවූ; සමාධී පි, සමාධිහු; චත්තාරොව හොන්ති, සතරදෙනෙක්ම වෙත්;—

(ආ) කාමාවචරො සමාධි, කාමාවචරසමාධිය;රූපාවචරො,රූපාවචර සමාධිය; අරූපාවචරො, අරූපාවචර සමාධිය; අපරියාපන්නොති, ලොකොත්තර සමාධියයි; එවං, මෙසේ; චත්තාරො සමාධී, සතර සමාධි කෙනෙක් වෙත්; තත්ථ, එහි; සබ්බාපි උපචාරෙකග්ගතා, සියලු උප

ඉතරෙ තයොති–එවං කාමාවචරාදිවසෙන චතුබ්බිධො. ඡට්ඨචතුක්කෙ–"ඡන්දඤ්චෙ භික්ඛු අධිපතිං කරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං, අයං වුච්චති ඡන්දසමාධි, විරියඤ්චෙ භික්ඛු…පෙ…චිත්තඤ්චෙ භික්ඛු…පෙ…වීමංසඤ්චෙ භික්ඛු අධිපතිං කරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං, අයං වුච්චති වීමංසා සමාධී"ති එවං අධිපතිවසෙන චතුබ්බිධො…

(ඇ) පඤ්චකෙ–යං චතුක්කභෙදෙ වුත්තං දුතියං ඣානං, තං විතක්කමත්තාතික්කමෙන දුතියං. විතක්කවිචාරාතික්කමෙන තතියන්ති එවං විධා භින්දිත්වා පඤ්චජ්ඣානානි වෙදිතබ්බානි. තෙසං අඞ්ගභූතා ච පඤ්ච සමාධීති එවං පඤ්චජ්ඣානඞ්ගවසෙන පඤ්චවිධතා වෙදිතබ්බා…

(ඈ) කොචස්ස සඞ්කිලෙසො කිං වොදානන්ති එත්ථ පන විස්සජ්ජනං විභඞ්ගෙ වුත්තමෙව. වුත්තං හි තත්ථ:–"සඞ්කිලෙසන්ති හානභාගියො ධම්මො, වොදානන්ති විසෙසභාගියො ධම්මො"ති. තත්ථ පඨමස්ස

---

චාරධ්‍යානයෙහි එකාග්‍රතාතොමෝ; කාමාවචරෙ සමාධි, කාමාවචර සමාධි නමි; (සෙසු කාමාවචර සමාධි ඇත්ද හේ මෙහි භාවනාමය සමාධීහු අභිමත බැවින් "උපචාරෙකග්ගතා කාමාවචරෙ සමාධි"යි කීහු.) රූපාවචරාදි කුසලචිත්තෙකග්ගතා, රූපාවචරාදිවූ කුශල චිත්තෛකාග්‍රතා තොමෝ; ඉතරෙ තයොති, රූපාවචර අරූපාවචර අපරියාපන්න සමාධීහු තුන්දෙනයයි; එවං, මෙසේ; කාමාවචරාදි වසෙන චතුබ්බිධො, කාමාවචරාදි විසින් සතරප්‍රකාර වේ;–භික්ඛු, මහණ තෙමේ; චෙ, ඉදින්; ඡන්දං, ඡන්දය; අධිපතිං කරිත්වා, (ඡන්දවත්හට සමාධි වේ නම් මටමවන්නේයයි ඡන්දය) ජ්‍යෙෂ්ඨ කොට; සමාධිං ලභති, සමාධිය ලැබේ නම්; ලභති චිත්තස්ස එකග්ගතං, චිත්තෛකාග්‍රතාව ලැබේ නම්; අයං, මෙතෙමෙ; ඡන්දසමාධීති වුච්චති, ඡන්දාධිපති සමාධියයි කියනු ලැබේ; වීමංසං, ප්‍රඥාව…පෙ…

(ඇ)–චතුක්කභෙදෙ, චතුෂ්කවශයෙන් සමාධිප්‍රභෙද නිර්දේශයෙහි; යං දුතියං ඣානං වුත්තං, යම් දෙවනධ්‍යානයෙක් කියනලද්ද; තං, හේ; විතක්කමත්තාතික්කමෙන, විතර්කමාත්‍රයාගේ ඉක්මීමෙන්; දුතියං, ද්විතීය නම් වෙයි; විතක්කවිචාරාතික්කමෙන තතියන්ති, විතර්කවිචාර දෙදෙනාගේ ඉක්මීමෙන් තෘතීය නම් වෙයි; එවං, මෙසේ; විධා භින්දිත්වා, දෙකක් කොට බිඳ; පඤ්චජ්ඣානානි වෙදිතබ්බානි, පඤ්චධ්‍යානයෝ දතයුත්තාහුයි; (සෙසු තැන්හි සම්ප්‍රයොග වශයෙන් විචාරය හා සමග පවත්නාවූ විතර්කය පඤ්චකනයෙහි ද්විතීයධ්‍යානයෙහි වෙන්කරනලද්දයේද සුට්ඨුවියොජිත නොවේනුයි ඔහු හා සමගම විචාරසමතික්‍රමණය දක්වන පිණිස "විතක්ක විචාරාතික්කමෙන"කී හයි දන්නේ.) තෙසං අඞ්ගභූතා පඤ්චසමාධීති ච, පඤ්චධ්‍යානයන්ට අඞ්ගවූ පස සමාධිහයි; එවං, මෙසේ පඤ්චධ්‍යානයන්ට අඞ්ගභාව වසයෙන්; පඤ්චවිධතා, සමාධිහුගේ පඤ්චවිධ බව; වෙදිතබ්බා, දතයුතු…

(ඈ) "කොචස්ස සඞ්කිලෙසො කිං වොදානං" යන මෙහි වනාහි; විස්සජ්ජනං, විසඳීම; විභඞ්ගෙ, ඥානවිභඞ්ගයෙහි; ("ඣානසමාධි සමාපත්තීනං සඞ්කිලෙසං වොදානං" යන තැන) වුත්තමෙව, කියනලද මැයි;

ඣානස්ස ලාභිං කාමසහගතසඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති හාන භාගිනී පඤ්ඤාති ඉමිනා නයෙන හානභාගියො ධම්මො වෙදිතබ්බො. අවිතක්කසහගතා සඤ්ඤා මනසිකාරා සමුදාචරන්ති විසෙසභාගිනී පඤ්ඤාති ඉමිනා නයෙන විසෙසභාගියො ධම්මො වෙදිතබ්බො.

(ඇ) කථං භාවෙතබ්බොති-එත්ථ පන යො තාව අයං ලොකිය ලොකුත්තරවසෙන දුවිධොති ආදිසු අරියමග්ගසම්පයුත්තො සමාධි වුත්තො, තස්ස භාවනානයො පඤ්ඤා භාවනානයෙනෙව සඞ්ගහිතො.

---

තත්, ඒ විභඞ්ගයෙහි; වුත්තං හි, කියේ මැනු; සඞ්කිලෙසනන්ති, සඞ්කිලෙස නම්; හානභාගියො ධම්මො, අප්‍රගුණවූ ප්‍රථමධ්‍යානාදීන් නැඟි කල්හි කාමාදිවිෂයසංඥමනස්කාරසඞ්ඛ්‍යාත හානභාගීයධර්මයයි; වොදානන්ති, වොදාන නම්; විසෙසභාගියො ධම්මොති, ප්‍රගුණවූ ප්‍රථම ධ්‍යානාදින් නැඟි කල්හි ද්විතීයධ්‍යානාදිවිෂය සංඥමනස්කාර සඞ්ඛ්‍යාත විශෙෂභාගීය ධර්මයයි; (එහෙයින්ම කීහ. "පඨමස්ස ඣානස්ස ලාභිං" යනාදී) තත්, එහි; පඨමස්ස ඣානස්ස ලාභිං, අප්‍රගුණවූ ප්‍රථමධ්‍යාන ලාභීහු; කාමසහගත, ආලම්බනවශයෙන් කාමසහගතවූ; සඤ්ඤා මනසිකාරා, සංඥමනස්කාර යන මොහු; සමුදාචරන්ති, චොදනා කෙරෙද්ද; (ධ්‍යානයෙන් නැංගහු පෙළත්ද යන අර්ථයි.) හානභාගිනී පඤ්ඤාති, (කාමයෙහි පවත්නා සංඥමනස්කාරයන්ගෙ වශයෙන්) ප්‍රථමධ්‍යාන සංඥතොමො පිරිහෙන්නීයයි; ඉමිනා නයෙන, මේ කාම සහගතසංඥය යනාදි මේ ප්‍රථමධ්‍යානයෙහි කී විධියෙන්; හාන භාගියො ධම්මො වෙදිතබ්බො, හානභාගීයධර්මය දතයුතු; අවිතක්ක සහගතා, අවිතර්කවූ ද්විතීයධ්‍යාන ආලම්බන වශයෙන් අවිතර්ක සහ ගතවූ; සඤ්ඤාමනසිකාරා, සංඥමනස්කාරයෝ; සමුදාචරන්ති, ප්‍රගුණවූ ප්‍රථමධ්‍යානයෙන් නැංගහු ද්විතීයධ්‍යානාධිගමය පිණිස චොදනා කෙරෙද්ද (පෙළද්ද); විසෙසභාගිනී පඤ්ඤා, ද්විතීයධ්‍යානයෙහි පවත්නා සංඥ මනස්කාර වශයෙන් ප්‍රථමධ්‍යාන ප්‍රඥතොමෝ විශෙෂවූ ද්විතීයධ්‍යානොත්පත්තියට පදස්ථාන බැවින් විශෙෂභාගිනී නම් වේ; ඉමිනා නයෙන, මේ අවිතක්කසහගතා යනාදී ප්‍රථමධ්‍යානයේ කී විධි යෙන්; විසෙසභාගියො ධම්මො වෙදිතබ්බො, විශෙෂභාගීයධර්මය දතයුතු, (මෙතෙනැ වනාහි සමාධිය අභිමතයයි දතයුතු.

(ඇ) කථං භාවෙතබ්බොති එත්ථ පන, කථං භාවෙතබ්බො යන මෙහි වනාහි, "ලොකිය ලොකුත්තර වසෙන දුවිධො"යනාදියෙහි; අරිය මග්ගසම්පයුත්තො, ලොකොත්තර අප්‍රමාණ අපරියාපන්න ග්‍රහණයෙන් ලෞකිකයන් හා අසාධාරණ වශයෙන් සප්‍රීතිකාදිග්‍රහණයෙහි සාධාරණවශයෙන්"යො අයං අරියමග්ග සම්පයුත්තො සමාධි වුත්තො"යි යොදනු; යම් මේ ආර්‍යමාර්ගී සම්ප්‍රයුක්ත සමාධියෙක් කියනලද්ද; තස්ස, ඔහුගේ; භාවනානයො, භාවනාවිධිය; [තාව, පළමු කොට,] පඤ්ඤාභාවනා නයෙනෙව සඞ්ගහිතො, ප්‍රඥභාවනා නයින්ම සඞ්ග්‍රහකරනලද්ද; පඤ්ඤාය

පඤ්ඤාය භාවිතාය සො භාවිතොව හොති, තස්මා තං සන්ධාය එවං භාවෙතබ්බොති න කිඤ්චි විසුං වදාම. යො පනායං ලොකියො සො වුත්තනයෙන සීලානි විසොධෙත්වා සුපරිසුද්ධෙ සීලෙ පතිට්ඨිතෙන, ය්වාස්ස දසසු පලිබොධෙසු පලිබොධො අත්ථි තං උපච්ඡින්දිත්වා කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා අත්තනො චරියානුකූලං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහාරෙ විහරන්තෙන ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා සබ්බං භාවනාවිධානං අපරිහාපෙන්තෙන භාවෙතබ්බොති. අයමෙත්ථ සඞ්ඛෙපො. අයං පන විත්ථාරො.

(අ) යං තාව වුත්තං ය්වාස්ස දසසු පලිබොධෙසු පලිබොධො අත්ථි තං උපච්ඡින්දිත්වාති එත්ථ.

---

භාවිතාය, ප්‍රඥාව බවනලදකල්හි; සො, හේ සමාධියතෙමේ; භාවිතොව හොති, ප්‍රතිසන්ධි සම්ප්‍රයුක්ත හෙයින් බවනලද්දේම වේ; තස්මා, එහෙයින්; තං සන්ධාය, ඒ ආයඝීමාර්ගසමාධිය සඳහා; එවං භාවෙතබ්බොති, මෙසේ බැවියයුතුයයි; කිඤ්චි, කිසිවක්; විසුං, ප්‍රඥාභාවනායෙන් වෙන්කොට; නො වදාම, නො කියමු; යො පනායං ලොකියො, යම් ලෞකික සමාධියෙක් ඇත්ද; සො, හෙතෙම; වුත්තනයෙන, යට කී නයින්; සීලානි විසොධෙත්වා, සීලයන් පිරිසුදුකොට; සුපරිසුද්ධෙ සීලෙ පතිට්ඨිතෙන, පිරිසුදුසිල්හි පිහිටියහු විසින්; ("භාවෙතබ්බො"යි යොදනු;) අස්ස, මේ යොගීහු තමාගේ; දසසු පලිබොධෙසු, දශපලිබොධයන් කෙරෙහි; යො පලිබොධො අත්ථි, යම් පලිබොධයෙක් ඇත්ද; තං, හේ; උපච්ඡින්දිත්වා, පසිඳ; කම්මට්ඨානදායකං, කමටහන් දෙන්නාවූ; කල්‍යාණමිත්තං, කල්‍යාණමිත්‍රයා කරා; උපසඞ්කමිත්වා, එළඹ; අත්තනො චරියානුකූලං, තමාගේ චරිතයට අනුකූලවූ; චත්තාලීසාය කම්මට්ඨානෙසු, සතලිස් කමටහනුන් කෙරෙහි; අඤ්ඤතරං කම්මට්ඨානං, එක්තරා කමටහනක්; ගහෙත්වා, ගෙන; සමාධිභාවනාය, සමාධිභාවනාවට; අනනුරූපං විහාරං පහාය, නොසුදුසු අටළොස් වෙහෙර හැර; අනුරූපෙ විහාරෙ විහරන්තෙන, සුදුසු පසඟින්යුත් වෙහෙර වසන්නහු විසින්; ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා, දික් කෙස් නිය ආදිවූ ක්‍ෂුද්‍ර පලිබොධයන් පසිඳ; සබ්බං භාවනාවිධානං, සියලු භාවනාවිධිය; අපරිහාපෙන්තෙන, නොපිරිහෙළන්නහු විසින්; භාවෙතබ්බොති; බැවියයුතුය යන; අයං, මේ; එත්ථ, මෙහි; සඞ්ඛෙපො, සඞ්ක්‍ෂෙපය; අයං පන, මේ වනාහි; විත්ථාරො, විස්තරයි.

(අ) යං තාව වුත්තං, යමෙක් පළමුකොට කියනලදද; ඉදානි, දැන්; ("ඉමෙ දසපලිබොධා වෙදිතබ්බා"යනු සබඳ "අස්ස යොගිනො දසසු පලිබොධෙසු යො පලිබොධො අත්ථි තං උපච්ඡින්දිත්වාති යං වුත්තං එත්ථ"යි යොදනු.) ය්වාස්ස තාවාති යං වුත්තං, යම් වචනයෙක් මෙසේ ආදියෙහි කියනලදද; එත්ථ, මෙහි; (පලිබොධ නම් කවර යත් යත අණීයි.)

133 ආවාසො ච කුලං ලාභො ගණො කම්මඤ්ච පඤ්චමං,
අද්ධානං ඤාති ආබාධො ගන්ථො ඉද්ධීති තෙ දසාති.

ඉමෙ දසපලිබොධා නාම.

(අ) තත්ථ ආවාසො යෙව ආවාසපලිබොධො, එසනයො කුලාදිසු, තත්ථ ආවාසොති එකොපි ඔවරකො වුච්චති එකම්පි පරිවෙණං සකලොපි සඞ්ඝාරාමො. ස්වායං න සබ්බස්සෙව පලිබොධො හොති, යො පනෙත්ථ නවකම්මාදිසු උස්සුක්කං වා ආපජ්ජති, බහුභණ්ඩසන්නිචයො වා හොති, යෙන කෙනචි වා කාරණෙන අපෙක්ඛවා පටිබද්ධචිත්තො, තස්සෙව පලිබොධො හොති න ඉතරස්ස, තත්‍රිදං වත්ථු. ද්වෙ කිර කුලපුත්තා අනුරාධපුරා නික්ඛමිත්වා ථූපාරාමෙ පබ්බජිංසු. තෙසං එකො ද්වෙමාතිකා පගුණං කත්වා පඤ්චවස්සිකො හුත්වා පවාරෙත්වා

---

133. ආවාසො ච, අවස්ද; කුලං, ඤාතිකුලාදී කුලයද; ලාභො, ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත ලාභයද; ගණො, ගණයද; පඤ්චමං, පස්වනුවූ; කම්මඤ්ච, නවකම්මද; අද්ධානං, මඟගමන්ද; ඤාති, ආචරියුපජ්ඣායාදී නෑයෝද; ආබාධො, යම්කිසි රොගයෙක්ද; ගන්ථො, පයර්‍යාප්තිග්‍රහණයද; ඉද්ධීති, පුහුදුන් ඉදුද යන; තෙ දසාති, ඒ පලිබොධයෝ දශදෙනෙකැයි කියනලද.

ඉමෙ දසපලිබොධා නාම, මේ දශපලිබොධයෝ නම්වෙත්.

(අ) තත්ථ, ඒ දශපලිබොධයන්කෙරෙහි; ආවාසොයෙව, අවසම්; ආවාසපලිබොධො, ආවාසපලිබොධනම්; කුලාදිසු, කුලාදීන්කෙරෙහි; එසනයො, මෙමනයයි; එත්ථ, මෙහි; ආවාසොති, ආවාසයනම්; එකොපි ඔවරකො, එකදගැබෙක්; එකම්පි පරිවෙණං, එකද පිරිවෙනෙක්; සකලොපි සඞ්ඝාරාමො, සියලුසඟරමද; වුච්චති, කියනුලැබේ; ස්වායං, ඒ මේ ආවාසය; න සබ්බස්සෙව පලිබොධො හොති, සියල්ල හටම පලිබොධනොවේ; යො පන, යමෙක් වනාහි; එත්ථ, ඒ අවස්හි; නවකම්මාදිසු උස්සුක්කං වා ආපජ්ජති, නවකම්මාදියෙහි උත්සාහයට හෝ පැමිණේද; බහුභණ්ඩසන්නිචයො වා හොති, බොහෝ භාණ්ඩසන්නිචය ඇත්තේ හෝ වේද; යෙන කෙනචි වා කාරණෙන, (සිහිල් සෙවන ඇත්තේය මිහිරි පැන් ඇත්තේය යනාදි) යම්කිසි කරුණෙකින්; අපෙක්ඛවා, අපෙක්ෂාඇත්තේද; පටිබද්ධචිත්තො, පිළිබඳ සිතැත්තේද; තස්සෙව පලිබොධො හොති, ඔහටම පලිබොධ වෙයි; න ඉතරස්ස, සෙස්සහට නොවේ; තත්‍ර, ඒ පලිබොධාභාවයෙහි; ඉදං වත්ථු, මෙවතෙකි; (කිර යනු අනුශ්‍රවණයෙහි නිපාතයි.) ද්වෙ කුලපුත්තා, කුලපුත්හු දෙදෙනෙක්; අනුරාධපුරා නික්ඛමිත්වා, අනුරාධපුර යෙන් නික්ම; ථූපාරාමෙ පබ්බජිංසු, ථූපාරාමයෙහි පැවිදිවූහ; තෙසං, ඒ දෙදෙනා කෙරෙන්; එකො, එකෙක්; ද්වෙමාතිකා පගුණං කත්වා, දෙමෑ පුහුණුකොට; පඤ්චවස්සිකො හුත්වා, පස්වස් ඇතිව; පවාරෙත්වා, පවරා; පාචීනඛණ්ඩරාජිං නාම ගතො, පාචීනඛණ්ඩරාජිනම් තැනට

පාචීනඛණ්ඩරාජිං නාම ගතො. එකො තත්ථෙව වසති, [පාචීනඛණ්ඩරාජිං ගතො තත්ථ චිරං වසිත්වා ථෙරො හුත්වා චින්තෙසි:-පටිසල්ලානසාරුප්පමිදං ඨානං, හන්ද නං සහායකස්සාපි ආරොචෙමීති. තතො නික්ඛමිත්වා අනුපුබ්බෙන ථූපාරාමං පාවිසි. පවිසන්තංයෙව ච නං දිස්වා සමානවස්සිකත්ථෙරො පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙත්වා වත්තං අකාසි. ආගන්තුකත්ථෙරො සෙනාසනං පවිසිත්වා චින්තෙසි:-ඉදානි මෙ සහායො සප්පිං වා ඵාණිතං වා පානකං වා පෙසෙස්සති, අයං හි ඉමස්මිං නගරෙ චිරනිවාසීති. සො රත්තිං අලද්ධා පාතො චින්තෙසි.

(අ) ඉදානි උපට්ඨාකෙහි පහිතං යාගුඛජ්ජකං පෙසෙස්සතීති තම්පි අදිස්වා පහිණන්තා නත්ථි පවිට්ඨස්ස මඤ්ඤෙ දස්සන්තීති පාතොව තෙන සද්ධිං ගාමං පාවිසි. තෙ එකවීථිං චරිත්වා උළුඞ්කමත්තං යාගුං ලභිත්වා ආසනසාලායං නිසීදිත්වා පිවිංසු. තතො ආගන්තුකො චින්තෙසි:-

---

ගියේ; (පූර්වදිග පර්වත ඛණ්ඩයන් අතුරෙහි වනරාජියෙක් ඇති තැන යෙත්.) එකො, එකෙක්; තත්ථෙව වසති, එහිම වෙසෙයි; පාචීනඛණ්ඩරාජිං ගතො, පාචීනඛණ්ඩරාජියට ගිය තෙමේ; තත්ථ, එහි; චිරං වසිත්වා, බොහෝකලක් වැස; ථෙරො හුත්වා, තෙරව; චින්තෙසි, මෙසේ සිතී; ඉදං ඨානං, මෙතැන; පටිසල්ලානසාරුප්පං, විවේකයට සරුප්ය; හන්ද, එබැවින්; [නං, එය;] සහායකස්සාපි, මාගෙ සබඳහටද; අරොචෙමීති, කියමියි; තතො නික්ඛමිත්වා, ඒ පාචීනඛණ්ඩරාජියෙන් නික්ම; අනුපුබ්බෙන, අනුක්‍රමයෙන්; ථූපාරාමං පාවිසි, ථූපාරාමයට වන; පවිසන්තංයෙව ච නං දිස්වා, ඔහු වදනහුම දැක; සමානවස්සිකත්ථෙරො, සමවස්ඇති තෙරහු; පච්චුග්ගන්ත්වා, පෙරගමන් අවුත්; පත්තචීවරං පටිග්ගහෙත්වා, පාසිවුරු පිළිගෙන; වත්තං අකාසි, වත්කොළෝ; ආගන්තුකත්ථෙරෙ, අමුතු තෙරහු; සෙනාසනං පවිසිත්වා, සෙනස්නට වැද; චින්තෙසි, සිතූ; මෙ සහායො, මාගෙ යහළු තෙම; ඉදානි, දැන්; සප්පිං වා, ගිතෙල් හෝ; ඵාණිතං වා, පැණි හෝ; පානකං වා, පාන වර්ගයක් හෝ; පෙසෙස්සති, එවයි; අයං හි, මෙතෙම වනාහි; ඉමස්මිං නගරෙ, මෙනුවර; චිරනිවාසීති, බොහෝකල්වසන්නෙකැයි; සො, ඒ අමුතුතෙමෙ; රත්තිං අලද්ධා, රෑ නොලදින්; පාතො චින්තෙසි, උදෑසන්හි සිතී.

(අ) ඉදානි, දැන්; උපට්ඨාකෙහි පහිතං, උපස්ථායකයන් විසින් එලවනලද; යාගුඛජ්ජකං, හඹුහා කැවුන්; පෙසෙස්සතීති, එවන්නේයයි; තම්පි අදිස්වා, හෙද නොදැක; පහිණන්තා නත්ථි, එවන්නහු නැත; පවිට්ඨස්ස මඤ්ඤෙ දස්සන්තීති, ගමට වන්නහුට දෙනවන්හයි; පාතොව, උදෑසෙනෙම; තෙන සද්ධිං ගාමං පාවිසි, ඒ ගම්වැසි තෙරුන් හා සමග ගමටවන්හු; තෙ, ඒ දෙදෙන; එකවීථිං චරිත්වා, එක් වීථි යකසිහා; උළුඞ්කමත්තං යාගුං ලභිත්වා, සරළුවක්පමණ හඹුලදින්; ආසනසාලායං නිසීදිත්වා, ආසනසාලාවෙහි හිඳ; පිවිංසු, වැළඳුහු; තතො, ඉක්බිත්තෙන්; ආගන්තුකො, අමුතුතෙරහු; චින්තෙසි, මෙසේ

නිබද්ධයාගුං මඤ්ඤෙ නත්ථි, භත්තකාලෙදානි මනුස්සා පණීතං භත්තං දස්සන්තීති. තතො භත්තකාලෙපි පිණ්ඩාය චරිත්වා ලද්ධමෙව භුඤ්ජිත්වා, ආහ:-කිං භන්තෙ සබ්බකාලං එවං යාපෙථාති. ආම ආවුසොති, භන්තෙ පාචීනඛණ්ඩරාජි ඵාසුකා, තත්ථ ගච්ඡාමාති, ථෙරො නගරතො දක්ඛිණ ද්වාරෙන නික්ඛමන්තො කුම්භකාරගාමමග්ගං පටිපජ්ජි. ඉතරො ආහ:- කිං භන්තෙ ඉමං මග්ගං පටිපන්නත්ථාති. නනු ත්වං ආවුසො පාචීන ඛණ්ඩරාජියා වණ්ණං අභාසීති. කිං පන භන්තෙ තුම්හාකං එත්තකං කාලං වසිතට්ඨානෙ න කොචි අතිරෙකපරික්ඛාරො අත්ථීති. ආමාවුසො මඤ්චපීඨං සඞ්ඝිකං, තං පටිසාමිතමෙව, අඤ්ඤං කිඤ්චි නත්ථීති. මය්හං පන භන්තෙ කත්තරදණ්ඩො තෙලනාළි උපාහනත්ථවිකා ච තත්ථෙවාති. තයා ආවුසො එකදිවසං වසිත්වා එත්තකං ඨපිතන්ති, ආම භන්තෙති, සො පසන්නචිත්තො ථෙරං වන්දිත්වා තුම්හාදිසානං

---

සිතූ; නිබද්ධයාගුං මඤ්ඤෙ නත්ථි, නිබද්ධ කැඳක් නැතිවන; භත්ත කාලෙදානි, දන්බත්වේලෙහි; මනුස්සා, මිනිස්හු; පණීතං භත්තං දස්සන්තීති, ප්‍රණීතබත් දෙන්නාහයි; තතො, ඉක්බිත්තෙන්; භත්ත කාලෙපි පිණ්ඩාය චරිත්වා ලද්ධමෙව භුඤ්ජිත්වා, බත්වේලෙහිදු පිඬුසිඟා ලද්දූයම වළඳා; ආහ, මෙසේකී; කිං භන්තෙ, වහන්ස කිම; සබ්බකාලං එවං යාපෙථාති, හැමකල්හිම මෙසේ යැපේදූයි; ආමාවුසොති, එසේ ඇවතයි ගම්වැසි තෙරහු කීහු; භන්තෙ, වහන්ස; පාචීනඛණ්ඩරාජි, පාචීනඛණ්ඩරාජිතොමෝ; ඵාසුකා, ඵාසුය; තත්ථ ගච්ඡාමාති, එයට යම්හයි; ථෙරො, ගම්වැසිතෙරහු; නගරතො, නුවරින්; දක්ඛිණ ද්වාරෙන නික්ඛමන්තො, දකුණුදොරින් නික්මෙන්නාහු; කුම්භකාර ගාමමග්ගං පටිපජ්ජි, කුඹල්හලට යන මග පිළිපන්හු; (නික්මූනහු යුතැනී.) ඉතරො ආහ, අනික් අමුතු තෙරහු මෙසේකිවු; කිං භන්තෙ, වහන්ස කිම; ඉමං මග්ගං පටිපන්නත්ථාති, මේ මග නික්මුණුසේක් නැයි, ආවුසො, ඇවත; ත්වං, තොප; පාචීනඛණ්ඩරාජියා, පාචීනඛණ්ඩ රාජිනම් තැන; වණ්ණං අභාසි නනුති, ගුණකීයෙහි නොවේ දැයි, කිං පන, කිමෙක්ද; භන්තෙ, වහන්ස; තුම්හාකං එත්තකං කාලං වසි තට්ඨානෙ, තොපගෙ මෙතෙක්කල් විසූ තැන්හි; කොචි අතිරෙක පරික්ඛාරො න අත්ථීති, කිසිඉතිරි පිරිකරෙක් නැද්දූයි; ආම ආවුසො, ඇවත එසේය; මඤ්චපීඨං සඞ්ඝිකං, වැළඳගන්නා හැඳපුටු සඟසතුය; තං, හේ; පටිසාමිතමෙව; තගාතබනලදමය; අඤ්ඤං කිඤ්චි නත්ථීති, අනික් කිසිවෙක් නැතැයි; භන්තෙ, වහන්ස; මය්හං පන, මාගෙ වනාහි; කත්තරදණ්ඩො, කතුරැයටද; තෙලනාළි, තෙල්නළද; උපාහනත්ථ විකාව, වහන්පසියද; තත්ථෙවාති, එහිමයයි; ආවුසො, ඇවත; තයා; තාවිසින්; එකදිවසං වසිත්වා, එක්දවසක් වැස; එත්තකං ඨපිතන්ති, මෙතෙක් තබනලද්දූයි; ආම භන්තෙ, වහන්ස එසේයයි; සො, හෙ තෙම; පසන්නචිත්තො, ප්‍රසන්නසිත් ඇත්තේ; ථෙරං වන්දිත්වා, තෙරුන්වැඳ; තුම්හාදිසානං භන්තෙ සබ්බත්ථ අරඤ්ඤවාසමෙව, වහන්ස

භන්තෙ සබ්බත්ථ අරඤ්ඤවාසො යෙව ථූපාරාමො චතුන්නං බුද්ධානං ධාතුනිධානට්ඨානං, ලොහපාසාදෙ සප්පායං ධම්මසවණං මහාචෙතිය දස්සනං ථෙරදස්සනඤ්ච ලබ්භති, බුද්ධකාලො විය වත්තති. ඉධෙව තුම්හෙ වසථාති දුතියදිවසෙ පත්තචීවරං ගහෙත්වා සයමෙව අගමාසීති. ඊදිසස්ස ආවාසො න පලිබොධො හොති.

(ඇ) කුලන්ති:- ඤාතිකුලං වා උපට්ඨාකකුලං වා, එකච්චස්ස හි උපට්ඨාකකුලම්පි සුඛිතෙ සුඛිතොති ආදිනා නයෙන සංසට්ඨස්ස විහරතො පලිබොධො හොති, සො කුලමානුසකෙහි විනා ධම්මසවණාය සාමන්තවිහාරම්පි න ගච්ඡති. එකච්චස්ස මාතාපිතරොපි පලිබොධා න හොන්ති. කොරණ්ක[1]විහාරවාසිකථෙරස්ස භාගිනෙය්‍යදහරභික්ඛුනො විය. සො කිර උද්දෙසත්ථං රොහණං අගමාසි ථෙරභගිනීපි උපාසිකා සදා ථෙරං තස්ස පවත්තිං පුච්ඡති, ථෙරො එකදිවසං දහරං ආනෙස්සාමීති

---

තුඹවැන්නවුන්ට හැමතැනම අරණ්‍යවාසමය; ථූපාරාමො, ථුබරෙඹ; චතුන්නං බුද්ධානං, මෙකප කකුසඳ කොණාගමන කසුප් ගෞතමය යන සතර බුදුන්ගේ; ධාතුනිධානට්ඨානං, පටීධාතුය ඩබරය නහන සළුය අකුදුය යන පරිභොගධාතු ශරීරධාතුන්ගේ නිධානස්ථානය; ලොහපාසාදෙ සප්පායං ධම්මසවණං, ලෝවාමහපායෙහි සැපවූ දහම් ඇසීමද; මහාචෙතියදස්සනං, මහාචෛත්‍යදර්ශනයද; ථෙරදස්සනඤ්ච, ස්ථවිරයන් දැක්ම ද; ලබ්භති, ලැබෙයි; බුද්ධකාලො විය වත්තති, බුදුන් කලක්මෙන් පවත්ති; ඉධෙව, මෙහිම; තුම්හෙ වසථාති, තෙපි වසවයි කියා; දුතියදිවසෙ, දෙවනදවස්; පත්තචීවරං ගහෙත්වා, පාසිවුරුගෙන; සයමෙව අගමාසීති, තුමූම ගියෝ; ඊදිසස්ස, මේ තෙරුන් මෙන් අලගනාවූ සිතැත්තාහට; ආවාසො පලිබොධො න හොති, ආවාසය පලිබොධ නොවේ.

(ඇ) කුලන්ති, කුලනම්; ඤාතිකුලං වා, නෑ කුලහෝය; උපට්ඨාකකුලං වා, උපස්ථායකකුල හෝයි; එකච්චස්සහි; සමහරක්හට; උපට්ඨාකකුලම්පි, උපස්ථායක කුලයද; සුඛිතෙ, කුලය සුඛිත කල්හි; සුඛිතොති ආදිනා නයෙන, තෙමේද සුඛිතවෙයි යනාදිනයින්; සංසට්ඨස්ස විහරතො, හැනී වසන්නහුට, පලිබොධො හොති, පලිබොධවේ; සො, හෙතෙම; කුලමානුසකෙහි විනා, කුලමිනිසුන් හැර; ධම්මසවණාය, බණ අසනුපිණිස; සාමන්තවිහාරම්පි න ගච්ඡති, ආසන්නවිහාරයටද නොයෙයි; එකච්චස්ස, සමහරක්හට; මාතාපිතරොපි, මවුපියෝපවා; පලිබොධා න හොන්ති, පලිබොධ නොවෙත්; කොරණ්ක[1]විහාරවාසිකථෙරස්ස භාගිනෙය්‍යදහරභික්ඛුනො විය, කොරණ්ක නම්වූ වෙහෙරවසන තෙරුන්ගෙ බෑන ළදරු මහණහට මෙනි; සො කිර, ඒ දහරමහණ තෙමේ; උද්දෙසත්ථං, උද්දෙසයපිණිස; (පෙළකියවා ගෙන පුහුනුකරනුපිණිස යුතැති.) රොහණං අගමාසි, රුහුණු දනවුවට ගියෝ; ථෙරභගිනීපි උපාසිකා තෙරුන්ගෙ නං උපාසිකාද; සදා,

---

1. කොරණ්ඩක-ත්‍රි. මු.

රොහණාභිමුඛො පායාසි. දහරොපි චිරං මෙ ඉධ වුත්ථං උපජ්ඣායංදානි පස්සිත්වා උපාසිකාය ච පවත්තිං ඤත්වා ආගමිස්සාමීති රොහණතො නික්ඛමි. තෙ උභොපි ගඞ්ගාතීරෙ සමාගච්ඡිංසු. සො අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ ථෙරස්ස වත්තං කත්වා කුහිං යාසීති පුච්ඡිතො තමත්ථං ආරොචෙසි. ථෙරො සුට්ඨු තෙ කතං, උපාසිකාපි සදා පුච්ඡති, අහම්පි එතදත්ථමෙව ආගතො, ගච්ඡ ත්වං අහං පන ඉධෙව වස්සං වසිස්සාමීති තං උය්‍යොජෙසි. සො වස්සූපනායිකදිවසෙයෙව තං විහාරං පත්තො, සෙනාසනම්පිස්ස පිතරා කාරිතමෙව පත්තං, අථස්ස පිතා දුතියදිවසෙ ආගන්ත්වා කස්ස භන්තෙ අම්හාකං සෙනාසනං පත්තන්ති පුච්ඡන්තො ආගන්තුකදහරස්සාති සුත්වා තං උපසඞ්කමිත්වා වන්දිත්වා ආහ:- භන්තෙ අම්හාකං සෙනාසනෙ වස්සං උපගතස්ස වත්තං අත්ථීති. කිං උපාසකාති? තෙමාසං අම්හාකං යෙව ඝරෙ භික්ඛං ගහෙත්වා පවාරෙත්වා ගමනකාලෙ ආපුච්ඡිතබ්බන්ති. සො තුණ්හීභාවෙන අධිවාසෙසි,

---

හැමදවසම; ථෙරං තස්ස පවත්තිං පුච්ඡති, තෙරුන් පුතණුවන්ගෙ පවත් පිළිවිසී; ථෙරො, තෙරනු; එකදිවසං, එක්දවසක්; දහරං ආනෙස්සාමීති, දහරයා ගෙනෙමියි; රොහණාභිමුඛො පායාසි, රුහුණට අභිමුඛව ගියෝ; දහරොපි, දහරද; චිරං මෙ ඉධ වුත්ථං, බොහෝ කලක් මාවිසින් මෙහි වසනලද; උපජ්ඣායංදානි පස්සිත්වා, දැන් උපාධ්‍යායයන්බලා; උපාසිකාය ච පවත්තිං ඤත්වා, උපාසිකාවන්ගේද පවත් දැන; ආගමිස්සාමීති, එමියි; රොහණතො නික්ඛමි, රුහුණින් නික්මිනි; තෙ උභොපි, තෙරනුද දහරමහණද දෙදෙනාම; ගඞ්ගාතීරෙ සමාගච්ඡිංසු, මහවැලිගන්තෙර එක්වූහ; සො, ඒ දහරතෙමෙ; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ, එක්තරා රුක්මූලෙකදී; ථෙරස්ස වත්තං කත්වා, තෙරුන්ට වත්කොට; කුහිං යාසීති පුච්ඡිතො, කොයි යෙහිදැයි විචාරනලද්දේ; තමත්ථං ආරොචෙසි, එපවත් කී; ථෙරො, තෙරනු; සුට්ඨු තෙ කතං, තාවිසින් මැනවෙක් කරනලදැ; උපාසිකාපි, උපාසිකාද; සදා පුච්ඡති, දවස දවස විචාරයි; අහම්පි, මමද; එතදත්ථමෙව ආගතො, මේ පිණිසම ආමි; ගච්ඡ ත්වං, තො යා; අහං පන ඉධෙව වස්සං වසිස්සාමීති, මම වනාහි මෙහිම වස් වෙසෙමි යි; තං උය්‍යොජෙසි, ඒ දහරයා නගායවූ; සො හෙතෙම; වස්සූපනායිකදිවසෙයෙව, වසෙළඹෙන දවස්ම; තං විහාරං පත්තො, ඒ වෙහෙරට පැමිණියේ; සෙනාසනම්පි, සෙනස්නද; අස්ස, ඕහට; පිතරා කාරිතමෙව, පියාණන් විසින්ම කරවන ලද්දේම; පත්තං, පැමිණියෙ; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ මහණහුගේ; පිතා, පියාණෝ; දුතියදිවසෙ ආගන්ත්වා, දෙවන දවස් අවුදු; කස්ස භන්තෙ අම්හාකං සෙනාසනං පත්තන්ති, වහන්ස කවුරුන්ට අපගෙ සෙනස්න පත්දැයි; පුච්ඡන්තො, විචාරන්නේ; ආගන්තුකදහරස්සාති සුත්වා, ආගන්තුකදහරකෙනෙක්නටය යනු අසා; තං උපසඞ්කමිත්වා; ඒ දහරයන්කරා එළැඹ; වන්දිත්වා, වැඳ; ආහ, මෙසේ කී; භන්තෙ, වහන්ස; අම්හාකං සෙනාසනෙ වස්සං උපගතස්ස,

(අ) උපාසකොපි ඝරං ගන්ත්වා අම්හාකං ආවාසෙ එකො ආගන්තුකො අය්‍යො උපගතො, සක්කච්චං උපට්ඨාතබ්බොති ආහ. උපාසිකාපි සාධූති සම්පටිච්ඡිත්වා පණීතං ඛාදනීයං භොජනීයං පටියාදෙසි. දහරොපි භත්තකාලෙ ඤාතිකුලං අගමාසි. න නං කොචි සඤ්ජානි. සො තෙමාසම්පි තත්ථ පිණ්ඩපාතං පරිභුඤ්ජිත්වා වුත්ථවස්සො අහං ගච්ඡාමීති ආපුච්ඡි. අථස්ස ඤාතකා ස්වෙ භන්තෙ ගච්ඡස්සථාති දුතිය දිවසෙ ඝරෙයෙව භොජෙත්වා තෙලනාළිං පූරෙත්වා එකං ගුළපිණ්ඩං නවහත්ථඤ්ච සාටකං දත්වා ගච්ඡථ භන්තෙති ආහංසු. සො අනුමොදනං කත්වා රොහණාභිමුඛො පායාසි, උපජ්ඣායොපිස්ස පවාරෙත්වා පටිපථං ආගච්ඡන්තො පුබ්බෙ දිට්ඨට්ඨානෙයෙව තං අද්දස. සො අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ ථෙරස්ස වත්තං අකාසි. අථ නං ථෙරො

---

අපගෙ සෙනස්නෙහි වස්එළැඹියහට; වත්තං අත්ථීති, වතෙක් ඇතැයි; කිං උපාසකාති, කිමෙක්ද උපාසකයයි කිවූ; තෙමාසං, තුන්මසක්; අම්හාකං ඝරෙයෙව භික්ඛං ගහෙත්වා, අපගෙ ගෙහිම අහරගෙන; පවාරෙත්වා ගමනකාලෙ, පවරා යනකලැ; ආපුච්ඡිතබ්බං, පිළිවිස්සයුතු; (අපට කියා වැඩියයුතුය යුතැනී.) සො හෙතෙම; තුණ්හීභාවෙන අධිවාසෙසි, තුෂ්ණීම්භාවයෙන් ඉවසී.

(අ) උපාසකොපි, උපාසකද; ඝරං ගන්ත්වා, ගෙට ගොස්; අම්හාකං ආවාසෙ, අපගෙ සෙනස්නෙහි; එකො ආගන්තුකො අය්‍යො, එක් ආගන්තුක ආර්‍ය්‍යකෙනෙක්; උපගතො, වසෙළැඹියහ; සක්කච්චං උපට්ඨාතබ්බොති ආහ, සකස්කොට උපස්ථාන කටයුත්තේය යි කී; උපාසිකාපි, උපාසිකාවෝද; සාධූති සම්පටිච්ඡිත්වා, යහපතැයි ගිවිස, පණීතං ඛාදනීයං භොජනීයං පටියාදෙසි, මධුරවූ ඛාද්‍යභොජ්‍යය සැපයූ; දහරොපි, දහරද; භත්තකාලෙ, වළඳනාවේලෙහි; ඤාතිකුලං අගමාසි, මවුපියන් කුලයට එළැඹිය; නං, ඔවුන්; කොචි න සඤ්ජානි; කිසිවෙක් නොහැඳින; සො, හෙතෙම; තෙමාසම්පි තත්ථ පිණ්ඩපාතං පරිභුඤ්ජිත්වා, තුන්මසම එහි අහරවළඳා; [වුත්ථ වස්සො, වැස නිමවන ලද්දේ;] අහං ගච්ඡාමීති ආපුච්ඡි, මම යෙමි යි පිළිවිස්සි; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඔහුගෙ; ඤාතකා, නෑයෝ; ස්වෙ භන්තෙ ගච්ඡස්සථාති, වහන්ස සෙට වඩනේයයි කියා; දුතියදිවසෙ, දෙවනදවස්; ඝරෙයෙව භොජෙත්වා, ගෙහිම වළඳවා; තෙලනාළිං පූරෙත්වා, තෙල්නළ පුරාලා; එකං ගුළපිණ්ඩං, එක් සකුරු පිඩක්ද; නවහත්ථඤ්ච සාටකං දත්වා, නවරියන් පිළියක්ද දී; ගච්ඡථ භන්තෙති ආහංසු, වහන්ස වැඩියමැනවැයි කීහු; සො, හෙතෙම; අනුමොදනං කත්වා, අනුමෙවුනිකොට; රොහණාභිමුඛො, රුහුණට අභිමුඛව; පායාසි, ගියේය; උපජ්ඣායොපිස්ස, ඔහුගෙ උපාධ්‍යායයෝද; පවාරෙත්වා, පවරා; පටිපථං ආගච්ඡන්තො, පෙරමග එන්නාහු; පුබ්බෙ දිට්ඨට්ඨානෙයෙව, පෙරදුටු තැන්හිම; නං, ඔහු; අද්දස, දිටී; සො, හෙතෙම; අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ; එක්තරා රුක්මූලෙක; ථෙරස්ස, තෙරුන්ට; වත්තං

පුච්ඡි:- කිං භද්‍රමුඛ දිට්ඨා තෙ උපාසිකාති, සො ආම භන්තෙති සබ්බං පවත්තිං අරොචෙත්වා තෙන තෙලෙන ථෙරස්ස පාදෙ මක්ඛෙත්වා ගුළෙන පානකං කත්වා පායෙත්වා තම්පි සාටකං ථෙරස්සෙව දත්වා ථෙරං වන්දිත්වා මය්හං භන්තෙ රොහණංයෙව සප්පායන්ති අගමාසි. ථෙරොපි විහාරං ආගන්ත්වා දුතියදිවසෙ කොරණ්ඩකගාමං පාවිසි උපාසිකාපි මය්හං භාතා මමපුත්තං ගහෙත්වා ඉදානි ආගච්ඡති ඉදානි ආගච්ඡතීති සදා මග්ගං ඔලොකය මානාව තිට්ඨති. සා තං එකකමෙව ආගච්ඡන්තං දිස්වා මතො මෙ මඤ්ඤෙ පුත්තො යං ථෙරො එකකොව ආගච්ඡතීති, ථෙරස්ස පාදමූලෙ පතිත්වාව පරිදෙවමානා පරොදි. ථෙරො නූන දහරො අප්පිච්ඡතාය අත්තානං අජානාපෙත්වාව ගතොති තං සමස්සාසෙත්වා සබ්බං තං පවත්තිං ආරොචෙත්වා පත්තත්ථවිකතො තං සාටකං නීහරිත්වා දස්සෙසි. උපාසිකා පසීදිත්වා පුත්තෙන ගත දිසාභිමුඛා උරෙන නිපජ්ජිත්වා නමස්සමානා ආහ:- මය්හං පුත්තසදිසං

---

අකාසි, වත් කෙළේ; අථ, ඉක්බිත්තෙන්; [තං, ඔහු;] ථෙරො පුච්ඡි, තෙරහු පිළිවිස්සෝ; කිං, කිම; භද්‍රමුඛ, භද්‍රමුඛය; තෙ, තා විසින්; උපාසිකා දිට්ඨාති, උපාසිකාව දක්නාලද්දූයි; සො, හෙතෙමෙ; ආම භන්තෙති, වහන්ස එසේයයි; සබ්බං පවත්තිං ආරොචෙත්වා, සියලු පවත් කියා; තෙන තෙලෙන, ඒ තෙලින්; ථෙරස්ස පාදෙ මක්ඛෙත්වා, තෙරුන් පාදයන් මැඩ; ගුළෙන, සකුරෙන්; පානකං කත්වා, පානයක් කොට; පායෙත්වා, වළඳවා; තම්පි සාටකං ථෙරස්සෙව දත්වා, ඒ පිළියද තෙරුන්ටම දී; ථෙරං වන්දිත්වා, තෙරුන් වැඳ; මය්හං භන්තෙ රොහණංයෙව සප්පායන්ති, මට වහන්ස රුහුණම සැපයයි; අගමාසි, ගියේ; ථෙරොපි, තෙරහුදු; විහාරං ආගන්ත්වා, වෙහෙරට අවුත්; දුතියදිවසෙ, දෙවන දවස්; කොරණ්ඩකගාමං පාවිසි, කොරණ්ඩක නම් ගමට වන්හු; උපාසිකාපි, උපාසිකාවෝද; මය්හං භාතා, මා බෑණෝ; මම පුත්තං ගහෙත්වා, මාගේ පුතණුවන්ගෙණ; ඉදානි ආගච්ඡති ඉදානි ආගච්ඡතීති, දැන් එති දැන් එතියි; සදා මග්ගං ඔලොකයමානාව තිට්ඨති, පැවරූ දවස් හිම්කොට හැමවේලෙහිම මඟ බල බලාම සිටී; සා, හෙ තොමෝ; තං, ඒ තෙරුන්; එකකමෙව, හුදකලාම; ආගච්ඡන්තං දිස්වා, එන්නවුන් දැක; මතො මෙ මඤ්ඤෙ පුත්තො, මාගෙපුතණුවෝ මළවන්හයි; යං, යම්කරුණෙකින්; ථෙරො, තෙරහු; එකකො ආගච්ඡතීති, හුදකලාවම එන්නාහයි; ථෙරස්ස පාදමූලෙ පතිත්වා, තෙරුන් පාමුල්හි හී; පරිදෙවමානා, හඬන්නී; පරොදි, වැළැප්හු; ථෙරො, තෙරහු; නූන, එකැතියෙන්; දහරො, දහරතෙමෙ; අප්පිච්ඡතාය, අපිස්බැවින්; අත්තානං අජානාපෙත්වා, තමා නොහඳුන්වා; ගතොති, ගියේයයි; තං උපාසිකං, ඒ උපාසිකාව; සමස්සාසෙත්වා, අස්වසා; සබ්බං තං පවත්තිං ආරොචෙත්වා, ඒ සියලුපවත් කියා; පත්තත්ථවිකතො, පාත්‍රපසියෙන්; තං සාටකං නීහරිත්වා, ඒ පිළිය හැරගෙන; දස්සෙසි, දැක්වී; උපාසිකා, උපාසිකාවෝ; පසීදිත්වා, පැහැද; පුත්තෙන ගතදිසාභිමුඛාව, පුතණුවන්විසින් ගිය දිගට අභිමුඛවම, උරෙන නිපජ්ජිත්වා, ළෙන් බැස හෙව; නමස්සමානා,

වත මඤ්ඤෙ භික්ඛුං කායසක්ඛිං කත්වා භගවා රථවිනීතපටිපදං නාලකපටිපදං තුවටකපටිපදං චතුපච්චයසන්තොසභාවනාරාමතාදීපකං මහාඅරියවංසපටිපදඤ්ච දෙසෙසි. විජිතමාතුයා නාම ගෙහෙ තෙමාසං භුඤ්ජමානො අහං පුත්තො ත්වං මාතාති න වක්ඛති, අහො අච්ඡරියමනුස්සොති. එවරූපස්ස මාතාපිතරොපි පලිබොධා න හොන්ති, පගෙව අඤ්ඤං උපට්ඨාකකුලන්ති.

**ලාභොති**:-චත්තාරො පච්චයා, තෙ කථං පලිබොධා හොන්ති? පුඤ්ඤවන්තස්ස හි භික්ඛුනො ගතගතට්ඨානෙ මනුස්සා මහාපරිවාරෙ පච්චයෙ දෙන්ති. සො තෙසං අනුමොදෙන්තො ධම්මං දෙසෙන්තො සමණධම්මං කාතුං ඔකාසං න ලභති. අරුණුග්ගමනතො යාව පඨමයාමො

---

වදනී, ආහ, මෙසේකිවු; වත, ඒකාන්තයෙන්; මෙ පුත්තසදිසං, මාගෙ පුතණුවන් වැනිවූ, භික්ඛුං, භික්ෂුවක්හු; කායසක්ඛිං කත්වා, කාය ශාක්ෂිකොට; (සම්මුඛයේ ප්‍රතිග්‍රාහක කොටය යුතැති.) භගවා, භගවත් තෙමෙ; රථවිනීතපටිපදං, දශකථාවස්තු පරිදීපක පූජිකවූ රථවිනීතූපමාවෙන් විභාවිතවූ රථවිනීතසූත්‍රයෙහි ආ සත්විශුද්ධිපිළිවෙත් ද; නාලක පටිපදං, **"මොනෙය්‍යං තෙ උපඤ්ඤිස්සං"** යනාදීන් බුදුන් විසින් නාලක නම් තෙරුන්ට කී පිළිවෙත් ද; තුවටකපටිපදං **"මූලං පපඤ්චසඞ්ඛාය"**ති යනාදීන් දෙසූ පිළිවෙත් ද; චතුපච්චයසන්තොස භාවනාරාමතාදීපකං, චීවරාදිසතරපසයෙහි සන්තොෂයද; භාවනා රාමතාවද ප්‍රකාශකවූ; මහාඅරියවංසපටිපදඤ්ච, මහාආර්‍ය්‍යවංශ ප්‍රති පත්තිය ද; දෙසෙසි මඤ්ඤෙ, දෙසූහයි සිතමි; විජිතමාතුයා නාම ගෙහෙ, වැඩූ මවකගෙ ගෙහි නම්; තෙමාසං භුඤ්ජමානො, තුන්මසක් වළඳන්නේ; අහං පුත්තො, මම පිත්මි; ත්වං මාතාතිපි, තෙපි මෑණියව; න වක්ඛති, නොකියන්නේය; අහො, විස්මය; අච්ඡරියමනුස්සොති, ආශ්චර්‍ය්‍යමනුෂ්‍යයෙකැයි; (**"සුත්තෙතාන ගන්දිකාභිමුඛා උරෙන නිපජ්ජිත්වා නමස්සමානා ආහ"**යි යොදනු.) එවරූපස්ස, මෙබඳුවූ මහණහට; මාතාපිතරොපි පලිබොධා නාම න හොන්ති, මවුපියෝද පලිබොධ නම් නොවෙත්; පගෙව අඤ්ඤං උපට්ඨාකකුලං, අන්‍යවූ උපස්ථායක කුලයෙක් පලිබොධ නොවනබව කැලමැයි-

ලාභොති, ලාභනම්; චත්තාරො පච්චයා, සතරපසයෝයි; තෙ කථං පලිබොධා හොන්ති, ඔහු කෙසේ පලිබොධවෙත්ද; පුඤ්ඤවන්තස්ස හි භික්ඛුනො, පිනැති භික්ෂුහට; ගතගතට්ඨානෙ මනුස්සා, ගියගියතැන මිනිස්සු; මහාපරිවාරෙ පච්චයෙ දෙන්ති, (දෙනදෙන පසය පිරිකර සහිතකොට දෙනබැවින්) විපුල පරිවාරඇති ප්‍රත්‍යයන් දෙත්; (බුඩපූජා පාසිවුරු ආදීන් පිරිවරකොට ඇති අහරදන් පිණ්ඩපාතාදීන් පරිවාරකොට සිවුරු දන් ආදි දෙති යන අර්ථයි.) සො, හෙ තෙම; තෙසං, ඒ මිනිස්නට; අනුමොදෙන්තො, අනුමෙවුති කරන්නේ; ධම්මං දෙසෙන්තො, දහම්දෙසන්නේ; සමණධම්මං කාතුං ඔකාසං න ලභති, මහණදම්පුරන්නට අවකාශනොලැබේ; අරුණුග්ගමනතො,

තාව මනුස්සසංසග්ගො න උපච්ඡිජ්ජති. පුන බලවපච්චූසෙයෙව බාහුලිකපිණ්ඩපාතිකා ආගන්ත්වා භන්තෙ අසුකො උපාසකො උපාසිකා අමච්චො අමච්චධීතා තුම්හාකං දස්සනකාමාති වදන්ති. සො ගණ්හාවුසො පත්තචීවරන්ති ගමනසජ්ජොව හොති නිච්චබ්‍යාවටො; තස්සෙවං තෙ පච්චයා පලිබොධා හොන්ති. තෙන ගණං පහාය යත්ථ නං න ජානන්ති තත්ථ එකකෙන චරිතබ්බං, එවං සො පලිබොධො උපච්ඡිජ්ජති.

(අ) ගණොති සුත්තන්තිකගණො වා ආභිධම්මිකගණො වා යො තස්ස උද්දෙසං වා පරිපුච්ඡං වා දෙන්තො සමණධම්මස්ස ඔකාසං න ලභති, තස්ස ගණො පලිබොධො හොති, තෙන සො එවං උපච්ඡින්දිතබ්බො. සචෙ තෙසං භික්ඛූනං බහුං ගතං හොති, අප්පං අවසිට්ඨං තං නිට්ඨපෙත්වා අරඤ්ඤං පවිසිතබ්බං. සචෙ අප්පං ගතං බහුං අව

---

අරුණු නැඟෙණතෙක පටන්; යාව පඨමයාමො, යම්තාක් ප්‍රථම යාමයද; තාව, ඒ තාක්; මනුස්සසංසග්ගො, මිනිසුන්ගේ සසඟ; න උපච්ඡිජ්ජති, නොසිඳේ; පුන, නැවත; බලවපච්චූසෙ යෙව, අලුයම් වේලෙහිම; බාහුලිකපිණ්ඩපාතිකා ආගන්ත්වා, ප්‍රත්‍යය බාහුලිකපිණ්ඩපාතිකයෝ අවුත්; භන්තෙ, වහන්ස; අසුකො උපාසකො, අසුවල් උපාසකතෙමෙ; උපාසිකා, උපාසිකාතොමෝ; අමච්චො, ඇමති තෙමෙ; අමච්චධීතා, ඇමති දූ තොමෝ; තුම්හාකං දස්සනකාමාති වදන්ති, තොප දක්නා කැමැත්තහයි කියත්; සො, හෙතෙම; ගණ්හාවුසො පත්තචීවරන්ති, ඇවත පාසිවුරුගනැයි; ගමනසජ්ජො ව හොති, ගමනට සැරසුනේම වේ; නිච්චබ්‍යාවටො, (උපාසක ආදීන් සැගැන් මෙහි) හැමවේලෙහිම ව්‍යාවෘතත වේ; (යුක්තිවෙයි යුතැති.) තස්ස, ඕහට; එවං, මෙසේ; තෙ පච්චයා පලිබොධා හොන්ති, ඒ පසයෝ පලිබොධ වෙත්; තෙන, එහෙයින්; ගණං පහාය, ගණය හැර; යත්ථ, යම් තැනෙක; නං, ඔහු; න ජානන්ති, නොහඳුනත්ද; තත්ථ, එහි; එකකෙන චරිතබ්බං, අසහායවූවහු විසින් හැසිරියයුතු; එවං, එසේ කල්හි; සො පලිබොධො, ඒලාභපලිබොධය; උපච්ඡිජ්ජති, සිඳේ.

(අ) ගණොති, ගණපලිබොධ නම්; සුත්තන්තිකගණො වා, සෞත්‍රාන්තික ගණය හෝ ය; ආභිධම්මිකගණො වා, ආභිධර්මික ගණය හෝයි; යො, යමෙක්; තස්ස, ඒ ගණයහට; උද්දෙසං වා, උද්දෙසය හෝ; පරිපුච්ඡං වා, පරිපුච්ඡා හෝ; දෙන්තො, දෙන්නේ; (**උද්දෙස නම් පෙළ කියවා දීමයි. පරිපුච්ඡා නම් අර්ථ ඉගැන්වීමයි.**) සමණධම්මස්ස, ශ්‍රමණ ධර්මයට; ඔකාසං න ලභති, අවකාශ නොලැබේද; තස්ස, ඕහට; ගණො, ගණයතෙමෙ; පලිබොධො හොති, පිලිබුඳු වේ; තෙන, එහෙයින්; සො, හෙතෙම; එවං, මෙසේ; උපච්ඡින්දිතබ්බො, පසිඳයුතු; සචෙ, ඉදින්; තෙසං භික්ඛූනං, ඒ භික්ෂූන්ට; බහුං ගතං, බොහෝ ගියේ වී නම්; අප්පං අවසිට්ඨං, මඳෙක් අවසිටියේ වී නම්; තං නිට්ඨපෙත්වා, හේ නිමවා; අරඤ්ඤං පවිසිතබ්බං, වලටවැද්දයුතු; සචෙ, ඉදින්; අප්පං

සිට්ඨං, යොජනතො පරං අගන්ත්වා අන්තො යොජනපරිච්ඡෙදෙ අඤ්ඤං ගණවාචකං උපසඞ්කමිත්වා ඉමෙ ආයස්මා උද්දෙසාදීහි සඞ්ගණ්හතූති වත්තබ්බං. එවම්පි අලභමානෙන මය්හං ආවුසො එකං කිච්චං අත්ථි, තුම්හෙ යථාඵාසුකට්ඨානානි ගච්ඡථාති ගණං පහාය අත්තනො කම්මං කාතබ්බන්ති෴

(අ) කම්මන්ති නවකම්මං, තං කරොන්තෙන වඩ්ඪකී ආදීහි ලද්ධාලද්ධං ජානිතබ්බං, කතාකතෙ උස්සුක්කං ආපජ්ජිතබ්බන්ති සබ්බථාපි පලිබොධො හොති, සොපි එවං උපච්ඡින්දිතබ්බො, සචෙ අප්පං අවසිට්ඨං හොති නිට්ඨපෙතබ්බං. සචෙ බහුං සඞ්ඝිකමෙව නවකම්මං සඞ්ඝස්ස භාරහාරකභික්ඛූනං වා නිය්‍යාදෙතබ්බං, අත්තනො සන්තකඤ්චෙ අත්තනො භාරහාරකානං නිය්‍යාදෙතබ්බං, තාදිසෙ අලභන්තෙන සඞ්ඝස්ස පරිච්චජිත්වා ගන්තබ්බං෴

---

ගතං, මඳෙක් ගියේවීනම්; බහුං අවසිට්ඨං, අවටසිටියේ බොහෝ වී නම්; යොජනතො පරං අගන්ත්වා, යොදනකින් මත්තට නොගොස්; අන්තො යොජනපරිච්ඡෙදෙ, යොදනක් පමණින් ඇතුළෙහි; අඤ්ඤං ගණවාචකං උපසඞ්කමිත්වා, අනික් ගණවාචකයකු කරා එළැඹ; ආයස්මා, ආවත්තෙමෙ; උද්දෙසාදීහි, උද්දෙශපරිපෘච්ඡාදීන්; ඉමෙ සඞ්ගණ්හතූති, මොවුන්ට සඞ්ග්‍රහකෙරේවයි; වත්තබ්බං, කියයුතු; එවම්පි, මෙසේද; අලභමානෙන, නොලබන්නහු විසින්; මය්හං ආවුසො එකං කිච්චං අත්ථි, ඇවත්නි මාගෙ එක් කටයුත්තෙක් ඇති; තුම්හෙ, තෙපි; යථාඵාසුකට්ඨානානි ගච්ඡථාති, ඵාසුතැනකට යෙත්වයි; ගණං පහාය, ගණයා හැර; අත්තනො කම්මං කාතබ්බං, තමාගෙ මහණදම් කටයුතු෴

(අ) කම්මන්ති, කර්ම නම්; නවකම්මං, නවකර්මාන්තයි; තං, හේ නවකර්මාන්තය; කරොන්තෙන, කරන්නහු විසින්; වඩ්ඪකීආදීහි, වඩු ආදීන් විසින්; ලද්ධාලද්ධං ජානිතබ්බං, ලදනොලද දෙය දතයුතු; කතාකතෙ උස්සුක්කං ආපජ්ජිතබ්බන්ති, කළනොකළ කර්මයෙහි උත්සාහයට පැමිණිය යුතුයයි; සබ්බථාපි, හැමපරිද්දෙන්ම; පලිබොධො හොති, පලිබොධය වේ; (මේ කෙළේ මේ නොකෙළේ යයි දූන් මම කතාකතයෙහි උස්සුක්ක නම්; නොහොත්: "කතාකතෙ අප්පකෙ ච මහන්තෙ ච"යි යුතැන් "ඵලාඵලෙ"යනුයෙහි මෙනි.) සොපි, හෙද; එවං, මෙසේ; උපච්ඡින්දිතබ්බො, පසිඳයුතු; සචෙ, ඉදින්; අප්පං අවසිට්ඨං හොති, මඳක් අවශිෂ්ටවී නම්; නිට්ඨපෙතබ්බං, නිමවියයුතු; ("සචෙ බහුං අවසිට්ඨං"යි සබඳකරනු), ඉදින් බොහෝ අවසිටියේ වී නම්; සචෙ සඞ්ඝිකමෙව නවකම්මං, ඉදින් සඞ්ඝික නවකර්මයෙක්ම වී නම්; සඞ්ඝස්ස භාරහාරකභික්ඛූනං වා නිය්‍යාදෙතබ්බං, සඞ්ඝයාගෙ බර උසුලන භික්ෂූන්ට හෝ පාවාදියයුතු; අත්තනො සන්තකඤ්චෙ, ඉදින් තමාසතු වී නම්; අත්තනො භාරහාරකානං නිය්‍යාදෙතබ්බං, තමාගෙ බර උසුලනට පාවාදියයුතු; තාදිසෙ අලභන්තෙන, එබඳු භාරහාරකයන් නො ලබන්නහු විසින්; සඞ්ඝස්ස පරිච්චජිත්වා, සඞ්ඝයාට හැර; ගන්තබ්බං, යායුතු෴

(අ) අද්ධානනති:- මග්ගගමනං, යස්ස හි කත්ථචි පබ්බජ්ජාපෙක්ඛො වා හොති, පච්චයජාතං වා කිඤ්චි ලද්ධබ්බං හොති, සචෙ තං අලභන්තො න සක්කොති අධිවාසෙතුං, අරඤ්ඤං පවිසිත්වා සමණධම්මං කරොන්තස්සාපි ගමිකචිත්තං නාම දුප්පටිවිනොදයං හොති, තස්මා ගන්ත්වා තං කිච්චං තීරෙත්වාව සමණධම්මෙ උස්සුක්කං කාතබ්බං. ඤාතීති විහාරෙ ආචරියුපජ්ඣාය සද්ධිවිහාරික අන්තෙවාසිකසමානුපජ්ඣායකසමානාචරියකා, ඝරෙ මාතාපිතාභාතාති එවමාදිකා, තෙ ගිලානා ඉමස්ස පලිබොධා හොන්ති, තස්මා සො පලිබොධො උපට්ඨහිත්වා තෙසං පාකතිකකරණෙන උපච්ඡින්දිතබ්බො. තත්ථ උපජ්ඣායො තාව ගිලානො සචෙ ලහුං න වුට්ඨාති යාවජීවම්පි පටිජග්ගිතබ්බො, තථා පබ්බජ්ජාචරියො උපසම්පදාචරියො සද්ධිවිහාරිකො උපසම්පාදිත පබ්බජ්ජාපිත අන්තෙවාසික

---

(අ) අද්ධානනති, අද්ධාන නම්; මග්ගගමනං, මඟයාමයි; යස්ස හි, යමක්හුගෙ; කත්ථචි, කිසිතැනෙක; පබ්බජ්ජාපෙක්ඛො වා හොති, පැවිද්දෙහි අපෙක්ෂා ඇත්තෙක් වී නම් හෝ; පච්චයජාතං වා කිඤ්චි ලද්ධබ්බං හොති, කිසිප්‍රත්‍යයෙක් හෝ ලැබියයුතු වී නම්; සචෙ, ඉදින්; තං අලභන්තො න සක්කොති අධිවාසෙතුං, ඒ නොලබන්නේ ඉවසිය නොහේද; (ඉදින් නොලබන්නේද ඉවසිය හේ නම් වලටවැද මහණ ධම් කටයුතුය යන අභිප්‍රායයි.) අරඤ්ඤං පවිසිත්වා, අරණ්‍යයටවැද; සමණධම්මං කරොන්තස්සාපි, මහණදම්කරන්නහුටද; ගමිකචිත්තං නාම දුප්පටිවිනොදයං හොති, ගමන්යනුකැමැත්තහු සිත නොවැළකිය හැකි; තස්මා, එහෙයින්; ගන්ත්වා, ගොස්; තං කිච්චං තීරෙත්වාව, ඒකටයුත්ත නිමවාම; සමණධම්මෙ උස්සුක්කං කාතබ්බං, මහණධම්හි උත්සාහකටයුතු; ඤාතී ති, නෑයෝ නම්; විහාරෙ, විහාරයෙහි; ආචරිය, ආචාර්‍ය්‍යයහ; උපජ්ඣාය, උපාධ්‍යායයහ; සද්ධිවිහාරික, සද්ධිවිහාරිකයහ; අන්තෙවාසික, අතවැස්සහ; සමානුපජ්ඣායක, සමානවූ උපාධ්‍යායයන් ඇත්තාහ; සමානාචරියකා, සමානවූ ආචාර්‍ය්‍යයන් ඇත්තාහ; (එක උපාධ්‍යායයන් එක ආචාර්‍ය්‍යයන් ඇත්තාහ යුතැති.) ඝරෙ, ගෙහි; මාතා, මවුය; පිතා, පියෙය; භාතාති, බෑය යන; එවමාදිකා, මේ ආදිහුයි; තෙ, ඔහු; ගිලානා, ගිලන්වූවාහු; ඉමස්ස, මොහට; පලිබොධා හොන්ති, පලිබොධ වෙත්; තස්මා, එහෙයින්; සො පලිබොධො, ඒ පලිබොධය; උපට්ඨහිත්වා, උපස්ථාන කොට; තෙසං, ඔවුන්ට; පාකතිකකරණෙන, පියව කිරීමෙන්; (නිරොග කළ මෙන් කිරීමෙනැයි යුතැන්.) උපච්ඡින්දිතබ්බො, පසිඳයුතු; තත්ථ, ඔවුන් කෙරෙහි; උපජ්ඣායො තාව, උපාධ්‍යායයෝ; ගිලානො හොති, ගිලන්වූවාහු; සචෙ, ඉදින්; ලහුං න උට්ඨාති, වහා නොනැඟෙත් නම්; යාවජීවම්පි, යාවජීවයෙනුදු; පටිජග්ගිතබ්බො, පිළිදැග්ගයුත්තෝ; පබ්බජ්ජාචරියො; පැවිදිකළ ඇජරෝද; උපසම්පදාචරියො, උපසම්පදාදුන් ඇජරෝද, සද්ධිවිහාරිකො, සද්ධිවිහාරිකද; උපසම්පාදිත, කම්වදන් කියවා තමා විසින් උපසම්පන්නකරවනලද අතවැසිද; පබ්බජ්ජාපිත අන්තෙවාසික,

සමානුපජ්ඣායකා ච, නිස්සයාචරිය උද්දෙසාචරිය නිස්සයන්තෙවාසික උද්දෙසන්තෙවාසික සමානාචරියකා පන යාව නිස්සයඋද්දෙසා අනුපච්ඡින්නා තාව පටිජග්ගිතබ්බා, පහොන්තෙන තතො උද්ධම්පි පටිජග්ගිතබ්බා එව. මාතාපිතූසු උපජ්ඣායෙ විය පටිපජ්ජිතබ්බං. සචෙපි හි තෙ රජ්ජෙපි ඨිතා හොන්ති පුත්තතොච උපට්ඨානං පච්චාසිංසන්ති, කාතබ්බමෙව. අථ තෙසං භෙසජ්ජං නත්ථි, අත්තනො සන්තකං දාතබ්බං. අසති භික්ඛාචරියාය පරියෙසිත්වාපි දාතබ්බමෙව. භාතුභගිනීනං පන තෙසං සන්තකමෙව යොජෙත්වා දාතබ්බං. සචෙ නත්ථි අත්තනො සන්තකං තාවකාලිකං දත්වා පච්ඡා ලභන්තෙන ගණ්හිතබ්බං අලභන්තෙන න චොදෙතබ්බා. අඤ්ඤාතකස්ස භගිනියා සාමිකස්ස භෙසජ්ජං නෙව කාතුං න දාතුං වට්ටති, තුය්හං සාමිකස්ස දෙහීති වත්වා පන භගිනියා දාතබ්බං. භාතුජායායපි එසෙව නයො. තෙසං පන පුත්තා ඉමස්ස ඤාතකායෙවාති තෙසං කාතුං වට්ටති.

---

පැවිදිකරවනලද අතවැසිද; සමානුපජ්ඣායකා ච, එක උපාධ්‍යායයන් ඇත්තෙද යන මොහුද; තථා, එසේමැයි; (ගිලන්වූවාහු උපස්ථාන කටයුත්තාහ යුතැන්.) නිස්සයාචරිය, නිසදුන් ඇජරෝය; උද්දෙසාචරිය, උදෙසදුන් ඇජරෝය; නිස්සයන්තෙවාසික, නිසවසන අතවැසිය; උද්දෙසන්තෙවාසික, උදෙස ගන්නා අතවැසිය; සමානාචරියකා පන, එක ඇජරන් නිසා වසන්නෝද යන මොහු වනාහි; යාව, යම්තාක්; නිස්සයඋද්දෙසා අනුපච්ඡින්නා, නිශ්‍රය උද්දෙසය යන මොහු නොසිඳපවත්තාහුද; තාව පටිජග්ගිතබ්බා, ඒතාක් පිළිදූග්ගයුත්තාහුයි; පහොන්තෙන, පොහොසත්හු විසින්; තතො උද්ධම්පි, එයින් මත්තෙහිද; පටිජග්ගිතබ්බා එව, පිළිදූග්ගයුත්තාහුමැයි; මාතාපිතූසු, මවුපියන් කෙරෙහි; උපජ්ඣායෙ විය, උපාධ්‍යායයන් කෙරෙහි මෙන්; පටිපජ්ජිතබ්බං, පිළිපැද්දයුතු; සචෙපි හි, ඉදින්; තෙ, ඒ මවුපියෝ; රජ්ජෙපි ඨිතා හොන්ති, රජයෙහි සිටියාහුවූ නමුදු; පුත්තතොච උපට්ඨානං පච්චාසිංසන්ති, පුතණුවන් කෙරෙන් වනාහි උපස්ථාන කැමැති වූ නම්; කාතබ්බමෙව, කටයුතුමැයි; අථ, ඉදින්; තෙසං භෙසජ්ජං නත්ථි, ඔවුන්ට බෙහෙත් නැත්නම්; අත්තනො සන්තකං දාතබ්බං, තමා සතු බෙහෙත් දියයුතු; අසති, තමා සතු බෙහෙදෙක් නැත් නම්; භික්ඛාචරියාය පරියෙසිත්වාපි, භික්ෂාචාරයෙන් පර්‍යෙෂණයකොටද; දාතබ්බමෙව, දියයුතුමැයි; භාතුභගිනීනං පන, භාතු භගිනීන්ට වනාහි; (භාතු නම් තමහට බාල වැඩිමහලු කුසහොත්තෝය. භගිනී නම් බාල වැඩිමහලු කුසහොත්තීයි.) තෙසං සන්තකමෙව, ඔවුන් සතු බෙහෙත්ම; යොජෙත්වා දාතබ්බං, යොදා දියයුතු; සචෙ නත්ථි, ඉදින් නැත්නම්; අත්තනො සන්තකං, තමා සතු බෙහෙත්; තාවකාලිකං දත්වා, තවුකැලි කොට දී; පච්ඡා, පසුව; ලභන්තෙන ගණ්හිතබ්බං, ලබන්නහු විසින් ගතයුතු; අලභන්තෙන, නොලබන්නහු විසින්; න චොදෙතබ්බා, නොඉල්විය යුත්තාහුයි;

(අ) **ආබාධොති** යො කොචිරොගො, සො බාධයමානො පලිබොධො හොති. තස්මා සො භෙසජ්ජකරණෙන උපච්ඡින්දිතබ්බො, සචෙ පන කතිපාහං භෙසජ්ජං කරොන්තස්සාපි න වූපසම්මති, නාහං තුය්හං දාසො න භතකො තං යෙවම්හි පොසෙන්තො අනමතග්ගෙ සංසාර වට්ටෙ දුක්ඛප්පත්තොති අත්තභාවං ගරහිත්වා සමණධම්මො කාතබ්බො. **ගන්ථොති** පරියත්තිපරිහරණං තං සජ්ඣායාදීහි නිච්චබ්‍යාවටස්සෙව පලිබොධො හොති, න ඉතරස්ස තත්‍රිමානි වත්ථූනි. මජ්ඣිමභාණකදෙවත්ථෙරො කිර මලයවාසි දෙවත්ථෙරස්ස සන්තිකං ගන්ත්වා කම්මට්ඨානං යාචි. ථෙරො කීදිසොසි ආවුසො පරියත්තියන්ති පුච්ඡි.

---

භගිනියා, කුසහොත්තියගෙ; අඤ්ඤාතිකස්ස සාමිකස්ස, නොනෑ සැමියහට; භෙසජ්ජං නෙව කාතුං න දාතුං වට්ටති, බෙහෙත් කරන්නටද නොදවටී දෙන්නටද නොදවටී; තුය්හං සාමිකස්ස දෙහීති, තිගෙ සැමියාහට දෙයි; වත්වා, කියා; භගිනියා දාතබ්බං, කුසහොත්තියට දියයුතු; භාතුජායායපි, කුසහොත්තනුගේ අඹුවටද; එසෙව නයො, මෙම්නයයි; තෙසං පන පුත්තා, ඔවුන්ගෙ පුත්‍රයෝ වනාහි; ඉමස්ස ඤාතකායෙව මේ භික්ෂුහට නෑයෝමැයි; තෙසං කාතුං වට්ටති, ඔවුන්ට බෙහෙත් කරන්නට වටී.

(අ) ආබාධොති, ආබාධ නම්; යො කොචිරොගො, මුල්වූ හෝ අනුබඳවූ හෝ යම්කිසි රොගයෙකි; සො, එරොගය; බාධයමානො, පෙළන්නේ; පලිබොධො හොති, පලිබොධ වේ; තස්මා, එහෙයින්; සො, ඒ ආබාධපලිබොධය; භෙසජ්ජකරණෙන උපච්ඡින්දිතබ්බො, බෙහෙත් කිරීමෙන් පසිඳයුතු; සචෙ පන, ඉදින්; කතිපාහං භෙසජ්ජං කරොන්තස්සාපි, කිපදවසක් බෙහෙත්කරන්නාහට ද; න උපසම්මති, නොසන්හිඳේ නම්; නාහං තුය්හං දාසො, මම තාගෙ දසකිම් නොද වෙමි; න භතකො, බැළයකිම් නොදවෙමි; තං යෙව පොසෙන්තො, තාම පොෂණය කරන්නෙම්; අනමතග්ගෙ සංසාරවට්ටෙ, අනුව නොදන්නාලද සසරවට; (අනාදිමත් සසරය යුතැයි.) දුක්ඛප්පත්තො මහීති, දුකට පැමිණියෙම්වීම් යි; අත්තභාවං ගරහිත්වා, ආත්මභාවයට නින්දාකොට; සමණධම්මො කාතබ්බො, මහණදම් කටයුතු; ගන්ථොති, ග්‍රන්ථ නම්; පරියත්ති පරිහරණං, පර්‍ය්‍යාප්ති පරිහරණයයි; තං, හේ; සජ්ඣායාදීහි, සජ්ඣායනය ධාරණය පරිචයය පරිපෘච්ඡාය යනාදීන්; නිච්චබ්‍යාවටස්සෙව, නිත්‍යයෙන් නියුක්තයහටම; පලිබොධො හොති, පලිබොධ වේ; න ඉතරස්ස, අව්‍යාවටයහට නොවේ; (ග්‍රන්ථධුරය හැරද සිටියහට ග්‍රන්ථය පවතී නම් ඕහට ග්‍රන්ථය පලිබොධ නොවෙයි දක්වන පිණිස "තත්‍රිමානි"යනාදී කීහු.) තත්‍ර, එහි; (අව්‍යාවටයහට පලිබොධ නොවීමෙහිය යුතැයි.) ඉමානි වත්ථූනි, මේ වස්තු හුයි; මජ්ඣිමභාණකදෙවත්ථෙරො කිර, මධ්‍යමභාණක දෙව නම් තෙරහු; මලයවාසී, මලයදෙශයෙහි වසන; (ගල්වල වසන යුතැයි.) දෙවත්ථෙරස්ස සන්තිකං ගන්ත්වා, දෙව නම් තෙරුන්වහන්සේ සමීපයට

(ආ) මජ්ඣිමො මෙ භන්තෙ පගුණොති. ආවුසො මජ්ඣිමො නාමෙස දුප්පරිහාරො මූලපණ්ණාසං සජ්ඣායන්තස්ස මජ්ඣිමපණ්ණාසකො ආගච්ඡති. තං සජ්ඣායන්තස්ස උපරිපණ්ණාසකො, කුතො තුය්හං කම්මට්ඨානන්ති. භන්තෙ තුම්හාකං සන්තිකෙ කම්මට්ඨානං ලභිත්වා පුන න ඔලොකෙස්සාමීති කම්මට්ඨානං ගහෙත්වා එකූනවීසති වස්සානි සජ්ඣායං අකත්වා වීසතිමෙ වස්සෙ අරහත්තං පත්වා සජ්ඣායත්ථාය ආගතානං භික්ඛූනං වීසති මෙ ආවුසො වස්සානි පරියත්තිං අනොලොකෙන්තස්ස, අපි ච ඛො කතපරිචයො අහං එත්ථ ආරභථාති වත්වා ආදිතො පට්ඨාය යාව පරියොසානා එකබ්‍යඤ්ජනෙපීති කඞ්ඛා නාහොසි෴ කාරලියගිරිවාසී නාගත්ථෙරෙපි අට්ඨාරසවස්සානි පරියත්තිං ඡඩ්ඩෙත්වා භික්ඛූනං ධාතුකථං උද්දිසි තෙසං ගාමවාසිකත්ථෙරෙහි සද්ධිං සංසන්දෙන්තානං එකපඤ්හොපි උප්පටිපාටියා ආගතො නාහොසි෴

---

එළැඹ; කම්මට්ඨානං යාචි, කමටහන් ඉල්වූහු; ථෙරෙ, තෙරහු; ආවුසො, ඇවත; පරියත්තියං කීදිසොසි, පයඹීපතියෙහි කෙබන්දෙහි දැයි; පුච්ඡි, විචාළේසි෴

(ආ) මජ්ඣිමො මෙ භන්තෙ පගුණො, වහන්ස මධ්‍යමනිකාය මට පුහුණුයයි කීහු; ආවුසො, ඇවැත; එසො මජ්ඣිමො නාම දුප්පරිහාරො, මේ මධ්‍යමනිකාය නම් දුකින් පරිහරණය කටයුත්තේය; මූලපණ්ණාසං සජ්ඣායන්තස්ස, මුල්පනස ස්වාධ්‍යායනයකරන්නා හට; (පිරිවහන්නාහට;) මජ්ඣිමපණ්ණාසකො ආගච්ඡති, (සූත්‍රප්‍රදෙශයන්ද වාරයන්ද සදෘශ බැවින්) මැදිපනස එන්නේය; තං සජ්ඣායන්තස්ස, ඒ මැදිපනස ස්වාධ්‍යායනය කරන්නාහට; උපරිපණ්ණාසකො, උපරිපනස එන්නේය; කුතො තුය්හං කම්මට්ඨානන්ති, තොපට කමටහන් කොයිදැයි; භන්තෙ, වහන්ස; තුම්හාකං සන්තිකෙ, තොප සමීපයෙහි; කම්මට්ඨානං ලභිත්වා, කමටහන් ලදින්; පුන න ඔලොකෙස්සාමීති, නැවත නොබලම්යි; කම්මට්ඨානං ගහෙත්වා, කමටහන් ගෙන; එකූනවීසතිවස්සානි, එකුන්විසි අවුරුද්දක්; සජ්ඣායං අකත්වා, නොපිරිවහා; වීසතිමෙ වස්සෙ අරහත්තං පත්වා, විසිවන හවුරුදු රහත්බවට පැමිණ; සජ්ඣායත්ථාය ආගතානං භික්ඛූනං, ස්වාධ්‍යායනය පිණිස ආ භික්ෂූන්ට; ආවුසො, ඇවැත්නි; පරියත්තිං අනොලොකෙන්තස්ස මෙ, පරියත්තිය නොබලන්නාවූ මට; වීසති වස්සානි, විසිහවුරුද්දෙක් ඇත; අපිච ඛො, එතකුදුවුවත්; අහං, මම; එත්ථ, මෙහි; කතපරිචයො, කරනලද පරිචය ඇත්තෙමි; ආරභථාති වත්වා, ආරම්භකරවයි කියා; ආදිතොපට්ඨාය යාව පරියොසානා, ආදියෙහි පටන් කෙළවර දක්වා; එකබ්‍යඤ්ජනෙපි, එක්බ්‍යඤ්ජනයෙකද; කඞ්ඛා නාහොසි, සැකයෙක් නොවී෴ කාරලියගිරි වාසි නාගත්ථෙරෙපි, කැරලිගිරි නම් තැන වසන නාග නම් තෙරහුද; අට්ඨාරසවස්සානි පරියත්තිං ඡඩ්ඩෙත්වා, අටළොස් හවුරුද්දෙක් පයඹීපතිය හැර; භික්ඛූනං, භික්ෂූන්ට; ධාතුකථං උද්දිසි, ධාතුකථාව දෙසූහු; ගාමවාසික

(ඇ) මහාවිහාරෙපි, තිපිටකචූළාභයත්ථෙරො නාම අට්ඨකථං අනුග්ගහෙත්වාව පඤ්චනිකායමණ්ඩලෙ තීණි පිටකානි පරිවත්තෙස්සාමීති සුවණ්ණභෙරිං පහරාපෙසි. භික්ඛුසඞ්ඝො කතමාචරියානං උග්ගහො, අත්තනො ආචරියුග්ගහං යෙව වදතු, ඉතරථා වත්තුං න දෙමාති ආහ. උපජ්ඣායොපි නං අත්තනො උපට්ඨානං ආගතං පුච්ඡි:–ත්වං ආවුසො භෙරිං පහරාපෙසීති. ආම භන්තෙ, කිං කාරණාති, පරියත්තිං භන්තෙ පරිවත්තෙස්සාමීති. ආවුසො අභය ආචරියා ඉමං පදං කථං වදන්තීති? එවං වදන්ති භන්තෙති. ථෙරො හුං'ති පටිබාහි. පුන සො අඤ්ඤෙන අඤ්ඤෙන පරියායෙන එවං වදන්ති භන්තෙති තික්ඛත්තුං ආහ. ථෙරො සබ්බං හුං'ති පටිබාහිත්වා ආවුසො තයා පඨමං කථිතොයෙව ආචරියමග්ගො ආචරියමුඛතො පන අනුග්ගහිතත්තා එවං ආචරියා වදන්තීති සණ්ඨාතුං නාසක්ඛි.

---

ත්ථෙරෙහි සද්ධිං, අනුරාධපුරවැසි තෙරුන් හා සමග; සංසන්දනත්ථාතං තෙසං, සංසන්දනය කරන ඒ භික්ෂූන්ගෙ; එකපඤ්හාපි උපපටිපාටියා ආගතො නාහොසි, එකද ප්‍රශ්නයෙකුදු උතපටිපාටින් ආයේ නොවී.

(ඇ) මහාවිහාරෙපි, මහ වෙහෙරෙහිදු; තිපිටක චූළාභයත්ථෙරො නාම, තිපිටක චූළාභය නම් තෙරකෙනෙක්; අට්ඨකථං අනුග්ගහෙත්වා, අටුවා නොඉගෙන ම; පඤ්චනිකාය මණ්ඩලෙ, දීඝනිකායාදි පස් නිකායෙහි භික්මුණු පිරිසට; තීණි පිටකානි පරිවත්තෙස්සාමීති, තුන්පිටකය වර්ණනාකෙරෙමියි; සුවණ්ණභෙරිං පහරාපෙසි, ශ්‍රෙෂ්ඨභෙරිය පැහැරවූ; භික්ඛුසඞ්ඝො, භික්සඟහු; කතමාචරියානං උග්ගහො, උහු විසින් වර්ණනාකරනු ලබන්නේ කවර ආචාර්යයන්ගේ උද්ග්‍රහයද; අත්තනො ආචරියුග්ගහං යෙව වදතු, තමාගෙ ආචාර්යයන් ඉගැන්වුවාම කියවයි; ඉතරථා වත්තුං න දෙමාති, නො එසේ කියනොදෙම්හයි; ආහ, කීහ; උපජ්ඣායොපි, උපාධ්‍යායයෝද; අත්තනො උපට්ඨානමාගතං නං පුච්ඡි, තමනට උපස්ථානයට ආ ඒ තෙර පුළුවුත්හු; ත්වං ආවුසො භෙරිං පහාරාපෙසීති, ඇවත තෝ බෙර පැහැරවීදැයි; ආම භන්තෙ, වහන්ස එසේමයයි; කිං කාරණාති, කවර හෙතුවකින්ද; පරියත්තිං භන්තෙ පරිවත්තෙස්සාමීති, වහන්ස පර්‍ය්‍යාප්තිය වර්ණනාකෙරෙමියි කී; ආවුසො අභය, ඇවැත්වූ අබානමැත්තව; ආචරියා ඉමං පදං කථං වදන්තීති, ආචාර්‍ය්‍යවරහු මේ පදය කෙසේ කියද්ද; එවං වදන්ති භන්තෙති, වහන්ස මෙසේ කියති කී; (එක් ඇජරකෙනෙකුන් කෙරෙහි නො ඇසුවද අනුසසව විසින් "එවං වදන්ති"යි-කී හයි දතයුතු.) ථෙරො, තෙරහු; හුංති පටිබාහි, හුංකාරයෙන් පිළිබැහු; පුන, නැවත; සො, හෙතෙම; අඤ්ඤෙනඤ්ඤෙන පරියායෙන, අනික් අනික් ක්‍රමයකින්; එවං වදන්ති භන්තෙති, වහන්ස මෙසේ කියන්නාහයි; තික්ඛත්තුං ආහ, තුන්වරෙක් කීහු; ථෙරො, තෙරහු; සබ්බං, සියල්ලම; හුංති පටිබාහිත්වා, හුංකාරයෙන් පිළිබහා; ආවුසො, ඇවැත; තයා, තා විසින්; පඨමං කථිතොයෙව

(ආ) ගච්ඡ අත්තනො ආචරියානං සන්තිකෙ සුණාහීති. කුහිං භන්තෙ ගච්ඡාමීති. ගඞ්ගාය පරතො රොහණජනපදෙ තුලාධාර පබ්බතවිහාරෙ සබ්බපරියත්තිකො ධම්මරක්ඛිතත්ථෙරො නාම වසති, තස්ස සන්තිකං ගච්ඡාහීති. සාධු භන්තෙති ථෙරං වන්දිත්වා පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං ථෙරස්ස සන්තිකං ගන්ත්වා වන්දිත්වා නිසීදි. ථෙරො කස්මා ආගතොසීති පුච්ඡි. ධම්මං සොතුං භන්තෙති, ආවුසො අභය දීඝමජ්ඣිමෙසු මං කාලෙන කාලං පුච්ඡන්ති, අවසෙසං පන මෙ තිංසමත්තානි වස්සානි න ඔලොකිතපුබ්බං, අපි ච ත්වං රත්තිං මම සන්තිකෙ පරිවත්තෙහි, අහං තෙ දිවා කථයිස්සාමීති. සො සාධුභන්තෙති තථා අකාසි. පරිවෙණද්වාරෙ මහාමණ්ඩපං කාරෙත්වා ගාමවාසිනො දිවසෙ දිවසෙ ධම්මසවණාය ආගච්ඡන්ති ථෙරො රත්තිං පරිවත්තිතං දිවා කථයන්තො අනුපුබ්බෙන දෙසනං

---

ආචරියමග්ගො, පළමුකොට කීයේම ආචාර්‍ය්‍යයන්ගේ කථාමාර්ගය; ආචරියමුඛතො පන අනුග්ගහිතත්තා, ආචාරියමුඛයෙන් වනාහි නො උගත් හෙයින්; එවං ආචරියා වදන්තීති, ආචාර්‍ය්‍යයෝ මෙසේ කියතියි; සණ්ඨාතුං නාසක්ඛි, පිහිටනට නො පොහොසත් වී.....

(ආ) ගච්ඡ,යා; අත්තනො ආචරියානං සන්තිකෙ සුණාහීති, තට කියන් තට දුසුසු ඇජරන් සමීපයෙහි අසායි කීවු; කුහිං භන්තෙ ගච්ඡාමීති, වහන්ස කොහියෙම්ද; ගඞ්ගාය පරතො, ගඟින් ඈත; රොහණජනපදෙ, රුහුණුදනවුවෙහි; තුලාධාරපබ්බතවිහාරෙ, තරහල්පවුවෙහෙර; සබ්බපරියත්තිකො, සියලු ත්‍රිපිටකපර්‍ය්‍යාප්තිධරවූ; ධම්මරක්ඛිතත්ථෙරො නාම වසති, ධර්මරක්ෂිත නම් තෙරකෙනෙක් වෙසෙති; තස්ස සන්තිකං ගච්ඡාහීති, ඔවුන් සමීපයට යායි කීහු; සාධු භන්තෙති, වහන්ස; යහපතැයි; ථෙරං වන්දිත්වා, තෙරුන් වැඳ; පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං, පන්සියයක් භික්ෂූන් හා සමඟ; ථෙරස්ස සන්තිකං ගන්ත්වා, තෙරුන් සමීපයට ගොස්; වන්දිත්වා, වැඳ; නිසීදි, හුන්හු; ථෙරො, තෙරහු; කස්මා ආගතොසීති පුච්ඡි, කුමක් පිණිස ආදූයි විචාළෝ; ධම්මං සොතුං භන්තෙති, වහන්ස දහම් අසනු පිණිස ආමි කී; ආවුසො අභය; ඇවැත්වූ අබා නමැත්තව; දීඝමජ්ඣිමෙසු මං කාලෙන කාලං පුච්ඡන්ති, දීඝමධ්‍යමදෙනිකායයෙහි මා කලින්කල විචාරති; අවසෙසං පන, සෙස්ස වනාහි; මෙ, මා විසින්; තිංසමත්තානි වස්සානි, තිස්හවුරුද් දක්හට; න ඔලොකිතපුබ්බං, නොබලනලද විරිය; අපි ච, එකෙක් ඇති; ත්වං, තෝ; රත්තිං මම සන්තිකෙ පරිවත්තෙහි, රෑ මා සමීපයෙහි පිරිවහා; අහං, මම; තෙ දිවා කථයිස්සාමි, තට දහවල් කියමි; සො, හෙතෙම; සාධු භන්තෙති, වහන්ස යහපතැයි; තථා අකාසි, එසේ කෙළේ; පරිවෙණද්වාරෙ මහාමණ්ඩපං කාරාපෙත්වා, පිරිවෙන්දෙර මහත් මඩුවක් කරවා; ගාමවාසිනො ගම්වැස්සෝ; දිවසෙ දිවසෙ ධම්මසවණාය ආගච්ඡන්ති, දවස දවස දහම් අසනු පිණිස එත්; ථෙරො, තෙරහු; රත්තිං පරිවත්තිතං දිවා කථයන්තො, රෑ පිරිවැහු තැන් දහවල් කියන්නාහු; අනුපුබ්බෙන දෙසනං නිට්ඨපෙත්වා, අනුක්‍රමයෙන්

නිට්ඨපෙත්වා අභයත්ථෙරස්ස සන්තිකෙ තට්ටිකාය නිසීදිත්වා ආවුසො මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ. භන්තෙ කිං භණථ, නනු මයං තුම්හාකමෙව සන්තිකෙ සුතං, කිමහං හි තුම්හෙහි අඤ්ඤාතං කථෙස්සාමීති. තතො නං ථෙරෙ අඤ්ඤෙ එස ආවුසො ගතකස්ස[1] මග්ගො නාමාති ආහ, අභයත්ථෙරෙ කිර තදා සොතාපන්නො හොති. අථස්ස සො කම්මට්ඨානං දත්වා ආගන්ත්වා ලොහපාසාදෙ ධම්මං පරිවත්තෙන්තො ථෙරෙ පරිනිබ්බුතොති අස්සොසි, සුත්වා ආහරථාවුසො චීවරන්ති,[2] චීවරං පාරුපිත්වා අනුච්ඡවිකො ආවුසො අම්හාකං ආචරියස්ස අරහත්තමග්ගො, ආචරියො නො ආවුසො උජු ආජානීයො, සො අත්තනො ධම්මන්තෙවාසිකස්ස සන්තිකෙ තට්ටිකාය නිසීදිත්වා මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ, අනුච්ඡවිකො ආවුසො ථෙරස්ස අරහත්තමග්ගොති. එවරූපානං ගන්ථො පලිබොධො න හොති.

---

දෙසුන් නිමවා; අභයත්ථෙරස්ස සන්තිකෙ තට්ටිකාය නිසීදිත්වා, (පීඨිකායෙන් බැස) අභයතෙරුන් සමීපයෙහි පත්කඩ හිඳ; ආවුසො මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ, ඇවැත මට කමටහන් කියවයි කිවු; භන්තෙ කිං භණථ, වහන්ස කුමක් කියන්නෙස්ද; මයං, මා විසින්; තුම්හාකමෙව සන්තිකෙ සුතං නනු, නුඹ සමීපයෙහිම අසන ලද්දේ නොවේද; අහං හි තුම්හෙහි අඤ්ඤාතං කිං කථෙස්සාමීති, මම වනාහි නුඹ විසින් නොදන්නා ලද කුමක් කියම්ද; තතො, ඉක්බිත්තෙන්; නං, ඔහට; ථෙරෙ, තෙරහු; ආවුසො, ඇවැත; එස ගතකස්ස මග්ගො නාම අඤ්ඤෙති, මේ අධිගතයන්ගේ මාර්ග නම් අනිකෙක්මයයි; ආහ, කිවු; අභයත්ථෙරෙ කිර තදා සොතාපන්නො හොති, අභයතෙරහු එසමයෙහි සොවාන් වෙත්; අථ, ඉක්බිත්තෙන්; සො, ඒ අභයතෙරහු; අස්ස කම්මට්ඨානං දත්වා, ඔවුන්ට කමටහන් දී; ආගන්ත්වා, අවුත්; ලොහපාසාදෙ ධම්මං පරිවත්තෙන්තො, ලෝවාමහපායෙහි ධර්මය කියන්නාහු; ථෙරෙ පරිනිබ්බුතොති අස්සොසි, තෙරහු පිරිනිවියහ යනු ඇසූ; සුත්වා, අසා; ආහරථාවුසො චීවරන්ති, ඇවැත්නි සිවුරු ගෙනෙවයි; චීවරං පාරුපිත්වා, (තෙරුන් කෙරෙහි ගෞරවයෙන්) සිවුරු පරිමණ්ඩල කොට පෙරව; ආවුසො, ඇවැත්නි; අම්හාකං ආචරියස්ස අපගේ ආචාරීන්ගේ; අරහත්තමග්ගො අනුච්ඡවිකො, රහත්මග සුදුසුය; ආවුසො, ඇවැත්නි; නො ආචරියො, අපගේ ආචාර්යයෝ; උජු ආජානීයො ඉඳුරුම කාරණාකාරණා දන්නාහයි; සො, ඔහු; අත්තනො ධම්මන්තෙවාසිකස්ස සන්තිකෙ, තමන්ගෙ ධර්මාන්තෙවාසිකයා සමීපයෙහි; තට්ටිකාය නිසීදිත්වා, පත්කඩ හිඳ; මය්හං කම්මට්ඨානං කථෙහීති ආහ, මට කමටහන් කියවයි කීහ; ආවුසො, ඇවැත්නි; අනුච්ඡවිකො ථෙරස්ස අරහත්තමග්ගොති, තෙරුන්ගෙ රහත්මග අනුච්ඡවිකයයි කිවු; එවරූපානං, මෙබඳුවනට; ගන්ථො පලිබොධො න හොති, ග්‍රන්ථය පලිබොධ නො වේ.

---

1 අධිගතකස්ස-බහුසු. 2 පත්තචීවරන්ති-ත්‍රි: මු.

**(අ) ඉද්ධීති පොථුජ්ජනිකා ඉද්ධි, සා හි උත්තානසෙය්‍යකදාරකො විය තරුණසස්සං විය ච දුප්පරිහාරා හොති, අප්පමත්තකෙන ච භිජ්ජති, සා පන විපස්සනාය පලිබොධො හොති, න සමාධිස්ස, සමාධිං පත්වා පත්තබ්බතො. තස්මා විපස්සනත්ථිකෙන ඉද්ධිපලිබොධො උපච්ඡින්දිතබ්බො, ඉතරෙන අවසෙසා'ති.-**

**-අයං තාව පලිබොධකථාය විත්ථාරො-**

**(ආ) කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා'ති එත්ථ පන දුවිධං කම්මට්ඨානං, සබ්බත්ථකකම්මට්ඨානං පාරිහාරියකම්මට්ඨානන්ති. තත්ථ සබ්බත්ථකකම්මට්ඨානං නාම:- භික්ඛුසඞ්ඝාදීසු මෙත්තා මරණසති ච, අසුභසඤ්ඤා'ති පි එකෙ, කම්මට්ඨානිකෙන හි භික්ඛුනා පඨමං තාව පරිච්ඡින්දිත්වා සීමට්ඨකභික්ඛුසඞ්ඝෙ සුඛිතා භවන්තු අබ්‍යා**

---

(අ) ඉද්ධීති, සෘද්ධිනම්; පොථුජ්ජනිකා ඉද්ධි, පුහුදුන්ගෙ සෘද්ධියි; සා හි, යම් සෘද්ධියක්තොමෝ; උත්තානසෙය්‍යකදාරකො විය, උඩුබැලිහෝනා බාල දරුවෙකු මෙන්ද; තරුණසස්සං විය ච, පැලගොයමක් මෙන්ද; දුප්පරිහාරා හොති, (බොහෝ උපද්‍රව ඇතිබැවින්) දුකසේ පරිහරණය කටයුතුවෙයි; අප්පමත්තකෙන ච භිජ්ජති, මඳකිනුදු බිඳේ; සා පන, හෝ වනාහි; විපස්සනාය පලිබොධො හොති, විදර්ශනාවට පලිබොධ වේ; න සමාධිස්ස, සමාධියට පලිබොධනොවේ; සමාධිං පත්වා, සමාධියට පැමිණ; පත්තබ්බතො, පැමිණිය යුතු හෙයිනි; තස්මා විපස්සනත්ථිකෙන, එහෙයින් විදර්ශනාභාවනාකරනු කැමැත්තහු විසින්; ඉද්ධිපලිබොධො උපච්ඡින්දිතබ්බො, සෘද්ධිපලිබොධය පසිඳිය යුතු; ඉතරෙන, සෙසු සමාධිභාවනාකරනුකැමැත්තහු විසින්; අවසෙසා නව පලිබොධා උපච්ඡින්දිතබ්බා, (යි යොදනු.) සෙසු නව පලිබොධයෝ පසිඳියයුත්තාහුයි.-

**පලිබොධකථා.**

(ආ) කම්මට්ඨාන-පෙ-එත්ථ පන, "කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා" යන මෙහි වනාහි; දුවිධං කම්මට්ඨානං, කමටහන් දෙවැදෑරුම් වේ; සබ්බත්ථකකම්මට්ඨානං, හැමතන්හි කැමැතිවිය යුතු කමටහන; පාරිහාරියකම්මට්ඨානන්ති, පරිහරණය කටයුතු කමටහනැයි; (කම්මට්ඨානං දුවිධං හොති යි-යොදනු.) තත්ථ, එ දෙක්හි; සබ්බත්ථකකම්මට්ඨානං නාම, සබ්බත්ථකකමටහන නම්; භික්ඛුසඞ්ඝාදීසු මෙත්තා, භික්සඟආදීන් කෙරෙහි මෛත්‍රීද; මරණසති ච, මරණසිහියද (යන මේයි); එකෙ, සමහරු; අසුභසඤ්ඤම්පි, අශුභසංඥද (සබ්බත්ථක කමටහනැයි කියත්); කම්මට්ඨානිකෙන හි භික්ඛුනා, කමටහන්හි යෙදෙන මහණහු විසින්; පඨමං තාව, පළමු කොට; පරිච්ඡින්දිත්වා, ("ඉමස්මිං විහාරෙ සබ්බෙ භික්ඛුසඞ්ඝෙ"යි) පිරිසිඳ; සීමට්ඨකභික්ඛුසඞ්ඝෙ, හිම්හි

---

1 සංබබා භික්ඛු සංඝසා-මු. සං. 2. විංසතිකතො-ශ්‍රී. මු.

පජ්ඣාති මෙත්තා භාවෙතබ්බා, තතො සීමට්ඨකදෙවතාසු, තතො ගොචරගාමම්හි ඉස්සරජනෙ, තතො තත්ථ මනුස්සෙ උපාදාය සබ්බසත්තෙසු, සො හි භික්ඛුසඞ්ඝෙ මෙත්තාය සහවාසීනං මුදුචිත්තතං ජනෙති අථස්ස තෙ සුඛසංවාසා හොන්ති. සීමට්ඨකදෙවතාසු මෙත්තාය මුදුකතචිත්තාහි දෙවතාහි ධම්මිකාය රක්ඛාය සුසංවිහිතාරක්ඛො හොති. ගොචරගාමම්හි ඉස්සරජනෙ මෙත්තාය මුදුකතචිත්තසන්තානෙහි ඉස්සරෙහි ධම්මිකාය රක්ඛාය සුරක්ඛිතපරික්ඛාරො හොති. තත්ථ මනුස්සෙසු මෙත්තාය පසාදිතචිත්තෙහි තෙහි අපරිභූතො හුත්වා විචරති. සබ්බසත්තෙසු මෙත්තාය සබ්බත්ථ අප්පටිහතචාරො හොති. මරණසතියා පන අවස්සං[1] මරිතබ්බන්ති[2] අනෙසනං පහාය උපරූපරි වඩ්ඪමානසංවෙගො අනොලීනවුත්තිකො

---

වසන භික්ෂුසඞ්ඝයා කෙරෙහි; සුඛිතා භවන්තු, සුවපත් වෙත්වයි; අබ්‍යාපජ්ඣා භවන්තූති, නිදුක් වෙත්වයි; මෙත්තා භාවෙතබ්බා, මෙත් තොමෝ හැවියයුත්තීයි; තතො, ඉක්බිත්තෙන්; සීමට්ඨකදෙවතාසු, හිම්හි වසන දෙවියන්කෙරෙහිද්; තතො, ඉක්බිත්තෙන්; ගොචරගාමම්හි ඉස්සරජනෙ, ගොදුරුගම්හි ඉසුරුජනයාකෙරෙහිද්; තතො, ඉක්බිත්තෙන්; තත්ථ මනුස්සෙ උපාදාය, ඒ ගොදුරුගම්හි මිනිසුන් කෙරෙහි පටන්; සබ්බසත්තෙසු, සියලු සතුන්කෙරෙහිද්; (මෙත්තා භාවෙතබ්බා යි යොදනු.) සො හි, හෙතෙම; භික්ඛුසඞ්ඝෙ මෙත්තාය, භික්ෂූන් කෙරෙහි මෙතින්; සහවාසීනං, සමඟවසන්නවුන්ගේ; මුදුචිත්තතං ජනෙති, තමා කෙරෙහි මෘදුසිත් ඇතිබව කෙරෙයි; අථ, එසේකල්හි; අස්ස, මොහුවිසින්; තෙ, ඒ සහවාසීහු; සුඛසංවාසා හොන්ති, සුවසේ සමග විසියයුතුවෙත්; සීමට්ඨකදෙවතාසු මෙත්තාය, සිම්හි වසනු දෙවියන් කෙරෙහි මෙතින්; මුදුකතචිත්තාහි දෙවතාහි, මොළොක්කරන ලද සිත්ඇති දෙවියන්විසින්; ධම්මිකාය රක්ඛාය, දහැමින් යුත් රක්ෂාවෙන්; සුසංවිහිතාරක්ඛො හොති, යක්ඛාභූතපරිපන්ථයෙන් මුදාමනාකොට විහිතවූ ආරක්ෂා ඇති වේ; ගොචරගාමම්හි ඉස්සරජනෙ මෙත්තාය, ගොදුරුගම්හි ඉසුරුජනයන්කෙරෙහි මෙතින්; මුදුකතචිත්තසන්තානෙහි ඉස්සරෙහි, මොළොක්කරනලද සිත්සතන්ඇති ඉසුරන්විසින්; ධම්මිකාය රක්ඛාය, ධර්මයෙන් යුක්තවූ රක්ෂාවෙන්; සුරක්ඛිතපරික්ඛාරො හොති, මනාකොට රක්ෂාකරනලද පරිෂ්කාර ඇතියේ වේ; තත්ථ මනුස්සෙසු මෙත්තාය, ඒ ගොදුරුගම්හි මිනිසුන් කෙරෙහි මෙතින්; පසාදිතචිත්තෙහි තෙහි, පහදවනලද සිත්ඇති ඔවුන්විසින්; අපරිභූතො හුත්වා විචරති, අපරිභූතව (අනින්දිතව) හැසිරේ; සබ්බසත්තෙසු මෙත්තාය, සියලුසතුන්කෙරෙහි මෙතින් (සව්සතුන් මොළොක්වනබැවින්); සබ්බත්ථ, හැමතැන; අප්පටිහතචාරො හොති, නොගැටෙනුවූ පැවතුම් ඇතිවේ; මරණසතියා පන, මරණසිහියෙන්; අවස්සං මරිතබ්බන්ති, අවශ්‍යයෙන් මළයුතුයයි; අනෙසනං පහාය, නොසේකරන අනෙසුන් හැර; උපරූපරි වඩ්ඪමාන සංවෙගො, මතුමතුයෙහි වඩනා සංවෙග ඇත්තේ; අනොලීනවුත්තිකො,

---

1 මයං-ත්‍රි. මූ. 2 විනොදනො-ත්‍රි. මූ.

හොති, අසුභසඤ්ඤා පරිචිතචිත්තස්ස පනස්ස දිබ්බානිපි ආරම්මණානි ලොභවසෙන චිත්තං න පරියාදියන්ති. එවං බහූපකාරත්තා සබ්බත්ථ අත්ථිතබ්බං. ඉච්ඡිතබ්බන්ති ච අධිප්පෙතස්ස යොගානුයොගකම්මස්ස ඨානන්තිචාති සබ්බත්ථකකම්මට්ඨානන්ති වුච්චති. චත්තාලීසාය පන කම්මට්ඨානෙසු යං යස්ස චරිතානුකූලං තං තස්ස නිච්චං පරිහරිතබ්බත්තා, උපරිමස්ස ච උපරිමස්ස ච භාවනාකම්මස්ස පදට්ඨානත්තා පාරිහාරියකම්මට්ඨානන්ති වුච්චති. ඉති ඉමං දුවිධම්පි කම්මට්ඨානං යො දෙති අයං කම්මට්ඨානදායකො නාම. තං කම්මට්ඨානදායකං-කල්‍යාණමිත්තන්ති.

134 පියො ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො,
ගම්භීරඤ්ච කථං කත්තා නොචට්ඨානෙ නියොජයෙ ති.

---

හොති, මනාපිළිවෙත පසුනොබස්නා පැවතුම් ඇති වේ; අසුභසඤ්ඤා පරිචිතචිත්තස්ස පන, අශුභසංඥායෙන් පුරුදුකරනලද සිත්ඇති; අස්ස, ඔහුගේ; චිත්තං, සිත; දිබ්බානිපි ආරම්මණානි, දිව අරමුණෝද; ලොභවසෙන, ලොභවශයෙන්; න පරියාදියන්ති, ක්‍ෂයනොකෙරෙත්; (දිවඅරමුණු පවා ඔහුසිත ලොබ් උපනව රූ නොවේ යන අභිප්‍රායයි.) එවං, මෙසේ; බහූපකාරත්තා, බොහෝ උපකාර ඇතිබැවින්; සබ්බත්ථ, සියලු කර්මස්ථානානුයොගයෙහි; අත්ථිතබ්බං, යී යේයි- (පුජීසේ මාවිසින්); ඉච්ඡිතබ්බන්තිච, කැමතිවියයුතුනුයි කියාද; අධිප්පෙතස්ස, අභිමතවූ; යොගානුයොගකම්මස්ස, භාවනාසඞ්ඛ්‍යාත යොගයෙහි අනුයුඤ්ජනක්‍රියාවට; ඨානන්තිචාති, කාරණනුයි කියාද; සබ්බත්ථකකම්මට්ඨානන්ති වුච්චති, සබ්බත්ථකකර්මස්ථානයයි කියනුලැබේ; ("සබ්බත්ථකඤ්ච තං කම්මට්ඨානඤ්චාති සබ්බත්ථකකම්මට්ඨානං" යී වෙත්.) චත්තාලීසාය පන කම්මට්ඨානෙසු, සතලිස් කමටහනුන්කෙරෙහි; යං යස්ස චරිතානුකූලං, යමෙක් යමෙක්හුගේ චරිතයට අනුකූලද; තං, හේ කමටහන; තස්ස, ඔහුවිසින්; නිච්චං, හැමවේලේම; පරිහරිතබ්බත්තා, පරිහරණය කටයුතුබැවින්ද; උපරිමස්ස ච උපරිමස්ස ච භාවනාකම්මස්ස, මතුමතු වන භාවනාකර්මයටද; පදට්ඨානත්තා, පිහිටවනබැවින්ද; පාරිහාරියකම්මට්ඨානන්ති වුච්චති, පාරිහාර්‍ය්‍යකර්මස්ථානයයි කියනුලැබේ; ඉති, මෙසේ; ඉමං දුවිධම්පි කම්මට්ඨානං, මේ දෙවැදෑරුම්වූ කමටහන; යො දෙති, යමෙක් දේද; අයං කම්මට්ඨානදායකො නාම, මේ කර්මස්ථානදායක නම්; (තං කම්මට්ඨානදායකං යනු කල්‍යාණමිත්තං යන්නට විශෙෂණයි.) කල්‍යාණමිත්තන්ති, කල්‍යාණමිත්තං යනුයෙහි.

134. පියො, තමාගේ ශීලසම්පත්තියෙන් ප්‍රියය; (එහෙයින්ම.) ගරු, පහණසතක් මෙන් ගරුය; භාවනීයො, ගුණවිසින් සම්භාවනා කටයුතුය; වත්තා ච, අවවාදවිසින් කියනසුලුය; වචනක්ඛමො, චොදනාවිසින් පිළිවිසිතෙපුල් සහනසුලුය; ගම්භීරඤ්ච කථං කත්තා, සස්පිළිස්සුමුපා ඈ පිළිසංයුත් ගැඹුරුතෙපුල් කියනසුලුය; නොචට්ඨානෙ නියොජයෙති, නොතැන් නොයොදන්නේය යන.

(අ) එවමාදිගුණසමන්නාගතං එකන්තහිතෙසිං වුඩ්ඪිපක්ඛෙ ඨිතං කල්‍යාණමිත්තං. “මමං හි ආනන්ද කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්තී”ති ආදිවචනතො පන සම්මාසම්බුද්ධො යෙව සබ්බාකාරසම්පන්නො කල්‍යාණමිත්තො, තස්මා තස්මිං සති තස්සෙව භගවතො සන්තිකෙ ගහිතං කම්මට්ඨානං සුගහිතං හොති. පරිනිබ්බුතෙ පන තස්මිං අසීතියා මහාසාවකෙසු යො ධරති, තස්ස සන්තිකෙ ගහෙතුං වට්ටති. තස්මිම්පි අසති යං කම්මට්ඨානං ගහෙතුකාමො හොති, තස්සෙව වසෙන චතුක්කපඤ්චකජ්ඣානානි නිබ්බත්තෙත්වා ඣානපදට්ඨානං විපස්සනං වඩ්ඪෙත්වා ආසවක්ඛයං පත්තස්ස ඛීණාසවස්ස සන්තිකෙ ගහෙතබ්බං. කිං පන ඛීණාසවො අහං ඛීණාසවොති අත්තානං පකාසෙතී ති? කිං වත්තබ්බං, කාරකභාවං හි ජානිත්වා පකාසෙති.

---

(අ) එවමාදිගුණසමන්නාගතං, මේ ආදිගුණයෙන් සමන්විතවූ; (“**කල්‍යාණමිත්තො හි සද්ධාසම්පන්නො හොති සීලසම්පන්නො සුතසම්පන්නො චාගසම්පන්නො විරියසම්පන්නො සතිසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො**”යී කියනලද ගුණෙන් සම්පන්නවූ යූ තැති.) එකන්තහිතෙසිං, එකැතියෙන් හිත පසස්නාවූ; වුඩ්ඪිපක්ඛෙ ඨිතං, අභිවෘද්ධිපක්ෂයෙහි පිහිටි; කල්‍යාණමිත්තං, කලණමිත්වූ; ආනන්ද, අනඳ; මමං කල්‍යාණමිත්තං හි ආගම්ම, කල්‍යාණමිත්‍රවූ මා කරු පැමිණ; ජාතිධම්මා සත්තා, ජාතිධර්මසත්වයෝ; ජාතියා පරිමුච්චන්තීති, ජාතීන් මිදෙන්නාහ යන; ආදිවචනතො පන, මේ ආදි වදාළබැවින්; සම්මාසම්බුද්ධො යෙව, සම්මාසම්බුදුහු ම; සබ්බාකාරසම්පන්නො කල්‍යාණමිත්තො, සර්වාකාරයෙන් සම්පන්නවූ කල්‍යාණමිත්‍රයි; තස්මා, එහෙයින්; තස්මිං සති, ඒ බුදුන් ඇතිකල්හි; තස්සෙව භගවතො සන්තිකෙ, ඒ භගවත්හුගේ සමීපයෙහිම; ගහිතං කම්මට්ඨානං සුගහිතං හොති, ගන්නාලද කමටහන සුගහිත නම්වේ; පරිනිබ්බුතෙ පන තස්මිං, භගවත්හු පිරිනිවිකල්හි; අසීතියා මහාසාවකෙසු යො ධරති, අසූමහසවුවන්කෙරෙහි යමෙක් ඇද්ද; තස්ස සන්තිකෙ ගහෙතුං වට්ටති, ඔහුසමීපයෙහි ගන්නට වටී; තස්මිම්පි අසති, උහුදු නැතිකල්හි; යං කම්මට්ඨානං ගහෙතුකාමො හොති, යම් කමටහනක් ගන්නා කැමතිවේද; තස්සෙව වසෙන, ඒ කමටහන්හුගේ වශයෙන්; චතුක්කපඤ්චකජ්ඣානානි නිබ්බත්තෙත්වා, චතුෂ්කපඤ්චකධ්‍යානයන් නිපදවා; ඣානපදට්ඨානං විපස්සනං වඩ්ඪෙත්වා, ධ්‍යානපිහිටකොටඇති විවසුන් වඩා; ආසවක්ඛයං පත්තස්ස, රහත්ඵලයට පැමිණි; ඛීණාසවස්ස සන්තිකෙ ගහෙතබ්බං, රහතක්හු සමීපයෙහි ගතයුතු; කිං පන, කිම; ඛීණාසවො, ක්ෂීණාශ්‍රවතෙමේ; අහං ඛීණාසවොති, මම ක්ෂීණාශ්‍රවයෙම් යි; අත්තානං පකාසෙතීති, තමා පහළකෙරේද?; කිං වත්තබ්බං, අපවිසින් කියයුතු කිම?; කාරකභාවං හි, භාවනාකරනබැව්; ජානිත්වා, දැන; පකාසෙති, තමන් පහළකෙරේ ද මැ නෝ;(දැහැන්කරුන් දුටුකල රහතුන් තමන් රහත්බැව් පහළකරනබවම දක්වනුපිණිස “තන්නු” යනාදි කී

තත්‍ථ අස්සගුත්තත්‍ථෙරො ආරද්ධං ඉමස්ස භික්ඛුනො කම්මට්ඨානං කාරකො අයන්ති ඤත්‍වා ආකාසෙ චම්මඛණ්ඩං පඤ්ඤපෙත්‍වා තත්‍ථ පල්ලඞ්කෙන නිසින්නො කම්මට්ඨානං කථෙසීති. තස්මා සචෙ ඛීණාසවං ලභති, ඉච්චෙතං කුසලං. නො චෙ ලභති, අනාගාමි සකදාගාමි සොතාපන්නඣානලාභී පුථුජ්ජන තිපිටකධර ද්විපිටකධර එකපිටකධරෙසු පුරිමස්ස පුරිමස්ස සන්තිකෙ. එකපිටකධරෙපි අසති යස්ස එකසඞ්ගීතිපි අට්ඨකථාය සද්ධිං පගුණා, සො ච ලජ්ජී හොති, තස්ස සන්තිකෙ ගහෙතබ්බං. එවරූපො හි තන්තිධරො වංසානුරක්ඛකො පවෙණිපාලකො ආචරියො ආචරියමතිකොව හොති, න අත්තනොමතිකො. තෙනෙව පොරාණකත්ථෙරා ලජ්ජී රක්ඛිස්සති ලජ්ජී රක්ඛිස්සතී ති ආහංසු.

---

"කථෙසි තත්‍ථ" යි යොදනු.) අස්සගුත්තත්ථෙරො, අස්සගුප්තනම් තෙරහු; ඉමස්ස භික්ඛුනො, මේ භික්ෂුහු විසින්; (තෘතීයාර්ථයෙහි ෂෂ්ඨිය) කම්මට්ඨානං ආරද්ධං, කමටහන් ආරම්භකරනලද; කාරකො අයන්ති ඤත්‍වා, මේකරැයයි දැන; ආකාසෙ චම්මඛණ්ඩං පඤ්ඤපෙත්‍වා, අහස සම්කඩ පනවා; තත්‍ථ, එහි; පල්ලඞ්කෙන නිසින්නො, පලඟින් හුන්නාහු; කම්මට්ඨානං කථෙසි තත්‍ථ, කමටහන් කීවෝ නොවෙති; තස්මා සචෙ ඛීණාසවං ලභති, එහෙයින් ඉදින් ක්ෂීණාශ්‍රවයක්හු ලැබාතම්; ඉච්චෙතං කුසලං, ඒ ක්ෂීණාශ්‍රවයා කුශලය; (යෙහෙක යුතැ ති.) නො චෙ ලභති, නොලදතම්; අනාගාමි, අනගැමියා; සකදාගාමි, සෙදගැමියා; සොතාපන්න, සෝවාන, ඣාන ලාභී, දැහැන්ලද්දේය; පුථුජ්ජනතිපිටකධර, පුහුදුන් තුන්පිටකධරය; ද්විපිටකධර, දෙපිටකධරය; එකපිටකධරෙසු, එක්පිටකධරය යන මොවුන්කෙරෙහි; පුරිමස්ස පුරිමස්ස සන්තිකෙ, පළමුපළමුවූවහු සමීපයෙහි; (කම්මට්ඨානං ගහෙතබ්බං" යනු සබඳ.) එකපිටකධරෙපි අසති, එක්පිටකයක් දැරුවක්හුදු නැතිකල්හි; යස්ස, යමක්හට; එකසඞ්ගීතිපි, එක්සඟියකුදු; අට්ඨකථාය සද්ධිං පගුණා, අටුවාසමගපුහුණුද; සො ච ලජ්ජී හොති, තෙමේද ලජ්ජී වේද; තස්ස සන්තිකෙ ගහෙතබ්බං, උහුසමීපයෙහි ගතයුතු; එවරූපො හි තන්තිධරො, මෙබඳු ලජ්ජීසූත්‍රධරතෙමේ; වංසානුරක්ඛකො, බුද්ධානුබුද්ධයන් වංශය අනුරක්ෂණයකරන්නාවූ; පවෙණිපාලකො, ඇජර උගහනැමති ප්‍රවෙණිය රක්ෂාකරන්නාවූ; ආචරියො, ආචාර්‍ය්‍යතෙමේ; ආචරියමතිකොව හොති, ආචරියමතිය නොඉක්මෙන බැවින් ආචරියමතයෙහිම සිටිනේයි; (මේ පක්ෂයෙහි "ආචරියමතිං කාසති කථෙති ආචරියමතිකං නියුතො ආචරියමතිකො" යි ගන්නේ "ආචරියමතිං කාසති කථෙතීති ආචරියමතිකො" යි ගත ආචාර්‍ය්‍යමතයම කියන්නේය යන අර්ථ වේ.) න අත්තනොමතිකො, තමාමතිය කියන්නේ නොවේ; තෙනෙව, එහෙයින්ම; පොරාණකත්ථෙරා, පුරාතනතෙරවරහු; ලජ්ජී රක්ඛිස්සති ලජ්ජී රක්ඛිස්සතීති ආහංසු, ලජ්ජී රක්කී ලජ්ජීරක්කී යි කිවූ.

(අ) පුබ්බෙ වුත්තඛීණාසවාදයො චෙත්ථ අත්තනා අධිගතමග්ගමෙව ආචික්ඛන්ති, බහුස්සුතො පන තං තං ආචරියං උපසඞ්කමිත්වා උග්ගහපරිපුච්ඡානං විසොධිතත්තා ඉතො චිතො ච සුත්තඤ්ච කාරණඤ්ච සල්ලක්ඛෙත්වා සප්පායාසප්පායං යොජෙත්වා ගහනට්ඨානෙ ගච්ඡන්තො මහාහත්ථී විය මහාමග්ගං දස්සෙන්තො කම්මට්ඨානං කථෙස්සති. තස්මා එවරූපං කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා තස්ස වත්තපටිවත්තං කත්වා කම්මට්ඨානං ගහෙතබ්බං.

(ආ) සචෙ පන තං එකවිහාරෙයෙව ලභති, ඉච්චෙතං කුසලං. නො චෙ ලභති, යත්ථ සො වසති තත්ථ ගන්තබ්බං. ගච්ඡන්තෙන ච ධොතමක්ඛිතෙහි පාදෙහි උපාහනා ආරුහිත්වා ඡත්තං ගහෙත්වා තෙලනාළිමධුඵාණිතාදීනි ගාහාපෙත්වා අන්තෙවාසිකපරිවුතෙන න ගන්තබ්බං, ගමිකවත්තං පන පූරෙත්වා අත්තනො පත්තචීවරං සයමෙව ගහෙත්වා අන්තරාමග්ගෙ යං යං විහාරං පවිසති සබ්බත්ථ වත්තපටිවත්තං කුරු

---

(අ) එත්ථ ච, මොවුන්කෙරෙහිදු; පුබ්බෙ වුත්තඛීණාසවාදයො, පළමු කී රහත්ආදීහු; අත්තනා අධිගතමග්ගමෙව ආචික්ඛන්ති, තමන්විසින් අධිගතමග්ගම කියති; බහුස්සුතො පන, බහුශ්‍රැත වනාහි; තං තං ආචරියං උපසඞ්කමිත්වා, ඒ ඒ ඇජරන් කරා එළැඹ; උග්ගහපරිපුච්ඡානං විසොධිතත්තා, කමටහනට උපකාරවූ පෙළඅටුවා ශුද්ධකළබැවින්; ඉතොචිතොච, පස්නිකායෙහි ඔබින් ඔබින්; සුත්තඤ්ච කාරණඤ්ච සල්ලක්ඛෙත්වා, ඒ ඒ කමටහනට සුදුසුවූ සූත්‍රපදද සූත්‍රානුගතවූ කාරණාද සලකා; සප්පායාසප්පායං යොජෙත්වා, සැප අසැප යොදා; ගහනට්ඨානෙ ගච්ඡන්තො, ගහන තැන යන්නාවූ; මහාහත්ථී විය, මහ ඇතක්හු මෙන්; මහාමග්ගං දස්සෙන්තො, කමටහන් විධිය මහමං කොට දක්වමින්; කම්මට්ඨානං කථෙස්සති, කමටහන් කියන්නේයි; තස්මා, එහෙයින්; කල්‍යාණමිත්තං, කල්‍යාණමිත්‍රවූ; එවරූපං කම්මට්ඨානදායකං, එබඳුවූ කර්මස්ථාන දායකයක්හු කරා; උපසඞ්කමිත්වා, එළැඹ; තස්ස, ඔහට; වත්තපටිවත්තං කත්වා, වත්පිළිවත් කොට; කම්මට්ඨානං ගහෙතබ්බං, කමටහන් ගතයුතු.

(ආ) සචෙ පන, ඉදින්; තං, ඔහු; එකවිහාරෙ යෙව ලභති, එකවෙහෙරම ලැබේ නම්; ඉච්චෙතං කුසලං, හේ මැනව; නොචෙ ලභති, ඉදින් නොලැබේ නම්; යත්ථ සො වසති, යම්තැනෙක හෙතෙමෙ වෙසේද; තත්ථ ගන්තබ්බං, එයට යායුතු; ගච්ඡන්තෙන ච, යන්නහු විසිනුදු; ධොතමක්ඛිතෙහි පාදෙහි; දෙව තෙල් ගැල්වූ පයින්; උපාහනා ආරුහිත්වා, වහන් නැඟී; ඡත්තං ගහෙත්වා, සත්ගෙන; තෙලනාළිමධුඵාණිතාදීනි ගාහාපෙත්වා, තෙල්නළ මීහි සකුරු ආදීන් ගෙන්වාගෙන; අන්තෙවාසික පරිවුතෙන, අතවැස්සන් විසින් පිරිවරනලදින්; න ගන්තබ්බං, නොයායුතු; ගමිකවත්තං පන පූරෙත්වා, ගමිකවත් පුරා; අත්තනො පත්තචීවරං සයමෙව ගහෙත්වා, තමාගේ පාසිවුරු තමාමගෙන; අන්තරාමග්ගෙ යං යං විහාරං පවිසති, අතුරුමඟ යම් යම් වෙහෙර

මානෙන සල්ලහුකපරික්ඛාරෙන පරමසල්ලෙඛවුත්තිනා හුත්වා ගන්තබ්බං, තං විහාරං පවිසන්තෙන අන්තරායෙව[1] දන්තකට්ඨං කප්පියං කාරාපෙත්වා ගහෙත්වා පවිසිතබ්බං, න ච මුහුත්තං විස්සමිත්වා පාදධොවනමක්ඛනාදීනි කත්වා ආචරියසන්තිකං ගමිස්සාමීති අඤ්ඤං පරිවෙණං පවිසිතබ්බං, කස්මා? සචෙ හිස්ස තත්‍ර ආචරියස්ස විසභාගා භික්ඛූ භවෙය්‍යුං, තෙ ආගමනකාරණං පුච්ඡිත්වා ආචරියස්ස අවණ්ණං පකාසෙත්වා නට්ඨොසි සචෙ තස්ස සන්තිකං ආගතොති විප්පටිසාරං උප්පාදෙය්‍යුං යෙන තතොව පටිනිවත්තෙය්‍ය, තස්මා ආචරියස්ස වසනට්ඨානං පුච්ඡිත්වා උජුකං තත්ථෙව ගන්තබ්බං. සචෙ ආචරියො දහරතරෙ හොති, පත්තචීවරපටිග්ගහණාදීනි න සාදිතබ්බානි, සචෙ බුඩ්ඪතරෙ ගන්ත්වා ආචරියං වන්දිත්වා ඨාතබ්බං, නික්ඛිපාවුසො පත්තචීවරන්ති වුත්තෙන නික්ඛිපිතබ්බං, පානීයං පිවාති වුත්තෙන සචෙ ඉච්ඡති

---

කට වදීද; සබ්බත්ථ, ඒ සියලුතන්හි; වත්තපටිවත්තං කුරුමානො, වදනහු විසින් ආගන්තුකවත් නික්මෙන්නහු විසින් ගමිකවත් කරන්නහු විසින්; සල්ලහුකපරික්ඛාරෙන, සැහැල්හු පිරිකර ඇත්තහු විසින්; පරමසල්ලෙඛවුත්තිනා හුත්වා ගන්තබ්බං, උකට සලේ පැවතුම්ඇතිව යායුතු; තං විහාරං පවිසන්තෙන, ඒ ඇජරන් වසන වෙහෙරට වදනහු විසින්; අන්තරායෙ ව දන්තකට්ඨං කප්පියං කාරාපෙත්වා, අතුරෙහිදීම දුවටුදඬු කැපකරවා; ගහෙත්වා, ගෙන; පවිසිතබ්බං, වැද්දයුතු; මුහුත්තං, මොහොතක්; විස්සමිත්වා, සැතපී; පාදධොවනමක්ඛනාදීනි කත්වා, පාදෙවීම් තෙල්ගැල්වීම් ආදිකොට; ආචරියසන්තිකං ගමිස්සාමීති, ඇජරන්සමීපයට යෙමියි; අඤ්ඤං පරිවෙණං, අනික් පිරිවෙනකට; න චපවිසිතබ්බං, නොමවැද්දයුතු; කස්මා, කුමක්හෙයින යත්; සචෙ හි, ඉදින්; තත්‍ර, ඒ වෙහෙර; ආචරියස්ස විසභාගාභික්ඛූ භවෙය්‍යුං, ආචාය්‍යීයන්ට විසභාගභික්ෂුහු ඇත්නම්; තෙ ආගමනකාරණං පුච්ඡිත්වා, ඔව්හු ආ කරුණු විචාරා; ආචරියස්ස, අචාරීන්ගේ; අවණ්ණං පකාසෙත්වා, නොගුණ ප්‍රකාශකොට; සචෙ, ඉදින්; තස්ස සන්තිකං ආගතො, ඔහුසමීපයට ආයිහි නම්; නට්ඨො අසි, නටුයෙහි වේදැයි; ("අස්ස විප්පටිසාරං උප්පාදෙය්‍යුං"යි සබඳ කරනු.) ඔහට විපිළිසර උපදවන්නාහුයි; යෙන, යම් විපිළිසරකින්; තතොව, එතනම සිට; නිවත්තෙය්‍ය, නවතීද; (එසේ විපිළිසර උපදවන්නා හුය යුතැනී.) තස්මා, එහෙයින්; ආචරියස්ස වසනට්ඨානං පුච්ඡිත්වා, ආචාරීන් වසනතැන පිළිවිස; උජුකං, ඉඳුරම; තත්ථෙව, එයටම; ගන්තබ්බං, යායුතු; සචෙ, ඉදින්; ආචරියො දහරතරෙ හොති, ආචාරීහු ළදරුවූ නම්; පත්තචීවරපටිග්ගහණාදීනි න සාදිතබ්බානි, පාසිවුරු පිළිගැණීම් ආදි නොඉවසියයුතු; සචෙ බුඩ්ඪතරෙ හොති, ඉදින් වැඩිමහලුවූ නම්; ගන්ත්වා, ගොස්; ආචරියං වන්දිත්වා ඨාතබ්බං, ආචාරීන් වැඳ සිටියයුතු; නික්ඛිපාවුසො පත්තචීවරන්ති වුත්තෙන, ඇවැත පාසිවුරුතබායි කියනලද්දහු විසින්; නික්ඛිපිතබ්බං, තැබියයුතු; පානීයං පිවාති වුත්තෙන,

---

1 අන්තරාමග්ගෙයෙව-ත්‍රි. මු. 2 දැහැටු. දැමිටි. දැහිටි.

පාතබ්බං, පාදෙ ධොවාහීති වුත්තෙන න තාව ධොවිතබ්බා, සචෙ හි ආචරියෙන ආහට[1]මුදකං භවෙය්‍ය න සාරුප්පං සියා. ධොවාවුසො න මයා ආහතං අඤ්ඤෙහි ආහතන්ති වුත්තෙන පන යත්ථ ආචරියො න පස්සති එවරූපෙ පටිච්ඡන්නෙ වා ඔකාසෙ අබ්භොකාසවිහාරස්සාපි වා එකමන්තෙ නිසීදිත්වා පාදා ධොවිතබ්බා, සචෙ ආචරියො තෙලනාළිං ආහරති උට්ඨහිත්වා උභොහි හත්ථෙහි සක්කච්චං ගහෙතබ්බා, සචෙ හි සො න ගණ්හෙය්‍ය අයං භික්ඛු ඉතො එව පට්ඨාය සම්භොගං කොපෙතීති ආචරියස්ස භවෙය්‍ය[2]. ගහෙත්වා පන න ආදිතොව පාදා මක්ඛෙතබ්බා, සචෙ හි තං ආචරියස්ස ගත්තබ්භඤ්ජනතෙලං භවෙය්‍ය න සාරුප්පං සියා. තස්මා පඨමං සීසං මක්ඛෙත්වා ඛන්ධාදීනි මක්ඛෙතබ්බානි. සබ්බපාරිහාරියතෙලමිදං ආවුසො පාදෙපි මක්ඛෙහීති

---

පැන් බොවයි කියනලද්දහු වුසින්; සචෙ ඉච්ඡති පාතබ්බං, ඉදින් කැමති නම් පියයුත්ත; පාදෙ ධොවාති වුත්තෙන, පාදයන් දෙයි කියනලද්දහු විසින්; න තාව ධොවිතබ්බා, තව නොදෙවියයුත්ත; සචෙ හි, ඉදින්; ආචරියෙන ආහටමුදකම්භවෙය්‍ය, ආචාරීන් විසින් ගෙනා පැන් වී නම්; න සාරුප්පං සියා, සරුප් නොවන්නේයි; ධොවාවුසො, ඇවත දෙ; න මයා ආහතං, මා විසින් ගෙනෙන ලද්දේ නොවෙයි; අඤ්ඤෙහි ආහතන්ති, අනුන් විසින් ගෙනෙනලදැයි; වුත්තෙන පන, කියනලද්දහු විසින් වනාහි; යත්ථ ආචරියො න පස්සති, යම්තැනෙක්හි ආචාර්‍ය්‍යයෝ නොදකිත්ද; එවරූපෙ, එබඳුවූ; පටිච්ඡන්නෙ වා ඔකාසෙ, ප්‍රතිච්ඡන්නවූ අවකාශයෙක හෝ; අබ්භොකාසවිහාරස්සාපි, අභ්‍යවකාශ විහාරයාගේද; එකමන්තෙ වා නිසීදිත්වා, ආචාරීන්ට ඉදිරිව හමුයෙහි නොහිඳ පිටිපස නොපෙනෙන තෙන හෝ හිඳ; පාදා ධොවිතබ්බා, පා දෙවියයුත්තාහුයි; සචෙ, ඉදින්; ආචරියො, ආචාරීහු; තෙලනාළිං ආහරති, තෙල්නළ ගෙනාවූ නම්; උට්ඨහිත්වා, නැඟීසිට; උභොහි හත්ථෙහි, දෙඅතින්; සක්කච්චං ගහෙතබ්බා, සකස්කොට ගතයුත්තීයි; සචෙහි සො න ගණ්හෙය්‍ය, ඉදින් හෙතෙම නොගත්තේ වී නම්; අයං භික්ඛු, මේ මහණ; ඉතො එව පට්ඨාය, මෙතැනම පටන්ගෙන; සම්භොගං කොපෙතීති, සම්භොගය කොවන්නේයයි; (නොකරන්නේය යුතැන්.) ආචරියස්ස භවෙය්‍ය, ආචාරීන්ට වන්නේය; (සිතන්නේය යුතැනි.) ගහෙත්වා පන, තෙල් නළ ගෙන වනාහි; ආදිතොව පාදා න මක්ඛෙතබ්බා, ආදිකොටම පාදයෝ ගැඟිය යුත්තාහු නොවෙත්; සචෙ හි, ඉදින්; ආචරියස්ස ගත්තබ්භඤ්ජන තෙලං භවෙය්‍ය, ආචාරීන් ශරීරයෙහි ගැඟනතෙලෙක් වී නම්; තං, එය; න සාරුප්පං සියා, සරුප් නොවන්නේයි; තස්මා, එහෙයින්; පඨමං, පළමුකොට; සීසං මක්ඛෙත්වා, හිස ගඟා; ඛන්ධාදීනි මක්ඛෙතබ්බානි, පිටිකර ආදීහු ගැඟියයුතු; ආවුසො, ඇවත; ඉදං, මේ; සබ්බපාරිහාරියතෙලං, සියලු ඇඟපසඟට හෝ සියලු මහණට හෝ පිණිස පරිහරණය කටයුතු තෙල; [ආවුසො, ඇවත;] පාදෙපි මක්ඛෙහීති

---

1. ආහත - ත්‍රි. මු.
2. අඤ්ඤදත්ථකං භවෙය්‍ය - ත්‍රි මු.

වුත්තෙන පන පාදෙ මක්ඛෙත්වා ඉමං තෙලනාළිං ඨපෙමි භන්තෙති වත්වා ආචරියෙ ගණ්හන්තෙ දාතබ්බා. ගතදිවසතො[1] පට්ඨාය කම්මට්ඨානං මෙ භන්තෙ කථෙථ ඉච්චෙවං න වත්තබ්බං. දුතියදිවසතො පන පට්ඨාය සචෙ ආචරියස්ස පකතිඋපට්ඨාකො අත්ථි. තං යාචිත්වා වත්තං කාතබ්බං. සචෙ යාචිතොපි න දෙති, ඔකාසෙ ලද්ධෙයෙව කාතබ්බං, කරොන්තෙන ච ඛුද්දකමජ්ඣිමමහන්තානි තීණි දන්තකට්ඨානි උපනාමෙතබ්බානි, සීතං උණ්හන්ති දුවිධං මුඛධොවන උදකඤ්ච නහානොදකඤ්ච පටියාදෙතබ්බං. තතො යං ආචරියො තීණි දිවසානි පරිභුඤ්ජති, තාදිසමෙව නිච්චං උපට්ඨපෙතබ්බං[2].

(අ) නියමං අකත්වා යං වා තං වා පරිභුඤ්ජන්තස්ස යථාලද්ධං උපනාමෙතබ්බං, කිං බහුනා වුත්තෙන. යං තං භගවතා. "අන්තෙවාසිකෙන භික්ඛවෙ ආචරියම්හි සම්මා වත්තිතබ්බං, තත්‍රායං සම්මාවත්තනා- කාලස්සෙව වුට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං

---

වුත්තෙන පන, පයද ගසයි කියනලද්දහු විසින්; පාදෙ මක්ඛෙත්වා, පයගසා; ඉමං තෙලනාළිං ඨපෙමි භන්තෙති වත්වා, මේ තෙල්නළ තබමි වහන්සැයි කියා; ආචරියෙ ගණ්හන්තෙ දාතබ්බා, ආචාරීන් ගනුත් හොත් දියුතුය; ගතදිවසතො පට්ඨාය, ගිය දවස් පටන් ගෙන; සචෙ, ඉදින්; ආචරියස්ස පකති උපට්ඨාකො අත්ථි, ආචාරීන්ගේ පියවි උපස්ථායකයෙක් ඇත් නම්; තං යාචිත්වා, උහු ඉල්වා ගෙන; වත්තං කාතබ්බං, වත්කටයුතුය; සචෙ, ඉදින්; යාචිතොපි න දෙති, වත් ඉල්වනලද්දේද නොදේ නම්; ඔකාසෙ ලද්ධෙයෙව කාතබ්බං, අවකාශලදවිටම කටයුතු; කරොන්තෙන ච, කරන්නහු විසිනුදු; ඛුද්දකමජ්ඣිමමහන්තානි තීණි දන්තකට්ඨානි, කුඩා මැදුම් මහත්වූ දැහැටිදඬුවෝ තුන්දෙනෙක්; උපනාමෙතබ්බානි, එළවිය යුත්තාහුයි; සීතං උණ්හන්ති දුවිධං, හැල්දිය හුණුදිය යන දෙවැදෑරුම්වූ; මුඛ ධොවනඋදකඤ්ච, මුවදෝනා දියද; නහානොදකඤ්ච, නහනදියද; පටියාදෙතබ්බං, සැපවියයුතු; තතො, එයින්; ආචරියො, ඇජරෝ; තීණි දිවසානි, තුන්දවසක්; යං පරිභුඤ්ජති, යමක් වැළඳගනීත් නම්; තාදිසමෙව නිච්චං උපට්ඨපෙතබ්බං, එබඳුමවූවා නිතියෙන් එළවිය යුතු.

(අ) නියමං අකත්වා, නියම නොකොට; යං වා තං වා පරිභුඤ්ජන්තස්ස, යම්තම් දෙයක් වැළඳගන්නාහට; යථා ලද්ධං උපනාමෙතබ්බං, ලද දැයක්ම එළවියයුතු; කිං බහුනා වුත්තෙන, බොහෝ කොට කී මෙන් කිම; ("යං තං භගවතා පඤ්ඤත්තං" යි සබඳ.) භගවතා, භගවත්හු විසින්; භික්ඛවෙ, මහණෙනි; අන්තෙවාසිකෙන, අතවැස්සහු විසින්; ආචරියම්හි, ආචාරීහු කෙරෙහි; සම්මාවත්තිතබ්බං, මනාකොට පැවැත්ත යුතු; තත්‍ර, එහි; අයං, මේ; සම්මාවත්තනා, මනාකොට පැවතුම්; කාලස්සෙව උට්ඨාය, උදෑසන්හිම නැගී; උපාහනා ඔමුඤ්චිත්වා, වහන්

---

1. ආගතදිවසතො - ත්‍රි. මු. 2. උපනාමෙතබ්බං - ත්‍රි. මු.

කරිත්වා දන්තකට්ඨං දාතබ්බං, මුඛොදකං දාතබ්බං, ආසනං පඤ්ඤ
පෙතබ්බං,සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා”ති
ආදිකං ඛන්ධකෙ යං සම්මා වත්තං පඤ්ඤත්තං තං සබ්බම්පි කාතබ්බං.
එවං වත්තසම්පත්තියා ගරුං ආරාධයමානෙන සායං වන්දිත්වා යාහීති
විස්සජ්ජිතෙන ගන්තබ්බං. යදා සො කිස්ස ආගතොසීති පුච්ඡෙය්‍ය,
තදා ආගමනකාරණං කථෙතබ්බං. සචෙ සො නෙව පුච්ඡති වත්තං
පන සාදියති දසාහෙ වා පක්ඛෙ වා වීතිවත්තෙ එකදිවසං විසජ්ජි
තෙනාපි අගන්ත්වා ඔකාසං කාරෙත්වා ආගමනකාරණං ආරොචෙ
තබ්බං. අකාලෙ වා ගන්ත්වා කිමත්ථං ආගතොසීති පුට්ඨෙන ආරො
චෙතබ්බං. සචෙ සො පාතොව ආගච්ඡාති වදති, පාතොව ගන්තබ්බං.
සචෙ පනස්ස තාය වෙලාය පිත්තාබාධෙන වා කුච්ඡි පරිඩය්හති,
අග්ගිමන්දතාය වා භත්තං න ජීරති, අඤ්ඤො වා කොචිරොගො බාධති,

---

ගළවා; ඒකංසං උත්තරාසඞ්ගං කරිත්වා, උත්තරාසඞ්ගය එකස්කොට
පෙරව; දන්තකට්ඨං දාතබ්බං, දැහැටිදඬු දියයුතු; මුඛොදකං දාතබ්බං,
මුවදෝනාදිය දියයුතු; ආසනං පඤ්ඤපෙතබ්බං, අසුන් පැනවියයුතු;
සචෙ යාගු හොති, ඉදින් කැඳ ඇත්නම්; භාජනං ධොවිත්වා, භාජන
දෙව; යාගු උපනාමෙතබ්බාති, කැඳඑළවියයුත්තීයයි; ආදිකං, මේ
ආදිවූ; ඛන්ධකෙ, වත්තකඳෙහි; යං තං වත්තං, යම් ඒ වතෙක්;
පඤ්ඤත්තං, පනවනලද්ද; තං සබ්බම්පි කාතබ්බං, ඒ සියල්ලම කට
යුතු; එවං, මෙසේ; වත්තසම්පත්තියා ගරුං ආරාධයමානෙන, වත්
සම්පත්තියෙන් ගුරුහු සිත්ගන්නහු විසින්; සායං, සවස; වන්දිත්වා,
වැඳ; යාහීති, යායි; විස්සජ්ජිතෙන, හරනලද්දහු විසින්; ගන්තබ්බං,
යායුතු; යදා, යම්වේලෙක; සො, ඒ ඇජරතෙමේ; කිස්ස ආගතො
සීති පුච්ඡති, කුමක් පිණිස අයිදූයි විචාරාද; තදා, එකල්හි; ආගමන
කාරණං කථෙතබ්බං, ආකරුණු කියයුතු; සචෙ, ඉදින්; සො, ඒ
ඇජරතෙම; නෙව පුච්ඡති, නොම විචාරා නම්; වත්තං පන සාදියති
වත් වතාහි ඉවසා නම්; දසාහෙ වා, දසදවසක් හෝ; පක්ඛෙ වා, පක්ෂ
යක් හෝ; වීතිවත්තෙ, ඉක්මුණුකල; එකදිවසං, එක්දවසක්; විසජ්ජි
තෙනාපි, යායි සමුදෙන ලදහු විසිනුදු; අගන්ත්වා, නොගොස්; ඔකාසං
කාරෙත්වා, අවකාශකරවා; ආගමන කාරණං ආරොචෙතබ්බං, ආ
කරුණු කියයුතු;අකාලෙ වා ගන්ත්වා, නොකල්හි හෝ එළැඹ; කිමත්ථං
ආගතොසීති පුට්ඨෙන, කුමක් පිණිස ආදූයි විචාරනලද්දහු විසින්;
ආරොචෙතබ්බං, කියයුතු; සචෙ, ඉදින්; සො, ඒ ඇජර; පාතොව
ආගච්ඡාති වදති, උදුසන්හිම එවයි කියා නම්; පාතොව ගන්තබ්බං,
උදුසන්හිම යායුතු; සචෙ පන, ඉදින් වනාහි; අස්ස, ඔහුගේ; තාය
වෙලාය, ඒ වේලෙහි; පිත්තාබාධෙන වා කුච්ඡි පරිඩය්හති, පිත්ත
රොගයෙන් කුක්ෂිය දනම් හෝ; අග්ගිමන්දතාය වා භත්තං න ජීරති,
අග්නි මදබැවින් හෝ බත නොදිරා නම්; අඤ්ඤො වා කොචි රොගො
බාධති, අනික් කිසි රොගයෙක් හෝ පෙළා නම්; තං, ඒ රොගය;

තං යථාභූතං ආවිකත්වා අත්තනො සප්පායවෙලං ආරොචෙත්වා තායං වෙලායං උපසඞ්කමිතබ්බං. අසප්පායවෙලායං හි වුච්චමානම්පි කම්මට්ඨානං න සක්කා හොති මනසිකාතුන්ති. "අයං කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා"ති-එත්ථ විත්ථාරො.

(අ) ඉදානි, අත්තනො චරියානුකූලන්ති-එත්ථ චරියාති ඡ චරියා, රාගචරියා දොසචරියා මොහචරියා සද්ධාචරියා බුද්ධිචරියා විතක්කචරියාති, කෙචි පන රාගාදීනං සංසග්ගසන්නිපාතවසෙන අපරාපි චතස්සො, තථා සද්ධාදීනම්පි ඉමාහි අට්ඨහි සද්ධිං චුද්දස ඉච්ඡන්ති. එවම්පන භෙදෙ වුච්චමානෙ රාගාදීනං සද්ධාදීහිපි සංසග්ගං කත්වා අනෙකචරියා

---

යථාභූතං ආවිකත්වා, වූපරිද්දෙන් පහළකොට; අත්තනො සප්පාය වෙලං ආරොචෙත්වා, තමහට සැපවේලාවක් කියා; තායං වෙලායං උපසඞ්කමිතබ්බං, එවේලෙහි එළැඹියයුතු; අසප්පායවෙලායං හි, නොසැපවේලෙහි; වුච්චමානම්පි කම්මට්ඨානං, කියන ලබන ලදවූ කමටහන; න සක්කා හොති මනසිකාතුං, මෙනෙහි කරන්ට නොපිළිවන් වේ; අයං, මෙතෙමේ; කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වාති එත්ථ, කම්මට්ඨාන...පෙ...ත්වා යන මෙහි; විත්ථාරො, විස්තරයි.

(අ) ඉදානි, දැන්; අත්තනො චරියානුකූලන්ති එත්ථ, අත්තනො චරියානුකූලං යන මෙහි; චරියාති, චරියා නම්; ඡචරියා, චරියාවෝ සදෙනයි; රාගචරියා, රාගයාගේ සතන්හි උත්සන්නභාව චරණය (ප්‍රවෘත්තිය) රාගචරියා නම්; (සෙස්සෙහිදු මෙම නයයි.) දොසචරියා, ද්වෙෂචරියාය; මොහචරියා, මොහචරියාය; සද්ධාචරියා, ශ්‍රද්ධාචරියාය; බුද්ධිචරියා, බුද්ධිචරියාය; විතක්කචරියා, විතර්කචරියායයි; (සදෙනෙක් වෙතියි යොදනු.) කෙචි පන, සමහරකෙනෙක් වනාහි; ("ඉච්ඡන්ති"යි යොදනු.) රාගාදීනං, රාගාදී තුන්දෙනාගේ; සංසග්ගසන්නිපාතවසෙන, සංසර්ග සන්නිපාත වශයෙන්; (මිශ්‍ර වශයෙන් රාශි වශයෙන්;) අපරාපි චතස්සො, අනික් සතරදෙනක; තථා සද්ධාදීනම්පි, එසේම ශ්‍රද්ධාදීන්ගේද; (සංසර්ගසන්නිපාත වශයෙන් සතරදෙනෙකැයි) ඉමාහි අට්ඨහි සද්ධිං, මොවුන් අටදෙනෙකු හා සමග; චුද්දස ඉච්ඡන්ති, තුදුස් චරිතකෙනෙක් පසසිත්; (මෙහි රාගද්වෙෂ චරිතය රාගමොහචරිතය ද්වෙෂමොහ චරිත යයි දෙදෙනා එක්කිරීම සංසර්ග නම් වෙයි. රාගද්වෙෂමොහචරිත යයි තුන්දෙනා එක්කිරීම සංසර්ගසන්නිපාත නම් වෙයි. මොවුන් හැම සඳහා-අපරාපි චතස්සො යි කීහු. ශ්‍රද්ධාදී ත්‍රිකයෙහිදු මෙම නයයි.) එවං පන, මෙසේ සංසර්ගසන්නිපාත වශයෙන්; භෙදෙ වුච්චමානෙ, භෙදය කියනු ලබන කල්හි; රාගාදීනං සද්ධාදීහිපි සංසග්ගං කත්වා, රාගාදීන්ගේ ශ්‍රද්ධාදීන් හා ද සංසර්ගකොට; (රාගසද්ධාචරියා යනාදීන් මිශ්‍රකොට;) අනෙකචරියා හොන්ති, නොඑක් චරිතයෝ වෙත්; (තෙසැටෙක්ද අධිකයෙක්ද වෙති යනු අර්ථයි. ඔහු අසමෙමා

හොන්ති, තස්මා සඞ්ඛෙපතො ඡළෙව චරියා වෙදිතබ්බා, චරියා පකති උස්සන්නතාති අත්ථතො එකං, තාසං වසෙන ඡළෙව පුග්ගලා හොන්ති රාගචරිතො දොසචරිතො මොහචරිතො සද්ධාචරිතො බුද්ධිචරිතො විතක්කචරිතොති. තත්ථ යස්මා රාගචරිතස්ස කුසලප්පවත්ති සමයෙ සද්ධා බලවතී හොති, රාගස්ස ආසන්නගුණත්තා. යථා හි අකුසලපක්ඛෙ රාගො සිනිද්ධො නාතිලූඛො, එවං කුසලපක්ඛෙ සද්ධා. යථා හි රාගො වත්ථුකාමෙ පරියෙසති, එවං සද්ධා සීලාදිගුණෙ. යථා හි රාගො අහිතං න පරිච්චජති එවං සද්ධා හිතං න පරිච්චජති, තස්මා රාගචරිතස්ස සද්ධා

---

සාන්තනරධාන සූත්‍රටීකාවෙහි කී නියෙන් දතයුත්තාහුයි.) තස්මා, එහෙයින්; සඞ්ඛෙපතො, සංක්‍ෂෙපයෙන්; ඡළෙවචරියා වෙදිතබ්බා, චරියාවෝ සදෙනෙක්ම දතයුත්තාහුයි; චරියා, චරියාය; පකති, ප්‍රකෘතිය; උස්සන්නතාති, උත්සන්නබවය යනු; අත්ථතො එකං, අර්ථයෙහින් එකෙකි; (රාගාදීහුම සන්තානයෙහි උත්සන්න භාවයෙන් පවත්නා හෙයින් චරියා නමුදු වෙති. ප්‍රතිපක්‍ෂ භාවනාවක් නැති කල්හි ඒ ඒ සතන්හි ස්වභාව හෙයින් ප්‍රකෘති නමුදු වෙති අන්‍ය ධර්ම යන්ට වඩා අධික විසින් උත්සන්නතා නමුදු වෙත්.) තාසං වසෙන, ඒ මූලචරියාවන්ගේ වශයෙන්; ඡළෙවපුග්ගලා හොන්ති, පුද්ගලයෝ සදෙනෙක්ම වෙත්; රාගචරිතො, රාගචරිතය; දොසචරිතො, ද්වෙෂ චරිතය; මොහචරිතො, මොහචරිතය; සද්ධාචරිතො, ශ්‍රද්ධාචරිතය; බුද්ධිචරිතො, බුද්ධිචරිතය; විතක්කචරිතොති, විතර්කචරිතයයි; තත්ථ, එහි; යස්මා, යම්හෙයකින්; රාගචරිතස්ස, රාගචරිතයහට; කුසලප්පවත්ති සමයෙ, කුශලචිත්තයාගේ ප්‍රවෘත්තිකාලයෙහි; සද්ධා බලවතී හොති, (රාගොත්සන්න සන්තානයෙහි තදනුකූලගුණධර්මයාගේ එකාන්තයෙන් අධිකබව සම්භව වන බැවින්) ශ්‍රද්ධා බලවත් වේ; (එහෙයින්ම කීහ. "රාගස්ස ආසන්නගුණත්තා"යි—ස්නෙහය පර්යෙෂණය අපරිත්‍යාගය යන මෙයින් සභාගධර්ම හෙයින් යන අර්ථයි—එම "සාධයති යථා හි" යනාදී) යථා හි, යම්සේ; අකුසලපක්ඛෙ, අකුශලපක්‍ෂයෙහි; රාගො සිනිද්ධො, රාගය සිනිඳු වේද; නාතිලූඛො, රඤ්ජන වශයෙන් පවත්නෙන් අතිශයින්ම රූක්‍ෂ නොවේද; එවං කුසලපක්ඛෙ සද්ධා, කුශල පක්‍ෂයෙහි ශ්‍රද්ධා එසේමයයි; (ප්‍රසාද වශයෙන් පවත්නෙන් සිනිඳුව අරූක්‍ෂව පවති යන අර්ථයි;) යථා හි, යම්සේ; රාගො, රාගයතෙමේ; වත්ථුකාමෙ පරියෙසති, වස්තුකාමයන් පර්යෙෂණය කෙරේද; (තෘෂ්ණා වශයෙන් තන්නිම්නව පවතිත්ද යන අර්ථයි.) එවං සද්ධා සීලාදිගුණෙ, ශ්‍රද්ධාවද සීලාදිගුණයන් එසේමැයි. (අධිමුච්චනවශයෙන් තන්නිම්නව පවතී යන අර්ථයි.) යථා හි, යම්සේ; රාගො, රාගයතෙමේ; අහිතං න පරිච්චජති, අභිෂ්වඞ්ග විසින් වැද පවත්නෙන් අහිතය දුරු නො කෙරේද; එවං සද්ධා හිතං න පරිච්චජති, එසේම ශ්‍රද්ධාවද අවකල්පන භාවයෙන් ස්නෙහ වශයෙන් වැද පවත්නෙන් හිතය දුරුනොකෙරේද; තස්මා, එහෙයින්; රාගචරිතස්ස, රාගචරිතයහට; සද්ධාචරිතො

චරිතො සභාගො. යස්මා පන දොසචරිතස්ස කුසලප්පවත්ති සමයෙ පඤ්ඤා බලවතී හොති, දොසස්ස ආසන්නගුණත්තා. යථා හි අකුසලපක්ඛෙ දොසො නිස්සිනෙහො ආරම්මණං න අල්ලීයති, එවං කුසලපක්ඛෙ පඤ්ඤා. යථා ච දොසො අභූතම්පි දොසමෙව පරියෙසති, එවං පඤ්ඤා භූතමෙව දොසං පරියෙසති. යථා දොසො සත්තපරිවජ්ජනාකාරෙන පවත්තති, එවං පඤ්ඤා සඞ්ඛාරපරිවජ්ජනාකාරෙන. තස්මා දොසචරිතස්ස බුද්ධිචරිතො සභාගො. යස්මා පන මොහචරිතස්ස අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය වායමමානස්ස යෙභුය්‍යෙන අන්තරායකරා විතක්කා උප්පජ්ජන්ති, මොහස්ස ආසන්නලක්ඛණත්තා. යථා ච මොහො පරිබ්‍යාකුලතාය අනවට්ඨිතො...

---

සභාගො, ශ්‍රද්ධාචරිතයා සභාගවේ; යස්මා පන, යම්හෙයකින් වනාහි; දොසචරිතස්ස, ද්වේෂචරිතයහට; කුසලප්පවත්ති සමයෙ, කුශලයාගේ ප්‍රවෘත්තිකාලයෙහි; පඤ්ඤා බලවතී හොති, (ද්වේෂොත්සන්න සන්තානයෙහි තදනුකූලධර්මයාගේ එකාන්තයෙන් අධිකබව සම්භව වන හෙයින්) ප්‍රඥාබලවත්වේ; (එහෙයින්ම කීහ. "දොසස්ස ආසන්නගුණත්තා"යි-නොඇලීමය පයෙෂ්ෂණය පරිවර්ජනය යන මෙයින් සභාගධර්ම හෙයින යන අර්ථයි.) යථා හි, යම්සේ; අකුසලපක්ඛෙ, අකුශලපක්ෂයෙහි; දොසො නිස්සිනෙහො, ද්වේෂය (ව්‍යාපාදවශයෙන් විසංසෘෂ්ටව පවත්නෙන්) නිස්නෙහවේද; ආරම්මණං න අල්ලීයති, අරමුණෙහි නොඇලේද; එවං කුසලපක්ඛෙ පඤ්ඤා, කුශලපක්ෂයෙහි ප්‍රඥාද එසේමැයි; (රාගයන්ගේ යථාස්වභාවාවබොධ විසින් පවත්නෙන් අරමුණෙහි විසංසෘෂ්ටව පවත්නේය යන අර්ථයි.) යථා ච, යම්සේ; දොසො, ද්වේෂය; අභූතම්පි දොසමෙව පරියෙසති, අවිද්‍යමානවූ දෝෂයක්ම සොයාද; (නැටිවේද;) එවං පඤ්ඤා භූතමෙව දොසං පරියෙසති, එසේම ප්‍රඥාවද විද්‍යමානවූ දෝෂයක් සොයා; (විචාරණය කෙරේය යන අර්ථයි.) යථා, යම්සේ; දොසො, ද්වේෂය; සත්තපරිවජ්ජනාකාරෙන පවත්තති, සත්වයන් දුරුකරන ආකාරයෙන් පවතීද; (යම්සේ තමහට අහිත වේද ඒ ආකාරයෙන් දුරුකෙරේද යන අර්ථයි.) එවං පඤ්ඤා සඞ්ඛාරපරිවජ්ජනාකාරෙන, එසේම ප්‍රඥතොමෝ; (නිර්වින්දනාදි වශයෙන් පවත්නෙන්) සංස්කාරයන් දුරුකරන ආකාරයෙන් පවතී; තස්මා, එහෙයින්; දොසචරිතස්ස, ද්වේෂචරිතයාහට; බුද්ධිචරිතො සභාගො, බුද්ධිචරිතයා සභාග වේ; යස්මා පන, යම්හෙයකින් වනාහි; මොහචරිතස්ස, මොහචරිතයහට; අනුප්පන්නානං කුසලානං ධම්මානං, අනුත්පන්න කුශලධර්මයන්ගේ; උප්පාදාය වායමමානස්ස, උත්පාදය පිණිස ව්‍යායාම කරනුවහට; යෙභුය්‍යෙන, බොහෝ සේම; අන්තරායකරා විතක්කා උප්පජ්ජන්ති, (මොහොත්සන්න සන්තානයෙහි තදනුකූලගුණධර්මයාගේ බොහෝසේ ප්‍රවෘත්තියවන හෙයින්) අන්තරායකර මිථ්‍යා විතර්කයෝ උපදනාහුයි; (එහෙයින් කීහ "මොහස්ස ආසන්නලක්ඛණත්තා"යි-අනවස්ථාන චඤ්චලභාවයෙන් සභාග ලක්ෂණ

(අ) එවං විතක්කො නානප්පකාරවිතක්කනතාය, යථා ච මොහො අපරියොගාහනතාය චඤ්චලො, තථා විතක්කො ලහුපරිකප්පනතාය. තස්මා මොහචරිතස්ස විතක්කචරිතො සභාගොති. අපරෙ තණ්හා මාන දිට්ඨිවසෙන අපරා පි තිස්සො චරියා වදන්ති, තත්ථ තණ්හා රාගො යෙව මානො ච තං සම්පයුත්තොති තදුභයං රාගචරියං නාතිවත්තති.

---

හෙයින යන අර්ථයි—මොහයද විතර්කයද අකුසලම බැවින් "ආසන්න ගුණත්වා"යි නොකියා "ආසන්න ලක්ඛණත්වා"යී කීහු.) යථා ච, යම්සේ; මොහො, මොහයතෙමෙ; පරිව්‍යාකුලතාය, අරමුණෙහි සම් මොහවසයෙන් ව්‍යාකුලව පවත්නෙන්; අනවට්ඨිතො, නොසතිටු හන්ව පවතිද.

(අ) එවං, එපරිද්දෙන්ම; විතක්කො, විතර්කයතෙමේ; නානාප්ප කාරවිතක්කනතාය, නානාප්‍රකාර අරමුණු විතර්කණය කොට සවිස්ථාර බැවින් නොසතිටුහන්ව පවතී; යථා ච, යම්සෙ; මොහො, මොහය; අපරියොගාහනතාය, ස්වභාවාවබොධ විසින් අරමුණෙහි නොබැස පවත්නා බැවින්; චඤ්චලො, චඤ්චලව පවතීද; තථා, එසේම; විතක්කො, විතර්කයද; ලහුපරිකප්පනතාය, ලඝුවූ කල්පනා ඇති බැවින් චඤ්චලව පවතී; තස්මා, එහෙයින්; මොහචරිතස්ස මොහ චරිතයහට; විතක්කචරිතො සභාගොති, විතර්කචරිතයා සභාගවේ; අපරෙ, සමහරු; තණ්හාමානදිට්ඨිවසෙන, තණ්හාචරියා ය මානචරි යා ය දිට්ඨිචරියා ය යන මොවුන්ගේ වශයෙන්; අපරාපි තිස්සො චරියා වදන්ති, අතික් තුන්චරිත කෙනෙකුත්ද කියත්; තත්ථ, ඔන්වුකෙරෙහි; තණ්හා රාගොයෙව, තෘෂ්ණා නම් රාගයමය; මානො ච, මානයද; තං සම්පයුත්තොති, එරාගයා හා ම සම්ප්‍රයුක්තනුයි; තදුභයං, තෘෂ්ණා මාන වය; රාගචරියං නාතිවත්තති, ස්වභාව හෙයිනුදු සම්ප්‍රයොගහෙයිනුදු රාගචරියාව ඉක්ම නොපවතී.

(තෘෂ්ණාව නම් ස්වභාව හෙයින් රාගයමය එහෙයින් රාගචරියා යෙන් භින්න තෘෂ්ණාචරියාවෙක් නැත මානයද වෙෂාදීන් මෙන් උහු හා විප්‍රයුක්තව නොලැබෙනුයි තෘෂ්ණාමාන දෙකම රාගචරියාවෙහිම සඞ්ග්‍රහ වෙයි යන අභිප්‍රායයි-යම්සේ රාග ද්වෙෂයන් හා සම්ප්‍රයොග වශයෙන් සමඟ පවත්නාවූද මොහය උත්සද හෙයින් වෙනම චරියා භාවනයද එසෙම රාගය හා සම්ප්‍රයොග ඇතද වෙනම මානයාගේ චරියාභාවය යුක්තවන්නේය. එතකුදු වුවත් රාග පටිඝ මාන දිට්ඨි විචිකිච්ඡා අවිජ්ජාවන්ගේ අනුසයාර්ථයමෙන් මේ රාගාදීන්ට වෙන්වූ චර්‍ය්‍යාර්ථයෙක් ඇත්තුයි මානයහට චර්‍ය්‍යාර්ථය නැතැයි දතයුතු. දෘෂ්ටියගේද වෙනම චරියානොවන බව මෙසේ දතයුතු. සත්‍යයෙහි මානය බහුල පුද්ගලයාහට ඊර්‍ය්‍යාපථාදි විසින් විභාගයක් නැති බැවින් රාගචරිතයා කෙරෙහිම සඞ්ග්‍රහ කරන පිණිස මානො ච තං සම්ප යුත්තොව යි කීහු.

(අ) මොහනිදානත්තා ච දිට්ඨියා දිට්ඨිචරියා මොහචරියමෙව අනුපතිතා පනෙතා චරියා කිංනිදානා? කථඤ්ච ජානිතබ්බං? අයං පුග්ගලො රාගචරිතො අයං දොසාදීසු අඤ්ඤතරචරිතො කිං චරිතස්ස පුග්ගලස්ස කිං සප්පායන්ති? තත්‍ර පුරිමා තාව තිස්සො චරියා පුබ්බාචිණ්ණනිදානා ධාතුදොසනිදානා චාති එකච්චෙ වදන්ති, පුබ්බෙ කිර ඉට්ඨප්පයොග සුභකම්මබහුලො රාගචරිතො හොති සග්ගා වා චවිත්වා ඉධූපපන්නො, පුබ්බෙ ඡෙදනවධබන්ධනවෙරකම්මබහුලො දොසචරිතො හොති, නිරයනාගයොනීහි වා චවිත්වා ඉධූපපන්නො, පුබ්බෙ මජ්ජපානබහුලො සුතපරිපුච්ඡාවිහීනො ච මොහචරිතො හොති, තිරච්ඡානයොනියා වා චවිත්වා ඉධූපපන්නොති. එවං පුබ්බාචිණ්ණනිදානාති වදන්ති. ද්වින්නං පන ධාතූනං උස්සන්නත්තා පුග්ගලො

---

(අ) දිට්ඨියා, දෘෂ්ටියගේ; මොහනිදානත්තාච, මොහනිදාන කොට ඇති බව හෙයිනුදු; (සමුච්චයින් සම්ප්‍රයුක්තහෙයිනුදු යන අර්ථයි;) දිට්ඨිචරියා, දෘෂ්ටිචර්‍ය්‍යාව; මොහචරියමෙව අනුපතති, මොහ චර්‍ය්‍යාවෙහිම ඇතුළත් වේ යන අර්ථයි.තා පනෙතා චරියා, ඒ මේ චරිතයෝ; කිංනිදානා, කුමක්නිදාන කොට ඇත්තාහුද; අයං පුග්ගලො රාගචරිතො, මෙ පුද්ගල රාගචරිතය; අයං, මෙතෙම; දොසාදීසු, ද්වේෂාදීන් කෙරෙහි; අඤ්ඤතරචරිතො, එක්තරා චරිතයෙක; කිං චරිතස්ස පුග්ගලස්ස, කවර චරිතපුද්ගලට; කිං සප්පායන්ති, කිමෙක් සැප්දැයි; (කථං ච ජානිතබ්බං යී යොදනු.) කෙසේ දතයුතුද; තත්‍ර, එහි; පුරිමා තාව තිස්සො චරියා, පළමුවූ රාගාදි චර්‍ය්‍යාවෝ තුන්දෙන; පුබ්බාචිණ්ණනිදානා, පූර්වජාතියෙහි පුරුදුකරනලද දෙය කාරණකොට ඇත්තාහ; ධාතුදොසනිදානා චාති, පෘථිවිධාතු ආදීන් හා ශ්ලේෂ්මාදී දෝෂයන් කාරණකොට ඇත්තාහයි; එකච්චෙ, සමහරකෙනෙක්; වදන්ති, කියත්; (එකච්චෙ යනු උපතිෂ්‍යස්ථවිරයන් සඳහා කීහු. ඔවුන් විසින් තමන්ගේ විමුක්ති මාර්ගයෙහි එසේ කියනලදී )පුබ්බෙ, පූර්වජාතියෙහි;(කිර ශබ්දය ඔවුන් කියනුයෙහි අරුචි සූචනාර්ථයි.) ඉට්ඨප්පයොග, ඉෂ්ටක්‍රියා හා; සුභකම්මබහුලො,සුභක්‍රියා බොහෝ කොට ඇත්තේ; රාගචරිතො හොති, රාගචරිත වෙයි; සග්ගා වා චවිත්වා ඉධූපපන්නො, ස්වර්ගයෙන් හෝ චුතව මිහි උපන්නේද රාගචරිත වේ; පුබ්බෙ, පූර්වජාතියෙහි; ඡෙදනවධබන්ධන වෙරකම්මබහුලො, අත් පා ආදි සිඳීම මැරීම අඬු බන්ධනාදීන් බැඳීම වෛරක්‍රියාය යන මොවුන් බහුලකොට ඇත්තේ; දොසචරිතො හොති, ද්වේෂචරිත වෙයි; නිරයනාගයොනීහි වා චවිත්වා ඉධූපපන්නො, නිරය නාගයොනිය යන මෙයින් චුතව මිහි උපන්නේ හෝ ද්වේෂචරිත වෙයි; පුබ්බෙ මජ්ජපානබහුලො, පූර්වයෙහි මද්‍යපානය බොහෝ කොට ඇතියේ; සුතපරිපුච්ඡාවිහීනො ච, ශ්‍රැතපරිපෘච්ඡා රහිතයාද; මොහචරිතො හොති, මොහචරිත වේ;(මිහි ශ්‍රැත නම් ඇසූ දැන පරිපෘච්ඡා නම් ග්‍රන්ථිපද අර්ථ විචාරයි.)තිරච්ඡානයොනියා වා චවිත්වා,තිරිසන් යොනියෙන් හෝ චුතව; ඉධූපපන්නො, මිහි උපන්නේ මොහචරිත වෙයි;

මොහචරිතො හොති පඨවීධාතුයා චෙව අපොධාතුයා ච. ඉතරාසං ද්වින්නං උස්සන්නත්තා දොසචරිතො, සබ්බාසං සමත්තා පන රාගචරිතොති. දොසෙසු ච සෙම්හාධිකො රාගචරිතො හොති, වාතාධිකො මොහචරිතො. සෙම්හාධිකො වා මොහචරිතො, වාතාධිකො වා රාගචරිතොති, එවං ධාතුදොස නිදානාති වදන්ති. තත්ථ යස්මා පුබ්බෙ ඉට්ඨප්පයොගසුභකම්ම බහුලාපි සග්ගා චවිත්වා ඉධූපපන්නාපි ච න සබ්බෙ රාගචරිතායෙව හොන්ති. ඉතරෙ වා දොසමොහචරිතා, තථා ධාතූනඤ්ච යථාවුත්තෙන නෙව නයෙන උස්සදනියාමො[1] නාම නත්ථි, දොසනියමෙ ච රාගමොහ

---

එවං, මෙසේ; පුබ්බාචිණ්ණ නිදානාති වදන්ති, පෙර පුරුදුකළ දෑය නිදානකොට ඇත්තාහයි කියත්; ද්වින්නං පන ධාතූනං උස්සන්නත්තා, ධාතුන් දෙදෙනා උත්සන්නබැවින්; පුග්ගලො මොහචරිතො හොති, පුද්ගල මොහචරිත වේ; (කවර දෙදෙනාගේද යත්?) පඨවීධාතුයා චෙව, පෘථිවීධාතුවගේ හා, ආපොධාතුයා ච, ආපොධාතුවගේ යි; (ධාතුන් දෙදෙනා ගුරුබැවින් ඔවුන් අධිකපුහුල්හු නොහඟනා බැවින් අරමුණු බරව වැටහෙන මොහචරිත වේ.) ඉතරාසං ද්වින්නං උස්සන්නත්තා, තෙජොධාතු වායොධාතු දෙදෙනා අධිකබැවින්; දොසචරිතො [හොති], ද්වෙෂචරිත වේ; (ධාතුන් දෙදෙනා තීක්ෂ්ණ බැවින් ඔවුන් අධික පුද්ගලතෙම තීක්ෂ්ණවූ ද්වෙෂචරිත වෙයි කියත්.) සබ්බාසං සමත්තා පන රාගචරිතො, සියලුධාතුන්ගේ සමබැවින් රාගචරිත වේ; දොසෙසු ච, දොෂයන් කෙරෙහිද; සෙම්හාධිකො රාගචරිතො හොති, සෙම්න් ශුක්‍රප්‍රාබල්‍යවනහෙයින් ශ්ලෙෂ්මාධිකයා රාගචරිත වෙයි; වාතාධිකො මොහචරිතො, වාතය වියවුල්ව පවත්නාබැවින් වාතාධිකයා මොහචරිත වේ; සෙම්හාධිකො වා මොහචරිතො, ශ්ලෙෂ්මාව වසාගෙන සිටිනාහෙයින් ශ්ලෙෂ්මාධිකයා හෝ මොහචරිත වේ; වාතාධිකො වා රාගචරිතොති, වාතයා සොල්වනබැවින් වාතාධිකයා හෝ රාගචරිත වෙයි යෙත්; එවං, මෙසේ; ධාතුදොසනිදානාති වදන්ති, ධාතුන්හා දොෂයන් නිදානකොට ඇත්තාහයි කියත්; තත්ථ, එහි; යස්මා, යම් හෙයකින්; පුබ්බෙ, පූර්වජාතියෙහි; ඉට්ඨප්පයොගසුභකම්මබහුලාපි, ඉෂ්ටක්‍රියා හා සුභක්‍රියා බහුලයෝද; සග්ගා චවිත්වා ඉධූපපන්නාපි ච; ස්වර්ගයෙන් චුතව මෙහි උපන්නාහුද; න සබ්බෙ රාගචරිතායෙව හොන්ති, (අරාගචරිතය නටද පූර්වයෙහි ඉෂ්ටප්‍රයොග ශුභකර්ම බහුලබව සම්භවවනහෙයිනුදු ස්වර්ගයෙන් චුතව මිහි උත්පත්තිය සම්භවවනහෙයිනුදු) හැමදෙනම රාගචරිත නොවෙත්; ඉතරෙ වා, (ඡෙදන වධබන්ධන වෛර කර්මබහුල යෝද නිරය නාගයොනීන් චුතව මෙහි උපන්නාවූද) සෙස්සෝ; න සබ්බෙ දොසමොහචරිතා එව හොන්ති, (යි යොදනු.) හැමදෙනම ද්වෙෂමොහචරිතයෝ නොවෙති; තථා, එසේම; ධාතූනං ච, ධාතුන්ගේද; යථා වුත්තෙනෙව නයෙන, 'ද්වින්නං පන ධාතූනං උස්සන්නත්තා' යනාදි උක්තප්‍රකාරවූ නයින්; උස්සදනියාමො නාම නත්ථි, උත්සද නියමයෙක්නම්

---

1. නියමො-කත්ථචි.

චයමෙව වුත්තං, තම්පි ච පුබ්බාපරවිරුද්ධමෙව. සද්ධාචරියාදීසු ච එකිස්සාපි නිදානං න වුත්තමෙව, තස්මා සබ්බමෙතං අපරිච්ඡින්නවචනං. අයං පනෙත්ථ අට්ඨකථාචරියානං මතානුසාරෙන විනිච්ඡයො:- වුත්තං හෙතං උස්සදකිත්තනෙ—"ඉමෙ සත්තා පුබ්බහෙතු නියාමෙන ලොභුස්සදා දොසුස්සදා මොහුස්සදා අලොභුස්සදා අදොසුස්සදා අමොහුස්සදා ච හොන්ති.

(අ) යස්ස හි කම්මායූහනක්ඛණෙ ලොභො බලවා හොති අලොභො මන්දො, අදොසාමොහා බලවන්තො දොසමොහා මන්දා, තස්ස මන්දො

---

නැති; (අසුවල් අසුවල් ධාතූහු අධිකබැවින් අසුවල් අසුවල් චරිතවෙ යි යන නියමයෙක් නැත යන අර්‍ථයි.) දොසනියමෙ ච, දෝෂ නියමයෙහිදු; රාගමොහචයමෙව වුත්තං, රාගමොහ දෙකම කියනලදී; තම්පි ච, හේ දෝෂවශයෙන් නියමවචනය ද; පුබ්බාපරවිරුද්ධමෙව, පූර්‍වාපරවිරුද්ධමැයි; (සෙම්හාධිකො රාගචරිතො යි කියා නැවත සෙම්හාධිකො මොහචරිතො යී ද වාතාධිකො[1] මොහචරිතො යි කියා නැවත වාතාධිකො රාගචරිතො[2] යී ද කීබැවින් පූර්‍වාපරවිරුද්ධය යන අර්‍ථයි.) සද්ධාචරියාදීසු ච, ශ්‍රද්ධාචරිතාදීන් කෙරෙහිදු; එකිස්සාපි, එකචර්‍ය්‍යාව කටද; නිදානං න වුත්තමෙව, නිදාන නොකියනලදමැයි; තස්මා, එහෙයින්; සබ්බමෙතං, මෙ සියල්ල; අපරිච්ඡින්නවචනං, නුවණින් පිරිසිඳ කියනලද වචනයෙක් නොවේ; (පරීක්‍ෂානොකොට කී වචනයෙක යන අර්‍ථයි.) අයං පන, මේ වනාහි; එත්ථ, මෙහි; අට්ඨකථාචරියානං, අර්‍ථකථාචාර්‍ය්‍යයන්ගේ; මතානුසාරෙන විනිච්ඡයො, ලබ්ධි අනුමයාමෙන් කරන විනිශ්චයයි; වුත්තං හෙතං උස්සදකිත්තනෙ, (විපාකකථාවෙහි) උත්සදකීර්‍තනයෙහි කියෙ මැනු; ඉමෙ සත්තා, මේ සත්හු; පුබ්බහෙතුනියාමෙන, පූර්‍වයෙහි ප්‍රවෘත්තලොභාදි[3] හෙතුනියමයෙන්; (ඒ ලොභාදීන්ට ප්‍රතිනියත ලුබ්ධතාදි ස්වභාවයෙන යන අර්‍ථයි.) ලොභුස්සදා, ලොභොත්සද වෙති; (ලොභො උස්සදො එතෙසන්ති ලොභුස්සදා යි ගන්නේ- සෙස්සෙහි දු මෙම නයයි- උත්සන්න ලොභයන ලොභාධිකයන යන අර්‍ථයි.) දොසුස්සදා, ද්වෙෂොත්සද වෙති; මොහුස්සදා, මොහොත්සද වෙති; අලොභුස්සදා, අලොභොත්සද වෙති; අදොසුස්සදා, අද්වෙෂොත්සද වෙති; අමොහුස්සදා ච හොන්ති, අමොහොත්සද ද වෙත්; (සම්පිණ්ඩනාර්‍ථ ච ශබ්දයෙන් ලොභාදීන්ගේ ව්‍යතිමිශ්‍රකවශයෙන් සම්භවවන චතුර්දශ ප්‍රභෙදයන් නිඃශෙෂයෙන් සම්පිණ්ඩණය කෙරෙත්.

(අ) යස්ස හි; යමෙක්හට; කම්මායූහනක්ඛණෙ, කර්‍මකරන කාලයෙහි; ලොභො බලවා හොති, (තදනුරූප ප්‍රත්‍යයසාමග්‍රිබලයෙන්) ලොභය අධික වෙයි; අලොභො මන්දො, තත්ප්‍රතිපක්‍ෂවූ අලොභය දුර්‍වල වේ; (ලොභාලොභයන් එකක්‍ෂණයෙහි නොපවත්නා බැවින් නිකාන්තික්‍ෂණය ආයූහනපාක්‍ෂිකම කොට 'කම්මායූහනක්ඛණෙ

---

1. රාගාධිකො-මු. ස. 2. මොහචරිතො-බහුසු. 3. මොහාදි-සන්න.

අලොභො ලොභං පරියාදාතුං න සක්කොති. අදොසාමොහා පන බලවන්තා දොසමොහෙ පරියාදාතුං සක්කොන්ති. තස්මා සො තෙන කම්මෙන දින්නපටිසන්ධිවසෙන නිබ්බත්තො ලුද්ධො චෙව හොති සුඛසීලො අක්කොධනො පඤ්ඤවා වජිරූපමඤාණොති. යස්ස පන කම්මායූහනක්ඛණෙ ලොභදොසා බලවන්තා හොන්ති අලොභාදොසා මන්දා, අමොහො ච බලවා මොහො මන්දො, සො පුරිමනයෙනෙව ලුද්ධො චෙව හොති දුට්ඨො ච පඤ්ඤවා පන හොති වජිරූපමඤාණො, දත්තාභයත්ථෙරො විය. යස්ස කම්මායූහනක්ඛණෙ ලොභඅදොස

---

ලොභො බලවා හොති අලොභො මන්දො, යි කීහ යි දතයුතු. සෙසු පෙදෙහිදු මෙමනයයි.) අදොසාමොහා බලවන්තා, අද්වේෂ අමෝහ දෙදෙන බලවත් වෙත්ද; දොස මොහා මන්දා, ද්වේෂ මෝහ දෙදෙන දුර්වල වෙත්ද; තස්ස, ඔහට; මන්දො අලොභො, දුර්වලවූ අලොභය; ලොභං පරියාදාතුං න සක්කොති, ලොභය මඩනට අසමර්ථවේ; (ඒ අලොභය තෙමේ මෙසේ සුන්දරවූ මෙසේ විපුලවූ මෙසේ මහඅගිවූ වස්තු කෙසේ දෙම්ද යනාදීන් ප්‍රවෘත්තවූ අමුක්තත්‍යාගතාදිවශයෙන් පවත්නාවූ චෙතනා හා සම්ප්‍රයුක්තවූයේ මනාකොට ලොභය මැඩපැවැත්විය නො හැකිය යන අර්ථයි.) අදොසාමොහා පන බලවන්තා, (ද්වේෂ මෝහයන් අනුත්පත්තීන්ද එබඳු ප්‍රත්‍යය ලාභයෙන්ද) බලවත්වූ අද්වේෂ අමෝහ දෙදෙනා; දොසමොහෙ පරියාදාතුං සක්කොන්ති, ද්වේෂමෝහයන් මඩනට පොහොසත් වෙත්; තස්මා, එහෙයින්; (ලොභ අද්වේෂ අමෝහයන් ගේ බලවත් බැවින් අලොභ ද්වේෂ මෝහයන් ගේ දුර්වලබැවින්ද යන අර්ථයි.) සො, ඒ කැමින් සමන්විතපුද්ගල තෙමෙ; තෙන කම්මෙන දින්නපටිසන්ධිවසෙන, ලොභාදි[1] උපනිශ්‍රය ඇති කුශලකර්මයෙන් දෙනලද පිළිසඳවිසින්; නිබ්බත්තො, උපන්නේ; ලුද්ධොචෙව හොති, ලුබ්ධද වේ; සුඛසීලො, අරූක්ෂප්‍රකෘති ඇතිවේ; අක්කොධනො, නොකිපෙන සුළුවේ; පඤ්ඤවා, නුවණැතිවේ; වජිරූපමඤාණොති, වජ්‍රොපමඥාන ඇතිවේ; යස්ස පන, යමක්හුගේ වනාහි; කම්මායූහනක්ඛණෙ, කර්මකරන වේලාවෙහි; ලොභදොසා බලවන්තා හොන්ති, ලොභද්වේෂයෝ බලවත්වෙත්ද; අලොභාදොසා මන්දා, අලොභඅද්වේෂදෙදෙනා දුර්වලවෙත්ද; අමොහො ච බලවා, අමෝහය බලවත්වේද; මොහො මන්දො, මොහය මඳවේද; සො, ඒ කැමින් සමන්විත පුද්ගලතෙමෙ; පුරිමනයෙනෙව, පෙරකී නයානුසාරයෙන්ම; (පුරිමනයෙන යන මෙයින් මන්දා අලොභාදොසා ලොභදොසෙ පරියාදාතුං න සක්කොන්ති අමොහො පන බලවා මොහං පරියාදාතුං සක්කොති යනු අතිදෙශ කොළේ-මතුවාරයෙහිදු මෙමනයයි.) ලුද්ධො චෙව හොති, ලුබ්ධද වෙයි; දුට්ඨො ච, ක්‍රොධනද වෙයි: පඤ්ඤවා පන හොති, නුවණැත්තේ වේ; වජිරූපමඤාණො, වජ්‍රොපමඥාන ඇති වේ; දත්තාභයත්ථෙරො විය, දත්තාභය නම් ස්ථවිරයන් මෙනි; යස්ස, යමක්හට; කම්මායූහනක්ඛණෙ, කර්මය කරන වේලෙහි; ලොභ

---

1. මොහාදි-මු. ස.

මොහා බලවන්තා හොන්ති ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව ලුද්ධොචෙව දන්ධො ච සීලකො පන හොති අක්කොධනො.

(අ) තථා යස්ස කම්මායූහනක්ඛණෙ තයොපි ලොභදොස මොහා බලවන්තා හොන්ති අලොභාදයො මන්දා, සො පුරිමනයෙනෙව ලුද්ධොචෙව හොති දුට්ඨො ච මූළ්හො ච, යස්ස පන කම්මායූහනක්ඛණෙ අලොභදොසමොහා බලවන්තා හොන්ති ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව අලුද්ධො අප්පකිලෙසො හොති දිබ්බාරම්මණම්පි දිස්වා නිච්චලො, දුට්ඨො පන හොති දන්ධපඤ්ඤො ච, යස්ස පන කම්මායූහනක්ඛණෙ අලොභාදොසමොහා බලවන්තා හොන්ති ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව අලුද්ධොචෙව හොති අදුට්ඨො සීලකො ච, දන්ධො පන හොති. තථා යස්ස කම්මායූහනක්ඛණෙ අලොභදොසාමොහා බලවන්තා

---

අදොසමොහා බලවන්තා, ලොභය අද්වේෂය මොහය යන මොහු බලවත්ද; ඉතරෙ මන්දා, අලොභය ද්වේෂය අමොහය යනමොහු දුර්වල වෙත්ද; පුරිමනයෙනෙව, පෙරකී නයින්ම; ලුද්ධොචෙව හොති, ලුබ්ධද වෙයි; දන්ධොච, නුවණමඳ ද වෙයි; සීලකො පන, සිල්වතාහි වේ; (මොළොක්පියවි ඇතිවේ යන අර්ථයි;) අක්කොධනො, කිපෙනසුලු නොවේ.

(අ) තථා, එසේම; යස්ස, යමෙක්හට; කම්මායූහනක්ඛණෙ, කර්මකරනවේලෙහි; තයොපි ලොභදොසමොහා, ලොභය ද්වේෂය මොහය යන තුන්දෙන; බලවන්තා හොන්ති, බලවත්වෙත්ද; අලොභාදයො මන්දා; අලොභාදීහු දුර්වලවෙත්ද; සො, හෙතෙම; පුරිමනයෙනෙව, පෙරකීනයින්ම; ලුද්ධොචෙව හොති, ලුබ්ධද වෙයි; දුට්ඨො ච ක්‍රුද්ධ වෙයි; මූළ්හොච, මූඪද වේ; යස්ස පන, යමක්හට වනාහි; කම්මායූහනක්ඛණෙ, කර්මකරනවේලෙහි; අලොභදොසමොහා බලවන්තා හොන්ති, අලොභය ද්වේෂය මොහය යන මොහු බලවත්වෙත්ද; ඉතරෙ මන්දා, ලොභය අද්වේෂය අමොහය යන මොහු දුර්වලවෙත්ද; සො, හෙතෙම; පුරිමනයෙනෙව, පෙරකීනයින්ම; අලුද්ධො, අලොභීවෙයි; අප්පකිලෙසො මඳවූ කෙලෙශයන් ඇතියේ වේ; දිබ්බාරම්මණම්පි දිස්වා නිච්චලො හොති, දිව්‍යාලම්බණයකුදු දැක නිශ්චල වෙයි; දුට්ඨො පන හොති, කිපෙනසුලු වේ; දන්ධපඤ්ඤො ච, නුවණමඳවේ; යස්ස පන යමක්හට; කම්මායූහනක්ඛණෙ, කර්මකරනක්ෂණයෙහි; අලොභාදොස මොහා බලවන්තා හොන්ති, අලොභය අද්වේෂය මොහය යන මොහු බලවත් වෙද්ද; ඉතරෙ මන්දා, ලොභාදී තුන්දෙන දුර්වලවෙත්ද; සො, හෙතෙම; පුරිමනයෙනෙව,පෙරසේම; අලුද්ධොචෙව හොති, අලොභීද වෙයි; අදුට්ඨො, අක්‍රුද්ධවෙයි; සීලකො ච, සීලද වෙයි; දන්ධො පන හොති, නුවණමඳවේ; තථා, එසේම; යස්ස කම්මායූහනක්ඛණෙ, යමක් හට කර්මකරනවේලෙහි; අලොභදොසාමොහා බලවන්තා හොන්ති,

හොන්ති ඉතරෙ මන්දා, සො පුරිමනයෙනෙව අලුද්ධො චෙව හොති පඤ්ඤවා ච, දුට්ඨො පන හොති කොධනො. තථා යස්ස කම්මායූහනක්ඛණෙ තයොපි අලොභාදයො බලවන්තො හොන්ති ලොභාදයො මන්දා, සො පුරිමනයෙනෙව මහාසඞ්ඝරක්ඛිතත්ථෙරො විය අලුද්ධො අදුට්ඨො පඤ්ඤවා ච හොතී"ති.

(අ) එත්ථ ච යො ලුද්ධොති වුත්තො අයං රාගචරිතො, දුට්ඨ දන්ධා දොසමොහචරිතා, පඤ්ඤවා බුද්ධිචරිතො, අලුද්ධාදුට්ඨා පසන්න පකතිතාය

---

අලොභය ද්වෙෂය අමොහය යන මොහු බලවත් වෙද්ද; ඉතරෙ මන්දා, ලොභාදීහු දුර්වලවෙද්ද; සො, හෙතෙම; පුරිමනයෙනෙව, පෙරකී නයින්ම; අලුද්ධො චෙව හොති, අලොභීද වෙයි; පඤ්ඤවා ච, නුවණැතිද වේ; දුට්ඨො පන හොති, ද්වෙෂී වනාහි වේ; කොධනො, කිපෙන සුලු වේ; තථා, එසේම; යස්ස, යමක්හට; කම්මායූහනක්ඛණෙ, කර්ම කරනවෙලෙහි; තයොපි අලොභාදයො බලවන්තො හොන්ති, අලොභාදී තුන්දෙනම බලවත් වෙත්ද; ලොභාදයො මන්දා, ලොභාදීහු දුර්වලවෙද්ද; සො, හෙතෙම;–මහාසඞ්ඝරක්ඛිතත්ථෙරො විය, මහාසඞ්ඝරක්ඛිතස්ථවිරයන් මෙන්; අලුද්ධො, අලොභීද වෙයි; අදුට්ඨො, ද්වෙෂීද නොවෙයි; පඤ්ඤවාච හොති, නුවණැතිද වෙයි.

(මෙහි ලොභ–දොස–මොහ, ලොභ–දොස, ලොභ–මොහ, දොස–මොහ, ලොභ–දොස–මොහ, යන මොවුන්ගේ වශයෙන් එකකයෝ තුන්දෙනෙක; ද්වකයෝ තුන්දෙනෙක; එක ත්‍රිකයෙකැයි; ලොභාදීන්ගේම උත්සදයෙන් අකුශලපක්ෂයෙහිම සත්වාරයෙක; කුශලපක්ෂයෙහිදු එසේම අලොභාදීන්ගේ උත්සදවශයෙන් සත්වාරයෙකැයි; වාරයෝ තුදුසෙක් වෙති. එහි **අලොභදොසාමොහා අලොභාදොසමොහා අලොභදොසමොහා බලවන්තො** යි ආ කුශලපක්ෂයෙහි තෘතීය ද්විතීය ප්‍රථමවාරයෙන් දොසුස්සද මොහුස්සද දොසමොහුස්සද වාරයෝ ගන්නා ලද්දහුම වෙත්. එසේම අකුශලපක්ෂයෙහිදු **ලොභාදොසමොහා ලොභදොසාමොහා ලොභාදොසාමොහා බලවන්තො** යි ආ තෘතීය ද්විතීය ප්‍රථමවාරයෙන් අදොසුස්සද අමොහුස්සද අදොසාමොහුස්සද වාරයෝම ගෘහීතවෙත්නුයි අකුශල කුශලපක්ෂයෙහි තුන් තුන් වාරයෙන් ඇතුළත්කොට අටවාරයෝම දක්වනලදහයි දතයුතු.)

(අ) එත්ථ ච, මෙහි වනාහි; ලුද්ධොති වුත්තො; (උස්සදකිත්තනනයෙහි) ලුබ්ධයයි කියනලද්ද; අයං, මෙතෙම; රාගචරිතො, චර්‍ය්‍යාවිචාරයෙහි රාගචරිතයයි දතයුතු වේ; දුට්ඨදන්ධා, දුෂ්ටය දන්ධයයි කියනලද දෙදෙන; දොසමොහචරිතා, ද්වෙෂමොහචරිත වෙත්; පඤ්ඤවා, අතිශය ඥානඇත්තේයයි කියනලද්දේ; බුද්ධිචරිතො, බුද්ධිචරිත වේ; අලුද්ධාදුට්ඨා, අලුබ්ධ අදුෂ්ටයයි කියනලද දෙදෙන; පසන්න පකතිතාය, ප්‍රසන්නස්වභාවහෙයින්; සද්ධාචරිතා, ශ්‍රද්ධාචරිත වෙත්; (අලොභ අද්වෙෂ දෙදෙනාගේ බලවත්බව ශ්‍රද්ධාවගේ උපනිශ්‍රයභාවයක්

සද්ධාචරිතො යථා වා අමොහපරිවාරෙන කම්මුනා නිබ්බත්තො බුද්ධිචරිතො, එවං බලවසද්ධාපරිවාරෙන කම්මුනා නිබ්බත්තො සද්ධාචරිතො, කාමවිතක්කාදි පරිවාරෙන කම්මුනා නිබ්බත්තො විතක්කචරිතො, ලොභාදීසු වොමිස්ස පරිවාරෙන කම්මුනා නිබ්බත්තො වොමිස්සචරිතොති. එවං ලොභාදීසු අඤ්ඤතරඤ්ඤතරපරිවාරං පටිසන්ධිජනකං කම්මං චරියානං නිදානන්ති වෙදිතබ්බං.

(ආ) යං පන වුත්තං කථඤ්ච ජානිතබ්බං අයං පුග්ගලො රාගචරිතොති ආදි තත්‍රායං නයො.

135 ඉරියාපථතො කිච්චා භොජනා දස්සනාදිතො,
ධම්මප්පවත්තිතො චෙව චරියායො විභාවයෙති.

---

විනා නොවන්නෙන් අලුබ්ධ අදුෂ්ට දෙදෙනා ප්‍රසන්න ස්වභාව ඇතිහෙයින් ශ්‍රද්ධාචරිතවෙතියි කීහු. අමිශ්‍රවූ පූර්වහෙතු නියාමයෙන්ම බුද්ධිචරිතාදීහුදු දක්වනපිණිස යථා වා යනාදි කියනලදී.) වා, නොහොත්; යථා යම්සේ; අමොහපරිවාරෙන කම්මුනා නිබ්බත්තො, උපනිශ්‍රයවශයෙනුදු ප්‍රඥා පිරිවරකොටඇති කර්මයෙන් උපන්නේ; බුද්ධිචරිතො, බුද්ධිචරිතවේද;එවං, එසේ; බලවසද්ධාපරිවාරෙන කම්මුනා නිබ්බත්තො, බලවත්ශ්‍රද්ධාවපිරිවරකොටඇති කර්මයෙන් උපන්නේ; සද්ධාචරිතො, ශ්‍රද්ධාචරිත වේ; කාමවිතක්කාදිපරිවාරෙන කම්මුනා නිබ්බත්තො,*කාම විතර්කාදීන් පිරිවරකොට ඇති කර්මයෙන් උපන්නේ;විතක්කචරිතො, විතර්කචරිත වේ;වොමිස්සපරිවාරෙන කම්මුනා නිබ්බත්තො, ලොභමොහාදි වශයෙන් ඔවුනොවුන් හා අවිරුද්ධ මිශ්‍රකර්මයන් පිරිවරකොට ඇති කැමින් උපන්නේ; වොමිස්සචරිතො, මිශ්‍රචරිතවෙ; (මිහි ලොභ මොහාදියෙන් ඔවුනොවුන් හා අවිරුද්ධ මිශ්‍රක පරිවාරයෙක යන අර්‍ථයි-අවිරොධයද භින්නස්වභාවවූ ශ්‍රද්ධානුසාරී ධර්මානුසාරී ගොත්‍රයන් මෙන් යුගග්‍රාහවශයෙන් අප්‍රවෘත්තියෙතැයි දතයුතුය-පූර්වහෙතු නියාම යෙන්ම චර්‍ය්‍යාසිද්ධියවනබැවින්; එකාන්තයෙන් මිශ්‍රකචර්‍ය්‍යාවෝද පැසැස්සයුත්තා හයි උත්සද කීර්තනයද එසේම ප්‍රවෘත්තියයි දතයුතු.) එවං, මෙසේ; ලොභාදීසූ, ලොභාදීන් කෙරෙහි; අඤ්ඤතරඤ්ඤතර පරිවාරං, එක්තරා එක්තරා එකක්හු පිරිවරකොටඇති;පටිසන්ධිජනකං කම්මං, ප්‍රතිසන්ධිජනකකර්මය;චරියානං නිදානන්ති වෙදිතබ්බං, චර්‍ය්‍යාවන්ට නිදානයයි දතයුතු.

(ආ) යං පන වුත්තං, යමක්වනාහි කියනලදද; කථං ච ජානිතබ්බං අයං පුග්ගලො රාගචරිතොති ආදි,මෙ පුද්ගල රාගචරිත වේද යනාදිය කෙසේ දතයුතුද? තත්‍ර,ඒ පුච්ඡාවචනයෙහි;අයං නයො,මෙමනයයි.

135. ඉරියාපථතො, ඊර්‍ය්‍යාපථහෙයින් ද; කිච්චා, කෘත්‍යහෙයින් ද; භොජනා, භොජනහෙයින් ද; දස්සනාදිතො, දර්ශනාදිහෙයින් ද; ධම්මප්පවත්තිතො චෙව, ධර්මයන්ගේ ප්‍රවෘත්තිහෙයින් ද; චරියායො, චර්‍ය්‍යාවන්; විභාවයෙ, පහළ කරන්නේයි.

(අ) තත්ථ ඉරියාපථතොති-රාගචරිතො හි පකතිගමනෙන ගච්ඡන්තො චාතුරියෙන ගච්ඡති, සනිකං පදං නික්ඛිපති, සමං නික්ඛිපති සමං උද්ධරති, උක්කුටිකඤ්චස්ස පදං හොති. දොසචරිතො පාදග්ගෙහි ඛණන්තො විය ගච්ඡති, සහසා පදං නික්ඛිපති, සහසා උද්ධරති, අනුකඩ්ඪිතඤ්චස්ස පදං හොති. මොහචරිතො පරිබ්‍යාකුලාය ගතියා ගච්ඡති, ඡම්භිතො විය පදං නික්ඛිපති, ඡම්භිතො විය උද්ධරති, සහසානුපීළිතඤ්චස්ස පදං හොති. වුත්තම්පි චෙතං මාගන්දියසුත්තුප්පත්තියං.

136 රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ
දුට්ඨස්ස හොති අනුකඩ්ඪිතං පදං,[1]
මූළ්හස්ස හොති සහසානුපීළිතං
විවත්තච්ඡද්දස්සිදමීදිසං පදන්ති.

---

(ආ) තත්ථ, එහි; ඉරියාපථතොති, ඉරියාපථතො යන්නෙහි; රාගචරිතොහි, රාගචරිතතෙමෙ; පකතිගමනෙන ගච්ඡන්තො, පියවිගමනින් යන්නේ; චාතුරියෙන ගච්ඡති, චතුරභාවයෙන් යේ; (ලීලායෙන් යෙයි සේයි.) සනිකං පදං නික්ඛිපති, සෙමෙන් පය තබයි; සමං නික්ඛිපති, සමකොට තබයි; සමං උද්ධරති, සමකොට උදුරයි; අස්ස, මොහුගේ; පදඤ්ච, පාදය වනාහි; උක්කුටිකං හොති, උත්කුටක වේ; (පය සමකොට හෙළතිදු පියවරවනාහි විලුම්න් හා අක්පයින් ගැළේ මැද නොගැළෙන්නේය යුතැති.) දොසචරිතො, ද්වෙෂචරිතතෙම; පාදග්ගෙහි, පතුල් අගින්; ඛණන්තො විය ගච්ඡති, බිම කණන්නක්හු මෙන් යේ; සහසා පදං නික්ඛිපති, වහාම බිම පයහෙළයි; සහසා, වහාම; උද්ධරති, උදුරා; අනුකඩ්ඪිතඤ්චස්ස පදං හොති, (පාදනික්ෂෙපසමයෙහි අදනක්හුමෙන් පයතබානුයි) මොහු පස්සෙන් කයනලද්දේ වේ; මොහචරිතො, මොහචරිතතෙමෙ; පරිබ්‍යාකුලාය ගතියා, හාත්පසින් හැලඑළුගමනින්; ගච්ඡති, යෙයි; ඡම්භිතො විය, තැතිගත්තක්හු මෙන්; (සැකඇත්තක්හු මෙන් භයඇත්තක්හු මෙන් යුතැති;) පදං නික්ඛිපති, පයතබයි; ඡම්භිතො විය, තැතිගත්තක්හු මෙන්; උද්ධරති, උදුරයි; අස්ස පදඤ්ච, මොහුගෙ පිය වනාහි; සහසානුපීළිතං, විලුම්න්හා අක්පල්ලෙන් වහාම එසවෙයි; මාගන්දිය සුත්තුප්පත්තියං, මාගන්දිය සූත්‍රොත්පත්තියෙහි; එතං, මේ; වුත්තම්පි ච, කියනලදී.

136. රත්තස්ස, රාගීහුගේ; පදං, පියය; උක්කුටිකං භවෙ, විලුම්න් හා අක්පල්ලෙන් ගැළේ; (මැද නොගැළුණෙ වෙයි යනඅර්ථයි.) දුට්ඨස්ස, ද්වෙෂීහුගේ; පදං, පියය; අනුකඩ්ඪිතං හොති, පස්සෙන් අදනාලද්දේ වෙයි; මූළ්හස්ස, මොහීහු ගේ (පියය); සහසානුපීළිතං, විලුම්න් හා අක්පල්ලෙනුත් වහාම එබෙයි; (පුරෙ පසට අලොහෙළන ලදී වෙයි යනු සත්‍යයි.) විවත්තච්ඡදස්ස, විදහන ලද කෙලෙස් සෙවෙනි ඇත්තහුගේ; (ප්‍රහීණකෙලශඇත්තහුගේය යි සේයි.) ඉදමීදිසං පදං, මෙබඳුවූ පියය වේ.

---

1. සහසානුපීළිතං-ති. මූ. ධම්මපදට්ඨකථා.

(අ) ඨානම්පි රාගචරිතස්ස පාසාදිකං හොති මධුරාකාරං, දෙසචරිතස්ස ථද්ධාකාරං, මොහචරිතස්ස ආකුලාකාරං. නිසජ්ජායපි එසෙව නයො, රාගචරිතො ච අතරමානො සමං සෙය්‍යං පඤ්ඤපෙත්වා සනිකං නිපජ්ජිත්වා අඞ්ගපච්චඞ්ගානි සමොධාය පාසාදිකෙන ආකාරෙන සයති, වුට්ඨාපියමානො ච සීඝං වුට්ඨාය සඞ්කිතො විය සනිකං පටිවචනං දෙති. දෙසචරිතො තරමානො යථා තථා වා සෙය්‍යං පඤ්ඤපෙත්වා පක්ඛිත්තකායො ච භාකුටිකං කත්වා සයති, වුට්ඨාපියමානො ච සීඝං වුට්ඨාය කුපිතො විය පටිවචනං දෙති. මොහචරිතො දුස්සණ්ඨානං සෙය්‍යං පඤ්ඤපෙත්වා වික්ඛිත්තකායො බහුලං අධොමුඛො සයති, වුට්ඨාපියමානො ච හුංකාරං කරොන්තො දන්ධං වුට්ඨාති. සද්ධාචරිතාදයො පන යස්මා රාගචරිතාදීනං සභාගා, තස්මා තෙසම්පි තාදිසොව ඉරියාපථො හොතීති, එවං තාව ඉරියාපථතො චරියායො විභාවයෙ.

---

(අ) ඨානම්පි, සිටීමද; රාගචරිතස්ස, රාගචරිතයාගේ; පාසාදිකං හොති ප්‍රශාදවහවේ; මධුරාකාරං, මියුරු ආකාර ඇත්තේයි; (ඉදුවූ ආකාර ඇතියේය යුතැති—රුවැති වේ යනු සත්‍යයි.) දෙසචරිතස්ස, වෙෂ චරිතයාගේ; ථද්ධාකාරං, දැඩිවූ ආකාර ඇත්තේයි; මොහචරිතස්ස, මොහචරිතයාගේ; ආකුලාකාරං, ආකුලවූ ආකාරඇත්තේයි; නිසජ්ජායපි, නිෂද්‍යායෙහිද; එසෙව නයො, මෙම නයයි; රාගචරිතො, රාගචරිතද; අතරමානො, යුහුනොව; (සෙමෙන යූ තැති.) සමං සෙය්‍යං පඤ්ඤපෙත්වා, සමකොට යහන පනවා; සනිකං නිපජ්ජිත්වා, සෙමෙන් බැස හෙව; අඞ්ගපච්චඞ්ගානි සමොධාය, අඞ්ගප්‍රත්‍යඞ්ගයන් මනාකොට නොවිසිරපිහිටුවා; පාසාදිකෙන ආකාරෙන, ප්‍රශාදකරවූ අකාරයෙන්; නිපජ්ජිත්වා, හෙව; සයති, නිදා; වුට්ඨාපියමානො ච, නඟා සිටුවනු ලබන්නේද; සීඝං උට්ඨාය, වහානැඟීසිට; සඞ්කිතො විය, සැක ඇත්තෙකු මෙන්; සනිකං, සෙමෙන්; පටිවචනං දෙති, ප්‍රතිවචනදේ; දෙසචරිතො, වෙෂචරිතතෙම; තරමානො, යුහුව; යථා තථා වා සෙය්‍යං පඤ්ඤපෙත්වා, යම්තම් දෙයකින් යහන පනවා; වික්ඛිත්තකායො, අවසඟයක්හු මෙන් වහා එළවනලද සිරුරඇතියාව, භාකුටිකං කත්වා, මුහුණු හකුළුවා ගෙන හෙව; සයති, නිදා; වුට්ඨාපියමානො ච, නඟා සිටුවනු ලබන් නේද; සීඝං උට්ඨාය, වහා නැඟීසිට; කුපිතො විය, කිපියක්හු මෙන්; පටිවචනං දෙති, ප්‍රතිවචන දේ; මොහචරිතො, මොහචරිතතෙමේ; දුස්සණ්ඨානං සෙය්‍යං පඤ්ඤපෙත්වා, නපුරුවූ සටහන්කොට යහන පනවා; වික්ඛිත්තකායො, ඒ ඒ පස හෙළනලද අඞ්ග ප්‍රත්‍යඞ්ග ඇතියාව; බහුලං, බොහෝසේ; අධොමුඛො සයති, මුහුනින් හෙව නිදා; වුට්ඨාපියමානො ච, නඟා සිටුවනු ලබන්නේද; හුංකාරං කරොන්තො, හුංකාරකෙරෙමින්; දන්ධං වුට්ඨාති, ලස්ව නැඟීසිටී; සද්ධාචරිතාදයො පන, ශ්‍රද්ධාචරිතාහු වනාහි, යස්මා, යම්හෙයකින්; රාගචරිතාදීනං

(අ) කිච්චාති සම්මජ්ජනාදීසු ච කිච්චෙසු රාගචරිතො සාධුකං සම්මජ්ජනිං ගහෙත්වා අතරමානො වාලිකං අවිප්පකිරන්තො සින්දුවාර කුසුමසන්ථරමිව සන්ථරන්තො සුධං සමං සම්මජ්ජති. දොසචරිතො ගාළ්හං සම්මජ්ජනිං ගහෙත්වා තරමානරූපො උභතො වාලිකං උස්සා දෙන්තො ඛරෙන සද්දෙන අසුධං විසමං සම්මජ්ජති. මොහචරිතො සිපිලං සම්මජ්ජනිං ගහෙත්වා සම්පරිවත්තකං ආලොළයමානො අසුධං විසමං සම්මජ්ජති. යථා සම්මජ්ජනෙ එවං චීවරධොවනරජනාදීසුපි සබ්බකිච්චෙසු. නිපුණමධුරසමසක්කච්චකාරී රාගචරිතො, ගාළ්හථද්ධ විසමකාරී දොසචරිතො, අනිපුණ පරිබ්‍යාකුලවිසමාපරිච්ඡින්නකාරී මොහචරිතො. චීවරධාරණම්පි ච රාගචරිතස්ස නාතිගාළ්හං නාති

---

සභාගා, රාගචරිතාදීන්ට සභාගයෝද; තස්මා, එහෙයින්; තෙසම්පි, ඒ ශ්‍රද්ධාචරිතාදීන්ගේද, තාදිසො ච ඉරියාපථො හොති, එබඳුවූම ඉරියවු වේ; එවං, මෙසේ; තාව, පළමුකොට; ඉරියාපථතො, ඉරියවූ හෙයින්; චරියායො විභාවයෙ, චර්‍ය්‍යාවන් පහළකරන්නේයි.―

(අ) කිච්චාති, කිච්චා යන්නෙහි; සම්මජ්ජනාදීසු ච කිච්චෙසු, හැමදූන් ආදි කිසයෙහිදු; රාගචරිතො, රාගචරිතතෙමෙ; සාධුකං, නොදූනී නොමොළොක් කොට; සම්මජ්ජනිං ගහෙත්වා, මුස්න ගෙන; අතර මානො, යුහු නොව; වාලිකං අවිප්පකිරන්තො, වැලි නොවිසුරුවන්නේ; සින්දුවාරකුසුමසන්ථරං, නිකමල් ඇතිරියක්; සන්ථරන්තො ඉව, අතුරන්නක්හුමෙන්; සුධං, ශුධකොට; සමං, සමකොට; සම්මජ්ජති, හමදී; දොසචරිතො, ද්වෙෂචරිතතෙමෙ; ගාළ්හං සම්මජ්ජනිං ගහෙත්වා, තරකොට මුස්න ගෙන; තරමානරූපො, යුහු ව; උභතො, දෙපස්හි; වාලිකං උස්සාදෙන්තො, වැලිනගන්නේ; ඛරෙන සද්දෙන, ඛරස්වර යෙන්; (රූක්ෂ හඬ ඇතිකොට යන අභිප්‍රායයි.) අසුධං, අශුධකොට; විසමං, නොසමකොට; සම්මජ්ජති, හමදී; මොහචරිතො, මොහචරිත තෙමෙ; සිපිලං, සිපිලකොට; සම්මජ්ජනිං ගහෙත්වා, මුස්නගෙන; සම්පරිවත්තකං,(වැලි)පෙරළ පෙරළා; ආලොළයමානො,(වැලිකසළ) අලළමින්; (ආකූල කෙරෙමින් යුතැති.) අසුධං, අශුධකොට; විසමං සම්මජ්ජති, නොසමකොට හමදී; යථා සම්මජ්ජනෙ, යම්සේ හැමදීමෙහි; චීවරධොවන රජනාදීසු, සිවුරුදෙවීම රැඳීම යනාදීවූ; සබ්බ කිච්චෙසු අපි, සියලු කෘත්‍යයෙහිද; එවං, මෙසේමැයි; නිපුණ, දක්ෂව; මධුර, මනාකොට; සම, සමකොට; සක්කච්චකාරී, සකස්කොට කරන සුලුවූයේ; රාගචරිතො, රාගචරිත වේ; ගාළ්හ, ස්ථිරකොට; ථද්ධ, අසිපිල කොට; විසමකාරී, විෂමකොට කරන්නේ; දොසචරිතො, ද්වෙෂ චරිත වේ; අනිපුණ, අදක්ෂව; පරිබ්‍යාකුල, වියවුල්කොට; විසම, සමනොකොට; අපරිච්ඡින්නකාරී, නොපිරිසිඳ කරනසුලුවූයේ; මොහ චරිතො, මොහචරිත වේ; චීවරධාරණම්පිච, සිවුරුදැරීමද; රාගචරි තස්ස, රාගචරිතයාගේ; නාතිගාළ්හං, ඉතා දැඩිනොවූයේ; නාති සිපිලං,

සිථිලං හොති පාසාදිකං පරිමණ්ඩලං, දොසචරිතස්ස අතිගාළ්හං අපරිමණ්ඩලං, මොහචරිතස්ස සිථිලං පරිබ්‍යාකුලං. සද්ධාචරිතාදයො තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා, තං සභාගත්තාති. එවං කිච්චතො චරියායො විභාවයෙ෴

(ඇ) භොජනාති රාගචරිතො සිනිද්ධමධුරභොජනප්පියො හොති, භුඤ්ජමානො ච නාතිමහන්තං පරිමණ්ඩලං ආලොපං කත්වා රසපටිසංවෙදී අතරමානො භුඤ්ජති කිඤ්චිදෙව ච සාදුං ලභිත්වා සොමනස්සං ආපජ්ජති, දොසචරිතො ලූඛඅම්බිලභොජනප්පියො හොති. භුඤ්ජමානො ච මුඛපූරකං ආලොපං කත්වා අරසපටිසංවෙදී තරමානො භුඤ්ජති, කිඤ්චිදෙව ච අසාදුං ලභිත්වා දොමනස්සං ආපජ්ජති. මොහචරිතො අනියතරුචිකො හොති. භුඤ්ජමානො ච අපරිමණ්ඩලං පරිත්තමාලොපං කත්වා භාජනෙ ඡඩ්ඩෙන්තො මුඛං මක්ඛෙන්තො

---

ඉතා මොලොක් නොවූයේ; හොති, වේ; පාසාදිකං, ප්‍රසාද එළවන්නේ; පරිමණ්ඩලං, හාත්පසින් මණ්ඩල වේ; (හැමඅතින් වට වේ යුතැනි.) දොසචරිතස්ස, ද්වෙෂචරිතයාගේ (චීවරධාරණය); අතිගාළ්හං, ඉතා දැඩි වේ; අපරිමණ්ඩලං, පරිමණ්ඩල නොවේ; මොහචරිතස්ස, මොහචරිතයාගේ (චීවරධාරණය); සිථිලං, සිථිල වේ; පරිබ්‍යාකුලං, හාත්පසින් ආකුල වේ; සද්ධාචරිතාදයො, ශ්‍රද්ධාචරිතාදීහු; තං සභාගත්තා, ඔවුන් හා සභාගහෙයින්; තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා, ඔවුන්ගේම අනුසාරයෙන් දතයුත්තාහුයි; එවං, මෙසේ; කිච්චතො, කෘත්‍යවශයෙන්; චරියායො විභාවයෙ, චර්‍ය්‍යාවන් පහළකරන්නේයි෴

(ඇ) භොජනාති, භොජනා යන්නෙහි; රාගචරිතො, රාගචරිතතෙමෙ; සිනිද්ධමධුර භොජනප්පියො හොති, සිනිදුවූ මධුරවූ බොජුන් ප්‍රිය කොට ඇති වේ; භුඤ්ජමානො ච, වළඳන්නේද; නාතිමහන්තං, ඉතා මහත්නොකොට; පරිමණ්ඩලං ආලොපං කත්වා, ආලොපය වට කොට; රසපටිසංවෙදී, රසවිඳ; අතරමානො, යුහුනොව; භුඤ්ජති, වළඳ; කිඤ්චිදෙව ච සාදුං ලභිත්වා, කිසිමධුරයක් ලදින්; සොමනස්සං ආපජ්ජති, සොම්නසට පැමිණේ; දොසචරිතො, ද්වෙෂචරිතතෙමෙ; ලූඛඅම්බිලභොජනප්පියො හොති, රූක්‍ෂවූ ඇඹුල්වූ භොජනය ප්‍රිය කොට ඇත්තේ වේ; භුඤ්ජමානො ච, වළඳන්නේද; මුඛපූරකං ආලොපං කත්වා, මුඛය පුරන්නාවූ මහත්වූ ආලොපයකොට; අරසපටිසංවෙදී, රස නොවිඳ; තරමානො, යුහු ව; භුඤ්ජති, වළඳ; කිඤ්චිදෙව ච අසාදුං ලභිත්වා, කිසි නොමියුරක් ලදින්; දොමනස්සං ආපජ්ජති, දොම්නසට පැමිණේ; මොහචරිතො, මොහචරිතතෙමෙ; අනියතරුචිකො හොති, අනියතවූ රුචි ඇත්තේ වේ; (රාග ද්වෙෂ චරිතයන් දෙදෙනා එකෙක නියතවූ රුචිඇත්තේ නොවෙයි යුතැනි.) භුඤ්ජමානො ච, වළඳන්නේද; අපරිමණ්ඩලං පරිත්තමාලොපං කත්වා, වට නොකොට කුඩා ආලොපය කොට; භාජනෙ ඡඩ්ඩෙන්තො,

වික්ඛිත්තචිත්තො තං තං විතක්කෙන්තො භුඤ්ජති. සද්ධාචරිතාදයොපි තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා තංසභාගත්තාති. එවං භොජනතො චරියායො විභාවයෙ.

(අ) දස්සනාදිතොති රාගචරිතො ඊසකම්පි මනොරමං රූපං දිස්වා විම්හයජාතො විය චිරං ඔලොකෙති, පරිත්තෙපි ගුණෙ සජ්ජති, භූතම්පි දොසං න ගණ්හාති, පක්කමන්තො පි අමුඤ්චිතුකාමො ව හුත්වා සාපෙක්ඛො පක්කමති. දොසචරිතො ඊසකම්පි අමනොරමං දිස්වා කිලන්තරූපො විය න චිරං ඔලොකෙති, පරිත්තෙපි දොසෙ පටිහඤ්ඤති, භූතම්පි ගුණං න ගණ්හාති, පක්කමන්තොපි මුඤ්චිතු කාමොව හුත්වා අනපෙක්ඛො පක්කමති. මොහචරිතො යංකිඤ්චිරූපං දිස්වා පරපච්චයිකො හොති පරං නින්දන්තං සුත්වා නින්දති පසංසන්තං සුත්වා පසංසති සයං පන අඤ්ඤාණුපෙක්ඛාය උපෙක්ඛති, එස නයො

---

මළුදන බඳුනෙහි හුළු ඉස්මින්; මුඛං මක්ඛෙන්තො, මුහුණ ගහමින්; වික්ඛිත්තචිත්තො, විසුරුණුසිත් ඇත්තේ; (එකඟනොවූයේ යූ තැනි.) තං තං විතක්කෙන්තො, ඒ ඒ විතර්කණය කෙරෙමින්; (ඒ ඒ සිතමින් යූතැනි.) භුඤ්ජති, වළඳා; සද්ධාචරිතාදයොපි, ශ්‍රද්ධාචරිතාදීහුද; තං සභාගත්තා, ඔවුන් හා සභාග හෙයින්; තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා, ඔවුන්ගේ ම අනුසාරයෙන් දතයුත්තාහුයි; එවං, මෙසේ; භොජනතො, භොජන හෙයින්; චරියායො විභාවයෙ, චර්‍ය්‍යාවන් පහළකරන්නේයි.

(අ) දස්සනාදිතොති, 'දස්සනාදිතො'යන්නෙහි; රාගචරිතො, රාගචරිත තෙමෙ; ඊසකම්පි මනොරමං රූපං දිස්වා, මඳකුදු සිත්කළු රුවක් දැක; විම්හයජාතො විය, විස්මය ඇතියක්හු මෙන්; චිරං, බොහෝ කලක්; ඔලොකෙති, බලා; පරිත්තෙපි ගුණෙ සජ්ජති, මඳවූද ගුණයෙක ඇලේ; භූතම්පි දොසං න ගණ්හාති, විද්‍යමානවූද දොෂයක් නොගනී; පක්කමන්තො පි, යන්නේද; අමුඤ්චිතුකාමොව හුත්වා, මුදනු නොකමැතිවම; සාපෙක්ඛො, අපෙක්‍ෂා ඇතිවම; පක්කමති, යේ; දොසචරිතො, ද්වෙෂචරිතතෙමෙ; ඊසකම්පි අමනොරමං දිස්වා, මඳකුදු නොමනාවක් දැක; කිලන්තරූපො විය, (ඒ අසහනයෙන්) බෙදයට පැමිණියක්හු මෙන්; චිරං, බොහෝ කලක්; න ඔලොකෙති, නොබලා; පරිත්තෙපි දොසෙ, මඳදද්වෙෂයෙක; පටිහඤ්ඤති, සැවේ; භූතම්පි ගුණං, විද්‍යමානද ගුණයක්; න ගණ්හාති, නොගනී; පක්කමන්තොපි, යන්නේද; මුඤ්චිතුකාමො ච හුත්වා, මිදියැටිවම; අනපෙක්ඛො පක්කමති, නිරපෙක්‍ෂව යේ; මොහචරිතො, මොහචරිතතෙමෙ; යං කිඤ්චි රූපං දිස්වා, මනා නොමනා යම්කිසි රුවක් දැක; පරපච්චයිකො හොති, පරප්‍රත්‍යය ඇත්තේ වේ; පරං නින්දන්තං සුත්වා, පරයා නින්‍දාකරන්නහු අසා; නින්දති, තෙමේ නින්‍දා කෙරෙයි; පසංසන්තං සුත්වා, ප්‍රශංසා කරන්නහු අසා; පසංසති, ප්‍රශංසා කෙරේ; සයං, - තෙමේ; අඤ්ඤාණුපෙක්ඛාය, අඥානවූ උපෙක්‍ෂායෙන්; උපෙක්ඛති, උපෙක්‍ෂාකෙරේ;

සද්දසවණාදීසුපි. සද්ධාචරිතාදයො පන තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා තං සභාගත්තා'ති. එවං දස්සනාදිතොපි චරියායො විභාවයෙ.

(ඈ) ධම්මප්පවත්තිතො චෙවා'ති රාගචරිතස්ස ච මායා සාඨෙය්‍යං මානො පාපිච්ඡතා මහිච්ඡතා අසන්තුට්ඨිතා සිඞ්ගං චාපල්‍යන්ති එවමාදයො ධම්මා බහුලං පවත්තන්ති. දොසචරිතස්ස කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියන්ති එවමාදයො. මොහචරිතස්ස ථිනං මිද්ධං උද්ධච්චං කුක්කුච්චං විචිකිච්ඡා ආධානගාහිතා

---

එසනයො සද්දසවණාදීසුපි, ශබ්දශ්‍රවණාදියෙහිද මෙමනයයි; සද්ධාචරිතාදයො පන, ශ්‍රද්ධාචරිතාදීහු වනාහි; තං සභාගත්තා, ඔවුන් හා සභාගහෙයින්; තෙසං යෙවානුසාරෙන වෙදිතබ්බා, ඔවුන්ගෙ අනුසාරයෙන්ම දතයුත්තාහුයි; එවං, මෙසේ; දස්සනාදිතොපි, දර්ශනාදි විසින්ද; චරියායො විභාවයෙ, චරියාවන් පහළකරන්නාහුයි.

(ඈ) ධම්මප්පවත්තිතො චෙවා'ති, 'ධම්මප්පවත්තිතො චෙව'යන්නෙහි; රාගචරිතස්ස, රාගචරිතයහට; මායා, ඇති දෙස් මුවහකරන ලකුණු මායාය; සාඨෙය්‍යං, නැති ගුණ පහළකරන ලකුණු සාඨෙය්‍යය; මානො, උඩඟුලකුණු මානය; පාපිච්ඡතා,[1] නැති ගුණ පහළකිරීම් මුඛයෙන් පිළිගහණෙහි පමණ නොදන්නා ලකුණු පාපිච්ඡතාය; මහිච්ඡතා, ඇති ගුණ පහළකිරීම් මුඛයෙන් පිළිගහණෙහි පමණ නොදන්නා ලකුණු මහිච්ඡතාය; අසන්තුට්ඨිතා, තම ලාභයෙන් සතුටුනොවන ලකුණු අසන්තුට්ඨිතාය; සිඞ්ගං, ශෘඞ්ගබව; (නාගරිකභාවයයි කියනලද කෙලෙශශෘඞ්ගය); චාපල්‍යං, තමා සිරුරද චීවරාදි පිරිකරද හොබවන විසින් පවත්නා ලොලුප්ප නමැති චාපල්‍යයයි; එවමාදයො, මේ ආදීවූ ධර්මයෝ; බහුලං, බොහොසේ; පවත්තන්ති, පවතිත්; (ආදි ශබ්දයෙන් අහිරික අනොත්තප්පමදප්පමාදාදීහු ගන්නා ලැබෙත්.) දොසචරිතස්ස, ද්වෙෂචරිතයහට; කොධො, කිපෙනලකුණු ක්‍රොධය; උපනාහො, අනුන්ගෙ; අපරාධබඳනා ලකුණු උපනාහය; මක්ඛො, අනුන් ගුණ මකන ලකුණු මක්ඛය; පළාසො, අනුන්ගේ ගුණ ඩැහැ පහකරන්නක්හු මෙන් යුගග්‍රාහ ලකුණුවූ පළාසය; ඉස්සා, පර සැපත උසුයා ලකුණු ඉස්සාය; මච්ඡරියං, තමා සැපත් සඟවන ලකුණු මච්ඡරිය යන; එවමාදයො, මේ ආදීහුයි; (ආදිශබ්දයෙන් දොවචස්සතා පාපමිත්තතාදීන්ගේ සඞ්ග්‍රහය වේ.) මොහචරිතස්ස, මොහචරිතයහට; ථිනං, නිරුත්සාහව සිත්හු නටබවය යන ථිනය; මිද්ධං, සිත්හුගේ ශක්තිනැතිව නටබවය යන මිද්ධයද; උද්ධච්චං, සිත්හු නොසන්සුන් බවය යන උද්ධච්චය; කුක්කුච්චං, විපිළිසරබවයයි කියන ලද කුක්කුච්චය; විචිකිච්ඡා, සංසය ලකුණු විචිකිත්සාය; ආධානගාහිතා, අයොනිසො දෘඪග්‍රහණය යන ආධානගාහිතාය; දුප්පටි

---

1, මෙතන බොහෝ සන්න පොත්වල ආකූලය.

දුප්පටිනිස්සග්ගිතාති එවමාදයො. සද්ධාචරිතස්ස මුත්තචාගතා අරියානං දස්සනකාමතා සද්ධම්මං සොතුකාමතා පාමොජ්ජබහුලතා අසංසට්ඨතා අමායාවිතා පසාදනීයෙසු ඨානෙසු පසාදොති එවමාදයො. බුද්ධිචරිතස්ස සොවචස්සතා කල්‍යාණමිත්තතා භොජනෙ මත්තඤ්ඤුතා සතිසම්පජඤ්ඤං ජාගරියානුයොගො සංවෙජනීයෙසු ඨානෙසු සංවෙගො සංවිග්ගස්ස ච යොනිසො පධානන්ති එවමාදයො. විතක්කචරිතස්ස භස්සබහුලතා ගණාරාමතා කුසලානුයොගෙ අරති අනවට්ඨිතචිත්තතා රත්තිං ධූමායනා දිවා පජ්ජලනා හුරාහුරං ධාවනාති එවමාදයො ධම්මා බහුලං පවත්තන්තීති එවං ධම්මප්පවත්තිතො චරියායො විභාවයෙ෴

---

නිස්සග්ගිතා, ගන්නාලද මිථ්‍යාග්‍රහණය වෙන්කොටපිය නොහැකි බවය යන දුප්පටිනිස්සග්ගිතාය යන; එවමාදයො, මේ ආදීහුයි; (ආදි ශබ්දයෙන් මුට්ඨස්සච්චය අසම්පජඤ්ඤය යනාදීන්ගේ සඞ්ග්‍රහය වේ.) සද්ධාචරිතස්ස, ශ්‍රද්ධාචරිතයහට; මුත්තචාගතා, නිස්සඞ්ගත්‍යාගය; අරියානං, ආර්‍ය්‍යයන්ගේ; දස්සනකාමතා, දක්ම කැමති බවය; සද්ධම්මං සොතුකාමතා, සදහම් අසනු කැමතිබවය; පාමොජ්ජබහුලතා, ප්‍රීති බහුලබවය; අසංසට්ඨතා, රජඇමති ආදීන් හා හැනී නොවසනබවය; අමායාවිතා, මායාවී නොවන බවය; (ඇති දෙය් මුවහනොකරනබවය යුතැනි.) පසාදනීයෙසු ඨානෙසු, ප්‍රසාදකටයුතුවූ තුනුරුවන්හි; පසාදොති, ප්‍රසාදය යන; එවමාදයො, මේ ආදීහුයි; බුද්ධිචරිතස්ස, බුද්ධිචරිතයහට; සොවචස්සතා, සුවචබවය; කල්‍යාණමිත්තතා, කල්‍යාණමිත්‍රයන් ඇතිබවය; භොජනෙ මත්තඤ්ඤුතා, භොජනයේ පමණ දන්නාබවය; සතිසම්පජඤ්ඤං, සිහිනුවණ දෙකය; ජාගරියානුයොගො, අප්‍රමාදභාවයෙහි යෙදීමය; සංවෙජනීයෙසු ඨානෙසු, ජාත්‍යාදි උවෙග කටයුතු තන්හි; සංවෙගො, උවෙගය; සංවිග්ගස්ස ච, උවෙගකළහුගේ ද; යොනිසො, නුවණින්; පධානන්ති, වීර්‍ය්‍යකිරීමයයි; එවමාදයො, මේ ආදීහුයි; විතක්කචරිතස්ස, විතර්කචරිතයහට; භස්සබහුලතා, කථා බහුලබවය; (දොඩමලු බවය යුතැනි.) ගණාරාමතා, ගෙණෙහි ඇලුණු බවය; කුසලානුයොගෙ, කුශලධර්මභාවනාවෙහි; අරති, අනභිරතිය; අනවට්ඨිතචිත්තතා, අනවස්ථිතවූ සිත් ඇති බවය; රත්තිං ධූමායනා, මෙසේ ද මෙසේ ද කෙරෙමියි රාත්‍රිභාගයෙහි ඒ ඒ කෘත්‍යයන්ගේ පරිවිතර්කණ නැමති විතර්කධූමයෙන් දුමවන බවය; දිවා පජ්ජලනා, විතර්කිතවූ ඒ ඒ කෘත්‍යයන්ගේ දිවසභාගයෙහි අනුෂ්ඨාන නැමති දහවල් දිළියීමය; හුරාහුරං ධාවනාති, අරමුණින් අරමුණට දිවීමය යන; එවමාදයො ධම්මා, මේ ආදී ධර්මයෝ; බහුලං, බොහොසේ; පවත්තන්ති, පවතිත්; එවං, මෙසේ; ධම්මප්පවත්තිතො, ධර්මයන්ගේ ප්‍රවෘත්තීන්; චරියායො විභාවයෙ, චර්‍ය්‍යාවන් පහළකරන්නේ෴

(අ) යස්මා පන ඉදං චරියාවිභාවනාවිධානං සබ්බාකාරෙන නෙව පාළියං න අට්ඨකථායං ආගතං, කෙවලං ආචරියමතානුසාරෙන වුත්තං, තස්මා න සාරතො පච්චෙතබ්බං. රාගචරිතස්ස හි වුත්තානි ඉරියාපථාදීනි දොසචරිතාදයොපි අප්පමාදවිහාරිනො කාතුං සක්කොන්ති. සංසට්ඨචරිතස්ස ච පුග්ගලස්ස එකස්සෙව භින්නලක්ඛණා ඉරියාපථාදයො න සම්පජ්ජන්ති[1] යං පනෙතං අට්ඨකථාසු චරියා විභාවනා විධානං වුත්තං, තදෙව සාරතො පච්චෙතබ්බං. වුත්තං හෙතං:- චෙතොපරියඤාණස්ස ලාභී ආචරියො චරියං ඤත්වා කම්මට්ඨානං කථෙස්සති, ඉතරෙන අන්තෙවාසිකො. පුච්ඡිතබ්බොති. තස්මා චෙතොපරියඤාණෙන වා තං වා පුග්ගලං පුච්ඡිත්වා ජානිතබ්බං අයං පුග්ගලො රාගචරිතො අයං දොසාදිසු අඤ්ඤතරචරිතොති.

---

(අ) යස්මා පන, යම් හෙයකින් වනාහි; ඉදං, මේ; චරියාවිභාවනාවිධානං, චර්‍යාවන්ගේ පහළකරන විධිය; සබ්බාකාරෙන, සියලු ආකාරයෙන්; පාළියං නෙව ආගතං, පාළියෙහි නොම ආයේය; නාට්ඨකථායං, අටුවායෙහි නොද ආයේයි; ('සබ්බාකාරෙන'යනුයෙන් මඳමඳ දෙයක් ආයේ කිවූ යූ වෙත්.) කෙවලං, හුදෙක්; ආචරියමතානුසාරෙන, ඇජරමත අනුසාරයෙන්; වුත්තං, කියනලද්ද; තස්මා, එහෙයින්; න සාරතො පච්චෙතබ්බං, සාර හෙයින් හැදහියයුතු නොවේ; ("රාගචරිතස්සහි"යනාදීන් කාරණා දක්වති.) රාගචරිතස්ස හි වුත්තානි, රාගචරිතයහට කියනලද; ඉරියාපථාදීනි, ඊර්‍යාපථාදීන්; අප්පමාදවිහාරිනො, අප්‍රමාදවිහාරීවූ; දොසචරිතාදයොපි, ද්වෙෂචරිතාදීහුද; කාතුං සක්කොන්ති, කරන්නට පොහොසත් වෙත්; සංසට්ඨචරිතස්ස ච, මුසුවූ චරිත ඇති; එකස්සෙව පුග්ගලස්ස, එකම පුහුලහටද; භින්නලක්ඛණා, (චාතුරියගමනය අචාතුරියගමනය සනිකගමනය සහසාගමනය යනාදී)භින්න ලක්‍ෂණවූ; ඉරියාපථාදයො, ඉරියවූ ආදීහු; න සම්පජ්ජන්ති, නොයෙදෙත්; අට්ඨකථාසු, අටුවායෙහි; යම්පනෙතං චරියාවිභාවනාවිධානං, යම් හේ චරියානුභාවයන්ගේ විභාවනා විධියෙක්; වුත්තං, කියනලද්ද; තදෙව, හේම; සාරතො, සාර හෙයින්; පච්චෙතබ්බං, හැදහියයුතු; එතං, මේ; වුත්තං හි, අටුවායෙහි කියනලද මැනු; චෙතොපරියඤාණස්ස ලාභී ආචරියො, පරසිත් පිරිසිඳ දන්නා නුවණලද ඇජරතෙමේ; චරියං ඤත්වා, චරිතදැන; කම්මට්ඨානං කථෙස්සති, කමටහන් කියන්නේය; ඉතරෙන, සෙස්සහු විසින්; අන්තෙවාසිකො, අතවැසිතෙමෙ; පුච්ඡිතබ්බො, විචාරියයුතුයි; තස්මා, එහෙයින්; චෙතොපරියඤාණෙන වා, පරසිත් දන්නා නුවණින් හෝ; තං පුග්ගලං, ඒ අතැවැසි පුහුලා; පුච්ඡිත්වා, පිළිවිස හෝ; අයං පුග්ගලො රාගචරිතො, මෙ පුහුල් රාගචරිතය; අයං, මෙතෙමේ; දොසාදිසු අඤ්ඤතරචරිතොති, ද්වෙෂාදීන් කෙරෙහි එක්තරා චරිතයෙකැයි; ජානිතබ්බං, දතයුතුයි.

---

1. න උපපජ්ජන්ති. ම.

(අ) කිං චරිතස්ස ච පුග්ගලස්ස කිං සප්පායන්ති-එත්ථ පන සෙනාසනං තාව රාගචරිතස්ස අධොතවෙදිකං භූමට්ඨකං අකතපබ්භාරතිණකුටිපණ්ණසාලාදීනං අඤ්ඤතරං රජොකිණ්ණං ජතුකාභරිතං ඔලුග්ගවිලුග්ගං අතිඋච්චං වා අතිනීචං වා උජ්ජඞ්ගලං සාසඞ්කං අසුචිවිසමමග්ගං යත්ථ මඤ්චපීඨම්පි මඞ්කුණභරිතං දුරූපං දුබ්බණ්ණං යං ඔලොකෙන්තස්සෙව ජිගුච්ඡා උප්පජ්ජති, තාදිසං සප්පායං නිවාසනපාරුපණං අන්තච්ඡින්නං ඔලම්බවිලම්බසුත්තකාකිණ්ණං ජාලපූවසදිසං සාණි විය ඛරසම්ඵස්සං කිලිට්ඨං භාරිකං කිච්ඡපරිහරණං සප්පායං, පත්තොපි දුබ්බණ්ණො මත්තිකාපත්තො වා ආණිගණ්ඨිකාහතො

---

(අ) කිං චරිතස්ස ච පුග්ගලස්ස, කවරචරිතයක් ඇති පුද්ගලක්හට; කිං සප්පායං, කිමෙක් සැපද යත; එත්ථ,-මෙහි; සෙනාසනං තාව, සෙනාසනතෙමේ; රාගචරිතස්ස, රාගචරිතයහට; අධොතවෙදිකං, නොපිරිසුදුපරික්ෂෙපවෙදිකාපරිඛා ඇති; භූමට්ඨකං, බිම්හිතැගූයේ හෝ;(මතුමහල් නැතියේය යන අභිප්‍රායයි.) අකතපබ්භාර, නොකරන ලද භිත්තිභූමිපරිකර්‍ම්ම ඇති; (තැම් සිටි පබ්බතයාගේ යටභාගය හෝ) තිණකුටි, තණකිළිය; පණ්ණසාල, පන්සැලය යන; ආදීනං, මේ ආදීන්ගේ; අඤ්ඤතරං, එක්තරා එකෙක් හෝ; රජොකිණ්ණං, රජසින් ගැවසීගත්; ජතුකාභරිතං, දුවත්තන්[1] විසින් පිරුණේ;ඔලුග්ගවිලුග්ගං, සිඳුණුබිඳුණේ; අතිඋච්චං වා, ඉතා උස්වූයේ හෝ; අතිනීචං වා, ඉතා මිටිවූයේ හෝ; උජ්ජඞ්ගලං, රළුවූ රජස්තැනෙහි; (ඡායොදක රහිතවූය භූතැන්.) සාසඞ්කං, සිංහව්‍යාඝ්‍රාදිභයින් සාශඞ්කවූ; අසුචි, සුචිනොවන; විසමමග්ගං, නොසමවූ මං ඇතිවූයේ; (සප්පායං යනු සබඳ.) යත්ථ, යම් සෙනස්නෙක; මඤ්චපීඨම්පි, ඇඳපුටුද; මඞ්කුණභරිතං, මකුණන් පිරුණේ; දුරූපං, විරූපවූයේ; දුබ්බණ්ණං, නපුරුවූපැහැඇතියේ; (නපුරු සටහන් ඇතියේ හෝ වේද; යං, යම් ඇඳපුටුවක්; ඔලොකෙන්තස්සෙව ජිගුච්ඡා උප්පජ්ජති, බලන්නහුටම පිළිකුල් උපදීද; තාදිසං, එබඳුවූ සෙනස්න; සප්පායං, සැප වේ; නිවාසනපාරුපණං, හඳනා පොරොණා සිවුරුද; අන්තච්ඡින්නං, අසින් සුන්නේ;[2] (ඔලම්බවිලම්බසුත්තකාකිණ්ණං, ඔලම්බවිලම්බවූ සූත්‍රයෙන් ආකීර්ණවූයේ; (ඔලම්බ නම් මඳක් එලෙන හූය-විලම්බ නම් දික්ව එලෙනහූය)ජාලපූවසදිසං, ජාලපූපයක් වැනිවූ; (ඉඹිපු බඳුය යනු සත්‍යයි ජාලාකාරයෙන් කරනලද අපූපජාතියෙක යෙත්.) සාණිවිය ඛරසම්ඵස්සං, සණපොහොරුවක්මෙන් දුක්පහස් ඇතියේ;(නොහොත් තනි අමුක් මෙන් දුක්පහස් ඇතියේ;)කිලිට්ඨං,කිලිටුවූයේ;භාරිකං,බරවූයේ;කිච්ඡපරිහරණං, බරබැවිනුදු අතුරතුරේ සිදියම් කිරීමෙනුදු දුකසේ පරිහරණයකට යුතුවූයේ; සප්පායං, සැපයි; පත්තොපි, පාත්‍රයද; දුබ්බණ්ණො, නපුරුවූ වර්‍ණ ඇති; මත්තිකාපත්තො වා, මැටිපය හෝ; ආණිගණ්ඨිකාහතො, ඇණින් හා පෙතින් නසනලද ශොභා ඇති; (ඇණ නම්

---

1. දුවත්-බොහෝ. 2. දසින්. මූ.

අයොපත්තො වා ගරුකො දුස්සණ්ඨානො සීසකපාලමිව ජෙගුච්ඡො වට්ටති. භික්ඛාචාරමග්ගො පි අමනාපො අනාසන්නගාමො විසමො වට්ටති. භික්ඛාචාරගාමොපි යත්ථ මනුස්සා අපස්සන්තා විය විචරන්ති, යත්ථ එකකුලෙපි භික්ඛං අලභිත්වා නික්ඛමන්තං එහි භන්තෙති ආසනසාලං පවෙසෙත්වා යාගුභත්තං දත්වා ගච්ඡන්තා ගාවිං විය වජෙ පවෙසෙත්වා අනවලොකෙත්වා ගච්ඡන්ති, තාදිසො වට්ටති. පරිවිසනමනුස්සාපි දාසා වා කම්මකරා වා දුබ්බණ්ණා දුද්දසිකා කිලිට්ඨවසනා දුග්ගන්ධා ජෙගුච්ඡා යෙ අචිත්තීකාරෙන යාගුභත්තං ඡඩ්ඩෙන්තා විය පරිවිසන්තිච, තාදිසා සප්පායා. යාගුභත්තඛජ්ජකම්පි ලූඛං දුබ්බණ්ණං සාමාකකුද්‍රූසකකණාජකාදිමයං පූතිතක්කබිලඞ්ග ජිණ්ණසාකසූපෙය්‍යං යංකිඤ්චිදෙව කෙවලං උදරපූරමත්තං වට්ටති. ඉරියා

---

සිදුරු තැන ගසන ඇණය. ගණ්ඩි නම් එහි හෙළන පෙතියි.) අයොපත්තො වා, යපස හෝ; ගරුකො, බරවූයේ; දුස්සණ්ඨානො, නපුරු සටහන් ඇත්තේ; සීසකපාලමිව ජෙගුච්ඡො, හිස්කබලක්මෙන් පිළිකුල්වූයේ; වට්ටති, වටී; භික්ඛාචාරමග්ගොපි, සිඟා යන මඟද; අමනාපො, සිත්කළු නොවූයේ; අනාසන්නගාමො, දුරුවූ ගම් ඇතියේ; විසමො, සමනොවූයේ; වට්ටති, වටී; භික්ඛාචාරගාමොපි, සිඟායන ගමද; යත්ථ මනුස්සා, යම් ගමෙක මිනිස්සු; අපස්සන්තා විය විචරන්ති, නොදක්නවුන් මෙන් ඇවිදිත්ද; යත්ථ, යම් ගමෙක; එකකුලෙපි, එක්කුලෙක්හිදු; භික්ඛං අලභිත්වා, භික්‍ෂාව නොලදින්; නික්ඛමන්තං, ගමින් නික්මෙන්නාහු එහි භන්තෙති, වහන්ස එන්නේයයි; ආසනසාලං පවෙසෙත්වා, ආසනසාලාවට වදවා; යාගුභත්තං දත්වා ගච්ඡන්තා, හඹුබත් දී යන්නාහු; ගාවිං, දෙනක; වජෙ පවෙසෙත්වා විය, ගොවු දෙහිලා යන්නවුන් මෙන්; අනවලොකෙත්වා ගච්ඡන්ති, නොබැණම යෙද්ද; තාදිසො, එබඳුවූ ගොචරග්‍රාමය; වට්ටති, වටී; පරිවිසනමනුස්සා පි, වළඳවනමිනිස්හුදු; දාසා වා, දස්හු වෙත්වයි; කම්මකරාවා, මෙහෙකරුවෝ වෙත්වයි; දුබ්බණ්ණා, නපුරුවූ පැහැඇත්තාහු; දුද්දසිකා, අඟපසඟ විසින් නපුරුවූ දසුන් ඇත්තාහු; කිලිට්ඨවසනා, කිලිටිවසන් ඇත්තාහු; දුග්ගන්ධා, දුඃගඳවූවාහු; ජෙගුච්ඡා, පිළිකුල්වූවාහු වෙත්ද; යෙ, යම් කෙනෙක්; අචිත්තීකාරෙන, අගෞරවයෙන්; යාගුභත්තං, හඹුබත්; ඡඩ්ඩෙන්තා විය, දමන්නවුන් මෙන්; පරිවිසන්ති ච, වළඳවත්ද; තාදිසා, එබඳුවූවෝ; සප්පායා, සැපයෝයි; යාගුභත්තඛජ්ජකම්පි, හඹුබත් කැවුමුදු; ලූඛං, රූක්‍ෂවූයේ; දුබ්බණ්ණං, දුර්වර්ණවූයේ; සාමාක, බොඩහමු; කුද්‍රූසක; සෙසු ක්‍ෂුද්‍රධාන්‍ය; කණාජකාදිමයං, නිවුඩු[1] සහල් ආදීන් කරනලද; පූතිතක්ක, කුණුමොහොර; බිලඞ්ග, කාඩි; ජිණ්ණසාකසූපෙය්‍යං, මුහුකළ පලාමාළු ඇති; යංකිඤ්චිදෙව, යම්කිසිවක්ම; කෙවලං, හුදෙක්; උදරපූරමත්තමපි, කුස්පිරෙණ පමණක්; වට්ටති, වටී; ඉරියාපථොපි, ඉරියව්ද; අස්ස, මෝහට;

---

1. නිමුඩු. මු.

පථොපිස්ස ඨානං වා චඞ්කමො වා වට්ටති, ආරම්මණං නීලාදිසු වණ්ණකසිණෙසු යං කිඤ්චි අපරිසුද්ධවණ්ණන්ති ඉදං රාගචරිතස්ස සප්පායං.

(ආ) දොසචරිතස්ස සෙනාසනං නාතිඋච්චං නාතිනීචං ඡායූදකසම්පන්නං සුවිභත්තභිත්තිථම්භසොපානං සුපරිනිට්ඨිතමාලාකම්මලතාකම්මං නානාවිධචිත්තකම්මසමුජ්ජලං සමසිනිද්ධමුදුභූමිතලං බ්‍රහ්මවිමානමිව කුසුමදාමවිචිත්තවණ්ණචෙලවිතානසමලඞ්කතං සුපඤ්ඤත්තසුචිමනොරමත්ථරණමඤ්චපීඨං තත්ථ තත්ථ වාසත්ථාය නික්ඛිත්තකුසුමවාසගන්ධසුගන්ධං යං දස්සනමත්තෙනෙව පීතිපාමොජ්ජං ජනයති, එවරූපං සප්පායං, තස්ස පන සෙනාසනස්ස මග්ගොපි සබ්බපරිස්සයවිමුත්තො සුචිසමතලො අලඞ්කතපටියත්තොව වට්ටති,

---

ඨානං වා චඞ්කමො වා වට්ටති, සිටීම හෝ සක්මන හෝ වටී; (ප්‍රණීත ඉරියවුවෙහි රාගොත්පත්ති වන හෙයින යන අභිප්‍රායයි.) ආරම්මණං, අරමුණු; නීලාදිසු වණ්ණකසිණෙසු, නීලාදිවූ වර්ණකසුණෙහි; යං කිඤ්චි, යම් කිසිවෙක්; අපරිසුද්ධවණ්ණන්ති, නොපිරිසුදු වර්ණ ඇතියේ; (සැපයි.) ඉදං, මේ; රාගචරිතස්ස සප්පායං, රාගචරිතයහට සැපයි; (මෙසේ කල කෙලෙස් උපැත් නොවේ යන අභිප්‍රායි.)

(ආ) දොසචරිතස්ස, ද්වෙෂචරිතයහට; සෙනාසනං, සෙනස්න; නාති උච්චං, ඉතා උස්නොවූයේ; නාති නීචං, ඉතා මිටිනොවූයේ; ඡායූදකසම්පන්නං, ඡායාඋදකයෙන් සමන්විතවූයේ; සුවිභත්ත, මනාකොට විභාගකරනලද; භිත්තිථම්භසොපානං, භිත්ති හා ටැම් හා හිණි ඇතියේ; සුපරිනිට්ඨිත, මනාකොට නිමවනලද; මාලාකම්මලතාකම්මං, මල්කම් ලියකම් ඇතියේ; නානාවිධචිත්තකම්මසමුජ්ජලං, නන්ප්‍රකාර චිත්‍රකර්මයෙන් උජ්වලවූයේ; සමසිනිද්ධමුදුභූමිතලං, සමවූ සනිග්ධවූ මෘදුවූ බිම්තල ඇතියේ; බ්‍රහ්මවිමානමිව, බඹවිමනක් මෙන්; කුසුමදාමවිචිත්තවණ්ණ, මල්දමින් විසිතුරුවූ වර්ණ ඇති; චෙලවිතානසමලඞ්කතං, පිළිවියනින් සදනලද්දේ; සුපඤ්ඤත්ත, මනාකොට පනවනලද; සුචිමනොරමත්ථරණමඤ්චපීඨං, සුචිවූ මනොරම්‍යවූ පසතරණ ඇති හැඳපුටු ඇතියේ; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; වාසත්ථාය නික්ඛිත්ත, සුවඳගන්වන පිණිස තබනලද; කුසුමවාසගන්ධසුගන්ධං, මල් හා වත් සුන්හෙහි ගන්ධයෙන් සුගන්ධවූයේ; ('සප්පායං'යනු සබඳ;) යං, යම් සෙනස්නෙක්; දස්සනමත්තෙනෙව පීතිපාමොජ්ජං ජනයති, දර්ශනමාත්‍රයෙන්ම ප්‍රීතිප්‍රමොද්‍යය උපදවාද; එවරූපං, මෙබඳුවූයේ; සප්පායං, සැපයි; තස්ස පන සෙනාසනස්ස මග්ගොපි, ඒ සෙනස්නටයනමඟද; සබ්බපරිස්සයවිමුත්තො, සියලු පරිපන්ථයෙන් විනිර්මුක්තවූයේ; සුචි, පිරිසුදුවූයේ; සමතලො, සමවූතලඇත්තේ; අලඞ්කතපටියත්තොව වට්ටති, සදු නිමවනලද්දේම වටී; (සජ්ජිතවූයේම වටී යුතැති.)

(අ) සෙනාසනපරික්ඛාරෙපෙත්ථ කීටමඞ්කුණදීඝජාතිමූසිකාදීනං නිස්සයපරිච්ඡින්දනත්ථං නාතිබහුකො, එකං මඤ්චපීඨමත්තමෙව වට්ටති, නිවාසනපාරුපනම්පිස්ස,[1] චීනපට්ටසොමාරපට්ටකොසෙය්‍ය කප්පාසික සුඛුමඛොමසුඛුමාදීනං යං යං පණීතං, තෙන තෙන එකපට්ටං වා දුපට්ටං වා සල්ලහුකං සමණසාරුප්පෙන සුරත්තං සුපරිසුද්ධවණ්ණං වට්ටති, පත්තො උදකබුබ්බුළමිව සුසණ්ඨානො මණිවිය සුමට්ඨො නිම්මලො සමණසාරුප්පෙන සුපරිසුද්ධවණ්ණො අයොමයො වට්ටති, භික්ඛාචාරමග්ගො පරිස්සයවිමුත්තො සමො මනාපො නාතිදූරනාච්චා සන්නගාමො වට්ටති. භික්ඛාචාරගාමොපි යත්ථ මනුස්සා ඉදානි අය්‍යො ආගමිස්සතීති සිත්තසම්මට්ඨෙ පදෙසෙ ආසනං පඤ්ඤපෙත්වා පච්චුග්ගන්ත්වා පත්තං ආදාය ඝරං පවෙසෙත්වා පඤ්ඤත්තාසනෙ නිසීද

---

(අ) එත්ථ, මෙහි; සෙනාසනපරික්ඛාරෙපි, සෙනසුන්පිරිකරද; කීටමඞ්කුණදීඝජාතිමූසිකාදීනං, පණු මකුණු දිග්දූමිහි ආදීන්ගේ; නිස්සයපරිච්ඡින්දනත්ථං, ආශ්‍රය පසිඳිනා පිණිස; එකං මඤ්චපීඨමත්තමෙව වට්ටති, එකම හැඳක් හා පුටුවක් පමණ වටී; නාතිබහුකො, ඉතා වැඩියක් (නොවටී); නිවාසනපාරුපනම්පි,[1] හඳනා පොරෝනා සිවුරුද; අස්ස, ඕහට; චීනපට්ට, චීනදෙශයෙහි පටය; සොමාරපට්ට, සොමාර දෙශයෙහි පටය; කොසෙය්‍ය, තිහිරිපිළිය; කප්පාසිකසුඛුම, සිහින් කපුපිළිය; ඛොමසුඛුම, සිහින් කොමුපිළිය; (එනම් දෙශයෙක පිළිය යෙක්. කොමු නම් වාකජාතියෙක යෙත්මැයි.)ආදීනං, මේ ආදීන්ගේ; යං යං පණීතං, යමෙක් යමෙක් ප්‍රණීතද; තෙන තෙන, එ එයින්; එකපට්ටං වා දුපට්ටං වා, එක්පට හෝ දෙපට වූයේ; සල්ලහුකං, සැහැල්ලුවූයේ; සමණසාරුප්පෙන සුරත්තං, ශ්‍රමණසාරුප්‍යයෙන් මනාකොටම රඳනාලද්දේ; සුපරිසුද්ධවණ්ණං, ඉතා පිරිසුදුපැහැ ඇත්තේ; වට්ටති, වටී; පත්තො, පාත්‍රය;උදකබුබ්බුළමිව සුසණ්ඨානො, දියබුබුලක් මෙන් මනාවූ සටහන් ඇත්තේ; මණිවිය සුමට්ඨො, මැණිකක්මෙන් ඉතාමටවූයේ; නිම්මලො, නිර්මලවූයේ; සමණසාරුප්පෙන, ශ්‍රමණසාරුප්‍යවර්ණයෙන්; සුපරිසුද්ධවණ්ණො, සුපිරිසුදු වර්ණ ඇතියේ; අයොමයො, යකඩින් කරනලද්දේ; වට්ටති, වටී; භික්ඛාචාරමග්ගො, පිඬු සිඟා යන මඟද; පරිස්සය විමුත්තො, උපද්‍රව යෙන් මිදුනේ; සමො, සමවූයේ; මනාපො, මනවඩන්නේ(වටී); නාති දූරනාච්චාසන්නගාමො වට්ටති, ඉතා දුරුනොවූ ඉතා ළංනොවූ ගම් ඇත්තේ වටී; භික්ඛාචාරගාමොපි, සිඟායන ගම්ද; යත්ථ මනුස්සා, යම් ගමෙක මිනිස්හු; ඉදානි අය්‍යො ආගමිස්සතීති, දැන් ආර්‍ය්‍යයෝ එන්නා හයි; සිත්තසම්මට්ඨෙ පදෙසෙ, දියහිස හමඳනාලද පෙදෙස්හි; ආසනං පඤ්ඤපෙත්වා, හුනස්පනවා; පච්චුග්ගන්ත්වා, පෙරමඟට ගොස්; පත්තං ආදාය, පාත්‍රයගෙන; ඝරං පවෙසෙත්වා, ගෙට වඩා; පඤ්ඤත්තා සනෙ නිසීදපෙත්වා, පැනවූ ආසනයෙහි හිඳුවා; සක්කච්චං, සකස්

---

1. පාපුරණම්පිස්ස-සාත්ථවි.

පෙත්වා සක්කච්චං සහත්ථා පරිවිසන්ති, තාදිසො වට්ටති. පරිවෙසකා පනස්ස යෙ හොන්ති අභිරූපා පාසාදිකා සුන්හාතා සුවිලිත්තා ධූමවාසසුගන්ධසුගන්ධිනො[1] නානාවිරාගසුචිමත්තුක්කට්ඨවත්ථාභරණපතිමණ්ඩිතා සක්කච්චකාරිනො, තාදිසා සප්පායා. යාගුභත්තඛජ්ජකම්පි වණ්ණගන්ධරසසම්පන්නං ඔජවන්තං මනොරමං සබ්බාකාරපණීතං යාවදත්ථං වට්ටති, ඉරියාපථොපිස්ස සෙය්‍යා වා නිසජ්ජා වා වට්ටති. ආරම්මණං නීලාදීසු වණ්ණකසිණෙසු යංකිඤ්චි සුපරිසුද්ධවණ්ණන්ති, ඉදං දොසචරිතස්ස සප්පායං.

(අ) මොහචරිතස්ස සෙනාසනං දිසාමුඛං අසම්බාධං වට්ටති. යත්ථ නිසින්නස්ස විවටා දිසා පඤ්ඤායන්ති, ඉරියාපථෙසු චඞ්කමො වට්ටති. ආරම්මණං පනස්ස පරිත්තං සුප්පමත්තං සරාවමත්තං වා ඛුද්දකං නවට්ටති. සම්බාධස්මිං හි ඔකාසෙ චිත්තං භිය්‍යො සම්මොහමාපජ්ජති,

---

කොට; සහත්ථා පරිවිසන්ති, තමන් අතින් වළඳවත්ද; තාදිසො වට්ටති, එබඳුවූයේ වටී; පරිවෙසකා පන, වළඳවන මිනිස්සු වනාහි; අස්ස, ඕහට; යෙ, යම් කෙනෙක්; අභිරූපා, සුන්දර රූපඇත්තාහු; පාසාදිකා, ප්‍රසාද එළවන්නාහු; සුන්හාතා, මනාකොට නැහැවාහු; සුවිලිත්තා, මනාකොට විලෙවුන් ගත්තාහු; ධූමවාසසුගන්ධ, දුම වත් සුණුසුවඳය යන මෙහි ගන්ධයෙන්; සුගන්ධිනො, සුවඳවූවාහු; නානා විරාග, නන්පැහැ ඇති; සුචිමත්තුක්කට්ඨවත්ථාභරණපතිමණ්ඩිතා, ශුචිවූ මනොඥවස්ත්‍රාභරණයෙන් සැදූනාහු; සක්කච්චකාරිනො, සකස් කොට කරන සුල්ලහු; [හොන්ති, වෙද්ද;] තාදිසා සප්පායා, එබඳුවූවහු සැප යෝයි; යාගුභත්තඛජ්ජකම්පි, හඹුබත්කැවුම් දු; වණ්ණගන්ධරස සම්පන්නං, වර්ණගන්ධරස යන මෙයින් සමන්විතවූයේ; ඔජවන්තං, ඔජස්ඇත්තේ; මනොරමං, මනහරවූයේ; සබ්බාකාරපණීතං, සර්‍වාකාරයෙන් මධුරවූයේ; යාවදත්ථං, කැමැති පමණවූයේ; වට්ටති, වටී; ඉරියාපථොපි, ඉරියවුවද; අස්ස, මෝහට; සෙය්‍යා වා, හෙවීම හෝ; නිසජ්ජා වා, හිඳීම හෝ; වට්ටති, වටී; ආරම්මණං, අරමුණු; නීලාදීසු වණ්ණකසිණෙසු, නීලාදිවර්ණකසිණයන් කෙරෙහි; යං කිඤ්චි, යම් කිසිවෙක්; සුපරිසුද්ධවණ්ණං, ඉතා පිරිසුදු පැහැඇත්තේ; [වට්ටති, වටී;] ඉදං, මේ; දොසචරිතස්ස සප්පායං, ද්වෙෂචරිතයහට සැපයි.

(අ) මොහචරිතස්ස සෙනාසනං, මොහචරිතයහට සෙනස්න; දිසාමුඛං, දිගට අභිමුඛවූයේ; (අභ්‍යවකාශයට අභිමුඛවූයේය යන අභිප්‍රායි.) අසම්බාධං වට්ටති, හකනොවූයේ වටී; යත්ථ, යම්සෙනස් නෙක; නිසින්නස්ස, හුන්නහුට; විවටා දිසා පඤ්ඤායන්ති, විවෘතවූ දික්හු පැනෙද්ද; කිසිවෙකින් මුවහනොවූ දික්හු යුතැති.) ඉරියාපථෙසු, ඉරියවුවෙහි; චඞ්කමො වට්ටති, සක්මන් වටී; ආරම්මණං පන, අරමුණු වනාහි; අස්ස, මෝහට; පරිත්තං, ස්වල්පවූයේ; සුප්පමත්තං, සුළුකුලු පමණවූයේ; සරාවමත්තං, මලාවක් පමණවූයේ; ඛුද්දකං, කුඩා අරමුණු; න වට්ටති, නොවටී; සම්බාධස්මිං ඔකාසෙ, හකවූ අව

---

1. ධූපවාසකුසුමගන්ධසුරභිනො-කාළුවි.

තස්මා විපුලං මහාකසිණං වට්ටති. සෙසං දොසචරිතස්ස වුත්තසදිසමෙවාති, ඉදං මොහචරිතස්ස සප්පායං. සද්ධාචරිතස්ස සබ්බම්පි දොසචරිතම්හි වුත්තවිධානං සප්පායං. ආරම්මණෙසු චස්ස අනුස්සතිට්ඨානම්පි වට්ටති. බුද්ධිචරිතස්ස සෙනාසනාදීසු ඉදං නාම අසප්පායන්ති නත්ථි. විතක්කචරිතස්ස සෙනාසනං විවටං දිසාමුඛං. යත්ථ නිසින්නස්ස ආරාමවනපොක්ඛරණීරමණීයානි ගාමනිගමජනපදපටිපාටියො නීලොභාසා ච පබ්බතා පඤ්ඤායන්ති, තං න වට්ටති. තං හි විතක්කසන්ධාවනස්සෙව පච්චයො හොති. තස්මා ගම්භීරෙ දරීමුඛෙ වනපටිච්ඡන්නෙ හත්ථිකුච්ඡිපබ්භාරමහින්දගුහාසදිසෙ සෙනාසනෙ වසිතබ්බං. ආරම්මණම්පිස්ස විපුලං න වට්ටති, තාදිසං හි විතක්කවසෙන

---

කාශයෙහි; චිත්තං, සිතතෙමෙ; භිය්‍යො, බොහෝසේ; සම්මොහමාපජ්ජති, මුළාබවට පැමිණේ; තස්මා, එහෙයින්; විපුලං වට්ටති, මහත් කිසුණුවටී; (ශූර්පශරාව ප්‍රමාණයට සතර පස්අඟලක් වඩා කරන කිසුණුය යන අභිප්‍රායි. මහාකසිණං යනුයෙහි අර්ථ පවසන පිණිස කීහු. මහත් කිසුණුමඬුළු වටී යන අර්ථයි.[1]) සෙසං, සෙස්ස; දොසචරිතස්ස වුත්තසදිසමෙව, ද්වේෂචරිතයහට කියනලද්දහාම සදෘශ වේ; (සෙනසුන් ආදියෙහි යමෙක් මොහචරිතයහට වක්තව්‍යවේද හේ ද්වේෂචරිතයහට කියනලද සැප හා සදෘශම වේ යුතැයි.) ඉදං, මේ; මොහචරිතස්ස සප්පායං, මොහචරිතයහට සැපයි; සද්ධාචරිතස්ස, ශ්‍රද්ධාචරිතයහට; දොසචරිතම්හි, ද්වේෂචරිතයා කෙරෙහි; වුත්තවිධානං සබ්බම්පි, කියනලදවිධාන ඇති සියල්ලම; සප්පායං, සැපයි; ආරම්මණෙසු ච, අරමුණන්කෙරෙහි ද; අස්ස, මෝහට; අනුස්සතිට්ඨානම්පි, අනුස්මෘතිස්ථානය ද; (බුද්ධානුස්මෘති ආදිවූ සදෙන ද යන අර්ථයි.) වට්ටති, වටී; බුද්ධිචරිතස්ස, බුද්ධිචරිතයහට; සෙනාසනාදීසු, සෙනාසනාදීන් කෙරෙහි; ඉදං නාම අසප්පායන්ති නත්ථි, මෙනම් දෑයෙක් අසප්පාය යනු නැති; විතක්කචරිතස්ස, විතර්කචරිතයහට; සෙනාසනං, සෙනසුන්; විවටං, විවෘතවූයේ; දිසාමුඛං, දිගට අභිමුඛවූයේ; (වට්ටති-යනු සබඳ.) යත්ථ නිසින්නස්ස, යම්තැනක උන්නාහට; ආරාමවනපොක්ඛරණීරමණීයානි, අරම්වනපොකුණුරමණීහුද; ගාමනිගමජනපදපටිපාටියො, ගම්නියම්ගම් දනවු පිළිවෙළහුද; නීලොභාසා ච පබ්බතා, නීලප්‍රභා ඇති පර්වතයෝ ද; පඤ්ඤායන්ති, පැනෙද්ද; තං න වට්ටති, ඒ නොවටී; තං හි, හේ වනාහි; විතක්කසන්ධාවනස්ස පච්චයො හොති, විතර්කයාගේ සන්ධාවනයට (දිවීමට) ප්‍රත්‍යය වේ; තස්මා, එහෙයින්; ගම්භීරෙ, ගැඹුරුවූ; දරීමුඛෙ, පර්වතවිවරයෙහි; වනපටිච්ඡන්නෙ, වෙනෙන් මුවහවූ; හත්ථිකුච්ඡිපබ්භාරමහින්දගුහාසදිසෙ, හත්ථිකුච්ඡිපබ්භාරය මහින්දගුහාය යන මොවුන් වැනිවූ; (මිහිඳුගුහා නම් සෑගිරිය මිහිඳු මහතෙරුන් විසූ ගුහායි.) සෙනාසනෙ වසිතබ්බං, සෙනස්නෙහි විසිය යුතු; ආරම්මණම්පි, අරමුණුදු; අස්ස, මෝහට; විපුලං, මහත්වූයේ; න වට්ටති, නොවටී; තාදිසං හි, එබඳුවූයේ; විතක්කවසෙන සන්ධා

---

1. ශු. ස. අසම්මතය.

සන්ධාවනාය පච්චයො හොති. පරිත්තං පන වට්ටති, සෙසං රාගචරිතස්ස වුත්තසදිසමෙවාති ඉදං විතක්කචරිතස්ස සප්පායං. අයං අත්තනො චරියානුකූලන්ති එත්ථ ආගතචරියානං පභෙදනිදාන[1] විභාවනසප්පාය පරිච්ඡෙදතො විත්ථාරො.

(අ) නව තාව චරියානුකූලං කම්මට්ඨානං සබ්බාකාරෙන ආවිකතං, තං හි අනන්තරස්ස මාතිකාපදස්ස විත්ථාරෙ සයමෙව ආවි භවිස්සති. තස්මා යං වුත්තං "චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා"ති එත්ථ සඞ්ඛාතනිද්දෙසතො, උපචාරප්පනාවහතො, ඣානප්පභෙදතො, සමතික්කමතො, වඩ්ඪනාවඩ්ඪනතො, ආරම්මණතො,

---

වනාය, විතර්කවශයෙන් දිවීමට; පච්චයො හොති, ප්‍රත්‍යය වේ; පරිත්තං පන, පරිත්තකිසුණ වනාහි; (සුප්පමත්ත සරාවමත්තවූයේ යුසේසි.) වට්ටති, වටී; සෙසං, සෙස්ස; රාගචරිතස්ස වුත්තසදිසමෙවාති; රාගචරිතයහට කියනලද සැපය හා සමවූයේම (වටී;) ඉදං, මේ; විතක්කචරිතස්ස සප්පායං, විතර්කචරිතයහට සැපයි; අයං, මේ; අත්තනො චරියානුකූලන්ති එත්ථ, අත්තනො චරියානුකූලං-යන මෙහි; ආගතචරියානං, ආවාවූ චරියාවන්ගේ; පභෙදනිදාන[1]විභාවනසප්පායපරිච්ඡෙදතො, ප්‍රභෙදපරිච්ඡෙදය නිදානපරිච්ඡෙදය විභාවනපරිච්ඡෙදය සප්පාය පරිච්ඡෙදය යන මොවුන්ගේ; විත්ථාරො, විස්තරයි; (මේ රාගචරිතය යනාදීන් ජනනයම විභාවනා නම් වෙයි හඟිනු.)

(අ) චරියානුකූලං කම්මට්ඨානං, චරියානුකූලවූ කමටහන; සබ්බාකාරෙන, හැමආකාරයෙන්; නව තාව ආවිකතං, තව පහළනොක රනලදී; (සමහර කසිණානුස්සතිට්ඨාන කෙනෙකුන් සතප්‍රාය ප්‍රසඞ්ග හෙයින් නව තාව චරියානුකූලං යනාදි කීහයි- හඟනේ.) තං හි, ඒ චරියානුකූලය හා කමටහන; අනන්තරස්ස මාතිකාපදස්ස විත්ථාරෙ, අනතුරෙහි කියනලද මාතෘකාපදයාගේ විස්තරයෙහි; සයමෙව ආවිභවිස්සති, තෙමේම පහළවේ; තස්මා, එහෙයින්; චත්තාලීසාය කම්මට්ඨානෙසු, සතලිස් කමටහනුන් කෙරෙහි; අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වාති, එක්තරා කමටහනක් ගෙනයයි; යං වුත්තං, (යි යොදනු.) යමක්කියනලද්ද; එත්ථ, මෙහි; සඞ්ඛාතනිද්දෙසතො, සතළිසෙකැයි සඞ්ඛ්‍යාවශයෙන් ගෘහීතයන්ගේ නිර්දේශ හෙයින්ද; උපචාරප්පනාවහතො, (මෙතෙක්දෙන උපචාරධ්‍යාන එළවති මෙතෙක් දෙන අර්පණාධ්‍යාන එළවති යි.) මෙසේ උපචාරාර්පණාවහබැවින්ද; ඣානප්පභෙදතො, (මෙතෙක් දෙන එකධ්‍යානිකයහ මෙතෙක්දෙන ත්‍රිකධ්‍යානිකයහ මෙතෙක්දෙන සකලධ්‍යානිකයහ යි මෙසේ) ධ්‍යාන ප්‍රභෙද හෙයින්ද; සමතික්කමතො, (මෙ කමටහනුන් කෙරෙහි අඞ්ග සමතික්‍රමය මොවුන් කෙරෙහි ආලම්බන සමතික්‍රමය යි මෙසේ) සමතික්‍රමණ හෙයින්ද; වඩ්ඪනාවඩ්ඪනතො, (මෙතෙක්දෙන වැඩියයුත්තාහ මෙතෙක්දෙන නොවැඩිය යුත්තාහයි මෙසේ) වැඩියයුතු

---

[1] විධාන-මූ. ස. ථ. මූ.

භූමිතො, ගහණතො, පච්චයතො, චරියානුකූලතොති, ඉමෙහි තාව දසහි ආකාරෙහි කම්මට්ඨානවිනිච්ඡයො වෙදිතබ්බො. තත්ථ **සඞ්ඛාතනිද්දෙසතොති**:-චත්තාලීසාය කම්මට්ඨානෙසු ඉති හි වුත්තං, තත්‍රිමානි චත්තාලීස කම්මට්ඨානානි:-දසකසිණා දසඅසුභා දසඅනුස්සතියො චත්තාරො බ්‍රහ්මවිහාරා චත්තාරො ආරුප්පා එකා සඤ්ඤා එකං වවත්ථානන්ති. තත්ථ පඨවීකසිණං ආපොකසිණං තෙජොකසිණං වායොකසිණං නීලකසිණං පීතකසිණං ලොහිතකසිණං ඔදාතකසිණං ආලොකකසිණං පරිච්ඡින්නාකාසකසිණන්ති, ඉමෙ දසකසිණා. උද්ධුමාතකං විනීලකං විපුබ්බකං විච්ඡිද්දකං වික්ඛායිතකං වික්ඛිත්තකං හතවික්ඛිත්තකං ලොහිතකං පුළුවකං අට්ඨිකන්ති, ඉමෙ දස අසුභා. බුද්ධානුස්සති ධම්ම[1] සඞ්ඝ සීල චාග දෙවතානුස්සති මරණස්සති කායගතාසති ආනාපානසති උපසමානුස්සතීති, ඉමා දස අනුස්සතියො. මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛාති, ඉමෙ චත්තාරො බ්‍රහ්මවිහාරා.

---

නොවැඩියයුතුහෙයින්ද; ආරම්මණතො, (ස්වභාවධර්මාලම්බනය නිමිත්තාලම්බනය වක්තව්‍යාලම්බනය චලිතාලම්බනය අචලිතාලම්බනය යන මොවුන්ගේ වශයෙන්) ආලම්බනවිභාග හෙයින්ද; භූමිතො, කාමාවචරාදි භූමි විභාගහෙයින්ද; ගහණතො, මොහු දෘෂ්ටයෙන් ගතයුත්තාහ මොහු ස්පෘෂ්ටව්‍යයෙන් ගතයුත්තාහ යනාදීන්) ග්‍රහණ හෙයින්ද; පච්චයතො, ආරූප්‍යාදීන්ට යථාහීයෙන් ප්‍රත්‍යයභාවයෙන්ද; චරියානුකූලතොති, රාගචරිතාදීන්ට[2] අනුකූලහෙයින්දැයි; ඉමෙහි තාව දසහි ආකාරෙහි, මේ දශආකාරයෙන්; කම්මට්ඨානවිනිච්ඡයො වෙදිතබ්බො, කමටහන් විනිශ්චය දතයුතුයි; තත්ථ, ඒ දශප්‍රකාරයෙහි; (සඞ්ඛාතනිද්දෙසතො යන්නෙහි;) චත්තාලීසාය කම්මට්ඨානෙසු ඉතිහි වුත්තං, සතලිස් කමටහනුන් කෙරෙහිය යි මෙසේ කියනලද්ද; තත්‍ර, එහි; ඉමානි, මොහු; චත්තාලීසකම්මට්ඨානානි, සතලිස්කමටහන්හුයි: දසකසිණා, දසකිසුණහ; දසඅසුභා, දශඅශුභයහ; දසානුස්සතියො, දශානුස්මෘති යහ; චත්තාරො බ්‍රහ්මවිහාරා, සතරබ්‍රහ්මවිහාරයහ; චත්තාරො ආරුප්පා, සතරආරූප්‍යයහ; එකා සඤ්ඤා, එකම සංඥවක; එකං වවත්ථානන්ති, එකම ව්‍යවස්ථානයෙකැයි; තත්ථ, එහි; *පඨවීකසිණං, පඨවිකිසුණ; …පෙ… පරිච්ඡින්නාකාස කසිණන්ති, පිරිසුන් අහස්කිසුණය යන; ඉමෙ, මොහු; දසකසිණා, දසකිසුණෝ නම් වෙත්; උද්ධුමාතකං, උද්ධුමාතක අසුභය …පෙ… අට්ඨිකන්ති, අස්ථික අශුභයයි; ඉමෙ, මොහු; දසඅසුභා, දශඅශුභයෝ නම් වන්නාහුයි; බුද්ධානුස්සති, බුද්ධානුසිය …පෙ… උපසමානුස්සතීති, උපසමානුසිය යී; ඉමා, මොහු; දසඅනුස්සතියො, දශානුස්මෘති නම් වෙත්; මෙත්තා, මෛත්‍රිය; කරුණා, කරුණාය; මුදිතා, මුදිතාය; උපෙක්ඛා, උපෙක්ෂාය යන; ඉමෙ චත්තාරො බ්‍රහ්මවිහාරා නාම, මොහු සතරබ්‍රහ්මවිහාරයෝ නම් වෙත්; ආකාසානඤ්චායතනං, ආකාසානඤ්චායතනය; විඤ්ඤාණඤ්චායතනං, විඤ්ඤාණඤ්චායතනය; ආකිඤ්චඤ්ඤායතනං, ආකිඤ්චඤ්ඤායතනය; නෙවසඤ්ඤානාසඤ්ඤ

---

1. ධම්මානුස්සති-ත්‍රි. මූ.
2. චරිතාදීන්ට-මූ. ස.

ආකාසානඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති, ඉමෙ චත්තාරො ආරුප්පා. ආහාරෙ පටික්කූලසඤ්ඤා එකා සඤ්ඤා චතුධාතුවවත්ථානං එකං වවත්ථානන්ති, එවං සඞ්ඛාතනිද්දෙසතො විනිච්ඡයො වෙදිතබ්බො෴

(අ) **උපචාරප්පනාවහතොති**:-ඨපෙත්වා කායගතාසතිඤ්ච ආනාපානසතිඤ්ච අවසෙසා අට්ඨ අනුස්සතියො, ආහාරෙ පටික්කූලසඤ්ඤා ච, චතුධාතු වවත්ථානන්ති, ඉමානෙව හෙත්ථ දසකම්මට්ඨානානි උපචාරාවහානි, සෙසානි අප්පනාවහානීති එවං උපචාරප්පනාවහතො. **ඣානප්පභෙදතොති**:-අප්පනාවහෙසු චෙත්ථ ආනාපානසතියා සද්ධිං දසකසිණා චතුක්කජ්ඣානිකා හොන්ති, කායගතාසතියා සද්ධිං දස අසුභා පඨමජ්ඣානිකා, පුරිමා තයො බ්‍රහ්මවිහාරා තිකජ්ඣානිකා, චතුත්ථ බ්‍රහ්මවිහාරො චත්තාරො ච ආරුප්පා චතුක්කජ්ඣානිකාති එවං ඣානප්පභෙදතො. **සමතික්කමතොති** වෙ සමතික්කමා, අඞ්ගසම

---

යතනන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යි; ඉමෙ, මොහු; චත්තාරො ආරුප්පා, සතර ආරූප්‍යයෝ නම් වෙත්; ආහාරෙ පටික්කූලසඤ්ඤා, අහර පිළිකුල් සංඥතොමෝ; එකා සඤ්ඤා නාම, එක් සංඥ නම් වෙයි; චතුධාතුවවත්ථානං, සතරධාතූන්ගේ ව්‍යවස්ථාව; එකං වවත්ථානන්ති, එක්ව්‍යවස්ථානතමැයි; එවං, මෙසේ; සඞ්ඛාතනිද්දෙසතො විනිච්ඡයො වෙදිතබ්බො, සඞ්ඛ්‍යාතනිර්දේශ හෙයින් විනිශ්චය දතයුතු෴

(අ) "උපචාරප්පනාවහතො"යන්නෙහි; කායගතාසතිඤ්ච, කායගතාස්මෘතියද; ආනාපානසතිඤ්ච, ආනාපානස්මෘතියද; ඨපෙත්වා, තබා; අවසෙසාඅට්ඨඅනුස්සතියො, අවශෙෂ අට අනුස්මෘතීහුද; ආහාරෙ පටික්කූලසඤ්ඤා ච, ආහාරයෙහි පිළිකුල් සංඥවද; චතුධාතු වවත්ථානන්ති, චතුර්ධාතුව්‍යවස්ථාවද යන; එත්ථ, මේ කමටහනුන් කෙරෙහි; ඉමානෙව හි දසකම්මට්ඨානානි, මේ දශකමටහන්හුම; උපචාරාවහානි, උපචාරධ්‍යාන එළවන්නාහුය; සෙසානි, සෙස්සෝ; අප්පනාවහානීති, අර්පණා එළවන්නාහයි; එවං උපචාරප්පනාවහතො, මෙසේ උපචාරාර්පණාවහබැවින් ෴ පෙ ෴ "ඣානප්පභෙදතො" යන්නෙහි;අප්පනාවහෙසු චෙත්ථ, අර්පණාවහවූ මෙ කමටහනුන් කෙරෙහිදු; ආනාපානසතියා සද්ධිං, ආනාපානස්මෘතිය හා සමග; දසකසිණා, දසකිසුණුහු; චතුක්කජ්ඣානිකා හොන්ති, සතර රූපාවචරධ්‍යානයන් ඇත්තාහු වෙත්;(මේ චතුෂ්කනය හෙයින් කීහු.)කායගතාසතියා සද්ධිං, කායගතාසතිය හා සමග; දසඅසුභා, දශඅශුභයෝ; පඨමජ්ඣානිකා, ප්‍රථමධ්‍යාන ඇත්තාහු වෙත්; පුරිමා තයො බ්‍රහ්මවිහාරා, පළමු තුන්බ්‍රහ්මවිහාරයෝ; තිකජ්ඣානිකා, ආදියෙහි තී ධ්‍යානයන් තුන් දෙනා ඇත්තාහුයි; චතුත්ථබ්‍රහ්මවිහාරො, සතරවන බ්‍රහ්මවිහාරයද; චත්තාරො ච ආරුප්පා, සතර ආරූප්‍යයෝද; චතුක්කජ්ඣානිකා, සතර ධ්‍යාන ඇත්තාහු වෙත්;෴පෙ෴"සමතික්කමොති"යන; එත්ථ, මෙහි; වෙ සමතික්කමා, සමතික්‍රමනයෝ දෙදෙනෙකි; අඞ්ගසමතික්කමො ච,

**තික්කමො ච ආරම්මණසමතික්කමො ච. තත්‍ථ සබ්බෙසුපි තිකචතුක්කජ්ඣානිකෙසු කම්මට්ඨානෙසු අඞ්ගසමතික්කමො හොති විතක්කවිචාරාදීනි ඣානඞ්ගානි සමතික්කමිත්‍වා තෙස්වෙවාරම්මණෙසු දුතියජ්ඣානාදීනං පත්තබ්බතො, තථා චතුබ්බ්‍රහ්මවිහාරෙ, සො පි හි මෙත්තාදීනං යෙව ආරම්මණෙ සොමනස්සං සමතික්කමිත්‍වා පත්තබ්බොති. චතූසු පන ආරුප්පෙසු ආරම්මණසමතික්කමො හොති. පුරිමෙසු හි නවසු කසිණෙසු අඤ්ඤතරං සමතික්කමිත්‍වා ආකාසානඤ්චායතනං පත්තබ්බං, ආකාසාදීනි ච සමතික්කමිත්‍වා විඤ්ඤාණඤ්චායතනාදීනි. සෙසෙසු සමතික්කමො නත්‍ථීති එවං සමතික්කමතො.**

(අ) **වඩ්ඪනාවඩ්ඪනතොති:**-ඉමෙසු චත්තාලීසාය කම්මට්ඨානෙසු දසකසිණානෙව වඩ්ඪෙතබ්බානි. යත්තකං[1] ඔකාසං කසිණෙන ඵරති

---

අඞ්ගයන්ගේ ඉක්මීමද; ආරම්මණසමතික්කමො ච, ආලම්බනයන්ගේ ඉක්මීමදැයි; ("ෙච සමතික්කමා"යි යොදනු.) තත්‍ථ, එදෙක්හි; සබ්බෙසුපි, සියලුම; තිකචතුක්කජ්ඣානිකෙසු කම්මට්ඨානෙසු, ත්‍රිකධ්‍යානිකවූ පූර්‍වබ්‍රහමවිහාරත්‍රයෙහිද චතුෂ්කධ්‍යානිකවූ ආනාපානදසකසිණ යන කමටහනුන් කෙරෙහි ද; අඞ්ගසමතික්කමො හොති, අඞ්ගයන්ගේ ඉක්මීම වේ; විතක්කවිචාරාදීනි ඣානඞ්ගානි සමතික්කමිත්‍වා, විතර්ක විචාරාදී ධ්‍යානාඞ්ගයන් ඉක්ම; තෙස්වෙවාරම්මණෙසු, ඒ අරමුණෙහිම; දුතියජ්ඣානාදීනං, ද්විතීයධ්‍යානාදීන්ගේ; පත්තබ්බතො, පැමිණියයුතු හෙයිනි; තථා චතුබ්බ්‍රහමවිහාරෙ, සතරවන බ්‍රහමවිහාරයෙහිදු එසේ මැයි; සොපි හි, ඒ සතරවන බ්‍රහමවිහාරයද; මෙත්තාදීනංයෙව ආරම්මණෙ, මෛත්‍රී ආදීන්ගේ අරමුණෙහිම; සොමනස්සං සමතික්කමිත්‍වා, සොමනස්සය ඉක්ම; පත්තබ්බො, පැමිණියයුතු; චතූසු පන ආරුප්පෙසු, සතර ආරූප්‍යයන් කෙරෙහි; ආරම්මණසමතික්කමො හොති, ආලම්බන සමතික්‍රමය වේ; පුරිමෙසු හි නවසු කසිණෙසු,(අහස් කිසුණ හැර) පළමු නවකිසුණෙහි; (සෙසු තැන අටකිසුණෙහි යයිද ඔදාතකිසුණ සෙයින්ම ආලොකකිසුණ උගුළුවා අරූපසමාපත්ති උපදවන බැවින් එහි ඇතුළු කොට "නවකසිණෙසු"යි කීහු.) අඤ්ඤතරං සමතික්කමිත්‍වා, එක්තරා කිසුණක් ඉක්ම; ආකාසානඤ්චායතනං පත්තබ්බං, ආකාසානඤ්චායතනධ්‍යානය පැමිණියයුතු; ආකාසාදීනි ච සමතික්කමිත්‍වා, ආකාශාදීන් ඉක්ම; විඤ්ඤාණඤ්චායතනාදීනි, විඤ්ඤාණඤ්චායතනාදීහු පැමිණිය යුත්තෝයි; සෙසෙසු, සෙස්සන් කෙරෙහි; සමතික්කමො නත්‍ථීති, සමතික්‍රමය නැති;-

(අ) ඉමෙසු චත්තාලීසාය කම්මට්ඨානෙසු, මේ සතලිස් කමටහනුන් කෙරෙහි; දසකසිණානෙව, දසකිසුණෝම; වඩ්ඪෙතබ්බානි, වැඩිය යුත්තාහුයි; යත්තකං ඔකාසං, යම් පමණ අවකාශයෙක්; කසිණෙන, කිසුණෙන්; ඵරති, ස්ඵරණය කෙරේද,(කිසුණපතුරුවාද යන අර්‍ථයි.)

---

1. යත්තකඤ්චි-ත්‍රි. මු.

තදබ්භනතරෙ දිබ්බාය සොතධාතුයා සද්දං සොතුං දිබ්බෙන චක්ඛුනා රූපානි පස්සිතුං පරසත්තානඤ්ච චෙතසා චිත්තමඤ්ඤාතුං සමත්ථො හොති. කායගතාසති පන අසුභානි ච න වඩ්ඪේතබ්බානි. කස්මා? ඔකාසෙන පරිච්ඡින්නත්තා ආනිසංසාභාවා ච. සා ච තෙසං ඔකාසෙන පරිච්ඡින්නත්තා භාවනානයෙ ආවිභවිස්සති. තෙසු පන වඩ්ඪිතෙසු කුණපරාසියෙව වඩ්ඪති, න කොචි ආනිසංසො අත්ථි, වුත්තම්පි චෙතං සොපාකපඤ්හව්‍යාකරණෙ "විභූතා භගවා රූපසඤ්ඤා අවිභූතා අට්ඨික සඤ්ඤා"ති. තත්‍ර හි නිමිත්තවඩ්ඪනවසෙන රූපසඤ්ඤා විභූතාති වුත්තා, අට්ඨිකසඤ්ඤා අවඩ්ඪනවසෙන අවිභූතාති, යං පනෙතං කෙවලං

---

තදබ්භනතරෙ, ඒ අතුරෙහි; දිබ්බාය සොතධාතුයා සද්දං සොතුං, දිව්‍යශ්‍රොත්‍රධාතුවෙන් ශබ්දය අසන්වද; (මෙහින් කිසුණුපැතිරිතැනම මුත් සෙසු තැන හඬතොම අසයි කීවෙත්.) දිබ්බෙන චක්ඛුනා, දිව්‍ය නෙත්‍රයෙන්; රූපානි පස්සිතුං, රූපබලනුවමද; පරසත්තානඤ්ච, පර සත්ත්වයන්ගේද; චිත්තං, සිත; චෙතසා අඤ්ඤාතුඤ්ච, සිතින් දන්නටද; සමත්ථො හොති, සමර්ථ වේ; (දිවඇසින් දක්නාලද හෘදය රූපඇති සත්ත්වයාගේ චිත්තය ආදිකම්මික තෙමේ චෙතොපරිය නුවණින් පිරිසිදි නට සමර්ථවෙයි අතිකෙකුට නොවේ කිසුණු පැතිරීම චෙතොපරිය ඥාණයට ප්‍රත්‍යය වේ නුයි "පරසත්තානං.....පෙ.....සමත්ථො හොති" යි කීහු.) කායගතාසති පන, කායගතාසතියද අසුභානි ච, අශුභයෝද; න වඩ්ඪේතබ්බානි, නොවැඩිය යුත්තාහුයි; කස්මා, කුමක්හෙයින යත්? ඔකාසෙන පරිච්ඡින්නත්තා, අවකාශයෙන් පිරිසුන්හෙයිනි; (කායියාසී සභාගපරිච්ඡෙදවශයෙන්ද අසුභය හාත්පස්හි පාෂාණනිමිත්තාදීන් පිරිසුන් හෙයින්ද යන අර්ථයි.) ආනිසංසාභාවා ච, අනුසස්නුදු නැති හෙයිනි; තෙසං, ඒ කායගතාසති අශුභයන්ගේ; සාච ඔකාසෙන පරිච්ඡින්නතා, ඒ අවකාශයෙන් පිරිසුන්බවද; භාවනානයෙ ආවි භවිස්සති, භාවනානයෙහි පහළ වේ; තෙසු පන වඩ්ඪිතෙසු, ඒ කාය ගතාසති අශුභයන්වැඩූකලම, කුණපරාසියෙව වඩ්ඪති, කුණපරාශියම වඩන්නේයි; න කොචි ආනිසංසො අත්ථි, (ඔවුන් වැඩූකල්හි කුණප රාශියම වඩනාබැවින් නොවැඩුවද කාමරාගවිෂ්කම්භනයවනබැවින්) කිසිඅනුසසෙක්නැති; එතං, මේ වැඩීමෙහි ප්‍රයොජනයෙක් නැතිබව; සොපාකපඤ්හව්‍යාකරණෙ, සොපාකප්‍රශ්නව්‍යාකරණයෙහි; වුත්තම්පි ච, වදාරනලදී; භගවා, භගවත්නි; රූපසඤ්ඤා, රූපසංඥතොමෝ; විභූතා, මහත්ව වඩනාලදද; (අප්‍රමාණාලම්බනයෙහි පවත්නෙන් පරිව්‍යක්තය යන අර්ථයි.) අවිභූතා අට්ඨිකසඤ්ඤා, අස්ථිකසංඥතොමෝ අපරි ව්‍යක්තයි; තත්‍ර, එහි; නිමිත්තවඩ්ඪනවසෙන, නිමිත්තවඩනවිසින්; රූපසඤ්ඤා, රූපසංඥතොමෝ; විභූතාති වුත්තා, විභූතයයි කියනලදී; අට්ඨිකසඤ්ඤා, අස්ථිකසංඥතොමෝ; අවඩ්ඪනවසෙන, නොවඩන විසින්; අවිභූතාති, අවිභූතයයි කියනලදී; කෙවලං, සියලු; ඉමං පඨවිං,

අට්ඨිකසඤ්ඤාය අඵරිං පඨවිං ඉමන්ති වුත්තං, තං ලාභිස්ස සතො උපට්ඨානාකාරවසෙන වුත්තං. යථෙව හි ධම්මාසොකකාලෙ කරවීකසකුණො සමන්තා ආදාසභිත්තීසු අත්තනො ඡායං දිස්වා සබ්බදිසාසු කරවීකසඤ්ඤී හුත්වා මධුරං ගිරං නිච්ඡාරෙසි, එවං ථෙරොපි අට්ඨිකසඤ්ඤාය ලාභිත්තා සබ්බාදිසාසු උපට්ඨිතං නිමිත්තං පස්සන්තො කෙවලාපි පඨවී අට්ඨිකභරිතාති චින්තෙසීති. යදි එවං යා අසුභජ්ඣානානං අප්පමාණාරම්මණතා වුත්තා සා විරුජ්ඣතීති? සා ච න විරුජ්ඣති, එකච්චො හි උද්ධුමාතකෙ වා අට්ඨිකෙ වා මහන්තෙ නිමිත්තං ගණ්හාති, එකච්චො අප්පකෙ, ඉමිනා පරියායෙන එකච්චස්ස පරිත්තාරම්මණං ඣානං හොති, එකච්චස්ස අප්පමාණාරම්මණන්ති. යො වා

---

මේ පෘථිවිය; අට්ඨිකසඤ්ඤාය අඵරින්ති, අස්ථිසංඥාවෙන් ස්ඵරනය කෙළෙමියි; යං පනෙතං වුත්තං, (යි යොදනු.) යම් මේ වචනයෙක් කියනලදද; තං, ඒ වචනය; ලාභිස්සසතො, ලාභිවූවහට; උපට්ඨානාකාරවසෙන වුත්තං, (බැලූබැලූඅත පෙනෙනබැවින්) වැටහෙන ආකාරවශයෙන් කියනලද; (නිමිත්තවඩ්ඪනවශයෙන් නොපැණේ යන අභිප්‍රායයි.) යථෙව හි, යම්සේ; ධම්මාසොකකාලෙ, ධර්මාශොකරජහුකාලයෙහි; කරවීකසකුණො, කරවීකසකුණයෙක්; සමන්තා, හාත්පසින්; ආදාසභිත්තීසු, ආදශී භිත්තියෙහි; අත්තනො ඡායං දිස්වා, තමාගේ ඡායාව දැක; සබ්බදිසාසු, සියලුදික්හි; කරවීකසඤ්ඤී හුත්වා කරවීකය යන සංඥාඇතිව; මධුරං ගිරං නිච්ඡාරෙසි, මධුර ශබ්දය පැවැත්වීද; ඒවං, එපරිද්දෙන්ම; ථෙරොපි, තෙරහුද; අට්ඨිකසඤ්ඤාය ලාභිත්තා, අස්ථිකසංඥාවසාතිශයලදබව හෙයින්; (උත්කෘෂ්ට වශීභාවඇති හෙයින යන අදහසි.) සබ්බදිසාසු, සියලුදිග; උපට්ඨිතං නිමිත්තං පස්සන්තො, වැටහුණු නිමිත්ත බලන්නේ; කෙවලාපි පඨවී, සියලු පොළෝ තොමෝ, අට්ඨිකභරිතාති චින්තෙසි, ඇටින්පිරුනහයි සිතූහු; (තෙරහු උත්කෘෂ්ටභාවයට පැමිණිහෙයින් අශ්වමණ්ඩලයෙහි අශ්වයෙකු මෙහෙයන්නෙකු මෙන් හුන්තැන සිටිතැන ධ්‍යානයට සමවදනාහ. එහෙයින්ම තෙරුන්ට නිමිත්තය වඩනලද්දසේ වැටහිණි.) යදි එවං, ඉදින් එසේවීනම්; අසුභනිමිත්තය නොවඩීනම් යනු භාවයි.) අසුභජ්ඣානානං, අශුභධ්‍යානයන්ගේ; යා අප්පමාණාරම්මණතා, යම් අප්‍රමණාරම්මණබවක්; වුත්තා, (දම්සඟුණෙහි) කියනලදද; සා විරුජ්ඣතීති, හෝ විරෙධවෙයි සෙත්; සා ච න විරුජ්ඣති, හෝ ද විරෙධ නො වේ; එකච්චො හි, සමහරකෙනෙක්; මහන්තෙ, මහත්වූ; උද්ධුමාතකෙ වා, උද්ධුමාතකඅසුභයෙහි වත්; අට්ඨිකෙ වා, ඇටෙකවත්; නිමිත්තං ගණ්හාති, නිමිති ගනී; (සියලුසිරුරෙහි හෝ නිමිත්තගනීය යන අදහසි.) එකච්චො, එකෙක්; අප්පකෙ, (ශරීරයෙහි) එකදෙශයෙක; (ක්ෂුද්‍රදරක ශරීරයෙහි හෝ නිමිත්තයගනී;) ඉමිනා පරියායෙන, මේ පර්‍ය්‍යායෙන්; එකච්චස්ස, එකක්හුගේ; පරිත්තාරම්මණං ඣානං හොති, පරිත්තාලම්බනධ්‍යානය වෙයි; එකච්චස්ස, එකක්හුගේ; අප්පමාණාරම්මණන්ති, අප්‍රමාණාලම්බනධ්‍යානය වෙයි; යො වා;

එතං වඩ්ඪන්තෙ ආදීනවං අපස්සන්තා වඩ්ඪෙන්ති, තං සන්ධාය අප්පමාණාරම්මණතා වුත්තං. ආනිසංසාභාවා පන න වඩ්ඪෙතබ්බානීති. යථා ච එතානි, එවං සෙසානිපි නවඩ්ඪෙතබ්බානි. කස්මා? තෙසු හි ආනාපානනිමිත්තං තාව වඩ්ඪයතො වාතරාසියෙව වඩ්ඪති, ඔකාසෙන ච පරිච්ඡින්නං.

(අ) ඉති සාදීනවත්තා ඔකාසෙනච පරිච්ඡින්නත්තා න වඩ්ඪෙතබ්බං බ්‍රහ්මවිහාරා සත්තාරම්මණා, තෙසං නිමිත්තං වඩ්ඪයතො සත්තරාසියෙව වඩ්ඪෙය්‍ය, නච තෙන අත්ථො අත්ථි. තස්මා තම්පි න වඩ්ඪෙතබ්බං. යං පන වුත්තං "මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා"ති. ආදි, තං පරිග්ගහවසෙන වුත්තං, එකආවාස ද්විආවාසාදිනාහි අනුක්කමෙන එකිස්සා දිසාය සත්තෙ පරිග්ගහෙත්වා භාවෙන්තො

---

යමෙක් හෝ; එතං, මේඅසුභනිමිත්තය; වඩ්ඪන්තෙ ආදීනවං අපස්සන්තා, (අසුභරාසි එව වඩ්ඪති න ච කොචි ආනිසංසො-යි කියනලද ) ආදීනව නොදක්නෝ; වඩ්ඪෙන්ති, වඩාද; තං සන්ධාය, උහුසඳහා; අප්පමාණාරම්මණතා වුත්තං, අප්‍රමාණාලම්බණයයි කියනලදී; ආනිසංසාභාවා පන, ආනිසංසයක් නැතිහෙයින්; න වඩ්ඪෙතබ්බානීති, නොවැඩියයුත්තාහුයි; යථා ච එතානි, යම්හෙයකින් කායගතාසති දසඅසුභ යන මොහු නොවැඩියයුත්තාහුද; එවං, එපරිද්දෙන්ම; සෙසානිපි, සෙස්සෝද; න වඩ්ඪෙතබ්බානි, නො වැඩියයුත්තාහු යි; කස්මා, කුමක්හෙයිනයත්? තෙසුහි,ඔවුන් කෙරෙන්;ආනාපානනිමිත්තං තාව, ආනාපාන නිමිත්තය; වඩ්ඪයතො, වඩනුවහට; වාතරාසියෙව වඩ්ඪති, වාතරාසියම වඩී; (පිචුපිණ්ඩාදි වශයෙන් වැටහෙන්නාවූ නිමිත්තය වාතසඞ්ඛාත සන්නිශ්‍රය නුයි "වාතරාසියෙව වඩ්ඪති" යි කීහු.) ඔකාසෙන ච පරිච්ඡින්නං; නාසිකාග්‍රයඋත්තරොෂ්ඨය යන අවකාශයෙන් පිරිසිඳුනාලදී;

(අ) ඉති, මෙසේ; සාදීනවත්තා, ආදීනවඇතිබැවින්ද; ඔකාසෙන ච පරිච්ඡින්නත්තා, අවකාශයෙන් පරිච්ඡින්නහෙයින්ද; න වඩ්ඪෙතබ්බං, නො වැඩියයුතු; බ්‍රහ්මවිහාරා, සතරබ්‍රහ්මවිහාරයෝ; සත්තාරම්මණා, සත්වයන් අරමුණුකොට ඇත්තාහ; තෙසං, ඒ බ්‍රහ්මයාගේ; නිමිත්තං වඩ්ඪයතො, අරමුණුවඩනුවහට; සත්තරාසියෙව වඩ්ඪෙය්‍ය, සත්වරාශියම වැඩෙන්නේය; න ච තෙන අත්ථො අත්ථි, ඒ සත්වරාශිය වැඩීමෙන් (පෘථිවිකසුණු ආදිය වැඩීමෙහි මෙන්) කිසි ප්‍රයෝජනයෙක් නැති; තස්මා, එහෙයින්; තම්පි, ඒ සත්වාලම්බණයද; න වඩ්ඪෙතබ්බං, නොවැඩිය යුතු; මෙත්තාසහගතෙන චෙතසා, මෛත්‍රීන්යුක්ත චිත්තයෙන්; එකං දිසං ඵරිත්වාති ආදී; එක්දිගක් පතුරුවාය යනාදී; යං පන වුත්තං, (යි යොදනු.) යමෙක්වනාහි කියනලද්ද; තං, හේ; පරිග්ගහවසෙන වුත්තං, අපරිගෘහීතභාවනාවිෂයාගේ පරිග්‍රහවශයෙන් කියනලදී; එකආවාස ද්විආවාසාදිනාහි, එක් අවසෙක දෙඅවසෙක යනාදීන්; අනුක්කමෙන, පිළිවෙළින්; එකිස්සා දිසාය සත්තෙ පරිග්ගහෙත්වා, එක්දිගක සතුන් පරිග්‍රහකොට; භාවෙන්තො, වඩන්නේ

එකං දිසං ඵරිත්වාති වුත්තත්තා. න නිමිත්තං වඩ්ඪෙන්තා. පටිභාගනිමිත්තමෙව වෙත්ථ නත්ථි, යදයං වඩ්ඪෙය්‍ය, පරිත්ත අප්පමාණාරම්මණතා පෙත්ථ පරිග්ගහවසෙනෙව වෙදිතබ්බා. ආරුප්පාරම්මණෙසුපි ආකාසං කසිණුග්ඝාටිමත්තත්තා තං හි කසිණාපගමවසෙනෙව මනසිකාතබ්බං. තතො පරං වඩ්ඪයතොපි න කිඤ්චි හොති. විඤ්ඤාණං සභාවධම්මත්තා, න හි සක්කා සභාවධම්මං වඩ්ඪෙතුං. විඤ්ඤාණාපගමො විඤ්ඤාණස්ස අභාවමත්තත්තා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනාරම්මණං සභාවධම්මත්තායෙව නවඩ්ඪෙතබ්බං, සෙසානි අනිමිත්තත්තා,

---

එකං දිසං ඵරිත්වාති වුත්තත්තා, එක්දිගක් ස්ඵරණයකොට යයි කියනලද; න නිමිත්තං වඩ්ඪෙන්තා, නිමිත්තය වඩනු වේ නොවේ; එත්ථ, මේ බ්‍රහ්මවිහාරභාවනාවෙහි, පටිභාගනිමිත්තමෙව නත්ථි, ප්‍රතිභාගනිමිත්තයම නැති; යදයං වඩ්ඪෙය්‍ය, යම් ප්‍රතිභාගනිමිත්තයක් මේ යොගීවඩාද, (තං පටිභාගනිමිත්තමෙව නත්ථි-යි යොදනු.) එත්ථ, මෙහි; පරිත්තඅප්පමාණාරම්මණතාපි, පරිත්තාලම්බන අප්‍රමාණාලම්බනබවද, පරිග්ගහවසෙනෙව; අල්පානල්පපරිග්‍රහවශයෙන්ම; වෙදිතබ්බා, දතයුතු; (කතිපයසත්ත්වයන්ගේ පරිග්‍රහවශයෙන් ප්‍රවෘත්ත වූයේ පරිත්තාරම්මණ වෙයි බොහෝ සත්ත්වයන්ගේ පරිග්‍රහවශයෙන් ප්‍රවෘත්තවූයේ අප්‍රමාණාලම්බන වෙයි යන අර්ථයි.) ආරුප්පාරම්මණෙසුපි, අරූපාලම්බනයන් කෙරෙහිද; ආකාසං, ආකාශය; කසිණුග්ඝාටිමත්තත්තා කිසුණුඉගිළිවූතැන බැවින්; (නවඩ්ඪෙතබ්බං-යි යොදනු.) තං හි, ඒ ආකාශය, කසිණාපගමවසෙනෙව, කසිණයාගේ අපගමවශයෙන්ම; මනසිකාතබ්බං, (පරිච්ඡෙදාකාසකසිණය පරිච්ඡෙදවශයෙන්) මෙනෙහිකරනුලැබෙයි; (කිසුණ ඉගුළු අහස අහස් සෙයින්ම මෙනෙහි කරනුලැබෙයි මෙසේබැවින් "කසිණාපගමවසෙන" යී කීහු.) තතො පරං, එයින්මත්තෙහි; වඩ්ඪයතොපි, වඩනුවහට; න කිඤ්චි හොති, කිසිවෙක් නොවේ; (වඩනේ නොවෙයි යන අර්ථයි.) විඤ්ඤාණං, විඤ්ඤාණය; සභාවධම්මත්තා, ස්වභාව ධර්මහෙයින් (නො වැඩියයුතු); න හි සක්කා සභාවධම්මං වඩ්ඪෙතුං, පරිකල්පිතඅරමුණමවඩන්නට පිළිවන්බැවින් ස්වභාධර්මවඩනුවට නොමපිළිවනි; විඤ්ඤාණාපගමො, විඤ්ඤාණයාගේ අපගමය; විඤ්ඤාණස්ස අභාවමත්තත්තා, විඤ්ඤාණයාගේ අභාවමාත්‍රයක් හෙයින් (නො වැඩියයුතු); නෙවසඤ්ඤා නාසඤ්ඤායතනාරම්මණං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනාලම්බනය; සභාවධම්මත්තායෙව, ස්වභාවධර්මහෙයින්ම; න වඩ්ඪෙතබ්බං, නො වැඩියයුතු; ආරූප්‍යයන්ගේ පරිත්තාරම්මණ අප්‍රමාණාලම්බනතාව පරිත්ත කිසුණු ඉගුළු අහස්හිද විපුලකිසුණු ඉගිළිවූ අහස්හිද ප්‍රවෘත්තීන් දතයුතු.) සෙසානි, සෙසු බුද්ධානුස්සති ආදිවූ දසකම්ටහන්හු; අනිමිත්තත්තා, ප්‍රතිභාගනිමිත්ත නැතිබැවින්; ("න වඩ්ඪෙතබ්බානි"යි යොදනු.) පටිභාගනිමිත්තං හි, ප්‍රතිභාගනිමිත්තය;වඩ්ඪෙතබ්බං නාම භවෙය්‍ය,වැඩියයුතු නම් වන්නේයි;(හි යනු-යස්මා දර්ථයි.) බුද්ධානුස්සති

පටිභාගනිමිත්තං හි වඩ්ඪෙතබ්බං නාම භවෙය්‍ය. බුද්ධානුස්සති ආදීනඤ්ච නෙව පටිභාගනිමිත්තං ආරම්මණං හොති තස්මා තං න වඩ්ඪෙතබ්බන්ති එවං වඩ්ඪනාවඩ්ඪනතො.

(ඇ) **ආරම්මණතොති**:–ඉමෙසු ච චත්තාලීසාය කම්මට්ඨානෙසු දස කසිණා දසඅසුභා ආනාපානසති කායගතාසතීති ඉමානි ද්වාවීසති පටිභාගනිමිත්තාරම්මණානි, සෙසානි න පටිභාගනිමිත්තාරම්මණානි, තථා දසසු අනුස්සතීසු ඨපෙත්වා ආනාපානසතිඤ්ච කායගතාසතිඤ්ච අවසෙසා අට්ඨඅනුස්සතියො ආහාරෙ පටිකූලසඤ්ඤා චතුධාතු වවත්ථානං විඤ්ඤාණඤ්චායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති ඉමානි ද්වාදස සභාවධම්මාරම්මණානි, දසකසිණා දසඅසුභා ආනාපාන සති කායගතාසතීති ඉමානි ද්වාවීසති නිමිත්තාරම්මණානි, සෙසානි ඡ නවත්තබ්බාරම්මණානීති, තථා විපුබ්බකං ලොහිතකං පුළුවකං ආනාපානසති ආපොකසිණං තෙජොකසිණං වායොකසිණං යඤ්චආලොක

---

සතිආදීනඤ්ච, බුද්ධානුස්සති ආදීන්ට වනාහි; නෙව පටිභාගනිමිත්තං ආරම්මණං හොති, පටිභාගනිමිත්තයෙක් නොමඅරමුණු වේ; තස්මා, එහෙයින්; තං හේ බුද්ධානුස්සති ආදි කමටහන; න වඩ්ඪෙතබ්බං, නො වැඩියයුතු;–

(ඇ) ඉමෙසු ච චත්තාලීසාය කම්මට්ඨානෙසු, මේ සතළිස් කමටහනුන් කෙරෙහි; දසකසිණා, දසකසිණයහ; දසඅසුභා, දශඅශුභයහ; ආනාපානසති; ආනාපානසමෘතිය; කායගතාසතීති, කායගතාසමෘතියයි; ඉමානි ද්වාවීසති, මොහු දෙවිස්ස; පටිභාගනිමිත්තාරම්මණානි, ප්‍රතිභාගනිමිත්තවූ අරමුණෝයි; සෙසානි, සෙසු අටළොස; න පටිභාගනිමිත්තාරම්මණානි, ප්‍රතිභාගනිමිත්ත නොවූ අරමුණෝයි; තථා, එසේම; දසසු, අනුස්සතිසු, දශානුසමෘතීන් කෙරෙහි; ආනාපානසතිඤ්ච, ආනාපාන සමෘතිය ද; කායගතාසතිඤ්ච, කායගතා සමෘතිය ද; ඨපෙත්වා, තබා, අවසෙසා අට්ඨඅනුස්සතියො, සෙසු අට අනුසමෘතීහු ද; ආහාරෙ පටිකූලසඤ්ඤා, අහර පිළිකුල් සංඥාව ද; චතුධාතු වවත්ථානං, චතුර්ධාතු ව්‍යවස්ථාව ද; විඤ්ඤාණඤ්චායතනං, විඤ්ඤාණඤ්චායතනය ද; නෙව සඤ්ඤානාසඤ්ඤායතනන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයද යන; ඉමානි ද්වාදස, මොහු දොළොස්දෙන; සභාවධම්මාරම්මණානි; ස්වභාව ධර්මවූ අරමුණහ; දසකසිණා, දසකිසුණහ; දසඅසුභා, දසඅසුභයහ; ආනාපානසති, ආනාපානසමෘතිය; කායගතාසතීති, කායගතාසමෘති යයි; ඉමානි ද්වාවීසති, මොහු දෙවිස්ස; නිමිත්තාරම්මණානි, ප්‍රතිභාග නිමිත්තවූ අරමුණෝයි; සෙසානි ඡ, සතරබ්‍රහ්මවිහාරයහ ආකාශානන්ත්‍යායතනය විඥානානන්ත්‍යායතනය යන මේ සදෙන; න වත්තබ්බාරම්මණානි, ප්‍රඥප්තිවූ අරමුණෝයි; තථා, එසේම; විපුබ්බකං, පූයා වැහෙන අසුභය; ලොහිතකං, හෙනලේඇති අසුභය; පුළුවකං, කෘමීන් වැහෙන අසුභය; ආනාපානසති, ආනාපානසමෘතියය; අපොසිකසිණං, ආපොකිසුණුය; තෙජොකසිණං, තෙජොකිසුණුය; වායොකසිණං

කසිණෙසු සූරියාදීනං ඔභාසමණ්ඩලාරම්මණං ඉමානි අට්ඨ චලිතාරම්මණානි, තානි ච ඛො පුබ්බභාගෙ. පටිභාගං පන සන්නිසින්නමෙව හොති. සෙසානි අචලිතාරම්මණානීති එවං ආරම්මණතො. භූමිතොති:-එත්ථ ච දසඅසුභා කායගතාසති ආහාරෙපටික්කූලසඤ්ඤාති ඉමානි ද්වාදස දෙවෙසු නප්පවත්තන්ති. තානි ද්වාදස ආනාපානසතිචාති ඉමානි තෙරස බ්‍රහ්මලොකෙ නප්පවත්තන්ති අරූපභවෙ පන ඨපෙත්වා චත්තාරො ආරුප්පෙ අඤ්ඤං නප්පවත්තති. මනුස්සෙසු සබ්බානිපි පවත්තන්තීති - එවං භූමිතො.

(අ) ගහණතොති -දිට්ඨඵුට්ඨසුතගහණතොපෙත්ථ විනිච්ඡයො වෙදිතබ්බො. තත්‍ර ඨපෙත්වා වායොකසිණං සෙසා නවකසිණා දසඅසුභානි

---

වායොකසිණය; ආලොක කසිණෙසු, ආලොක කසිණයන් කෙරෙහි; සූරියාදීනං, සූර්‍ය්‍යාදීන්ගේ; යඤ්ච ඔභාසමණ්ඩලාරම්මණං,[1] යම් අවභාසමණ්ඩලසඞ්ඛ්‍යාතවූ අරමුණෙක් ඇද්ද; ඉමානි අට්ඨ, මොහු අටදෙන; චලිතාරම්මණානි, සැලෙනඅරමුණෝයි; (මිහි වැහෙන පූයඇතිබැවින් විපුබ්බකයද වැහෙනලෙහෙඇති හෙයින් ලොහිතකයද කෘමීන් සැලෙනහෙයින් පුළුවකය ද චලිතාලම්බනයයි කියනලදහ-වාත පාණවජ්‍රාදීන් අන්තඃප්‍රවිෂ්ටවූ සූර්‍ය්‍යාලොකාදීහු ගේ චලනාකාරය පැනෙනහෙයින්-අවභාෂමණ්ඩලාලම්බනය චලිතාලම්බනයයි කියන ලදී. සෙස්සවුන්ගේ චලිතබව ප්‍රකටමැයි.) තානි ච ඛො, ඔහුද; පුබ්බභාගෙ, ප්‍රතිභාගනිමිත්තොත්පත්තියට පූර්වභාගයෙහිම චලිතාලම්බන නම් වෙයි; පටිභාගං පන, ප්‍රතිභාගය වනාහි; සන්නිසින්නමෙව හොති, සන්හුන්නේම වේ; (නිශ්චල වේ යන අර්ථයි.) සෙසානි, සෙස්සෝ; අචලිතාරම්මණානි, අචලිතාලම්බන වෙත්;-දසඅසුභා, දසඅසුභයන; කායගතාසති, කායගතාස්මෘතිය; ආහාරෙ පටික්කූලසඤ්ඤාති, අහරපිළිකුල් සංඥය යන; ඉමානි ද්වාදස, මොහු දොළොස්දෙන; දෙවෙසු, කාමාවචරදෙව්ලොව; නප්පවත්තන්ති, (අසුභයනුදු ප්‍රතිකූලාහාරයදු ඉහි නැතිබැවින්) නොපවතිත්; තානි ද්වාදස, මොහු දොළසද; ආනාපානසතිචාති, (බඹලොව ආශ්වාසප්‍රශ්වාස නැතිබැවින්) ආනාපාන සතියද යන; ඉමානි තෙරස, මොහු තෙළෙස්දෙන; බ්‍රහ්මලොකෙ නප්පවත්තන්ති, බඹලොව නොපවතිත්; අරූපභවෙ පන, අරූපභවයෙහි වනාහි; ඨපෙත්වා චත්තාරො ආරුප්පෙ, සතරආරූප්‍යයන් තබා; අඤ්ඤං නප්පවත්තති, අනිකෙක් නොපවතී; මනුස්සෙසු, මිනිස්ලොව; සබ්බානිපි පවත්තන්තීති, සැමදෙනම පවත්නාහුයි;—

(අ) "ගහණතො" යන්නෙහි; දිට්ඨඵුට්ඨසුතගහණතොපි, දෘෂ්ටව්‍යයෙන් ස්පෘෂ්ටව්‍යයෙන් ශ්‍රැතයෙන් ගැනුම්හෙයිනුදු; එත්ථ, මෙහි; විනිච්ඡයො වෙදිතබ්බො, විනිශ්චය දතයුතු; තත්‍ර, එහි; ඨපෙත්වා වායොකසිණං, වායුකසිණ තබා; සෙසා නවකසිණා, සෙසු නවකසිණයෝද; දසඅසුභානි, දසඅසුභයොදුයි යන; ඉමානි එකූනවීසති, මොහු

---

1. මණ්ඩලාදීනං ආරම්මණං—සාඵවි.

ඉමානි එකූනවීසති දිට්ඨෙන ගහෙතබ්බානි. පුබ්බභාගෙ චක්ඛුනා ඔලොකෙත්වා ඔලොකෙත්වා නිමිත්තං තෙසං ගහෙතබ්බන්ති අත්ථො. කායගතාසතියං තචපඤ්චකං දිට්ඨෙන, සෙසං සුතෙනාති එවං තස්සා ආරම්මණං දිට්ඨසුතෙන ගහෙතබ්බං, ආනාපානසති ඵුට්ඨෙන; වායොකසිණං දිට්ඨඵුට්ඨෙන, සෙසානි අට්ඨාරස සුතෙන ගහෙතබ්බානි, උපෙක්ඛාබ්‍රහ්මවිහාරො චත්තාරො ආරුප්පාති ඉමානෙත්ථ න ආදිකම්මිකෙන ගහෙතබ්බානි, සෙසානි පඤ්චතිංස ගහෙතබ්බානීති එවං ගහණතො. **පච්චයතොති**:-ඉමෙසු පන කම්මට්ඨානෙසු ඨපෙත්වා ආකාසකසිණං සෙසා නවකසිණා ආරුප්පානං පච්චයා හොන්ති, දසපි කසිණා අභිඤ්ඤානං, තයොපි බ්‍රහ්මවිහාරා චතුත්ථබ්‍රහ්මවිහාරස්ස, හෙට්ඨිමං හෙට්ඨිමං ආරුප්පං උපරිමස්ස උපරිමස්ස, නෙවසඤ්ඤා

---

එකුන්විසිදෙන; දිට්ඨෙන ගහෙතබ්බානි, දෘෂ්ටවූවස්තුව කරණකොට ගෙන උගතයුත්තාහුයි; (උද්ග්‍රහනිමිත්තයෝ ඉපදවියයුත්තාහ යන අර්ථයි.) පුබ්බභාගෙ, පූර්වභාගයෙහි; චක්ඛුනා ඔලොකෙත්වා ඔලොකෙත්වා, ඇසින් බලබලා; තෙසං, ඒ කසුණුආදීන්ගේ; නිමිත්තං, උද්ග්‍රහනිමිත්ත; ගහෙතබ්බන්ති අත්ථො, ගතයුතුය යන අර්ථයි; කායගතාසතියං, කායගතාසතියෙහි; තචපඤ්චකං, ත්වක්පඤ්චකය; දිට්ඨෙන, දෘෂ්ටවස්තුවෙන්ද; සෙසං, සෙස්ස, සුතෙනාති, ශ්‍රැතවස්තුවෙන්දැයි; එවං, මෙසේ; තස්සාරම්මණං, ඒ කායගතාසතිඅරමුණ; දිට්ඨසුතෙන ගහෙතබ්බං, දෘෂ්ටශ්‍රැතදෙකින් ගතයුතු; ආනාපානසති, ආනාපානසතිකම්මටහන; ඵුට්ඨෙන, පහළකැන්විසින්, වායොකසිණං, වායුකසුණ; දිට්ඨඵුට්ඨෙන, දක්නාලද පහරනලදවස්තුවෙන්; (ඉක්ෂු සශ්‍යාදීන්ගේ පත්‍රයෙහි චලමානවර්ණෝද්ග්‍රහණමුඛයෙන් වාතග්‍රාහ්‍ය බැවින් දිට්ඨඵුට්ඨෙන යුහු.) සෙසානි අට්ඨාරස, සෙසු අටළොස; සුතෙන ගහෙතබ්බානි, ශ්‍රැතයෙන් ගතයුත්තාහුයි; උපෙක්ඛාබ්‍රහ්මවිහාරො, උපෙක්ෂාබ්‍රහ්මවිහාරයද; චත්තාරො ආරුප්පාති, සතරආරූප්‍යයෝද යන; ඉමානි, මොහු; එත්ථ, මෙකමටහනුන් කෙරෙහි; ආදිකම්මිකෙන නගහෙතබ්බානි, (යට තුන්බ්‍රහ්මවිහාරයටද කසුණෙහි රූපාවචර චතුර්ථධ්‍යානයටද නොපැමිණ නොඉපදවියහැකි හෙයින්) ආදිකර්මිකයාවිසින් භාවනාරම්භවශයෙන් ගතයුත්තාහු නොවෙත්; සෙසානි පඤ්චතිංස, සෙසු පන්තිස; ගහෙතබ්බානි, ගතයුත්තාහුයි, ‘පච්චයතො’ යන්නෙහි; ඉමෙසු පන කම්මට්ඨානෙසු, මේ කමටහනුන් කෙරෙහි; (කම්මට්ඨාන ශබ්දයෙන් යථාභීයෙන් ආලම්බනයනුදු ධ්‍යානයනුදු ගතහතු ) ඨපෙත්වා ආකාසකසිණං, නොඉගිළවියහැකි බැවින් අහස්කසුණ තබා, සෙසා නවකසිණා, සෙසු නවකසුණයෝ; ආරුප්පානං පච්චයා හොන්ති, ආරූප්‍යයන්ට ප්‍රත්‍යය වෙත්; දසපි කසිණා, දසකසුණෝම; අභිඤ්ඤානං, අභිඥවන්ට ප්‍රත්‍යයෝ වෙත්; තයොපි බ්‍රහ්මවිහාරා, පළමු තුන්බ්‍රහ්මවිහාරයෝ; චතුත්ථබ්‍රහ්මවිහාරස්ස, සතරවන බ්‍රහ්මවිහාරයට (පසවෙත්); හෙට්ඨිමං හෙට්ඨිමං ආරුප්පං

නාසඤ්ඤායතනං නිරොධසමාපත්තියං, සබ්බානි පි සුඛවිහාර විපස්සනා භවසම්පත්තීනන්ති එවං පච්චයතො. **චරියානුකූලතො** ති:–චරියානං අනුකූල තොපෙත්ථ විනිච්ඡයො වෙදිතබ්බො. සෙය්‍යථිදං? රාගචරිතස්ස තාව එත්ථ දස අසුභා කායගතාසතී ති එකාදස කම්මට්ඨානානි අනුකූලානි, දොසචරිතස්ස චත්තාරො බ්‍රහ්මවිහාරා චත්තාරි වණ්ණකසිණානීති අට්ඨ, මොහචරිතස්ස විතක්කචරිතස්සච එකං ආනාපානසති කම්මට්ඨානමෙව; සද්ධාචරිතස්ස ඡ පුරිමා අනුස්සතියො, බුද්ධිචරිතස්ස මරණසති උපසමානුස්සති චතුධාතුවවත්ථානං ආහාරෙ පටික්කූල සඤ්ඤාති චත්තාරි, සෙසකසිණානි චත්තාරො ච පන ආරුප්පා සබ්බචරිතානං අනුකූලානි, කසිණෙසු ච යං කිඤ්චි පරිත්තං විතක්ක චරිතස්ස, අප්පමාණං මොහචරිතස්සාති එවමෙත්ථචරියානුකූලතො විනිච්ඡයො වෙදිතබ්බොති.

---

යට යට අරූපාවචරය; උපරිමස්ස උපරිමස්ස, මතු මතු අරූපාවචරයට (පසුවේ);නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය; නිරොධසමාපත්තියං, නිරොධසමාපත්තියට (පසුවේ); සබ්බානිපි, සියලුම; සුඛවිහාර, දෘෂ්ටධර්මසුඛවිහාරයෝ; විපස්සනා, විදර්ශනාය; භවසම්පත්තීනං, භවසම්පත්තිය යන මොවුන්ට (ප්‍රත්‍යයවෙති යි);එවං, මෙසේ; පච්චයතො, ප්‍රත්‍යයහෙයින්; (විනිශ්චය දතයුතු.) ‘චරියානු කූලතො– යන්නෙහි; චරියානං අනුකූලතොපි, චරිතයන්ට අනුකූල හෙයිනුදු; එත්ථ, මේ කමටහනුන් කෙරෙහි; විනිච්ඡයො වෙදිතබ්බො, විනිශ්චය දතයුත්තේයි; සෙය්‍යථිදං, හේ කෙසේද; එත්ථ, ඒ රාගාදි චරිතයන්කෙරෙහි; රාගචරිතස්ස, රාගචරිතයහට; දසඅසුභා, දසඅසුභයහ; කායගතාසතීති, කායගතාසතිය යන; එකාදසකම්මට්ඨානානි, එකොළොස්කමටහන්හු;අනුකූලානි (රාගවිෂ්කම්භනයට උපායබැවින්) අනුකූලයෝයි; දොසචරිතස්ස, ද්වෙෂචරිතයහට; චත්තාරො බ්‍රහ්ම විහාරා, සතරබ්‍රහ්මවිහාරයහ; චත්තාරි වණ්ණකසිණානි. සතරවර්ණ කිසුණහ යන;අට්ඨ,අටදෙන;(අනුකූලානි-යි යොදනු.)මොහචරිතස්ස, මොහචරිතයහටද; විතක්කචරිතස්ස ච, විතර්කචරිතයහටද; එකං, එකම; ආනාපානසතිකම්මට්ඨානමෙව, ආනාපානසති කමටහනම; (අනුකූලං-යි යොදනු.) සද්ධාචරිතස්ස, ශ්‍රද්ධාචරිතයාහට; පුරිමා ඡ අනුස්සතියො; පළමුවූ බුද්ධානුස්සති ධම්ම සඞ්ඝ සීල චාග දෙවතානුස්ස තිය යන අනුස්මෘතිහු සදෙන; (අනුකූලානි යි යොදනු. මතුයෙහිදු මෙම නියේ අනුකූලයෝයි )බුද්ධිචරිතස්ස, බුද්ධිචරිතයහට; මරණසති, මරණසිහිය, උපසමානුස්සති, උපසමසිහිය; චතුධාතුවවත්ථානං, සතර ධාතුන්ගේ ව්‍යවස්ථාය; ආහාරෙ පටික්කූලසඤ්ඤාති, අහරපිළිකුල් සංඥය යන; චත්තාරි, සතරදෙන; (අනුකූලයෝයි.) සෙසකසිණා, වර්ණකිසුණු හැර සෙසුකිසුණහ; චත්තාරො ච පන ආරුප්පා, සතර ආරූප්‍යයහයන මොහු; සබ්බචරිතානං අනුකූලානි, සියලු චරිතයන්ට අනුකූලයෝයි; කසිණෙසු ච, කිසුණෙහිදු; පරිත්තං “සුප්පමත්තං සරාව

(අ) සබ්බඤ්චෙතං උජුවිපච්චනීකවසෙන ච අතිසප්පායවසෙන ච වුත්තං. රාගාදීනං පන අවික්ඛම්භිකා[1] සද්ධාදීනං වා අනුපකාරා කුසල භාවනා නාම නත්ථි. වුත්තම්පි චෙතං මෙඝියසුත්තෙ– "චත්තාරො ධම්මා උත්තරිං භාවෙතබ්බා. අසුභා භාවෙතබ්බා රාගස්ස පහානාය. මෙත්තා භාවෙතබ්බා ව්‍යාපාදස්ස පහානාය, ආනාපානසති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදාය, අනිච්චසඤ්ඤා භාවෙතබ්බා අස්මිමාන සමුග්ඝාතායා"ති. රාහුලසුත්තෙපි–"මෙත්තං රාහුල භාවනං භාවෙහී"ති. ආදිනා නයෙන එකස්සෙව සත්ත කම්මට්ඨානානි වුත්තානි. තස්මා වචනමත්තෙ අභිනිවෙසං අකත්වා සබ්බත්ථ අධිප්පායො පරියෙසිතබ්බොති. අයං කම්මට්ඨානං ගණ්හිත්වාති එත්ථ කම්මට්ඨානකථා විනිච්ඡයො.

---

මත්තං"යි කියනලද; යංකිඤ්චි, යම්කිසිවෙකුදු; විතක්කචරිතස්ස, විතර්කචරිතයහට (අනුකූලය);අප්පමාණං,එයින්වැඩි පමණ ඇත්තේ; මොහචරිතස්සාති, මොහචරිතයහට සැපයි; එවං, මෙසේ;එත්ථ,මෙහි; චරියානුකූලතො විනිච්ඡයො වෙදිතබ්බො, චර්‍යානුකූලහෙයින් විනිශ්චය දතයුතු.

(අ) සබ්බඤ්චෙතං, මෙ සියල්ල; උජුවිපච්චනීකවසෙන ච, සෘජු ප්‍රතිපක්‍ෂ බැවින්ද; (ඉදිවම පිළිවක් විසින යුතෑනි.) අතිසප්පායවසෙන ච, ඉතා සැපවිසින් ද; වුත්තං, කියනලදී; (රාගචරිතාදීන්ට අසුභකමටහන ආදීහු පිළිවක් විසින් කියනලදන සද්ධාචරිතආදීනට බුද්ධානුස්සති ආදිය සැපවිසින් කියනලදැයි යන අර්‍ථයි.) රාගාදීනං පන අවික්ඛම්භිකා, රාගාදිකෙලෙසුන් විච්ඡුම් නො කරන (නො ඔබන්නාවූ); සද්ධාදීනංවා, ශ්‍රද්ධාදීන්ට;අනුපකාරා, අනුපකාරවූ;කුසලභාවනා නාම නත්ථි, කුශලභාවනානම්දැයෙක් නැති; මෙඝියසුත්තෙ, මෙඝියසූත්‍රයෙහි; එතං වුත්තම්පි ච, මෙ කියනලදී; චත්තාරො ධම්මා, මෙතෙහිකට යුතුවූ සතරධර්‍මයෝ; උත්තරිං, මතුයෙහි; (සීලසම්පත්තිය කල්‍යාණ මිත්‍රත්‍වය සත්‍ප්‍රායධර්‍මශ්‍රවණය වීර්‍ය්‍ය ප්‍රඥාය යන මේ පඤ්චධර්‍මයෙහි පිහිටිවීමෙන් මත්තෙහි යන අර්‍ථයි.) භාවෙතබ්බා, වැඩියයුත්තාහුයි; අසුභා, (එකොළොස්අසුභකමටහන්හි) අසුභභාවනාතොමෝ; රාගස්ස පහානාය, රාගප්‍රහාණියපිණිස; භාවෙතබ්බා, වැඩියයුතු; මෙත්තා, (ඔධිසො අනොධිසො විසින් පවත්නා) මෛත්‍රී තොමෝ; ව්‍යාපාදස්ස පහානාය, ව්‍යාපාදප්‍රහාණියපිණිස;භාවෙතබ්බා,වැඩියයුතු; ආනාපාන සති, ෂොඩශවස්තුකවූ ආනාපානස්මෘතිතොමෝ; විතක්කුපච්ඡෙදාය, මිථ්‍යාවිතර්කයන්ගේ උපච්ඡෙදයපිණිස; භාවෙතබ්බා, වැඩියයුතු; අනිච්චසඤ්ඤා, (සර්‍වසංස්කාරයෝ අනිත්‍යහයිප්‍රවෘත්ත) අනිත්‍යානුදර්‍ශනාතොමෝ; අස්මිමානසමුග්ඝාතාය, (අස්මි–යී උපන්නාවූ) නවවිධ මානයාගේ සමුච්ඡෙදය පිණිස; භාවෙතබ්බා, වැඩියයුතු; (මෙසේ එකක්හු සතරචරිතනොවතුදු එකක්හුටම සතරකමටහන්හු වැඩිය

1. අවික්ඛම්භකා–ක.ප.ව.

(අ) **ගහෙත්වාති**.–ඉමස්ස පන පදස්ස අයං අත්ථපරිදීපනා. තේන යෝගිනා කම්මට්ඨානදායකං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වාති එත්ථ වුත්තනයේනේව වුත්තප්පකාරං කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා බුද්ධස්ස වා භගවතෝ ආචරියස්ස වා අත්තානං නිය්‍යාතෙත්වා සම්පන්නජ්ඣාසයේන සම්පන්නාධිමුත්තිනා ච හුත්වා කම්මට්ඨානං යාචිතබ්බං. තත්‍ර–“ඉමාහං භගවා අත්තභාවං තුම්හාකං පරිච්චජාමී”ති එවං බුද්ධස්ස භගවතෝ අත්තා නිය්‍යාතේතබ්බෝ, එවං හි අනිය්‍යාතෙත්වා පන්තේසු සේනාසනේසු විහරන්තෝ භේරවාරම්මණේ ආපාථ

---

යුතුවාහයි කියනලදහ. එහෙයින් සියලුකමටහන්හු සියලු කෙලෙසුන් විෂ්කම්භනයහ සියලු කුසලයන් වඩනාහ යි යනු භාවයි.) රාහුලසුත්තෙපි, රාහුලසූත්‍රයෙහිදු; මෙත්තං රාහුල භාවනං භාවෙහීති, රාහුලය මෛත්‍රීභාවනා වඩයි; ආදිනානයෙන, මේආදි නයෙන්; එකස්සෙව, එකමසත්විරයන්ට; සත්තකම්මට්ඨානානි වුත්තානි, සතර බ්‍රහ්මවිහාරය අසුභය කායගතාසතිය ආනාපානසතිය යන සත් කමටහන්හු කියනලදහ; (තෙරහුදු සජීවරිත නොවෙති යන අභිප්‍රායි.) තස්මා, එහෙයින්; වචනමත්තෙ, (අසුවල් කමටහන අසුවල් චරිතයහට අනුකූලයයි කී) වචනමාත්‍රයෙහි; අභිනිවෙසං අකත්වා, අභිනිවේශය නොකොට; සබ්බත්ථ, හැමතැනම; අධිප්පායො පරියෙසිතබ්බො, (මේ චරිතයහට මේ කමටහන අනුකූලයයි කීමෙහි) අභිප්‍රාය සෙවිය යුතු; (හේ වනාහි “සබ්බත්ථකං” යනාදීන් කථිතමැයි.) අයං, මේ; කම්මට්ඨානං ගහෙත්වාති එත්ථ, “කම්මට්ඨානං ගහෙත්වා” යන මෙහි; කම්මට්ඨානකථාවිනිච්ඡයො, කර්මස්ථානකථා විනිශ්චයයි.෴

(අ) ගහෙත්වා ති ඉමස්ස පන පදස්ස, ගහෙත්වා යන මේ පදයාගේ; අයං, මේ; අත්ථපරිදීපනා, අර්ථදීපනායි; තෙන යොගිනා, ඒ යෝගීහුවිසින්; කම්මට්ඨාන෴පෙ෴ත්වාති එත්ථ වුත්තනයෙනෙව, මෙහි කී නයින්ම; වුත්තප්පකාරං කල්‍යාණමිත්තං, “පියො ගරු භාවනීයො” යනාදීන් කියනලදප්‍රකාරඇති කලණමිතුහු කරා; උපසඞ්කමිත්වා, “අත්තනො පත්තචීවරං සයමෙව ගහෙත්වා” යනාදීන් කී නියෙන් එළැඹ; බුද්ධස්ස වා භගවතො, භගවත් බුදුන්ට හෝ; ආචරියස්ස වා, ආචාරීන්ට හෝ; අත්තානං නිය්‍යාතෙත්වා, තමා පාවාදී; (උන් වසඟකොටය යුතුැති.) සම්පන්නජ්ඣාසයෙන, සම්පන්නවූ අධ්‍යාසය ඇත්තහුවිසින්; සම්පන්නාධිමුත්තිනා ච හුත්වා, සම්පන්නවූ අධිමුක්ති ඇතියහු විසිනුදු, කම්මට්ඨානං යාචිතබ්බං; කමටහන් ඉල්ලියයුතු, තත්‍ර, එහි; භගවා, භගවත; අහං, මම; ඉමං අත්තභාවං, මේ ආත්මභාවය; තුම්හාකං, තොපට; පරිච්චජාමීති, පරිත්‍යාග කෙරෙමි යි; එවං, මෙසේ; බුද්ධස්ස භගවතො; භගවත් බුදුයහට, අත්තා නිය්‍යාතෙතබ්බො, ආත්මය නියර්‍යාතනය කටයුතු; එවං හි අනිය්‍යාතෙත්වා, මෙසේ නියර්‍යාතනය නොකොට; පන්තෙසු සෙනාසනෙසු විහරන්තො, ගැඹුරු වල්සෙනස්නෙහි වසන්නේ; භෙරවාරම්මණෙ ආපාථමාගතෙ,

මාගතෙ සඤ්ඡිතුං අසක්කොන්තො ගාමන්තං ඔසරිත්වා ගිහිහි සංසට්ඨො හුත්වා අනෙසනං ආපජ්ජිත්වා අනයබ්‍යසනං පාපුණෙය්‍ය, නිය්‍යාතිතත්තභාවස්ස පනස්ස භෙරවාරම්මණෙ ආපාථමාගතෙපි භයං න උප්පජ්ජති. තත්‍ර තයා පණ්ඩිත පුරිමදිවසමෙව අත්තා බුද්ධානං නිය්‍යාතිතොති පච්චවෙක්ඛතො ච පනස්ස සොමනස්සමෙව උප්පජ්ජති, යථා හි පුරිසස්ස උත්තමං කාසිකවත්ථං භවෙය්‍ය, තස්ස තස්මිං මූසිකාය වා කීටෙහි වා ඛායිතෙ[1] උප්පජ්ජෙය්‍ය දෙමනස්සං. සචෙ පන තං අචීවරිකස්ස භික්ඛුනො දදෙය්‍ය, අථස්ස තං තෙන භික්ඛුනා ඛණ්ඩාඛණ්ඩං කයිරමානං දිස්වාපි සොමනස්සමෙව උප්පජ්ජෙය්‍ය, එවං සම්පදමිදං වෙදිතබ්බං.

(ඇ) ආචරියස්ස නිය්‍යාතෙන්තෙනාපි "ඉමාහං භන්තෙ අත්තභාවං තුම්හාකං පරිච්චජාමී"ති වත්තබ්බං. එවං අනිය්‍යාතිතත්තභාවො හි

---

භයානක අරමුණු හමුවූකල; සණ්ඨිතුං අසක්කොන්තො, හැල්විය නොහෙන්නේ; (සපිරවිය නොහෙන්නේය යුතැයි.) ගාමන්තං ඔසරිත්වා, ග්‍රාමාන්තයට බැස; ගිහිහි සංසට්ඨො හුත්වා, ගිහින්හා හැනී; අනෙසනං ආපජ්ජිත්වා, අයුක්තාන්වෙෂණයට පැමිණ; අනයබ්‍යසනං පාපුණෙය්‍ය, අනයව්‍යශනයට පැමිණෙන්නේය; නිය්‍යාතිතත්තභාවස්ස පනස්ස, පරිත්‍යක්තවූ ආත්මභාවඇති ඔහටවනාහි; භෙරවාරම්මණෙ ආපාථමාගතෙ, භයානක අරමුණු හමුවූකල; භයං න උප්පජ්ජති, භය නොඋපදී; පණ්ඩිත, නුවණැත්තව; තයා, තාවිසින්; පුරිමදිවසමෙව, පළමුදවසම; අත්තා බුද්ධානං නිය්‍යාතිතො තත්‍ර, ආත්මය බුදුන්ට පාවා දෙනලද්දේ නොවේදැයි; පච්චවෙක්ඛතොච පන, ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ අස්ස, ඔහට; සොමනස්සමෙව උප්පජ්ජති, (මෙසේ බොහෝ උපද්‍රවඇති ආත්මභාවය සථානයෙහි දෙනලදැයි සිතන්නහුට) සොම්නස්ම උපදී; යථා හි, යම්සේ; පුරිසස්ස, පුරුෂයාගේ; උත්තමං, උතුම්වූ; කාසිකවත්ථං භවෙය්‍ය, කසීවස්ත්‍රයක් වන්නේද; තස්ස, ඒපුරුෂයහට; තස්මිං, ඒ කසීවත; මූසිකාය වා, මීයකුවිසින් හෝ; කීටෙහි වා, පණුවන් විසින්හෝ; ඛායිතෙ, කනලද කල්හි; උප්පජ්ජෙය්‍ය දෙමනස්සං, දෝම්නස් උපදනේය; සචෙ පන, ඉදින් වනාහි; තං, හේවස්ත්‍රය; අචීවරිකස්ස භික්ඛුනො දදෙය්‍ය, සිවුරු නැති මහණක්හට දුන්නේවීනම්; අථ, ඉක්බිත්තෙන්; තං, හේවස්ත්‍රය; තෙන භික්ඛුනා, එමහණහුවිසින්; ඛණ්ඩාඛණ්ඩං කයිරමානං දිස්වාපි; කඩකඩකරනුලබන්නා දැකද; අස්ස, මොහට; සොමනස්සමෙව උප්පජ්ජෙය්‍ය, සොම්නස්ම උපදනේයි; ඉදං, මෙද; එවං සම්පදං, මෙම වැන්නැයි; වෙදිතබ්බං, දතයුතු.

(ඇ) ආචරියස්ස නිය්‍යාතෙන්තෙනාපි, ආචාර්‍ය්‍යයන්ට නිය්‍යාතනය කරනුවහු විසිනුදු; භන්තෙ, වහන්ස; ඉමං අත්තභාවං, මේ ආත්මභාවය; අහං, මම; තුම්හාකං, තොපට; පරිච්චජාමීති, පරිත්‍යාගකෙරෙමි යි;

---

1. ඛාදිතෙ-ත්‍රි. මු.

**අතජ්ජනීයො වා හොති දුබ්බචො වා අනොවාදකරො යෙන කාමඞ්ගමො වා ආචරියං අනාපුච්ඡාව යත්‍ථිච්ඡති තත්‍ථ ගන්තා, තමෙනං ආචරියො ආමිසෙන වා ධම්මෙන වා න සඞ්ගණ්හාති ගුළ්හං ගන්‍ථං න සික්ඛාපෙති. සො ඉදං දුවිධං සඞ්ගහං අලභන්තො සාසනෙ පතිට්ඨං න ලභති න චිරස්සෙව දුස්සීල්‍යං වා ගිහිභාවං වා පාපුණාති. නිය්‍යාතිතත්තභාවො පන නෙව අතජ්ජනීයො හොති න යෙන කාමඞ්ගමො සුවචො ආචරියායත්තවුත්තිරෙව හොති. සො ආචරියතො දුවිධං සඞ්ගහං ලභන්තො සාසනෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති, චූළපිණ්ඩපාතිකතිස්සත්ථෙරස්ස අන්තෙවාසිකා විය- ථෙරස්ස කිර සන්තිකං තයො භික්ඛූ අගමංසු. තෙසු එකො අහං භන්තෙ තුම්හාකං අත්ථායාති වුත්තෙ සතපොරිසෙ පපාතෙ පතිතුං උස්සහෙය්‍යන්ති ආහ.**

---

වත්තබ්බං, කියයුතු; එවං, මෙසේ; අනිය්‍යාතිතත්තභාවො, අපරිත්‍යක්තවූ ආත්මභාවඇත්තේ; අතජ්ජනීයො හොති, තර්ජනය කටයුතු නොවෙයි; දුබ්බචො වා, නොකීකරු හෝ වේ; අනොවාදකරො, අවවාදනොකෙරේ; (අනොවාදකරො-යනු දුබ්බචො-යනු යෙහිම අර්ථප්‍රකාශකරණුපිණිස කීහු.) යෙන කාමඞ්ගමො වා, කැමති අතක යේ හෝ යි; ආචරියං අනාපුච්ඡාව, ආචාර්‍ය්‍යයන් නොපිළිවිස; යත්‍ථිච්ඡති, යම්තැනකට යනු කැමතිද; තත්‍ථ ගන්තා, එයටයන්නේ වේ; තං එතං, ඒ මේ මහණහට; ආචරියො, ආචාර්‍ය්‍යතෙමේ; ආමිසෙන වා, ආමිෂයෙන් හෝ; ධම්මෙන වා, අවවාද අනුශාසනා ධර්‍මයෙන් හෝ; න සඞ්ගණ්හාති, සඞ්ග්‍රහනොකෙරේ; ගුළ්හං ගන්‍ථං, (කර්‍මස්ථාන සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදාදිවූ) ගැඹුරු ශූන්‍යතාප්‍රතිසංයුක්තධර්‍මයන්; න සික්ඛාපෙති, නොහික්මවා; (අර්ථප්‍රකාශකොට නොදක්වා;) සො, හෙතෙම; ඉදං දුවිධං සඞ්ගහං අලභන්තො, මේ ධර්‍මාමිෂවිසින් දෙවැදෑරුම්සඞ්ග්‍රහ නොලබන්නේ; සාසනෙ පතිට්ඨං න ලභති, සස්නෙහි පිහිට නොලැබේ; න චිරස්සෙව, නො බොහෝකලකින්ම; දුස්සීල්‍යං වා ගිහිභාවං වා පාපුණාති, දුශ්ශීලබවට හෝ ගිහිබවට පැමිණේ; නිය්‍යාතිතත්තභාවො පන, පරිත්‍යක්තවූ ආත්මභාව ඇත්තේ වනාහි; නෙව අතජ්ජනීයො හොති, තර්ජනය නොකටයුතු නොදවෙයි; න යෙන කාමඞ්ගමො, කැමතිඅත යන්නේද නොවේ; සුවචො, කීකරුවේ; ආචරියායත්තවුත්තිරෙව හොති, ආචාර්‍ය්‍යයන් පිළිබඳ පැවතුම්ම ඇතිවේ; සො, හෙතෙම; ආචරියතො දුවිධං සඞ්ගහං ලභන්තො, ආචාර්‍ය්‍යයන් කෙරෙන් දෙවැදෑරුම් සඞ්ග්‍රහලබන්නේ; සාසනෙ, සස්නෙහි; වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති, ශීලයෙන් වෘද්ධියට සමාධින් විරූඪියට ප්‍රඥාවෙන් විපුලබවට පැමිණේ; චූළපිණ්ඩපාතිකතිස්සත්ථෙරස්ස; චූළපිණ්ඩපාතිකතිස්ස නම් තෙරුන්ගේ; අන්තෙවාසිකා විය, අතවැස්සන් මෙනි; ථෙරස්ස කිර සන්තිකං, තෙරුන් සමීපයට; තයො භික්ඛූ අගමංසු, භික්ෂූහු තුන්දෙනෙක් ගියෝ; තෙසු,

(ආ) දුතියො අහං භන්තෙ තුම්හාකං අත්ථායාති වුත්තෙ ඉමං අත්තභාවං පණ්හිතො පට්ඨාය පාසාණපිට්ඨෙ සංසෙනෙත්වා නිරවසෙසං ඛෙපෙතුං උස්සහෙය්‍යන්ති ආහ. තතියො අහං භන්තෙ තුම්හාකං අත්ථායාති වුත්තෙ අස්සාසපස්සාසෙ උපරුන්ධිත්වා කාලකිරියං කාතුං උස්සහෙය්‍යන්ති ආහ. ථෙරො භබ්බා ඉමෙ භික්ඛූති කම්මට්ඨානං කථෙසි. තෙ තස්ස ඔවාදෙ ඨත්වා තයොපි අරහත්තං පාපුණිංසූති, අයමානිසංසො අත්තනිය්‍යාතනෙ. තෙන වුත්තං "බුද්ධස්ස වා භගවතො ආචරියස්ස වා අත්තානං නිය්‍යාතෙත්වා"ති. **සම්පන්නජ්ඣාසයෙන සම්පන්නාධිමුත්තිකාව භුත්වාති**:- එත්ථ පන තෙන යොගිනා අලොභාදීනං වසෙන ඡහාකාරෙහි සම්පන්නජ්ඣාසයෙන භවිතබ්බං, එවං සම්පන්නජ්ඣාසයො හි තිස්සන්නං බොධීනං අඤ්ඤතරං පාපුණාති…

---

ඔවුන් කෙරෙහි; එකො, එකෙක්; භන්තෙ, වහන්ස; අහං, මම; තුම්හාකං අත්ථායාති වුත්තෙ, තොපට වැඩෙකැයි කී කල්හි; සතපොරිසෙ පපාතෙ, සියක් පුරුෂප්‍රමාණ ඇති ප්‍රපාතයෙහි; පතිතුං උස්සහෙය්‍යන්ති ආහ, හෙන්නට උත්සාහකෙරෙමි යි කී…

(ආ) දුතියො, දෙවන අතවැසි; අහං, මම; භන්තෙ, වහන්ස; තුම්හාකං අත්ථායාති වුත්තෙ, තොපට (මනුෂ්‍යකලකයෙන්) ප්‍රයොජනයෙකැයි කී කල්හි; ඉමං අත්තභාවං, මේ ආත්මභාවය; පණ්හිතො පට්ඨාය, විළුමැ පටන්ගෙන; පාසාණපිට්ඨෙ සංසෙනෙත්වා, ගලක්පිට ගසන්නෙම්; නිරවසෙසං ඛෙපෙතුං, නිරවශෙෂයෙන් ක්ෂයකරන්නට; උස්සහෙය්‍යන්ති ආහ, උත්සාහ ඇත්තෙමියි කී; තතියො, තුන්වන අතවැසි; අහං මම; භන්තෙ, වහන්ස; තුම්හාකං අත්ථායාති වුත්තෙ, (ආශ්වාස ප්‍රශ්වාස නිරොධයෙන්) තොපට කිසි ප්‍රයොජනයෙකැයි කීකල්හි; අස්සාසපස්සාසෙ උපරුන්ධිත්වා, ආශ්වාස ප්‍රශ්වාස නිරොධකොට; කාලකිරියං කාතුං උස්සහෙය්‍යන්ති ආහ, කාලක්‍රියාකරන්නට උත්සාහ කෙරෙමි යි කී; ථෙරො, තෙරහු; භබ්බා ඉමෙ භික්ඛූති, මේ මහණහු එකැතියෙන් භව්‍යයහයි; කම්මට්ඨානං කථෙසි, කමටහන් කීහු; තෙ, ඒ මහණහු; තස්ස ඔවාදෙ ඨත්වා, ඒ තෙරුන්ගේ අවවාදයෙහි සිට; තයොපි අරහත්තං පාපුණිංසූති, තුන්දෙනම රහත්බවට පැමිණියෝයි; අයං, මේ අත්තනිය්‍යාතනෙ ආනිසංසො, ආත්මනිර්‍ය්‍යාතනයෙහි අනුසසී; තෙන වුත්තං, එහෙයින් කියනලදී; ("බුද්ධස්ස…පෙ…නිය්‍යාතෙත්වා"යි මෙ තුන්දෙනා විසින්ම ආචාරීන් කෙරෙහි භක්ති හැඟවීමෙන් තමන්ගේ වීර්‍ය්‍යාරම්භයම හඟවන ලදැයි දතයුතු.) සම්පන්න…පෙ…එත්ථ පන, මෙහි වනාහි; තෙන යොගිනා, ඒ යොගීන් විසින්; අලොභාදීනං වසෙන, අලොභාදීන් විසින්; ඡහාකාරෙහි, (අලුබ්භනාදී) සයාකාරයෙකින්; සම්පන්නජ්ඣාසයෙන, සම්පූර්ණවූ අදහස් ඇත්තහු විසින්; භවිතබ්බං, වියයුතු; (පූර්වභාගයෙහි ශීලසම්පදාදීන් සාධනවශයෙන්ද ලොකොත්තර කුසලයන්ට උපනිශ්‍රයවශයෙන්ද සම්පන්නවූ අදහස්

(අ) යථාහ:- "ඡ අජ්ඣාසයා බොධිසත්තා[1] බොධිපරිපාකාය සංවත්තන්ති. අලොභජ්ඣාසයා ච බොධිසත්තා ලොභෙ දොසදස්සාවිනො, අදොසජ්ඣාසයා ච බොධිසත්තා දොසෙ දොසදස්සාවිනො, අමොහජ්ඣාසයා ච බොධිසත්තා මොහෙ දොසදස්සාවිනො, නෙක්ඛම්මජ්ඣාසයා ච බොධිසත්තා ඝරාවාසෙ දොසදස්සාවිනො, පවිවෙකජ්ඣාසයා ච බොධිසත්තා ගණසඞ්ගණිකාය[2] දොසදස්සාවිනො, නිස්සරණජ්ඣාසයා ච බොධිසත්තා සබ්බභවගතීසු දොසදස්සාවිනො"ති. යෙහි කෙචි අතීතානාගත පච්චුප්පන්නා සොතාපන්නා සකදාගාමී අනාගාමී අරහන්ත[3] පච්චෙකබුද්ධ සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ ඉමෙහි ඡහි ආකාරෙහි

---

ඇත්තහු විසින් වියයුතුය යුතැති ')එවං, මෙසේ; සම්පන්නජ්ඣාසයො හි, සම්පන්නවූ අදහස් ඇත්තේ; තිස්සන්නං බොධීනං, ත්‍රිවිධබොධීන් කෙරෙන්; අඤ්ඤතරං පාපුණාති, එක්තරා බොධියකට පැමිණේ.

(අ) යථාහ, වදාළේමැනු; ඡ අජ්ඣාසයා බොධිසත්තා, සඅදහස් ඇති බෝසත්හු; බොධිපරිපාකාය, බොධිඥානයමුහුකුරුවනු පිණිස; සංවත්තන්ති, පවතිත්; ලොභෙ දොසදස්සාවිනො, (ලුබ්භනලකුණු) ලොභයෙහි අයුණුදක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; අලොභජ්ඣාසයාව, (අලොභීනම් කෙසේවමෝද්‍යේ හෝයි.) අලොභඅදහස්ඇතිවෙත්; (සැමතැනම හැමදවසම කෙසේනම් අලුබ්ධවමෝද්‍යේහෝයි සිතා ආදී යෙහිද ලොභ නොකිරීමෙන් මැදද ලොභනොකිරීමෙන් පසුවද පවත්නා අලොභඅදහස් ඇත්තාහු යුතැති සෙසු පෙදෙහිදු මෙම නයයි.) දොසෙ, (දුස්සනලකුණු) වෙෂයෙහි; දොසදස්සාවිනො, අයුණු දක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; අදොසජ්ඣාසයාව, (අවෙෂීනම් කෙසේ වමෝද්‍යේහෝයි) අවෙෂයෙහි අදහස්ඇතිවෙත්; මොහෙ; (මුය්හනලකුණු) මොහයෙහි; දොසදස්සාවිනො, අයුණුදක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; අමොහජ්ඣාසයාව, (අමොහීනම් කෙසේ වමෝද්‍යේහෝයි) අමොහඅදහස් ඇතිවෙත්; ඝරාවාසෙ දොසදස්සාවිනො, ගිහිගෙයි විසීමෙහි අයුණුදක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; නෙක්ඛම්මජ්ඣාසයා, (කෙසේනම් පැවිදිවමෝද්‍යේහෝයි) ප්‍රව්‍රජ්‍යාවෙහි අදහස් ඇතිවෙත්; ගණසඞ්ගණිකාය දොසදස්සාවිනො, ගණසඞ්ගණිකාවෙහි අයුණු දක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; පවිවෙකජ්ඣාසයා, (කෙසේනම් විවේකීවමෝද්‍යේහෝයි) තදඞ්ගාදීවිවෙකයෙහි අදහස් ඇතිවෙත්; සබ්බභවගතීසු දොසදස්සාවිනො, සියලුභවගතියෙහි අයුණුදක්නාවූ; බොධිසත්තා, බෝසත්හු; නිස්සරණජ්ඣාසයා, (නිවන්නම් කෙසේදැයි) නිවන්හි අදහස් ඇතිවෙත්; අතීතානාගත පච්චුප්පන්නා, අතීතානාගත වර්තමාන කාලිකවූ; යෙහි කෙචි, යම් කිසි; සොතාපන්නා, සෝවාන්හ; සකදාගාමී, සෙදගැමියහ; අනාගාමී, අනගැමියහ; අරහන්ත, රහත්හ; පච්චෙකබුද්ධ, පසේබුදුහ; සම්මාසම්බුද්ධා, සම්‍යක්සම්බුද්ධයහ යන යම්කෙනෙක්ද; සබ්බෙ තෙ, ඔහුහැම

---

1. බොධිසත්තානං-ත්‍රි. මු. 2. සඞ්ගණිකාය-ත්‍රි. මු, 3. ඛීණාසව-සා.ළු.චි.

අත්තනා අත්තනා පත්තබ්බං විසෙසං පත්තා. තස්මා ඉමෙහි ඡහි ආකාරෙහි සම්පන්නජ්ඣාසයෙන භවිතබ්බං.

(අ) තදධිමුත්තතාය පන අධිමුත්තිසම්පන්නෙන භවිතබ්බං. සමාධාධිමුත්තෙන සමාධිගරුකෙන සමාධිපබ්භාරෙන, නිබ්බාණාධිමුත්තෙන නිබ්බාණගරුකෙන නිබ්බාණපබ්භාරෙන ච භවිතබ්බන්ති අත්ථො. එවං සම්පන්නජ්ඣාසයාධිමුත්තිනො පනස්ස කම්මට්ඨානං යාචතො චෙතොපරියඤාණලාභිනා ආචරියෙන චිත්තාචාරං ඔලොකෙත්වා චරියා ජානිතබ්බා. ඉතරෙන කිං චරිතොසි, කෙ වා තෙ ධම්මා බහුලං සමුදාචරන්ති, කිං වා තෙ මනසිකරොතො ඵාසු හොති, කතරස්මිං වා තෙ කම්මට්ඨානෙ චිත්තං නමතීති එවමාදීහි නයෙහි පුච්ඡිත්වා ජානි-

---

දෙනම; ඉමෙහෙව ඡහි ආකාරෙහි, මෙම සආකාරයෙන්; අත්තනා අත්තනා පත්තබ්බං විසෙසං, තමතමන් විසින් පැමිණියයුතු විශෙෂයට, පත්තා; පැමිණියහ; තස්මා, එහෙයින්; ඉමෙහි ඡහි ආකාරෙහි, මේ සආකාරයෙන්; සම්පන්නජ්ඣාසයෙන භවිතබ්බං, සම්පන්නවූ අදහස්ඇත්තහුවිසින් වියයුතු.

(අ) තදධිමුත්තතාය පන, එහිම අධිමුක්තී ඇතිබැවින් වනාහි; (යමක්පිණිස ශාමනානුයොගය කෙරේද යමක් පිණිස ප්‍රව්‍රජ්‍යාව වේද එහිම අධිමුක්තිඇත්තහු විසින්ය යුතැයි.) අධිමුත්තිසම්පන්නෙන භවිතබ්බං, අධිමුක්තිසම්පන්නයාවිසින් වියයුතු; සමාධාධිමුත්තෙන, සමාධියෙහි අධිමුක්තිඇත්තහු විසින්; සමාධිගරුකෙන, සමාධියම ගුරුකොට ඇත්තහු විසින්; සමාධිපබ්භාරෙන, සමාධියෙහිම නැමුනහුවිසින්; නිබ්බාණාධිමුත්තෙන, නිවන්හි අධිමුක්තිඇත්තහු විසින්; නිබ්බාණගරුකෙන; නිවන්ම ගුරුකොට ඇත්තහු විසින්; නිබ්බාණපබ්භාරෙන, නිවන්හි නැමුණහු විසින්; භවිතබ්බන්ති අත්ථො, වියයුතුයයන අර්ථයි; එවං, මෙසේ; සම්පන්නජ්ඣාසයාධිමුත්තිනො පන, සම්පන්නවූ අදහස් හා අධිමුක්තිඇතිව; කම්මට්ඨානං යාචතො, කමටහන්ඉල්වන්නාවූ; අස්ස, මොහුට; චෙතොපරියඤාණලාභිනා ආචරියෙන, පරසිත්පිරිසිඳදන්නා නුවණලද ඇජරුවිසින්; චිත්තාචාරං ඔලොකෙත්වා, සිත්හසරබලා; චරියා ජානිතබ්බා, චරියාවෝ දතයුත්තාහුයි; ඉතරෙන, ඒ නුවණනොලද්දහුවිසින්; කිං චරිතොසීති, කවර චරිතයෙහිදැයි;(පුච්ඡිත්වා ජානිතබ්බා යනු-සබඳ-මෙසේ විචාරන ලද්දේ නොදනිමියි කියානම් "කෙ වා තෙ ධම්මා" යනාදීන්විචාරිය යුතු.) තෙ, තට; කෙ වා ධම්මා බහුලං සමුදාචරන්ති, කවරධර්මයෝ බොහෝකොට හැසිරෙද්ද; කිං වා මනසිකරොතො, (අසුභාදීන් කෙරෙහි) කුමක් මෙනෙහි කරන්නාවූ; තෙ, තට; ඵාසු හොති, ඵාසු වේද; (සිත් එකඟව සුවසේ වෙසේ ද යුතැයි) කතරස්මිං වා කම්මට්ඨානෙ, කවර කමටහනෙක්හි; තෙ චිත්තං නමති, පියවින් තාසිත

තබ්බා. එවං ඤත්වා චරියානුකූලං කම්මට්ඨානං කථෙතබ්බං. කථෙන්තෙන ච තිවිධෙන කථෙතබ්බං. පකතියා උග්ගහිතකම්මට්ඨානස්ස එක ද්වෙ නිසජ්ජා සජ්ඣායං කාරෙත්වා දාතබ්බං. සන්තිකෙ වසන්තස්ස ආගතාගතක්ඛණෙ කථෙතබ්බං, උග්ගහෙත්වා අඤ්ඤත්‍ර ගන්තුකාමස්ස නාතිසඞ්ඛිත්තං නාතිවිත්ථාරිකං කත්වා කථෙතබ්බං. තත්‍ථ පඨවිකසිණං තාව කථෙන්තෙන චත්තාරො කසිණදොසා කසිණකරණං කතස්ස භාවනානයො දුවිධං නිමිත්තං දුවිධො සමාධි සත්තවිධං සප්පායාසප්පායං දසවිධං අප්පණාකොසල්ලං විරියසමතා අප්පණාවිධානන්ති ඉමෙ නවආකාරා කථෙතබ්බා, සෙසකම්මට්ඨානෙසුපි තස්ස තස්ස අනුරූපං කථෙතබ්බං, තං සබ්බං තෙසං භාවනාවිධානෙ ආවිභවිස්සති. එවං කථියමානෙ පන කම්මට්ඨානෙ තෙන යොගිනා නිමිත්තං

---

නැමේදැයි; එවමාදීහි නයෙහි, මේ ආදීනයින්; පුච්ඡිත්වා, විචාරා; ජානිතබ්බා, දතයුත්තාහුයි; (ආදි ග්‍රහණින් ඉරියාපථාදීන්ගේ සඞ්ග්‍රහය දතයුතු.)—එවං ඤත්වා මෙසේ දැන; චරියානුකූලං කම්මට්ඨානං, චරිතයට අනුකූලවූ කමටහන්; කථෙතබ්බං, කියයුතු; කථෙන්තෙන ච, කියන්නහුවිසිනුදු; තිවිධෙන කථෙතබ්බං, තුන්පරිද්දෙකින් කියයුතු; පකතියා උග්ගහිතකම්මට්ඨානස්ස, පියවින් උගත්කමටහන් ඇත්තහට; (සජ්ඣායනාකාලයෙහි හෝ මනසිකාරවිසින් හෝ පුරුදුකරනලදකමටහන් ඇත්තාහටය යු තැනි.) එක ද්වෙ නිසජ්ජා සජ්ඣායං කාරෙත්වා දාතබ්බං, එක්දෙකස්නක් පුහුණුගන්වා දියයුතු; සන්තිකෙ වසන්තස්ස, සමීපයෙහි වසනුවහට; ආගතාගතක්ඛණෙ කථෙතබ්බං, ආආක්ෂණෙහි පවත් අසඅසා කියයුතු; උග්ගහෙත්වා අඤ්ඤත්‍ර ගන්තුකාමස්ස, ඉගෙන අනික් තැනකට යනු කැමැත්තාහට; නාතිසඞ්ඛිත්තං, ඉතාසංක්ෂෙපනොකොට; නාතිවිත්ථාරිකං කත්වා, ඉතාවිස්තරනොකොට; කථෙතබ්බං, කියයුතු, තත්‍ථ ඒ කමටහන්හි; තාව, පළමුකොට; පඨවිකසිණං කථෙන්තෙන, පඨවිකිසුණුකමටහන කියනුවහු විසින්; චත්තාරො කසිණදොසා, සතර කිසුණුදොස්හු; කසිණකරණං, කිසුණුකරනනියාය; කතස්ස භාවනානයො, කරනලද කසිණයාගේ භාවනානය; දුවිධං නිමිත්තං, දෙවැදෑරුම් නිමිත්තය; දුවිධො සමාධි, දෙවැදෑරුම් සමාධිය; සත්තවිධං සප්පායාසප්පායං, සත්වැදෑරුම් සැපනොසැපය; දසවිධං අප්පණාකොසල්ලං, දසවැදෑරුම් අර්පණාකෞශල්‍යය; විරියසමතා, වීර්‍ය්‍යසමත්වය; අප්පණාවිධානන්ති, අර්පණාවිධානයයි; ඉමෙ නවආකාරා, මේ නවප්‍රකාරයෝ; කථෙතබ්බා, කියයුත්තාහුයි; සෙසකම්මට්ඨානෙසුපි, සෙසු කමටහනෙහිදු; තස්ස තස්ස අනුරූපං, ඒ ඒ කමටහනට සුදුසු කොට; කථෙතබ්බං, කියයුතු; තං සබ්බං, ඒ සියල්ල; තෙසං භාවනාවිධානෙ ආවිභවිස්සති, ඒ ඒ කමටහනුන්ගේ භාවනාවිධි කියන තැන පහළවේ; එවං කථියමානෙ පන කම්මට්ඨානෙ, මෙසේ කමටහන් කියනලබන කල්හි; තෙන යොගිනා, ඒ යොගීහු විසින්; නිමිත්තං ගහෙත්වා සොතබ්බං, නිමිත්ත ගෙන

ගහෙත්වා සොතබ්බං. නිමිත්තං ගහෙත්වාති—ඉදං හෙට්ඨිමපදං, ඉදං උපරිමපදං, අයමස්ස අත්ථො, අයමධිප්පායො, ඉදං ඔපම්මන්ති එවං තං තං ආකාරං උපනිබන්ධිත්වාති අත්ථො, එවං නිමිත්තං ගහෙත්වා සක්කච්චං සුණන්තෙන හි කම්මට්ඨානං සුග්ගහිතං හොති. අථස්ස තං නිස්සාය විසෙසාධිගමො සම්පජ්ජති, න ඉතරස්සාති. අයං ගහෙත්වා ති ඉමස්ස පදස්ස අත්ථපරිදීපනා. එත්තාවතා 'කල්‍යාණමිත්තං උපසඞ්කමිත්වා අත්තනො චරියානුකූලං චත්තාලීසාය කම්මට්ඨානෙසු අඤ්ඤතරං කම්මට්ඨානං ගහෙත්වා"ති ඉමානි පදානි සබ්බාකාරෙන විත්ථාරිතානි හොන්තීති෴

ඉතිසාධුජනපාමොජ්ජත්ථාය කතෙ විසුද්ධිමග්ගෙ
සමාධිභාවනාධිකාරෙ

## කම්මට්ඨානගහණනිද්දෙසො නාම

**තතියො පරිච්ඡෙදො.**

—+—

### 4.

(අ) ඉදානි යං වුත්තං "සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහාරෙ විහරන්තෙනා"ති, එත්ථ පන යස්ස තාව ආචරියෙන සද්ධිං එකවිහාරෙ වසතො ඵාසු හොති, තෙන තත්ථෙව කම්මට්ඨානං

---

ඇසියයුතු; නිමිත්තං ගහෙත්වාති ඉදං, නිමිත්තං ගහෙත්වා යන මේ; ඉදං හෙට්ඨිමපදං, මේ යට පදය; ඉදං උපරිමපදං, මේ මතු පදය; අයමස්ස අත්ථො, මෙම පදයාගේ අර්ථ මේය; අයමධිප්පායො, මේ අභිප්‍රායය; ඉදං ඔපම්මන්ති, මේ උපමායයි; එවං, මෙසේ; තං තං ආකාරං, ඒ ඒ ආකාරය; උපනිබන්ධිත්වාති අත්ථො, සිත්හි බැඳය යන අර්ථයි; එවං මෙසේ; නිමිත්තං ගහෙත්වා, නිමිත්තගෙන; සක්කච්චං සුණන්තෙන හි, සකස් කොට අසන්නාහු විසින්; කම්මට්ඨානං සුග්ගහිතං හොති, කමටහන මනා කොට ගන්නා ලැබේ; අථ, ඉක්බිත්තෙන්; තං නිස්සාය, ඒ නිසා; අස්ස, ඔහට; විසෙසාධිගමො සම්පජ්ජති, විශෙෂාධිගමය සිඩවෙයි; න ඉතරස්සාති, සෙස්සහට සිඩනොවේ; අයං, මේ; ගහෙත්වාති ඉමස්ස පදස්ස, ගහෙත්වා යන මේ පදයාගේ; අත්ථපරිදීපනා, අර්ථදීපනයයි; එත්තාවතා, මෙපමණකින්; කල්‍යාණ෴ පෙ෴ ගහෙත්වාති, ගෙනය යන; ඉමානි පදානි, මේ පදයෝ; සබ්බාකාරෙන, සියලු ප්‍රකාරයෙන්; විත්ථාරිතානි හොන්ති, විස්තර කරන ලද්දාහු වෙත්෴

## කම්මට්ඨානගහණනිද්දෙසො තතියො.

—+—

### 4.

(අ) ඉදානි, දැන්; යං වුත්තං, යමෙක් කියනලද්ද; සමාධි෴ පෙ෴ එත්ථ පන, මෙහි වනාහි; ආචරියෙන සද්ධිං, ආචාරීන් හා සමඟ; එකවිහාරෙ වසතො, එක වෙහෙර වසන්නාවූ; යස්ස තාව, යමක්හට; ඵාසු හොති, (ආවාසසප්පායාදී ලාභයෙන් මනසකාරයට) සුවවේද; තෙන,

පරිසොධෙන්තෙන වසිතබ්බං. සචෙ තත්ථ ඵාසු න හොති, යො අඩ්ඪගාවුතෙ වා අඩ්ඪයොජනෙ වා යොජනමත්තෙපි වා සප්පායො විහාරො හොති, තත්ථ වසිතබ්බං. එවං හි සති කම්මට්ඨානස්ස කිස්මිඤ්චි ඨානෙ සන්දෙහෙ වා සති සතිසම්මොසෙ වා ජාතෙ කාලස්සෙව විහාරෙ වත්තං කත්වා අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා භත්තකිච්චපරියොසානෙයෙව ආචරියස්ස වසනට්ඨානං ගන්ත්වා තං දිවසං ආචරියස්ස සන්තිකෙ කම්මට්ඨානං සොධෙත්වා දුතියදිවසෙ ආචරියං වන්දිත්වා නික්ඛමිත්වා අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා අකිලමන්තොයෙව අත්තනො වසනට්ඨානං ආගන්තුං සක්ඛිස්සති. යො පන යොජනප්පමාණෙපි ඵාසුකට්ඨානං න ලභති, තෙන කම්මට්ඨානෙ සබ්බං ගණ්ඨිට්ඨානං ඡින්දිත්වා සුවිසුද්ධං ආවජ්ජනපටිබද්ධං කම්මට්ඨානං කත්වා දූරම්පි ගන්ත්වා සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහාරෙ

---

ඔහු විසින්; තෙනෙව, එහිම; කම්මට්ඨානං පරිසොධෙන්තෙන, (ගැට පද සිඳ) කමටහන් පිරිසිදුකරන්නහු විසින්; වසිතබ්බං, විසියයුතු; සචෙ, ඉදින්; තත්ථ, එහි; ඵාසු න හොති, ඵාසු නො වේ නම්; යො අඩ්ඪ, යම් අතික්; (විහාරො හොති-යනු-සබඳ.) ගාවුතෙ වා, ගවු වෙක හෝ; අඩ්ඪයොජනෙ වා, අඩයොදනෙක හෝ; යොජනමත්තෙපි වා, යොදුනක් පමණ තැනෙක හෝ; සප්පායො විහාරො හොති, සැප වෙහෙරක් වේද; තත්ථ වසිතබ්බං, එහි විසියයුතු; එවං හි සති, එසේ කල්හි; කම්මට්ඨානස්ස, කර්මස්ථානයාගෙ; කිස්මිඤ්චි ඨානෙ, කිසිතැනෙක; සන්දෙහෙ වා සති, සන්දේහයක් හෝ ඇති කල්හි; සතිසම්මොසෙ වා ජාතෙ, සිහිමුළාවගිය කල්හි හෝ; කාලස්සෙව, උදැසනම; විහාරෙ වත්තං කත්වා, වසන වෙහෙර වත්කොට; අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා, අතරමඟ පිඬු සිඟා; භත්තකිච්චපරියොසානෙයෙව, බත් කිස කෙළවරම; ආචරියස්ස වසනට්ඨානං ගන්ත්වා, ආචාර්යයන් වසන තැනට එළඹ; තං දිවසං, එදවස්; ආචරියස්ස සන්තිකෙ, ආචාර්යයා සමීපයෙහි; කම්මට්ඨානං සොධෙත්වා, කමටහන් පිරිසුදු කොට; දුතිය දිවසෙ, දෙවන දවස්; ආචරියං වන්දිත්වා, ආචාර්යයන් වැඳ; නික්ඛමිත්වා, නික්ම; අන්තරාමග්ගෙ පිණ්ඩාය චරිත්වා, අතුරුමඟ පිඬු සිඟා; අකිලමන්තොයෙව, අක්ලාන්තකාය ඇතිවම; අත්තනො, තමාගෙ; වසනට්ඨානං ආගන්තුං සක්ඛිස්සති, වසන තැනට එන්නට සමර්ථ වේ; යො පන, යමෙක් වනාහි; යොජනප්පමාණෙපි ඵාසුකට්ඨානං න ලභති, යොදුනක් පමණ තැනද ඵාසුතැනෙක් නො ලැබේ නම්; තෙන, ඔහු විසින්; කම්මට්ඨානෙ, කමටහන; සබ්බං ගණ්ඨිට්ඨානං, සියලු ගැටතැන්; ඡින්දිත්වා, (අර්ථ පහළකිරීමෙන්) බිඳ; කම්මට්ඨානං, කමටහන; සුවිසුද්ධං, පරිශුද්ධ කොට; ආවජ්ජනපටිබද්ධං කත්වා, ආවර්ජනප්‍රතිබද්ධ කොට; දූරම්පි ගන්ත්වා, දුරටද ගොස්; සමාධිභාවනාය අනනුරූපං විහාරං, සමාධි භාවනාවට නුසුදුසු වෙහෙර; පහාය, හැර; අනුරූපෙ විහාරෙ

විහාතබ්බං. තත්‍ථ අනනුරූපො නාම අට්ඨාරසන්නං දොසානං අඤ්ඤතරෙන සමන්නාගතො, තත්‍රිමෙ අට්ඨාරසදොසා:—"මහත්තං නවත්තං ජිණ්ණත්තං පන්‍ථනිස්සිතත්තං සොණ්ඩිං පණ්ණං පුප්ඵං ඵලං පත්‍ථනීයතා නගරසන්නිස්සිතතා දාරුසන්නිස්සිතතා ඛෙත්තසන්නිස්සිතතා විසභාගානං පුග්ගලානං අත්‍ථිතා පට්ටනසන්නිස්සිතතා පච්චන්තසන්නිස්සිතතා රජ්ජසීමසන්නිස්සිතතා අසප්පායතා කල්‍යාණමිත්තානං අලාභො"ති,

(අ) ඉමෙසං අට්ඨාරසන්නං දොසානං අඤ්ඤතරෙන දොසෙන සමන්නාගතො අනනුරූපො නාම, න තත්‍ථ විහාතබ්බං. කස්මා ? මහාවිහාරෙ තාව බහූ නානාඡන්දා සන්නිපතන්ති තෙ අඤ්ඤමඤ්ඤං පටිවිරුද්ධතාය වත්තං න කරොන්ති, බොධිඅඞ්ගනාදීනි අසම්මට්ඨානෙව හොන්ති, අනුපට්ඨාපිතං පානීයං පරිභොජනීයං, තත්‍රායං

---

විහාතබ්බං, සුදුසු වෙහෙර විසියයුතු; තත්‍ථ, එහි; අනනුරූපො නාම, නුසුදුසු වෙහෙර නම්; අට්ඨාරසන්නං දොසානං, අටළොස් දෙෂයන් කෙරෙන්; අඤ්ඤතරෙන සමන්නාගතො, එක්තරා දෙෂයකින් සමන්විතවූයේ; තත්‍ර, එහි; ඉමෙ අට්ඨාරසදොසා, මොහු අටළොස් දෙෂයෝයි; මහත්තං, මහත්බවය; නවත්තං, අලුත්බවය; ජිණ්ණත්තං, ජීර්ණබව්ය; පන්‍ථනිස්සිතත්තං, මඟක් ඇසිරුකළ බවය; සොණ්ඩිං, පැන්කෙම් ඇත්තෙය; පණ්ණං, පත්‍ර ඇත්තෙය; පුප්ඵං, මල් ඇත්තෙය; ඵලං, ඵලඇත්තෙය; පත්‍ථනීයතා, ප්‍රාර්ථනීය බවය; නගරසන්නිස්සිතතා, නුවර ඇසිරුකළ බවය; දාරුසන්නිස්සිතතා, දාරු සන්නිශ්‍රිත තැන් ඇසිරුකළ බවය; ඛෙත්තසන්නිස්සිතතා, ක්‍ෂෙත්‍රසීමා ඇසිරිකළබවය; විසභාගානං පුග්ගලානං අත්‍ථිතා, විසභාග පුද්ගලයන් ඇති බවය; පට්ටනසන්නිස්සිතතා, සමුද්‍රතීරය ඇසිරිකළබවය; පච්චන්තසන්නිස්සිතතා, ප්‍රත්‍යන්ත ඇසිරිකළ බවය; රජ්ජසීමසන්නිස්සිතතා, රාජ්‍යසීමා ඇසිරුකළ බවය; අසප්පායතා, නො සැපබවය; කල්‍යාණමිත්තානං අලාභොති, කල්‍යාණමිත්‍රයන්ගේ අලාභයයි;

(අ) ඉමෙසං අට්ඨාරසන්නං දොසානං, මේ අටළොස් දෙෂයන් කෙරෙන්; අඤ්ඤතරෙන දොසෙන සමන්නාගතො, එක්තරා දෙෂෙකින් සමන්විතවූයේ; අනනුරූපො නාම, නො සුදුසු වෙහෙර නම් වේ; තත්‍ථ, එහි; න විහාතබ්බං, නො විසියයුතු, කස්මා, කුමක් හෙයින යත් ? මහාවිහාරෙ තාව, මහවෙහෙර; බහූ නානාඡන්දා සන්නිපතන්ති, බොහෝ නොඑක් අදහස් ඇත්තාහු රැස්වෙත්; තෙ, ඔහු; අඤ්ඤමඤ්ඤං පටිවිරුද්ධතාය, ඔවුනොවුන් ප්‍රතිවිරුද්ධ බැවින්; වත්තං න කරොන්ති, වත් නො කෙරෙති; බොධිඅඞ්ගනාදීනි, මහබෝ අඟන ආදීහු; අසම්මට්ඨානෙව හොන්ති, නො හමදනා ලද්දෑහුම වෙත්; පානීයං, බොන පැන්; පරිභොජනීයං, නහන පැන්; අනුපට්ඨාපිතං, නො එළවකලද්දේ වේ; තත්‍ර, එහි; අයං, මේ මහණතෙමෙ; ගොචර

ගොචරගාමෙ පිණ්ඩාය චරිස්සාමීති පත්තචීවරමාදාය ගච්ඡන්තො
සචෙ පස්සති වත්තං වා අකතං පානීයඝටං වා රිත්තං, අථානෙන
වත්තං කාතබ්බං හොති පානීයං උපට්ඨපෙතබ්බං. අකරොන්තො
වත්තභෙදෙ දුක්කටං ආපජ්ජති, කරොන්තස්ස කාලො අතික්කමති,
අතිදිවා පවිට්ඨො නිට්ඨිතාය භික්ඛාය කිඤ්චි න ලභති, පටිසල්ලාන
ගතොපි සාමණෙරදහරභික්ඛූනං උච්චාසද්දෙන සඞ්ඝකම්මෙහි ච
වික්ඛිපති, යත්ථ පන සබ්බං වත්තං කතමෙව හොති, අවසෙසාපි ච
ඝට්ටනා නත්ථි, එවරූපෙ මහාවිහාරෙපි විහාතබ්බං, නවවිහාරෙ බහුං
නවකම්මං හොති, අකරොන්තං උජ්ඣායන්ති. යත්ථ පන භික්ඛූ එවං
වදන්ති:–ආයස්මා යථා සුඛං සමණධම්මං කරොතු, මයං නවකම්මං
කරිස්සාමාති. එවරූපෙ විහාරෙ විහාතබ්බං. ජිණ්ණවිහාරෙ පන බහුං
පටිජග්ගිතබ්බං හොති, අන්තමසො අත්තනො සෙනාසනමත්තම්පි අපටි

---

ගාමෙ පිණ්ඩාය චරිස්සාමීති, ගොචරග්‍රාමයෙහි පිඬුසිගමියි; පත්ත
චීවරමාදාය, පාසිවුරුගෙන; ගච්ඡන්තො, යන්නේ; සචෙ, ඉදින්;
වත්තං වා අකතං පස්සති, (මහබෝ අඟන ආදි තැන) වතක් හෝ
නොකරනලදහු දකීද; පානීයඝටං වා රිත්තං, (කැමදෙනා පැන් එළ
විය යුතු තැන) සිස්කළ හෝ දකීද; අථ, ඉක්බිත්තෙන්; අනෙන,
මොහුවිසින්; වත්තං කාතබ්බං හොති, වත්කටයුතු වෙයි; පානීයං උපට්ඨ
පෙතබ්බං, පැන් එළවියයුතු වේ; අකරොන්තො, නො කරන්නේ;
වත්තභෙදෙ දුක්කටං ආපජ්ජති, වත්භෙදයෙන් දුකුළාවට අවදී;
කරොන්තස්ස, වත්කරන්නාහට; කාලො අතික්කමති, කල් ඉක්මේ;
අතිදිවා පවිට්ඨො, ඉතා දහවල් ගමටවන්නේ; නිට්ඨිතාය භික්ඛාය,
භික්ෂාව පළමුව වන් මහණනට දී නිමිකල; කිඤ්චි න ලභති,
කිසිවක් නො ලැබේ; පටිසල්ලානගතොපි, විවෙකයට ගියේද;
සාමණෙරදහරභික්ඛූනං, හෙරණුන්ගෙ ළදරුමහණුන්ගෙ; උච්චා
සද්දෙන, උස් හඬින් ද; සඞ්ඝකම්මෙහි ච, සඞ්ඝකර්මයෙන් ද; වික්ඛි
පති, වික්ෂෙපයට යේ; යත්ථ පන, යම් වෙහෙරක වනාහි; සබ්බං
වත්තං කතමෙව හොති, සියලු වත් කරනලද්දේම වේද; අවසෙසා
පිච ඝට්ටනා නත්ථි, සෙසු ගැහැටද නැද්ද; එවරූපෙ, එබඳුවූ;
මහාවිහාරෙපි, මහවෙහෙරද; විහාතබ්බං, විසියයුතු; නව විහාරෙ,
අලුත් වෙහෙර; බහුං නවකම්මං හොති, බොහෝ නවකර්ම ඇති
වේ; අකරොන්තං, නොකරන්නහුට; උජ්ඣායන්ති, කිපෙත්; යත්ථ
පන, යම්තැනෙක වනාහි; භික්ඛූ, මහණහු; එවං වදන්ති, මෙසේ
කියද්ද; ආයස්මා, ආවත්; යථා සුඛං, සුවසේ; සමණධම්මං කරොතු,
මහණදම් කෙරේවා; මයං, අපි; නවකම්මං කරිස්සාමාති, නවකර්ම
කරම්හයි; එවරූපෙ විහාරෙ, මෙබඳු වෙහෙර; විහාතබ්බං, විසියයුතු;
ජිණ්ණවිහාරෙ පන, ජරාවෙහෙර වනාහි; බහුං පටිජග්ගිතබ්බං හොති,
බොහෝ පිළිදැග්ගයුතු වේ; අන්තමසො, යටත්පිරිසෙයින්; අත්තනො
සෙනාසන මත්තම්පි, තමාගෙ සෙනසුන් පමණකුදු; අපටිජග්ගන්තං,

ජග්ගන්තං උජ්ඣායන්ති, පටිජග්ගන්තස්ස කම්මට්ඨානං පරිහායති. පඤ්ඤතිස්සතෙ මහාපථවිහාරෙ රත්තින්දිවං ආගන්තුකා සන්නිපතන්ති. විකාලෙ ආගතානං අත්තනො සෙනාසනං දත්වා රුක්ඛමූලෙ වා පාසාණපිට්ඨෙ වා වසිතබ්බං හොති. පුනදිවසෙපි එවමෙවාති කම්මට්ඨානස්ස ඔකාසො න හොති, යත්ථ පන එවරූපො ආගන්තුකසම්බාධො න හොති තත්ථ විහාතබ්බං. සොණ්ඩි නාම පසාණපොක්ඛරණී හොති, තත්ථ පානීයත්ථං මහාජනො සමොසරති. නගරවාසීනං රාජකුලූපගත්ථෙරානං අන්තෙවාසිකා රජනකම්මත්ථාය ආගච්ඡන්ති, තෙසං භාජනදාරුදොණිකාදීහි පුච්ඡන්තානං අසුකෙච අසුකෙච ඨානෙති දස්සෙතබ්බානි හොන්ති, එවං සබ්බකාලම්පි නිච්චබ්‍යාවටො හොති.

(ඇ) යත්ථ නානාවිධං සාකපණ්ණං හොති. තත්ථස්ස කම්මට්ඨානං ගහෙත්වා දිවාවිහාරං නිසින්නස්සාපි සන්තිකෙ සාකහාරිකා ගායමානා පණ්ණං උච්චිනන්තියො විසභාගසද්දසඞ්ඝට්ටනෙන කම්මට්ඨා

---

නොපිළිදගනහට; උජ්ඣායන්ති, කිපෙත්; පටිජග්ගන්තස්ස, පිළිදගනහට; කම්මට්ඨානං පරිහායති, කමටහන් පිරිහේ; පඤ්ඤතිස්සතෙ (පඤ්ඤතිස්සිතෙ-හි සේයි.) මහාපථවිහාරෙ, මහවත් සමීපයෙහි වෙහෙර; රත්තින්දිවං, රෑදහවල්; ආගන්තුකා සන්නිපතන්ති, ආගන්තුකයෝ රැස්වෙත්; විකාලෙ ආගතානං, නොකල්හි ආවානට; අත්තනො සෙනාසනං දත්වා, තමාගේ සෙනසුන දී; රුක්ඛමූලෙ වා, රුක්මුල හෝ; පාසාණපිට්ඨෙ වා වසිතබ්බං හොති, පහණපිටෙක හෝ විසියයුතු වේ; පුන දිවසෙපි, දෙවනදවසුදු; එවමෙවාති, මෙසේමනුයි; කම්මට්ඨානස්ස ඔකාසො න හොති, කමටහනට අවකාශ නොවේ; යත්ථ පන, යම් වෙහෙරෙක; [එවරූපො, මෙබඳු වූ; ආගන්තුකසම්බාධො, ආගන්තුකයන් ගෙන් ඇතිවන ගැහැටෙක්; න හොති, නොවේද; තත්ථ, එහි; විහාතබ්බං, විසියයුතුයි;] සොණ්ඩිනාම පාසාණපොක්ඛරණී හොති, කෙම් නම් වූ ගල්පොකුණු වේද; තත්ථ පානීයත්ථං, එහි පැන් පිණිස; මහාජනො, මහජනතෙමේ; සමොසරති, රැස්වෙයි; නගරවාසීනං, නුවර වසන් නාවූ; රාජකුලූපගත්ථෙරානං, රජකුලයට එළඹෙන තෙරවරුන්ගේ; අන්තෙවාසිකා, අතවැස්සෝ; රජනකම්මත්ථාය ආගච්ඡන්ති, රඳනකම් පිණිස එති; තෙසං, ඔවුන්ට; භාජනදාරුදොණිකාදීහි, රදන් තම්බන වළඳය දරය රදන් දෙණය යන මොහු; (ආදිග්‍රහණින් රදන් පිසන තැනය යනාදී ගත්හු.) පුච්ඡන්තානං, විචාරන්නාට; අසුකෙ ච අසුකෙ ච ඨානෙති, අසුවල් අසුවල් තැනයයි; දස්සෙතබ්බානි හොන්ති, දක්වියයුතු වෙත්; එවං, මෙසේ; සබ්බකාලම්පි, හැමදවස්හිම; නිච්චබ්‍යාවටො හොති, නිත්‍යයෙන් මෙහිම යුක්ත වේ.

(ඇ) යත්ථ, යම් වෙහෙරෙක; නානාවිධං, නොඑක් ප්‍රකාරවූ; සාකපණ්ණං හොති, පලාවේද; තත්ථ, ඒ වෙහෙර; අස්ස, මොහු; කම්මට්ඨානං ගහෙත්වා, කමටහන් ගෙන; දිවාවිහාරං නිසින්නස්සාපි සන්තිකෙ, දිවාවිහාරයේ හුන්නහු සමීපයෙහි; සාකහාරිකා, පලාගෙන යන මාගම්හු; ගායමානා පණ්ණං උච්චිනන්තියො, ගී කියමින් පලාබිඳිනාහු; විසභාග

නන්තරායං කරොන්ති. යත්ථ පන නානාවිධා මාලාගච්ඡා සුපුප්ඵිතා හොන්ති, තත්‍රාපි තාදිසොයෙව උපද්දවො. යත්ථ නානාවිධං අම්බ ජම්බුපනසාදි ඵලං හොති, තත්ථ ඵලත්ථිකා ආගන්ත්වා යාචන්ති. අදෙන්තස්ස කුජ්ඣන්ති, බලක්කාරෙන වා ගණ්හන්ති, සායණ්හසමයෙ විහාරමජ්ඣෙ චඞ්කමන්තෙන තෙ දිස්වා කිං උපාසකා එවං කරොථාති වුත්තා යථාරුචිං අක්කොසන්ති, අවාසායපිස්ස පරක්කමන්ති. යත්ථ නීයෙ පන ලොකසම්මතෙ දක්ඛිණගිරි හත්ථිකුච්ඡි චෙතියගිරි චිත්තල පබ්බතසදිසෙ විහාරෙ විහරන්තං අයං අරහාති සම්භාවෙත්වා වන්දිතු කාමා මනුස්සා සමන්තා ඔසරන්ති, තෙනස්ස න ඵාසු හොති, යස්ස පන තං සප්පායං හොති, තෙන දිවා අඤ්ඤත්ථ ගන්ත්වා රත්තිං වසි තබ්බං. නගරසන්නිස්සිතෙ විසභාගාරම්මණානි ආපාථං ආගච්ඡන්ති,

---

සද්දසඞ්ඝට්ටනෙන, විසභාග ශබ්දයන්ගේ සට්ටනයෙන්; කම්මට්ඨා නන්තරායං කරොන්ති, කමටහනට අන්තරාය කෙරෙත්; (කාමගුණූප සංහිත ගීතශබ්ද විසභාගශබ්දය යෙති-කොවල ස්ත්‍රීශබ්දයද විසභාග ශබ්දයයි ම දතයුතු.) යත්ථ පන, යම් වෙහෙරක; නානාවිධා මාලා ගච්ඡා, නොඑක් වැදෑරුම් මල්රුක්හු; සුපුප්ඵිතා හොන්ති, පිපීසිටිනාහු වෙද්ද; තත්‍රාපි, ඒ වෙහෙරද; තාදිසොයෙව උපද්දවො, එබඳුවූම උපද්‍රව වේ; යත්ථ, යම් වෙහෙරෙක; නානාවිධං, නොඑක් වැදෑරුම්වූ; අම්බජම්බු පනසාදි ඵලං හොති, අඹය දඹය කොස්ය යනාදී ඵල වේද; තත්ථ, එ වෙහෙරට; ඵලත්ථිකා ආගන්ත්වා, ඵලකැමැත්තනු අවුදින්; යාචන්ති, ඉල්වති; අදෙන්තස්ස, නොදෙන්නහට; කුජ්ඣන්ති, කිපෙති; බලක්කාරෙන වා ගණ්හන්ති, බලාත්කාරයෙන් හෝ ගණිති; සායණ්හසමයෙ, සවස්වේලෙහි; විහාරමජ්ඣෙ චඞ්කමන්තෙන, වෙහෙර මැද සක්මන්කරන මහණහු විසින්; තෙ දිස්වා, ඒ මිනිසුන් දැක; උපා සකා,උපාසක චරිති;කිං එවං කරොථාති වුත්තා,කුමක් හෙයින් මෙසේ කරුදැයි කියනලද්දාහු; යථාරුචිං අක්කොසන්ති, රිසිසේ ආක්‍රොශ කෙරෙත්; අස්ස, ඒ මහණහුගේ; අවාසායපි පරක්කමන්ති, නොවිසීම පිණිසද උත්සාහ කෙරෙත්;යත්ථනීයෙ පන,ප්‍රාචීනීයවූ;ලොකසම්මතෙ, ලෝවැස්සන් විසින් සම්භාවනා කටයුතුවූ; දක්ඛිණගිරි, දැකිණිගිරි වෙහෙරය; (මගධරට දැකිණිගිරිය යෙක්.) හත්ථිකුච්ඡි, ඇත්කුස් ලෙණය; චෙතියගිරි, සෑගිරිය; චිත්තලපබ්බත, සිතුල්පවුවය යන මොවුන් හා; සදිසෙ, සදෘශවූ (වැනිවූ); විහාරෙ විහරන්තං, වෙහෙර වසන්නහු; අයං අරහාති, මෙ රහතැයි; සම්භාවෙත්වා, සම්භාවනා කොට; වන්දිතුකාමා මනුස්සා, වඳනා කැමැති මිනිස්හු; සමන්තා, හාත් පසින්; ඔසරන්ති, රැස්වෙත්; තෙන, එහෙයින්; අස්ස, ඕහට; න ඵාසු හොති, පහසුනොවේ; යස්ස පන තං සප්පායං හොති, යමක්හට ඒ වෙහෙර සැපවී නම්; තෙන, ඔහු විසින්; දිවා අඤ්ඤත්ථ ගන්ත්වා, දහවල් අනික් තැනකට ගොස්; රත්තිං වසිතබ්බං, රෑ විසියයුතු; නගර සන්නිස්සිතෙ, නුවර සමීපයෙහි වෙහෙර;විසභාගාරම්මණානි, ඉට්ඨ අනිට්ඨ

කුම්භදාසියොපි සමෙහි නිඝංසන්තියො ගච්ඡන්ති, ඔක්කමිත්වා මග්ගං න දෙන්ති, ඉස්සරමනුස්සාපි විහාරමජ්ඣෙ සාණිං පරික්ඛිපිත්වා නිසීදන්ති. දුරුසන්නිස්සයෙ පන යත්ථ කට්ඨානි ච දබ්බූපකරණරුක්ඛා ච සන්ති, තත්ථ කට්ඨහාරිකා පුබ්බෙ වුත්තන සාකපුප්ඵහාරිකා විය අඵාසුං කාරෙන්ති. විහාරෙ රුක්ඛා සන්ති තෙපි ඡින්දිත්වා ඝරානි කරිස්සාමාති මනුස්සා ආගන්ත්වා ඡින්දන්ති, සචෙ සායණ්හසමයං පධානඝරා නික්ඛමිත්වා විහාරමජ්ඣෙ චඞ්කමන්තො තෙ දිස්වා කිං උපාසකා එවං කරොථාති වදති යථාරුචිං අක්කොසන්ති, අවාසායපිස්ස පරක්කමන්ති.

(අ) යො පන ඛෙත්තසන්නිස්සිතො හොති සමන්තා ඛෙත්තෙහි පරිවාරිතො, තත්ථ මනුස්සා විහාරමජ්ඣෙයෙව ඛලං කත්වා ධඤ්ඤං මද්දන්ති. පමුඛෙ සුස්සන්ති[1] අඤ්ඤම්පි බහුං අඵාසුං කාරෙන්ති, යත්‍රාපි

---

විසභාග අරමුණෝ; ආපාථං ආගච්ඡන්ති, හමුබවට එත්; කුම්භදාසියොපි, කළදැස්හුද; සමෙහි නිඝංසන්තියො, කළයෙන් සටමින්; ගච්ඡන්ති, යෙත්; ඔක්කමිත්වා, පහව; මග්ගං න දෙන්ති, මං නොදෙත්; ඉස්සරමනුස්සාපි, ඉසුරු මිනිස්හුද්; විහාරමජ්ඣෙ, වෙහෙර මැද; සාණිං පරික්ඛිපිත්වා, කඩරෙදි පරික්‍ෂෙප කොට; නිසීදන්ති, හිඳිත්; දුරුසන්නිස්සයෙ පන, දරඇසිරුවෙහෙර වනාහි; යත්ථ, යම් වෙහෙරක; කට්ඨානි ච, දරද; දබ්බූපකරණරුක්ඛා ච සන්ති, දැව උපකරණයට නිසිවූ රුක්හු ද ඇද්ද; තත්ථ, එ වෙහෙර; කට්ඨහාරිකා, දරගෙනයන මාගම්හු; පුබ්බෙ වුත්තන, පළමු කී; සාකපුප්ඵහාරිකා විය, සාකහාරිකා පුප්ඵහාරිකාවන් මෙන්; අඵාසුං කාරෙන්ති, අඵාසු කෙරෙති; විහාරෙ රුක්ඛා සන්ති, වෙහෙර වෘක්‍ෂයෝ වෙත්; තෙපි ඡින්දිත්වා, ඒ රුක් කපා; ඝරානි කරිස්සාමාති, ගෙ කරම්හයි; මනුස්සා ආගන්ත්වා, මිනිස්හු අවුත්; ඡින්දන්ති, කපති; සචෙ, ඉදින්; සායණ්හසමයං, සවස්වේලෙහි; පධානඝරා නික්ඛමිත්වා, ප්‍රධාන ගෘහයෙන් නික්ම; විහාරමජ්ඣෙ චඞ්කමන්තො, වෙහෙරමැද සක්මන්කරන මහණ; තෙ දිස්වා, ඒ මිනිසුන් දැක; උපාසකා, උපාසකවරිනි; කිං එවං කරොථාති වදති, කුමක් පිණිස මෙසේ කරව්දැයි කියන්නෙය; යථාරුචිං අක්කොසන්ති, රිසිසේ ආක්‍රොශ කෙරෙත්; අස්ස, ඒ මහණහුගේ; අවාසායපි, ඉහී නො විසීම පිණිසද; පරක්කමන්ති, උත්සාහ කෙරෙත්;

(අ) යො පන, යම් වෙහෙරෙක්; ඛෙත්තසන්නිස්සිතො හොති, කෙත් ඇසුරු කෙළේ වේද; සමන්තා, හාත් පසින්; ඛෙත්තෙහි පරිවාරිතො, ක්‍ෂෙත්‍රයෙන් පිරිවරනලද්ද; තත්ථ, ඒ වෙහෙර; මනුස්සා, මිනිස්හු; විහාරමජ්ඣෙයෙව,වෙහෙර මැදම;ඛලං කත්වා,කළවිටි කොට;ධඤ්ඤං මද්දන්ති,වී මඩනාහ;පමුඛෙ, නිසවත්තෙහි; සුස්සන්ති, වී වියළන්නාහ; බහුං,බොහොවූ;අඤ්ඤම්පි අඵාසුං කාරෙන්ති, අනික් අඵාසුද කරන්නා

---

1 සොසයන්ති-ක්‍රි. මු.

මහාසඞ්ඝභොගො හොති ආරාමිකකුලානං ගාවො රුන්ධන්ති උදකවාරං පටිසෙධෙන්ති, මනුස්සා වීහිසීසං ගහෙත්වා පස්සථ තුම්හාකං ආරාමිකකුලානං කම්මන්ති සඞ්ඝස්ස දස්සෙන්ති. තෙන තෙන කාරණෙන රාජරාජමහාමත්තානං ඝරවාරං ගන්තබ්බං හොති. අයම්පි ඛෙත්තසන්නිස්සිතෙනෙව සඞ්ගහිතො. විසභාගානං පුග්ගලානං අත්ථිතාති-යත්ථ අඤ්ඤමඤ්ඤං විසභාගා වෙරී භික්ඛූ විහරන්ති, යෙ කලහං කරොන්තා මා භන්තෙ එවං කරොථාති වාරියමානා එතස්ස පංසුකූලිකස්ස ආගතකාලතො පට්ඨාය නට්ඨම්හාති වත්තාරො භවන්ති. යොපි උදකපට්ටනං වා ථලපට්ටනං වා සන්නිස්සිතො හොති, තත්ථ අභිණ්හං නාවාහි ච සත්ථෙහි ච ආගතමනුස්සා ඔකාසං දෙථ පානීයං දෙථ ලොණං දෙථාති ඝට්ටයන්තා අඵාසුං කරොන්ති. පච්චන්තනිස්සිතෙ පන මනුස්සා බුද්ධාදිසු අප්පසන්නා හොන්ති. රජ්ජසීමනිස්සිතෙ රාජ

---

හුයි; යත්‍රාපි, යම් වෙහෙරෙක; මහාසඞ්ඝභොගො හොති, මහත් සඞ්ඝභොග ඇද්ද; ආරාමිකකුලානං ගාවො රුන්ධන්ති, ආරාමික කුලන්ගේ ගොයම් කෑ හයි ගෙරිබැඳ සිටුවති; උදකවාරං පටිසෙධෙන්ති, ගොයමට දියසුතු දියමුර වළකති; මනුස්සා, මිනිස්හු; වීහිසීසං ගහෙත්වා, වී කරල් කඩාගෙන; පස්සථ, බලව; තුම්හාකං, තොපගේ; ආරාමිකකුලානං කම්මන්ති, ආරාමික කුලයන්ගේ ක්‍රියායි; සඞ්ඝස්ස දස්සෙන්ති, සඞ්ඝයාහට දක්වති; තෙන තෙන කාරණෙන, ඒ ඒ කරුණෙන්; රාජරාජමහාමත්තානං ඝරවාරං ගන්තබ්බං හොති, රජරජ මහාමැතියන්ගේ ගෙට යායුතු වෙයි; අයම්පි, මෙද; ඛෙත්තසන්නිස්සිතෙනෙව සඞ්ගහිතො, ක්‍ෂෙත්‍රසන්නිශ්‍රිතයෙන්ම සඞ්ග්‍රහකරනලදී; "විසභාගානං පුග්ගලානං අත්ථිතා"-යන මෙහි; යත්ථ, යම් වෙහෙරෙක; අඤ්ඤමඤ්ඤං විසභාගා, ඔවුනොවුන්ට සභාගනොවූ; වෙරීභික්ඛූ විහරන්ති, වෛරී භික්‍ෂූහු වෙසෙද්ද; යෙ, යම් භික්‍ෂුකෙනෙක්; කලහං කරොන්තා, කලහකරන්නාහු; මා භන්තෙ එවං කරොථාති, වහන්ස එසේ නොකරන්නෝයි; වාරියමානා, වළකනු ලබන්නාහු; එතස්ස පංසුකූලිකස්ස ආගතකාලතො පට්ඨාය, මේ පාංශුකූලිකයා ආ කැන් පටන් ගෙන; නට්ඨම්හායි, නටුම්හයි; වත්තාරො භවන්ති, කියන්නාහු වෙත්; යොපි, යම් වෙහෙරෙක්; උදකපට්ටනං වා, මුහුදු ඇසිරුකළ පටුන (මුහුදු පටුන නදීඇසිරුකළපටුන යනාදිය දියඇසිරුකළපටුන් නම් වේ.) ථලපට්ටනං වා, අටවිමුඛාදීන් ඇසිරුකළ ගොඩපටුන් ද; සන්නිස්සිතො හොති, ආශ්‍රය කොළේ වේද; තත්ථ, එහි; අභිණ්හං, එක්වන්; නාවාහි ච, නැවින්ද; සත්ථෙහි ච, සත්ථයෙන් ද; ආගතමනුස්සා, ආ මිනිස්හු; ඔකාසං දෙථ, අවකාශදෙව; පානීයං දෙථ, පැන්දෙව; ලොණං දෙථාති, ලුණුදෙවයි; ඝට්ටයන්තා, ගහටකරන්නාහු; අඵාසුං කරොන්ති, අපහසු කෙරෙත්ද; පච්චන්තනිස්සිතෙ පන, ප්‍රත්‍යන්තනිශ්‍රිතයෙහි වනාහි; මනුස්සා, මිනිස්හු; බුද්ධාදිසු අප්පසන්නා හොන්ති, බුද්ධාදීන් කෙරෙහි අප්‍රසන්න වෙත්; රජ්ජසීම

භයං හොති. තං හි පදෙසං එකො රාජා න මය්හං වසෙ වත්තතීති පහරති, ඉතරොපි න මය්හං වසෙ වත්තතීති. තත්‍රායං භික්ඛු කදාචි ඉමස්ස රඤ්ඤො විජිතෙ විචරති, කදාචි එතස්ස, අථ නං චරපුරිසොති මඤ්ඤමානා අනයව්‍යසනං පාපෙන්ති. අසප්පායතාති-විසභාගරූපාදිආරම්මණසමොසරණෙන වා අමනුස්සපරිග්ගහිතතාය වා අසප්පායතා, තත්‍රිදං වත්‍ථු:-එකො කිර ථෙරො අරඤ්ඤෙ වසති. අථස්ස එකා යක්ඛිණී පණ්ණසාලද්වාරෙ ඨත්වා ගායි. සො නික්ඛමිත්වා ද්වාරෙ අට්ඨාසි. සා ගන්ත්වා චඞ්කමනසීසෙ ඨත්වා ගායි. ථෙරො චඞ්කමනසීසං අගමාසි. සා සතපොරිසෙ පපාතෙ ඨත්වා ගායි. ථෙරො පටිනිවත්ති. අථ නං සා වෙගෙනාගන්ත්වා ගහෙත්වා මයා භන්තෙ න එකො වෙ තුම්හාදිසා ඛාදිතාති ආහ. කල්‍යාණමිත්තතානං වා අලාභොති-යත්ථ

---

නිස්සිතෙ, රාජ්‍යසීමානිශ්‍රිතවෙහෙර; රාජභයං හොති, රාජභය වේ; තං හි පදෙසං, ඒ ප්‍රදෙශය; එකො රාජා, එක්රජෙක්; මය්හං වසෙ න වත්තතීති, මා වසයෙහි නො පවත්තෙයයි; පහරති, පහරන්නෙය; ඉතරොපි, අනික්රජ ද; න මය්හං වසෙ වත්තතීති, මා වසයෙහි නො පවත්නෙයයි; පහරති, පහරන්නෙය; තත්‍ර, ඒ වෙහෙර; අයං භික්ඛු, මේ මහණ; කදාචි, කිසිකලෙක; ඉමස්ස රඤ්ඤො විජිතෙ විචරති, මේ රජහුගේ විජිතයෙහි හැසිරෙයි; කදාචි, කිසිකලෙක; එතස්ස, ඒ රජහුගේ (විජිතයෙහි හැසිරේ); අථ, එසේ කල්හි; නං, ඒ මහණහු; චරපුරිසො අයන්ති, මේ චරපුරුෂයෙකැයි; මඤ්ඤමානා, සිතන්නාහු; අනයව්‍යසනං පාපෙන්ති, අනයව්‍යසනයට පමුණුවත්; (අනය නම් නොවැඩ ව්‍යසන නම් පීඩායි.) අසප්පායතාති, නො සැපබව නම්; විසභාගරූපාදිආරම්මණසමොසරණෙන වා, සභාගනොවන රූපාදී අරමුණන්ගේ ඔබින්ඔබ හැසිරීමෙන් හෝ; අමනුස්සපරිග්ගහිතතාය වා, යක්ෂයන් විසින් පරිගෘහීත බැවින් හෝ; අසප්පායතා, නො සැප බවයි; තත්‍ර, ඒ අසැපබැව්හි; ඉදං වත්‍ථු, මෙ වතෙකි; එකො කිර ථෙරො, එක් තෙරකෙනෙක්; අරඤ්ඤෙ වසති, අරණ්‍යයෙහි වෙසෙයි; අථ, එකල්හි; අස්ස, ඒ තෙරුන්ගේ; පණ්ණසාලද්වාරෙ ඨත්වා, පන්සල් දොර සිට; එකා යක්ඛිණී, එක් යකින්නක්; ගායි, ගීයක් කිවූ; සො, ඒ තෙරහු; නික්ඛමිත්වා, පන්සලින් නික්ම; ද්වාරෙ අට්ඨාසි, දොර සිටියහ; සා, ඒ යකිණී; ගන්ත්වා, ගොස්; චඞ්කමනසීසෙ ඨත්වා, සක්මන් ඉස සිට; ගායි, ගීයක්කිවූ; ථෙරො, තෙරහු; චඞ්කමනසීසං අගමාසි, සක්මන් ඉසට ගියහ; සා, ඒ යකිණී; සතපොරිසෙ පපාතෙ ඨත්වා ගායි, (ගීත ශබ්දයෙන් ආවහු ප්‍රපාතයෙහි හෙලාගෙන කම් යි) සියක් පුරුෂ ප්‍රමාණ ප්‍රපාතයෙහි සිට ගීයක් කිවූ; ථෙරො, තෙරහු; පටිනිවත්ති, වැලැක්කහ; අථ, ඉක්බිත්තෙන්; සා, ඒ යකිණී; නං, ඒ තෙරුන්කරා; වෙගෙනාගන්ත්වා, වේගයෙන් අවුත්; ගහෙත්වා, (කොයි යෙයිදූයි) ගෙන; භන්තෙ, වහන්ස; මයා, මාවිසින්; තුම්හාදිසා, තොපවැන්නෝ; ඛාදිතා, කනලද්දහු; න එකො වෙ, එකෙක් දෙන්නෙක් නොවෙති යි;

නසක්කා හොති ආචරියං වා ආචරියසමං වා උපජ්ඣායං වා උපජ්ඣාය සමං වා කල්‍යාණමිත්තං ලද්ධුං, තත්ථ සො කල්‍යාණමිත්තානං අලාභො මහාදොසො යෙවාති ඉමෙසං අට්ඨාරසන්නං දොසානං අඤ්ඤතරෙන සමන්නාගතො අනනුරූපොති වෙදිතබ්බො.

වුත්තම්පි චෙතං අට්ඨකථාසු:-

137 මහාවාසං නවාවාසං ජරුවාසඤ්ච පන්ථනිං,
සොණ්ඩිං පණ්ණඤ්ච පුප්ඵඤ්ච ඵලං පත්ථිතමෙව ච.

138 නගරං දාරුනා ඛෙත්තං විසභාගෙන පට්ටනං,
පච්චන්තසීමා සප්පායං යත්ථ මිත්තො න ලබ්භති.

139 අට්ඨාරසෙතානි ඨානානි ඉති විඤ්ඤාය පණ්ඩිතො,
ආරකා පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථාති.

---

ආහ, කිවු; "කල්‍යාණමිත්තානං වා අලාභො" යන්නෙහි, යත්ථ, යම් වෙහෙරක; (වෙහෙර සමීපයෙහි හෝ;) ආචරියං වා, ආචාර්‍ය්‍යයන් හෝ; ආචරියසමං වා, ආචාර්‍ය්‍යයන් හා සමවූ හෝ; උපජ්ඣායං වා, උපාධ්‍යාය යන් හෝ; උපජ්ඣායසමං වා, උපාධ්‍යායයන් හා සමවූහෝ; කල්‍යාණ මිත්තං ලද්ධුං, කල්‍යාණමිත්‍රයකු හෝ ලබන්නට; ("න සක්කාති" සි යොදනු) පිළිවන් නොවේද; තත්ථ, එහි; සො කල්‍යාණමිත්තානං අලාභො, ඒකල්‍යාණමිත්‍රයන්ගේ අලාභය; මහාදොසො යෙවාති, මහා දොෂයයි; ඉමෙසං අට්ඨාරසන්නං දොසානං අඤ්ඤතරෙන, මේ අට ළොස් දොසයන්කෙරෙන් එක්තරු එකෙකින්; සමන්නාගතො, සමන් විතවූයේ; අනනුරූපො ති, අනුරූපවිහාර නම් නොවේ යි; වෙදි තබ්බො, දතයුතු.

අට්ඨකථාසු, අටුවාකථායෙහි; එතං, මේ; වුත්තම්පි ච, කියනලදී.

137. මහාවාසං, මහවෙහෙර; නවාවාසං, නවවෙහෙර; ජරුවාසං, ජරුවාසවෙහෙර; පන්ථනිං, මහමං ඇසිරුකළවෙහෙර; සොණ්ඩිං, පැන් කොම්ඇතිවෙහෙර; පණ්ණං, පත්‍රඇතිවෙහෙර; පුප්ඵං, මල්ඇති වෙහෙර; ඵලං, ඵලඇතිවෙහෙර; පත්ථිතමෙව, පැතියයුතුවෙහෙර.

138. නගරං, නුවරඇසිරුකළවෙහෙර; දාරුනා, දාරුඇතිවෙහෙර හා සමග; ඛෙත්තං, කෙත්ඇසිරුකළවෙහෙර; විසභාගෙන, විසභාගය ඇසිරුකළවෙහෙර හා සමග; පට්ටනං, පටුන්ගම්ඇසිරුකළවෙහෙර; පච්චන්තං, ප්‍රත්‍යන්තඇසිරුකළවෙහෙර; සීම, රජසිම්ඇසිරුකළ වෙහෙර; අසප්පායං, නොසැපවෙහෙර; යත්ථ, යම්වෙහෙරෙක; මිත්තො න ලබ්භති, කල්‍යාණමිත්‍රයන් නොලැබේද යන.

139. එතානි අට්ඨාරසට්ඨානානි, මේ අටළොස්ස්ථානයන්; පණ්ඩිතො, නුවණැත්තේ; ඉති විඤ්ඤාය, මෙසේ දැන; පටිභයං මග්ගං යථා, භය ඇති මඟක්මෙන්; ආරකා, දුරින්ම; පරිවජ්ජෙය්‍ය, දුරුකරන්නේයි.

(ඇ) යො පන ගොචරගාමතො නාතිදූරනාච්චාසන්නතාදීහි පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො අයමනුරූපො නාම. වුත්තමෙතං හි භගවතා:—“කථඤ්ච භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ගසමන්නාගතං හොති? ඉධ භික්ඛවෙ සෙනාසනං නාතිදූරං හොති නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං, අප්පඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං හොති, තස්මිං ඛො පන සෙනාසනෙ විහරන්තස්ස අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තස්මිං ඛො පන සෙනාසනෙ ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා තෙ කාලෙන කාලං උපසඞ්කමිත්වා

---

(ඇ) යො පන, යම් වෙහෙරෙක්; ගොචරගාමතො, ගොචරග්‍රාමයෙන්; නාතිදූරනාච්චාසන්නතාදීහි, ඉතා දුරු නොවනබවය ඉතා ආසන්න නොවනබවය යනාදීවූ; පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො, පස්අඟින් සමන්විතද; අයං, මේ වෙහෙර; අනුරූපො නාම, අනුරූප නම් වේ; භගවතා, භගවත්හු විසින්; වුත්තමෙතං හි, මේ වදාළේමැයි; භික්ඛවෙ, මහණෙනි; සෙනාසනං, සෙනස්න; කථං පඤ්චඞ්ගසමන්නාගතං හොති, කෙසේ පඤ්චාඞ්ගයෙන් සමන්විතවේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මෙහි; සෙනාසනං, සෙනස්න; නාතිදූරං හොති, (අඞ්ගවූවෙකින් නොදුරුබැවින්) ඉතා දුරු නොවේද; නාච්චාසන්නං, (යමත්පිරිසෙයින් දුනුපන්සියයකට අඩු නොවනබැවින්) ඉතා ආසන්න නොවේද; ගමනාගමනසම්පන්නං, (ඉතා දුරු ඉතා ළං නොවනබැවිනුදු නිරුපද්‍රව සැප මං ඇතිබැවිනුදු) ගමනයටද ආගමනයටද සුවවේද; දිවා අප්පකිණ්ණං, දිවාභාගයෙහි මහජනයාවිසින් සඞ්කීර්ණනොවේ ද; රත්තිං අප්පසද්දං, (රුදවස ජනයාගේ බණනහඬ නැතිබැවින්) රාත්‍රියෙහි ශබ්දනැත්තේ ද; අප්පනිග්ඝොසං, (හැමවේලෙහිම ජනසන්නිපාතයෙන්වන නිර්ඝොෂ නැතිබැවින්) ගිගුරුම් හඬනැත්තේ ද; අප්පඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං හොති, මැසි මදුරු වාත ආතප දීඝජාතිය යන මොවුන්ගේ ඩැහැමෙන් (වෙරපැහැරීමෙන්) වන ස්පර්ශ නැත්තේවේ ද; තස්මිං සෙනාසනෙ, ඒ සෙනස්නෙහි; විහරන්තස්ස, වසන්නහට; චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, සිවුරුය පිණ්ඩපාතය සෙනාසනය ගිලන්පසය බෙහෙත්පිරිකරය යන මොහු; අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති, නො දුකින්ම උපදනාහුද; තස්මිං ඛො පන සෙනාසනෙ, ඒ සෙනස්නෙහි; ථෙරා භික්ඛූ විහරන්ති,[1] ස්ථවිරභික්ෂූහු වෙසෙති; බහුස්සුතා, සූත්‍රගෙයාදී බොහෝ ඇසූතැන් ඇති; ආගතාගමා, (වාචුග්ගතකරණයෙන්ද ගුරුන්කෙරෙහි මනාකොට උගත්බැවින්ද දන්නාලද පර්‍ය්‍යාප්තිධර්‍මම ඇතිබැවින්ද) විඥතවූ ආගමඇති; ධම්මධරා, සූත්‍රාභිධර්‍මසඞ්ඛ්‍යාතධර්‍මය දරුබැවින් ධර්‍මධරවූ; විනයධරා, විනයධරවූ; මාතිකාධරා, විනයාභිධර්‍ම මාතෘකා දරුබැවින් මාතෘකාධරවූ; (“ථෙරා භික්ඛූ විහරන්ති”යි සම්බන්ධකරනු;)

---

1. නිවසන්ති-යනුද පාඨයි.

පරිපුච්ඡන්ති පරිපඤ්හන්ති ඉදං භන්තෙ කථං ඉමස්ස කො අත්ථොති, තස්ස තෙ ආයස්මන්තො අවිවටඤ්චෙව විවරන්ති අනුත්තානීකතඤ්ච උත්තානී කරොන්ති අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති. එවං ඛො භික්ඛවෙ සෙනාසනං පඤ්චඞ්ග සමන්නාගතං හොතීති" අයං සමාධිභාවනාය අනනුරූපං විහාරං පහාය අනුරූපෙ විහරන්තෙනාති එත්ථ විත්ථාරො.

(ඇ) ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වා–එවං පතිරූපෙ සෙනාසනෙ[1] විහරන්තෙන–යෙපිස්ස තෙ හොන්ති ඛුද්දකා පලිබොධා තෙපි උපච්ඡින්දිතබ්බා, සෙය්‍යථිදං? දීඝානි කෙසනඛලොමානි ඡින්දිතබ්බානි, ජිණ්ණචීවරෙසු දළ්හීකම්මං වා තුන්නකම්මං වා කාතබ්බං, කිලිට්ඨානි වා රජි

---

තෙ, ඒ තෙරවරුන්කරා; කාලෙන කාලං උපසඞ්කමිත්වා, කලින්කල එළඹ; පරිපුච්ඡන්ති, පෙළදම්හි සැකපිළිවිසිද්ද, පරිපඤ්හන්ති, අර්ථවිචාරණය කෙරේද; භන්තෙ, වහන්ස; ඉදං කථං, මේ පදය කෙසේද; ඉමස්ස කො අත්ථො ති, මේ පදයාගේ අර්ථ කවරේදැයි කියා; ("පරිපුච්ඡන්ති, පරිපඤ්හන්තියි යොදනු.) තස්ස, ඔහට; තෙ ආයස්මන්තො, ඒ ආයුෂ්මත්හු; අවිවටඤ්චෙව විවරන්ති, (ප්‍රදෙශාන්තර පාළිදර්ශනයෙන්) ආගමවශයෙන් පාඨාර්ථය ප්‍රකාශ කෙරෙති; අනුත්තානීකතඤ්ච උත්තානී කරොන්ති, අනුත්තානවූ (ගැඹුරුවූ) අර්ථය (යුක්තිවිභාවනයෙන්) උත්තානකෙරෙති; අනෙකවිහිතෙසු, අනෙකවිධවූ; කඞ්ඛාඨානියෙසු ධම්මෙසු, සංශයොත්පත්ති කාරණවූ බැවින් ග්‍රන්ථිස්ථානවූ පාළිප්‍රදෙශයෙහි; කඞ්ඛං පටිවිනොදෙන්ති, (යථාවයෙන් විනිශ්චයදීමෙන්) කාඞ්ක්ෂාව දුරුකෙරෙත්; එවංඛො, මෙසේ; භික්ඛවෙ, මහණෙනි; සෙනාසනං, පඤ්චඞ්ගසමන්නාගතං හොතීති, සෙනාසනය පඤ්චාඞ්ගයෙන් යුක්තවෙයි; ("වුත්තං හෙතං භගවතා"යි යොදනු- මෙහි නාතිදූරං හොති නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං–යනු එක් අඟෙකි, දිවා අප්පාකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං–යනු එකෙකි, අප්ප ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං ඛො පන හොති-යි යනු එකෙකි, තස්මිං ඛො පන සෙනාසනෙ විහරන්තස්ස...පෙ...පරික්ඛාරා-යනු එකෙකි, තස්මිං ඛො පන සෙනාසනෙ ථෙරා...පෙ...කඞ්ඛං පටිවිනොදෙන්ති-යනු එකෙකි;) අයං, මේ...පෙ...එත්ථ විත්ථාරො, මෙහි විස්තරයි...

(ඇ) ඛුද්දක...පෙ...කත්වාති "ඛුද්දක පලිබොධුපච්ඡෙදං කත්වා" යන මෙහි; එවං, මෙසේ; පතිරූපෙ සෙනාසනෙ විහරන්තෙන, සුදුසු සෙනස්නෙහි වසන්නහු විසින්; අස්ස, ඔහුගේ; යෙපි තෙ හොන්ති ඛුද්දකාපලිබොධා, යම් ඒ ක්ෂුද්‍ර පලිබොධ කෙනෙක් ඇද්ද; තෙපි උපච්ඡින්දිතබ්බා, උහුදුපසිඳයුතු; [සෙය්‍යථිදං, ඔහු කවරහුද යත්? දීඝානි කෙසනඛලොමානි, දික්වූ කෙස් නිය ලොම්; ඡින්දිතබ්බානි, සිඳියයුත්තාහුය; ජිණ්ණචීවරෙසු, දිරාගිය සිවුරෙහි; දළ්හීකම්මං වා, දැඩිකම්හෝ; තුන්නකම්මං වා, ගෙත්තම්හෝ; කාතබ්බං, කටයුතුයි;

---

1. විහාරෙ-කත්ථචි

තබ්බානි, සචෙ පනෙත්ථ මලං හොති පත්තො පචිතබ්බො, මඤ්චපීඨාදීනි සොධෙතබ්බානීති. අයං ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වාති එත්ථ විත්ථාරො. ඉදානි–"**සබ්බං භාවනාවිධානං අපරිහාපෙන්තෙන භාවෙතබ්බා**"ති–එත්ථ අයං පථවීකසිණං ආදිං කත්වා සබ්බකම්මට්ඨානවසෙන විත්ථාරකථා හොති. එවං උපච්ඡින්නඛුද්දකපලිබොධෙන හි භික්ඛුනා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෙන භත්තසම්මදං පටිවිනොදෙත්වා පවිවිත්තෙ ඔකාසෙ සුඛනිසින්නෙන කතාය වා අකතාය වා පථවියා නිමිත්තං ගණ්හිතබ්බං. වුත්තං හෙතං:–"පථවීකසිණං උග්ගණ්හන්තො පථවියං නිමිත්තං ගණ්හාති කතෙ වා අකතෙ වා

---

කිලිට්ඨානි වා, කිලිටිසිවුරු හෝ; රජිතබ්බානි, රැදියයුත්තාහුය; සචෙ, ඉදින්; පනෙත්ථ මලං හොති, පාත්‍රයෙහි මලඇත්තේවීනම්; පත්තො පචිතබ්බො, පය පිසියයුතු; මඤ්චපීඨාදීනි, මැසිපුටු ආදිය; සොධෙතබ්බානීති, පිරිසුදු කටයුත්තාහුය යත; අයං, මේ; ඛුද්දකපලිබොධුපච්ඡෙදං කත්වාති එත්ථ, කුඩාපිලිබුදුපසිඳීමකොටය යනමෙහි; විත්ථාරො, විස්තරයි; ඉදානි, දැන්; සබ්බං භාවනාවිධානං, සියලුභාවනාවිධිය; අපරිහාපෙන්තෙන, නොපිරිහෙළන්නහු විසින්; භාවෙතබ්බාති එත්ථ, වැඩියයුතුය යනමෙහි; පථවීකසිණං ආදිංකත්වා, පඨවිකිසුණ මුල්කොට; සබ්බකම්මට්ඨානවසෙන, අනුක්‍රමයෙන් දක්වන සතළිස් ආකාරවූ සියලුකමටහන්ගේ වශයෙන්; අයං විත්ථාරකථා හොති, මේ විස්තර කථාව වේ; එවං උපච්ඡින්නඛුද්දකපලිබොධෙන හි, මෙසේ පසිඳිනාලද කුඩා පිළිබුදු ඇති; පිණ්ඩපාත පටික්කන්තෙන, පිණ්ඩපාතපරිභොගයෙන් පෙරළා ආවාවූ; භික්ඛුනා, මහණවිසින්; පච්ඡාභත්තං, බතට පසුකාලයෙහි; භත්තසම්මදං පටිවිනොදෙත්වා, භොජනනිමිත්තයෙන් උපදනා විඩා සන්සිඳුවා; (ආහාරය ආහාරාසයට පිවිසිකල ආහාරයාගේ ආගන්තුකබැවින් බොහෝසෙයින් ශරීරවිඩා උපදනේය ඒ ව්‍යුපශමය නුවූකල ශරීරඛෙදයෙන් චිත්තෙකාග්‍රතාව නොලබන හෙයින් ඒ විඩා සන්සිඳුවාය යුතුයි.) පවිවිත්තෙ ඔකාසෙ, ජනවිවික්තස්ථානයෙක්හි; සුඛ නිසින්නෙන, පලක්බැඳ ශරීරය සෘජුව තබා සැපසේ හුන්නහු] විසින්; කතාය වා අකතාය වා, කරනලද හෝ නොකරනලද හෝ; පථවියා,පෘථිවියෙහි; නිමිත්තං ගණ්හිතබ්බං, නිමිත්තගතයුතු; වුත්තං හෙතං,(පරණ අටුවායෙහි) කියේමැනු; පථවීකසිණං උග්ගණ්හන්තො, උද්ග්‍රහනිමිත්තභාවයෙන් පඨවිකිසුණ උගන්නේ; පථවියං, (වක්ෂ්‍යමාණවිශෙෂඇති) පෘථිවිමණ්ඩලයෙහි; නිමිත්තං ගණ්හාති,(ආදශීතලයෙහි මුඛනිමිත්තය ඇසින් ගන්නක්හු මෙන් භාවනා නුවණින් වක්ෂ්‍යමාණ විශෙෂ ඇති) පෘථිවි නිමිත්තය ගණී; ("පථවියං"යි කිවද මණ්ඩලාපෙක්ෂාවෙන් නපුංසකනිද්දෙශකොළේ)කතෙ වා, වක්ෂ්‍යමානවිධින් කරනලද හෝ අකතෙවා, නොකරනලද (බලමණ්ඩලාදී) පෘථිවිමණ්ඩලයෙහි හෝ;

**සාන්තකෙ නො අනන්තකෙ, සකොටිකෙ නො අකොටිකෙ, සවට්ටුමෙ නො අවට්ටුමෙ, සපරියන්තෙ නො අපරියන්තෙ, සුප්පමත්තෙ වා සරාවමත්තෙ වා. සො තං නිමිත්තං සුග්ගහිතං කරොති සූපධාරිතං උපධාරෙති සුවවත්ථිතං වවත්ථපෙති, සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා සුවවත්ථිතං වවත්ථපෙත්වා ආනිසංසදස්සාවී රතනසඤ්ඤී හුත්වා චිත්තීකාරං උපට්ඨපෙත්වා සම්පියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධති අද්ධා ඉමාය පටිපත්තියා[1] ජරාමරණම්හා මුච්චිස්සාමීති. සො විවිච්චෙව කාමෙහි…පෙ…පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරතී"ති…**

---

සාන්තකෙ, අන්තසහිතමවූ; (ස පරිච්ඡෙදමවූ යන අර්ථයි.) නො අනන්තකෙ, අනන්තනැතිවූ; ("සකොටිකෙ"යනාදීහු-සාන්තකෙ යනාදීන් හා සමානාර්ථයෝයි.) සුප්පමත්තෙ වා, සුළුකුලුපමණවූ හෝ; සරාවමත්තෙ වා, මලාවක් පමණ වූ හෝ; (මිහි සුප්ප සරාව දෙදෙනා සමප්‍රමාණවූවාහු පසස්නාලදහු.) සො, ඒ යොගාවචරතෙමෙ; තං නිමිත්තං, ඒ පෘථිවිමණ්ඩලය; සුග්ගහිතං කරොති, මනාකොට ගන්නාලද්දක් කෙරේ; (යම්කලෙක උන්මීලිතකාලයෙහි මෙන් නිමීලිතකාලයෙහි වැටහේද එකල්හි මනාකොට ගන්නාලද්දනම් වේ.) සූපධාරිතං උපධාරෙති, මනාකොට සලකනලදුකොට සලකා (ස්මෘතිය එළවා අවහිතවූ සිතින් නැවත නැවත සලකන්නේ මනාකොට සලකනලදුකොට සලකන්නේ නම් වේ.) සුවවත්ථිතං, මනාකොට නියමකරනලදුකොට; වවත්ථපෙති, නියමකෙරේ; සො, ඒ යොගීතෙම; තං නිමිත්තං, ඒ පෘථිවිමණ්ඩලය; සුග්ගහිතං කත්වා, මනාකොට ගන්නාලදුකොට; සූපධාරිතං උපධාරෙත්වා, මනාකොට සලකනලදු කොට සලකා; සුවවත්ථිතං වවත්ථපෙත්වා, මනාකොට නියමකරනලදු කොට නියම කොට; ආනිසංසදස්සාවී, අනුසස් දක්නේ; රතනසඤ්ඤී හුත්වා, රත්නසංඥ ඇතිව; චිත්තීකාරං උපට්ඨපෙත්වා, ගෞරවඑළවා; සම්පියායමානො, සොම්නස්වෙමින්; තස්මිං ආරම්මණෙ, සුගෘහිතකරණාදීන් මනාව වැටහුණු පෘථිවිකසුණු අරමුණෙහි; චිත්තං උපනිබන්ධති, තමාගේ සිත උපචාරධ්‍යානයට පමුණුවා බඳී; (අන්‍යාලම්බනයෙන් වළකා) අද්ධා, ඒකාන්තයෙන්; ඉමාය පටිපත්තියා, මෙ පිළිවෙතින්; ජරාමරණම්හා මුච්චිස්සාමීති, ජරාමරණයෙන් මිදෙමි යි; අද්ධායනාදීන් අනෘශංසදර්ශීබව දැක්වූහු.) සො, ඒ යොගීතෙමෙ; විවිච්චෙව කාමෙහි, කාමයන් කෙරෙන් වෙන්ව; [විවිච්ච අකුසලෙහි; ධම්මෙහි, අකුශලධර්මයන් කෙරෙන් වෙන්ව]; පඨමජ්ඣානං උපසම්පජ්ජ, ප්‍රථමධ්‍යානය උපදවා; විහරති, වෙසේ…

---

1. පටිපදය-සාළුවි·

(අ) තත්‍ථ යෙන අතීතභවෙපි සාසනෙ වා ඉසිපබ්බජ්ජාය වා පබ්බජිත්‍වා පඨවිකසිණෙ චතුක්කපඤ්චකජ්ඣානානි නිබ්බත්තිතපුබ්බානි, එවරූපස්ස පුඤ්ඤවතො උපනිස්සයසම්පන්නස්ස අකතාය පඨවියා කසිතට්ඨානෙ වා ඛලමණ්ඩලෙ වා නිමිත්තං උප්පජ්ජති. මල්ලකත්ථෙරස්ස විය—තස්ස කිරායස්මතො කසිතට්ඨානං ඔලොකෙන්තස්ස තණ්ඨානප්පමාණමෙව නිමිත්තං උදපාදි, සො තං වඩ්ඪෙත්‍වා පඤ්චකජ්ඣානානි නිබ්බත්තෙත්‍වා ඣානපදට්ඨානං විපස්සනං පට්ඨපෙත්‍වා අරහත්තං පාපුණි. යො පන එවං අකතාධිකාරො හොති තෙන ආචරියසන්තිකෙ[1] උග්ගහිතං කම්මට්ඨානවිධානං අවිරාධෙත්‍වා චත්තාරො කසිණදොසෙ පරිහරන්තෙන කසිණං කාතබ්බං. නීල පීත ලොහිතොදාත සම්භෙදවසෙන හි චත්තාරො පඨවිකසිණදොසා, තස්මා නීලාදිවණ්ණං මත්තිකං අග්ගහෙත්‍වා ගඞ්ගාවහෙ මත්තිකාසදිසාය

---

(අ) (දැන් දක්වනලද අටුවාපාඨයාගේ අර්ථප්‍රකාශකිරීම හා සමග භාවනාවිධිය පැහැදිලිකරණුවෝ-තත්‍ථ යනාදි කීහු.) තත්‍ථ, ඒ දෙක්හි; යෙන, යමෙක්හු විසින්; අතීතභවෙ පි, අතීතබෙවෙහිදු; සාසනෙ වා, බුදුසස්නෙහි හෝ; ඉසිපබ්බජ්ජාය වා, ඍෂිප්‍රව්‍රජ්‍යාවෙහි හෝ; පබ්බජිත්‍වා, පැවිදිව; පඨවිකසිණෙ, පඨවිකිසුණෙහි; චතුක්කපඤ්චකජ්ඣානානි, චතුෂ්ක පඤ්චක ධ්‍යානයෝ; නිබ්බත්තිතපුබ්බානි, නිපදවනලද විරූද; එවරූපස්ස, එබඳුවූ; පුඤ්ඤවතො, භාවනාමය පිනැතියහට; උපනිස්සයසම්පන්නස්ස, එබඳුම උපනිශ්‍රයෙන් සමන්විතයහට; අකතාය පඨවියා, නොකරනලද පෘථිවියෙහි; කසිතට්ඨානෙ වා, සාවතැන හෝ; ඛලමණ්ඩලෙ වා, කලවිටිමඬුල්ලෙහි හෝ; නිමිත්තං උප්පජ්ජති, ප්‍රතිභාග නිමිත්ත උපදී; මල්ලකත්ථෙරස්ස විය, මල්ලක නම් තෙරුන්ට මෙනි; තස්ස කිරායස්මතො, ඒ ආවත්හු; කසිතට්ඨානං ඔලොකෙන්තස්ස, සාවතැන් බලන්නහුට; තණ්ඨානප්පමාණමෙව, ඒ බැලූතැන් පමණවම; නිමිත්තං උදපාදි, ප්‍රතිභාගනිමිත්ත උපනී; සො, ඒ තෙරහු; තං වඩ්ඪෙත්‍වා, ඒ නිමිත්ත වඩා; පඤ්චකජ්ඣානානි නිබ්බත්තෙත්‍වා, පස්ධ්‍යාන් උපදවා; ඣානපදට්ඨානං විපස්සනං පට්ඨපෙත්‍වා, ධ්‍යාන්පාදකකොට විදර්ශනාවට පටන්ගෙන; අරහත්තං පාපුණි, රහත්බවට පැමිණියෝ; යො පන, යමෙක්වනාහි; එවං අකතාධිකාරො හොති, මෙසේ කෘතාධිකාර නොවේනම්; තෙන, උහුවිසින්; ආචරියසන්තිකෙ,[1] ආචාර්‍ය්‍යයන්සමීපයෙහි; උග්ගහිතං කම්මට්ඨානවිධානං, උගත් කමටහන් විධිය; අවිරාධෙත්‍වා, නොවරදවා; චත්තාරො කසිණදොසෙ පරිහරන්තෙන, සතරකිසුණුදොසුන් දුරුකරන්නහු විසින්; කසිණං කාතබ්බං, කිසුණකටයුතු; නීල පීත ලොහිතොදාත සම්භෙදවසෙන හි, නිල්වන් රන්වන් සුදු පැහැඇති මැටි මුසුවීම් විසින්; චත්තාරො පඨවිකසිණදොසා, පඨවිකිසුණු දොස්හු සතරදෙනෙකි; තස්මා, එහෙයින්; නීලාදිවණ්ණං මත්තිකං අග්ගහෙත්‍වා, නීලාදිවර්‍ණ

---

1. ආචරියස්ස සන්තිකෙ - ත්‍රි. මු.

අරුණවණ්ණාය මත්තිකාය වුත්තං කසිණං[1] කාතබ්බං, තඤ්ච බො විහාරමජ්ඣෙ සාමණෙරාදීනං සඤ්චරණට්ඨානෙ න කාතබ්බං, විහාරපච්චන්තෙ පන පටිච්ඡන්නට්ඨානෙ පබ්භාරෙ වා පණ්ණසාලාය වා සංහාරිමං වා තත්‍රට්ඨකං වා කාතබ්බං.

(අ) තත්‍ර සංහාරිමං චතූසු දණ්ඩකෙසු පිලොතිකං වා චම්මං වා කටසාරකං වා බන්ධිත්වා තත්ථ අපනීතතිණමූලසක්ඛරවාලිකාය සුමද්දිතාය මත්තිකාය වුත්තප්පමාණං වට්ටං ලිම්පිත්වා කාතබ්බං, තං පරිකම්මකාලෙපි භූමියං අත්ථරිත්වා ඔලොකෙතබ්බං, තත්‍රට්ඨකං භූමියං පදුමකණ්ණිකාකාරෙන ඛාණුකෙ ආකොටෙත්වා වල්ලීහි විනන්ධිත්වා කාතබ්බං, යදි සා මත්තිකා නප්පහොති අධො අඤ්ඤං පක්ඛිපිත්වා උපරිභාගෙ සුපරිසොධිතාය අරුණවණ්ණාය මත්තිකාය

---

ඇති මැටි නොගෙන; ගඞ්ගාවහෙ මත්තිකාසදිසාය, රවුළගං සැඩපහරින් පහළ හිත්තියෙහි මැටි වැනි වූ; අරුණවණ්ණාය මත්තිකාය, අරුණුවන් මැටියෙන්; වුත්තං කසිණං කාතබ්බං, කියනලද පඨවි කිසුණ කටයුතු; තඤ්ච බො, හේ කිසුණද; විහාරමජ්ඣෙ, වෙහෙරමැද; සාමණෙරාදීනං සඤ්චරණට්ඨානෙ, හෙරණආදීන්ගේ සඤ්චරණස්ථානයෙහි; න කාතබ්බං, නො කටයුතු; විහාරපච්චන්තෙ පන, විහාර පර්‍යන්තයෙහි වනාහි; පටිච්ඡන්නට්ඨානෙ, මුවහතැන; පබ්භාරෙ වා, නැමී සිටි ගල්යටෙක හෝ; පණ්ණසාලාය වා, පන්සලෙක හෝ; සංහාරිමං වා, ගෙනයා ඇකිකොට හෝ; තත්‍රට්ඨකං වා, ඉහිම සිටිනා කොට හෝ; කාතබ්බං, කටයුතු.

(අ) තත්‍ර, එ දෙක්හි; සංහාරිමං, සංහාරිම කිසුණ; චතූසු දණ්ඩකෙසු, දඬුසතරෙක; පිලොතිකං වා, රෙදිකඩක් හෝ; චම්මං වා, සමක් හෝ; කටසාරකං වා, කලාල්කඩක් හෝ; (හුණුපපිරිඑව් යනු සන්නයි.) බන්ධිත්වා, බැඳ; තත්ථ, එහි; අපනීත, පහකරනලද; තිණමූලසක්ඛරවාලිකාය, තණමුල් හකුරු වැලිඇති; සුමද්දිතාය, මනාකොට මඩනාලද; මත්තිකාය, මැටියෙන්; වුත්තප්පමාණං[2], එක්වියත්සතරඟුල්පමණකොට; වට්ටං, වටකොට; ලිම්පිත්වා කාතබ්බං, ලෙපකර කටයුතු; තං, එය; පරිකම්මකාලෙපි, නිමිත්තග්‍රහණයෙන් භාවනාකරනකාලයෙහිද; භූමියං අත්ථරිත්වා, භූමියෙහි අතුට; (බිමතබාය යනඅර්ථයි.) ඔලොකෙතබ්බං, බැලියයුතු; තත්‍රට්ඨකං, තත්‍රට්ඨකකිසුණ; භූමියං, බිම; පදුමකණ්ණිකා කාරෙන, පියුම්කෙමි ආකාරයෙන්; ඛාණුකෙ ආකොටෙත්වා, කණුගසා; වල්ලීහි විනන්ධිත්වා, වැලින් බැඳ; කාතබ්බං, කටයුතු; යදි, ඉදින්; සා මත්තිකා නප්පහොති, ඒ අරුණුවන්මැටි නොසෑහේ නම්; අධො අඤ්ඤං පක්ඛිපිත්වා, යට අනික්මැටියක් බහාලා; උපරිභාගෙ, මතුපිට; සුපරිසොධිතාය, තණමුල් ආදීන් පහකොට පිරිසුදුකරනලද; අරුණවණ්ණාය

---

1 මත්තිකාය කසිණං-ශ්‍රී. මු. 2. විදත්ථිචතුරඞ්ගුලප්පමාණං-සන්න.

විදත්ථිචතුරඞ්ගුලවිත්ථාරං වට්ටං කාතබ්බං, එතදෙවහි පමාණං සන්ධාය සුප්පමත්තං වා සරාවමත්තං වාති වුත්තං. "සාන්තකො හො අනන්තකො" ති. ආදිපනස්ස පරිච්ඡෙදත්ථාය වුත්තං, තස්මා එවං වුත්තප්පමාණපරිච්ඡෙදං කත්වා රුක්ඛපාණිකා විසභාගවණ්ණං සමුට්ඨාපෙති තස්මා තං අගහෙත්වා පාසාණපාණිකාය සංසිත්වා සමං භෙරිතලසදිසං කත්වා තං ඨානං සම්මජ්ජිත්වා න්හාත්වා ආගන්ත්වා කසිණමණ්ඩලතො අඩ්ඪතෙය්‍යහත්ථන්තරෙ පදෙසෙ පඤ්ඤත්තෙ විදත්ථිචතුරඞ්ගුලපාදකෙ සුඅත්ථතෙ පීඨෙ නිසීදිත්වා[1] තතො දූරතරෙ නිසින්නස්ස හි කසිණං න උපට්ඨාති, ආසන්නතරෙ කසිණදොසා පඤ්ඤායන්ති, උච්චතරෙ නිසින්නෙන ච ගීවං ඔනමිත්වා ඔලොකෙතබ්බං

---

මත්තිකාය, අරුණුවන්මැටියෙන්; විදත්ථිචතුරඞ්ගුලවිත්ථාරං, එක්වියත් සතරඟුලක් පළලකොට; වට්ටං කාතබ්බං, වටකොට කටයුතු; එතදෙවහි පමාණං සන්ධාය, "විදත්ථිචතුරඞ්ගුලං"යි කියනලදපමණම සඳහා; සුප්පමත්තං වා සරාවමත්තං වාති වුත්තං, "සුප්පමත්තං වා සරාවමත්තං වා"යි කියනලදී; (එහි කුල්ලද ඉතාමහත් නොවූයේ මලාවද මහත් සැළක් පියාලනලද පමණම සමප්‍රමාණවූයේ වේ.) "සාන්තකො හො අනන්තකො" යනාදි වනාහි; අස්ස, ඒ කසිණයාගේ; පරිච්ඡෙදත්ථාය වුත්තං, පරිච්ඡෙදය පිණිස කියනලදී; තස්මා, එහෙයින්; එවං වුත්තප්පමාණ පරිච්ඡෙදං කත්වා, එක්වියත්සතරඟුලක් පළල පරිච්ඡෙදකොට; (නොහොත් එක්වියත් සතරඟුලක් පමණ කිසුණ විසභාගවර්ණයකින් පරිච්ඡෙදකොට;) රුක්ඛපාණිකා, කසඳුන් ආදී දඬුපෙණය; විසභාග වණ්ණං සමුට්ඨාපෙති, අරුණුවන් පැහැයට විසභාගවර්ණය උපදවයි; තස්මා, එහෙයින්; තං අගහෙත්වා, ඒ දඬුපෙණය නොගෙන; (පියවිරුක් පෙණය ගල්පෙණයෙහිම ඇතුළත්වෙයි හඟනේ.) පාසාණපාණිකාය සංසිත්වා, ගල්පෙණින් ගා; සමං, සමකොට; භෙරිතලසදිසං කත්වා, බෙර මුහුණක් මැනිකොට; තං ඨානං සම්මජ්ජිත්වා, එතැන හැමද; න්හාත්වා ආගන්ත්වා, නාහාඅවුත්; කසිණමණ්ඩලතො, කිසුණුමඬුල්ලෙන්; අඩ්ඪතෙය්‍යහත්ථන්තරෙ පදෙසෙ, දෙරියන් වියතක්පමණ අතුර ඇති ප්‍රදේශයෙහි; (මඬුල්ලහා හිඳිනා පුටුව හා මැද දෙරියන් වියතක් තබා යයි සේයි.) පඤ්ඤත්තෙ, පනවනලද; විදත්ථිචතුරඞ්ගුලපාදකෙ, එක් වියත්සතරඟුල් පා ඇති; සුඅත්ථතෙ පීඨෙ, මොළොක්කොට අතුළ පුටුයෙහි; නිසීදිත්වා[1], හිඳ; ("නිමිත්තං ගණ්හන්තෙන භාවෙතබ්බං" යනු හා යොදනු.) තතො දූරතරෙ නිසින්නස්සහි, මඬුල්ලෙන් දෙරියන් වියතකින් දුරුව හුන්නාහට; කසිණං න උපට්ඨාති, කිසුණ නො වැටහේ; ආසන්නතරෙ, දෙරියන්වියතකින් ළංව හුන්නාහට; කසිණ දොසා පඤ්ඤායන්ති, කිසුණුදෙස් පැනේ; උච්චතරෙ නිසින්නෙන, කීපමණින් උස්තැන්හි හුන්නහුවිසින්; ගීවං ඔනමිත්වා ඔලොකෙ

---

I. නිසීදිතබ්බං-ත්‍රි. මූ.

හොති, නීචතරෙ ජණ්ණුකානි රුජන්ති, තස්මා වුත්තනයෙනෙව නිසීදිත්වා **අප්පස්සාදා කාමාති** ආදිනා නයෙන කාමෙසු ආදීනවං පච්චවෙක්ඛිත්වා කාමනිස්සරණෙ සබ්බදුක්ඛසමතික්කමස්ස උපායභූතෙ නෙක්ඛම්මෙ ජාතාභිලාසෙන බුද්ධධම්මසඞ්ඝගුණානුස්සරණෙන පීතිපාමොජ්ජං ජනයිත්වා අයං දානි සා සබ්බබුද්ධපච්චෙකබුද්ධඅරියසාවකෙහි පටිපන්නා නෙක්ඛම්මපටිපදාති පටිපත්තියා සඤ්ජාතගාරවෙන අද්ධා ඉමාය පටිපත්තියා පවිවෙකසුඛරසස්ස භාගී භවිස්සාමීති උස්සාහං ජනයිත්වා සමෙන ආකාරෙන චක්ඛූනි උම්මීලෙත්වා නිමිත්තං ගණ්හන්තෙන භාවෙතබ්බං. අතිඋම්මීලයතො හි චක්ඛුං කිලමති මණ්ඩලඤ්ච අතිවිභූතං හොති, තෙනස්ස නිමිත්තං නුප්පජ්ජති, අති

---

තබ්බං හොති, කරතමා නැඹුරුව ගෙන බැලියයුතු වේ; නීචතරෙ, මිටියෙහි හුන්නහුගේ; ජණ්ණුකානි රුජන්ති, දෙදනම්බුලු රෙදෙයි; ("ජණ්ණුකානි රුජන්ති" යනු පය එල්වා හිඳිනාහෙයින් කීහයි ගනතේ.) තස්මා, එහෙයින්; වුත්තනයෙනෙව නිසීදිත්වා, කී නයෙන්ම හිඳ; අප්පස්සාදා කාමාති ආදිනා නයෙන, කාමයෝ අල්පාස්වාදයහ යනාදිනයින්; කාමෙසු ආදීනවං පච්චවෙක්ඛිත්වා, කාමයෙහි ආදීනව ප්‍රත්‍යවෙක්ෂාකොට; කාමනිස්සරණෙ, කාමයන්ට නිස්සරණවූ; (කාමයන්කෙරෙන් නිර්ගතවූ හෝ) සබ්බදුක්ඛසමතික්කමස්ස උපායභූතෙ, (රහත්මඟට පාදකබැවින්) සියලු දුක් ඉක්මීමට උපායවූ; නෙක්ඛම්මෙ ජාතාභිලාසෙන, ධ්‍යානප්‍රතිලාභයෙහි උපන් අභිලාෂාඇත්තහු විසින්; බුද්ධධම්මසඞ්ඝගුණානුස්සරණෙන, (**"සම්මා සම්බුද්ධො වත භගවා අවිපරීතධම්මදෙසනත්තා"** යනාදීන්) බුද්ධරත්නයාගේද (**"ස්වාක්ඛාතො ධම්මො එකන්තනිය්‍යානිකත්තා"** යනාදීන්) ධර්මරත්නයාගේද (**"සුප්පටිපන්නො සඞ්ඝො සත්ථානුසිට්ඨං පටිපජ්ජනතො"** යනාදීන්) සඞ්ඝරත්නයාගේද ගුණ සිහිකිරීමෙන්; පීතිපාමොජ්ජං ජනයිත්වා, රත්නත්‍රයවිෂය ප්‍රීතිප්‍රමෝද්‍ය උපදවා; සබ්බබුද්ධපච්චෙකබුද්ධඅරියසාවකෙහි, සියලු බුදු පසේබුදු අරිසවුවන්විසින්; පටිපන්නා, පිළිපදනාලද; "අයං දානි, මෙ දැන්; සා නෙක්ඛම්මපටිපදාති, ඒ නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපත්තියයි;(සොපචාරධ්‍යානය විදර්ශනාය මාර්ගය නිර්වාණය යන මොවුන්ගේ අධිගමයට කාරණායයි යන අදහසි.) පටිපත්තියා, පිළිවෙත්හි; සඤ්ජාතගාරවෙන, උපන් ගෞරවඇත්තහු විසින්; අද්ධා, එකාන්තයෙන්; ඉමාය පටිපත්තියා, මේ පිළිවෙතින්; පවිවෙකසුඛරසස්ස, චිත්තවිවෙකාදී ප්‍රවිවෙකයෙන්වූ සුවරසයට;භාගී භවිස්සාමීති,හිමි වෙමි යි;උස්සාහං ජනයිත්වා,උත්සාහ උපදවා, සමෙන ආකාරෙන; සමවූ ආකාරයෙන්; චක්ඛූනි උම්මීලෙත්වා, ඇස්දල්වා; නිමිත්තං ගණ්හන්තෙන, නිමිත්ත ගන්නහුවිසින්; භාවෙතබ්බං,හැවියයුතු;අතිඋම්මීලයතො හි,ඉතා ඇසදල්වන්නහුගේ; චක්ඛුං කිලමති, (ඉතාසියුම් රුවක් හෝ ඉතා භාස්වර රුවක් හෝ බලන්නක්හට මෙන්) ඇස කළකිරේ; මණ්ඩලඤ්ච, මඬුල්ලද; අති

මන්දං උම්මීලයතො මණ්ඩලං අවිභූතං හොති චිත්තඤ්ච ලීනං හොති, එවම්පි නිමිත්තං නුප්පජ්ජති, තස්මා ආදාසතලෙ මුඛනිමිත්තදස්සිනා විය සමෙන ආකාරෙන චක්ඛූනි උම්මීලෙත්වා නිමිත්තං ගණ්හන්තෙන භාවෙතබ්බං න වණ්ණො පච්චවෙක්ඛිතබ්බො, න ච ලක්ඛණං මනසිකාතබ්බං.

(අ) අපි ච වණ්ණං අමුඤ්චිත්වා නිස්සය සවණ්ණං කත්වා උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ චිත්තං ඨපෙත්වා මනසිකාතබ්බං, **පඨවී මහී මෙදිනී භූමි වසුධා වසුන්ධරාති** ආදීසු පඨවිනාමෙසු යං ඉච්ඡති යදස්ස සඤ්ඤානුකූලං හොති තං වත්තබ්බං.

---

විභූතං හොති, ඉතා පහළවේ; (ලක්ෂණවශයෙන් හෝ වර්ණවශයෙන් හෝ වැටහේ;) තෙන, එහෙයින්; අස්ස, ඕහට; නිමිත්තං නුප්පජ්ජති, නිමිත් නොඋපදී; අතිමන්දං උම්මීලයතො, ඉතාමඳකොට බලන්නහුට; මණ්ඩලං, මඬුල්ල; අවිභූතං හොති, පහළනොවේ. (ගජනිමීලනයෙන් බලන්නහුට අරමුණක්මෙන් පහළනොවේ යුතැයි.) චිත්තඤ්ච ලීනං හොති, (දර්ශනයෙහි මඳ ව්‍යාපාරබැවින් කෞසීද්‍යපක්ෂයෙහි ගිමෙන්) සිතද ලීනවේ; එවම්පි, මෙසේකලද; නිමිත්තං නුප්පජ්ජති, නිමිත්තය නොඋපදී; තස්මා, එහෙයින්; ආදාසතලෙ මුඛනිමිත්තදස්සිනා විය, කැටපත්තලෙහි මුහුණු පිළිබිඹු බලනුවහුමෙන්; (උන්මීලනයද අතිනිමීලනයද නොකොට කැටපත් තෙලෙහි වර්ණය පස් නොවිකා ඉහි ලකුණු මෙනෙහි නොකොට සම ආකාරයෙන්ම තමා මුහුණුනිමිත් බලනුවහු මෙන යුතැයි.) සමෙන ආකාරෙන චක්ඛූනි උම්මීලෙත්වා, සම ආකාරයෙන් ඇස් දල්වා; නිමිත්තං ගණ්හන්තෙන, නිමිත්ගන්නහුවිසින්; භාවෙතබ්බං, හැවිය යුතු; න වණ්ණො පච්චවෙක්ඛිතබ්බො, ඉහි අරුණවර්ණය නොපස් විකියයුතුය; (නොසිතියයුතුය යුතැන්) න ච ලක්ඛණං මනසිකාතබ්බං, (ඉහි පෘථිවිධාතුවෙහි) තදලකුණු මෙනෙහි නොකටයුතු.

(අ) අපි ච, එකෙක්ඇති; වණ්ණං අමුඤ්චිත්වා, (බලබලා හැවිය යුතු බැවින්)වර්ණය නොහැර; නිස්සයසවණ්ණං කත්වා, වර්ණයා තමහට ආශ්‍රයවූ පෘථිවිධාතුව හා සමාන ගතිකකොට;(එක්වනුකොට-වර්ණය හා එක්කොටම මෙනෙහි කටයුතුය යුතැති.)උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ, පෘථිවිධාතුවගේ උත්සන්නභාවයෙන්; (ශක්තිහෙයින් අධික බැවින්-සසම්භාර පෘථිවියෙහි පඨවියයි යම් ලොක ව්‍යවහාරයෙක්ද) ඒ ප්‍රඥප්තිධර්මයෙහි; චිත්තං ඨපෙත්වා, සිතපිහිටුවා; මනසිකාතබ්බං, මෙනෙහිකටයුතු; පඨවී, පෘථිවිය; මහී, මහිය; මෙදිනී, මෙදිනීය; භූ , භූමිය; වසුධා, වසුධාය; වසුන්ධරාති ආදීසු, වසුන්ධරාය යන මේ ආදිවූ; පඨවිනාමෙසු, පෘථිවිනාමයන් කෙරෙහි; යං ඉච්ඡති, යම් නාමයක් කැමතිද; යං, යමෙක්තෙමෙ; අස්ස, මොහුගේ; සඤ්ඤානුකූලං හොති, පූර්වයෙහි ගෘහීතසංඥාවශයෙන් අනුකූලවේද; තං වත්තබ්බං, ඒ නම කියයුත්ත; ("වත්තබ්බං" යන මෙහි ප්‍රථම සම්පාතාහාරයෙහි කිසිවක් හට වාග්භෙදද වෙයි කීවෙත්-ආචාර්‍ය්‍යන්විසින් කියයුතුබව සඳහා හෝ කියනලදී.

(අ) අපි ච **පඨවී** ති එතදෙව නාමං පාකටං, තස්මා පාකටවසෙනෙව **පඨවී පඨවී** ති භාවෙතබ්බං කාලෙන උම්මීලෙත්වා කාලෙන නිමීලෙත්වා[1] ආවජ්ජිතබ්බං, යාව උග්ගහනිමිත්තං නුප්පජ්ජති තාව කාලසතම්පි කාලසහස්සම්පි තතො භිය්‍යොපි එතෙනෙව නයෙන භාවෙතබ්බං. තස්සෙවං භාවයතො යදා නිමීලෙත්වා ආවජ්ජන්තස්ස උම්මීලිතකාලෙ විය ආපාථං ආගච්ඡති, තදා උග්ගහනිමිත්තං ජාතං නාම හොති, තස්ස ජාතකාලතො පට්ඨාය න තස්මිං ඨානෙ නිසීදිතබ්බං, අත්තනො වසනට්ඨානං පවිසිත්වා තත්ථ නිසින්නෙන භාවෙතබ්බං, පාදධොවනපපඤ්චපරිහාරත්ථං පනස්ස එකපටලිකුපාහනා ච කත්තරදණ්ඩො ච ඉච්ඡිතබ්බො. අථානෙන සචෙ තරුණො සමාධි කෙනචිදෙව අසප්පායකාරණෙන නස්සති උපාහනා ආරුය්හ කත්තරදණ්ඩං

---

(අ) අපිච, අනිකෙකුදු; පඨවීති එතදෙව නාමං පාකටං, පඨවී යන මේ නමම ප්‍රකටය; තස්මා, එහෙයින්; පාකටවසෙනෙව, ප්‍රකටවශයෙන්ම; පඨවී පඨවීති භාවෙතබ්බං, පඨවී පඨවී කියා බැවියයුතු; කාලෙන උම්මීලෙත්වා, කලෙක්හි ඇස්දල්වා; (නිමිත්තග්‍රහණවශයෙන් මණ්ඩලය බලා) කාලෙන නිමීලෙත්වා, කලෙක ඇසපියා; ආවජ්ජිතබ්බං, (යම් ආකාරයෙකින් ඇසදල්වා බලාගන්නාලදද ඒ ආකාරයෙන්) ආභොග කටයුතු; යාව උග්ගහනිමිත්තං නුප්පජ්ජති, යම්තාක් උද්ග්‍රහ නිමිත්ත නොඋපදී ද; තාව, ඒතාක්; කාලසතම්පි, කාලශතයකුදු; කාලසහස්සම්පි, කාලසහස්‍රයකුදු; තතො භිය්‍යොපි, එයින්වැඩියකුදු; එතෙනෙව නයෙන, මෙමනයින්ම; භාවෙතබ්බං, භැවිය යුතු; තස්සෙවං භාවයතො, මෙසේ භාවනාකරන්නාවූ ඔහට; යදා, යම් වේලෙක; නිමීලෙත්වා අවජ්ජන්තස්ස, ඇසපියා ආවර්ජනා කරන්නා හට; උම්මීලිතකාලෙ විය, ඇසදල්වූ කාලයෙහි මෙන්; ආපාථං ආගච්ඡති, (මුනිදොර ජවනට) හමුබවට ඒද; තදා, එකල්හි; උග්ගහ නිමිත්තං ජාතං නාම හොති, උද්ග්‍රහනිමිත්ත උපන්නානම් වේ; තස්ස, ඒ උද්ග්‍රහනිමිත්හුගේ; ජාතකාලතො පට්ඨාය, උපන්තැන්පටන්ගෙන; න තස්මිං ඨානෙ නිසීදිතබ්බං, එතැන්හි නොහින්දයුතු; (ඉදින් උද්ග්‍රහනිමිත් උපදවනසඳද පඨවිමණ්ඩලය බලබලා බවානම් ප්‍රතිභාගනිමිත් උපැත් නොවන්නෙය සමීපයෙහි හුන්නහුවිසිනුදු නොබලනුවට නොපිළිවන්නුයි "න තස්මිං ඨානෙ නිසීදිතබ්බං" යුහු.) අත්තනො වසනට්ඨානං පවිසිත්වා, තමා වසනතැනට වැද; තත්ථ නිසින්නෙන, එහි හුන්නහුවිසින්; භාවෙතබ්බං, භැවියයුතු; පාදධොවනපපඤ්චපරිහාරත්ථං අස්ස, පාදෙවීමෙන් වනලස හරණාපිණිස; අස්ස, මේ යොගීහුවිසින්; එකපටලිකුපාහනා ච, (නිශ්ශබ්දභාවය පිණිස) එක්පටවහන්ද; කත්තරදණ්ඩො ච, (පරිපන්ථදූරීකරණය පිණිස) කතුරුයටෙකුදු; ඉච්ඡිතබ්බො, පැසැස්සයුක්ත; සචෙ, ඉදින්; තරුණො සමාධි, තරුණවූ සමාධිය; කෙනචිදෙව අසප්පායකාරණෙන, කිසි අසත්ප්‍රායකාරණයෙකින්; නස්සති, නටුයේවීනම්; උපාහනා

---

1. නිම්මීලෙත්වා-ත්‍රි. මූ.

ගහෙත්වා තඞ්ඛණං ගන්ත්වා නිමිත්තං ආදාය ආගන්ත්වා සුඛනිසින්නෙන භාවෙතබ්බං, පුනප්පුන සමන්නාහරිතබ්බං, තක්කාහතං විතක්කාහතං කාතබ්බං. තස්ස එවං කරොන්තස්ස අනුක්කමෙන නීවරණානි වික්ඛම්භන්ති, කිලෙසා සන්නිසීදන්ති උපචාරසමාධිනා චිත්තං සමාධියති, පටිභාගනිමිත්තං උප්පජ්ජති, තත්‍රායං පුරිමස්ස උග්ගහනිමිත්තස්ස ච ඉමස්ස ච විසෙසො:–උග්ගහනිමිත්තෙ කසිණදොසො පඤ්ඤායති, පටිභාගනිමිත්තං ථවිකතො නීහටාදාසමණ්ඩලං විය සුධොතසඞ්ඛථාලං විය වලාහකන්තරා නික්ඛන්තචන්දමණ්ඩලං විය මෙඝමුඛෙ බලාකාවිය උග්ගහනිමිත්තං පදාලයිත්වා නික්ඛන්තමිව තතො සතගුණං සහස්සගුණං සුපරිසුද්ධං හුත්වා උපට්ඨාති.

---

ආරූයහ, වහන්නැගී; කත්තරදණ්ඩං ගහෙත්වා, කතුරුයටගෙන; තඞ්ඛණං ගන්ත්වා, එතනටගොස්; නිමිත්තං ආදාය, උද්ග්‍රහනිමිත් ගෙන; ආගන්ත්වා, අවුත්; (අථානෙන සුඛනිසින්නෙන භාවෙතබ්බං, යී යොදනු.) පසුව ඒ යොගීහු ඕසින් සුවෙන් හුන්නහු විසින් බැවිය යුතු; පුනප්පුන සමන්නාහරිතබ්බං, නැවත නැවත නිමිත් ආවර්ජන කටයුතු; තක්කාහතං විතක්කාහතං කාතබ්බං,තර්කයෙන් පහරණලද බලවත් විතර්කයෙන් පහරණලද කටයුතු; (බලවත් විතර්ක මනස්කාර බොහෝ කොට පැවැත්විය යුතුය යුතැති.) එවං කරොන්තස්ස,මෙසේ කරන්නාවූ; තස්ස, ඒ යොගීහට; අනුක්කමෙන, (හවුන්) අනුක්‍රම යෙන්; නීවරණානි වික්ඛම්භන්ති, නීවරණයෝ එබෙත්; (සඬාදිඉඳු රන් නිර්මලව තිහිණිව පැවැත්මෙන් අසඬියාදීන්ගේ දුරුවීමෙන් සාතිශය බලප්‍රාප්තයන්විසින් උපස්තම්භලද විතර්කාදීකමචසැරිදූහැන් අඟහු බොහෝකොට පහළවෙති එහෙයින් ඔවුන්ට ඉදිවම පිළිගැළිවූ කම්සැදූආදීහු තදෙකස්ථ පාපධම්මයන් හා සමග දුරුවෙති උගැහැ නිමිත්හාසමග ඒ පිළිබිංනිමිත් අරමුණුකොට උවසරධ්‍යන් උපදී එසින් කිහ. "නීවරණානි වික්ඛම්භන්ති"යී) කිලෙසා සන්නිසීදන්ති, කෙලෙස්හු මනාවම සන්හිඳෙති; උපචාරසමාධිනා, උවසරසමාධීන්; චිත්තං සමාධියති, සිත සමාහිතවේ; පටිභාගනිමිත්තං උප්පජ්ජති, පිළිබිංනිමිත් උපදී; තත්‍ර, එ දෙක්හි; පුරිමස්ස, පළමුවූ; උග්ගහනිමිත්තස්ස ච, උගැහැනිමිත්හුගේද;ඉමස්ස ච,මේ පිළිබිං නිමිත්හුගේද; අයං විසෙසො, මේ වෙසෙසි; උග්ගහනිමිත්තෙ, උගහනිමිත්හි;කසිණ දොසො පඤ්ඤායති, (පෙණපහරආදී) කිසුණුදෙස් පැනෙයි; පටිභාග නිමිත්තං, පිළිබිංනිමිත්; ථවිකතො නීහට, පසියෙන් හයනලද; ආදාස මණ්ඩලං විය, කැටපතක්මෙන්ද; සුධොත, මනාකොට දෙවි; සඞ්ඛ ථාලං විය, සක්තල්ලක්මෙන්ද; වලාහකන්තරා නික්ඛන්ත, වලාහ අතුරෙන් නික්මුණු; චන්දමණ්ඩලං විය, සඳමඬලක්මෙන්ද; මෙඝමුඛෙ බලාකා විය, මෙසමුඛයෙහි බලාකාවක් මෙන්ද; උග්ගහනිමිත්තං පදාලයිත්වා නික්ඛන්තමිව, උගැහැනිමිත් පළාගෙන නික්මුනක්හු මෙන්; තතො, ඒ උද්ග්‍රහනිමිත්තට වඩා; සතගුණං සහස්සගුණං සුපරිසුද්ධං හුත්වා, (කිසුණුදෙස්නැතිව) සියක්ගුණ දහසක්ගුණ පිරිසුදුව; උපට්ඨාති, වැටහේ.

(ආ) තස්ස ච ඛො නෙව වණ්ණවන්තං න සණ්ඨානවන්තං, යදි හි තං එදිසං භවෙය්‍ය චක්ඛුවිඤ්ඤෙය්‍යං සියා ඔළාරිකං සම්මසනූපගං තිලක්ඛණබ්භාහතං, න පනෙතං තාදිසං, කෙවලං හි සමාධිලාභිනො උපට්ඨානාකාරමත්තං සඤ්ඤජමෙතන්ති උප්පන්නකාලතො ච පනස්ස පට්ඨාය නීවරණානි වික්ඛම්භිතානෙව හොන්ති, කිලෙසා සන්නිසින්නාව උපචාරසමාධිනා චිත්තං සමාහිතමෙවාති. දුවිධො හි සමාධි:– උපචාරසමාධි ච අප්පණාසමාධි ච. ද්වීහාකාරෙහි චිත්තං සමාධියති උපචාරභූමියං වා පටිලාභභූමියං වා, තත්ථ උපචාරභූමියං නීවරණප්පහානෙන චිත්තං සමාහිතං හොති. පටිලාභභූමියං අඞ්ගපාතුභාවෙන, චිත්තං පන සමාධීනං ඉදං නානා

---

(ආ) තස්ස ච ඛො, ඒ පිළිබිඹුනිමිත්ද; නෙව වණ්ණවන්තං, (තමා පරමාර්ථයෙන් අවිද්‍යමානබැවින්) නොද වර්ණ ඇත්තේ වෙයි; න සණ්ඨානවන්තං, නොද සටහන් ඇත්තේද වෙයි; යදි හි, ඉදින්; තං, ඒ පිළිබිඹුනිමිත්; එදිසං භවෙය්‍ය, වර්ණඇත්තේ සටහන් ඇත්තේ වීනම්; චක්ඛුවිඤ්ඤෙය්‍යං සියා, චක්ෂුර්විඥෙය වන්නේයි; ඔළාරිකං, ඖදාරිකවන්නේය; සම්මසනූපගං, සම්මර්ශනයට සුදුසුවන්නේයි; තිලක්ඛණබ්භාහතං, (උත්පාදාදි) තුන්ලකුණෙන් අනුවිද්ධවන්නේය; (අනිත්‍යාදිලක්ෂණත්‍රයින් හෝ අඞ්කිතවන්නේයි ) එතං පන, මේ වනාහි;න තාදිසං,එබඳු නොවේ; කෙවලං හි, හුදෙක්;සමාධිලාභිනො, සමාධිලාභීහට; එතං, මේ; උපට්ඨානාකාරමත්තං, වැටහෙනආකාර මාත්‍රයෙක; සඤ්ඤජං, භාවනා සංඥාවෙන් වූයේයි; (භාවනාසංඥායෙන් හඳුනත පමණෙකි අසභාවධර්මහුගේ කිසිවෙකින් උපැත්නැති බැවින යන අර්ථයි.) අස්ස, ඒ පිළිබිඹුනිමිත්හුගේ;උප්පන්නකාලතො ච පන පට්ඨාය,උපන්කල්පටන්ගෙන;නීවරණානි,නීවරණයෝ;වික්ඛම්භිතානෙව හොන්ති, ඔබනලද්දහුම වෙත්; කිලෙසා, කෙලෙස්හු; සන්නිසින්නා, සන්හිඳෙනලද්දහුම වෙත්; උපචාරසමාධිනා, උපචාර සමාධියෙන්; චිත්තං සිත; සමාහිතමෙව, සමාහිතවූයේම වේ;දුවිධො හි සමාධි, සමාධිය දෙවැදෑරුම්වේ; උපචාරසමාධි ච,උපචාරසමාධියද; අප්පණාසමාධි ච, අර්පණාසමාධියදැයි; ද්වීහි ආකාරෙහි චිත්තං සමාධියති, (ධ්‍යානධර්මයන්ට ප්‍රතිපක්ෂයන්ගේ දූරීභාවයෙන් සපිරභාව ප්‍රාප්තියෙනැයි)දෙ ආකාරයෙන් සිත සමාහිත වේ;(දැන් ඒකාරණයන් අවස්ථාමුඛයෙන් දක්වන්නේ උපචාරභූමියං වා යනාදි කී.) උපචාර භූමියං වා, උපචාරඅවස්ථාවෙහි හෝ[1] (සමාහිතවෙයි);පටිලාභභූමියං වා,ප්‍රතිලාභ අවස්ථාවෙහි හෝ[2](සමාහිතවෙයි.)තත්ථ,ඒ දෙක්හි උපචාර භූමියං, උපචාරාවස්ථාවෙහි; නීවරණප්පහානෙන චිත්තං සමාහිතං හොති, නීවරණයන්ගේ පැහීමෙන් සිත සමාහිත වේ; පටිලාභභූමියං, ධ්‍යානයාගේ ප්‍රතිලාභාවස්ථාවෙහි; අඞ්ගපාතුභාවෙන, අඞ්ගප්‍රාදුර්භාව යෙන්(සමාහිතවෙයි);චිත්තං පන සමාධීනං,සමාධීන් දෙදෙනාගේ;ඉදං

---

1. උපසර බිම් හෝ- 2. ප්‍රතිලාභභූමියෙහි හෝ-

කරණං:- උපචාරෙ අඞ්ගානි න ථාමජාතානි හොන්ති, අඞ්ගානං අථාමජාතත්තා. යථා නාම දහරො කුමාරකො උක්ඛිපිත්වා ඨපියමානො පුනප්පුනං[1] භූමියං පතති, එවමෙව උපචාරෙ උප්පන්නෙ චිත්තං කාලෙන නිමිත්තං ආරම්මණං කරොති, කාලෙන භවඞ්ගං ඔතරති, අප්පණාය පන අඞ්ගානි ථාමජාතානි හොන්ති, තෙසං ථාමජාතත්තා යථා නාම බලවා පුරිසො ආසනා වුට්ඨාය දිවසම්පි තිට්ඨෙය්‍ය එවමෙව අප්පණාසමාධිම්හි උප්පන්නෙ චිත්තං සකිං භවඞ්ගවාරං ඡින්දිත්වා[2] කෙවලම්පි රත්තිං කෙවලම්පි දිවසං තිට්ඨති, කුසලජවනපටිපාටිවසෙනෙව පවත්තතීති.

(අ) තත්‍ර යදෙතං උපචාරසමාධිනා සද්ධිං පටිභාගනිමිත්තං උප්පන්නං, තස්ස උප්පාදනං නාම අතිදුක්කරං, තස්මා සචෙ තෙනෙව පල්ලඞ්කෙන

නානාකරණං, මේ නානාත්වයයි; උපචාරෙ, උපචාරාවස්ථායෙහි; අඞ්ගානි, ධ්‍යානාඞ්ගයෝ; ථාමජාතානි න හොන්ති, උපන්නාවූ ශක්තිඇත්තාහු නොවෙත්; (භාවනාබලප්‍රාප්තයෝ නොවෙති යන අර්ථයි.) අඞ්ගානං අථාමජාතත්තා, අඞ්ගයන් බලප්‍රාප්ත නොවන බැවින්; යථා නාම, යම්සේ; දහරකුමාරකො, බාලකුමර තෙමේ; උක්ඛිපිත්වා ඨපියමානො, නඟා සිටුවනලද්දේ; පුනප්පුනං භූමියං පතති, නැවත නැවත භූමියෙහි හෙන්නේද; එවමෙව, එපරිද්දෙන්ම; උපචාරෙ උප්පන්නෙ, උපචාර ධ්‍යානය උපන්කල; චිත්තං, ධ්‍යානසිත; කාලෙන, කලෙක්හි; නිමිත්තං ආරම්මණං කරොති, පිළිබිඹුනිමිත් අරමුණුකෙරෙයි; කාලෙන, කලෙක්හි; භවඞ්ගං ඔතරති, භවාඞ්ගයට බේ; අප්පණාය පන, අර්පණා වෙහි වනාහි; අඞ්ගානි, අඞ්ගයෝ; ථාමජාතානි හොන්ති, බලඇතිවෙත්; තෙසං, ඒ අඞ්ගයන්; ථාමජාතත්තා, බලඇතිබැවින්; යථා නාම, යම්සේ; බලවා පුරිසො, බලවත්පුරුෂයෙක්; ආසනා වුට්ඨාය, අස්නෙන්නැඟී; දිවසම්පි තිට්ඨෙය්‍ය, දවසකුදු සිටින්නේද; එවමෙව, එපරිද්දෙන්ම; අප්පණාසමාධිම්හි උප්පන්නෙ, අර්පණාසමාධිය උපන්කල්හි; චිත්තං, සිත; සකිං, එක්වටක්; භවඞ්ගවාරං ඡින්දිත්වා, භවාඞ්ගවාරය සිඳගෙන; කෙවලම්පි රත්තිං, සියලුරාත්‍රියෙහිදු; කෙවලම්පි දිවසං, සියලුදවස්හිදු; තිට්ඨති, සිටුනේයි; (ප්‍රථමාර්පණය එකචිත්තක්ෂණවතුදු ඒ අර්පණා සාමාන්‍යයෙන් සමාපත්තිකාලය ' සඳහා "කෙවලම්පි රත්තිං" යනු කීහයි සලකනු.) කුසලජවනපටිපාටිවසෙනෙව, කුසල්ජවන්පිළිවෙළ විසින්ම; පවත්තති, පවත්නේයි.

(අ) තත්‍ර, ඒ සමාධිදෙක්හි; උපචාරසමාධිනා සද්ධිං, උපචාරසමාධිය හා සමඟ; යදෙතං පටිභාගනිමිත්තං උප්පන්නං, යම් මේ ප්‍රතිභාග නිමිත්තයෙක් උපන්නේද; තස්ස උප්පාදනං නාම අතිදුක්කරං, ඒ පිළිබිඹුනිමිත්හුගේ ඉපදීම නම් ඉතා දුෂ්කරය; (ඉතාදුකින් කටයුතුය යුතැනි.) තස්මා, එහෙයින්; සචෙ, ඉදින්; තෙනෙව පල්ලඞ්කෙන,

1. පුනප්පුන-කත්ථචි. 2. විච්ඡින්දිත්වා—ත්‍රි. මූ.

තං නිමිත්තං වඩ්ඪෙත්වා අප්පනං අධිගන්තුං සක්කොති සුන්දරං, නොචෙ සක්කොති, අථානෙන තං නිමිත්තං අප්පමත්තෙන චක්කවත්තිගබ්භො විය රක්ඛිතබ්බං.

එවං හි.

140 නිමිත්තං රක්ඛතො ලද්ධ-පරිහානි[1] න විජ්ජති
ආරක්ඛම්හි අසන්තම්හි-ලද්ධං ලද්ධං විනස්සති.

තත්‍රායං රක්ඛණ විධි.

141 ආවාසො ගොචරො භස්සං-පුග්ගලො භොජනං උතු,
ඉරියාපථොති සත්තෙතෙ-අසප්පායෙ විවජ්ජයෙ.

142 සප්පායෙ සත්ත සෙවෙථ-එවං හි පටිපජ්ජතො,
න චිරෙනෙව කාලෙන-හොති කස්සචි අප්පනා.

---

එම පලගින්; තං නිමිත්තං වඩ්ඪෙත්වා, ඒ නිමිත්ත වඩා; අප්පණං අධිගන්තුං, අර්පණාවට පැමිණෙන්නට; සක්කොති, පොහොසත් නම්; සුන්දරං, සොඳුරු; නො චෙ සක්කොති, ඉදින් නොපොහොසත් විනම්; අථ, එසේකල්හි; අනෙන, මොහුවිසින්; තං නිමිත්තං, ඒ නිමිත්; අප්පමත්තෙන, නොපමාවූවහුවිසින්; චක්කවත්තිගබ්භො විය, සක්විති ගබක්මෙන්; රක්ඛිතබ්බං, රැකියයුතු.

එවං හි, එසේ කල්හි;

140. නිමිත්තං රක්ඛතො, පිළිබානිමිත් රක්නහුට; ලද්ධපරිහාණී න විජ්ජති, ලද උපචාරධ්‍යානයාගේ පරිහාණිය නොවේ; (නිමිත්තය නොනට කල්හි තදාලම්බනධ්‍යානය නොපිරිහෙන්නේම වේ;) ආරක්ඛම්හි, අසන්තම්හි, නිමිත්හි ආරක්‍ෂාවක් නැතිකල්හි; ලද්ධං ලද්ධං විනස්සති, ලද ලද ධ්‍යානයද නසියි; (ධ්‍යන්හු නිමිත්තායත්තව පවත්නාබැවිනි.)

තත්‍රායං රක්ඛණ විධි, ඒ පිළිබානිමිත්හුගේ මේ රක්‍ෂණ විධියි;

141. ආවාසො, අවස්ය; ගොචරො, ගොචරග්‍රාමය; භස්සං, කථාය; පුග්ගලො, පුගුල; භොජනං, භොජනය; උතු, ඍතුය; ඉරියාපථොති, ඉරියව්වය යන; එතෙ සත්ත, මොහු සත්දෙන; අසප්පායෙ, නොසැපවූවන්; විවජ්ජයෙ, දුරුකරන්නේය.

142. සප්පායෙ සත්ත, සැපවූ සත්දෙන; සෙවෙථ, සෙවුනේය, එවං හි පටිපජ්ජතො, මෙසේ පිළිපදනාවූ; කස්සචි, කිසිවක්හට; න චිරෙනෙව කාලෙන, නො බොහෝ කාලෙකින් ම; අප්පණා හොති, අපුන් වේ.

---

1. ලද්ධං පරිහානි—ත්‍රි. මූ.

(අ) තත්‍රස්ස යස්මිං ආවාසෙ වසන්තස්ස අනුප්පන්නං වා නිමිත්තං නුප්පජ්ජති, උප්පන්නං වා විනස්සති, අනුපට්ඨිතා ච සති න උපට්ඨාති, අසමාහිතඤ්ච චිත්තං න සමාධියති, අයං අසප්පායො. යත්ථ නිමිත්තං උප්පජ්ජති චෙව ථාවරඤ්ච හොති සති උපට්ඨාති චිත්තං සමාධියති. නාගපබ්බතවාසී පධානියතිස්සත්ථෙරස්ස විය, අයං සප්පායො෴

(ආ) තස්මා යස්මිං විහාරෙ බහූ ආවාසා හොන්ති, තත්ථ එකමෙකස්මිං තීණි තීණි දිවසානි වසිත්වා යත්ථස්ස චිත්තං එකග්ගං හොති, තත්ථ වසිතබ්බං, ආවාසසප්පායතාය හි තම්බපණ්ණිදීපම්හි චූළනාගලෙණෙ තත්ථෙව කම්මට්ඨානං ගහෙත්වා පඤ්චසතා භික්ඛූ අරහත්තං පාපුණිංසු, සොතාපන්නාදීනං පන අඤ්ඤත්‍ථ අරියභූමිං පත්වා තත්ථ අරහත්තං පත්තානඤ්ච ගණනා නත්ථි, එවං අඤ්ඤෙසු පි චිත්තලපබ්බතවිහාරාදිසු෴

---

(අ) තත්‍ර, එහි; යස්මිං ආවාසෙ, යම් අවසෙක; වසන්තස්ස අස්ස, වසන්නාවූ මොහට; අනුප්පන්නං වා නිමිත්තං, නොඋපන් හෝ නිමිත්ත; නුප්පජ්ජති, නො උපදීද; උප්පන්නං වා (නිමිත්තං) විනස්සති, උපන් හෝ නිමිත් නසීද; අනුපට්ඨිතා ච සති, නො එළඹසිටි සිහි තොමෝ; න උපට්ඨාති, නොඑළඹේද; අසමාහිතඤ්ච චිත්තං, සමාහිත නොවූ සිත ද; න සමාධියති, සමාහිත නොවේ ද; අයං, මේ ආවාසය; අසප්පායො, අසැප නම් වේ; යත්ථ, යම්අවසෙක (වසන්නහුට); නිමිත්තං උප්පජ්ජතිචෙව, (නූපන්) නිමිත් උපදීද; ථාවරඤ්ච හොති, (උපන්නිමිත්) තරවේද; සති උපට්ඨාති, සිහිඑළඹ සිටීද; චිත්තං සමාධියති, සිත සමාහිතවේද; නාගපබ්බතවාසී, නාපව්නම් තැන වසන; පධානියතිස්සත්ථෙරස්ස විය, පධානියතිස්ස නම් තෙරුන්ට මෙන්; අයං, මේ; සප්පායො, අවසසැප නම් වේ෴

(ආ) තස්මා, එහෙයින්; යස්මිං විහාරෙ, යම්වෙහෙරෙක; බහූ ආවාසා හොන්ති, බොහෝ ආවාසයොවෙද්ද; තත්ථ, එහි; එකමෙකස්මිං, එකි එකිඅවස; තීණි තීණි දිවසානි වසිත්වා, තුන්තුන් දවස වැස; යත්ථ, යම්අවසෙක; අස්ස චිත්තං එකග්ගං හොති, මොහුගේ සිත එකාග්‍රවේද; තත්ථ, ඒ අවස; වසිතබ්බං, විසියයුතු; ආවාසසප්පායතාය හි, ආවාස සප්පාය බැවින්; තම්බපණ්ණිදීපම්හි, මෙම හෙළදිව; චූළනාගලෙණෙ, සුළුන්නාලෙණ; තත්ථෙව කම්මට්ඨානං ගහෙත්වා, එහිම කමටහන්ගෙන; පඤ්චසතා භික්ඛූ අරහත්තං පාපුණිංසු, පන්සියයක් මහණහු රහත්බවට පැමිණියෝ; සොතාපන්නාදීනං පන, සෝවාන් ආදීන්ගෙද වනාහි; අඤ්ඤත්‍ථ අරියභූමිං පත්වා, සෙසු තැන්හි අරියභූමියට පැමිණ; තත්ථ, එහිදී; අරහත්තං පත්තානඤ්ච, රහත්බවට පැමිණියවුන්ගේ ද; ගණනා නත්ථි, ගණන්නැති; අඤ්ඤෙසු, සෙසු; චිත්තලපබ්බතවිහාරාදිසුපි, සිතුල්පවුවෙහෙර ආදියෙහිදු; එවං, එසේමැයි෴

(අ) ගොචරගාමො පන යො සෙනාසනතො උත්තරෙන වා දක්ඛිණෙන වා නාතිදූරෙ දියඩ්ඪකොසබ්භන්තරෙ හොති සුලභසම්පන්නභික්ඛො, සො සප්පායො විපරීතො අසප්පායො. භස්සම්පි බත්තිංසතිරච්ඡානකථාපරියාපන්නං අසප්පායං, තං හිස්ස නිමිත්තන්තරධානාය සංවත්තති, දසකථාවත්ථුනිස්සිතං සප්පායං, තම්පි මත්තාය භාසිතබ්බං. පුග්ගලොපි අතිරච්ඡානකථිකො සීලාදිගුණසම්පන්නො යං නිස්සාය අසමාහිතං වා චිත්තං සමාධියති සමාහිතං වා චිත්තං ථිරං හොති, එවරූපො සප්පායො. කායදළ්හිබහුලො පන තිරච්ඡානකථිකො අසප්පායො, සො හි තං කද්දමොදකමිව අච්ඡං උදකං මලිනමෙව කරොති, තාදිසඤ්ච ආගම්ම කොටපබ්බතවාසි දහරස්සෙව සමාපත්තිපි නස්සති, පගෙව නිමිත්තං. භොජනං පන කස්සචි මධුරං කස්සචි අම්බිලං සප්පායං හොති...

---

(අ) ගොචරගාමො පන, ගොචරග්‍රාමය වනාහි; යො, යමෙක්; සෙනාසනතො, සෙනසුනෙන්; උත්තරෙන වා දක්ඛිණෙන වා, (ගමනාගමනයෙහි හිරුමුහුණ නොකරනු පිණිස) දකුණුදිග හෝ උතුරුදිග හෝ වේද; නාතිදූරෙ, ඉතා නොදුර; දියඩ්ඪකොසබ්භන්තරෙ හොති, තුන් දහස්දුනුපමණින් ඇතුළේවේද; සුලභසම්පන්නභික්ඛො, සුලභ සම්පන්නවූ භික්ෂා ඇත්තේද; සො, තෙමේ; සප්පායො, සැපය; විපරීතො, විපරීතවූයේ; අසප්පායො, නොසැප වේ, භස්සම්පි, භස්සයද; බත්තිංසතිරච්ඡානකථා පරියාපන්නං, දෙතිස්තිරශ්චීන්කථාවෙහි ඇතුළත්වූයේ; අසප්පායං, නොසැපයි; තං හි, හෙ තෙමෙ; අස්ස, මොහුගේ; නිමිත්තන්තරධානාය සංවත්තති, ලද නිමිත්හුගේ අතුරුදන්වීම පිණිස වේ; දසකථාවත්ථුනිස්සිතං, දශකථාවස්තු සන්නිශ්‍රිතවූයේ; සප්පායං, සැපවේ; තම්පි, හෙ ද; මත්තාය, පමණින්; භාසිතබ්බං, බිණියයුතු; පුග්ගලොපි, පුඟුලාද; අතිරච්ඡාන කථිකො, තිරශ්චීනකථා නොබණනුයේ; (තිරශ්චීනකථාවට විදූරවූ ධර්මයුක්තකර්මස්ථානප්‍රතිසංයුක්ත කථා කරන්නේය යන අභිප්‍රායයි) සීලාදිගුණසම්පන්නො, සීලාදිගුණයෙන් යුක්තවූයේ; යං නිස්සාය, යමක්හු නිසා; අසමාහිතං වා චිත්තං සමාධියති, අසමාහිතවූ සිත සමාහිත හෝ වේද; සමාහිතං වා චිත්තං ථිරං හොති, සමාහිත චිත්තය ස්ථිර හෝ වේද; එවරූපො, මෙබඳු පුඟුලා; සප්පායො, සැපවෙයි; (යමෙක් සමාධිනැමතිද සමාධිකාමට හන්හි කෙළපැමිණියේද හේ සැපවෙයි හඟනේ.) කායදළ්හිබහුලො පන, ශරීරවර්ධනයෙහි තැත්කරනුයේ; (කායයාගේ සන්තර්පණ පොෂණයෙහි නියුක්තවූයේ;) තිරච්ඡානකථිකො, තිරශ්චීනකථා කරන්නේ; අසප්පායො, සැපනොවේ; සො හි, හෙතෙම; තං, ඒ යොගීහු; කද්දමොදකමිව අච්ඡං උදකං, පහන් දියකිලුටුකරන මඩදියක්මෙන්; මලිනමෙව කරොති, මලිනමකෙරේ; තාදිසඤ්ච ආගම්ම, එබඳු පුඟුලාකරා පැමිණ; කොටපබ්බතවාසිදහරස්සෙව,

(අ) උතුපි කස්සචි සීතො කස්සචි උණ්හො සප්පායො හොති, තස්මා යං භොජනං වා උතුං වා සෙවන්තස්ස ඵාසු හොති, අසමාහිතං වා චිත්තං සමාධියති සමාහිතං වා චිත්තං ථිරතරං හොති, තං භොජනං සො ච උතු සප්පායො. ඉතරං භොජනං ඉතරෙ ච උතු අසප්පායො. ඉරියාපථෙසුපි කස්සචි චඞ්කමො සප්පායො හොති, කස්සචි සයනට්ඨාන නිසජ්ජානං අඤ්ඤතරො, තස්මා තං ආවාසං විය තීණි දිවසානි උපපරික්ඛිත්වා යස්මිං ඉරියාපථෙ අසමාහිතං වා චිත්තං සමාධියති සමාහිතං වා චිත්තං ථිරතරං හොති, සො සප්පායො, ඉතරෙ අසප්පායොති වෙදිතබ්බො. ඉති ඉමං සත්තවිධං අසප්පායං වජ්ජෙත්වා සප්පායං සෙවිතබ්බං, එවං පටිපන්නස්ස හි නිමිත්තාසෙවනබහුලස්ස න චිරෙනෙව කාලෙන හොති කස්සචි අප්පනා…

---

සොළොස්වෙනි වසන දහරයාගෙමෙන්; සමාපත්තිපි නස්සති, සමවත්ද නස්නේය; පගෙව නිමිත්තං, නිමිත්තපළමුවම; භොජනං පන, භොජනය වනාහි; කස්සචි මධුරං, කිසිවක්හට මධුරවූයේ; කස්සචි අම්බිලං, කිසිවක්හට ඇඹුල්වූයේ; සප්පායං හොති, සැපවේ; (භොජනය බොහෝසේ සත්වයන්ට උපයොගයට යේනුයි "කස්සචි මධුරං කස්සචි අම්බිලං සප්පායං" යුහු- කටුකාදීරසයෝ වනාහි සංස්කාරයෙන් වන්නාහයි දතයුතු.)

(අ) උතුපි, ඍතුද; කස්සචි, කිසිවක්හට; සීතො, ශීතවූයේ; කස්සචි උණ්හො, කිසිවක්හට හුණුවූයේ; සප්පායො හොති, සැපවේ; තස්මා, එහෙයින්; යං භොජනං වා උතුං වා සෙවන්තස්ස, යම් භොජනයක් වත් ඍතුවක්වත් සෙවුනාහට; ඵාසු හොති, ඵාසු වේද; අසමා…පෙ…තං භොජනං, ඒ බොජුනද; සො ච උතු, ඒ ඍතුවද; සප්පායො, සැපය; ඉතරං භොජනං, සෙසුබොජුනද; ඉතරෙ ච උතු, සෙසුඍතුවද; අසප්පායො, නොසැපයි; ඉරියාපථෙසුපි, ඊර්‍ය්‍යාපථයෙහිද; කස්සචි, කිසිවක්හට; චඞ්කමො සප්පායො හොති, සක්මන සැපවෙයි; කස්සචි, කිසිවක්හට; සයනට්ඨාන නිසජ්ජානං අඤ්ඤතරො, සයනය ස්ථිතිය නිෂද්‍යය යන මොවුන් කෙරෙන් එක්තරාඑකෙක් සැපවේ; තස්මා, එහෙයින්; තං, හේ; ආවාසං විය, ආවාසයමෙන්; තීණි දිවසානි උපපරික්ඛිත්වා, තුන් දවසක් පරීක්ෂාකොට; යස්මිං ඉරියාපථෙ, යම්ඉරියවුවෙක; අස…පෙ…ථිරතරං හොති, වෙසෙසින් ස්ථිරවේද; සො සප්පායො, ඒ ඉරියවුව සැපය; ඉතරෙ අසප්පායොති, අනික් ඉරියවුව අසත්ප්‍රායයි; වෙදිතබ්බො, දතයුතු; ඉති, මෙසේ; ඉමං සත්තවිධං අසප්පායං, මේසත්විධවූ අසැපයන්; වජ්ජෙත්වා, දුරුකොට; සප්පායං, සැප; සෙවිතබ්බං, සෙවියයුතු; එවං පටිපන්නස්ස හි, මෙසේ සැපසෙවුනාවිසින් පිළිපන් නාවූ; නිමිත්තාසෙවනබහුලස්ස කස්සචි, නිමිත්හි ආසෙවනාබහුලවූ කිසිවක්හට; (පිළිබානිමිත්හි භාවනාමනස්කාරය බහුලකොට ආසෙවනයකරන කිසිවෙක්හට) න චිරෙනෙව කාලෙන, නො බොහෝ කලෙකින්ම; අප්පනා හොති, අපුන් වේ…

(අ) යස්ස පන එවම්පි පටිපජ්ජතො න හොති, තෙන දසවිධං අප්පනාකොසල්ලං සම්පාදෙතබ්බං. තත්‍රායං නයො:- දසහාකාරෙහි අප්පනාකොසල්ලං ඉච්ඡිතබ්බං- වත්ථුවිසදකිරියතො- ඉන්ද්‍රියසමත්තපටිපාදනතො- නිමිත්තකුසලතො- යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං- තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති- යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හාති- යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහංසෙති- යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛති - අසමාහිතපුග්ගලපරිවජ්ජනතො - සමාහිතපුග්ගලසෙවනතො- තදධිමුත්තතොති. තත්ථ වත්ථුවිසදකිරියා නාම:- අජ්ඣත්තිකබාහිරානං වත්ථූනං විසදභාවකරණං, යදා හිස්ස කෙසනඛලොමානි

---

(අ) යස්ස පන, යමක්හට වනාහි; එවම්පි පටිපජ්ජතො න හොති, මෙසේ පිළිපදිනහුටද අර්පණා නොවේනම්; තෙන, ඔහුවිසින්; දසවිධං අප්පනාකොසල්ලං, දශවිධවූ අර්පණාකෞශල්‍යය; යම්විධියෙකින් අර්පණාවෙහි කුශලවේද ඒ දශවිධවිධිය උපයන ඤාණයහෝ අර්පණාකෞශල්‍ය නම් වෙයි දන්නේ.) සම්පාදෙතබ්බං, සැපවියයුතු; තත්‍ර, එහි; අයං නයො, මේ ක්‍රමයවේ; දසහාකාරෙහි; දසආකාරයෙකින්; අප්පනාකොසල්ලං ඉච්ඡිතබ්බං, අර්පණාකෞශල්‍යය කැමැතිවියයුතු; වත්ථුවිසදකිරියතො, වස්තූන්ගේ නිර්මලබව කිරීමෙන්ද; ("අප්පනාකොසල්ලං ඉච්ඡිතබ්බං"යි යොදනු-සිත්පවත්නා තැන් හෙයින් සිරුරුද සිරුරු පිළිබැඳි සිවුරුආදීහුද වස්තුනම් වෙයි යම් සේ සිතට සුවඑළවද්ද එසේකිරීම ඔවුන්ගේ විසදකරණයයි දතයුතු-සෙසු පෙදෙහිදු මෙමනිය.) ඉන්ද්‍රියසමත්තපටිපාදනතො, ඉන්ද්‍රියයන්ගේ සමබව කිරීමෙන්ද; නිමිත්තකුසලතො, පඨවිකසිණාදී නිමිත්තයෙහි කුසලබැවින්ද; යස්මිං සමයෙ, යම් සමයෙක්හි; චිත්තං, සිත; පග්ගහෙතබ්බං, බැවියයුතුද; තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති, එසමයෙහි සිත හුවවන්නේද;යස්මිං සමයෙ,යම් සමයෙක,චිත්තං සිත; නිග්ගහෙතබ්බං, නිගැණිය යුතුද; තස්මිං සමයෙ, එසමයෙහි; චිත්තං නිග්ගණ්හාති, සිත නිගැණීද; යස්මිං සමයෙ, යම් සමයෙක; චිත්තං, සිත; සම්පහංසිතබ්බං, සතුටුකටයුතුද; තස්මිං සමයෙ, එසමයෙහි; චිත්තං සම්පහංසෙති, සිතසතුටුකෙරේද; යස්මිං සමයෙ, යම් සමයෙක; චිත්තං, සිත; අජ්ඣුපෙක්ඛිතබ්බං, උපෙක්ෂාකටයුතුද; තස්මිං සමයෙ, එසමයෙහි; චිත්තං, සිත; අජ්ඣුපෙක්ඛති, උපෙක්ෂා කෙරේද; අසමාහිතපුග්ගලපරිවජ්ජනතො, අසමාහිතපුගුලන්ගේ දුරුකිරීමෙන්ද; සමාහිතපුග්ගලසෙවනතො, සමාහිත පුගුල්සෙවීමෙන්ද; තදධිමුත්තතොති, සමාධියෙහි අධිමුක්තියෙන්දැයි; තත්ථ, එහි; වත්ථුවිසදකිරියා නාම, වස්තුවිසද ක්‍රියා නම්; අජ්ඣත්තිකබාහිරානං වත්ථූනං, ආධ්‍යාත්මබාහ්‍යවස්තූන්ගේ; විසදභාවකරණං, විසදබව කිරීමයි;

දීඝානි හොන්ති සරීරං වා සෙදමලගහිතං, තදා අජ්ඣත්තිකං වත්ථුං අවිසදං හොති අපරිසුද්ධං, යදා පන චීවරං ජිණ්ණං කිලිට්ඨං දුග්ගන්ධං හොති, සෙනාසනං වා උක්කලාපං, තදා බාහිරං වත්ථු අවිසදං හොති අපරිසුද්ධං, අජ්ඣත්තිකෙ බාහිරෙ ච වත්ථුම්හි අවිසදෙ උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු ඤාණම්පි අපරිසුද්ධං හොති, අපරිසුද්ධානි දීෂකපල්ලකවට්ටිතෙලානි නිස්සාය උප්පන්නදීෂසිඛාය ඔභාසො විය, අපරිසුද්ධෙන ච ඤාණෙන සඞ්ඛාරෙ සම්මසතො සඞ්ඛාරාපි අවිභූතා හොන්ති, කම්මට්ඨානමනුයුඤ්ජතො කම්මට්ඨානම්පි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං න ගච්ඡති, විසදෙ පන අජ්ඣත්තිකබාහිරෙ වත්ථුම්හි උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු ඤාණම්පි විසදං හොති, පරිසුද්ධානි දීපකපල්ලකවට්ටිතෙලානි නිස්සාය උප්පන්නදීපසිඛාය ඔභාසො විය, පරිසුද්ධෙන ච ඤාණෙන සඞ්ඛාරෙ සම්මසතො සඞ්ඛාරාපි විභූතා හොන්ති, කම්මට්ඨානමනුයුඤ්ජතො කම්මට්ඨානම්පි වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ගච්ඡති.

---

යදා හි, යම් කලෙක; අස්ස, මොහුගේ; කෙසනඛලොමානි, කෙස් නිය ලොම්හු; දීඝානි හොන්ති, දික්වෙද්ද; සරීරං වා සෙදමලගහිතං, සිරුර හෝ සෙවද මලගන්නා ලදද; තදා, එසමයෙහි; අජ්ඣත්තිකං වත්ථුං අවිසදං හොති, ආධ්‍යාත්ම වස්තුව (අදහැකිවත්) අවිසද වේ; අපරිසුද්ධං, නොපිරිසුදුවේ; යදා පන, යම් කලෙක; චීවරං ජිණ්ණං, චීවරය ජීර්ණවූයේ; කිලිට්ඨං, කිලුටුවූයේ; දුග්ගන්ධං හොති, දුගඳවූයේ වේද; සෙනාසනං වා උක්කලාපං, සෙනස්න හෝ කසළ ඇත්තේ වේද; (වා ශබ්දයෙන් පාත්‍ර ආදීන්ගේද සඞ්ග්‍රහය දතයුතු.) තදා බාහිරං වත්ථු අවිසදං හොති, එකල්හි බාහිර වස්තුව අවිසද වේ; අපරිසුද්ධං, නොපිරිසුදුවේ; අජ්ඣත්තිකෙ බාහිරෙ ච වත්ථුම්හි අවිසදෙ, අජ්ඣත්තික බාහිරවස්තූන් අවිසදකල්හි; උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු; (නිශ්‍රයාදී ප්‍රත්‍යය වශයෙන්) උපන් චිත්තචෛතසිකයන් කෙරෙහි; ඤාණම්පි අපරිසුද්ධං හොති, නුවණද අපරිශුද්ධවේ; අපරිසුද්ධානි, පිරිසුදුනොවූ; දීපකපල්ලකවට්ටිතෙලානි නිස්සාය, පාන් කබල් පියළිතෙල් නිසා; උප්පන්නදීපසිඛාය, උපන් දීපශිඛාවෙහි; ඔභාසො විය, ආලොකය මෙන්; අපරිසුද්ධෙන ච ඤාණෙන, නොපිරිසුදුවූ ඤාණයෙන්; සඞ්ඛාරෙ සම්මසතො, සංස්කාරයන් සම්මර්ශනය කරන්නාහට; සඞ්ඛාරාපි අවිභූතා හොන්ති, සංස්කාරයෝද (සකර හුදු) පහළ නොවෙත්; කම්මට්ඨානමනුයුඤ්ජතො, කමටහන් යොදන්නහුට; කම්මට්ඨානම්පි, කමටහන්ද; වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං න ගච්ඡති, වෘද්ධියට විරූඪියට විපුලබවට නොයේ; විසදෙ පන අජ්ඣත්තිකබාහිරෙ වත්ථුම්හි, අජ්ඣත්තික බාහිරවස්තූන් විසද කල්හි වනාහි; උප්පන්නෙසු චිත්තචෙතසිකෙසු, උපන් චිත්ත චෛතසික දමුන් කෙරෙහි; ඤාණම්පි විසදං හොති, ඤාණයද විසදවේ; පරිසුද්ධානි,

(ආ) ඉන්ද්‍රියසමත්තපටිපාදනං නාම:-සද්ධාදීනං ඉන්ද්‍රියානං සමභාවකරණං, සචෙ හිස්ස සද්ධින්ද්‍රියං බලවං හොති ඉතරානි මන්දානි, තතො විරියින්ද්‍රියං පග්ගහකිච්චං, සතින්ද්‍රියං උපට්ඨානකිච්චං, සමාධින්ද්‍රියං අවික්ඛෙපකිච්චං, පඤ්ඤින්ද්‍රියං දස්සනකිච්චං කාතුං න සක්කොති, තස්මා තං ධම්මසභාවපච්චවෙක්ඛණෙන වා යථා වා මනසිකරොතො බලවං ජාතං, තථා අමනසිකාරෙන හාපෙතබ්බං. වක්කලිත්ථෙරවත්ථු

---

පිරිසුදුවූ; දීපකපල්ලකවට්ටිතෙලානි නිස්සාය, පාත්තබල් පියළි තෙල්තිස්; උප්පන්නදීපසිඛාය ඔභාසො විය, උපන් දීපශිඛාවෙහි ආලෝකය මෙනි; පරිසුද්ධෙන ච ඤාණෙන, පිරිසුදුවූ නුවණින්; සඞ්ඛාරෙ සම්මසතො, සංස්කාරයන් සම්මර්ශනය කරන්නාහට; සඞ්ඛාරාපි විභූතා හොන්ති, සංස්කාරයෝද විභූත වෙති; [කම්මට්ඨානමනුයුඤ්ජතො, කමටහන් යොදන්නහුට;] කම්මට්ඨානම්පි, සමථ කමටහනද; වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ගච්ඡති, (අඞ්ගප්‍රාදුර්භාවයෙන්) වෘද්ධියට (ප්‍රගුණභාවයෙන්) විරූඪියට සර්වප්‍රකාර වශීභාවයෙන් වෛපුල්‍යයට යේ.

(ආ) ඉන්ද්‍රියසමත්තපටිපාදනං නාම, ඉන්ද්‍රියයන්ගෙ සමබවට පැමිණීම නම්; සද්ධාදීනං ඉන්ද්‍රියානං, ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන්ගෙ; සමභාවකරණං, සමබව කිරීමයි. (ප්‍රත්‍යය හෙයින් අනූනාධිකබව කිරීමයි.) සචෙ හි, ඉදින්, අස්ස, ඒ යොගීහට; සද්ධින්ද්‍රියං බලවං හොති, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත්වේද; ඉතරානි මන්දානි, ඉතරයෝ මඳවෙද්ද; තතො, එහෙයින්; (ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ඉතරයන් මඳ බැවින් යන අර්ථයි.) විරියින්ද්‍රියං පග්ගහකිච්චං, වීර්යෙන්ද්‍රියතෙමේ (සම්ප්‍රයුක්තධර්මයන්ට අනුබල දීමෙන්) හුවන කෘත්‍යය; ("කාතුං න සක්කොති" යි සම්බන්ධකරනු-සෙසු පෙදෙහිදු මෙම නිය) සතින්ද්‍රියං, සිහි ඉඳුරු; උපට්ඨානකිච්චං, අරමුණට එළඹ සිටිනා කිස (අරමුණු නොහරනා කිස හෝ); සමාධින්ද්‍රියං, සමාධි ඉඳුරු; අවික්ඛෙපකිච්චං, යපියයුතු දමුන් නොවිසිරිය දෙන කිස; පඤ්ඤින්ද්‍රියං, පැනඉඳුරු; දස්සනකිච්චං, (රූව අරමුණක් ඇසින්මෙන්) යථාවත්ව විෂය සවභාව දක්නා කෘත්‍යය; කාතුං, කරන්නට; න සක්කොති, නොපොහොසත්; තස්මා, එහෙයින්; තං, ඒ (බලවත් ශ්‍රද්ධෙන්ද්‍රියයෙන් මඩනාලද හෙයින්) ඉඳුරුධර්මසවභාව; පච්චවෙක්ඛණෙන වා, (යම් හැදහිය හැකි වස්තුවක්හුගේ උදාරතාදි ගුණයෙහි අධිමුච්චනයාගේ සාතිශය පැවැත්මෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත්වේද ඒ වස්තුහුගේ ප්‍රත්‍යය සමුත්පන්නාදි විභාගය වෙන් වෙන් කොට මෙනෙහි කිරීමෙන් හෝ යන අර්ථයි. මෙසේ ධර්මතානය සවභාව සවරසවශයෙන් පරිග්‍රහ කරන කල්හි මේ මේ දහමුන්ගේ සවභාවය යන ප්‍රඥාව්‍යාපාරය බලවත් බැවින් අධිමොක්ෂය සවිෂථාරවිය නොහේ-ධූරිය දහමුන් කෙරෙහි වනාහි යම්සේ ශ්‍රද්ධාවගේ බලවභාවයෙහි ප්‍රඥාවගේ මන්දභාවයද එසේම ප්‍රඥාවගේ බලවභාවයෙහි ශ්‍රද්ධාවගේ මන්දභාවය වෙයි දන්නේ එයින්

වත්ථු නිදස්සනං. සචෙ පන විරියින්ද්‍රියං බලවං හොති අථ නෙව සද්ධින්ද්‍රියං අධිමොක්ඛකිච්චං කාතුං සක්කොති, න ඉතරානි ඉතර කිච්චභෙදං, තස්මා තං පස්සද්ධාදි භාවනාය හාපෙතබ්බං, තත්‍රාපි සොණත්ථෙරස්ස වත්ථු දස්සෙතබ්බං. එවං සෙසෙසුපි එකස්ස බලවභාවෙ සති ඉතරෙසං අත්තනො කිච්චෙසු අසමත්ථතා වෙදිතබ්බා෴

(අ) විසෙසතො පනෙත්ථ සද්ධාපඤ්ඤානං සමාධිවිරියානඤ්ච සමතං පසංසන්ති, බලව සද්ධො හි මන්දපඤ්ඤො මුධප්පසන්නො හොති අවත්ථුස්මිං පසීදති, බලවපඤ්ඤො මන්දසද්ධො කෙරාටිකපක්ඛං භජති භෙසජ්ජ සමුට්ඨිතො විය රොගො අතෙකිච්ඡො හොති, උභින්නං සමතාය

---

කිහ "ධම්මසභාව පච්චවෙක්ඛණෙන හාපෙතබ්බං" යි) යථාමනසිකරොතො, යම් ආකාරයකින් හෝ මෙනෙහිකරනුවහට; බලවං ජාතං, (ශ්‍රද්ධෙන්ද්‍රිය) බලවත්වීද; තථා අමනසිකාරෙන, එසේ මෙනෙහි නොකිරීමෙන්; හාපෙතබ්බං, පහළවියයුතු; (විරියාදීන්ගේ පටු කෘත්‍ය භාවිවහවූ මනසකාරයෙන් ඔවුන්ගේ ඔවුන් හා ශ්‍රද්ධෙන්ද්‍රිය සමරස කරන්නහු විසින් පිරිහෙළිය යුතුය යන අර්ථයි - සෙසු ඉඳුරන් කෙරෙහිදු භාපනවිධිය මෙම නයින්ම දතයුතු.) එත්ථ ච, මෙහි වනාහි; වක්කලිත්ථෙරවත්ථු වක්කලිනම් තෙරුන්ගේ වත, නිදස්සනං, දෘෂ්ටාන්තයි; සචෙ පන ඉදින් විරියින්ද්‍රියං බලවං හොති, වීර්‍ය්‍යෙන්ද්‍රිය බලවත් වීනම්; අථ, එසේ කල්හි; සද්ධින්ද්‍රියං, ශ්‍රද්ධෙන්ද්‍රිය; අධිමොක්ඛ කිච්චං කාතුං, අධිමොක්ෂ කෘත්‍යය කරනුවම; නෙවසක්කොති, නොම පොහොසත්වෙයි; ඉතරානි, සෙසු ඉඳුරෝ; ඉතරකිච්චභෙදං, සෙසු උපස්ථානාදි කෘත්‍යභෙදය, ('නෙව කාතුං සක්කොන්ති" යි යොදනු.) තස්මා, එහෙයින්; තං, ඒ වීර්‍ය්‍යෙන්ද්‍රිය; පස්සද්ධාදි භාවනාය හාපෙතබ්බං, පස්සද්ධි සමාධි උපෙක්ඛා යන මේ වුන්ගේ භාවනායෙන් හෙළියයුතු, තත්‍රාපි එහිදු; සොණත්ථෙරස්ස වත්ථු, සොණනම් තෙරුන් ගේ වත; දස්සෙතබ්බං, දක්වියයුතු; සෙසෙසුපි, සති සමාධි පඤ්ඤින්ද්‍රිය යන් කෙරෙහිදු; එවං, මෙසේමැයි; එකස්ස බලවභාවෙ සති, එකක්හුගේ බලවත්බව ඇතිකල්හි; ඉතරෙසං, සෙස්සවුන්ගේ; අත්තනො කිච්චෙසු අසමත්ථතා, තමතමන්ගේ කෘත්‍යයෙහි අසමර්ථබව; වෙදිතබ්බා, දතයුත්තීයි෴

(අ) එත්ථ, මේ පඤ්චින්ද්‍රියයන් කෙරෙහි; විසෙසතො පන, විශෙෂයෙන් වනාහි; සද්ධාපඤ්ඤානං, ශ්‍රද්ධාප්‍රඥාවන්ගේද; සමාධිවිරියානඤ්ච, සමාධි වීර්‍ය්‍යයන්ගේද; සමතං පසංසන්ති, සමබව පසසිත්; බලවසද්ධො හි, බලවත් ශ්‍රද්ධා ඇති; මන්දපඤ්ඤො මඳනුවණ ඇත්තේ; මුධප්පසන්නො හොති, නොදැන පහදනේ වේ; අවත්ථුස්මිං පසීදති, (මුග්ධප්‍රසන්න බැවින් තීර්ථකයන්මෙන්) අවස්තුවෙහි පහදනේයි; බලවපඤ්ඤො, බලවත් ප්‍රඥා ඇත්තේ; මන්දසද්ධො, මඳවූ සැදැහැ ඇත්තේ; කෙරාටික පක්ඛං භජති, (සිත් උපන්පමණින්ම කුසල්වෙයි දන්ආදී දීමෙන්

චක්ඛුසමං යෙව පසීදති, බලවසමාධිං පන මන්දවිරියං සමාධිස්ස කොසජ්ජපක්ඛත්තා කොසජ්ජං අභිභවති, බලව විරියං මන්දසමාධිං විරියස්ස උද්ධච්චපක්ඛත්තා උද්ධච්චං අභිභවති, සමාධි පන විරියෙන සංයොජිතො කොසජ්ජෙ පතිතුං න ලභති, විරියං සමාධිනා සංයොජිතං උද්ධච්චෙ පතිතුං න ලභති, තස්මා තදුභයං සමං කාතබ්බං, උභයසමතාය හි අප්පනා හොති, අපි ච සමාධිකම්මිකස්ස බලවතීපි සද්ධා වට්ටති, එවං සද්දහන්තො ඔකප්පෙන්තො අප්පනං පාපුණිස්සති, සමාධිපඤ්ඤාසු පන සමාධිකම්මිකස්ස එකග්ගතා බලවතී වට්ටති, එවං හි සො අප්පනං

---

කටයුතුකිමැයි) කෙරවිතපක්ෂය සෙවුනේ වේ; හෙසජ්ජසමුට්ඨිතො විය රොගො, බෙහෙදින් උපන් රෝගයක්මෙන්; අතෙකිච්ඡො හොති, පිළියම්කටයුතු නොවේ; (මෙබඳුවූයේ වනාහි ශුෂ්කතර්කයෙන් විලුම්පමාන සිත්ඇත්තේ නුවණැත්තවුන් තෙපුල් නොගිවිස්නේයයි යන අදහසි.) උභින්නං සමතාය, ශ්‍රද්ධාප්‍රඥා දෙදෙනාගේ සමබවයෙන්; චක්ඛුසමං යෙව පසීදති, වත්හිම පහදනේයි; බලව සමාධිං පන, බලවත්සමාධිඇතිවූ; මන්දවිරියං, මන්දවීර්‍ය්‍යඇත්තහු සමාධිස්ස කොසජ්ජපක්ඛත්තා, සමාධිහු කෞසීද්‍යපක්ෂහෙයින්; කොසජ්ජං අභිභවති, කෞසීද්‍යය මැඩපවතී;(එසෙයින් අර්පණාවට නොපැමිණේ යන අභිප්‍රායයි– "උද්ධච්චං අභිභවති"යනුයෙහි දු මෙමනියි.) බලවවීරියං, බලවත්වීර්‍ය්‍ය ඇත්තාවූ; මන්දසමාධිං, මඳසමාධිඇත්තහු; විරියස්ස උද්ධච්චපක්ඛත්තා, වීර්‍ය්‍යය ඖද්ධත්‍යපක්ෂහෙයින්; උද්ධච්චං අභිභවති, උද්ධච්චය මැඩපවතී;සමාධි පන,සමාධියවනාහි; විරියෙන සංයොජිතො,වීර්‍ය්‍යහා යොදනලද්දේ;කොසජ්ජෙ පතිතුං න ලභති,කෞසීද්‍යයෙහි හෙන්නට නොලැබේ; විරියං, වීර්‍ය්‍යය;සමාධිනා සංයොජිතං, සමාධිය හා යොදන ලද්දේ; උද්ධච්චෙ පතිතුං න ලභති, උද්ධච්චයෙහි හෙන්නට නොලැබේ (ඖද්ධත්‍යපක්ෂයට නොයේ);තස්මා,එහෙයින්;තදුභයං ඒ ශ්‍රද්ධාප්‍රඥාදෙක හා සමාධිවීර්‍ය්‍යදෙකද; සමං කාතබ්බං, සමකටයුතු; උභයසමතාය හි, දෙදෙනාගේ සමබැවින්; අප්පනා හොති, අර්පණාවේ; අපි ච, අනිකෙකුදු; සමාධිකම්මිකස්ස, සමාධිකර්මිකයහට; බලවතීපි සද්ධා වට්ටති, බලවත්වූද සැදැහැ වටී; එවං, එසේකල්හි; (මඳක් ශ්‍රද්ධාව බලවත්කල "සද්ධා පස්සී"යි කී පමණකින් ධ්‍යාන්නම් කෙසේවේදැයි නොසලකා එකාන්තයෙන් බුදුන්විසින් කියනලද මේවිධිම සිඬමන්නේම යයි) සද්දහන්තො, හදහන්නේ; ඔකප්පෙන්තො, වැදහදහන්නේ; අප්පණං පාපුණිස්සති,අර්පණාවට පැමිණේ; සමාධිපඤ්ඤාසු පන, සමාධිප්‍රඥා දෙදෙනාකෙරෙහි වනාහි; සමාධිකම්මිකස්ස, සමාධිකර්මිකයහට; එකග්ගතා බලවතී වට්ටති, (ධ්‍යානය සමාධි ප්‍රධානබැවින්) එකාග්‍රතා තොමෝ බලවත්වී වටී; එවං හි, එසේකල්හි; (මඳක් එකාග්‍රතාව බලවත්කල්හි;) සො, හෙතෙම; අප්පණං පාපුණාති, අර්පණාවට

පාපුණාති, විපස්සනාකම්මිකස්ස පඤ්ඤා බලවතී වට්ටති, එවං හි සො ලක්ඛණපටිවෙධං පාපුණාති, උභින්නං පන සමතතාපි අප්පනා හොති යෙව, සති පන සබ්බත්ථ බලවතී වට්ටති, සති හි චිත්තං උද්ධච්චපක්ඛිකානං සද්ධාවිරියපඤ්ඤානං වසෙන උද්ධච්චපාතතො කොසජ්ජපක්ඛෙන ච සමාධිනා කොසජ්ජපාතතො රක්ඛති, තස්මා සා ලොණධූපනං විය සබ්බබ්‍යඤ්ජනෙසු, සබ්බකම්මිකඅමච්චො විය ච සබ්බරාජකිච්චෙසු, සබ්බත්ථ ඉච්ඡිතබ්බා. තෙනාහ:–"සති පන සබ්බත්ථිකා වුත්තා භගවතා, කිං කාරණා? චිත්තං හි සතිපටිසරණං, ආරක්ඛපච්චුපට්ඨානා ච සති, න විනා සතියා චිත්තස්ස පග්ගහනිග්ගහො හොතී"ති.

---

පැමිණේ; විපස්සනා කම්මිකස්ස, විදර්ශනා කර්මිකයහට; පඤ්ඤා බලවතී වට්ටති, ප්‍රඥතොමෝ බලවත්වී වටී; එවං හි, එසේකල්හි; සො, හෙ තෙම; ලක්ඛණපටිවෙධං පාපුණාති, ලක්ෂණප්‍රතිවෙධයට පැමිණේ; උභින්නං පන සමතතාපි, සමාධිප්‍රඥදෙදෙනාගේ සමබැවිනුදු; අප්පනායෙව හොති, අර්පණා වේ මැයි; (සමාධිකර්මිකයහට සමාධිබලවත් බව කැමතිවිය යුතුයයි හගවතපිණිස "සමතතාපි"යි කීහු "අප්පනා" යයිදු සමාධි ගතයුතු-එහෙයින්ම "සාසඞ්කාව හොති යෙව"යි යුහු-ලොවුතුරුඅර්පණා වනාහි ඔවුන්ගේ සමබැවින් කැමතිවතුලැබේ-එහෙයින්ම කීහ. "සමථවිපස්සනං යුගනද්ධං භාවෙති"යි.) සති පන, සිහිවනාහි; සබ්බත්ථ, ලීනඋද්ධතපක්ෂයෙහි සිටි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙහිම; බලවතී වට්ටති, බලවත් වී වටී; සති හි, සිහිතොමෝ; චිත්තං, සිත්හු; උද්ධච්චපක්ඛිකානං, ඖද්ධත්‍යපක්ෂයෙහි සිටි; සද්ධාවිරියපඤ්ඤානං වසෙන, ශ්‍රද්ධාවීර්‍ය්‍යප්‍රඥවන්ගේ වශයෙන්; උද්ධච්චපාතතො, උද්ධච්චයෙහි හීමෙන් ද; කොසජ්ජපක්ඛෙන සමාධිනා, කෞසීද්‍ය පක්ෂවූ සමාධිහු විසින්; කොසජ්ජපාතතො, කෞසීද්‍යයෙහි හීමෙන්ද; රක්ඛති, රකී; තස්මා, එහෙයින්; සා, ඒ සිහිතොමෝ; ලොණධූපනං විය සබ්බබ්‍යඤ්ජනෙසු, සියලුව්‍යඤ්ජනයෙහි ලුණු හා තෙල් හෙයින් ද; සබ්බකම්මිකඅමච්චො විය ච සබ්බරාජකිච්චෙසු, සියලු රාජකෘත්‍යයෙහි සියලු කටයුත්තෙහි තියුකත ඇමතියාමෙන් ද; සබ්බත්ථ, හැමතැනම; ඉච්ඡිතබ්බා, පැසැස්ස යුතුතීයි; තෙනාහ, එහෙයින් කීහ; සති පන, සිහිවනාහි; සබ්බත්ථිකා වුත්තා භගවතා, භගවත්හුවිසින් හැමතැන්ම කැමතිවිය යුතුතීයි කියනලදු; කිං කාරණා, කවර කරුණයත්?; චිත්තං හි, කුසල්සිත තෙමේ; සතිපටිසරණං, සමෘතියම පිළිසරණ කොට ඇත්තේයි; (අප්‍රාප්තයාගෙ ප්‍රාප්තියටද අනධිගතයාගෙ අධිගමයටද සමෘතියම සරණය යන අර්ථයි.) සති, සිහිතොමෝ; ආරක්ඛපච්චුපට්ඨානා, ආරක්ෂාව වැටහීම් කොට ඇත්තීයි; සතියා විනා, සමෘතිය නැතිව; චිත්තස්ස, චිත්තයාගේ; පග්ගහනිග්ගහො න හොතීති, ප්‍රග්‍රහ නිග්‍රහදෙක නොවන්නේයි.

(අ) නිමිත්ත කොසල්ලං නාම:-පඨවිකසිණාදිකස්ස චිත්තෙකග්ගතා නිමිත්තස්ස අකතස්ස කරණ කොසල්ලං, කතස්ස භාවනා කොසල්ලං, භාවනාය ලද්ධස්ස රක්ඛණකොසල්ලඤ්ච. තං ඉධ අධිප්පෙතං. කථඤ්ච යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති? යදාස්ස අතිසිථිල විරියතාදීහි ලීනං චිත්තං හොති, තදා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගාදයො තයො අභාවෙත්වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගාදයො තයො භාවෙති. වුත්තං හෙතං භගවතා. "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො පරිත්තං අග්ගිං උජ්ජාලෙතුකාමො අස්ස, සො තත්ථ අල්ලානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය අල්ලානි චෙව ගොමයානි පක්ඛිපෙය්‍ය අල්ලානි චෙව කට්ඨානි පක්ඛිපෙය්‍ය උදකවාතඤ්ච දදෙය්‍ය පංසුකෙන ච ඔකිරෙය්‍ය,

---

(අ) නිමිත්තකොසල්ලං නාම, නිමිත්තකෞශල්‍ය නම්; පඨවිකසිණාදිකස්ස, පෘථිවිකසුණු ආදීවූ; චිත්තෙකග්ගතා නිමිත්තස්ස, සිත් එකඟ බවට කරුණුවූ කසුණු නිමිත්හු; අකතස්ස, නොඋපදවනලද්දහුගේ; කරණ කොසල්ලං, ඉපදවීමෙහි දක්‍ෂබව; කතස්ස, උපදවනලද්දහුගේ; භාවනාකොසල්ලං, භාවනාවෙහි දක්‍ෂබව; භාවනාය ලද්ධස්ස, භාවනාවෙන් ලද්දහුගෙ; රක්ඛණකොසල්ලඤ්ච, රක්‍ෂණයෙහි දක්‍ෂබවයි; තං, ඒ රක්‍ෂණ කෞශල්‍යය; ඉධ, මේ අපීණා කෞශල්‍ය කථාවෙහි; අධිප්පෙතං, (නිමිත්ත කෞශල්‍යයයි) අභිමතයි; (සිත්හුගේ සමාහිත ආකාරය සලකා සමථනිමිත් රක්නාහුම කසුණු නිමිත් රක්නා බැවින් "පඨවිකසිණාදිකස්ස"යන තැන ආදි ග්‍රහණින් කෙවල ප්‍රතිභාග නිමිත්තම නොව සමථනිමිත්හුගේ ග්‍රහණයද දතයුතු. මේ අර්‍ථයෙහි "චිත්තෙකග්ගතා නිමිත්තස්ස"යන තැන "චිත්තෙකග්ගතා සඞ්ඛාතස්ස නිමිත්තස්ස"යි අර්‍ථගතයුතු.) කථඤ්ච...පෙ...යදා, යම් කලෙක; අස්ස, මේ යොගිහුගෙ; චිත්තං, භාවනාසිතතෙමේ; අතිසිථිල විරියතාදීහි, ඉතා සිථිල වීර්‍ය්‍ය ඇතිබව යනාදීන්; ලීනං හොති, හැකිලෙන්නේවේද; (ආදිග්‍රහණින් සධ්‍යාපත විහිළිබැව් ගණීත් යනු මෙතන සන්‍යය ටීකාචාරීන්-හේ "පමොදන සංවෙදන විපරියයෙ සංගණ්හාති"යි කීහු.) තදා, එවේලෙහි; පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදයො තයො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදී තුන්දෙනා; අභාවෙත්වා,[1] නොවඩා; ධම්මවිචයසම්බොජ්ඣඞ්ගාදයො තයො භාවෙති, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගාදී තුන්දෙන වඩන්නේයි; භගවතා, භගවත්හු විසින්; එතං, මේ; වුත්තං හි, වදාළේමය; භික්ඛවෙ, මහණෙනි; පුරිසො, පුරුෂ තෙමේ; සෙය්‍යථාපි, යම්සේ; පරිත්තං අග්ගිං, මඳවූ ගින්න; උජ්ජාලෙතුකාමො අස්ස, දල්වනු කැමැතිවේද; සො, හෙතෙම; තත්ථ, ඒ මඳගින්නෙහි; අල්ලානිචෙව තිණානි පක්ඛිපෙය්‍ය, අලුත් තණ බහාලන්නේද; අල්ලානිචෙව ගොමයානි පක්ඛිපෙය්‍ය, අලුත් ගොම බහාලන්නේද; අල්ලානි චෙව කට්ඨානි පක්ඛිපෙය්‍ය, අලුත් දර බහාලන්නේද; උදකවාතඤ්ච දදෙය්‍ය, දියමුසු වාතය දෙන්නේද; පංසු

---

1. අවඩ්ඪෙත්වා.

භබ්බො නු ඛො සො භික්ඛවෙ පුරිසො තං පරිත්තං අග්ගිං උජ්ජලෙතුන්ති, නොහෙතං භන්තෙ, එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ ලීනං චිත්තං හොති; අකාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, අකාලො සමාධි…පෙ…අකාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු? ලීනං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි දුස්සමුට්ඨාපයං හොති, යස්මිඤ්ච ඛො භික්ඛවෙ සමයෙ ලීනං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, කාලො…පෙ…විරිය…පෙ…කාලො පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, තං කිස්ස හෙතු? ලීනං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි සුසමුට්ඨාපයං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො පරිත්තං අග්ගිං උජ්ජලෙතුකාමො අස්ස, සො තත්‍ර සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය සුක්ඛානි චෙව ගොමයානි පක්ඛිපෙය්‍ය සුක්ඛානි චෙව කට්ඨානි පක්ඛිපෙය්‍ය මුඛවාතඤ්ච දදෙය්‍ය, න ච පංසුකෙන ඔකිරෙය්‍ය, භබ්බො නු ඛො සො භික්ඛවෙ පුරිසො තං පරිත්තං අග්ගිං උජ්ජලෙතුන්ති? එවම්භන්තෙ”ති…

---

කෙන ච ඔකිරෙය්‍ය, පස් ඕනේද; භික්ඛවෙ, මහණෙනි; සො පුරිසො, ඒ පුරුෂතෙමේ; තං පරිත්තං අග්ගිං, ඒ මඳගින්න; උජ්ජලෙතුං, දල්වන්නට; භබ්බො නු ඛොති, පොහොසත්දැයි (පුළුවුත්හු); නො හෙතං භන්තෙ, වහන්ස නොපොහොසතැයි (ප්‍රතිවචන දුන්හු); භික්ඛවෙ, මහණෙනි; එවමෙවඛො, එපරිද්දෙන්ම; යස්මිං සමයෙ ලීනං චිත්තං හොති, යම් සමයෙක සිත හැකුළුනේවේද; තස්මිං සමයෙ, එසමයෙහි; පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය, වැඩීමට; අකාලො, නොකල; අකාලො…පෙ…තං කිස්ස හෙතු, එයට කාරණා කිම;? භික්ඛවෙ, මහණෙනි; චිත්තං, සිත; ලීනං, හැකුළුණේය; තං, හේ; එතෙහි ධම්මෙහි, ප්‍රශ්‍රබ්ධිසමාධි උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය යන මේ ධර්මයෙන්; දුස්සමුට්ඨාපයං හොති, නගන්නට නොපිළිවන් වේ; භික්ඛවෙ, මහණෙනි; යස්මිං සමයෙ, යම් සමයෙක; චිත්තං, සිත; ලීනං හොති, ලීනවේද; තස්මිං සමයෙ, එසමයෙහි; ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය, වැඩීමට; කාලො, කල; කාලො…පෙ…විරිය…පෙ…තං, හේ; එතෙහි ධම්මෙහි, මේ ධම්මවිචය විරිය පීතිසම්බොජ්ඣඞ්ගධර්මයෙන්; සුසමුට්ඨාපයං හොති, සුවසේ නැගියහැකි වේ; සෙය්‍යථාපි…පෙ… සුක්ඛානිචෙව තිණානි පක්ඛිපෙය්‍ය, වියළිතණ බහාලන්නේද; සුක්ඛානි චෙව ගොමයානි පක්ඛිපෙය්‍ය, වියළිගොම බහාලන්නේද; සුක්ඛානි චෙව කට්ඨානි පක්ඛිපෙය්‍ය, වියළි දර බහාලන්නේද; මුඛවාතඤ්ච දදෙය්‍ය, මුවෙන් සුළං ඕනෙද; නච පංසුකෙන ඔකිරෙය්‍ය, නොදපස් ඕනෙද; භික්ඛවෙ, මහණෙනි; සො පුරිසො, ඒ පුරුෂතෙමේ; තං පරිත්තං අග්ගිං උජ්ජලෙතුං, ඒ මඳගින්න දල්වන්ට; භබ්බො නු ඛො, භව්‍යද කීහු; එවම්භන්තෙති, වහන්ස එසේයයි ප්‍රතිවචන දුන්හු…

(අ) එත්ථ ච යථාසකං ආහාරවසෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගාදීනං භාවනා වෙදිතබ්බා; වුත්තං හෙතං. "අත්ථි භික්ඛවෙ කුසලාකුසල ධම්මා සාවජ්ජානවජ්ජා ධම්මා හීනප්පණීතා ධම්මා කණ්හසුක්ක සප්පටිභාගා ධම්මා,

(ආ) තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරෙ, අයමාහාරෙ අනුප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තතී"ති. තථා "අත්ථි භික්ඛවෙ ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු. තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරෙ, අයමාහාරෙ අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය,

---

(අ) එත්ථ ච, මෙහිදු; යථාසකං ආහාරවසෙන, තමන් තමන්ගේ ප්‍රත්‍යය වශයෙන්; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදීනං භාවනා, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදීන්ගේ; (උත්පාදවර්ධන සඞ්ඛ්‍යාත) භාවනාතොමෝ; වෙදිතබ්බා, දතයුත්තීයි; වුත්තංහෙතං, වදාළේමය; භික්ඛවෙ, මහණෙනි; කුසලාකුසලධම්මා, කුශලාකුශලධර්මයෝ; සාවජ්ජානවජ්ජා ධම්මා, සාවද්‍යානවද්‍ය ධර්මයෝ; හීනප්පණීතා ධම්මා, හීනප්‍රණීත ධර්මයෝ; කණ්හසුක්කසප්පටිභාගා ධම්මා, කෘෂ්ණශුක්ල සප්‍රතිභාග ධර්මයෝ; අත්ථි, ඇති; (මෙහි කෞශල්‍ය සම්භූතාර්ථයෙන් කුශලයෝ යි-කුශලහෙතුක ප්‍රතිපක්ෂ හෙයින් අකුශලයෝයි-උක්ත ලක්ෂණ අකුශලයෝම සාවද්‍යයහ කුසලයෝ අනවද්‍යයෝයි එසේම අකුසලයෝ හීනයෝයි කුසලයෝ ප්‍රණීතයෝයි නොහොත් කුසලයෝම හීනච්ඡන්දාදීන් ප්‍රවෘත්ත ආරබ්ධයෝ හීනයහ සෙස්සෝ ප්‍රණීතයෝයි-අන්‍යොන්‍ය ප්‍රතිපක්ෂ කුශලාකුශලධර්මයෝ කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාගධර්ම නම් වෙත් නොහොත් "කණ්හා ච සුක්කා ච සප්පටිභාගා ච කණ්හසුක්කසප්පටිභාගා"යි-කෘෂ්ණ ශුක්ල ධර්මයන් වෙන්කොටගෙන සුඛවෙදනා දුක්ඛවෙදනාවට ප්‍රතිපක්ෂ හෙයින් සප්‍රතිභාගය දුක්ඛවෙදනා සුඛවෙදනාවට පිළිපක් හෙයින් සප්‍රතිභාගයයි අර්ථගතයුතු.)

(ආ) තත්‍ර, ඒ ධර්මයන් කෙරෙහි; යොනිසොමනසිකාර බහුලීකාරෙ, යොනිසොමනස්කාරයාගේ යම් බොහෝ කිරීමෙක් ඇද්ද; අයමාහාරෙ, මේ ආහාරය තෙමේ; අනුප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස, නොඋපන් හෝ ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය, උත්පාදනය පිණිස; උප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස, උපන් හෝ ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ; භියොභාවාය, නැවත නැවත වීම පිණිස; වෙපුල්ලාය, විපුලබව පිණිස; භාවනාය, වෘද්ධිය පිණිස; පාරිපූරියා, පරිපූර්ණවන පිණිස; සංවත්තති, පවතී; තථා, එසේම; ආරම්භධාතු, ආද්‍යාරම්භයෙහි ප්‍රවෘත්තවීර්‍ය්‍යය; නික්කමධාතු, කෞසීද්‍යයෙන් නික්මුණු බලවත් වීර්‍ය්‍යය; පරක්කමධාතු, මත්තට යන ඉතා බලවත් වීර්‍ය්‍යය;-තත්‍ර, ඒ ආරම්භධාතු ආදියෙහි;-පෙ-පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානීයාධම්මා, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගස්ථානීය ධර්මයෝ; (සෙසු පෙදෙහි

උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තතී"ති. තථා "අත්ථි භික්ඛවෙ පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා, තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තතී"ති තත්ථ සභාවසාමඤ්ඤලක්ඛණපටිවෙධවසෙන පවත්තමනසිකාරො කුසලාදීසු **යොනිසොමනසිකාරො** නාම, ආරම්භධාතු ආදීනං උප්පාදවසෙන පවත්තමනසිකාරො ආරම්භධාතු ආදීසු යොනිසොමනසිකාරො නාම. තත්ථ **ආරම්භධාතූති** පඨමවිරියං වුච්චති, **නික්කමධාතූති**-කොසජ්ජතො නික්ඛන්තත්තා තතොපි බලවතරං, **පරක්කමධාතූති**-පරං පරං ඨානං අක්කමනතො තතොපි බලවතරං; පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මාති පන-පීතියා එවෙතං නාමං, තස්සාපි උප්පාදකමනසිකාරො යොනිසොමනසිකාරො නාම...

---

අත්ථි ප්‍රථමවාරයෙහි කී නයින් දතයුතු.) තත්ථ "අත්ථි භික්ඛවෙ"යනාදීන් දක්වනලද පාඨයෙහි; සභාවසාමඤ්ඤලක්ඛණ පටිවෙධවසෙන, (කුසලාදීන්ගෙ අනවද්‍ය සුඛවිපාකාදිය ස්පර්ශාදීන්ගේ ඵුසනාදිය යන) ස්වභාවලක්ෂණයාගෙ ද අනිත්‍යාදි සාමාන්‍ය ලක්ෂණයාගෙ ද ප්‍රතිවෙධ වශයෙන්; පවත්තමනසිකාරො, ප්‍රවෘත්ත මනස්කාරය තෙමේ; (කුසලාදීන්ගෙ ඒ ඒ ස්වභාව ලක්ෂණාදීන්ගේ තත්වාවබොධ වශයෙන් උපන් ජවනචිත්තොත්පාදම අවිපරීත මනස්කාර බැවින් යොනිසොමනස්කාර යයි කියනලදී.) කුසලාදීසු යොනිසොමනසිකාරො නාම, කුසලාදීන් කෙරෙහි යොනිසොමනස්කාර නම්; ආරම්භධාතු ආදීනං, ආරබ්ධ ධාතු ආදීන්ගේ; උප්පාදවසෙන පවත්තමනසිකාරො, උත්පාදවශයෙන් ප්‍රවෘත්ත මනස්කාරය; ආරම්භධාතු ආදීසු යොනිසොමනසිකාරො නාම, ආරබ්ධධාත්වාදීන් කෙරෙහි යොනිසොමනස්කාර නම්; තත්ථ, ඒ ආරබ්ධධාත්වාදීන් කෙරෙහි; ආරම්භධාතූති, ආරම්භධාතු නම්; පඨමවිරියං වුච්චති, ප්‍රථමවීර්‍ය්‍යයි කියන ලැබේ; (කුශලක්‍රියාවෙහි ආද්‍යාරබ්ධ වශයෙන් ප්‍රවෘත්තවීර්‍ය්‍යය ධෘතිස්වභාව බැවින් ධාතු නම් වේනුයි "ආරම්භධාතූති පඨමවිරියං වුච්චති"යි කීහු ) නික්කමධාතූති, නික්කමධාතුයයි; කොසජ්ජතො නික්ඛන්තත්තා, කෞසීද්‍යයෙන් නිර්ගත බැවින්; තතො බලවතරං, ආරබ්ධධාතුවට වඩා අතිශයෙන් බලවත්වූ වීර්‍ය්‍යයි; ("වුච්චති"යි සම්බන්ධ කරනු.) පරක්කමධාතූති, පරක්කමධාතුයයි; පරම්පරඨානං අක්කමනතො, මතුමත්තට යන හෙයින්; තතොපි බලවතරං, නික්කමධාතුවටද වඩා අතිශයෙන්ම බලවත්වූ වීර්‍ය්‍යයි කියන ලැබේ; පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මාති පන, ප්‍රීතිසම්බොධ්‍යඞ්ග ස්ථානීය ධර්මයහ; පීතියා එවෙතං නාමං, ප්‍රීතියටම නම්; (**"තිට්ඨති පවත්තති එත්ථාති ඨානියා පීතිසම්බොජ්ඣඞ්ගස්ස ඨානියා පීති සම්බොජ්ඣඞ්ගට්ඨානියා ඨානභූතා වා ඨානියො පීතිසම්බොජ්ඣඞ්ගො**

(අ) අපි ච සත්තධම්මා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති:—පරිපුච්ඡකතා, වත්ථුවිසදකිරියතා, ඉන්ද්‍රියසමත්තපටිපාදනා, දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා, පඤ්ඤවන්තපුග්ගලසෙවනා, ගම්භීරඤාණචරියපච්චවෙක්ඛනා, තදධිමුත්තතාති. එකාදසධම්මා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති:– අපායාදිභයපච්චවෙක්ඛනතා, විරියායත්තලොකියලොකුත්තර විසෙසාධිගමානිසංසදස්සිතා, බුද්ධපච්චෙකබුද්ධමහාසාවකෙහි ගතමග්ගො මයා ගන්තබ්බො සො ච න සක්කා කුසීතෙන ගන්තුන්ති එවං ගමනවීථිපච්චවෙක්ඛනතා,

---

ඨානීයො එතෙසූති පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානීයා අපරාපරං පවත්තමානා පීතිසම්බොජ්ඣඞ්ගසම්පයුත්තා ධම්මා තස්මා පනෙතෙසු පීති යෙව පීතිසම්බොජ්ඣඞ්ගස්ස විසෙසකාරණං තස්මා වුත්තං පීතියා එවෙතං නාමන්ති”) තස්සාපි, ඒ ප්‍රීතියගේද; උප්පාදකමනසිකාරෙ, උපදවන මනස්කාරය; (යම්සේ මෙනෙහිකරනුවහට නො උපන් ප්‍රීති සම්බොධ්‍යඞ්ගය උපදීද උපන්නේ වඩීද එසේ පවත්නා මනස්කාරය යන අර්ථයි.) යොනිසො මනසිකාරො නාම, යොනිසොමනස්කාර නම...

(අ) [අපි ච, වැලි එකෙක් ඇත; ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය, ඉපදවීම පිණිස; සත්තධම්මා, ධර්මයෝ සත්දෙනෙක්; සංවත්තන්ති, පවතිත්; පරිපුච්ඡකතා, භාත් පසින් බැස විචාරන බවය; (පස්මහසඟිය ඉගෙනද ආචාර්‍ය්‍යයන් සෙවනය කොට ඒ ඒ පදයාගේ අර්ථය විචාරන්නහුටද අටුවා සහිත පඤ්චනිකායය හෝ ඉගෙන යම් යම් ග්‍රන්ථිස්ථාන ඇත්නම් ඒ ඒ ස්ථාන වහන්ස මේ පදය කෙසේද? මේ පදයාගේ අර්ථ කවරේදැයි? විචාරන්නාහට ද ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය උපදී යන අර්ථයි.) වත්ථුවිසදකිරියතා, අධ්‍යාත්මික බාහ්‍යවස්තූන්ගේ නිර්මලබව කිරීමය; ඉන්ද්‍රියසමත්තපටිපාදනා, ඉඳුරන්ගෙ සමබව පිළියෙළ කිරීමය; දුප්පඤ්ඤපුග්ගලපරිවජ්ජනා, දුෂ්ප්‍රාඥපුඟුලන් දුරුකිරීමය; (බත්දමනලද කවුඩන් මස්දමනලද සුනඛයන් මෙන් මෝහයෙන් මුළාවූ සත්වයන් දුරින්දුරුකිරීම දුෂ්ප්‍රාඥයන් දුරුකිරීම නම් වේ.) පඤ්ඤවන්තපුග්ගලසෙවනා, පැණවත් පුඟුලන් සෙවීමය;(ප්‍රඥව පිණිස ස්කන්ධාධිකාර ඇති සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදාදියෙහි දක්ෂ ආචාර්‍ය්‍යයන් හෝ විදසුන් භාවනා කරන්නාවූ මහාප්‍රාඥයන් හෝ කලින්කල සෙවනය කිරීමයි.) ගම්භීරඤාණචරියපච්චවෙක්ඛනා, ගැඹුරු නැණැත්තන් විසින් අවබොධ කටයුතුවූ ස්කන්ධධාතුආයතන ප්‍රතීත්‍යසමුත්පාදාදිය ප්‍රකාශවන්නාවූ හෝ ශූන්‍යතාප්‍රතිසංයුක්තවූ හෝ සූත්‍රාන්තයන් පස්විසීමය; තදධිමුත්තතා, ප්‍රඥයෙහි නිම්නප්‍රවණබවයි; විරියසම්බොජ්ඣඞ්ගස්ස, වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය, ඉපදවීම පිණිස; එකාදසධම්මා, එකොළොස් ධර්මයෝනෙක්; සංවත්තන්ති, පවතිත්; අපායාදිභය පච්චවෙක්ඛනතා, අපායාදිභය පස්විසනබවය; (ආදිශබ්දයෙන් ජාත්‍යාදි

දායකානං මහප්ඵලකාරකරණෙන පිණ්ඩාපචායනතා, විරියාරම්භස්ස වණ්ණවාදී මෙ සත්ථා සො ච අනතික්කමනීයසාසනො අම්හාකඤ්ච බහූපකාරො පටිපත්තියා ච පූජියමානො පූජිතො හොති න ඉතරථාති එවං සත්ථුමහත්ත පච්චවෙක්ඛනතා, සද්ධම්මසඞ්ඛාතං මෙ මහාදායජ්ජං ගහෙතබ්බං න ච සක්කා කුසීතෙන ගහෙතුන්ති එවං දායජ්ජමහත්ත පච්චවෙක්ඛනතා, ආලොකසඤ්ඤා මනසිකාර ඉරියාපථපරිවත්තන අබ්භොකාසසෙවනාදීහි ථිනමිද්ධවිනොදනතා, කුසීතපුග්ගලපරිවජ්ජනතා, ආරද්ධවිරියපුග්ගලසෙවනතා, සම්මප්පධානපච්චවෙක්ඛනතා තදධිමුත්තතාති. එකාදසධම්මා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති:- බුද්ධානුස්සති, ධම්ම- සඞ්ඝ-සීල-චාග-දෙවතානුස්සති,

---

දුඃඛය අනාගතයෙහි වෘත්තමූලකදුඃඛය ප්‍රත්‍යුත්පන්නයෙහි ආහාර, පරියෙසන මූලකදුඃඛය යන මොවුන් සඞ්ග්‍රහකෙරේ;) විරියායත්ත ලොකිය ලොකුත්තරවිසෙසාධිගමානිසංසදස්සාවිතා, වීය්‍ය්‍යීායත්තවූ ලෞකික ලොකොත්තර ගුණ විශෙෂාධිගමයන්ගේ අනුසස් දක්නා සුලුබවය; බුද්ධපච්චෙකබුද්ධමහාසාවකෙහි, බුදුපසේබුදු මහසවුවන් විසින්; ගතමග්ගො, අධිගතවූ මාර්ගය; මයා ගන්තබ්බො, මා විසින් යා යුතුය; සොපි, හෙද; කුසීතෙන ගන්තුං න සක්කාති, කුසීතවූවහු විසින් යන්නට නොහැකි වෙයි; එවං ගමනවීථිපච්චවෙක්ඛනතා, මෙසේ ගමන්මාර්ගය පස්විකනබවය; දායකානං මහප්ඵලකාරකරණෙන, ප්‍රත්‍යයදායකයන්ගේ සත්කාරයද තමාගේ මනා ප්‍රතිපත්තියද මහත්ඵලබව කිරීමෙන්; පිණ්ඩාපචායනතා, පිණ්ඩපාතයාගේ ප්‍රතිපූජනභාවය; මෙ සත්ථා, මාගේ ශාස්තෘන්වහන්සේ; විරියාරම්භස්ස වණ්ණවාදී, වීය්‍ය්‍යීාරම්භයෙහි ගුණකියනසුලුය; සොච, හෙතෙමේද; අනතික්කමනීයසාසනො, නොඉක්මිය හැකි අනුශාසනා ඇත්තේය; අම්හාකඤ්ච බහූපකාරො, අපටද බොහෝ උපකාර ඇත්තේය; පටිපත්තියාච පූජියමානො, ප්‍රතිපත්ති පූජාවෙන් පුදනුලබනුයේ; පූජිතො හොති, පුදනලද්දේවෙයි; න ඉතරථාති, අන්පරිද්දෙකින් නොවේයයි; එවං, මෙසේ;] සත්ථුමහත්ත පච්චවෙක්ඛනතා, ශාස්තෘහුගේ මහත්බව පස්විකීම; මෙ, මා විසින්; සද්ධම්මසඞ්ඛාතං මහාදායජ්ජං, සද්ධර්‍ම්මයයි කියනලද මහාදායාදය; ගහෙතබ්බං, ගතයුතු; නඤ්ච, හෙද; න සක්කා කුසීතෙන ගහෙතුන්ති, කුසීතහු විසින් ගන්නට නොපිළිවනැයි; එවං, මෙසේ; දායජ්ජමහත්තපච්චවෙක්ඛනතා, දායාදයාගේ මහත්බව පස්විකනබවය; ආලොකසඤ්ඤාමනසිකාර, ආලොකසංඥමෙනෙහිකිරීමය; ඉරියාපථපරිවත්තන, ඉරියවු පෙරළීමය; අබ්භොකාසසෙවනාදීහි, අභ්‍යවකාශ සෙවීම් ආදීන්; ථිනමිද්ධවිනොදනතා, ස්ත්‍යානමිද්ධ දුරුකරනබවය; කුසීතපුග්ගලපරිවජ්ජනතා, අලසවූ (භාවනාවෙහි නම් පමණකුදු නොදන්නා කායදඩ්ඩි බහුලවූ ශය්‍යසුඛාදියෙහි යෙදෙන තිරශ්චීන් කථාවෙහි නිරත) පුඟුලන් දුරුකරන බවය; ආරද්ධවිරියපුග්ගලසෙවනතා, දිවා සඞ්කමෙන නිසජ්ජාය යනාදීන් භාවනාරම්භ වශයෙන්) ආරබ්ධවූ; (දැඩිවූ වීය්‍ය්‍යී ඇතිය යුතුන්.)

උපසමානුස්සති, ලූඛපුග්ගලපරිවජ්ජනතා, සිනිද්ධපුග්ගලසෙවනතා, පසාදනීයසුත්තන්තපච්චවෙක්ඛනතා, තදධිමුත්තතාති. ඉති ඉමෙහි ආකාරෙහි එතෙ ධම්මෙ උප්පාදෙන්තො ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදයො භාවෙති නාම, එවං යස්මිං සමයෙ චිත්තං පග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං පග්ගණ්හාති…

(අ) කථං යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හාති? යදාස්ස අච්චාරද්ධවිරියතාදීහි උද්ධතං චිත්තං හොති, තදා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගාදයො තයො අභාවෙත්වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදයො භාවෙති. වුත්තං හෙතං භගවතා. "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමො අස්ස. සො තත්‍ර සුක්ඛානිචෙව තිණානි පක්ඛිපෙය්‍ය…පෙ… න ච පංසුකෙන ඔකිරෙය්‍ය, භබ්බො නු ඛො සො භික්ඛවෙ පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුන්ති? නො හෙතං භන්තෙ. එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ උද්ධතං චිත්තං හොති, අකාලො තස්මිං සමයෙ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, අකාලො විරිය…පෙ… අකාලො පීතිසම්බොජ්ඣඞ්ගස්ස

---

පුහුල් කලින්කල සෙවුනාබවය; සම්මප්පධානපච්චවෙක්ඛනතා, සතර වැදෑරුම් සම්මප්පධානයාගේ ආනුභාව පස්විසීමය; තදධිමුත්තතා, ඒ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙහි සර්‍වේර්‍ය්‍යාපථයෙහිම නිම්නප්‍රවණබවයි; එකාදසධම්මා, එකොළොස් ධර්‍මකෙනෙක්; පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ ඉපදවීම පිණිස පවතිත්; බුද්ධානුස්සති…පෙ… ලූඛපුග්ගලපරිවජ්ජනතා (බුදුරුවන් ආදියෙහි ප්‍රසාදස්නෙහය නැති බැවින්) ධූසරවූ හෘදය ඇති පුහුලන් දුරුකරන බවය; සිනිද්ධපුග්ගලසෙවනතා, (බුදුරුවන් ආදියෙහි ප්‍රසාදස්නෙහයෙන්) සිනිඳුවූ ළ ඇති පුහුලන් සෙවුනාබවය; පසාදනීයාදිසුත්තන්තපච්චවෙක්ඛනතා, බුදුරුවන් ආදීන්ගෙ ගුණ හඟවන සම්ප්‍රසාදනීයාදි සූත්‍රාන්තයන් පස්විසනබවය; තදධිමුත්තතා, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ උත්පාදනයෙහි නිම්න ප්‍රවණ බවයි; ඉති, මෙසේ; ඉමෙහි ආකාරෙහි, යථොක්ත කුශලාදී ධර්‍මයන්ගේ ස්වභාව සාමාන්‍ය ලක්‍ෂණ ප්‍රතිවෙධාකාරයෙන්ද පරිපුච්ඡකතාදි ආකාරයෙන්ද; එතෙ ධම්මෙ, කුසලාදීන් කෙරෙහි යොනිසොමනසිකාරාදීන්ද ධර්‍ම දූන්මය අර්‍ථ දූන්මය යනාදී ධර්‍මයන්ද; උප්පාදෙන්තො, උපදවන්නේ; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදයො, ධර්‍මවිචය සම්බොධ්‍යඞ්ගාදීන්; භාවෙති නාම, වඩන්නේ නම් වේ; එවං, මෙසේ…පෙ…

(අ) යස්මිං…පෙ… යදාස්ස අච්චාරද්ධවිරියතාදීහි, යම් කාලෙක මොහුගේ අතිශයින්ම හුවනලද වීර්‍ය්‍ය ඇතිබවය යනාදීන්; චිත්තං උද්ධතං හොති, සිත උඩගුවේද; (සමාධි ආදීන් නොමනා බැවින් නොසන් හුන්වේද-තදා යනාදියෙහි පදාර්‍ථ කී නයට ප්‍රතිපක්‍ෂ නයින් දතයුතු බැවින් අතුරතුරෙහි නොකීබසට අර්‍ථ කියනුලැබේ ) මහන්තං අග්ගික්ඛන්ධං, මහත් ගිනිරැසක්; නිබ්බාපෙතුකාමො අස්ස, නිවනු

භාවනාය තං කිස්ස හේතු? උද්ධතං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි දුවූපසමයං හොති. යස්මිඤ්ච ඛො භික්ඛවෙ සමයෙ උද්ධතං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො සමාධි…පෙ…කාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හේතු? උද්ධතං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි සුවූපසමයං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමො අස්ස, සො තත්ථ අල්ලානිචෙව තිණානි පක්ඛිපෙය්‍ය…පෙ…පංසුකෙනච ඔකිරෙය්‍ය, භබ්බොනුඛො සො පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුන්ති? එවං භන්තෙ"ති. එත්ථාපි යථාසකං ආහාරවසෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදීනං භාවනා වෙදිතබ්බා. වුත්තංහෙතං භගවතා:-

(අ) "අත්ථි භික්ඛවෙ කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති." තථා "අත්ථි භික්ඛවෙ සමථනිමිත්තං අව්‍යග්ගනිමිත්තං තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති." තථා "අත්ථි භික්ඛවෙ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තතී"ති. තත්ථ යථාස්ස පස්සද්ධිආදයො උප්පන්නපුබ්බා තං තං ආකාරං සල්ලක්ඛෙත්වා තෙසං උප්පාදනවසෙන පවත්තිතමනසිකාරොව තීසුපි

---

කැමැත්තේ;-සුක්ඛානි, වියලුණු;-දුවූපසමයං හොති, සන්හිඳුවන්නට නොපිළිවන්වේ;-යථාසකං ආහාරවසෙන, තමන් තමන්ගේ ප්‍රත්‍යය වශයෙන්; පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදීනං, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගාදීන්ගේ භාවනා වෙදිතබ්බා, වැඩීම දතයුත්තීයි…පෙ…

(ඇ) සමථනිමිත්තං, (මතුයෙහි සමාධියට කාරණවන බැවින්) සමාධියම සමථනිමිත්ත නම් වේ; අව්‍යග්ගනිමිත්තං, (අවික්ෂේප කාරණයෙන්) හේම අව්‍යග්ගනිමිත්ත නම; (තුන්වාරයෙහිම සෙසු පෙදෙහි අර්ථ යට කී නයින් දතයුතු.)-තත්ථ, "අත්ථි භික්ඛවෙ" යනාදීන් දැක්වූ පාඨයෙහි; යථා, යම්සේ; අස්ස, ඒ යොගීහට; පස්සද්ධිආදයො උප්පන්නපුබ්බා, ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂා යන මොහු ඒ ඒ කාරණයෙහි උපන් විරූද; තං තං ආකාරං සල්ලක්ඛෙත්වා, ඒ පස්සද්ධාකාරයද සමාහිතාකාරයද අජ්ඣුපෙක්ඛිතාකාරයද සලකා (පරීක්ෂාකොට); තෙසං උප්පාදනවසෙන, ඒ පස්සද්ධි ආදීන්ගේ උත්පාදන වශයෙන්; පවත්තිත මනසිකාරො ච, පවත්වනලද මනස්කාරයම; තීසුපි පදෙසු, "අත්ථි

පදෙසු යොනිසොමනසිකාරො නාම. සමථනිමිත්තන්ති ච සමථස්සෙවෙතං අධිවචනං, අවික්ඛෙපට්ඨෙන ච තස්සෙව අව්‍යග්ගනිමිත්තන්ති.

(අ) අපි ච:- සත්ත ධම්මා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති: පණීතභොජනසෙවනතා, උතුසුඛසෙවනතා, ඉරියාපථසුඛසෙවනතා, මජ්ඣත්තපයොගතා, සාරද්ධපුග්ගලපරිවජ්ජනතා, පස්සද්ධකායපුග්ගලසෙවනතා, තදධිමුත්තතාති. එකාදස ධම්මා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති:- වත්ථුවිසදතා, නිමිත්තකුසලතා, ඉන්ද්‍රියසමත්තපටිපාදනතා, සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා,[1] සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා, නිරස්සාදස්ස චිත්තස්ස සද්ධාසංවෙගවසෙන සම්පහංසනතා, සම්මාපවත්තස්ස අජ්ඣුපෙක්ඛනතා, අසමාහිත

---

භික්ඛවෙ කායපස්සද්ධි"යනාදීන් ආ තුන්වාරයෙහි (එසින් ප්‍රකාශිතවූ තුන්දහම්කොටස හෝ); යොනිසොමනසිකාරො නාම, යොනිසොමනස්කාර නම් වේ; සමථනිමිත්තන්තිච, සමථනිමිත්තං යනුද; සමථස්සෙව, ඒ සමථයටම; (අධිවචනං"යි යොදනු—"**නානාරම්මණෙ පරිබ්භමණෙන විවිධං අග්ගං එතස්සාති බ්‍යග්ගො වික්ඛෙපො එකග්ගතා භාවතො බ්‍යග්ගපටිපක්ඛොති අබ්‍යග්ගො සමාධි-තථා හි නානාකාරං සල්ලක්ඛෙත්වා ගය්හමානො සො එව නිමිත්තන්ති අබ්‍යග්ගනිමිත්තං**"යි ගන්නේ.

(අ) පණීතභොජනසෙවනතා, ප්‍රණීතබොජුන් සෙවුනාබවය; උතුසුඛසෙවනතා, සැපසෑතු සෙවුනාබවය; ඉරියාපථසුඛසෙවනතා, සුව ඉරියව් සෙවුනාබවය; මජ්ඣත්තපයොගතා, සමවූ කාය වාග් මනඃ ප්‍රයොගඇතිබවය; සාරද්ධපුග්ගලපරිවජ්ජනතා, කෙලෙසපරිදාහඇති නොසන්හුන් පුහුලන්දුරුකරනබවය; පස්සද්ධකායපුග්ගලසෙවනතා, කෙලෙසපරිදාහනැතිබැවින් සන්හුන්කායඇති පුහුලන්සෙවුනාබවය; තදධිමුත්තතාති, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයෙහි නිම්නප්‍රවණබවයි; එකාදස ධම්මා, එකොළොස්ධර්මකෙනෙක්; සමාධිසම්බොජ්ඣඞ්ගස්ස, සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය සංවත්තන්ති, උත්පාදයපිණිස පවත්නාහුයි, වත්ථුවිසදතා, ආධ්‍යාත්මිකබාහ්‍යවස්තූන් විසදබවය; නිමිත්තකුසලතා, පඨවිකසිණාදී චිත්තාග්‍රතානිමිතිහි දක්‍ෂබවය; ඉන්ද්‍රියසමත්තපටිපාදනතා, ඉඳුරන්ගේ සමබවකිරීමය; (සමාධීන්ද්‍රිය හා විරියින්ද්‍රිය සමබව කී වෙති යනු සත්‍යයි.) සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා, සුදුසුසමයෙහි සිත්හු නිගන්නාබවය; සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා, සුදුසුසමයෙහි සිත්හු හුවනබවය; නිරස්සාදස්ස චිත්තස්ස, භාවනාස්වාද රහිත සිත්හුගේ; සද්ධාසංවෙගවසෙන, ශ්‍රද්ධාවශයෙන් සංවෙගවශයෙන්; සම්පහංසනතා, සංවෙගසුජීවූ ප්‍රසාදොත්පාදනයෙන් සිත් සතුටුකිරීමය; සම්මාපවත්තස්ස, (ලීනුද්ධච්ච විරහයෙන්ද සමථවීථියට පිළිපැදීමෙන්ද සමව සවිශෙෂව පැවැත්මෙන්)මනාකොටම ප්‍රවෘත්ත භාවනා සිත්හුගේ; අජ්ඣුපෙක්ඛනතා,(පග්ගහනිග්ගහසම්පහංසනයෙහි

---

1 නිග්ගහනතා - ත්‍රි. මූ.

පුග්ගලපරිවජ්ජනතා, සමාහිතපුග්ගලසෙවනතා, ඣානවිමොක්ඛපච්චවෙක්ඛණතා, තදධිමුත්තතාති. පඤ්චධම්මා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති:- සත්තමජ්ඣත්තතා, සඞ්ඛාරමජ්ඣත්තතා, සත්තසඞ්ඛාරකෙලායනපුග්ගලපරිවජ්ජනතා, සත්තසඞ්ඛාරමජ්ඣත්තපුග්ගලසෙවනතා, තදධිමුත්තතාති. ඉති ඉමෙහි ආකාරෙහි එතෙ ධම්මෙ උප්පාදෙන්තො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදයො භාවෙති නාම. එවං යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තං නිග්ගණ්හාති.

(අ) කථං යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහංසෙති? යදාස්ස පඤ්ඤාපයොගමන්දතාය වා උපසමසුඛානධිගමෙන වා නිරස්සාදං චිත්තං හොති තදා නං අට්ඨසංවෙගවත්ථූ

---

ව්‍යාපාරයක් නැතිව) උපෙක්ෂා කරනබවය; අසමාහිතපුග්ගලපරිවජ්ජනතා, වික්ෂිප්ත හෘදය ඇති පුගුලන් දුරුකරනබවය; සමාහිතපුග්ගලසෙවනතා, සමාහිතපුගුලන් සෙවුනාබවය; ඣානවිමොක්ඛපච්චවෙක්ඛණතා, ප්‍රථමාදී ධ්‍යානයන්ට ප්‍රතිපක්ෂ ධර්මයන් කෙරෙන් මනාකොටම පහවූබැවින් විමොක්ෂ නම්වූ තුන් විමොක්ෂධ්‍යානයන්ද මෙසේ හැවිය යුතුය මෙසේ සමවැද්දයුතුයයි පස්විකනබවය; තදධිමුත්තතා, සමාධිසම්බොධ්‍යඞ්ගයෙහි නිම්නප්‍රවණබවයි; පඤ්චධම්මා, ධර්මයෝ පස්දෙනෙක්; උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදාය සංවත්තන්ති, උත්පාදය පිණිස වෙත්; සත්තමජ්ඣත්තතා, ප්‍රියසත්වයන් කෙරෙහිදු මැදහත්බවය; සඞ්ඛාරමජ්ඣත්තතා, චක්ෂුරාදීයෙහිදු පාසිවුරු ආදීයෙහිදු මැදහත්බවය; සත්තසඞ්ඛාරකෙලායනපුග්ගලපරිවජ්ජනතා, සත්වසංස්කාරයන් කෙරෙහි මමත්වය කරන පුගුලන් දුරුකරනබවය; සත්තසඞ්ඛාරමජ්ඣත්තපුග්ගලසෙවනතා, සත්වසංස්කාරයන් කෙරෙහි මැදහත්ව පවත්නා පුගුලන් සෙවුනා බවය; තදධිමුත්තතා, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයෙහි නිම්නප්‍රවණබවයි; ඉති, මෙසේ; ඉමෙහි ආකාරෙහි, කියනලද කායචිත්තයන්ගේ පස්සද්ධාකාර සැලකීම් ආකාරයෙන්ද සප්පායාහාර සෙවීම් ආදිවූ ආකාරයෙන්ද; එතෙ ධම්මෙ, මේ පස්සද්ධිආදී ධර්මයන්; උප්පාදෙන්තො, උපදවන්නේ; පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදයො භාවෙති නාම, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදීන් වඩන්නා නම් වේ; එවං, මෙසේ…පෙ…

(අ) යස්මිං…පෙ…යදා, යම්කලෙක; අස්ස, ඒ යොගීහුගේ; පඤ්ඤාපයොගමන්දතාය වා, ප්‍රඥා ප්‍රයොගමඳබැවින් හෝ; උපසමසුඛානධිගමෙන වා, එකාග්‍රතාසුඛය නොලදහෙයින් හෝ; නිරස්සාදං චිත්තං හොති, චිත්තය නිරාස්වාද වේද; (යම්වේලෙක ප්‍රඥාප්‍රයොගමඳවේද එවේලෙහි නොසකස් අහරක් පුරුෂයකුට රුචිනොඑළවන්නාක්මෙන් භාවනාතොමෝ සිතට අභිරුචි නො එළවයි එහෙයින් නිරාස්වාද

පච්චවෙක්ඛන්තො සංවෙජෙති. අට්ඨසංවෙගවත්ථූනි නාම:- ජාති ජරා ව්‍යාධි මරණානි චත්තාරි, අපායදුක්ඛං පඤ්චමං, අතීතෙ වට්ටමූලකං දුක්ඛං, අනාගතෙ වට්ටමූලකං දුක්ඛං, පච්චුප්පන්නෙ ආහාර පරියෙට්ඨි මූලකං දුක්ඛන්ති. බුද්ධධම්මසඞ්ඝගුණානුස්සරණෙන චස්ස පසාදං ජනෙති. එවං යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහංසෙති. කථං යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛති? යදාස්ස එවං පටිපජ්ජතො අලීනං අනුද්ධතං අනිරස්සාදං ආරම්මණසම්පවත්තං සමථවීථිපටිපන්නං චිත්තං හොති. තදාස්ස පග්ගහනිග්ගහසම්පහංසනෙසු න ව්‍යාපාරං ආපජ්ජති සාරථි විය සමප්පවත්තෙසු අස්සෙසු, එවං යස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛිතබ්බං තස්මිං සමයෙ චිත්තං අජ්ඣුපෙක්ඛති…

---

වෙයි යම්වේලෙක භාවනාතොමෙ මනාකොට වීථිප්‍රතිපන්නනොවන බැවින් මතුමතුයෙහි විශෙෂාවගතොවේද එසමයෙහි එකාග්‍රතාසුඛයාගේ අලාභයෙන් චිත්තය නිරස්වාද වේ යන අර්ථයි.) තදා, එවේලෙහි; තං, ඒ චිත්තය; අට්ඨසංවෙගවත්ථු පච්චවෙක්ඛන්තො සංවෙජෙති, අෂ්ටසංවෙගවස්තූන්ගේ ප්‍රත්‍යවෙක්ෂාවෙන් සංවෙගකරවා; අට්ඨසංවෙගවත්ථූනි නාම, අෂ්ටසංවෙගවස්තූ නම්; ජාතිජරාව්‍යාධිමරණානි, ජාතිය ජරාය ව්‍යාධිය මරණය යන; චත්තාරි, සතරදෙනය; අපාය දුක්ඛං පඤ්චමං, පඤ්චවිබන්ධනාදී ක්ෂුද්පිපාසාදි අන්‍යොන්‍යවිබාධනාදී හෙතුකොටඇති පස්වනුවූ අපායදුක්ඛයද; අතීතෙ වට්ටමූලකං දුක්ඛං, ඉකුත්කල්හි වටමුල්කොට ඇතිදුක්ද; අනාගතෙ වට්ටමූලකං දුක්ඛං අනාගතයෙහි වටමුල්කොටඇති දුක්ද; පච්චුප්පන්නෙ, වර්තමානකාලයෙහි; ආහාරපරියෙට්ඨිමූලකං දුක්ඛන්ති, ආහාරපර්‍යෙෂණය මුල්කොටඇති දුක්ද(යනමේයි); බුද්ධ ධම්ම සඞ්ඝ ගුණානුස්සරණෙන ච, බුද්ධ ධම්ම සඞ්ඝ යන තුන්රුවන්හි ගුණ සිහිකිරීමෙන්ද; අස්ස, ඒ චිත්තයට; පසාදං ජනෙති, ප්‍රසාදඑළවා; එවං, මෙසේ…පෙ…යදා, යම්කලෙක්හි; එවං පටිපජ්ජතො, මෙසේ පිළිපදනාවූ; අස්ස, ඒ යොගීහුගේ; චිත්තං, සිතතෙමේ; අලීනං, (කෞසීද්‍යපාක්ෂික ධර්මයන් විලීනනොවන බැවින්) නොහැකුළුණේ; අනුද්ධතං, (ඖද්ධත්‍යපාක්ෂිකධර්මයන් විලීන නොවනබැවින්) උද්ගුනොවූයේ; අනිරස්සාදං, (ප්‍රඥාප්‍රයොගසම්පත්තියෙනුදු ව්‍යපසමසුඛලාභයෙනුදු) නිරස්වාදනොවූයේ; ආරම්මණසම්පවත්තං, එහෙයින්ම අරමුණෙහි සමවපවත්නේ; සමථවීථිපටිපන්නං, සමාධිවීථියටපිළිපන්නේ; හොති, වේද; තදා, එවේලෙහි; අස්ස, ඒ සිත්හු; පග්ගහනිග්ගහසම්පහංසනෙසු, ලීන නොවන බැවින් හුවන බවය උද්ගු නොවන බැවින් නිගැන්මය නිරස්වාද නොවන බැවින් සතුටුකැරවීමය යන මෙහි; ව්‍යාපාරං න ආපජ්ජති, ප්‍රයොගයට නොපැමිණේ; සමප්පවත්තෙසු අස්සෙසු, සමවපවත්තා අශ්වයන්කෙරෙහි; සාරථිවිය, සාරථිහුමෙති; එවං, මෙසේ…පෙ…

(ඈ) අසමාහිතපුග්ගලපරිවජ්ජනතා නාම:- නෙක්ඛම්මපටිපදං අනාරූළ්හපුබ්බානං නෙකකිච්චපසුතානං වික්ඛිත්තහදයානං පුග්ගලානං ආරකා පරිච්චාගො. සමාහිතපුග්ගලසෙවනතා නාම:- නෙක්ඛම්මපටිපදං පටිපන්නානං සමාධිලාභීනං පුග්ගලානං කාලෙන කාලං උපසඞ්කමනං. තදධිමුත්තතා නාම:-සමාධිඅධිමුත්තතා සමාධිගරු සමාධිනින්නසමාධි පොණ සමාධිපබ්භාරතාති අත්ථො, එවමෙතං දසවිධං අප්පණා කොසල්ලං සම්පාදෙතබ්බං.

143 "එවං හි සම්පාදයතො අප්පණා කොසල්ලං ඉමං,
පටිලද්ධෙ නිමිත්තස්මිං අප්පණා සම්පවත්තති.

144 එවම්පි පටිපන්නස්ස සචෙ සා නප්පවත්තති,
තථාපි න ජහෙ යොගං වායමෙථෙව පණ්ඩිතො.

145 හිත්වා හි සම්මාවායාමං විසෙසං නාම මාණවො,
අධිගච්ඡෙ පරිත්තම්පි ඨානමෙතං න විජ්ජති.

---

(ඈ) අසමාහිතපුග්ගලපරිවජ්ජනතානාම, අසමාහිතපුගුලන් දුරලීම නම්; නෙක්ඛම්මපටිපදං අනාරූළ්හපුබ්බානං, ධ්‍යානප්‍රතිපත්තියට නොතැගී විරූ; (නොපිළිපන් විරූ යුතැති.) නෙකකිච්චපසුතානං, අනෙකකෘත්‍යයෙහි නියුක්තවූ; වික්ඛිත්තහදයානං පුග්ගලානං, වික්ෂිප්තවූ හෘදයඇති පුගුලන්; ආරකා පරිච්චාගො, දුරින්ම දුරුකිරීමය; සමාහිතපුග්ගලසෙවනතා නාම, සමාහිතපුගුලන් සෙවීමනම්; නෙක්ඛම්මපටිපදං පටිපන්නානං, ධ්‍යානපිළිවෙතට පිළිපන්; සමාධිලාභීනං පුග්ගලානං, සමාධිලද පුගුලන් කරා; කාලෙන කාලං උපසඞ්කමනං, කලින් කලට එළඹීමය, තදධිමුත්තතා නාම, තදධිමුත්තතා නම්; සමාධිඅධිමුත්තතා, සමාධියෙහි අධිමුක්තබවය; සමාධිගරු, සමාධියම ගුරුකොට ඇතිබවය; සමාධිනින්න, සමාධියෙහි නිම්නබවය; සමාධිපොණ, සමාධියෙහි ප්‍රවණබවය; සමාධිපබ්භාරතාති අත්ථො, සමාධියෙහි ප්‍රාග්භාරබවය යන අර්ථයි; එවං මෙසේ; එතං, මේ; දසවිධං අප්පණාකොසල්ලං, දශවිධවූ අර්පණාකෞශල්‍යය; සම්පාදෙතබ්බං, සැපවියයුතු.

143. පටිලද්ධෙ නිමිත්තස්මිං, පිළිලද නිමිත්හි; එවං හි, මෙසේ; ඉමං අප්පණාකොසල්ලං, මේ දසවැදෑරුම්වූ අර්පණාකෞශල්‍යය; සම්පාදයතො, සපයනුවහට; අප්පණා සම්පවත්තති, අර්පණා පවතී.

144. එවම්පිපටිපන්නස්ස, මෙසේද පිළිපදනුවහට; සචෙ, ඉදින්; සා, ඒ අර්පණාතොමෝ; නප්පවත්තති, නොපවතීනම්; තථාපි, එතකුදු වුවත්; න ජහෙ යොගං, භාවනායොගය නොහරනේය; පණ්ඩිතො, නුවණැත්තෝ; වායමෙථෙව, ව්‍යායාම කරන්නේමැයි.

145. "හිත්වා හි" යන හි ශබ්දය හෙත්වර්ථයෙහිය එහෙයින්;("යස්මා ඨානමෙතං න විජ්ජති තස්මා"යි යොදනු ) සම්මාවායාමං, සම්‍යග්ව්‍යා

146 චිත්තප්පවත්ති ආකාරං තස්මා සල්ලක්ඛයං බුධො,
සමතං විරියස්සෙව යොජයෙථ පුනප්පුනං.

147 ඊසකම්පි ලයං යන්තං පග්ගණ්හෙථෙව මානසං,
අච්චාරද්ධං නිසෙධෙත්වා සමමෙව පවත්තයෙ.

148 රෙණුම්හි උප්පලදලෙ සුත්තෙ නාවාය නාළියා,
යථා මධුකරාදීනං පවත්ති සම්පවණ්ණිතා.

149 ලීන උද්ධතභාවෙහි මොචයිත්වාන සබ්බසො,
එවං නිමිත්තාභිමුඛං මානසං පටිපාදයෙ"ති.

### තත්‍රායං අත්ථදීපනා

(අ) යථා හි අඡෙකො මධුකරො අසුකස්මිං රුක්ඛෙ පුප්ඵං පුප්ඵිතන්ති ඤත්වා තික්ඛෙන වෙගෙන පක්ඛන්තො තං අතික්කමිත්වා පටිනිවත්තෙන්තො ඛීණෙ රෙණුම්හි සම්පාපුණාති, අපරො අඡෙකො[1]

---

යාමය; හිත්වා, හැර; පරිත්තම්පි විසෙසං නාම, මඳ ද විශෙෂයකට නම්; මාණවො, සත්ත්වතෙමේ; අධිගච්ඡෙ, පැමිණෙන්නේය යන; එතණ්ඨානං, මේකාරණය; න විජ්ජති, යම්හෙයකින් නැද්ද.

146. තස්මා, එහෙයින්; චිත්තප්පවත්ති ආකාරං, භාවනාසිත්හු ලීනුද්ධච්ච විසින් පවත්නා ආකාරය; සල්ලක්ඛයං, සලකන්නාවූ; බුධො, නුවණැති යොගීතෙමේ; පුනප්පුනං, නැවත නැවත; විරියස්ස සමතං එව, වීර්‍ය්‍යයාගේ සමබවම; යොජයෙථ, යොදන්නේය;

147. ඊසකම්පි, මඳකුඳු; ලයං යන්තං, ලීනබවට යන්නාවූ; මානසං, සිත; පග්ගණ්හෙථෙව, හුවන්නේමය; අච්චාරද්ධං, ඉතා උඩගුවූ සිත; නිසෙධෙත්වා, වළකා; සමමෙව, සමකොටම; පවත්තයෙ, පවත්නේයි;

148. රෙණුම්හි, මල්රෙණ්හිද; උප්පලදලෙ, මහනෙල්පෙත්තෙහිද; සුත්තෙ, මකුළුහුයෙහිද; නාවාය, නැවෙහිද; නාළියා, තෙල්නළෙහිද; මධුකරාදීනං, මීමැසි සලස්‍ය වෛද්‍ය ආදීන්ගේ; පවත්ති, ප්‍රවෘත්තිතොමෝ; යථා, යම්සේ; සම්පවණ්ණිතා, (උපමාභාවයෙන් අටුවායෙහි) වර්ණනා කරනලද්ද.

149. එවං, එපරිද්දෙන්ම; ලීන උද්ධතභාවෙහි, ලීනබැවින් උද්ධත බැවින්; සබ්බසො මොචයිත්වාන, සංස්කාරයන් සර්වාකාරයෙන් මුදා; නිමිත්තාභිමුඛං, ප්‍රතිභාගනිමිත් අභිමුඛකොට; මානසං, සිත; පටිපාදයෙ, මෙහෙයන්න;

තත්‍ර, මේගාථාදෙක්හි; අයං, මේ; අත්ථදීපනා, උපමොපමෙයාර්ථ හැඟවීමයි;

(අ) යථාහි, යම්සේ; අඡෙකො මධුකරො, ඉතාදක්‍ෂවූ මධුකරතෙමේ; අසුකස්මිං රුක්ඛෙ, අසුවල්රුක; පුප්ඵං පුප්ඵිතන්ති ඤත්වා, මල්පිපිණැයි දැන; තික්ඛෙන වෙගෙන පක්ඛන්තො, තීක්‍ෂණවූ වෙගයෙන් දිවන්නේ; තං අතික්කමිත්වා, ඒ රුක ඉක්මම; පටිනි

---

1 අඡෙකො-සත්ව.

මන්දෙන ජවෙන පක්ඛන්තො ඛීණෙයෙව සම්පාපුණාති, ඡෙකො පන සමෙන ජවෙන පක්ඛන්තො සුඛෙන පුප්ඵරාසිං පත්වා යාවදිච්ඡකං රෙණුං ආදාය මධුං සම්පාදෙත්වා මධුරසං අනුභවති. යථා ච සල්ලකත්තඅන්තෙවාසිකෙසු උදකථාලගතෙ උප්පලපත්තෙ සත්ථකම්මං සික්ඛන්තෙසු එකො අතිඡෙකො වෙගෙන සත්ථං පාතෙන්තො උප්පලපත්තං ද්විධා වා ඡින්දති[1] උදකෙ වා පවෙසෙති, අපරෙ අච්ඡෙකො ඡින්දනපවෙසනභයා සත්ථකෙන ඵුසිතුම්පි න විසහති, ඡෙකො පන සමෙන පයොගෙන තත්ථ සත්ථපදං දස්සෙත්වා පරියොදාතසිප්පො හුත්වා තථාරූපෙසු ඨානෙසු කම්මං කත්වා ලාභං ලභති. යථා ච යො චතුබ්‍යාමප්පමාණං මක්කටසුත්තං ආහරති සො චත්තාරි සහස්සානි ලභතීති රඤ්ඤා වුත්තෙ එකො අතිඡෙකො පුරිසො වෙගෙන මක්කටසුත්තං ආකඩ්ඪන්තො තහිං තහිං ඡින්දති යෙව, අපරෙ අඡෙකො

---

වත්තන්තො, නැවත එන්නේ; ඛීණෙ රෙණුම්හි සම්පාපුණාති, රෙණුව ක්ෂීණවූකල්හි පැමිණෙන්නේද; (යම්හෙයෙකින් පිපි කෙණෙහි මල්රෙණු සුරස දේද පසුව වාතාදියෙන් වගුළේ හෝ විරස හෝ වේද එහෙයින් "ඛීණෙ රෙණුම්හි සම්පාපුණාතියි" කීහු.) අපරෙ, අනික්; අඡෙකො, දක්‍ෂනොවූ මධුකරයෙක්; මන්දෙන ජවෙන පක්ඛන්තො, මඳවූජවයෙන් දිවන්නේ; ඛීණෙ යෙව සම්පාපුණාති, ක්ෂීණකල්හිම පැමිණෙන්නේද; ඡෙකො පන, දක්‍ෂවූ මධුකරතෙමේ; සමෙන ජවෙන පක්ඛන්තො, සමවූ ජවයෙන් දිවන්නේ; සුඛෙන, සුවයෙන්ම; පුප්ඵරාසිං පත්වා. වෘක්‍ෂශාඛාවෙහි නිචිත මල්රැසට පැමිණ; යාවදිච්ඡකං රෙණුං ආදාය, කැමැතිපමණ රේණුගෙන; මධුං සම්පාදෙත්වා, මධුව සම්පාදනයකොට; මධුරසං[2] අනුභවති, මධු රසය වළඳා; යථා ච, යම්සේ; සල්ලකත්ත අන්තෙවාසිකෙසු, ශල්‍යකර්ම දන්නා ඇජරන්ගේ අතවැස්සන්; උදකථාලගතෙ උප්පලපත්තෙ, දියතල්ලෙහි තුබූ මහනෙල්මල් පෙත්තෙහි; සත්ථකම්මං සික්ඛන්තෙසු, ශිරාවෙධාදී ශස්ත්‍රකර්මය හික්මෙන්නවුන්කෙරෙහි; එකො, එකෙක්; අතිඡෙකො, ඉතා දක්‍ෂවූයේ; වෙගෙන සත්ථං පාතෙන්තො, වෙගයෙන් ශස්ත්‍රය හෙළන්නේ; උප්පලපත්තං, මහනෙල්පෙත්ත; ද්විධා ඡින්දති, දෙකක් කොටහෝ සිඳිනේද; උදකෙ වා පවෙසෙති, දියෙහිහෝ ප්‍රවෙශ කෙරේද; අපරෙ, අනික්; අච්ඡෙකො, දක්‍ෂනුවූ අතවැසි; ඡින්දනපවෙසනභයා; පෙත්ත කැපීයේද්දෝ හෝ දියෙහි ගැලීයේද්දෝ හෝ යන භයින්; සත්ථකෙන ඵුසිතුම්පි න විසහති, සැතින්පහර වන්නටද නොපොහොසත්වේද, ඡෙකො පන, දක්‍ෂවූ අතවැසි වනාහි; සමෙන පයොගෙන, සමප්‍රයොගයෙන්; තත්ථ, ඒ උත්පල පත්‍රයෙහි; සත්ථපදං දස්සෙත්වා, සැත්පද දක්වා; පරියොදාත සිප්පො හුත්වා, පිරිසුදුවූ ශිල්ප ඇත්තේ; තථාරූපෙසු ඨානෙසු, එබඳු සැත්කම් කටයුතුතන්හි; කම්මං කත්වා, ශස්ත්‍රකර්මය කොට; ලාභං ලභති, ලාභයලැබේද; යථා ච, යම්සේ; යො, යමෙක්; චතුබ්‍යාමප්පමාණං

---

1 ද්විධා ඡින්දති-කත්ථචි. 2 මධුරරසං-කත්ථචි.

ඡෙදනභයා ගහෙත්වා ඵුසිතුම්පි න විසහති, ඡෙකො පන කොටිතො පට්ඨාය සමෙන පයොගෙන දණ්ඩකෙ වෙඨෙත්වා ආහරිත්වා ලාභං ලභති. යථා ච අතිඡෙකො නිය්‍යාමකො බලවවාතෙ ලකාරං පූරෙන්තො නාවං විදෙසං පක්ඛන්දාපෙති, අපරො අඡෙකො මන්දවාතෙ ලකාරං ඔරොපෙන්තො නාවං තත්ථෙව ඨපෙති, ඡෙකො පන මන්දවාතෙ ලකාරං පූරෙත්වා බලවවාතෙ අඩ්ඪලකාරං කත්වා සොත්ථිනා ඉච්ඡිතට්ඨානං පාපුණාති. යථා ච යො තෙලං අඡඩ්ඩෙන්තො නාළිං පූරෙති සො ලාභං ලභතීති ආචරියෙන අන්තෙවාසිකානං වුත්තෙ එකො අතිඡෙකො ලාභලුද්ධො වෙගෙන පූරෙන්තො තෙලං ඡඩ්ඩෙති, අපරො අඡෙකො තෙලඡඩ්ඩනභයා ආසිඤ්චිතුම්පි න විසහති, ඡෙකො පන සමෙන පයොගෙන පූරෙත්වා ලාභං ලභති.

---

මක්කටසුත්තං, සතරබඹපමණ මකුළුහුයක්; ආහරති, ගෙනේද; සො චත්තාරි සහස්සානි ලභතීති, හේ සාරදහසක් ලැබෙයි; රඤ්ඤා වුත්තෙ, රජහු කීකල්හි; එකො අතිඡෙකො පුරිසො, ඉතා දක්‍ෂවූ එක් පුරුෂයෙක්; වෙගෙන මක්කටසුත්තං ආකඩ්ඪන්තො, වෙගයෙන් මකුළුහුය හයන්නේ; තහිං තහිං ඡින්දතියෙව, ඒ ඒ තන්හි සිඳින්නේමවේද; අපරො, අනික්; අඡෙකො, නොදක්‍ෂවූ පුරුෂයෙක්; ඡෙදන භයා, කැඩෙයි යන භයින්; ගහෙත්වා ඵුසිතුම්පි න විසහති, අතින් පහරනට නොද පොහොසත්වේද; ඡෙකො පන, දක්‍ෂපුරුෂ වනාහි; කොටිතො පට්ඨාය, කෙළවරපටන්ගෙන; සමෙන පයොගෙන, සමප්‍රයොගයෙන්; දණ්ඩකෙ වෙඨෙත්වා, මකුළුහුය දන්ඩෙක වෙළාගෙන; ආහරිත්වා, ගෙනඇර; ලාභං ලභති, ලාභ ලැබේද; යථා ච, යම්සේ; අතිඡෙකො නිය්‍යාමකො, ඉතා දක්‍ෂවූ නියමුවා; බලවවාතෙ, බලවත් වාතයෙහි; ලකාරං පූරෙන්තො, රුවල පුරා පවන් ගන්වන්නේ; නාවං, නැව; විදෙසං පක්ඛන්දාපෙති, නොදෙසට පමුණුවන්නේද; අපරො, අනික්; අඡෙකො, අදක්‍ෂවූ නියමුවෙක්; මන්දවාතෙ, මඳවාතයෙහි; ලකාරං ඔරොපෙන්තො, රුවල බහන්නේ; නාවං තත්ථෙව ඨපෙති, නැව එතැනම සිටුවාද; ඡෙකො පන, දක්‍ෂ තැනැත්තේ වනාහී; මන්දවාතෙ, මඳ වාතයෙහි; ලකාරං පූරෙන්තො, රුවල පුරන්නේ; බලව වාතෙ, බලවත් වාතයෙහි; අඩ්ඪලකාරං කත්වා, අඩ්ලකාරකොට; සොත්ථිනා, සුවෙන්; ඉච්ඡිතට්ඨානං පාපුණාති, කැමතිතැනට පැමිණෙන්නේද; යථා ච, යම්සේ; යො, යමෙක්; තෙලං අඡඩ්ඩෙන්තො, තෙල් නොඉස්නේ; නාළිං පූරෙති, නළ පිරැයේවීනම්; සො, හෙතෙම; ලාභං ලභතීති, ලාභ ලැබෙයි; ආචරියෙන අන්තෙවාසිකානං වුත්තෙ, ආචාරීන්විසින් අතවැස්සන්ට කීකල; එකො, එකෙක්; අතිඡෙකො, ඉතා දක්‍ෂවූයේ; වෙගෙන පූරෙන්තො, වහා පුරන්නේ; තෙලං ඡඩ්ඩෙති, තෙල් ඉස්නේද; අපරො, අනික්; අඡෙකො අදක්‍ෂයෙක්; තෙලඡඩ්ඩනභයා,

(අ) එවමෙවෙකො භික්ඛු උප්පන්නෙ නිමිත්තෙ සීඝමෙව අප්පනං පාපුණිස්සාමීති ගාළ්හං විරියං කරොති, තස්ස චිත්තං අච්චාරද්ධවිරියත්තා උද්ධච්චෙ පතති, න සක්කොති අප්පනං පාපුණිතුං, එකො අච්චාරද්ධ විරියතාය දොසං දිස්වා කිං දානි මෙ අප්පනායාති විරියං හාපෙති, තස්ස චිත්තං අතිලීනවිරියත්තා කොසජ්ජෙ පතති, සො පි න සක්කොති අප්පනං පාපුණිතුං, යො පන ඊසකම්පි ලීනං ලීනභාවතො-උද්ධතං උද්ධච්චතො මොචෙත්වා සමෙන පයොගෙන නිමිත්තාභිමුඛං පවත්තෙති, සො අප්පනං පාපුණාති, තාදිසෙන භවිතබ්බං, ඉමමත්ථං සන්ධාය එතං වුත්තං.

148 රෙණුම්හි උප්පලදලෙ සුත්තෙ නාවාය නාළියා,
　　යථා මධුකරාදීනං පවත්ති සම්පවණ්ණිතා.

149 ලීනඋද්ධතභාවෙහි මොචයිත්වාන සබ්බසො,
　　එවං නිමිත්තාභිමුඛං මානසං පටිපාදයෙති.[1]

---

තෙල් ඉසේදේහෝ යන හයින්; ආසිඤ්චිතුම්පි න විසහති, වත්කොට ලන්නටද නොපොහොසත්ද; ඡෙකො පන, දක්‍ෂතෙමෙ වනාහි; සමෙන පයොගෙන පූරෙත්වා, සමප්‍රයොගයෙන් පුරාලා; ලාභං ලභති, ලාභ ලැබේද.

(අ) එවමෙව, එපරිද්දෙන්ම; එකො භික්ඛු, එක් මහණෙක්; උප්පන්නෙ නිමිත්තෙ, පිළිබිඹු නිමිත් උපන්කල්හි; සීඝමෙව අප්පනං පාපුණිස්සාමීති, වහාම අපුන්පැමිනෙමි යි; ගාළ්හං විරියං කරොති, වීර්‍ය්‍යතරකෙරෙයි; තස්ස චිත්තං, ඔහුගේ සිත; අච්චාරද්ධවිරියත්තා; ඉතාවඩනලද වීර්‍ය්‍ය ඇති බැවින්; උද්ධච්චෙ පතති, උද්ධතබැව්හි හෙයි; න සක්කොති අප්පනං පාපුණිතුං, එහෙයින්ම අර්පණාවට පැමිණෙනුවට නොපොහො සත්වෙයි; එකො, එකෙක්; අච්චාරද්ධවිරියතාය, ඉතා වඩනලද වීර්‍ය්‍ය ඇතිබැව්හි, දොසං දිස්වා, දොස්දැක; කිං දානි මෙ අප්පනායාති, (ලද් දුම රක්‍ෂාකෙරෙමි යි) දැන් මට අර්පණාවෙන් කිමෙක්දැයි; විරියං හාපෙති, වීර්‍ය්‍ය පිරිහෙළාද; තස්ස චිත්තං, ඔහුගේ සිත; අතිලීනවිරි යත්තා, ඉතා හැකුළුණු වීර්‍ය්‍යඇති බැවින්; කොසජ්ජෙ පතති, කුසීත බව හෙයි; සොපි, හෙද; න සක්කොති අප්පනං පාපුණිතුං, අර්පණා වට පැමිණෙනුවට නොපොහොසත් වෙයි; යො පන, යමෙක් වනාහි; ඊසකම්පි, මඳකුදු; ලීනං, ලීනවූසිත; ලීනභාවතො, ලීනබැවින්ද; උද්ධතං, උද්ධතසිත; උද්ධච්චතො, උද්ධතබැවින්ද; මොචෙත්වා, මුදා, සමෙන පයොගෙන, සමප්‍රයොගයෙන්; නිමිත්තාභිමුඛං පවත්තෙති, පිළිබිඹුනිමිත්තට අභිමුඛකොට පවත්වාද; සො, හෙතෙම; අප්පනං පාපුණාති, අපුන්පැමිණේ; තාදිසෙන භවිතබ්බං, එබඳුවහුවිසින් විය යුතු; ඉමමත්ථං සන්ධායෙතං වුත්තං, මේ අර්ථය සඳහා මෙ කියනලදී. පෙ.

---

I. මේ ගාථා දෙක්හි අර්ථ (350) වෙනි පිටෙහි බලනු.

(අ) එවං නිමිත්තාභිමුඛං මානසං පටිපාදයතො පනස්ස ඉදානි අප්පනා ඉජ්ඣිස්සතීති භවඞ්ගං උපච්ඡින්දිත්වා **පඨවී පඨවීති** අනුයොගවසෙන උපට්ඨිතං තදෙව පඨවීකසිණං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති, තතො තස්මිංයෙවාරම්මණෙ චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති, තෙසු අවසානෙ එකං රූපාවචරං සෙසානි කාමාවචරානි පකතිචිත්තෙහි බලවතරවිතක්කවිචාරපීතිසුඛචිත්තෙකග්ගතානි, යානි අප්පනාය පරිකම්මත්තා පරිකම්මානීතිපි, යථා ගාමාදීනං ආසන්නප්පදෙසො ගාමූපචාරො නගරූපචාරොති වුච්චති, එවං අප්පනාය ආසන්නත්තා සමීපචාරිත්තා වා උපචාරානීතිපි, ඉතො පුබ්බෙ පරිකම්මානං උපරි අප්පනාය ච අනුලොමත්තො අනුලොමා

---

(අ) එවං, මෙසේ කී නියෙන්; නිමිත්තාභිමුඛං, නිමිත්තට අභිමුඛ කොට; මානසං පටිපාදයතො පන, සිත පිළිපදනාවූ; අස්ස, ඒ යෝගීහට; (විරියසමතා යොජනවශයෙන් වීර්‍ය්‍යී පිළිපන් භාවනාමනස පිළිබිඹු නිමිත්හි තිබීම්වශයෙන් නිමිත්තාභිමුඛකොට පිළිපන්නාවූ යෝගීහටය යන අදහසි.) ඉදානි, දැන්; අප්පනා ඉජ්ඣිස්සතීති, අර්පණාව සිද්ධ වෙයි කීසඳ; භවඞ්ගං උපච්ඡින්දිත්වා, භවාඞ්ග සිඳගෙන; ("මනොද්වාරාවජ්ජනමුප්පජ්ජති" යනු හා යොදනු.) පඨවි පඨවීති අනුයොගවසෙන උපට්ඨිතං, පඨවී පඨවී යන භාවනානුයෝගවශයෙන් වැටහුණු; තදෙව පඨවිකසිණං, එම පඨවිකිසුණ; ආරම්මණං කත්වා, එම පිළිබිඹු නිමිත් අරමුණුකොට; මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති, මනෝද්වාරාවර්ජනසිත උපදී; තතො, ඉක්බිත්තෙන්; තස්මිංයෙවාරම්මණෙ, එම පිළිබිඹු නිමිත් අරමුණෙහි; චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති, ජවන්හු සතරදෙනෙක් හෝ පස්දෙනෙක් හෝ දිවෙත්; තෙසු, ඔවුන්කෙරෙහි; අවසානෙ, කෙළවර; එකං, එකම ජවන්සිත; රූපාවචරං, රූපාවචර වෙයි; සෙසානි, සෙස්සෝ; කාමාවචරානි, කම්වැජරිවෙත්; පකතිචිත්තෙහි, පියවිකම්වැජරි සිතුන්ට වඩා; බලවතර, ඉතා බලවත්වූ; විතක්කවිචාරපීති සුඛචිත්තෙකග්ගතානි, විතර්කය විචාරය ප්‍රීතිය සුඛය චිත්තෛකාග්‍රතාය යන මොවුන් ඇත්තාහු වෙත්; යානි, යම්ජවන කෙනෙක්; අප්පනාය පරිකම්මත්තා, අර්පණාවට පරිකර්මබැවින්; (පටිසඞ්ඛාරකවනබැවින් යන අදහසි.) පරිකම්මානීතිපි, පරිකර්මහයි කියා; යථා, යම්සේ; ගාමාදීනං ආසන්නප්පදෙසො, ග්‍රාමාදීන්ට ආසන්නදෙශය; ගාමූපචාරො නගරූපචාරොති වුච්චති, ග්‍රාමෝපචාරය නගරොපචාර යයි කියනුලැබේද; එවං, එපරිද්දෙන්; අප්පනාය ආසන්නත්තා, අර්පණාවට ආසන්නබැවින්; සමීපචාරිත්තා වා, සමීපයෙහි හැසිරෙන හෙයින් හෝ; උපචාරානීතිපි, උපචාරහයි කියාද; (ආසන්නහෙයින් උපචාරබව වේ නම් ගොත්‍රභූහටම උපචාරසංඥා වන්නේයයි "සමීපචාරිත්තා වා" යුහු-අත්‍යාසන්න නුවූයේද ඉතා දුරැනොවන්නේ සමීපචාරීනම් වේ "අප්පනං උපෙච්ච උපචාරානි චරන්තීති උපචාරා" යනු වේ.) ඉතො පුබ්බෙ පරිකම්මානං, මෙයින් පෙරවූ නානාවර්ජන

නීතිපි වුච්චන්ති, යඤ්ච සබ්බන්තිමං තං පරිත්තගොත්තාභිභවනතො මහග්ගතගොත්තභාවනතො ච ගොත්‍රභූතිපි වුච්චති. අගහිතග්ගහණෙනපි පනෙත්ථ පඨමං පරිකම්මං, දුතියං උපචාරං, තතියං අනුලොමං, චතුත්ථං ගොත්‍රභූ. පඨමං වා උපචාරං, දුතියං අනුලොමං, තතියං ගොත්‍රභූ, චතුත්ථං පඤ්චමං වා අප්පනාචිත්තං. චතුත්ථමෙව හි පඤ්චමං වා අප්පෙති තඤ්ච ඛො ඛිප්පාභිඤ්ඤ දන්ධාභිඤ්ඤවසෙන,

---

වීථි පරිකර්මයන්වද; උපරි අප්පනාය ච, මතුයෙහි අර්පණාවටද; අනුලොමත්තො, අනුලොම් වනබැවින්; අනුලොමානීතිපි, අනුලොමය හයි කියාද; වුච්චන්ති, කියනුලැබෙත්ද; එත්, පරිකර්ම උපචාර අනුලොම නම් ජවනයන් කෙරෙහි; යඤ්ච සබ්බන්තිමං, යමෙක් සර්වාන්තිමද; තං, හේ; පරිත්තගොත්තාභිභවනතො, පරිත්තගොත්‍රය මඩනා හෙයින්ද; මහග්ගතගොත්තභාවනතො ච, මහද්ගතගොත්‍රය උපදවන හෙයින්ද; ගොත්‍රභූතිපි වුච්චති ගොත්‍රභූයයි කියනු ලැබේ; (මෙහි පරිත්තය යන නමද බුද්ධියද පරිත්තගොත්‍ර නම මහත්ගත ගොත්‍රයෙහිදු මෙමනයයි-මෙම කීහ-**"ගං තායතීති ගොත්තං, පරිත්තන්ති පවත්තමානං අභිධානං, බුද්ධි ච එකංසිකං විය තායති රක්ඛතීති පරිත්තගොත්තං, යථාහි වුච්චති ආරම්මණභූතෙන අත්ථෙන විනා න වත්තන්ති එවං අභිධානං අභිධෙය්‍යභූතෙන තාසමා සොතානි තායති රක්ඛතීති වුච්චති තං පන මහග්ගතානුත්තරවිධුරං කාමතණ්හාය ගොචරභූතං කාමාවචරධම්මානං ආවෙණිකං රූපං දට්ඨබ්බං මහග්ගතගොත්තන්ති ඉමිනාව නයෙන අත්ථො වෙදිතබ්බො"**යි සත්‍යයෙහි ව්‍යාඛ්‍යාහි) පරිත්තගොත්තාභිභවනතො, කාමාවචරිතම් මඩනාබැවින්; මහග්ගතගොත්තභාවනතො ච, රූපාවචරිතම් උපයන බැවිනැයි කීහු- එහෙයින් පරිත්තය යන නමද බුද්ධියද මඩනාහෙයිනුදු මහග්ගතය යන නම ද බුද්ධිය ද උපදවන හෙයිනුදු ගොත්‍රභූනමැයි දතයුතු.) අගහිතගහණෙනපි පන, අගෘහීත ග්‍රහණයෙනුදු වනාහි; (අවිශෙෂයෙන් සියල්ලටම පරිකර්මාදි සංඥනුයි ප්‍රථමනය ගෘහීතග්‍රහණ බැවින් "අගහිතගහණෙනපි පන"යි කීහු.) එත්, මෙහි; පඨමං පරිකම්මං, පළමුවන ජවනය පරිකර්ම නම් වෙයි; දුතියං උපචාරං, දෙවන ජවනය උපචාරනම් වෙයි; තතියං, තුන්වන ජවනය; අනුලොමං, අනුලොමනම් වෙයි; චතුත්ථං ගොත්‍රභූ, සතරවන ජවනය ගොත්‍රභූනම් වේ; (නානාවර්ජනපරිකර්මයම පරිකර්මවනබැවින් "පඨමං වා" යනාදී කීහු.) චතුත්ථං අප්පනාචිත්තං, සතරවනසිත අර්පණාසිත වේ; පඤ්චමං වා අප්පනාචිත්තං, (ඉදින් යටකී නයින් සතරවනුව ගොත්‍රභූනම්) පස්වන සිත හෝ අර්පණා වේ; (යන අර්ථයි.) චතුත්ථමෙව හි, සතරවනසිත හෝ; පඤ්චමං වා, පස්වනසිත හෝ; අප්පෙති, අර්පණා වේ; තඤ්ච ඛො, හෙද; ඛිප්පාභිඤ්ඤ දන්ධාභිඤ්ඤවසෙන, ක්ෂිප්‍රාභිඥය දන්ධාභිඥය යන මොවුන්ගේ වශයෙනි; (ක්ෂිප්‍රාභිඥයහට සතරවනුව වෙයි දන්ධාභිඥයහට පස්වනුව වෙයි

තතො පරං ජවනං පතති, භවඞ්ගස්ස වාරො හොති. ආභිධම්මිකගොදත්තත්ථෙරො පන පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවනපච්චයෙන පච්චයො”ති. ඉමං සුත්තං වත්වා ආසෙවනපච්චයෙන පච්ඡිමො පච්ඡිමො ධම්මො බලවා හොති, තස්මා ඡට්ඨෙපි සත්තමෙපි අප්පනා හොතීති ආහ, තං අට්ඨකථාසු අත්තනොමතිමත්තං ථෙරස්සෙතන්ති වත්වා පටික්ඛිත්තං, චතුත්ථපඤ්චමෙසුයෙව පන අප්පනා හොති, පරතො ජවනං පතිතං නාම හොති, භවඞ්ගස්ස ආසන්නත්තාති වුත්තං, තං එවං විචාරෙත්වා වුත්තත්තා න සක්කා පටික්ඛිපිතුං.

---

යන අර්ථයි.) තතො පරං, පඤ්චමජවනයා කෙරෙන් මත්තෙහි (සවන සත්වන ජවනය); පතති, හේ; භවඞ්ගස්ස වාරො හොති, භවාඞ්ගයාගේ වාරය වේ; (භවාඞ්ගාසන්නබැවින්ම පරික්ෂීණජවන හෙයින් ඥන්තක්හු මෙන් වෙයි සේයි.) ආභිධම්මිකගොදත්තත්ථෙරො පන, ආභිධම්මිකගොදත්තනම් තෙරහු; පුරිමා පුරිමා කුසලා ධම්මා, පළමු පළමු කුශලධර්මයෝ; පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං, පසු පසු කුශලධර්මයන්ට; ආසෙවන පච්චයෙන පච්චයොති, ආසෙවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවෙයි යන; ඉමං සුත්තං වත්වා, මේ සූත්‍රය කියා; ආසෙවනපච්චයෙන, අසෙවනප්‍රත්‍යය බලයෙන්; පච්ඡිමො පච්ඡිමො ධම්මො බලවා හොති, පශ්චිම පශ්චිම ධර්මය බලවත් වෙයි; තස්මා, එහෙයින්; ඡට්ඨෙපි සත්තමෙපි අප්පනා හොතීති ආහ, සවන්නෙහිදු සත්වන්නෙහිදු අර්පණාවෙයි කීහු; (යම්සේ ආසෙවන නොලද ප්‍රථම ජවනය දුර්වලබැවින් ගොත්‍රභුව ඉපැදවිය නොහේද ආසෙවනලද දෙවන තුන්වන ජවනය බලවත්බැවින් තුන්වන සතරවන ගොත්‍රභුව ඉපැදවියහේද එසේම ආසෙවන ලදින් බලවත්බැවින් සවන සත්වන ජවනය අර්පණාවෙයි යනු තෙරුන්ගේ අභිප්‍රායයි.) තං, ඒ තෙරුන්ගේ වචනය, (“පටික්ඛිත්තං”යි යොදනු. මතුයෙහි “වුත්තං” යනු “අට්ඨකථාසු” යනු හා යොදනු.) අත්තනො මතිමත්තං ථෙරස්සෙතන්ති වත්වා, (සූත්‍ර සූත්‍රානුලොම ආචාර්‍ය්‍යවාද යන මෙයින් අනුපසන්නමහිත බැවින්.) ස්ථවිරයන්ගේ අත්තනොමති පමණෙකැ යි; පටික්ඛිත්තං, ප්‍රතික්ෂෙපකරනලදී; (ආසෙවන නො ලද ප්‍රථම චෙතනාව දෘෂ්ටධර්මවෙදනීය වනබැවිනුදු ආසෙවනලද දෙවන චෙතනාවෙහි පටන් සවනචෙතනාවදක්වා අපරපර්‍ය්‍යා වෙද්‍යවනබැවිනුදු ආසෙවනප්‍රත්‍යයලාභයාගේ බලව භාව යෙහි අනෛකාන්තිකවනබැවින් “පුරිමා පුරිමා කුසලා ධම්මා” යන සූත්‍රපදයද අකාරණ වේ.) චතුත්ථ...පෙ...වුත්තං, අටකියනලදම අර්ථයුක්තිදර්ශනමුඛයෙන් නිගමනය පිණිස කීහු; තං, හේ වචනය; එවං විචාරෙත්වා, මෙසේ පරීක්ෂාකොට; වුත්තත්තා, කීහෙයින්; න සක්කා පටික්ඛිපිතුං, ප්‍රතික්ෂෙපකරන්නට නොපිළිවනි.

(අ) යථා හි පුරිසො ඡින්නතටාභිමුඛො ධාවන්තො ඨාතුකාමොපි පරියන්තෙ පාදං කත්වා ඨාතුං න සක්කොති පපාතෙ එව පතති, එවං ඡට්ඨෙ වා සත්තමෙ වා අප්පෙතුං න සක්කොති භවඞ්ගස්ස ආසන්නත්තා, තස්මා චතුත්ථපඤ්චමෙසු යෙව අප්පනා හොතීති වෙදිතබ්බා. සා ච පන එකචිත්තක්ඛණිකායෙව සත්තසු හි ඨානෙසු අද්ධානපරිච්ඡෙදො නාම නත්ථි, පඨමප්පනායං, ලොකියාභිඤ්ඤාසු, චතූසු මග්ගෙසු, මග්ගානන්තරඵලෙ, රූපාරූපභවෙසු භවඞ්ගජ්ඣානෙ, නිරොධස්ස පච්චයෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ, නිරොධා වුට්ඨහන්තස්ස ඵලසමාපත්තියන්ති....

---

(ඉදින් සවන සත්වන ජවන පරික්ෂීණජව ඇතිහෙයින් පතිතවේ නම් සත්වන ජවනචේතනාව කෙසේ උපපද්‍යවේද්‍යද[1] ආනන්තරීකද වේය යත්? මේ විශේෂය අනන්තරප්‍රත්‍යය ලදින් වූ බලවත් බැවින් නොවෙයි-වැලි කිමෙක්ද යත්? ක්‍රියාවස්ථාවිශෙෂහෙයින්-ක්‍රියාවස්ථාවනාහි ආරම්භ මධ්‍ය පර්‍ය්‍යවසානවශයෙන් ත්‍රිවිධ වෙයි එහි පර්‍ය්‍යවසානාවස්ථාව සන්නිෂ්ඨාපකචේතනා බැවින් උපපද්‍යවේදනීයද ආනන්තරීකද වෙයි- බලවත්බැවින් නොවෙයි දතයුතු. ප්‍රතිසන්ධියට ප්‍රත්‍යයවන විපාකසන්තානයෙහි සත්වන චේතනාව අනන්තරප්‍රත්‍යයභාවයෙන් වාසිතව ගියබැවිනුදු යෙත්-මෙම ටීක-“**පටිසන්ධියා අනන්තරපච්චයභාවිනො විපාකසන්තානස්ස අනන්තරපච්චයභාවෙන තථා අභිසඞ්ඛතත්තාතිච වදන්ති**”යි- එහෙයින් සවන සත්වන ජවනයෝ ප්‍රපාතාභිමුඛව පරික්ෂීණ ජව ඇති බැවින් වළකනුවට නොපිළිවන් වෙත්. එහෙයින් ම ටීක. “යථාහීත්‍යාදි”)

(අ) යථා හි, යම්සේ; පුරිසො, පුරුෂතෙමේ; ඡින්නතටාභිමුඛො, ඡින්නවූ කූලපාශ්වයට අභිමුඛව; ධාවන්තො, දිවන්නේ; ඨාතුකාමොපි, සිටිනා කැමතිවූයේද; පරියන්තෙ පාදං කත්වා ඨාතුං න සක්කොති, පර්‍ය්‍යන්තයෙහි (කෙළවර) පය තබා සිටිනට නොපොහොසත් වේද; පපාතෙ එව පතති, ප්‍රපාතයෙහිම හේද; එවං, එපරිද්දෙන්ම; ඡට්ඨෙ වා සත්තමෙ වා, සවන්නෙහි හෝ සත්වන්නෙහි හෝ; අප්පෙතුං න සක්කොති, අර්පණාවන්නට නොපොහොසති; භවඞ්ගස්ස ආසන්නත්තා, භවාඞ්ගයට ආසන්නහෙයිනි....පෙ....සා ච පන, ඒ අර්පණාද; එකචිත්තක්ඛණිකායෙව, එක චිත්තක්ෂණිකම වේ; සත්තසු හි ඨානෙසු, සත්තැනෙක; අද්ධානපරිච්ඡෙදො නත්ථි, කාලපරිච්ඡෙදයෙක්නැති(එකවර සත්තැනටද යෙත්); පඨමප්පනායං, පළමුවන අර්පණාවෙහිය; ලොකියාභිඤ්ඤාසු, ලෞකික අභිඥවන් කෙරෙහිය; චතූසු මග්ගෙසු, සතරමාර්ගයෙහිය; මග්ගානන්තරඵලෙ, මාර්ගානන්තරඵලයෙහිය; රූපාරූපභවෙසු භවඞ්ගජ්ඣානෙ, රූපාරූපභවයෙහි භවාඞ්ගසඞ්ඛ්‍යාත ධ්‍යානයෙහිය; නිරොධස්ස පච්චයෙ, නිරොධසමාපත්තියට ප්‍රත්‍යයවූ; නෙවසඤ්ඤා

---

1 වේදනීයද.

(අ) එත්ථ මග්ගානන්තරං ඵලං තිණ්ණං උපරි න හොති, නිරොධස්ස පච්චයො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං චිත්තං උපරි න හොති, රූපාරූපභවෙසු භවඞ්ගස්ස පරිමාණං නත්ථි, සෙසට්ඨානෙසු එකමෙව චිත්තන්ති ඉති එකචිත්තක්ඛණිකායෙව අප්පනා, තතො භවඞ්ගපාතො, අථ භවඞ්ගං විච්ඡින්දිත්වා ඣානං පච්චවෙක්ඛනත්ථාය ආවජ්ජනං, තතො ඣානං පච්චවෙක්ඛති. එත්තාවතා ච පනෙස "විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති" එවමනෙන පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං පඨමජ්ඣානං අධිගතං හොති පඨවීකසිණං.

---

නාසඤ්ඤායතනෙ, නෙවසංඥානාසංඥායතනයෙහිය; නිරොධා වුට්ඨහන්තස්ස, නිරොධයෙන් නැගෙන්නහුගේ; ඵලසමාපත්තියන්ති, ඵලසමාපත්තියෙහිය යනමේ සත්තැනයි; (සත්තසු ඨානෙසු යනු භාවනාධිකාරබැවින් සෙසුධර්ම නොකියා භාවනාබලයෙන් වන මහද්ගතධර්ම හා ලොකොත්තරධර්මපිණිස කීහු.

(අ) එත්ථ, මෙහි; මග්ගානන්තරං ඵලං, මාර්ගානන්තර ඵලය; තිණ්ණං උපරි න හොති, තුන්දෙනෙකුන් කෙරෙන් මත්තෙහි නොවේ; නිරොධස්ස පච්චයො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, නිරොධයට ප්‍රත්‍යය වූ නෙවසංඥානාසංඥායතනය; චිත්තං උපරි න හොති, දෙදෙනෙක්හු කෙරෙන් මත්තෙහි නොවේ; රූපාරූපභවෙසු, රූපාරූපදෙක්හි; භවඞ්ගස්ස පරිමාණං නත්ථි, භවාඞ්ගයෙහි පමණ නැති; සෙසට්ඨානෙසු, ප්‍රථමාර්පණාය ලෞකික අභිඥාය මාර්ගක්ෂණය නිරොධයෙන් නැගෙන්නහුගේ ඵලක්ෂණය යන මේ සතරතන්හි; එකමෙව චිත්තන්ති, එකම චිත්තයෙක් වේ; ඉති, මෙසේ; එකචිත්තක්ඛණිකායෙව අප්පනා, අර්පණාතොමෝ එකචිත්තක්ෂණිකම වේ; (මෙහි රූපාරූපභවයෙහි සෙසු අරමුණුසිත් නොපවත්නාසඳ භවාඞ්ගසිත් මෙතෙක්ම දවස් පවත්නේය යි කාලපරිමාණයක් නැතිබැවින් අද්ධාන පරිච්ඡෙද නැතැයි කීහ. සෙසු තැන්හි කාලපර්‍ය්‍යන්තබැවින් අද්ධාන පරිච්ඡෙද ඇතැයි කීහු.) තතො, ඒ අර්පණාවට ඉක්බිතිව; භවඞ්ගපාතො භාවාඞ්ගපාතය වේ; අථ, ඉක්බිත්තෙන්; භවඞ්ගං විච්ඡින්දිත්වා, භවාඞ්ගය සිඳගෙන; ඣානං පච්චවෙක්ඛනත්ථාය, ධ්‍යානයප්‍රත්‍යවෙක්ෂාකරන පිණිස; ආවජ්ජනං, මනොද්වාරාවර්ජනය වේ; තතො, ඉක්බිත්තෙන්; ඣානං පච්චවෙක්ඛති, ධ්‍යානප්‍රත්‍යවෙක්ෂා වන්නේයි; එත්තාවතා ච පන, මෙපමණ භාවනාක්‍රමයකින්; එස, මේ යොගීතෙමේ; විවිච්චෙව කාමෙහි, කාමයන්කෙරෙන් වෙන්වම; විවිච්ච අකුසලෙහි ධම්මෙහි, අකුශල ධර්මයන් කෙරෙන් වෙන්වම; සවිතක්කං, විතර්කසහිතවූ; සවිචාරං, විචාරසහිතවූ, විවෙකජං, විවෙකයෙහි උපන්; පීතිසුඛං, ප්‍රීතිසුඛ ඇති; පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය; උපසම්පජ්ජ, උපදවා; විහරති, වෙසේ-

**(අ) තත්‍ථ විවිච්චෙව කාමෙහීති කාමෙහි විවිච්චිත්‍වා විනා හුත්‍වා අපක්කමිත්‍වා, යො පනායමෙත්‍ථ එවකාරො සො නියමත්‍ථො ති වෙදිතබ්බො. යස්මා ච නියමත්‍ථො තස්මා තස්මිං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරණසමයෙ අවිජ්ජමානානම්පි කාමානං තස්ස පඨමස්ස ඣානස්ස පටිපක්ඛභාවං කාමපරිච්චාගෙනෙවස්ස අධිගමං දීපෙති. කථං? විවිච්චෙව කාමෙහීති එවං හි නියමෙ කයිරමානෙ ඉදං පඤ්ඤායති නූනමස්ස ඣානස්ස කාමා පටිපක්ඛභූතා, යෙසු සති ඉදං නප්පවත්තති අන්‍ධකාරෙ සති දීපොභාසො විය, තෙසං පරිච්චාගෙනෙව වස්ස අධිගමො හොති ඔරිමතීරපරිච්චාගෙන පාරිමතීරස්සෙව, තස්මා නියමං කරොතීති.**

---

අනෙන, මේ ප්‍රථමධ්‍යානය උපදවා වසන්නහුවිසින්, (තදෙව පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං යි සම්බන්‍ධකරනු.) පඤ්චඞ්ගවිප්පහීනං, ප්‍රහීණවූ කාමච්ඡන්‍දාදි පඤ්චාඞ්ගයන් ඇති; පඤ්චඞ්ගසමන්නාගතං, විතර්කාදි පඤ්චාඞ්ගයෙන් සමන්විතවූ; තිවිධකල්‍යාණං, (ආදිකල්‍යාණාදී) ත්‍රිවිධකල්‍යාණයන්ඇති; දසලක්ඛණසම්පන්නං, (ආදිමධ්‍ය පර්‍ය්‍යවසාන යන්ගේ ලක්‍ෂණ වශයෙන්) දශලක්‍ෂණයෙන් යුක්තවූ; පඨවිකසිණං, පෘථිවිකසුණුවූ; පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය; අධිගතං හොති, පැමිණෙනලදවේ.

(අ) තත්‍ථ, ඒ ධ්‍යානප්‍රථමයෙහි; විවිච්චෙව කාමෙහීති, විවිච්චෙවකාමෙහි යන්නෙහි; විවිච්චිත්‍වා, යි-සේයි; විනා හුත්‍වා, වෙන්ව; අපක්කමිත්‍වා, ප්‍රහාණවශයෙන් පහව; එත්‍ථ, විවිච්චෙව යනමෙහි; යො පනායං එවකාරො, යම් මේ එවකාරයෙක් ඇද්ද; සො, හෙතෙම; නියමත්‍ථොති වෙදිතබ්බො, නිශ්චයාර්ථයයි (අවධාරණාර්ථයයි) දතයුතු; යස්මා ච නියමත්‍ථො, යම්හෙයකින් නියමාර්ථද; තස්මා, එහෙයින්; තස්මිං පඨමජ්ඣානං උපසම්පජ්ජවිහරණසමයෙ, ඒ ප්‍රථමධ්‍යානයට පැමිණවසනසමයෙහි; අවිජ්ජමානානම්පි කාමානං, අවිද්‍යමානදවූ කාමයන්ගේ; තස්ස පඨමස්ස ඣානස්ස පටිපක්ඛභාවං, ඒ ප්‍රථමධ්‍යානයට ප්‍රතිපක්‍ෂබවද; කාමපරිච්චාගෙනෙව, කාමයාගේ පරිත්‍යාගයෙන්ම; අස්ස අධිගමං ච, ඒ ධ්‍යානයාගේ අධිගමයද; දීපෙති, හඟවා; කථං, කෙසේද යත්? විවිච්චෙව කාමෙහීති, කාමයන්කෙරෙන් වෙන්වමයයි; එවං හි නියමෙ කයිරමානෙ, මෙසේ නියමකරනුලබනකල්හි; ඉදං පඤ්ඤායති, මේ පැනේ; නූන, එකාන්තයෙන්; ඉමස්ස ඣානස්ස, මේ ධ්‍යානයට; කාමා පටිපක්ඛභූතා, කාමයෝ ප්‍රතිපක්‍ෂයෝයි; යෙසු සති, යම් කාමකෙනෙකුන් ඇතිකල්හි; ඉදං නප්පවත්තති, මේ ධ්‍යානය නොපවතීද; අන්‍ධකාරෙ සති දීපොභාසො විය, අන්‍ධකාරය ඇතිකල්හි ප්‍රදීපාලොකය මෙනි; (අන්‍ධකාරෙ සති යනු ඇඳිරිහයි අලුසම්ගම නොවැටෙනබැවින් කීහ. යනු සත්‍යයි–අන්‍ධකාරෙ සති දීපොභාසො වියාති එතෙන යථා පදීපොභාසාභාවෙන රත්තියං අන්‍ධකාරාභිභවො එවං ඣානාභාවෙන

(අ) තත්‍ථ සියා:-කස්මා පනෙස පුබ්බපදෙයෙව වුත්තො, න උත්තර පදෙ කිං? අකුසලෙහි ධම්මෙහි අවිවිච්චාපි ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යාති? න ඛො පනෙතං එවං දට්ඨබ්බං, තන්නිස්සරණතො හි පුබ්බ පදෙ එසො වුත්තො, කාමධාතුසමතික්කමනතො හි කාමරාගපටි පක්ඛතො ච ඉදං ඣානං කාමානමෙව නිස්සරණං. යථාහ:-“කාමාන මෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්ම”න්ති උත්තරපදෙපි පන යථා “ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො”ති එත්‍ථ එවකාරො ආනෙත්වා වුච්චති, එවං වත්තබ්බො, නහිසක්කා ඉතො අඤ්ඤෙහිපි

---

සන්තසන්තතිය: කාමාභිභවොති දසෙසති- යනු ටීකායි.) තෙසං පරිච්චාගෙනෙව, ඒ කාමයන්ගේ පරිත්‍යාගයෙන්ම; අස්ස අධිගමො හොති, මේ ධ්‍යානයාගේ අධිගමයද වේ; ඔරිමතීරපරිච්චාගෙන, අවරි මතීරයාගේ පරිත්‍යාගයෙන්; පාරිමතීරස්සෙව, පාරිමතීරයාගේ අධි ගමයමෙනි; තස්මා, එහෙයින්; නියමං කරොතීති ඉදං පඤ්ඤායති-(යි යොදනු.) නියමකරන්නේයි.

(අ) තත්, ඒ “විවිච්චෙවකාමෙහි” යන පදයෙහි; සියා, චොද්‍යයෙක් වන්නේයි; කස්මා පන, කුමක්හෙයින්; එස, මේ එවශබ්දයතෙමේ; පුබ්බපදෙයෙව වුත්තො, පූර්වපදයෙහිම කියනලද්දේද; න උත්තර පදෙ, උත්තරපදයෙහි නොකියනලදද; කිං, කිම; අකුසලෙහි ධම්මෙහි අවිවිච්චාපි, අකුශලධර්මයන් කෙරෙන් වෙන්නොවද; ඣානං උප සම්පජ්ජවිහරෙය්‍යාති, ධ්‍යානය උපදවා වෙසේද යත්? එතං, මේ(පූර්ව පදයෙහි ම) අවධාරණ වචනය; න ඛො පන එවං දට්ඨබ්බං, එසේදත යුතු නොවේ; තන්නිස්සරණතො, ඒ කාම නිස්සරණ හෙයින්; (කාම යෙන් පහවීමක් කාමයාගේ අපවත්කිරීමක් බැවිනැයි යන අර්ථයි.) පුබ්බපදෙ, පූර්වපදයෙහි; එසො, මේ එවශබ්දය; වුත්තො, කියනලදී; කාමධාතුසමතික්කමනතො, සියලු කාමභවයාගේ සමතික්‍රමණයට ප්‍රතිපත්තියක්බැවින්ද; (මෙයින් කාමයාගේ කාමපරිඥභාවය කීහු.) කාමරාගපටිපක්ඛතො, වක්ෂ්‍යමාන විභාග ඇති කෙලශකාමයට ප්‍රති පක්ෂ බැවින්ද;(මෙයින් ව්‍යාපාදයට ප්‍රතිපක්ෂ මෛත්‍රියමෙන්ද විහිංසා වට ප්‍රතිපක්ෂ කරුණාවමෙන්ද ධ්‍යානය කාමරාගයට ඍජු ප්‍රතිපක්ෂ යයි දක්වා) ඉදං ඣානං, මේ ධ්‍යානය; කාමානමෙවනිස්සරණං, කාම යන්ගේම නිස්සරණයි; (**නිස්සරන්ති නිග්ගච්ඡන්ති එතෙන එත්‍ථ වාති නිස්සරණං, කෙ නිග්ගච්ඡන්ති කාමා තෙසං කාමානං නිස්සරණං පහාණං තන්නිස්සරණං තතො**-යි ගන්නේ-මෙසේ ධ්‍යානය තමාගේ ප්‍රවෘත්තීන්ද විපාකප්‍රවෘත්තීන්ද කාමරාගයෙනුත් කාමධාතුවෙනුත් විනිවර්තස්වභාවනුයි විශෙෂයෙන් කාමයන්ගේම නිස්සරණයි)යථාහ, වදාලේමැයි; යදිදං නෙක්ඛම්මං, යම් මේ ධ්‍යානයෙක් ඇද්ද; එතං, මේ ධ්‍යානය;කාමානං නිස්සරණං,කාමයන්ගේ නිස්සරණ නුයි;උත්තර පදෙපි පන, උත්තරපදයෙහිදු; (“වත්තබ්බො”යි යොදනු.) යථා, යම් සේ; ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණොති එත්‍ථ “ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො” යන මෙහි; එවකාරෙ

නීවරණසඞ්ඛාතෙහි අකුසලෙහි ධම්මෙහි අවිවිච්ච ඣානං උපසම්පජ්ජ විහරිතුං, තස්මා-විවිච්චෙව කාමෙහි විවිච්චෙව අකුසලෙහි ධම්මෙහී"ති එවං පදද්වයෙපි එස දට්ඨබ්බො. පදද්වයෙපි ච කිඤ්චාපි විවිච්චාති ඉමිනා සාධාරණවචනෙන තදඞ්ගවිවෙකාදයො චිත්තවිවෙකාදයො ච සබ්බෙපි විවෙකා සඞ්ගහං ගච්ඡන්ති, තථාපි කායවිවෙකො චිත්තවිවෙකො වික්ඛම්භනවිවෙකොති තයො එව ඉධ දට්ඨබ්බා. **කාමෙහීති** ඉමිනා පන පදෙන යෙ ච නිද්දෙසෙ "කතමෙ වත්ථුකාමා මනාපියා රූපා"ති ආදිනා නයෙන වත්ථුකාමා වුත්තා, යෙ ච තත්ථෙව විභඞ්ගෙ ච-"ඡන්දො කාමො-රාගො කාමො-ඡන්දරාගො කාමො-සඞ්කප්පො කාමො-රාගො කාමො-සඞ්කප්පරාගො කාමො-ඉමෙ වුච්චන්ති කාමා"ති...

---

ආනෙත්වා වුච්චති, එවකාරය දෙවනපදයට ගෙනඅවුත් කියනු ලැබේද; එවං වත්තබ්බො, එසේම කියයුත්ත;(ඉධෙව භික්ඛවෙ යනාදියෙහි) භික්ඛවෙ, මහණෙනි; සමණො, (සෝවාන්) මහණද; ඉධෙව, මේ ශාසනයෙහිමය; දුතියො සමණො, දෙවන (සෙදගැමි අනගැමි) මහණද; ඉධ, මේ ශාසනයෙහිමයයි; (පදාර්ථදතයුතු) ඉතො, මේ කාමච්ඡන්දයෙන්; අඤ්ඤත්‍ර පි, අන්‍යවූ; නීවරණසඞ්ඛාතෙහි අකුසලෙහි ධම්මෙහි, නීවරණසඞ්ඛ්‍යාත අකුශලධර්මයන්කෙරෙනුදු; අවිවිච්ච, වෙන්නොව; ඣානං උපසම්පජ්ජ විහරිතුං, ධ්‍යානයඋපදවා වසන්නට; න සක්කාති,(යී-යොදනු.)නොපිළිවනී; තස්මා, එහෙයින්; විවිච්චෙව කාමෙහි, කාමයන්කෙරෙන් වෙන්වමයයි;-එවං, මෙසේ; පදද්වයෙපි, දෙපදයෙහිම; එස, මේ නියමය; දට්ඨබ්බො, දතයුතු; පදද්වයෙපි ච, දෙපදයෙහිම; කිඤ්චාපි, කිසිසේත්; විවිච්චාති ඉමිනා සාධාරණවචනෙන, විවිච්ච යන අවිශෙෂවචනයෙන්; තදඞ්ගවිවෙකාදයො ච, තදඞ්ගවිවෙකය විෂ්කම්භනවිවෙකය සමුච්ඡෙදවිවෙකය ප්‍රශ්‍රබ්ධිවිවෙකය නිස්සරණවිවෙකය යන පඤ්චවිවෙකයෝද; චිත්තවිවෙකාදයො ච,චිත්තවිවෙකය කායවිවෙකය උපධිවිවෙකය යන ත්‍රිවිධ විවෙකයෝදැයි;සබ්බෙපි විවෙකා, සියලු විවෙකයෝ;සඞ්ගහං ගච්ඡන්ති, සඞ්ග්‍රහයට යෙති; තථාපි, එතකුදුවුවත්; කායවිවෙකො, කායවිවෙකය; චිත්තවිවෙකො, චිත්තවිවෙකය; වික්ඛම්භනවිවෙකොති, වික්ඛම්භන විවෙකයයි; තයො එව, (සමුච්ඡෙදවිවෙකාදීන් අසම්භව වන හෙයින්) මේ තුන්දෙනම; ඉධ, මේ ධ්‍යානකථායෙහි; දට්ඨබ්බා, දතයුත්තාහයි; කාමෙහීති ඉමිනා පන පදෙන, කාමෙහි යන මේ පෙදෙන්; නිද්දෙසෙ, මහනිදෙස; කතමෙ වත්ථුකාමා, වස්තුකාමයෝ නම් කවරහ?; මනාපියා රූපාති ආදිනා නයෙන, මනාපියා රූපා යනාදි නයින්; යෙ ච වත්ථුකාමා වුත්තා, යම් වස්තුකාමකෙනෙක් කියන ලදහුද; තත්ථෙව, එමනිදෙස්හිම; විභඞ්ගෙ ච, ධ්‍යාන විභඞ්ගයෙහිද; (යෙ ච කිලෙසකාමා වුත්තා-යී යොදනු)-ඡන්දො කාමො යනාදියෙහි අර්ථ මෙසේ දතයුතු-(ප්‍රාර්ථනාකාරයෙන් ප්‍රවෘත්තවූ දුර්වල ලෝභය ඡන්දනාර්ථයෙන් ඡන්ද නම් වූයේ කැමතිවන හෙයින් කාම නම් වේ-

(අ) එවං කිලෙසකාමා වුත්තා, තෙ සබ්බෙපි සඞ්ගහිතා ඉච්චෙව දට්ඨබ්බා, එවං හි සති විවිච්චෙව කාමෙහීති වත්ථුකාමෙහිපි විවිච්චෙවාති අත්ථො යුජ්ජති, තෙන කායවිවෙකො වුත්තො හොති, විවිච්ච අකුසලෙහි ධම්මෙහීති-කිලෙස කාමෙහි සබ්බාකුසලෙහි වා විවිච්චාති අත්ථො යුජ්ජති, තෙන චිත්තවිවෙකො වුත්තො හොති, පුරිමෙන චෙත්ථ වත්ථුකාමෙහි විවෙකවචනතො එව කාමසුඛපරිච්චාගො, දුතියෙන කිලෙසකාමෙහි විවෙකවචනතො නෙක්ඛම්මසුඛපරිග්ගහො විභාවිතො හොති....

---

සෙස්සෙහිදු මෙම නයයි. එයට වඩා බලවත් ලෝභය *රඤ්ජනාර්ථ* යෙන් රාග නම් වේ. එයට වඩා බලවත් බහලරාගය ඡන්දරාග නම් වේ. නිමිත්තානුව්‍යඤ්ජනයන්ගේ සඞ්කල්පයට හේතුවූ ලෝභය සඞ්කල්ප නම. "**නිමිත්තානු ව්‍යඤ්ජනානි සඞ්කප්පෙති එතෙනාති සඞ්කප්පො තථා පවත්තො ලොභො**" එයට වඩා බලවත්වූයේ *රඤ්ජනාර්ථයෙන්* රාග නම් වේ. සඞ්කල්ප වශයෙන් ප්‍රවෘත්ත වෙසෙසින් බලවත්වූ ලෝභය සඞ්කල්පරාග නම් වේ.) ඉමෙ කිලෙසකාමාති වුච්චන්ති, මේ ක්ලේශ කාමයහයි කියනුලැබෙත්....

(අ) එවං කිලෙසකාමා වුත්තා, මෙසේ ක්ලේශකාමයෝ කියන ලදහුද; තෙ සබ්බෙපි, වස්තුකාමය ක්ලේශකාමය යන හැමදෙනම; සඞ්ගහිතා ඉච්චෙව, සඞ්ග්‍රහකරනලදහයිම; දට්ඨබ්බා, දතයුත්තාහයි; (මෙහි වස්තුකාමය ක්ලේශකාමයා විසින් කැමතිවනු ලබානුයි "**කාමියතීති කාමො**" යනු වෙයි. ක්ලේශකාමයා වස්තුකාමයකැමති වේනුයි "**කාමෙතීති කාමො**" යනු වේ.) එවං හි සති, මෙසේ (කාමයන් දෙදෙනාගේ සඞ්ග්‍රහයක්) ඇතිකල්හි; විවිච්චෙවකාමෙහීති, විවිච්චෙව කාමෙහි යන මෙහි; වත්ථුකාමෙහිපි විවිච්චෙවාති අත්ථො යුජ්ජති, වස්තුකාමයෙන් වෙන්වම යන අර්ථය යෙදේ; තෙන, ඒ වස්තුකාමයෙන්; කායවිවෙකො වුත්තො හොති, (පුත්‍රදාරාදි පරිග්‍රහවිවේකය හඟවන බැවින්) කායවිවේකය කියනලද වේ; විවිච්චඅකුසලෙහි ධම්මෙහීති, විවිච්ච අකුසලෙහි ධම්මෙහි යනුයෙහි; කිලෙසකාමෙහි, ක්ලේශකාමයන් කෙරෙන්; සබ්බාකුසලෙහි වා, සියලු අකුසලයන් කෙරෙන් හෝ; විවිච්චාති, වෙන්වයයි; අත්ථො යුජ්ජති, අර්ථ යෙදේ; තෙන, ඒ ක්ලේශකාමවිවේකයෙන්; චිත්තවිවෙකො වුත්තො හොති, චිත්තවිවේකය කියනලද වේ; එත්ථ, "විවිච්චෙවකාමෙහි විවිච්චඅකුසලෙහි ධම්මෙහි" යන පදවයෙහි;(මෙයින් නිර්ධාරිතවිවේකවයෙහි හෝ) පුරිමෙන, කායවිවේකයෙන්; වත්ථුකාමෙහි විවෙකවචනතො එව, වස්තුකාමයෙන් විවේකය කී හෙයින්ම; කාමසුඛපරිච්චාගො, කාම සුඛයාගේ පරිත්‍යාගය; (විභාවිතො හොති-යි යොදනු.) දුතියෙන, චිත්තවිවේකයෙන්; කිලෙසකාමෙහි විවෙක වචනතො, ක්ලේශ කාම යෙන් විවේකය කී හෙයින්; නෙක්ඛම්ම සුඛපරිග්ගහො, ධ්‍යානසුඛ

(අ) එවං වත්ථුකාමකිලෙසකාමවිවෙකවචනතොයෙව ච එතෙසං පඨමෙන සඞ්කිලෙසවත්ථුප්පහාණං, දුතියෙන සඞ්කිලෙසප්පහාණං, පඨමෙන ලොලභාවස්ස හෙතුපරිච්චාගො, දුතියෙන බාලභාවස්ස පඨමෙන ච පයොගසුද්ධි, දුතියෙන ආසයපොසනං විභාවිතං හොතීති ඤාතබ්බං. එසතාවනයො කාමෙහීති එත්ථ වුත්තකාමෙසු වත්ථුකාමපක්ඛෙ, කිලෙසකාමපක්ඛෙ පන ඡන්දොති ච රාගොති ච එවමාදීහි අනෙකභෙදො කාමච්ඡන්දොයෙව කාමොති අධිප්පෙතො, සො ච අකුසලපරියාපන්නොපි සමානො."තත්ථ කතමො කාමච්ඡන්දො කාමො"ති. ආදිනා නයෙන විභඞ්ගෙ ඣානපටිපක්ඛතො වා විසුං වුත්තො, කිලෙසකාමත්තා වා පුරිමපදෙ වුත්තො, අකුසලපරියාපන්නත්තා දුතියපදෙ....

---

පරිග්‍රහය; විභාවිතො හොති, පහළකරනලද්දේ වේ; (අකුශල ශබ්දයෙන් ඉදින් ක්ලෙශකාමය හෝ සියලු අකුශලයෝම හෝ ගෘහීතවූ නමුදු හැම පරිද්දෙන්ම ක්ලෙශකාමයෙන් විවේකය උක්තවේනුයි- දුතියෙන කිලෙසකාමෙහි විවෙකවචනතො-යි කීහයි දතයුතු....

(අ) එවං, මෙසේ; වත්ථුකාමකිලෙසකාමවිවෙකවචනතොයෙවච, වස්තුකාමක්ලෙශකාම විවේකවචනයෙන්ම; එතෙසං, යථොක්ත පදයන් දෙදෙනා අතුරෙන්; (නිර්ධාරණයෙහි ෂෂ්ඨියි.) පඨමෙන, කායවිවේකයෙන්; සඞ්කිලෙසවත්ථුප්පහාණං, තෘෂ්ණාදි සංක්ලෙශයන්ගේ උත්පත්තියට කාරණවූ වස්තුහුගේ ප්‍රහාණය; (විභාවිතං හොති යි-යොදනු.) දුතියෙන, චිත්තවිවේකයෙන්; (මතුයෙහිදු "පඨමෙන දුතියෙන" යන්නෙහි කී නියෙන්ම අර්ථයොදනු.) සඞ්කිලෙසප්පහාණං, සංක්ලෙශයාගේ ප්‍රහාණය; ලොලභාවස්ස හෙතුපරිච්චාගො, ඒ ඒ විෂයෙහි තෘෂ්ණොත්පාද සඞ්ඛ්‍යාත ලොලභාවයට හෙතුහුගේ පරිත්‍යාගය; (වස්තුකාමයාගේ පරිත්‍යාගය යන අර්ථයි—බාලභාවස්ස හෙතු පරිච්චාගො–යි යොදනු. මෙහි බාලභාව නම් අවිද්‍යායි. "දුච්චින්තිත චින්තී හොති"යනාදි හෝයි. එයට අයොනිසොමනස්කාරය හෝ සියලු අකුශලධර්මයෝ හෝ හෙතු නම් වෙති යි දතයුතු.) පයොගසුද්ධි, (කාමගුණාධිගමයට හෙතුවූ ප්‍රාණවධාදීන් අශුද්ධප්‍රයොගවන බැවින් තද්විවේකයෙන්) ප්‍රයොග ශුද්ධිය; (විභාවිත වේ යන අර්ථයි.) ආසය පොසනං, (තෘෂ්ණාසංක්ලෙශ විශොධනයෙන්ද විවර්තනාපනිශ්‍රය ධ්‍යාන සංවර්ධනයෙන්ද වන) අධ්‍යාශය විශොධනය; විභාවිතං හොති, විභාවිතවෙයි; ඤාතබ්බං, දතයුතු; එසතාවනයො, මේ නයතෙමේ; කාමෙහීති එත්ථ වුත්ත, කාමෙහි යන මේ පෙදෙහි කියනලද; කාමෙසු, කාමයන් කෙරෙහි; වත්ථුකාමපක්ඛෙ, වස්තුකාමපක්ෂයෙහිය; කිලෙසකාමපක්ඛෙ පන, ක්ලෙශකාමපක්ෂයෙහි වනාහි; ඡන්දොති ච, ඡන්දයයිදු; රාගොති ච, රාගයයිදු; එවමාදීහි, මේ ආදී නයින්; අනෙක භෙදො, (කාමාසව කාමරාග සංයොජනාදි වශයෙන්ද රූපතණ්හාදි වශයෙන්ද) අනෙකප්‍රභෙද ඇති; කාමච්ඡන්දොයෙව, කාමස්වභාවවූ

(අ) අනෙකභෙදතො වස්ස කාමතොති, අවත්වා කාමෙහීති වුත්තං, අඤ්ඤෙසම්පි ච ධම්මානං අකුසලභාවෙ විජ්ජමානෙ "තත්ථ කතමෙ අකුසලා ධම්මා කාමච්ඡන්දො"ති ආදිනා නයෙන විභඞ්ගෙ උපරිඣානඞ්ග පච්චනීක පටිපක්ඛභාවදස්සනතො නීවරණානෙව වුත්තානි. නීවරණානි හි ඣානඞ්ගපච්චනීකානි, තෙසං ඣානඞ්ගානෙව පටිපක්ඛානි විද්ධංසකානි විඝාතකානීති වුත්තං හොති, තථා හි- "සමාධි කාමච්ඡන්දස්ස පටිපක්ඛො, පීති ව්‍යාපාදස්ස, විතක්කො ථිනමිද්ධස්ස, සුඛං උද්ධච්චකුක්කුච්චස්ස, විචාරො විචිකිච්ඡායා"ති- පෙටකෙ වුත්තං෴

---

ඡන්දය; කාමොති අධිප්පෙතො, කාමයයි අභිමතයි; සොච, හෙද; අකුසලපරියාපන්නොපි සමානො, අකුසලයන් කෙරෙහි ඇතුළත් වූයේද; තත්ථ෴පෙ෴කතමො කාමච්ඡන්දො කාමොති"යනාදි නයින්; විභඞ්ග, ධ්‍යානවිභඞ්ගයෙහි; ඣානපටිපක්ඛතො වා, ධ්‍යානයට ප්‍රතිපක්ෂබව හෙයින් හෝ; විසුං වුත්තො, (අකුශල සාමාන්‍යයෙන් නොගෙන) වෙන්කොට ස්වරූපයෙන් ගන්නාලදී; කිලෙසකාමත්ත; වා, ක්ලෙශකාම හෙයින් හෝ; පුරිමපදෙ වුත්තො, පූර්වපදයෙහි කියන ලද; අකුසලපරියාපන්නත්තා දුතියපදෙ, අකුසලයන් කෙරෙහි පර්යාපන්න බැවින් දෙවන පෙදෙහි කියනලදී෴

(අ) අනෙකභෙදත්තා වස්ස, ඒ කාමයාගේ අනෙකභෙද ඇති හෙයින්; කාමතොති අවත්වා, කාමතොයි (එකවචනයෙන්) නොකියා, කාමෙහීති වුත්තං, "කාමෙහි" යි බහුවචනයෙන් කියනලදී, අඤ්ඤෙසම්පි ච ධම්මානං, දෘෂ්ටිමානාදී අන්‍යධර්මයන්ගේද තත් සම්ප්‍රයුක්තස්පර්ශාදීන්ගේද; අකුසලභාවෙ විජ්ජමානෙ, අකුසලබව ඇතිකල්හි; තත්ථ෴පෙ෴කාමච්ඡන්දොති ආදිනා නයෙන, තත්ථ කතමෙ අකුසලා ධම්මා කාමච්ඡන්දො යනාදි නයින්; විභඞ්ග, විභඞ්ගයෙහි; උපරිඣානඞ්ග, මතුයෙහි කියනලද ධ්‍යානාඞ්ගයන්; පච්චනීකා තමන්ට ප්‍රත්‍යනීක නීවරණධර්මයන්ට; පටිපක්ඛභාවදස්සනතො; ප්‍රතිපක්ෂභාවය දක්වන හෙයින්; (ධ්‍යානාඞ්ගයන් තමන්ට ප්‍රතිපක්ෂවූ නීවරණධර්මයන්ට ධ්‍යානාඞ්ගධර්මයන්ගේ ප්‍රතිපක්ෂභාවය දක්වන හෙයින යන අර්ථයි.) නීවරණානෙව වුත්තානි, ධ්‍යානාඞ්ගප්‍රතිපක්ෂවූ නීවරණයෝම කියනලදහු; නීවරණානි හි, නීවරණයෝ වනාහි; ඣානඞ්ගපච්චනීකානි, ධ්‍යානාඞ්ගයන්ගේ ප්‍රවෘත්තිනිවාරණය කරන හෙයින් ඔවුන්ට ප්‍රත්‍යනීකයෝයි; තෙසං, ඒ නීවරණයන්ට; ඣානඞ්ගානෙව පටිපක්ඛානි, ධ්‍යානාඞ්ගයෝම ප්‍රතිපක්ෂයෝයි; විද්ධංසකානි, විනාසකයෝයි; විඝාතකානීති, විහිංසකයනයි; වුත්තං හොති, කියනලද වේ; තථා හි, එසේමැයි; සමාධි කාමච්ඡන්දස්ස පටිපක්ඛො, (රාගප්‍රණිධියට සෘජුප්‍රතිපක්ෂ බැවින්ද නානාලම්බනයෙන් පොළොඹවන ලදුව පරිභ්‍රමනය කරන චිත්තයා සමාහිත කරන බැවින්ද) සමාධිය කාමච්ඡන්දයට ප්‍රතිපක්ෂයි, පීති ව්‍යාපාදස්ස, (ව්‍යාපාදයෙන්

(අ) එවමෙත්ථ විවිච්චෙව කාමෙහීති ඉමිනා කාමච්ඡන්දස්ස වික්ඛම්භන විවෙකො වුත්තො හොති, විවිච්ච අකුසලෙහි ධම්මෙහීති ඉමිනා පඤ්චන්නම්පි නීවරණානං, අගහිතග්ගහණෙන පන පඨමෙන කාමච්ඡන්දස්ස, දුතියෙන සෙසනීවරණානං, තථා පඨමෙන තීසු අකුසලමූලෙසු පඤ්චකාමගුණභෙදවිසයස්ස ලොභස්ස දුතියෙන ආඝාතවත්ථුභෙදාදිවිසයානං දොසමොහානං, ඔඝාදීසු වා ධම්මෙසු පඨමෙන කාමොඝකාමයොගකාමාසවකාමුපාදාන අභිජ්ඣාකායගන්ථ කාමරාග සංයොජනානං, දුතියෙන අවසෙස ඔඝයොගාසවඋපාදානගන්ථ සංයොජනානං, පඨමෙන ච තණ්හාය තංසම්පයුත්තකානඤ්ච, දුතියෙන

---

ගැටෙන සිත්හු පිණවනුව තමා ප්‍රමොද්‍යය හා සමාන යොගක්ෂෙම ඇති බැවින්) ප්‍රීතිය ව්‍යාපාදයට ප්‍රතිපක්ෂයි; විතක්කො ථීනමිද්ධස්ස (යොනිසොසඞ්කප්ප වශයෙන් සවිප්ඵාරකව පවත්නෙන්) විතර්කය ථීනමිද්ධයට ප්‍රතිපක්ෂ වේ; සුඛං, ව්‍යුපශාන්ත සීතල ස්වභාව ඇති සුඛය; උද්ධච්චකුක්කුච්චස්ස, (අව්‍යුපශම අනුතාපස්වභාව ඇති) උද්ධච්ච කුක්කුච්චයට ප්‍රතිපක්ෂ වේ; විචාරො විචිකිච්ඡායාති, (අරමුණෙහි අනුමාර්ජන වශයෙන් ප්‍රඥ ප්‍රතිරූප ස්වභාව ඇති හෙයින්) විචාරය විචිකිත්සාවට ප්‍රතිපක්ෂවේයයි; පෙටකෙ වුත්තං, පෙටකයෙහි කියන ලදී෴

(අ) එවං, මෙසේ; එත්ථ, මේ පදවයෙහි; විවි ෴ පෙ ෴ ඉමිනා, "විවිච්චෙව කාමෙහි"යන මෙයින්; කාමච්ඡන්දස්ස, කාමච්ඡන්දයාගේ; වික්ඛම්භනවිවෙකො වුත්තො හොති, විෂ්කම්භනවිවෙකය කියනලද්දේ වේ; 'විවි෴පෙ෴අකුසලෙහි ධම්මෙහි' යන මෙයින්; පඤ්චන්නම්පි නීවරණානං, පඤ්චනීවරණයන්ගේ; අගහිතග්ගහණෙන පන, නොගත්තහුගේ ගැණීමෙන් වනාහි; පඨමෙන, පළමුපෙදෙන්; කාමච්ඡන්දස්ස, කාමච්ඡන්දයාගේ; ("වික්ඛම්භන විවෙකො වුත්තො හොති"යි යොදනු. සෙසු පෙදෙහිදු මෙම නයයි.) දුතියෙන, දෙවනපෙදෙන්; සෙස නීවරණානං, සෙසු නීවරණයන්ගේ; තථා, එසේම;-තීසු අකුසල මූලෙසු, තුන් අකුසලමූලයන් කෙරෙහි; පඤ්චකාමගුණභෙදවිසයස්ස, රූපාදී පඤ්චකාමගුණ විශෙෂ විෂයවූ; ලොභස්ස, ලොභයාගේද;- "ආඝාතවත්ථුභෙදාදි විසයානං දොසමොහානං" යන්නෙහි; (ව්‍යාපාද විවෙකවචනයෙන් "අනත්ථං මෙ අචරි"යනාදී) ආඝාතවස්තු භෙදාදි විෂයවූ ද්වෙෂයාගේ;(ථීනමිද්ධාදි විවෙක වචනයෙන් ප්‍රච්ඡාදන වශයෙන් දුඃඛාදී පූර්වාන්තාදි භෙදවිෂයවූ) තදෙකස්ථ මොහයාගේද; (විෂ්කම්භන විවෙක උක්තයයි අර්ථ දතයුතු.)ඔඝාදීසු වා ධම්මෙසු, ඔඝාදි ධර්මයන් කෙරෙහි හෝ; පඨමෙන, ප්‍රථමවචනයෙන්; කාමොඝ, කාමොඝය; ෴පෙ෴කාමරාගසංයොජනානං,කාමරාගසංයොජනයයන මොවුන්ගේ; දුතියෙන, දෙවනවචනයෙන්; අවසෙසඔඝයොගාසව උපාදානගන්ථ සංයොජනානං, කාමොඝාදීන් කෙරෙන් පිටත් ඔඝය යොගය ආසවය උපාදානය ගන්ථය යන මොවුන්ගේ; තණ්හාය, තෘෂ්ණාවගේද;

අවිජ්ජාය තං සම්පයුත්තකානඤ්ච. අපිච:-පඨමෙන ලොභසම්පයුත්ත අට්ඨචිත්තුප්පාදානං, දුතියෙන සෙසානං චතුන්නං අකුසලචිත්තුප්පාදානං වික්ඛම්භනවිවෙකො වුත්තො හොතීති වෙදිතබ්බො. අයං තාව විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහීති එත්ථ අත්ථප්පකාසනා. එත්තාවතා පඨමස්ස ඣානස්ස පහාණඞ්ගං දස්සෙත්වා ඉදානි සම්පයොගඞ්ගං දස්සෙතුං **සවිතක්කං සවිචාරන්ති** ආදිවුත්තං...

(අ) තත්ථ විතක්කනං විතක්කො, ඌහනන්ති වුත්තං හොති, සවායං ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපනලක්ඛණො, ආහනනපරියාහනනරසො. තථා හි තෙන යොගාවචරො ආරම්මණං විතක්කාහතං විතක්කපරියාහතං කරොතීති වුච්චති. ආරම්මණෙ චිත්තස්ස ආනයනපච්චුපට්ඨානො. විචරණං විචාරො, අනුසඤ්චරණන්ති වුත්තං හොති.

---

තං සම්පයුත්තකානඤ්ච, ඒ තෘෂ්ණාසම්ප්‍රයුක්තයන්ගේද;-අවිජ්ජාය, අවිද්‍යාවගේද; තං සම්පයුත්තකානඤ්ච, ඒ අවිද්‍යාසම්ප්‍රයුක්තයන්ගේද; අපි ච, අතිකෙකුදු; පඨමෙන, පළමුපෙදෙන්; ලොභසම්පයුත්තඅට්ඨචිත්තුප්පාදානං, ලොභසම්ප්‍රයුක්ත අෂ්ටචිත්තොත්පාදයන්ගේද; දුතියෙන, දෙවනවචනයෙන්; සෙසානං චතුන්නං අකුසලචිත්තුප්පාදානං, (ද්වෙෂසම්ප්‍රයුක්ත දෙසිතය මොහමූල දෙසිතය යන) සෙසු සතර අකුසල චිත්තොත්පාදයන්ගේ;වික්ඛම්භනවිවෙකො වුත්තො හොතීති, විෂ්කම්භනවිවෙකය උක්තවෙයි; වෙදිතබ්බො, දතයුතු; අයං...පෙ... එත්ථ අත්ථප්පකාසනා, මෙහි අර්ථප්‍රකාශනායි; එත්තාවතා, මෙපමණෙකින්; පඨමස්ස ඣානස්ස, ප්‍රථමධ්‍යානයාගේ; පහාණඞ්ගං දස්සෙත්වා, ප්‍රහාණාඞ්ග දක්වා; ඉදානි, දැන්; සම්පයොගඞ්ගං දස්සෙතුං, සම්ප්‍රයොගාඞ්ගයන් දක්වනු පිණිස; සවිතක්කං සවිචාරන්ති ආදි වුත්තං, "සවිතක්කං සවිචාරං"යනාදි කියනලදී...

(අ) තත්ථ, එහි; විතක්කනං, විතර්කනය; විතක්කො, විතර්කනම්; ඌහනන්ති වුත්තං හොති, සිත්හු අරමුණෙහි එළවීමයයි කී නියායි; (ටීකායෙහි **ඊදිසම්දනන්ති ආරම්මණස්ස පරිකප්පනං** යි කීහු.) සවායං, ඒ විතර්කයතෙමේ; ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපනලක්ඛණො, අරමුණෙහි සිත්හු තමාගේ ආනුභාවයෙන් නගන බැවින් ආරොපනය සවභාව කොට ඇත්තේයි; (විතර්කය නැති දෙපස්විනැණුන් හා විතීයධ්‍යාන ආදීහු කෙසේ අරමුණට නැගෙද්ද යත්? දෙපස්විනැණහු විතර්කය නැතිහොතුදු වසත්වාලම්බනයන්ගේ සඞ්ඝට්ටනය බලවත්. හෙයින් නැගෙති විතීයධ්‍යාන ආදීහු යටයට භාවනාබලයෙන් නැගෙත් නොහොත්: පරිචයබලයෙන් අවිතර්කයද අරමුණට නැගෙත් යෙත්. මෙම කීහ ටීකායෙහි "**විතක්කස්ස හි සන්තානෙ අභිණ්හං පවත්තස්ස වසෙන චිත්තස්ස ආරම්මණාභිරූහණං චිරපරිචිතං තෙන තං කදාචි විතක්කෙන විනාපි තත්ථ පවත්තතෙව යථා තං ඤාණසහිතං හුත්වා සම්මසනවසෙන චිරපරිචිතං කදාචි ඤාණරහිතම්පි සම්මසනවසෙන පවත්තන්ති යථා වා හුත්වා පවත්තනං තං**

(අ) ස්වායං ආරම්මණානුමජ්ජනලක්ඛණො, තත්ථ සහජාතානුයොජනරසො, චිත්තස්ස අනුප්පබන්ධනපච්චුපට්ඨානො, සන්තෙපි ච නෙසං කත්ථචි අවිප්පයොගෙ ඔළාරිකට්ඨෙන පුබ්බඞ්ගමට්ඨෙන ච ඝණ්ටාභිඝාතො විය අභිනිරොපනට්ඨෙන ච චෙතසො පඨමාභිනිපාතො විතක්කො, සුඛුමට්ඨෙන අනුමජ්ජනසභාවෙන ච ඝණ්ටානුරවො විය අනුප්පබන්ධො විචාරො. විප්ඵාරවා චෙත්ථ විතක්කො පඨමුප්පත්තිකාලෙ පරිප්ඵන්දනභූතො චිත්තස්ස, ආකාසෙ උප්පතිතුකාමස්ස

---

**සබ්බසො කිලෙසරහිතම්පි පරිචයෙන කිලෙසවාසනා වසෙන පවත්තන්ති එවං සම්ඹදමිදං දට්ඨබ්බං**"ති) ආහනන පරියාහනනරසො, අරමුණෙහි පහරණ වෙසෙසින් පහරණ කෘත්‍ය ඇත්තේයි; තථා හි, එසේමැතු; තෙන, ඒ ආහනන පරියාහනනයෙන්; යොගාවචරො, යොගාවචරතෙමෙ; ආරම්මණං, අරමුණ; විතක්කාහතං, විතර්කයෙන් පහරණ ලද්ද; විතක්කපරියාහතං, විතර්කයෙන් විශෙෂ කොට පහරණලද්ද; කරොතීති, කෙරෙයි; වුච්චති, කියනුලැබේ; ආරම්මණෙ චිත්තස්ස ආනයන පච්චුපට්ඨානො, සිත්හු අරමුණෙහි එළවනු සවභාව විසින් වැටහීම් ඇත්තේයි; විචරණං, හැසිරීම; විචාරො, විචාරනම්; අනුසඤ්චරණන්ති වුත්තං හොති, අනුව හැසිරීම කී නියායි.

(අ) ස්වායං, ඒ මේ විචාරය තෙමේ; ආරම්මණානුමජ්ජනලක්ඛණො, අරමුණු පිරිමදින සවභාව ඇත්තේයි; තත්ථ, ඒ අරමුණෙහි; සහජාතානුයොජනරසො, සහජාතධර්මයන්ගේ (අනුවිචරණ වශයෙන්) යෙදීම කෘත්‍ය කොට ඇත්තේයි; චිත්තස්ස අනුප්පබන්ධනපච්චුපට්ඨානො, අරමුණෙහි සිත්හුගේ නොසිදීමක් මෙන් ප්‍රවෘත්තිය වැටහීම් කොට ඇත්තේයි; නෙසං, ඒ විතක්කවිචාර දෙදෙනාගේ; කත්ථචි, සවිතක්ක සවිචාර චිත්තොත්පාදයෙහි; අවිප්පයොගෙ සන්තෙපි, නොවියෝව පැවැත්මක් ඇති කල්හිදු; ඔළාරිකට්ඨෙන, (විචාරයට වඩා) ප්‍රකට බැවිනුදු; පුබ්බඞ්ගමට්ඨෙන ච, (තමා බෙලෙන් සිත්හු අරමුණට නැඟෙනු කොට විචාරයහට) පූර්වඞ්ගම හෙයිනුදු; ඝණ්ටාභිඝාතො විය, ඝණ්ටාභිඝාත ශබ්දමෙන් වෙයි; අභිනිරොපනට්ඨෙන ච, අභිනිරොපනය කරන බැවිනුදු; චෙතසො පඨමාභිනිපාතො, සිත්හු පළමු කොට අරමුණෙහි හීම; විතක්කො, විතර්කනම්; (විතර්කය හා හකව ප්‍රකට තැන් ගෙන කීහු–යම්සේ ඝණ්ටාභිඝාත ශබ්දය ප්‍රථමාභිනිපාත වේද එසේම අරමුණෙහි අභිනිරොපනය කරන හෙයින් විතර්කය සිත්හු ප්‍රථමාභිනිපාතවේ; "**අභිඝාතගහණෙන චෙත්ථ අභිඝාතජො සද්දො ගහිතො**"යනු ටීකායි.) සුඛුමට්ඨෙන, සූක්ෂ්මහෙයින්ද; අනුමජ්ජනසභාවෙනච, ඒ අනුසඤ්චරණසවභාව හෙයින්ද; ඝණ්ටානුරවො විය, ඝණ්ටායෙහි අනුරාවය මෙන්ද; අනුප්පබන්ධො විචාරො, අනුව වැටෙන්නේ විචාරනම; (විචාරයා ප්‍රකටතැන් ගෙන කීහු.) එත්ථ, මේ දෙදෙනා කෙරෙහි; විප්ඵාරවා, චලනවත්වූයේ; (පැතිරීම් ඇතියේ යනු සන්න්‍යයි.) පඨමුප්පත්තිකාලෙ පරිප්ඵන්දනභූතො චිත්තස්ස, චිත්තයාගේ ප්‍රථමොත්පත්තිකාලයෙහි පොපී ඇති බඳුවූයේ; විතක්කො,

පක්ඛිනො පක්ඛවික්ඛෙපො විය පදුමාභිමුඛපාතො විය ච ගන්ධානුබද්ධචෙතසො භමරස්ස, සන්තවුත්ති විචාරො නාතිපරිප්ඵන්දනභාවො චිත්තස්ස, ආකාසෙ උප්පතිතස්ස පක්ඛිනො පක්ඛප්පසාරණං විය, පරිබ්භමණං විය ච පදුමාභිමුඛපතිතස්ස භමරස්ස පදුමස්ස උපරිභාගෙ, දුකනිපාතට්ඨකථායම්පන ආකාසෙ ගච්ඡතො මහාසකුණස්ස උභොහි පක්ඛෙහි වාතං ගාහාපෙත්වා පක්ඛෙ සන්නිසීදාපෙත්වා ගමනං විය ආරම්මණෙ චෙතසො අභිනිරොපනභාවෙන පවත්තො විතක්කො, සො හි එකග්ගො හුත්වා අප්පෙති, වාතගහණත්ථං පක්ඛෙ ඵන්දාපයමානස්ස ගමනං විය අනුමජ්ජනභාවෙන පවත්තො විචාරො, සො හි ආරම්මණං අනුමජ්ජතීති වුත්තං. තං අනුපබන්ධෙන පවත්තියං යුජ්ජති. සො පන තෙසං විසෙසො පඨම දුතිය ජ්ඣානෙසු පාකටො හොති. අපිච:–මලග්ගහිතං කංසභාජනං එකෙන

---

විතර්කනම්;ආකාසෙ උප්පතිතුකාමස්ස පක්ඛිනො,ආකාශයෙහි නැඟෙනු කැමති ක්ෂුද්‍රපක්ෂිහුගේ; පක්ඛවික්ඛෙපො විය, පියාපැහැරමෙන්ද; ගන්ධානුබද්ධචෙතසො භමරස්ස, ගන්ධයෙහි අනුබද්ධවූ සිත් ඇති බමර හුගේ; පදුමාභිමුඛපාතො විය ච, පියුමට අභිමුඛව හීම මෙන්ද; ("විප්ඵාරවා පඨමුප්පත්තිකාලෙ පරිප්ඵන්දභූතො චිත්තස්ස විතක්කො"යි යොදනු.) සන්තවුත්ති, ශාන්තවෘත්ති ඇත්තේ; නාතිපරිප්ඵන්දභාවො චිත්තස්ස, සිත්හුගේ අතිශයෙන්ම පොපි නැතිබව; විචාරො, විචාර නම්; ආකාසෙ, අහස; උප්පතිතස්ස පක්ඛිනො, නැඟීපක්ෂිහුගේ; පක්ඛප්පසාරණං විය, පියාපැහැරමෙන්ද; පදුමාභිමුඛපතිතස්ස, පද්මයට අභිමුඛව හුණු; භමරස්ස, බමරහුගේ; පදුමස්ස උපරිභාගෙ, පියුමෙහි මතුභාගයෙහි; පරිබ්භමණං විය ච, පරිභ්‍රමණයක් මෙන්ද; ("සන්තවුත්තිතා නාතිපරිප්ඵන්දභාවො චිත්තස්ස විචාරො"යි යොදනු.) දුකනිපාතට්ඨකථායම්පන, දුකනිපාත අටුවායෙහි වනාහි; ආකාසෙ ගච්ඡතො, අහස යන්නාවූ; මහාසකුණස්ස, ගිජුලිහිණියාගේ; උභොහි පක්ඛෙහි, දෙපියාවෙන්; වාතං ගාහාපෙත්වා, වාතය ගන්වා; පක්ඛෙ සන්නිසීදාපෙත්වා, දෙපියාව සන්හිඳුවාගෙන; ගමනං විය, ගමනමෙන්; ආරම්මණෙ චෙතසො අභිනිරොපනභාවෙන පවත්තො විතක්කො, සිත්හු අරමුණෙහි නඟන බැවින් ප්‍රවෘත්තවූයේ විතර්කයය; [සො හි, හෙතෙම;එකග්ගො හුත්වා,එකඟවී;අප්පෙති,පමුණුවයි;]වාතගහණත්ථං, වාතය ගන්නා පිණිස; පක්ඛෙ ඵන්දාපයමානස්ස ගමනං විය, පියාදෙක සොලවන්නහුගේ ගමන මෙන්; අනුමජ්ජනභාවෙන පවත්තො විචාරොති, අරමුණු පිරිමදිනා බැවින් ප්‍රවෘත්තවූයේ විචාරයයි; [සො හි, ඒ විචාරයතෙමේ; ආරම්මණං අනුමජ්ජතීති, අරමුණු පිරීම දනේයයි;]වුත්තං, කියනලදී; (කුඩා ලිහිණියාගේ පියාපෙළීම බඳුයයි පොපි ඇතිසෙයින් විතර්කය ඖදාරිකබව කීහු–මහලිහිණියාගේ පියා සන්හිඳුවා යන ගමන වැන්නැයි වෙග ඇති බැවින් විතර්කය ඖදාරික සේ කීහු-කුඩා ලිහිණියාගේ පියාපැහැරීම බඳුයයි මඳවෙග ඇති

හත්ථෙන දළ්හං ගහෙත්වා ඉතරෙන හත්ථෙන චුණ්ණතෙලවාලණ්ඩුපකෙන පරිමජ්ජන්තස්ස ගාළ්හං ගහණහත්ථො[1] විය විතක්කො, පරිමජ්ජනහත්ථො විය විචාරො, තථා කුම්භකාරස්ස දණ්ඩප්පහාරෙන චක්කං භමයිත්වා භාජනං කරොන්තස්ස උප්පීළනහත්ථො විය විතක්කො, ඉතො චිතො ච සංසරණහත්ථො විය විචාරො, තථා මණ්ඩලං කරොන්තස්ස මජ්ඣෙ සන්නිරුම්භිත්වා ඨිතකණ්ටකො විය අභිනිරොපනො විතක්කො, බහිපරිබ්භමණකණ්ටකො විය අනුමජ්ජනො විචාරො, ඉති ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන සහවත්තන්ති

සෙයින් විචාරය ශාන්තසේම කිහු–මහ ලිහිණියාගේ පියා පොළම්න් යන ගමන මෙනැයි මඳ පොපි ඇතිසෙයින් විචාරයාගේ ශාන්ත සේම කිහු.) තං, හේ මහාසකුණදෘෂ්ටාන්තය; අනුප්පබන්ධෙන පවත්තියං හි, (උපචාරයෙහිවත් අර්පණාවෙහිවත්) සන්තාන විසින් පවත්නා කල්හි; යුජ්ජති, යෙදේ; (එහි විතර්කය නිශ්චලව අරමුණට වදනාක් මෙන් පවතියි. ප්‍රථමාභිනිපාතයෙහි එසේ නොවෙයි දතයුතු.) තෙසං, ඔවුන්ගේ; සො පන විසෙසො, ඒ විශෙෂය වනාහි; පඨමදුතියජ්ඣානෙසු පාකටො හොති, ප්‍රථම ද්විතීය ධ්‍යානයෙහි ප්‍රකට්වේ; (විතර්කයාගේ අභිනිරොපනාකාර සඞ්ඛ්‍යාත විශෙෂය ප්‍රථමධ්‍යානයෙහි ප්‍රකටවෙයි විතර්කයාගේ අභාවයෙන් පඤ්චකනයෙහි ද්විතීයධ්‍යානයෙහි විචාරයාගේ අනුමර්ජනාකාර විශෙෂය ප්‍රකට වේ.) අපි ච, අනිකෙකුදු; මලග්ගහිතං කංසභාජනං, මලහුන් ලොහොවලඳ; එකෙන හත්ථෙන දළ්හං ගහෙත්වා, එක් අතකින් තරවාගෙන; ඉතරෙන හත්ථෙන, අනික් අතින්; චුණ්ණතෙල වාලණ්ඩුපකෙන, සුණු තෙලින් යුත් එළුලොම් ආදීන් කළ ලොම් සුඹුළුවෙන්; පරිමජ්ජන්තස්ස, මදනහුගේ; ගාළ්හං ගහණහත්ථො විය, තරවාගත් අතබඳුවූයේ; විතක්කො, විතර්කයයි; පරිමජ්ජනහත්ථො විය, මදනා අතබඳුවූයේ; විචාරො, විචාරයයි; තථා, එසේම; කුම්භකාරස්ස, කුඹල්හු; දණ්ඩප්පහාරෙන චක්කං භමයිත්වා, දඬුපහරින් සකබමමවා; භාජනං කරොන්තස්ස, භාජනය කරනුහුගේ; උප්පීළන හත්ථො විය විතක්කො, මැටිපිඩ පෙළාගත් අත්බඳුවූයේ විතර්කයයි; ඉතො චිතොච, ඔබ්මොබ; සංසරණහත්ථො විය විචාරො, මැටිපිඩ ඔබින්ඔබ යන අත්බඳුවූයේ විචාරයයි; තථා, එසේම; මණ්ඩලං කරොන්තස්ස, (කංසභාජනාදියෙහි) වටරෙබා හෙළන්නහුගේ; (සැත්හි මැඩිලි හෙළනුවා යනු සිලිසන්නයි.) මජ්ඣෙ, මැද; සන්නිරුම්භිත්වා ඨිතකණ්ටකො විය, ඔබා ගෙන සිටි කටුව බඳුවූයේ; අභිනිරොපනො විතක්කො, අභිනිරොපන ලක්ෂණය විතර්කයයි; බහිපරිබ්භමණකණ්ටකො විය, පිටත්හි කවගසන කටුව බඳුවූයේ; අනුමජ්ජනො විචාරො, අනුමාර්ජනලක්ෂණ විචාරයයි; ඉති, මෙසේ; ඉමිනා ච විතක්කෙන, මේ උක්තලක්ෂණවිතර්කය හා; ඉමිනාච විචාරෙන, මේ විචාරයහාද; සහවත්තන්ති, සමගපවතී; රුක්ඛො

1. දළ්හගහණහත්ථො–ත්‍රි. මු.

රුක්ඛො විය පුප්ඵඵලෙනවාති ඉදං ඣානං සවිතක්කං සවිචාරන්ති වුච්චති. "විභඞ්ගෙ පන ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන උපෙතො හොති සමුපෙතො"ති ආදිනා නයෙන පුග්ගලාධිට්ඨානා දෙසනා කතා, අත්ථො පන තත්‍රාපි එවමෙව දට්ඨබ්බො.

(අ) **විවෙකජන්ති** එත්ථ-විවිත්ති විවෙකො, නීවරණවිගමොති අත්ථො, විවිත්තොති වා විවෙකො, නීවරණවිවිත්තො, ඣානසම්පයුත්තධම්මරාසීති අත්ථො, තස්මා විවෙකා-තස්මිං වා විවෙකෙ ජාතන්ති විවෙකජං. **පීතිසුඛන්ති**-පීනයතීති පීති සා සම්පියායනලක්ඛණා, කායචිත්තපීනනරසා, ඵරණරසා වා. ඔදග්‍ය පච්චුපට්ඨානා, සා පනෙසා ඛුද්දිකාපීති

---

විය පුප්ඵඵලෙන වාති, පුෂ්ප හා ඵල හා සමග පවත්නා වෘක්ෂය මෙනැයි; ඉදං ඣානං, මේ ධ්‍යානය; සවිතක්කං සවිචාරන්ති වුච්චති, සවිතර්කය සවිචාරයයි කියනු ලැබේ; (යම්සේ පුෂ්ප ශාඛාදි අවයවයෙන් විනිර්මුක්තව අවිද්‍යමානදවූ වෘක්ෂය සපුෂ්පඵලයයි කියනු ලැබේද මෙසේම විතර්කාදි අඞ්ගවිනිර්මුක්තව අවිද්‍යමානදවූ ධ්‍යානය සවිතර්කය සවිචාරය යි ව්‍යවහාර කරනුලැබෙයි හඟවන පිණිස "රුක්ඛො විය" යනාදි කථිතයයි දතයුතු.) විභඞ්ගෙ පන, විභඞ්ගයෙහි වනාහි; ඉමිනා-පෙ-නයෙන, මේ ආදී නයින්; පුග්ගලාධිට්ඨානා දෙසනා කතා (ධ්‍යාන භාවනා පුද්ගලවශයෙන් දෙසියයුතු බැවින්) පුද්ගලාධිෂ්ඨාන කොට දෙසනාකරන ලද්දී; අත්ථො පන, අර්ථය වනාහි; තත්‍රාපි, ඒ විභඞ්ග යෙහිදු; එවමෙව දට්ඨබ්බො) යම්සේ "ඉමිනා ච විතක්කෙන ඉමිනා ච විචාරෙන" යනාදි ධර්මවශයෙන් කියන ලදද) මෙසේම දතයුතු; (පරමාර්ථයෙන් පුද්ගලයකු නැති බැවින යන අභිප්‍රායයි-නොහොත් ධ්‍යානසමන්විතයාගේ විතර්කවිචාරය සමන්විතබව දක්වීමෙන් ධ්‍යානයාගේම සවිතර්කසවිචාරබව උක්තහෙයිනැයි මෙසේ හෝ අර්ථ දතයුතු.

(අ) විවෙකජන්ති එත්ථ "විවෙකජං" යනමෙහි; විවිත්ති, වෙන්වීම; විවෙකො, විවෙකනම්; නීවරණ විගමොති අත්ථො, නීවරණධර්මයන්ගේ පහවීමය යන අර්ථයි; විවිත්තොති වා විවෙකො, පහවීනුයි හෝ විවෙකනම්; නීවරණවිවිත්තො, නීවරණධර්මයන්කෙරෙන් පහවූ; ඣානසම්පයුත්තධම්මරාසීති අත්ථො, ධ්‍යාන හා සම්ප්‍රයුක්තධර්මරාශිය යන අර්ථයි; තස්මා විවෙකා, (නීවරණ විගතසඞ්ඛ්‍යාත) ඒ විවෙකය හෙතුකොටගෙන; තස්මිං වා විවෙකෙ, (නීවරණයන් කෙරෙන් පහවූධර්ම රාශිසඞ්ඛ්‍යාත) ඒ විවෙකයෙහි හෝ; ජාතන්ති, උපන්නුයි; විවෙකජං, විවෙකජනම් වේ; "පීතිසුඛං" යනු යෙහි; පීනයතීති, (කායචිත්තය) පිනවානුයි; පීති, ප්‍රීතිනම්වේ; සා, හෝතොමෝ; සම්පියායනලක්ඛණා, අරමුණු කැමින්කොට දක්නා සවභාව ඇත්තී යි; කායචිත්තපීනනරසා, කාය චිත්තදෙදෙනා පිනවන කෘත්‍ය ඇත්තී යි; ඵරණරසා වා

ඛණිකාපීති ඔක්කන්තිකාපීති උබ්බෙගාපීති ඵරණාපීතීති පඤ්චවිධා හොති, තත්ථ ඛුද්දිකාපීති සරීරෙ ලොමහංසනමත්තමෙව කාතුං සක්කොති, ඛණිකාපීති ඛණෙ ඛණෙ විජ්ජුප්පාතසදිසා හොති, ඔක්කන්තිකාපීති සමුද්දතීරං වීචි විය කායං ඔක්කමිත්වා ඔක්කමිත්වා භිජ්ජති, උබ්බෙගාපීති බලවතී හොති, කායං උද්ධග්ගං කත්වා ආකාසෙ ලඞ්ඝාපනප්පමාණප්පත්තා, තථා හි-පුණ්ණගල්ලකවාසී මහාතිස්සත්ථෙරො පුණ්ණමදිවසෙ සායං චෙතියඞ්ගණං ගන්ත්වා චන්දාලොකං දිස්වා මහාචෙතියාභිමුඛො හුත්වා ඉමාය වත වෙලාය චතස්සො පරිසා මහාචෙතියං වන්දන්තීති පකතියා දිට්ඨාරම්මණවසෙන බුද්ධාරම්මණං උබ්බෙගාපීතිං උප්පාදෙත්වා සුධාතලෙ පහටචිත්‍රගෙණ්ඩුකො[1] විය ආකාසෙ උප්පතිත්වා මහාචෙතියඞ්ගණෙයෙව පතිට්ඨාසි. තථා ගිරිකණ්ඩක

---

පැතිරෙන කෘත්‍ය ඇත්තී හෝයි;(උපන්තැනින් කෙසගක්[2] පමණතැන් සඞ්ක්‍රමණයක් නැද්ද ආත්මජරූපකිරීමෙන් තෙමේද පැතිරෙනු නම්වී.) ඔදග්‍යපච්චුපට්ඨානා, උදග්‍රබව වැටහීම්කොට ඇත්තීයි; සාප තෙසා;ඒ ප්‍රීති තොමෝ;—පෙ—සරීරෙ ලොමහංසනමත්තමෙව කාතුං සක්කොති, ශරීරයෙහි රෝමහර්ෂමාත්‍රයක්ම කරන්නට පොහොසත් වේ; ඛණිකා පීති; ක්ෂණිකප්‍රීතිතොමෝ; ඛණෙ ඛණෙ, ක්ෂණ ක්ෂණයෙහි; විජ්ජුප්පාතසදිසා හොති, විද්‍යුත්පාතසදෘශවූ, (ක්ෂුද්‍ර ප්‍රීතියට වඩා බලවත්ව) උපදී; ඔක්කන්තිකා පීති, අවක්‍රාන්තිකප්‍රීතිතොමෝ; සමුද්දතීරං වීචි විය, මුහුදුවෙරළ පැතිරෙන මුහුදු රළසෙයින්; කායං ඔක්කමිත්වා ඔක්කමිත්වා භිජ්ජති,ශරීරය පිනවමින් පැතිර බිඳේ;(හෝ ක්ෂුද්‍රප්‍රීතියට වඩා බලවත් වේ) උබ්බෙගාපීති, උද්වේගප්‍රීති තොමෝ; බලවතී හොති බලවත්වේ;කායං,ශරීරය;උද්ධග්ගං කත්වා, ඌර්ධ්වාග්‍රකොට; ආකාසෙ,අහස; ලඞ්ඝාපනප්පමාණප්පත්තා, නගාපියනපමණට පැමිණීමයි; තථා හි, එසේමැනු; පුණ්ණගල්ලකවාසී මහාතිස්සත්ථෙරො, පණගල්වැසි මහාතිස්ස නම් තෙරහු; පුණ්ණමදිවසෙ, මැදි පොහෝ දවස්; සායං, සවස්වේලෙහි; චෙතියඞ්ගණං ගන්ත්වා, (පණගල්වෙහෙර) දාගැබඅඟණට එළඹ; චන්දාලොකං දිස්වා, සඳපහන දැක; මහාචෙතියාභිමුඛො, හුත්වා, මහසෑයට අභිමුඛව; ඉමාය වත වෙලාය, මේ වේලෙහි; චතස්සො පරිසා, සිව්පිරිස්; මහාචෙතියං වන්දන්තීති, මහාචෛත්‍යය වඳනාහයි; පකතියාදිට්ඨාරම්මණවසෙන, පූර්වයෙහි මහාචෛත්‍යයෙහි දුටු අරමුණු විසින්;(මහාචෛත්‍යයෙහි පූජා දුටු විරූහෙයිනැයි සේයි.) බුද්ධාරම්මණං, බුදුන් අරමුණුකොට ඇති; උබ්බෙගාපීතිං උප්පාදෙත්වා, උත්ප්‍රෙක්ෂිකා ප්‍රීතිය උපදවා; සුධාතලෙ පහටචිත්‍රගෙණ්ඩුකො විය, සුණුබිමපහළ චිත්‍රාකාරයෙන් කළකන්දුකයක් මෙන්;(පෙදෙක් මෙන්) ආකාසෙ උප්පතිත්වා, අහසට නැගී; මහාචෙතියඞ්ගණෙයෙව පතිට්ඨාසි, මහසෑ අඟණෙහිම පිහිටිවිය; (සෙම්ය යන සිත් නැතද ප්‍රීතිබලයෙන්ම අරමුණුකළ තැන පිහිටි විය) තථා, එසේම; ගිරිකණ්ඩක

---

1. චිත්‍රගෙණ්ඩුකො-කඑචි.  2. පලඟකයක්-ඇතැම්.

මහාවිහාරස්ස උපනිස්සයෙ වත්තකාලකගාමෙ එකා කුලධීතාපි බලව බුද්ධාරම්මණාය උබ්බෙගාපීතියා ආකාසෙ ලඞ්ඝෙසි. තස්සා කිර මාතාපිතරො සායං ධම්මසවණත්ථාය විහාරං ගච්ඡන්තා අම්ම ත්වං ගරුභාරා අකාලෙ චරිතුං න සක්ඛිස්සසි, මයං තුය්හං පත්තිං කත්වා ධම්මං සොස්සාමාති අගමංසු, සා ගන්තුකාමාපි තෙසං වචනං පටිබාහිතුං අසක්කොන්තී ඝරෙ ඔහීයිත්වා ඝරාජිරෙ[1] ඨත්වා චන්දාලොකෙන ගිරිකණ්ඩකෙ ආකාසචෙතියඞ්ගණං ඔලොකෙන්තී චෙතියස්ස දීපපූජං අද්දස, චතස්සො ච පරිසා මාලාගන්ධාදීහි චෙතියපූජං කත්වා පදක්ඛිණං කරොන්තියො, භික්ඛුසඞ්ඝස්ස ච ගණසජ්ඣායසද්දං අස්සොසි, අථස්සා ධඤ්ඤාවතිමෙ යෙ විහාරං ගන්ත්වා එවරූපෙ චෙතියඞ්ගණෙ අනුසඤ්චරිතුං එවරූපඤ්ච මධුරං ධම්මකථං සොතුං ලභන්තීති මුත්තාරාසිසදිසං චෙතියං පස්සන්තියා එව උබ්බෙගාපීති උදපාදි, සා ආකාසෙ ලඞ්ඝිත්වා මාතා

මහාවිහාරස්ස, ගිරිභණ්ඩමහ වෙහෙරට; උපනිස්සයෙ, සමීපයෙහි (නොහොත් ඒ වෙහෙරට නිශ්‍රයවූ; (ගොචරස්ථානවූය යන අර්ථයි.) වත්තකාලකගාමෙ, එනම් ගමක; එකා කුලධීතාපි, එක් කුලදුවකුදු; බලව බුද්ධාරම්මණාය උබ්බෙගපීතියා, බලවත්වූ බුද්ධාලම්බණවූ උද්වෙගප්‍රීතීන්; ආකාසෙ ලඞ්ඝෙසි, අහස්නැඟ; තස්සා කිර, ඈගේ; මාතාපිතරො, මවුපියදෙදෙන; සායං, සවස; ධම්මසවණත්ථාය, බණ අසනු පිණිස; විහාරං ගච්ඡන්තා, වෙහෙරට යන්නාහු; අම්ම ත්වං ගරුභාරා, අම්ම තෙපි ගුරුවූ බර ඇත්තව;(දරුඇත්තවයි සේයි) අකාලෙ චරිතුං න සක්ඛිසි, නොවේලෙහි යන්නට නොපොහොසතුව; මයං, අපි; තුය්හං පත්තිං කත්වා, තිටද පෙත්කොට; ධම්මං සොස්සාමාති, බණ අසම්හයි; අගමංසු, ගියෝ; සා, හෝ තොමෝ; ගන්තුකාමාපි, යනු කැමතිවීද; තෙසං වචනං පටිබාහිතුං අසක්කොන්තී, ඔවුන්ගේ තෙපුල් පිළිබහන්නට නොපොහොසත්වී; ඝරෙ ඔහීයිත්වා, ගෙහිම වැළක; ඝරාජිරෙ ඨත්වා, ගෘහාඞ්ගණයෙහි සිට; චන්දාලොකෙන, චන්ද්‍රාලොකයෙන්, ගිරිකණ්ඩකෙ, ගිරිභණ්ඩයෙහි; ආකාසචෙතියඞ්ගණං ඔලොකෙන්තී, (පර්වතශිඛරයෙහි) ආකාශදාගැප් අඟණබලන්නී; චෙතියස්ස, චෛත්‍යයෙහි; දීපපූජං අද්දස, පහන්පුජා දුටු; චතස්සො ච පරිසා, සිවුවණක් පිරිස්; මාලාගන්ධාදීහි චෙතියපූජං කත්වා, මල්ගඳ ආදීන් චෛත්‍යයට පූජාකොට; පදක්ඛිණං කරොන්තියො, පැදකුණුකරන්නවුන්; "අද්දස"යි සම්බන්ධ කරනු.) භික්ඛුසඞ්ඝස්ස ච, භික්ෂුසඞ්ඝයාගේද;ගණසජ්ඣායසද්දං අස්සොසි, ගණව (දහම්) පිරිවහණහඬ ඇසූ;අථ, ඉක්බිත්තෙන්; අස්සා, ඈට; ධඤ්ඤාවතිමෙ, මූ ඉතාපිනැත්තහ; යෙ, යම්කෙනෙක්; විහාරං ගන්ත්වා, වෙහෙරට එළඹ; එවරූපෙ චෙතියඞ්ගණෙ, මෙබඳුවූ දාගැප් අඟණෙහි; අනුසඤ්චරිතුං, ඇවිදුනට; එවරූපඤ්ච මධුරං ධම්මකථං සොතුං, මෙබඳු මිහිරි ධම්මකථා අසනුවටද; ලභන්තීති, ලැබෙද්දැයි;මුත්තාරාසිසදිසචෙතියං,මුතුරැසක් වැනිවූ චෛත්‍යය;පස්සන්තියා

[1] ඝරද්වාරෙ-කත්ථචි

පිතූනං පුරිමතරං යෙව ආකාසචෙතියඞ්ගණෙ ඔරුය්හ චෙතියං වන්දිත්වා ධම්මං සුණමානා අට්ඨාසි, අථ නං මාතාපිතරො ආගන්ත්වා අම්ම ත්වං කතරෙන මග්ගෙන ආගතාති පුච්ඡිංසු. සා ආකාසෙන ආගතාම්හි න මග්ගෙනාති වත්වා අම්ම ආකාසෙන නාම ඛීණාසවා සඤ්චරන්ති, ත්වං කථං ආගතාති වුත්තා ආහ මය්හං චන්දාලොකෙන චෙතියං ඔලොකෙන්තියා ඨිතාය බුද්ධාරම්මණා බලවතී පීති උප්පජ්ජි, අථාහං නෙව අත්තනො ඨිතභාවං න නිසින්නභාවං අඤ්ඤාසිං, ගහිතනිමිත්තෙනෙව පන ආකාසෙ ලඞ්ඝිත්වා චෙතියඞ්ගණෙ පතිට්ඨිතාම්හීති. එවං උබ්බෙගාපීති ආකාසෙ ලඞ්ඝාපනප්පමාණා හොති.

(ආ) ඵරණාපීතියා පන උප්පන්නාය සකල සරීරං ධමිත්වා පූරිතවත්ථි විය මහතා උදකොඝෙන පක්ඛන්තා පබ්බත කුච්ඡි විය ච අනුපරිප්ඵුටං හොති. සා පනෙසා පඤ්චවිධා පීති ගබ්භං ගණ්හන්තී පරිපාකං ගච්ඡන්තී

---

එව, බලමින් සිටියහටම; උබ්බෙගාපීති උදපාදී, උත්ප්‍රෙක්ෂිකාප්‍රීති උපනු; සා හෝතොමෝ; ආකාසෙ ලඞ්ඝිත්වා, අහසනැඟී; මාතාපිතූනනං පුරිමතරංයෙව, මවුපියන්ට පළමුකොටම; ආකාසචෙතියඞ්ගණෙ ඔරුය්හ, ආකාසචෛත්‍යාඞ්ගණයෙහි බැස; චෙතියං වන්දිත්වා, චෛත්‍යය වැඳ; ධම්මං සුණමානා, දහම් අසන්නී; අට්ඨාසි, සිටී; අථ, ඉක්බිත්තෙන්; නං, ඇ; මාතාපිතරො, මවුපියෝ; ආගන්ත්වා, අවුත්; අම්ම, අම; ත්වං, තෝ; කතරෙන මග්ගෙන ආගතාති පුච්ඡිංසු, කවරමඟකින් අවුදැයි පිළිවිස්සෝ; සා, හෝ තොමෝ; ආකාසෙන ආගතාම්හි, අහසින්අයිමි; න මග්ගෙනාති වත්වා, මඟින් නො ආයෙමි කියා; අම්ම, අම; ආකාසෙන නාම, අහසින්නම්, ඛීණාසවා සඤ්චරන්ති, ක්ෂීණාශ්‍රවයෝ ඇවිදිති; ත්වං කථං ආගතාති වුත්තා, තෝ කෙසේ ආදැයි කියනලද්දී; ආහ, මෙසේකිවු; මය්හං චන්දාලොකෙන චෙතියං ඔලොකෙන්තියා ඨිතාය; මා චන්ද්‍රාලොකයෙන් චෛත්‍යය බලමින් සිටියාට; බුද්ධාරම්මණා බලවතීපීති උප්පජ්ජි, බුද්ධාලම්බන බලවත් ප්‍රීති උපන; අථ, ඉක්බිත්තෙන්; අහං, මම; නෙව අත්තනො ඨිතභාවං න නිසින්නභාවං අඤ්ඤාසිං, තමා නොදසිටි බව නොදහුන් බව දනිමි; ගහිතනිමිත්තෙනෙව පන (චෛත්‍ය වන්දනයද ධර්මශ්‍රවණයද උදෙසා ධඤ්ඤවතී මෙ යනාදීන්) ගන්නාලද කුසලනිමිත්ත හෙතුවෙන්ම; ආකාසෙ ලඞ්ඝිත්වා, අහස නැඟී; චෙතියඞ්ගණෙ පතිට්ඨිතාම්හීති, දාගැප් අඟණයෙහි පිහිටියෙමි; එවං, මෙසේ; උබ්බෙගාපීති, උද්වෙගප්‍රීතිතොමෝ; ආකාසෙ ලඞ්ඝාපනප්පමාණා හොති, අහස නැඟෙනපමණ වේ.

(අ) ඵරණාපීතියා පන උප්පන්නාය, ඵරණාප්‍රීතිය උපන්කල්හි; සකල සරීරං, සියලු ශරීරය; ධමිත්වා පූරිතවත්ථි විය, පිඹ පිරූ විතක්මෙන්ද; මහතා උදකොඝෙන පක්ඛන්තා, මහදියවතුරෙකින් වදනාලද; පබ්බතකුච්ඡිවිය ච, පර්වතකුක්ෂියක් මෙන්ද; අනුපරිප්ඵුටං හොති, හැමපසින්ම සපර්ශකරනලදුයේ වෙයි; සා පනෙසා පඤ්චවිධා පීති, හේ මේ පඤ්චවිධ ප්‍රීතිතොමෝ; ගබ්භං ගණ්හන්තී, (ප්‍රශ්‍රබ්ධියට නිමිත්ත බැවින්)

දුවිධං පස්සද්ධිං පරිපූරෙති කායපස්සද්ධිඤ්ච චිත්තපස්සද්ධිඤ්ච, පස්සද්ධි ගබ්භං ගණ්හන්තී පරිපාකං ගච්ඡන්තී දුවිධම්පි සුඛං පරිපූරෙති කායිකඤ්ච චෙතසිකඤ්ච, සුඛං ගබ්භං ගණ්හන්තං පරිපාකං ගච්ඡන්තං තිවිධං සමාධිං පරිපූරෙති ඛණිකසමාධිං උපචාරසමාධිං අප්පනාසමාධින්ති. තාසු යා අප්පනා සමාධිස්ස මූලං හුත්වා වඩ්ඪමානා සමාධිසම්පයොගං ගතා ඵරණාපීති අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා පීතීති. ඉතරං පන සුඛනං සුඛං, සුට්ඨු වා ඛාදති ඛණති ච කායචිත්තාබාධන්ති සුඛං, තං සාතලක්ඛණං, සම්පයුත්තානං උපබ්‍රෑහණරසං, අනුග්ගහපච්චුපට්ඨානං,

---

ගබ්ගන්නී; පරිපාකං ගච්ඡන්තී, මිහිකරන්නී; දුවිධං පස්සද්ධිං පරිපූරෙති, දෙවැදෑරුම් ප්‍රශ්‍රබ්ධිය පුරයි; (කවරදුවිධ ප්‍රශ්‍රබ්ධියක්ද යත්?) කායපස්සද්ධිං, කායප්‍රශ්‍රබ්ධියද; චිත්තපස්සද්ධිඤ්ච, චිත්තප්‍රශ්‍රබ්ධියද යන විවිධ ප්‍රශ්‍රබ්ධියයි; පස්සද්ධි ගබ්භං ගණ්හන්තී, ප්‍රශ්‍රබ්ධිය ගබ්ගන්නී; පරිපාකං ගච්ඡන්තී, මිහිකරන්නී; දුවිධම්පි සුඛං පරිපූරෙති, දෙවැදෑරුම් සුවය පුරයි; (කවර දෙසුවයද යත්?) කායිකඤ්ච චෙතසිකඤ්ච, කායිකසුඛය චෛතසිකසුවය යන මේ දෙසුවයයි; සුඛං ගබ්භං ගණ්හන්තං, සුඛය ගබ්ගන්නේ; පරිපාකං ගච්ඡන්තං, මුහුකරන්නේ; තිවිධං සමාධිං පරිපූරෙති, ත්‍රිවිධසමාධිය පුරයි; ඛණිකසමාධිං, (උපචාරභූමියට නොපැමිණි) ක්‍ෂණික සමාධිය; උපචාරසමාධිං, උපචාරසමාධිය; අප්පනාසමාධින්ති, අර්පණාසමාධියයි; (මේ තුන පුරා-අර්පණාසමාධි සම්ප්‍රයුක්තප්‍රීතිය අර්පණාසමාධියම පුරයි ක්‍ෂණිකසමාධි පූරණප්‍රීතියද උපචාරසමාධි පූරණප්‍රීතියද අර්පණාසමාධියට දුරැතුයි ඒ දෙකම නොඅල්වා "තෙසු යා අප්පනාසමාධිස්ස" යනාදි කීහු.) තාසු, ඒ තුන්සමාධීන් කෙරෙහි; අප්පනාසමාධිස්ස මූලං හුත්වා, අර්පණාසමාධියට මුල්ව; වඩ්ඪමානා, (පූර්වයෙහි උපචාරසමාධීහු හා සම්ප්‍රයුක්තව) අනුක්‍රමයෙන් වඩනී; සමාධිසම්පයොගං ගතා, අර්පණාසමාධීහු හා සම්ප්‍රයොගයට පැමිණි; (යා ඵරණාපීති, යි යොදනු.) යම් ස්ඵුරණ ප්‍රීතියක් ඇද්ද; අයං, මෝතොමෝ; ඉමස්මිං අත්ථෙ "පීතිසුඛං" යන තැන; අධිප්පෙතා පීති, අභිමත ප්‍රීතියි; (අර්පණාප්‍රීතියම ස්ඵුරණප්‍රීති නම්වේ "පඤ්චවිධා පීති ගබ්භං ගණ්හන්තී"යි කුමක් පිණිස කීහ යත්? ප්‍රගුණධ්‍යානයෙහි අර්පණාප්‍රීතියද මතුමත්තෙහි ධ්‍යානයෙහි ප්‍රීතියට ප්‍රත්‍යය වන බැවින් යථාලාභවශයෙන් ස ප්‍රීතිකධ්‍යානයට ප්‍රත්‍යයවන ප්‍රීතීන් එක්කොට සාමාන්‍ය විසින් "පඤ්චවිධා පීති"යි කී වෙත්.) ඉතරම්පන, අනික් සුඛය වනාහි; සුඛනං සුඛං, සුඛකිරීම සුවනම; (සුඛ දුක්ඛතක්‍රියායං, යන ධාතුයි.) වා, නොහොත්; සුට්ඨු, මනාකොට කායචිත්තාබාධං, කායචිත්තපීඩාව; ඛාදති, කානුයි; (ඛාද භක්ඛණෙ යන ධාතුයි.); ඛණතිච, කණීනුයිද; (ඛණ ඛණනෙ යන ධාතුයි) සුඛං, සුවයනම්වේ; තං, හේ සුඛය; සාතලක්ඛණං, සීතලමධුර සවභාව ඇත්තේයි; සම්පයුත්තානං උපබ්‍රෑහණරසං, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වැඩීම කෘත්‍යය කොට ඇත්තීයි; අනුග්ගහ පච්චුපට්ඨානං, සම්ප්‍රයුක්තවන්ට අනුග්‍රහ

සතිපි ච තෙසං පීතිසුඛානං කත්ථචි අවිප්පයොගෙ ඉට්ඨාරම්මණපටිලාභතුට්ඨි පීති, පටිලද්ධරසානුභවනං සුඛං, යත්ථ පීති තත්ථ සුඛං, යත්ථ සුඛං තත්ථ න නියමතො පීති. සඞ්ඛාරක්ඛන්ධසඞ්ගහිතා පීති, වෙදනාක්ඛන්ධසඞ්ගහිතං සුඛං, කන්තාරඛින්නස්ස වනන්තොදකදස්සනසවණෙසු විය පීති, වනච්ඡායප්පවෙසනඋදකපරිභොගෙසු විය සුඛං, තස්මිං තස්මිං සමයෙ පාකටභාවතො චෙතං වුත්තන්ති වෙදිතබ්බං, ඉති අයඤ්ච පීති ඉදඤ්ච සුඛං අස්ස ඣානස්ස අස්මිං වා ඣානෙ අත්ථීති ඉදං ඣානං

---

කිරීම (උපකාරී බව) මැඩගනීම්කොට ඇත්තීයි; කත්ථචි, ප්‍රථමධ්‍යානාදියෙහි; සතිපි ච තෙසං පීතිසුඛානං අවිප්පයොගෙ, ඒ ප්‍රීතිසුඛ දෙදෙනාගේ අවිප්‍රයොගයක් ඇතිකල්හිදු; ඉට්ඨාරම්මණපටිලාභතුට්ඨි පීති, ඉෂ්ටාලම්බන ප්‍රතිලාභවශයෙන් උපදනා තුෂ්ටිය ප්‍රීතිනම්; පටිලද්ධ රසානුභවනං සුඛං, ප්‍රතිලබ්ධවූ ආලම්බනරස අනුභවකිරීම සුඛනම්; යත්ථ පීති, යම් සිතෙක ප්‍රීතිය ඇද්ද; තත්ථ, ඒ සිත; සුඛං, සුඛය වේ; (මෙයින් විතර්කයාගේ විචාරය හා සම්ප්‍රයොගය මෙන් ප්‍රීති සුඛයන්ගේ අත්‍යන්තසංයොගය කීහු.) යත්ථ සුඛං යම්සිතෙක සුවයද; තත්ථ, ඒ සිත; න නියමතො පීති, (සුඛසහගත කායවිඤ්ඤාණයෙහි හා පඤ්චකනයෙහි චතුර්ථධ්‍යානයෙහි ප්‍රීතිය නොවන්නේ) නියමයෙන් ප්‍රීතිය නොවේ; (මෙයින් විචාරයාගේ විතර්කය හා සම්ප්‍රයොගය මෙන් සුඛයාගේ ප්‍රීතියහා අත්‍යන්තසංයොගය කීහු.) සඞ්ඛාරක්ඛන්ධසඞ්ගහිතා පීති, සංස්කාරස්කන්ධයෙහි සඞ්ග්‍රහකරන ලද්දී ප්‍රීතියයි; වෙදනාක්ඛන්ධසඞ්ගහිතං සුඛං, වෙදනාස්කන්ධයෙහි සඞ්ග්‍රහකරනලද්දේ සුඛයයි; කන්තාරඛින්නස්ස, පැන්නැතිදීර්ඝමාර්ගයෙහි දුක්ඛයට පැමිණියහුගේ; (**කං තාරෙන්ති එත්ථාති කන්තාරං නිරුදකමරුට්ඨානං,**) වනන්තොදකදස්සනසවණෙසු විය පීති, වනාන්තඋදකදර්ශනශ්‍රවණයෙහි මෙන් ප්‍රීතිය ගතයුතුයි; (**වනමෙව වනන්තං** යනු වේ.) වනච්ඡායප්පවෙසන උදකපරිභොගෙසු විය සුඛං, වනච්ඡායාවට වැදීමෙහි හා උදකපරිභොගකාලයෙහි මෙන් සුඛය දතයුතු; තස්මිං තස්මිං සමයෙ, ඉෂ්ටාලම්බනයාගෙ ප්‍රතිලාභ සමයෙහිද ප්‍රතිලබ්ධයාගෙ රසානුභවනසමයෙහිද වනච්ඡායාදීන්ගෙ දර්ශන ශ්‍රවණ සමයෙහිද පරිභොග සමයෙහිද; පාකටභාවතො ච, ප්‍රීතිසුඛ දෙදෙනාගෙ ප්‍රතිලබ්ධ හෙයින් ද; (ඉෂ්ටාලම්බනප්‍රතිලාභකාලයෙහිදු වනාන්තඋදක දර්ශනශ්‍රවණ කාලයෙහිදු සුවය ඇතදහොත් එයටවඩා ප්‍රකටප්‍රත්‍යය ඇති ප්‍රීතිය බලවත්හෙයින් ඉෂ්ටාලම්බන රසය අනුභවකරනකල්හිද ඡායාජල වැලඳගන්නා කල්හිද ප්‍රීතිය ඇතදහොත් එයටවඩා සුවය බලවත්වන බැවින්ද යන අර්ථයි.) එතං වුත්තන්ති වෙදිතබ්බං, මේ කියනලදූයි දතයුතුයි; ඉති, මෙසේ; අයඤ්ච පීති, මේ ප්‍රීතිද; ඉදඤ්ච සුඛං, මේ සුඛයද; අස්ස ඣානස්ස, මේ ධ්‍යානයහට ඇත්තුයි කියාද; අස්මිං වා ඣානෙ අත්ථීති, මේ ධ්‍යාන

පීතිසුඛන්ති වුච්චති. අථ වා පීති ච සුඛඤ්ච පීතිසුඛං, ධම්මවිනයාදයො විය. විවෙකජං පීතිසුඛමස්ස ඣානස්ස අස්මිං වා ඣානෙ අත්ථීති එවමපි විවෙකජං පීතිසුඛං. යථෙව හි ඣානං එවං පීතිසුඛමෙපත්ථ විවෙකජමෙව හොති, තඤ්චස්ස අත්ථි තස්මා එකපදෙනෙව විවෙකජංපීතිසුඛන්තිපි වත්තුං යුජ්ජති. විභඞ්ගෙ පන "ඉදං සුඛං ඉමාය පීතියා සහගතන්ති" ආදිනා නයෙන වුත්තං, අත්ථො පන තත්ථාපි එවමෙව දට්ඨබ්බො.

(අ) පඨමං ඣානන්ති ඉදං පරතො ආවිභවිස්සති. උපසම්පජ්ජාති උපගන්ත්වා, පාපුණිත්වාති වුත්තං හොති, උපසම්පාදයිත්වා වා, නිප්ඵාදෙත්වාති වුත්තං හොති, විභඞ්ගෙ පන "උපසම්පජ්ජාති පඨමස්ස ඣානස්ස ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵස්සනා සච්ඡිකිරියා උපසම්පදාති" වුත්තං, තස්සාපි එවමෙව අත්ථො දට්ඨබ්බො. විහරතීති තදනුරූපෙන

---

යෙහි ඇත්තුයි කියාද; ඉදං ඣානං, මේ ධ්‍යානය; පීතිසුඛන්ති වුච්චති, ප්‍රීතිසුඛයයි කියනු ලැබේ;(මේ අර්ථවිකල්පයෙහි "විවෙකජං"යි ධ්‍යානයම කියනලදී) අථ වා, නොහොත්; පීතිඤ්ච සුඛඤ්ච, ප්‍රීතියද සුඛයද ප්‍රීතිසුඛනම්වේ; ධම්මවිනයාදයො විය, (ධම්මො ච විනයො ච ධම්මවිනයා) යනාදී මෙන යන අර්ථයි;විවෙකජං යථෙව හි ඣානං,යම්සේ ධ්‍යානය විවෙකජද; එවං, මෙසේම; එත්ථ, මේ ධ්‍යානයෙහි; පීතිසුඛම්පි විවෙකජමෙව හොති, ප්‍රීතිසුඛයම විවෙකජවේ; තඤ්ච, ඒ ප්‍රීතිසුඛයද; අස්ස අත්ථි, මේ ධ්‍යානයට ඇති; තස්මා, එහෙයින්; එකපදෙනෙව (අලුප්තසමාස බැවින්) එකපදයෙන්ම; විවෙකජංපිතිසුඛන්ති වත්තුං යුජ්ජති, "විවෙකජංපීතිසුඛං"යි කියන්නට යෙදේ; විභඞ්ගෙ පන, විභඞ්ගයෙහි වනාහි, ඉදං සුඛං, මේ සුඛය; ඉමාය පීතියා සහගතන්ති ආදිනා නයෙන, මේ ප්‍රීතියහා සහගතය යනාදිනයින්; වුත්තං, කියනලදී; අත්ථො පන, අර්ථය වනාහි; තත්ථාපි, ඒ විභඞ්ගයෙහිදු; එවමෙව දට්ඨබ්බො, මෙසේම දතයුත්තේයි.

(අ) පඨමජ්ඣානන්ති ඉදං, "පඨමජ්ඣානං" යන මේ; පරතො ආවිභවිස්සති, මත්තෙහි පහළවේ; (උපසම්පජ්ජාති, යී සේයි) උපගන්ත්වා, තමා සන්තානයෙහි උත්පාදනවිසින් එළඹ; පාපුණිත්වාති වුත්තං හොති, පැමිණ යයි කී නියායි; වා, නොහොත්; (උපසම්පාදයිත්වා-යී සේයි) නිප්ඵාදෙත්වාති වුත්තං හොති, නිපදවායයි කී නියායි; විභඞ්ගෙ පන, විභඞ්ගයෙහිවනාහි; (උපසම්පජ්ජාති යී සේයි) පඨමස්ස ඣානස්ස, ප්‍රථමධ්‍යානයාගේ; ලාභො, ලබනබවය; පටිලාභො, මනාකොට පිළිලබනබවය; පත්ති, ප්‍රාප්තිය; සම්පත්ති, මනාකොට ලැබෙනබවය; ඵස්සනා, ඥානයෙන් දර්ශනය කරනබවය; සච්ඡිකිරියා, සාක්ෂාත් කරනබවය; උපසම්පදාති, උපදවනබවයයි; වුත්තං, කියනලදී; තස්සාපි, ඒ විභඞ්ගයාගේ; එවමෙව, මෙපරිද්දෙන්ම; අත්ථො දට්ඨබ්බො,අර්ථදතයුතු; විහරතීති-යන්නෙහි; තදනුරූපෙන,

ඉරියාපථවිහාරෙන ඉති වුත්තප්පකාරඣානසමඞ්ගී හුත්වා අත්තභාවස්ස ඉරියනං වුත්තිං පාලනං යපනං යාපනං චාරං විහාරං අභිනිප්ඵාදෙති. වුත්තඤ්හෙතං විභඞ්ගෙ:–"විහරතීති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති චරති විහරති තෙන වුච්චති විහරතී"ති.

(අ) යං පන වුත්තං–පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතන්ති–තත්ථ කාමච්ඡන්දො, ව්‍යාපාදො, ථීනමිද්ධං, උද්ධච්චකුක්කුච්චං, විචිකිච්ඡාති ඉමෙසං පඤ්චන්නං නීවරණානං පහානවසෙන පඤ්චඞ්ගවිප්පහීනතා වෙදිතබ්බා. න හි එතෙසු අප්පහීනෙසු ඣානං උප්පජ්ජති, තෙනස්සෙතානි පහානඞ්ගානීති වුච්චන්ති. කිඤ්චාපි හි ඣානක්ඛණෙ අඤ්ඤෙපි අකුසලා ධම්මා පහීයන්ති, තථාපි එතානෙව විසෙසෙන ඣානන්තරාය

---

ඒ ධ්‍යානයට අනුරූපවූ; ඉරියාපථවිහාරෙන, ඊර්‍ය්‍යාපථවිහාරයෙන්; ඉති, මෙසේ; උත්තප්පකාරඣානසමඞ්ගී හුත්වා, උක්තාකාරවූ ධ්‍යානයෙන් සමන්විතව; අත්තභාවස්ස, ආත්මභාවයාගේ; ඉරියනං, ක්‍රියාය; වුත්තිං, ප්‍රවෘත්තිය; පාලනං, ඉරියවූ පීඩායෙන් රැක්මය; යපනං ඒ ඒ ඉරියවුවිසින් වැටීම; යාපනං, යැපීම; චාරං, හැසිරීම; විහාරං, විහරණය; අභිනිප්ඵාදෙති, නිපදවා; වුත්තං හෙතං විභඞ්ග, විභඞ්ගයෙහි මේ කියේමැනු; විහරති යි සේයි; ඉරියති, ක්‍රියාවකෙරේ; වත්තති, පවත්ති; පාලෙති, (එක් ඊර්‍ය්‍යාපථපීඩාවක් අතික්ඉරියවුවෙන්) රකී; යපෙති, යපේ; යාපෙති, යපා; චරති, හැසිරේ; විහරති, වෙසේ; තෙන, එහෙසින්; විහරතී ති වුච්චති "විහරති" යි කියනුලැබේ.

(අ) (**පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගතන්ති යං පන වුත්තං තත්ථ**–යි යොදනු.) කාමච්ඡන්දො, කාමච්ඡන්දය; ව්‍යාපාදො, ව්‍යාපාදය; ථිනමිද්ධං, ස්ත්‍යාන, මිද්ධය; උද්ධච්චකුක්කුච්චං, ඖද්ධත්‍යකෞකෘත්‍යය; විචිකිච්ඡාති, විචිකිත්සාය යන; ඉමෙසං පඤ්චන්නං නීවරණානං, මේ පඤ්ච නීවරණයන්ගේ; පහානවසෙන, ප්‍රහාණවශයෙන්; පඤ්චඞ්ගවිප්පහීනතා, පඤ්චාඞ්ගවිප්‍රහීණබව; වෙදිතබ්බා, දතයුතු; (**පඤ්ච අඞ්ගානි වික්ඛම්භනවසෙන පහීණානි එතස්සාති පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චහි අඞ්ගෙහි විප්පහීනන්ති වා පඤ්චඞ්ගවිප්පහීනං** යනු වේ.) එතෙසු අප්පහීනෙසු, ඒ කාමච්ඡන්දාදීන් අප්‍රහීණකල්හි; ඣානං නහි උප්පජ්ජති, ධ්‍යානය නොමඋපදී; තෙන, එහෙයින්; අස්ස, මේ ධ්‍යානයාගේ; එතානි, මේ කාමච්ඡන්දාදීහු; පහානඞ්ගානීති, ප්‍රහාණාඞ්ගයහයි; වුච්චන්ති, කියනු ලැබෙත්; කිඤ්චාපි හි, කිසිසේත්; ඣානක්ඛණෙ, ධ්‍යානක්ෂණයෙහි; (ධ්‍යානලාභීහට ධ්‍යානසමන්විත නොවනකාලයෙහි ධ්‍යානප්‍රතිපක්ෂ නොවන ලොභචිත්තාදීන්ගේ ප්‍රවෘත්තිසද්භාවයෙන් "ඣානක්ඛණෙයි" කීහු.) අඤ්ඤෙපි අකුසලා ධම්මා, (ලොභචිත්තොත්පාදදී) සෙසු අකුශලධර්මයෝද; පහීයන්ති, පැහෙත්; (නොපවත්තී යන අර්ථයි.) තථාපි, එතකුදුවුවත්; එතානෙව, මේ කාමච්ඡන්දාදීහුම; විසෙසෙන ඣානන්තරාය කර, වෙසෙසින් ධ්‍යානයට අන්තරාය කරන්නෝයි;

කරන්ති. කාමච්ඡන්දෙන හි නානා විසයප්පලොභිතං චිත්තං න එකත්තාරම්මණෙ සමාධියති, කාමච්ඡන්දාභිභූතං වා තං න කාම ධාතුප්පහාණාය පටිපදං පටිපජ්ජති, ව්‍යාපාදෙන වාරම්මණෙ පටි හඤ්ඤමානං න නිරන්තරං පවත්තති. ථිනමිද්ධාභිභූතං අකම්මඤ්ඤං හොති. උද්ධච්චකුක්කුච්චපරෙතං අවූපසන්තමෙව හුත්වා පරිබ්භමති, විචිකිච්ඡාය උපහතං ඣානාධිගමසාධිකං පටිපදං නාරොහති, ඉති විසෙසෙන ඣානන්තරායකරත්තා එතානෙව පහාණඞ්ගා නීති වුත්තානීති. යස්මා පන විතක්කො ආරම්මණෙ චිත්තං අභිනිරොපෙති, විචාරො අනුබන්ධති, තෙහි අවික්ඛෙපාය සම්පාදිතප්ප

---

කාමච්ඡන්දෙනහි, කාමච්ඡන්දයෙන්; නානාලම්බනවිසයප්පලොභිතං චිත්තං, නානාලඹනහෙයින් පොළොඹනලද සිත; එකත්තාරම්මණෙ, (පඨවිකසිණාදිවිසින්) එකඑක ස්වභාවාලම්බනයෙහි; (නොහොත්: එකාග්‍රතාසඞ්ඛ්‍යාත එකත්වය එළවන අරමුණෙහි,) න සමාධියති, සමාහිත නොවේ; කාමච්ඡන්දාභිභූතං වා, කාමච්ඡන්දයෙන් හෝ මඩනාලද; තං, ඒ චිත්තය; කාමධාතුප්පහාණාය; (නානාවිෂය සම්මූඪවූ) කාම ධාතුවගේ ප්‍රහාණය (සමතික්‍රමණය) පිණිස; පටිපදං, ධ්‍යානයට; න පටිපජ්ජති, නොපැමිණේ; ව්‍යාපාදෙන ච, ව්‍යාපාදයෙනුදු; ආරම්මණෙ පටිහඤ්ඤමානං, අරමුණෙහි ගැටෙන්නේ; න නිරන්තරං පවත්තති, නිරන්තරයෙන් නොපවතීද, (වික්ෂෙපයෙන් අන්තරිත නොව සමාහිත නොව පවතී යනඅර්ථයි.) ථිනමිද්ධාභිභූතං, ස්ත්‍යාන මිද්ධයෙන් මඩනාලද්දේ; අකම්මඤ්ඤං හොති, භාවනාකර්මයට ක්ෂම නොවේ; (යොග්‍යනොවේ යන අර්ථයි.) උද්ධච්චකුක්කුච්චපරෙතං, ඖද්ධත්‍ය කෞකෘත්‍යදෙකින් යුක්තවූයේ (මඩනාලද්දේ); අවූපසන්ත මෙව හුත්වා, නොසන්හිඳීම; පරිබ්භමති, බමා; (නොසන්හුන්නවූව සමාධානයක් නැතිහෙයින් පරිභ්‍රමණයකෙරේ යන අර්ථයි.) විචිකිච්ඡාය උපහතං, (සාතිසය විචාරය නැති බැවින් භගවත් සම්බුද්ධවේද්දෝහෝ නොවේද්දෝහෝයි පඨවී පඨවී යනාදි මනසිකාරයෙන් ධ්‍යානයවේ ද්දෝහෝ නොවේද්දෝහෝයි යනාදි නයින් ප්‍රවෘත්තවූ) විචිකිත්සායෙන් පහරන ලද්දේ; ඣානාධිගමසාධිකං පටිපදං, ධ්‍යානයාගේ අධිගමය සාධන්නාවූ පිළිවෙතට; නාරොහති, (අප්‍රතිපත්තිනිමිත්තහෙයින්)නො නැඟේ; ඉති, මෙසේ; විසෙසෙන, වෙසෙසින්; ඣානන්තරාය කරත්තා, (සමාධි ආදීන්ට සෘජුප්‍රතිපක්ෂබැවින්) ධ්‍යානයට අන්තරාය කරන හෙයින්; එතානෙව, මේකාමච්ඡන්දාදීහුම; පහාණඞ්ගානීති වුත්තානි, ප්‍රහාණාඞ්ගයහයි කියන ලදහු; යස්මා පන, යම්හෙයකින් වනාහි; විතක්කො, විතර්කය තෙමේ; ආරම්මණෙ චිත්තං අභිනිරොපෙති, අරමුණෙහි සිත්හු නඟාද; විචාරො, විචාරයතෙමේ; අනුබන්ධති, අරමුණෙහි සිත්හු බඳීද; තෙහි, (ධ්‍යානාධිගමයට ප්‍රත්‍යයවූ) විතර්ක විචාරදෙකින්; අවික්ඛෙපාය සම්පාදිතප්පයොගස්ස, වික්ෂෙප නොවනු

යොගස්ස චෙතසො පයොගසම්පත්තිසම්භවා පීති පීනනං සුඛඤ්ච උපබ්‍රෑහණං කරෙති, අථ නං සසෙසසම්පයුත්තධම්මං එතෙහි අභිනිරොපණානුප්පබන්ධන පීනන උපබ්‍රෑහණෙහි අනුග්ගහිතා එකග්ගතා එකත්තාරම්මණෙ සමං සම්මා ආධියති, තස්මා විතක්කො විචාරො පීති සුඛං චිත්තෙකග්ගතාති ඉමෙසං පඤ්චන්නං උප්පත්තිවසෙන පඤ්චඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා, උප්පන්නෙසු හි එතෙසු පඤ්චසු ඣානං උප්පන්නං නාම හොති, තෙනස්ස එතානි පඤ්ච සමන්නාගතඞ්ගානීති වුච්චන්ති. තස්මා න එතෙහි සමන්නාගතං අඤ්ඤදෙව ඣානං නාම අත්ථීති ගහෙතබ්බං. යථා පන අඞ්ගමත්තවසෙනෙව චතුරඞ්ගිනී සෙනා

---

පිණිස නිපයනලද ප්‍රයොග ඇත්තහුගේ; චෙතසො, සිත්හුගේ; (පීනනං උපබ්‍රෑහණඤ්ච කරෙති-යි යොදනු.) පයොගසම්පත්තිසම්භවා පීති, (යථොක්තභාවනාවගේ) ප්‍රයොගසම්පත්තීන් උපන් ප්‍රීති තොමෝ; පීනනං, (භාවනාවශයෙන්) තපීණයද; සුඛඤ්ච, සුඛයද; උපබ්‍රෑහණං, සුඛපරිවෘද්ධියද; කරෙති, කෙරේ; අථ, ඉක්බිත්තෙන්; සසෙසසම්පයුත්තධම්මං, සෙසු (ස්පර්ශාදි) සම්ප්‍රයුක්තධර්මයන් සහිතවූ; නං, ඒ චිත්තය; (සමං සම්මා ආධියති යි සම්බන්ධ කරනු.) අභිනිරොපණානුප්පබන්ධන පීනන උපබ්‍රෑහණෙහි, අභිනිරොපනය අනුබන්ධනය ප්‍රීණනය උපබ්‍රෑහණය යන මොවුන්කරන; එතෙහි, විතර්කය විචාරය ප්‍රීතිය සුඛය යන මොවුන් විසින්; අනුග්ගහිතා එකග්ගතා, අනුග්‍රහකරනලද ඒකාග්‍රතා තොමෝ; එකත්තාරම්මණෙ, යථොක්ත ලක්ෂණ එකත්වාලම්බනයෙහි; සමං, (ඉන්ද්‍රිය සමතා වශයෙන්) සමකොට; සම්මා, (ප්‍රතිපක්ෂභාවයන්ගේ දූරීභාවයෙහි ලීනොද්ධත නොවනබැවින්) මනාකොට; ආධියති, පිහිටුවා; (ඒකාග්‍රතා තොමෝ සමාධානකෘත්‍යයෙන් චිත්තයද සම්ප්‍රයුක්තධර්මයන්ද තමා අනුකරන්නී ධ්‍යානක්ෂණයෙහි සාතිශයවම සමාහිතකෙරේ.) තස්මා, එහෙයින්; විතක්කො, විතර්කය; විචාරො, විචාරය; පීති, ප්‍රීතිය; සුඛං, සුඛය; චිත්තෙකග්ගතාති, චිත්තෛකාග්‍රතා යයි; ඉමෙසං පඤ්චන්නං, මේ පස්දෙනාගේ; උප්පත්තිවසෙන, (යථාප්‍රත්‍යයෙන්) උත්පත්තිවශයෙන්; පඤ්චඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා, පසඟින් සමන්විතබව දතයුත්තීයි; උප්පන්නෙසු හි එතෙසු පඤ්චසු, විතර්කාදි ධ්‍යානාඞ්ගයන් පස්දෙනා උපන්කල්හි; ඣානං උප්පන්නං නාම හොති, (ධ්‍යානය ව්‍යවහාර මොවුන්කෙරෙහිම බැවින්) ධ්‍යානය උත්පන්න නම් වේ; තෙන, එහෙයින්; අස්ස, මේ ධ්‍යානයාගේ; එතානි පඤ්ච, මේ විතර්කාදි පස්දෙන; සමන්නාගතඞ්ගානීති, යෙදෙන අඞ්ගයහයි; වුච්චන්ති, කියනුලැබෙත්; තස්මා, එහෙයින්; එතෙහි සමන්නාගතං, විතර්කාදි පසඟින් සමන්විතවූ; අඤ්ඤදෙව ඣානං නාම අත්ථීති, (ඒ පඤ්චාඞ්ගයන් මිස) අනික්මඣානයෙක් නම් ඇතැයි; න ගහෙතබ්බං, නොගතයුතු; යථා පන, යම්සේ; අඞ්ගමත්තවසෙනෙව, අඞ්ගමාත්‍රවශයෙන්ම; චතුරඞ්ගිනීසෙනා, සතර

පඤ්චඞ්ගිකඤ්ච තුරියං අට්ඨඞ්ගිකො ච මග්ගොති වුච්චති. එවම්දමපි අඞ්ගමත්තවසෙනෙව පඤ්චඞ්ගිකන්ති වා පඤ්චඞ්ගසමන්නාගතන්ති වා වුච්චතීති වෙදිතබ්බං. එතානි ච පඤ්චඞ්ගානි කිඤ්චාපි උපචාරක්ඛණෙපි අත්ථි, අථ ඛො උපචාරෙ පකතිචිත්තතො බලවතරානි, ඉධ පන උපචාරතොපි බලවතරානි රූපාවචරලක්ඛණප්පත්තානි, එත්ථ හි විතක්කො සුවිසදෙන[1] ආකාරෙන ආරම්මණෙ චිත්තං අභිනිරොපයමානො උප්පජ්ජති. විචාරො අතිවිය ආරම්මණං අනුමජ්ජමානො, පීතිසුඛං සබ්බාවන්තම්පි කායං ඵරමානං; තෙනෙවාහ:-"නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොතී"ති.

(අ) චිත්තෙකග්ගතාපි හෙට්ඨිමම්හි සමුග්ගපටලෙ උපරිමං සමුග්ගපටලං විය ආරම්මණෙ සුඵුසිතා හුත්වා උප්පජ්ජති අයමෙතෙසං ඉතරෙහි

---

අඟින්යුත් සේනාය; පඤ්චඞ්ගිකඤ්ච තුරියං, පඤ්චාඞ්ගයක් ඇති තුරියය; අට්ඨඞ්ගිකො ච, මග්ගොති, අෂ්ටාඞ්ගයක්ඇති මාර්ගයයි; වුච්චති, කියනුලැබේද; එවං, එපරිද්දෙන්ම; ඉදමපි, මේ ධ්‍යානයද; අඞ්ගමත්තවසෙනෙව, අඞ්ගමාත්‍රවිසින්ම; පඤ්චඞ්ගිකං ඉති වා, පඤ්චාඞ්ගයක් ඇත්තේයයිද; පඤ්චඞ්ගසමන්නාගතන්ති වා, පඤ්චාඞ්ග යෙන් යුක්තයයිද; වුච්චතීති, කියනුලැබේ යි; වෙදිතබ්බං, දතයුතු; එතානි ච පඤ්චඅඞ්ගානි, මේ පස් අඟහු; කිඤ්චාපි, කිසි සේත්; උපචාරක්ඛණෙපි අත්ථි, උපචාර ධ්‍යානයෙහිදු ඇත; අථඛො, එතකුදුවුවත්; උපචාරෙ, උපචාරක්ෂණයෙහි; පකතිචිත්තතො බලවතරානි, කාමාවචරචිත්තයට වඩා අතිශයෙන්ම බලවත්වූ; (කාමාවචරචිත්තයෙහි විතර්කාදීන්ට ද වඩා වෙසෙසින්ම බලවත්හ යනඅර්ථයි.) ඉධ පන, මෙහි වනාහි; උපචාරතොපි බලවතරානි, උපචාරයටද වඩා අතිශයෙන්ම බලවත්වූ; රූපාවචරලක්ඛණප්පත්තානි, රූපාවචරලක්ෂණයට පැමිණියාහු; එත්ථ හි, මේ පඤ්චාඞ්ගයන් කෙරෙහි; විතක්කො, විතර්කය තෙමෙ; සුවිසදෙන ආකාරෙන, (ක්ලෙශයන්කෙරෙන් මුක්තබැවින්) මනාවම ප්‍රකටවූ ආකාරයෙන්; ආරම්මණෙ, අරමුණෙහි; චිත්තං, සිත; අභිනිරොපයමානො, නගමින්; උප්පජ්ජති, උපදී; විචාරො, විචාරය; අතිවිය ආරම්මණං අනුමජ්ජමානො, අතිසයින්ම අරමුණ පිරිමදිමින් උපදී; පීතිසුඛං, ප්‍රීති සුඛ දෙක; සබ්බාවන්තම්පිකායං, සියලු අවයව වත්වූශරීරය (සකලශරීරය යන අර්ථයි. ඵරමානං, පැතිරෙමින් උපදී; තෙනෙවාහ, එහෙයින්ම කී; අස්ස සබ්බාවතො කායස්ස, මේ සියලු අවයවවත්වූ කායයාගේ; කිඤ්චි, කිසිවෙක්; විවෙකජෙන පීතිසුඛෙන, විවෙකජවූ ප්‍රීතිසුඛයෙන්; අප්ඵුටං න හොති, නොපහරනලද නොවෙයි.

(අ) චිත්තෙකග්ගතාපි, චිත්තෛකාග්‍රතාවද; හෙට්ඨිමම්හි සමුග්ගපටලෙ, යටසුමුං පියනෙහි; උපරිමං සමුග්ගපටලං විය, මතු සුමුංපියන මෙන්; ආරම්මණෙ සුඵුසිතා හුත්වා, අරමුණුසමග මනාව ස්පර්ශකොට උප්පජ්ජති, උපදී; අයං, මේ; එතෙසං, මේ ධර්මයන්ගේ; ඉතරෙහි,

---

1. සුවිසුඛෙන-ත්‍රි. ශ්‍යා.

විසෙසො, තත්‍ථ චිත්තෙකග්ගතා කිඤ්චාපි සවිතක්කං සවිචාරන්ති ඉමස්මිං පාඨෙ න නිද්දිට්ඨා, තථාපි විභඞ්ගෙ "ඣානන්ති-විතක්කො විචාරො පීති සුඛං චිත්තෙකග්ගතා"ති එවං වුත්තත්තා අඞ්ගමෙව, යෙන හි අධිප්පායෙන භගවතා උද්දෙසො කතො සො යෙව තෙන විභඞ්ගෙ පකාසිතො හොති. තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නන්ති-එත්‍ථ පන ආදිමජ්ඣපරියොසානවසෙන තිවිධකල්‍යාණතා, තෙසං යෙව ච ආදිමජ්ඣපරියොසානලක්ඛණවසෙන දසලක්ඛණසම්පන්නතා වෙදිතබ්බා. තත්‍රායං පාළි:-පඨමස්ස ඣානස්ස පටිපදා විසුද්ධිආදි, උපෙක්ඛානුබ්‍රෑහණා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං, පඨමස්ස ඣානස්ස පටිපදා විසුද්ධිආදි, ආදිස්ස කති ලක්ඛණානි? ආදිස්ස තීණි ලක්ඛණානි,

---

සෙසු ධර්මයන් කෙරෙන්; විසෙසො, වෙනසයි; තත්‍ථ, එහි; චිත්තෙකග්ගතාපි, (අර්පණාවශයෙන්පවත්නාවූ) චිත්තෛකාග්‍රතා තොමෝ; කිඤ්චාපි, කිසිසේත්; සවිතක්කං සවිචාරන්ති ඉමස්මිං පාඨෙ, සවිතක්කං සවිචාරං යන මේ පාඨයෙහි; න නිද්දිට්ඨා, ස්වරූපයෙන් නොදක්නා ලද; තථාපි, එතකුදුවුවත්; විභඞ්ගෙ, විභඞ්ගයෙහි; ඣානන්ති, ඣාන නම්; විතක්කො විචාරො පීති සුඛං චිත්තෙකග්ගතාති, විතර්කය විචාරය ප්‍රීතිය සුඛය චිත්තෛකාග්‍රතාය යයි; එවං වුත්තත්තා, මෙසේ කියනලද බව හෙයින්; අඞ්ගමෙව, ධ්‍යානාඞ්ගම වේ; යෙන හි අධිප්පායෙන, යම් අභිප්‍රායෙකින්; භගවතා උද්දෙසො කතො, භගවත්හු විසින් උද්දෙස කරනලද්දේද; සොයෙව, එමඅභිප්‍රාය; තෙන, ඒ භගවත්හු විසින්; විභඞ්ගෙ පකාසිතො හොති, විභඞ්ගයෙහි ප්‍රකාශකරනලදී; (සවිතක්කං සවිචාරං යනාදි උදෙසෙහි අභිප්‍රායම"විතක්කො විචාරො" යනාදියෙන් ප්‍රකාශකරනලද එසේබැවින් උදෙසෙහි නැතැයි නො සැලකිය යුතුය- විතක්ක විචාරඇත්තේ ප්‍රීති සුව ඇත්තේය යනු යෙහිම අභිප්‍රායවිසින්ම සමාධියම කීවෙති යි සැලකියයුතුය යනු සන්න්‍යයි. **කිඤ්චාපි සරූපතො න නිද්දිට්ඨා සාමඤ්ඤතො පන ඣානඞ්ගභාවෙන ගහිතා එව"** යනු ටීකානයයි) "තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං" යන මෙහි; ආදිමජ්ඣපරියොසාන වසෙන (ධ්‍යානයාගේ) ආදිමධ්‍ය පර්‍ය්‍යවසානවශයෙන්; තිවිධකල්‍යාණතා, ත්‍රිවිධකල්‍යාණයන් ඇතිබවද; තෙසංයෙව ච ආදිමජ්ඣපරියොසාන ලක්ඛණවසෙන, එම ආදි මධ්‍ය පර්‍ය්‍යවසානයන්ගේම ලක්‍ෂණ වශයෙන්; දසලක්ඛණසම්පන්නතා, දශලක්‍ෂණයෙන් යුක්ත බවද; වෙදිතබ්බා, දතයුතු; තත්‍ර, ඒ කල්‍යාණලක්‍ෂණ විභාවනයෙහි; අයං පාළි, මේ පෙළයි; පඨමස්ස ඣානස්ස, ප්‍රථමධ්‍යානයාගේ; පටිපදා විසුද්ධිආදි, ප්‍රතිපත්ති විසුද්ධිය ආදියයි; (ගොත්‍රභූඅවසන්කොටඇති භාවනාවිෂය ප්‍රතිපත්තිනම් වෙයි ඒ ප්‍රතිපත්තියගේ පරිපන්ථයන් කෙරෙන් විසුද්ධිය පටිපදා විසුද්ධිය-හෝ තොමෝ යම්හෙයකින් ධ්‍යානයාගේ උත්පාදක්‍ෂණයෙහි ලැබේද එහෙයින් පටිපදාවිශුද්ධිආදියයි කීහු.) පඨමස්ස ඣානස්ස, ප්‍රථමධ්‍යානයාගේ; පටිපදා විසුද්ධිආදි, ප්‍රතිපත්ති විශුද්ධිය ආදියයි; ආදිස්ස, ආදිහුගේ; කති ලක්ඛණානි, ලක්‍ෂණයෝ

**යො තස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති, විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති. යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, යඤ්ච පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති, පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි. ආදිස්ස ඉමානි තීණි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං ආදිකල්‍යාණඤ්චෙව හොතී ති ලක්ඛණසම්පන්නඤ්ච. පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහණා මජ්ඣෙ, මජ්ඣස්ස කති ලක්ඛණානි, මජ්ඣස්ස තීණි ලක්ඛණානි විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති. යඤ්ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති යඤ්ච සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති යඤ්ච එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහණා**

---

කීදෙනෙක්ද; ආදිස්ස, ආදිහුගේ; තීණි ලක්ඛණානි, ලක්ෂණයෝ තුන් දෙනෙකි; යො තස්ස පරිපන්ථො, ඒ ධ්‍යානයට යමෙක් පරිපන්ථද; තතො, ඒ පරිපන්ථයාකෙරෙන්; චිත්තං විසුජ්ඣති, චිත්තය විශුද්ධ වේ; විසුද්ධත්තා, විශුද්ධහෙයින්; චිත්තං, සිත; මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, මධ්‍යම සමථ නිමිත්තයට පැමිණේ; පටිපන්නත්තා, (එම සමථනිමිත්තයට) පිළිපන් හෙයින්; තත්ථ, ඒ මධ්‍යමසමථනිමිත්තයෙහි; චිත්තං පක්ඛන්දති, සිත වදී; පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, පරිපන්ථ ධර්මයන්කෙරෙන් චිත්තය විශුද්ධවෙයි යන; යඤ්ච, යමෙක් ඇද්ද; (සෙසුපෙදෙහිදු මෙසේ යොදා අර්ථ කියනු.)–ඉමානි තීණි ලක්ඛණානි, (පරිපන්ථයන්කෙරෙන් චිත්තයාගේ විසුජ්ඣනාකාරය මධ්‍යමසමථ නිමිත්තයට පිළිපදනාආකාරය එහි පක්ඛන්දනාකාරය යන) මේ තුන් දෙන ධ්‍යානයාගේ ආදියෙහි (උත්පාදක්ෂණයෙහි) අර්පණාප්‍රාප්ති ලක්ෂණයෝයි; (මේ ආකාර නැතිව අර්පණාවට පැමිණීමක් නැති හෙයින් අර්පණාවක් නැතහොත් ඒ ලක්ෂණයන් නොවනහෙයිනි.) පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය; ආදිකල්‍යාණඤ්චෙව හොති, (විශුද්ධප්‍රති පත්ති ඇතිබැවින්) ආදිකල්‍යාන නමුදු වෙයි; ලක්ඛණසම්පන්නඤ්ච (යථොක්ත ලක්ෂණයෙන් සමන්විතහෙයින්) ලක්ෂණසම්පන්න නමුදු වෙයි; (තෙන වුච්චති යි යොදනු–මෙම නයින් මධ්‍යමපර්‍ය්‍යවසාන ලක්ෂණයන්ගේද යොජනා දතයුතු.…පෙ.… විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, පටිපදාබලයෙන් පිරිසුදුවූසිත්හු (නැවත පිරිසුදුනොකොට හැකි බැවින් විශොධනයෙහි ව්‍යාපාර නොකරන්නේ) උපෙක්ෂා කෙරේ; සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, (සමථභාවයට පැමිණි හෙයින් නැවත සමාධානයෙහි ව්‍යාපාරනොකරන්නේ) සමථ ප්‍රති පන්නයා උපෙක්ෂාකෙරේ; එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති, (සමථ ප්‍රතිපන්න බැවින්ම කෙලෙශසංසර්ගය හැර එකත්වයෙන් වැටහුනු සමාධිහුගේ) නැවත එකත්තුපට්ඨානයෙහි ව්‍යපාර නොකරන්නේ උපෙක්ෂාකෙරේ…පෙ…තත්ථ ජාතානං ධම්මානං, එහි උපන් සමාධි

මජ්ඣෙ. මජ්ඣස්ස ඉමානි තීණි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං මජ්ඣෙ කල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං, පරියොසානස්ස කති ලක්ඛණානි, පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි. තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා තදුපගවිරිය වාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සම්පහංසනා, පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං, පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි, තෙන වුච්චති පඨමජ්ඣානං පරියොසාන කල්‍යාණඤ්චෙව හොති චතුලක්ඛණසම්පන්නඤ්චාති....

(අ) තත්‍ර පටිපදා විසුද්ධිනාම:–සසම්භාරිකො උපචාරො, උපෙක්ඛානුබ්‍රෑහණා නාම:– අප්පණා, සම්පහංසනා නාම:– පච්චවෙක්ඛනාති එව මෙකෙ වණ්ණයන්ති; යස්මා පන එකත්තගතං චිත්තං පටිපදාවිසුද්ධි පක්ඛන්තඤ්චෙව හොති උපෙක්ඛානුබ්‍රෑහිතඤ්ච, ඤාණෙන ච සම්ප

---

ප්‍රඥාසඞ්ඛ්‍යාත යුගනද්ධ ධර්මයන් ගේ; අනතිවත්තනට්ඨෙන, නොඉක්මෙන බැවින්; ඉන්ද්‍රියානං එකරසට්ඨෙන, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ (නානා ක්ලේශයන් කෙරෙන්) මුක්තබව හෙයින් විමුක්තිරසයෙන් එකරස බැවින්; තදුපගවිරියවාහනට්ඨෙන, ඒ අනතිවර්ත්තන ඒකරස භාව යට අනුරූපවූ වීර්‍ය්‍යපවත්වන හෙයින්; ආසෙවනට්ඨෙන, ආසෙවනාර්ථයෙන්....පෙ....

(අ) තත්‍ර, ඒපාළියෙහි; පටිපදා විසුද්ධිනාම, පටිපදාවිසුද්ධිනම්; සසම්භාරිකො, නානාවර්ජන පරිකර්මසහිතවූ; උපචාරො, එකාවර්ජනොපචාරය; (**සම්භරීයති ඣානං එතෙනාති සම්භාරො- නානාවජ්ජනපරිකම්මං, සහසම්භාරෙනාති සසම්භාරො සො එව සසම්භාරිකො**-යි ගන්නේ. ප්‍රථමාදි ධ්‍යානය පූර්වභාගභාවනායෙන්ම සාධිතබැවින් එකාවර්ජනොපචාරයෙහි සිද්ධවූ උපෙක්ෂා තොමෝ ධ්‍යානක්ෂණයෙහි පරිබ්‍රෑහිත නම් වේනුයි උපෙක්ඛානු බ්‍රෑහණාව අප්පණායි කීහු-ප්‍රතිලබ්ධධ්‍යානය නිසා වන යම් ප්‍රහෘෂ්ටාකාරයෙක් සිත්හුගේ පරිතොෂයෙක්- ඇද්ද ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් පවත්නා එ තොෂය සඳහා "සම්පහංසනා නාම පච්චවෙක්ඛනා"යි කීහු.) එවං, මෙසේ; එකෙ, අභයගිරි; නිවාසීහු; වණ්ණයන්ති, වර්ණනා කෙරෙත්; (එසේකල්හි අධ්‍යානධර්මයෙන් ධ්‍යානගුණ කියනලදනම් වනබැවින් ඔවුන් කියනු නොමැනවි-මෙම කීහ–"තථා හි සති අජ්ඣානධම්මෙහි ඣානස්ස ගුණසංකිත්තනං නාම කතං හොති නහි භුම්මන්තරං භුම්මන්තරපරියාපන්නං හොති"යි -පෙළහාද විරුද්ධවෙයි දක්වනුපිණිස "යස්මා පන" යනාදි කීහු.) යස්මා පන, යම්හෙයකින් වනාහි; එකත්තගතං චිත්තං, (ඉන්ද්‍රියයන්ගේ ඒකරසභාවයෙන්ද ඒකාග්‍රතාවගේ සිඛාප්‍රාප්තින්ද තදනුගුණවූ එකත්වාලම්බනයෙහි පැවති බැවින් එකත්වයටපැමිණි සම්ප්‍රයුක්තධර්ම යන් සහිතවූ) අර්පණාප්‍රාප්තචිත්තය; පටිපදාවිසුද්ධිපක්ඛන්තඤ්චෙව

හංසිතන්ති පාළියං වුත්තං, තස්මා අනන්තරා අප්පණායමෙව ආගමනවසෙන පටිපදාවිසුද්ධි. තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන උපෙක්ඛානුබ්‍රෑහණා ධම්මානං අනතිවත්තනාදිභාවසාධනෙන පරියොදපකස්ස ඤාණස්ස කිච්චනිප්ඵත්තිවසෙන සම්පහංසනා ච වෙදිතබ්බා. කථං යස්මිං හි වාරෙ අප්පණා උප්පජ්ජති තස්මිං යො නීවරණසඞ්ඛාතො කිලෙසගණො තස්ස ඣානස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති. විසුද්ධත්තා ආවරණවිරහිතං හුත්වා මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, මජ්ඣිමං සමථනිමිත්තං නාම සමප්පවත්තො අප්පණාසමාධියෙව. තදනන්තරං පන පුරිමචිත්තං එකසන්තතිපරිණාමනයෙන

---

හොති, (ප්‍රතිපත්තිවිසුද්ධිය තමා විසින් නිපදනාබැවින්) තෙමේ එයට වන්නමුදු වෙයි; උපෙක්ඛානුබ්‍රෑහිතං, උපෙක්ෂාව විසින් වඩනාලද නමුදු වෙයි; ඤාණෙන ච සම්පහංසිතන්ති, නුවණින්දු විසොධිතනමුදු වෙයි; පාළියං වුත්තං, පෙළෙහි කියනලද; තස්මා, එහෙයින්; අනන්තරා අප්පණායමෙව, ඇතුළු අර්පණාවෙහිම; ආගමනවසෙන, පරිකර්මාගමන විසින්; පටිපදාවිසුද්ධි, ප්‍රතිපත්තිවිශුද්ධිය; තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන, තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාවගේ කෘත්‍යවශයෙන්; උපෙක්ඛානුබ්‍රෑහණා, උපෙක්ෂානුබ්‍රෑහණාවද; ධම්මානං අනතිවත්තනාදි භාවසාධනෙන, ධර්මයන්ගේ අනතිවර්තනාදිභාවසාධනයෙන්; (ආදිග්‍රහණයෙන් ඉන්ද්‍රියෙකරසතා තදුපගවීර්‍යවාහණා ආසෙවනා යන මොවුන් ගත්හු. පරියොදපකස්ස ඤාණස්ස කිච්චනිප්ඵත්තිවසෙන, පිරිසිදුකරන (ප්‍රභාස්වරකරන යන අර්ථයි.) ඥානයාගේ කෘත්‍යනිෂ්පත්ති විසින්; (අනතිවර්තනාදි භාවසාධනයම ඥානයාගේ කෘත්‍යනිෂ්පත්තිනම් වෙයි දන්නේ.) සම්පහංසනා වෙදිතබ්බා, සම්පහංසනානම් වෙයි දතයුතු; කථං, කෙසේදයත්? යස්මිං හි වාරෙ,(සතර පස්සිතක්ඇති) යම් අර්පණා වාරයෙක්හි; අප්පණා උප්පජ්ජති, අර්පණා උපදීද; තස්මිං, ඒ වාරයෙහි; යො නීවරණසඞ්ඛාතො කිලෙසගණො, නීවරණසඞ්ඛ්‍යාතවූ යම් කෙලශගණයක්; තස්ස ඣානස්ස පරිපන්ථො, ඒ ධ්‍යානයට පරිපන්ථද; තතො චිත්තං විසුජ්ඣති, ඒපරිපන්ථයාකෙරෙන් චිත්තය විශුද්ධ වේ; විසුද්ධත්තා (අර්පණා විසුද්ධින්) විශුද්ධහෙයින්; ආවරණ විරහිතං හුත්වා, (යම් ආවරණයකින් ආවරිත චිත්තය පූර්වයෙහි මධ්‍යම ශමථනිමිත්තයට පැමිණෙනුවට නොපොහොස්ත්වීද එයින් වෙන්ව (ඔවුන් විසකම්භනයකොට යන අර්ථයි.) මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, මධ්‍යම සමථනිමිත්තයට පැමිණේ;(සම්ප්‍රවෘත්ත අර්පණාසමාධියම ලීනෞද්ධත්‍ය සඞ්ඛ්‍යාත අන්තවයට අනුපගමනයෙන් මධ්‍යමනමුදු සවිශෙෂ යෙන් ප්‍රත්‍යනීක ධර්මය ව්‍යුපශමයකරනහෙයින් ශමථ නමුදු යොගීහුගේ සුඛ විශෙෂයට කාරණහෙයින් නිමිත්ත නමුදු වේ-එයින්ම"මජ්ඣිම සමථ නිමිත්තං නාම සමප්පවත්තො අප්පණා සමාධියෙව" යි කීහු.) තද නන්තරං පන පුරිමචිත්තං, ඒ අර්පණාචිත්තයට අනන්තරප්‍රත්‍යයවූ පූර්ව චිත්තය; (ගොත්‍රභූ චිත්තය යන අර්ථයි.) එකසන්තතිපරිනාම නයෙන,

තථත්තං උපගච්ඡමානං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති නාම. එවං තාව පටිපන්නත්තා තථත්තුපගමනෙන තත්ථ පක්ඛන්දති නාම. එවං ච පුරිමචිත්තෙ විජ්ජමානාකාරනිප්ඵාදිකා පඨමස්ස ඣානස්ස උප්පාදක්ඛණෙයෙව ආගමනවසෙන පටිපදාවිසුද්ධි වෙදිතබ්බා. එවං විසුද්ධස්ස පන තස්ස පුන විසොධෙතබ්බාභාවතො විසොධනෙ ව්‍යාපාරං අකරොන්තො විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම. සමථභාවූපගමනෙන සමථපටිපන්නස්ස පුන සමාධානෙ ව්‍යාපාරං අකරොන්තො සමථපටිපන්නං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම. සමථපටිපන්නභාවතො එව චස්ස කිලෙස සංසග්ගං පහාය එකත්තෙන උපට්ඨිතස්ස පුන එකත්තුපට්ඨානෙ

---

(කිරිම දිහි නොවතුදු එකත්වනයින් කිරිම දිහි වෙයි යනුමෙන් ගොත්‍රභූ චිත්තයම අර්පණානොවතුදු) එකසන්තති පරිණාමනයින්; තථත්තං උපගච්ඡමානං, අර්පණාසමාධිබවට එළඹෙන්නේම; මජ්ඣිමං සමථ නිමිත්තං පටිපජ්ජති නාම, මධ්‍යම සමථ නිමිත්තයට පිළිපන්නා නම් වේ; එවං තාව පටිපන්නත්තා, මෙසේ පිළිපන් හෙයින්; තථත්තුපගමනෙන, එකෙණෙහි අර්පණා සමාධීන් සමාහිත භාවයට එළඹීමෙන්; තත්ථ පක්ඛන්දති නාම, (සෙස්සන් සෙයින් වදනාබවක් නැතද එකත්වනයින් අර්පණාසමාධි බවට එළඹෙන්නේම) අර්පණාසමාධියට වදනා නම්වේ; එවං, මෙසේ; පුරිමචිත්තෙ, (අර්පණාසිතට) පූර්වවූ (ගොත්‍රභූ) චිත්තයෙහි; විජ්ජමානාකාරනිප්ඵාදිකා, ඒ සිතෙහි විද්‍යමානවූ පරිපන්ථ විශුද්ධිය මධ්‍යමශමථප්‍රතිපත්තිය පක්ඛන්දනය යන ආකාරයෙන් නිපදනාවූ; (පටිපදා විසුද්ධි යොදනු.) පඨමස්ස ඣානස්ස උප්පාදක්ඛණෙයෙව, ප්‍රථමධ්‍යානයාගේ උත්පාදක්ෂණයෙහිම; ආගමනවසෙන, ආගමනවිසින්; පටිපදාවිසුද්ධි වෙදිතබ්බා, ප්‍රතිපත්ති විශුද්ධි දතයුතු; (ඒ ආකාරයෝ ප්‍රත්‍යය විශෙෂයෙන් ධ්‍යානක්ෂණයෙහි නිපන්නාහු පටිපදාවිශුද්ධියයි ලද සංඥා ඇත්තාහු ධ්‍යානයට ඒ විශෙෂයම නිපදවන්නවුන්මෙන් කියනලදහු.) එවං විසුද්ධස්ස පන තස්ස, මෙසේ විසුද්ධවූවනාහි සිත්හුගේ; පුන විසොධෙතබ්බාභාවතො, නැවත පිරිසිදු බවක් නැති බැවින්; විසොධනෙ ව්‍යාපාරං අකරොන්තො, සිත්හු පිරිසිදු කිරීමෙහි ව්‍යාපාරනොකරන්නේ; විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම, (තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාවගේ කෘත්‍ය වශයෙන් පුද්ගලතෙමේ) විශුද්ධචිත්තයෙහි මැදහත්වේ; සමථභාවූපගමනෙන, සමථභාවයට පැමිණීමෙන් සමථපටිපන්නස්ස, සමථයට පිළිපන්නහුට; පුන සමාධානෙ ව්‍යාපාරං අකරොන්තො, නැවත සමාධානයෙහි ව්‍යාපාර නොකරන්නේ; සමථපටිපන්නං චිත්තං අජ්ඣුපෙක්ඛති නාම, සමථ බවට පැමිණිසිත්හු කෙරෙහි මැදහත් නම් වේ; සමථපටිපන්නභාවතො එව, ශමථප්‍රතිපන්නබැවින්ම; කිලෙස සංසග්ගං පහාය එකත්තෙන උපට්ඨිතස්ස, (කෙසේනම් කෙලශසංසර්ගදුරුකෙරෙම්දෝ හෝයි පිළිපන්නාහට දූන් ශමථප්‍රතිපත්තින් ඒ කෙලශයන් පැහුණු හෙයින්) කෙලශසංසර්ගය නැතිබැවින් එකත්වයෙන් හුදකලාව පිහිටි; අස්ස, ඒ ධ්‍යානචිත්තයා; පුන එකත්තුපට්ඨානෙ ව්‍යාපාරං අකරොන්තො,

**ව්‍යාපාරං අකරොන්තො එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති නාම. එවං තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන උපෙක්ඛානුබ්‍රෑහණා වෙදිතබ්බා.**

**(අ) යෙ පනෙතෙ එවං උපෙක්ඛානුබ්‍රෑහිතෙ තත්ථ ජාතා සමාධිපඤ්ඤාසඞ්ඛාතා යුගනද්ධධම්මා අඤ්ඤමඤ්ඤං අනතිවත්තමානා හුත්වා පවත්තා, යානි ච සද්ධාදීනි ඉන්ද්‍රියානි නානාකිලෙසෙහි විමුත්තත්තා විමුත්තිරසෙන එකරසානි හුත්වා පවත්තානි, යඤ්චෙස තදුපගං තෙසං අනතිවත්තන එකරසභාවානං අනුච්ඡවිකං විරියං වාහයති, යා චස්ස තස්මිං ඛණෙ පවත්තා ආසෙවනා, සබ්බෙපි තෙ ආකාරා යස්මා ඤාණෙන සංකිලෙසවොදානෙසු තං තං ආදීනවඤ්ච ආනිසංසඤ්ච දිස්වා තථා**

---

නැවත එකත්වයෙන් තිබීමෙහි ප්‍රයොග නොකරන්නේ; **එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති නාම,** එකත්වයෙන් තිබීමෙහි මැදහත්නම් වේ; **එවං,** මෙසේ; **තත්‍ර මජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන,** තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාවගේ කෘත්‍යවශයෙන්; **උපෙක්ඛානුබ්‍රෑහණා වෙදිතබ්බා,** උපෙක්ෂාවගේ වැඩීම දතයුතු; (පරිපන්ථවිශුද්ධිය මජ්ඣිම සමථපටිපත්තිය පක්ඛන්දනය යන මෙහි අනුබ්‍රෑහිතධ්‍යානචිත්තයෙහි අවකාශ ලද තත්‍රමජ්ඣත්තුපෙක්ඛා තොමෝ සම්ප්‍රයුක්ත ධර්මයන් සමකොට පවත්වන්නී ඔවුන් වඩන්තියක මෙන් වේනුයි **"තත්‍ර මජ්ඣත්තුපෙක්ඛාය කිච්චවසෙන උපෙක්ඛානුබ්‍රෑහනා වෙදිතබ්බා"**යි කීහු.

**(අ) එවං,** මෙසේ; **උපෙක්ඛානුබ්‍රෑහිතෙ,** උපෙක්ෂාවෙන් වඩනාලද; **තත්ථ,** ඒ සමාධිචිත්තයෙහි; **ජාතා,** උපන්නාවූ; **සමාධිපඤ්ඤාසඞ්ඛාතා,** සමාධිය ප්‍රඥායයි කියනලද; **යෙ පනෙතෙ යුගනද්ධධම්මා,** යම් යුගයෙහි බඳයන්මෙන් සමවපවත්නා ධර්මකෙනෙක්ද යන අර්ථයි; **අඤ්ඤමඤ්ඤං අනතිවත්තමානා හුත්වා පවත්තා,** සමව පවත්නේම ඔවුනොවුන් නොඉක්ම පැවැත්තාහුද; **යානි ච සද්ධාදීනි ඉන්ද්‍රියානි,** යම් ශ්‍රද්ධාදී ඉන්ද්‍රියකෙනෙක්; **නානාකිලෙසෙහි විමුත්තත්තා,** නොයෙක් කෙලෙසුන්කෙරෙන් මුක්තබව හෙයින්; **විමුත්තිරසෙන එකරසානි හුත්වා පවත්තානි,** විමුක්තිකෘත්‍යයෙන් එක කෘත්‍යව, පැවැත්තාහුද; (සත්‍යයෙහි "කිලෙසි මුතුසහැවිනෙනි ඒ කිසහැවි ඇතියහ"යි කීහු.) **එස,** මේයොගීහි තෙමේ; (තදුපගං"යි සේයි) **තෙසං අනතිවත්තන එකරසභාවානං,** ඒ ඔවුනොවුන් නොඉක්මීමය එකකෘත්‍ය බවය යන මොවුන්ට, **අනුච්ඡවිකං විරියං වාහයති;** සුදුසුවූ වීර්‍ය්‍යපවත්වාද; **අස්ස,** ඒ ධ්‍යානචිත්තයාගේ; **තස්මිං ඛණෙ පවත්තා යා ච ආසෙවනා,** භඞ්ගක්ෂණයෙහි ප්‍රවෘත්ත යම් ආසෙවනාවක් ඇද්ද; (උත්පාදක්ෂණය ව්‍යතීත කල්හි ස්ථිතික්ෂණයෙහි පටන් ආසෙවනා තොමෝ "පවත්නා" නම් වේ.) **සබ්බෙපි තෙ ආකාරා,** අන්‍යොන්‍යානතිවර්තිතාදි වශයෙන් පවත්නා ඒ සියලු ආකාරයෝ; (ආසෙවනාවද ආසෙවනා භාවධර්මයන් පවත්නා ආකාරයෙක්මැයි) **යස්මා,** යම්හෙයකින්; **සංකිලෙසවොදානෙසු,** සංක්ලේශකර ව්‍යවදානකර ධර්මයන් කෙරෙහි, (සමාධි ප්‍රඥාවන්ගේ සමබව නොකිරීම භාවනාසංක්ලේශනම කිරීම ව්‍යවදාන

තථා සම්පහංසිතත්තා විසොධිතත්තා පරියොදපිතත්තා නිප්ඵන්නාව, තස්මා ධම්මානං අනතිවත්තනාදිභාවසාධනෙන පරියොදපකස්ස ඤාණස්ස කිච්චනිප්ඵත්තිවසෙන සම්පහංසනා වෙදිතබ්බාති වුත්තං, තත්ථ යස්මා උපෙක්ඛාවසෙන ඤාණං පාකටං හොති. යථාහ:-තථා පග්ගහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛති උපෙක්ඛාවසෙන, පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, උපෙක්ඛාවසෙන නානත්තකිලෙසෙහි චිත්තං විමුච්චති විමොක්ඛවසෙන, පඤ්ඤාවසෙනෙව පඤ්ඤින්ද්‍රියං

---

නම්-සෙසෙසහිදු මෙම නයයි.) තං තං ආදීනවඤ්ච, ඒ ඒ දොෂද; ආනිසංසඤ්ච, ගුණද; ඤාණෙන දිස්වා, පළමුකොට පාරිහාරික ප්‍රඥාවෙන් දැක; තථා සම්පහංසිතත්තා, (යම්සේ අන්‍යොන්‍යානතිවර්තතීනා දීහු වෙද්ද) එසේ එසේ සම්පහංසිත බැවින්; විසොධිතත්තා, එම නුවණින් විශොධිත බැවින්; පරියොදපිතත්තා, නිර්මලකළ බැවින්; නිප්ඵන්නාව, නිෂ්පන්නයෝද; තස්මා, එහෙයින්; ධම්මානං...පෙ... තබ්බාති වුත්තං-(යනු ලක්‍ෂණවර්ණනාවෙහි ආදියෙහි කීවාම නිගමන කොළෙ‍්‍ර්-ඒ ධ්‍යානක්‍ෂණයෙහිම ඇති උපෙක්ඛානු බ්‍රෑහණාව අවස නැයි නොකියා සම්පහංසනාව අවස නැයි කීමට කරුණු කිමයත්? "**තත්ථ යස්මා උපෙක්ඛාවසෙන ඤාණං පාකටං හොති තස්මා ඤාණකිච්චභූතා සම්පහංසනා පරියොසානං**"යි කරුණු දැක්වූහු.) තත්ථ, ඒ උපෙක්ඛානු බ්‍රෑහණසම්පහංසනයන් කෙරෙහි; යස්මා, යම්හෙයකින්; උපෙක්ඛාවසෙන, තත්‍රමජ්ඣත්තඋපෙක්ඛාව විසින්; ඤාණං පාකටං හොති, ඤාණය ප්‍රකටවේද;(තත්‍ර මජ්ඣත්තඋපෙක්‍ෂාව විසින් ද ධර්මයන් සමවාපවත්නා කල්හි සම්ප්‍රයුක්තඥානය පහන්ව ස්ඵුටවපවති යන අර්‍ථයි ) යථාහ, කියේමැයි; තථා පග්ගහිතං චිත්තං, (යම්සේ භාවනා චිත්තය කෞසීද්‍ය පක්‍ෂයෙහි නොහේද එසේ) වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගස්ථානීය ධර්මයන්ගේ බහුලීකරණයෙන් හුවනලද සිත්හු; සාධුකං අජ්ඣුපෙක්ඛති,(සමාධිවීර්‍ය්‍ය දෙදෙනාගේ සමබව කිරීමෙන් හුවනලද බැවින්) මනාකොටම මැදහත් වේ; උපෙක්ඛාවසෙන, උපෙක්‍ෂා සම්ප්‍රයුක්ත තත්‍රමජ්ඣත්තුපෙක්ඛා බැවිනි; පඤ්ඤාවසෙන, පූර්‍වයෙහි ප්‍රවෘත්තපාරිහාරික ප්‍රඥාවශයෙන්; පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, අර්පණාප්‍රඥාසඞ්ඛ්‍යාත ප්‍රඥෙන්ද්‍රියය තෙමේ අධිකප්‍රමාණවේ; (තෘත්‍යාධිකවේ යන අර්‍ථයි.)උපෙක්ඛාවසෙන, තත්‍ර මජ්ඣත්තුපෙක්ඛාව විසින්; නානත්තකිලෙසෙහි, නානාස්වභාව නීවරණ ප්‍රමුඛ කෙලශයන් කෙරෙන්; චිත්තං විමුච්චති,අර්පණාසිත මිදේ, විමොක්ඛවසෙන,[1] හෙද විමොක්‍ෂවශයෙනි; (ප්‍රඥාව අධිමාත්‍ර බැවින්ම උපෙක්‍ෂා වශයෙන් අධ්‍යුපෙක්‍ෂණය කරන්නහුගේ සිත කෙලෙසුන් කෙරෙන් මිදෙයි සේයි.) පඤ්ඤාවසෙන එව, පූර්‍වොක්ත පාරිහාරික ප්‍රඥාවශයෙන්ම, පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති; ප්‍රඥෙන්ද්‍රියය අධිකප්‍රමාණවේ; විමුත්තත්තා, නානා ස්වභාව කෙලශයන් කෙරෙන් විමුක්තහෙයින්ම;

---

1. විමුච්චනවසෙන-සන්න.

අධිමත්තං හොති විමුත්තත්තා තෙ ධම්මා එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනාති. තස්මා ඤාණකිච්චභූතා සම්පහංසනා පරියොසානන්ති වුත්තා.෴

(අ) ඉදානි පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණන්ති එත්ථ ගණනානුපුබ්බතා පඨමං, පඨමං උප්පන්නන්තිපි පඨමං. ආරම්මණූපනිජ්ඣානතො පච්චනීකජ්ඣාපනතො වා ඣානං, පඨවිමණ්ඩලම්පන සකලට්ඨෙන පඨවිකසිණන්ති වුච්චති. තං නිස්සාය පටිලද්ධනිමිත්තම්පි පඨවිකසිණං, නිමිත්තෙ පටිලද්ධඣානම්පි. තත්‍ර ඉමස්මිං අත්ථෙ ඣානං පඨවිකසිණන්ති වෙදිතබ්බං, තං සන්ධාය වුත්තං පඨමජ්ඣානං අධිගතං හොති පඨවිකසිණන්ති. එවං අධිගතෙ පන එතස්මිං තෙන යොගිනා වාලවෙධිනා විය සූදෙන විය ච ආකාරා පරිග්ගහෙතබ්බා. යථා හි

---

තෙ ධම්මා, ශ්‍රද්ධාදී ධර්මයෝ; (විශෙෂයෙන් ශ්‍රද්ධා ප්‍රඥා වීර්‍ය්‍ය සමාධීහු) එකරසා හොන්ති, එකකෘත්‍ය වෙත්; එකරසට්ඨෙන භාවනාති, එකරස හෙයින් භාවනායි; තස්මා, එහෙයින්; ඤාණකිච්චභූතා සම්පහංසනා, ඤාණයාගේ කෘත්‍යවූ සම්පහංසනා තොමෝ; පරියොසානන්ති වුත්තා, පර්‍ය්‍යවසානයයි කියන ලදු; (මෙසේ ත්‍රිවිධ ප්‍රතිපත්තිවිශුද්ධියෙන් ලද විශෙෂ ඇති ත්‍රිවිධවූ උපෙක්ෂානුබෘංහණයෙන් සාතිශය ප්‍රඥෙන්ද්‍රිය යාගේ අධිමාත්‍ර බැවින් චතුර්විධවූ සම්පහංසනා සිද්ධවෙතුයි ආගම නොපෙක්ෂාඥනකෘත්‍යවශයෙන් දශප්‍රකාරාකාරයෝ ධ්‍යානයෙහිම වෙති යි දතයුත්තාහුයි.෴

(අ) ඉදානි෴පෙ෴එත්ථ, මෙහි; ගණනානුපුබ්බතා, ගණනානුපුබ්බතා යයි සේයි; (ගණන් පිළිවෙළින් යන අර්ථයි.) පඨමං, ප්‍රථම නම් වේ; (මෙයින් දෙශනාක්‍රම දැක්වූහු.) පඨමං උප්පන්නන්තිපි පඨමං, පළමු කොට අධිගතනුයි හෝ ප්‍රථම නම්; (මෙයින් ප්‍රතිපත්තික්‍රම දැක්වූහු.) ආරම්මණූපනිජ්ඣානතො, පඨවිකිසුණු අරමුණු බලන හෙයින්ද; පච්චනීකජ්ඣාපනතො වා, ප්‍රතිපක්ෂනීවරණ ධර්මයන් දවන හෙයින්ද; ඣානං, ධ්‍යානනම්වේ; පඨවිමණ්ඩලං පන, පෘථිවිමණ්ඩලය වනාහි; සකලට්ඨෙන, (එක දෙශයක් අරමුණු නොකොට සියල්ලම අරමුණුකරන බැවින්) සකලාර්ථයෙන්; පඨවිකසිණන්ති වුච්චති, පඨවිකිසුණුයයි කියනු ලැබේ; තං නිස්සාය, ඒ පඨවිකිසුණ නිසා; පටිලද්ධ නිමිත්තම්පි, ප්‍රතිලබ්ධ නිමිත්තයද; පඨවිකසිණං, ("මඤ්චා ක්‍රොශන්ති" යනු මෙන්) පඨවිකසිණ නම් වේ; නිමිත්තෙ පටිලද්ධඣානම්පි, නිමිත්ත යෙහි පිළිලද ධ්‍යානයද; (තත්සාහචර්‍ය්‍යයෙන් "කුන්තා ප්‍රචරන්ති" යනු හෙයින්) පඨවිකිසුණු නම් වේ; තත්‍ර, එහි; ඉමස්මිං අත්ථෙ, මේ අර්ථයෙහි; ඣානං පඨවිකසිණන්ති වෙදිතබ්බං, ධ්‍යානය පෘථිවිකිසුණ යයි දතයුතු; තං සන්ධාය, ඒ ධ්‍යානය සඳහා; වුත්තං, කියනලදී; පඨම෴පෙ෴කසිණං යි–එවං අධිගතෙ, මෙසේ පැමිණෙනලද; එතස්මිං, මේ ධ්‍යන්හි; තෙන යොගිනා, ඒ යොගීහු විසින් වාලවෙධිනා විය (අනෙකධාභින්නවූ) වාලය විදිනහුමෙන්ද; සූදෙන වියච, භක්ත

සුකුසලො ධනුග්ගහො වාළවෙධාය කම්මං කුරුමානො යස්මිං වාරෙ වාළං විජ්ඣති, තස්මිං වාරෙ අක්කන්තපදානඤ්ච ධනුදණ්ඩස්ස ච ජියාය ච සරස්ස ච ආකාරං පරිග්ගණ්හෙය්‍ය එවං මෙ ඨිතෙන එවං ධනුදණ්ඩං එවං ජියං එවං සරං ගහෙත්වා වාළො විද්ධොති. සො තතො පට්ඨාය තථෙව තෙ ආකාරෙ සම්පාදෙන්තො අවිරාධෙත්වා වාළං විජ්ඣෙය්‍ය, එවමෙව යොගිනාපි ඉමං නාම මෙ භොජනං භුඤ්ජිත්වා එවරූපං පුග්ගලං සෙවමානෙන එවරූපෙ සෙනාසනෙ ඉමිනා නාම ඉරියාපථෙන ඉමස්මිං කාලෙ ඉදං අධිගතන්ති එතෙ භොජනසප්පායාදයො ආකාරා පරිග්ගහෙතබ්බා. එවං හි සො නට්ඨෙ වා තස්මිං තෙ ආකාරෙ සම්පාදෙත්වා පුන උප්පාදෙතුං අප්පගුණං වා පගුණීකරොන්තො පුනප්පුනං අප්පෙතුං සක්ඛිස්සති.--

---

කාරයා මෙන්ද; ආකාරා, ආකාරයෝ; පරිග්ගහෙතබ්බා, සැලකිය යුත්තාහුයි; යථා හි, යම්සේ; සුකුසලො ධනුග්ගහො, දක්ෂවූ දුනුවා තෙමේ; වාළවෙධාය කම්මං කුරුමානො, වාළවෙධය පිණිස අභියොග කරන්නේ; යස්මිං වාරෙ වාළං විජ්ඣති, යම් වාරයක වාළය විදීද; තස්මිං වාරෙ, ඒ වාරයෙහි; අක්කන්තපදානඤ්ච ඔසවාගත් පාදයන්ගේද; ධනුදණ්ඩස්ස ච, ධනුදීණ්ඩයාගේද; ජියාය ච, ජියාවගේද; සරස්ස ච, ශරයාගේද; ආකාරං පරිග්ගණ්හෙය්‍ය, ආකාරය සලකන්නේද; එවං ධනුදණ්ඩං, මෙසේ දුනුදඬු ගෙන; එවං ජියං, මෙසේ දුනුදිය ගෙන; එවං සරං ගහෙත්වා, මෙසේ ශරය ගෙන; එවං ඨිතෙන, මෙසේ සිටියාවූ; මෙ, මා විසින්; වාළො විද්ධොති, වාළය විදිනාලදැයි; ("ආකාරං පරිග්ගණ්හෙය්‍ය" යනු හා සම්බන්ධ කරනු.) සො, හෙතෙම; තතො පට්ඨාය, එතැන් පටන්; තථෙව, එසේම; තෙ ආකාරෙ සම්පාදෙන්තො, ඒ ආකාරයන් සපයන්නේ; අවිරාධෙත්වා වාළං විජ්ඣෙය්‍ය, නොවරදවා වාළය විදුනේද; එවමෙව, එපරිද්දෙන්ම; යොගිනාපි, යොගීහු විසිනුදු; ඉමං නාම භොජනං භුඤ්ජිත්වා, මෙනම් භොජනයක් වළඳා; එවරූපං පුග්ගලං සෙවමානෙන, මෙබඳුවූ පුගුලකු සෙවුනාවූ; මෙ මාවිසින්; එවරූපෙ සෙනාසනෙ, මෙබඳුවූ සෙනස්නෙහි; ඉමිනා නාම ඉරියාපථෙන, මෙබඳුවූ ඉරියවුවෙන්; ඉමස්මිං කාලෙ, මෙවෙනි කල; ඉදං අධිගතන්ති, මේ ධ්‍යන්අධිගතයයි; එතෙ භොජනසප්පායාදයො ආකාරා, මේ බොජුන් සැප ආදී ආකාරයෝ; පරිග්ගහෙතබ්බා, සැපවියයුත්තාහුයි; එවං හි, එසේ කල්හි; සො, ඒ යෝගීතෙමේ; තස්මිං, ඒ තරුණධ්‍යානය; නට්ඨෙ වා, නටකල්හි හෝ; තෙ ආකාරෙ සම්පාදෙත්වා, ඒ ආකාරයන් සපයා; පුන උප්පාදෙතුං, නැවත උපදවන්නටද; අප්පගුණං වා, නොපුහුණු ධ්‍යාන හෝ; පගුණීකරොන්තො, පුහුණු කරන්නේ; පුනප්පුනං අප්පෙතුං, නැවත නැවත අපුන් පමුණුවන්නට; සක්ඛිස්සති, පොහොසත්වී.--

(අ) යථා ච කුසලො සූදො භත්තාරං පරිවිසන්තො යං යං රුචියා භුඤ්ජති තං තං සල්ලක්ඛෙත්වා තතො පට්ඨාය තාදිසංයෙව තස්ස උපනාමෙන්තො ලාභස්ස භාගී හොති, එවමයම්පි අධිගතක්ඛණෙ භොජනාදයො ආකාරෙ ගහෙත්වා තෙ සම්පාදෙන්තො පුනප්පුනං අප්පණාය ලාභී හොති තස්මානෙන වාලවෙධිනා විය සූදෙන විය ච ආකාරා පරිග්ගහෙතබ්බා. වුත්තම්පිචෙතං භගවතා. "සෙය්‍යථාපි භික්ඛවෙ පණ්ඩිතො වියත්තො කුසලො සූදො රාජානං වා රාජමහාමත්තානං වා නානච්චයෙහි නානග්ගරසෙහි සූපෙහි පච්චුපට්ඨිතො අස්ස අම්බිලග්ගෙහිපි තිත්තකග්ගෙහිපි කටුකග්ගෙහිපි මධුරග්ගෙහිපි ඛාරිකෙහිපි අඛාරිකෙහිපි ලොණිකෙහිපි අලොණිකෙහිපි, ස ඛො සො භික්ඛවෙ

---

(අ) යථා ච, යම්සේ; කුසලො සූදො, දක්ෂවූ සූදතෙමෙ; භත්තාරං පරිවිසන්තො, ස්වාමීහු වළඳවන්නේ; යං යං රුචියා භුඤ්ජති, යමක් යමක් රුචිව වළඳද; තං තං සල්ලක්ඛෙත්වා, ඒ ඒ සලකා; තතො පට්ඨාය, එතැන් පටන්; තාදිසංයෙව, එබඳුවූවාම; තස්ස උපනාමෙන්තො, උහුට එළවන්නේ; ලාභස්ස භාගී හොති, ලාභයට හිමිවේද; එවං, එපරිද්දෙන්ම; අයම්පි, මෙද; අධිගතක්ඛණෙ, අධිගත කාලයෙහි; භොජනාදයො ආකාරෙ ගහෙත්වා, භොජනාදී ආකාරයන් සලකා; තෙ සම්පාදෙන්තො, ඔවුන් සපයනුයේ; පුනප්පුනඅප්පණාය ලාභී හොති, නැවත නැවත අර්පණාව ලැබෙන්නේවේ; තස්මා, එහෙයින්; අනෙන, මේ යොගීහි විසින්; වාලවෙධිනා විය, වාලය විදුනහු මෙන්ද; සූදෙනවිය ච, සූදයා මෙන්ද; ආකාරා පරිග්ගහෙතබ්බා, ආකාරයෝ සැලකිය යුත්තාහුයි; වුත්තම්පිචෙතං භගවතා, භාගවතුන් විසින් මේ කියන ලද මැයි; සෙය්‍යථාපි, යම්සේ; භික්ඛවෙ, මහණෙනි; පණ්ඩිතො, (සූපශාස්ත්‍ර පරිචයෙන්) පණ්ඩිතවූ; වියත්තො, (එහි විශදඥාන ඇති බැවින්)ව්‍යක්තවූ; කුසලො, (ස්ථානොත්පත්තික කෞශල්‍ය යොගයෙන්) කුශලවූ; සූදො, අරක්කැමිතෙමෙ; රාජානං වා, රජදරුවන්ට හෝ; රාජමහාමත්තානං වා, රාජමහාමාත්‍යයන්ට හෝ; ("නානග්ගරසෙහි සූපෙහි"යි පොත්හි ලියති "නානච්චයෙහි" යනු පාඨයි-එහෙයින්ම සන්න්‍යෙයෙහි-නානච්චයෙහි, නොයෙක්විධි ඇතියෙන් මැනො-එක් අරිය ඇතියෙන් යෙති වෙයි කීහු-ටීකාවෙහිද "නානච්චයෙහීති" නානාසභාවෙහි-නානා රසෙහීති අත්ථො-යි කීහු. නොයෙක් රස ඇති සූපයෙන් යන අර්ථයි.) පච්චුපට්ඨිතො අස්ස, එළඹ සිටියේවේද; අම්බිලග්ගෙහිපි, (ඇඹුල්කොට සිතිදු) උතුම් ඇඹුල්රසයෙන් හෝ; තිත්තකග්ගෙහිපි, සුදුකොට සිතිදු; කටුකග්ගෙහිපි, කුළුකොට සිතිදු; මධුරග්ගෙහිපි, මිහිරුකොට සිතිදු; ඛාරිකෙහිපි, (කරබටු කිලිල් ආදි) ක්ෂාරද්‍රව්‍යමුසුරෙසනුදු; අඛාරිකෙහිපි, ක්ෂාරද්‍රව්‍ය නොමුසු රෙසෙනුදු; ලොණිකෙහිපි, ලුණුමුසු රෙසෙනුදු; අලොණිකෙහිපි, ලුණු නොමුසු රෙසෙනුදු; ("පච්චුපට්ඨිතො අස්ස"යි යොදනු. "සබ්බොසො" යනු යෙහි "සො ඛො එසො" යන අර්ථයි.—පෙ.—

පණ්ඩිතො ව්‍යත්තො කුසලො සූදො සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති:-ඉදං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති, ඉමස්ස වා අභිහරති, ඉමස්ස වා බහුං ගණ්හාති, ඉමස්ස වා වණ්ණං භාසති, අම්බිලග්ගං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති, අම්බිලග්ගස්ස වා අභිහරති, අම්බිලග්ගස්ස වා බහුං ගණ්හාති, අම්බිලග්ගස්ස වා වණ්ණං භාසති…පෙ…අලොණිකස්ස වා වණ්ණං භාසතීති. ස ඛො සො භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො කුසලො සූදො ලාභී චෙව හොති අච්ඡාදනස්ස, ලාභී වෙතනස්ස, ලාභී අභිහාරානං, තං කිස්ස හෙතු? තථා හි සො භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො කුසලො සූදො සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති, එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පණ්ඩිතො ව්‍යත්තො කුසලො භික්ඛු කායෙ කායානුපස්සී විහරති…පෙ…වෙදනාසු- චිත්තෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො චිත්තං සමාධියති, උපක්කිලෙසා පහීයන්ති,

---

සකස්ස භත්තු, ස්වකීයවූ භර්තෘහුගේ; නිමිත්තං උග්ගණ්හාති, රුස්ව වළඳන ආකාරය සලකා; මෙ භත්තු, මාගේ ස්වාමිහට; අජ්ජ, අද; ඉදං සූපෙය්‍යං රුච්චති, මේ මාළුව රුචිකරයි; ඉමස්ස වා අභිහරති, මේ මාළුවට අත එළවයි; (නොහොත් වළඳයි "ඉමං වා අභ්‍යවහරති" යන අර්ථයි.) ඉමස්ස වා බහුං ගණ්හාති, මෙයින් හෝ බොහෝකොටගන්නී; ඉමස්ස වා වණ්ණං භාසති, මොහුගේ හෝ ගුණ කියයි; ("මෙ භත්තු අජ්ජ අම්බිලග්ගං වා සූපෙය්‍යං රුච්චති"යි යොදනු…පෙ… ලාභී චෙව හොති අච්ඡාදනස්ස, හඳනා පිළී හෝ ලැබෙයි; ලාභී වෙතනස්ස, තමාගේ වැඩුම හෝ ලැබේ; ලාභී අභිහාරානං, අභිහාරයන් හෝ; ලැබෙයි; තං කිස්ස හෙතු, එයට හෙතු කිම; තථා හි, එසේ මැනු …පෙ…එවමෙව ඛො, එසේම; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි; පණ්ඩිතො, නුවණැති; ව්‍යත්තො, ව්‍යක්තවූ; කුසලො, දක්‍ෂවූ; එකච්චො භික්ඛු, ඇතැම් මහණෙක්තෙමේ; කායෙ, (කුත්සිතවූ කෙශලොමාදිවූ සමූහසඞ්ඛ්‍යාත)රූපකායයෙහි; කායානුපස්සී, කෙශාදී ධර්මසමූහය බලනුයේ; විහරති, වෙසේ; වෙදනාසු, වෙදනාවන් කෙරෙයි; චිත්තෙ, චිත්තයෙහි; ධම්මෙසු (ස්පර්ශාදී සෙසු)ධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, ධර්මයන් බලනුයේ; විහරති, වෙසේ; ආතාපී, කෙලෙසුන් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූයේ; සම්පජානො, ධර්මපරිග්‍රාහකවූ ඥානයෙන් යුක්තවූයේ; සතිමා, ධර්මපරිග්‍රාහකවූ ස්මෘතියෙන් යුක්තවූයේ; ලොකෙ, ධර්මසඞ්ඛ්‍යාත ලොකයෙහි; අභිජ්ඣාදොමනස්සං විනෙය්‍ය; අභිධ්‍යාදෞර්මනස්‍යයන් දුරුකොට; ("විහරති"යි යොදනු.) ධම්මෙසු ධම්මානුපස්සිනො, ධර්මයන් කෙරෙහි ධර්මානුදර්ශීශීව; විහරතො තස්ස, වසන්නාවූ ඔහුගේ; චිත්තං, සිත; සමාධියති, සමාහිතවේ; උපක්කිලෙසා පහීයන්ති, උපක්ලෙශයෝ පැහෙත්; සො, හෙතෙමේ; තං

සො තං නිමිත්තං උග්ගණ්හාති. ස ඛො සො භික්ඛවෙ පණ්ඩිතො වියත්තො කුසලො භික්ඛු ලාභී චෙව හොති දිට්ඨධම්මසුඛවිහාරස්ස, ලාභී සතිසම්පජඤ්ඤස්ස, තං කිස්ස හෙතු? තථා හි සො භික්ඛවෙ පණ්ඩිතො වියත්තො කුසලො භික්ඛු සකස්ස චිත්තස්ස නිමිත්තං උග්ගණ්හාතී"ති…

(අ) නිමිත්තග්ගහණෙන චස්ස පුන තෙ ආකාරෙ සම්පාදයතො අප්පණාමත්තමෙව ඉජ්ඣති න චිරට්ඨානං, චිරට්ඨානං පන සමාධිපරිපන්ථානං ධම්මානං සුවිසොධිතත්තා හොති යො හි භික්ඛු කාමාදීනවපච්චවෙක්ඛණාදීහි කාමච්ඡන්දං න සුට්ඨු වික්ඛම්භෙත්වා කායපස්සද්ධිවසෙන කායදුට්ඨුල්ලං න සුප්පටිප්පස්සද්ධං කත්වා ආරම්භධාතුමනසිකාරාදිවසෙන ථිනමිද්ධං න සුට්ඨු පටිවිනොදෙත්වා සමථනිමිත්තමනසිකාරාදිවසෙන උද්ධච්චකුක්කුච්චං න සුසමූහතං කත්වා අඤ්ඤෙපි සමාධිපරිපන්ථෙ

---

නිමිත්තං උග්ගණ්හාති, මාගේ සිත මෙසේ සමාහිතවීයයි සමාහිතාකාරය සලකා…පෙ…ලාභී චෙව හොති දිට්ඨධම්මසුඛවිහාරස්ස, දෘෂ්ට ධර්මසුඛවිහාරයනුදු ලබන්නේය; ලාභී සතිසම්පජඤ්ඤස්ස, සිහිනුවණද ලබන්නේයි…පෙ…සකස්ස චිත්තස්ස, සවකීයවූ චිත්තයාගේ;

(අ) නිමිත්තග්ගහණෙන ච, ආකාරපරිග්‍රහයෙනුදු; පුන තෙ ආකාරෙ සම්පාදයතො, නැවත ඒ ආකාරයන් සම්පාදනය කරන; අස්ස, මේ යොගීහට; අප්පණාමත්තමෙව ඉජ්ඣති, අර්පණාපමණක්ම සිද්ධවෙයි; න චිරට්ඨානං, (ධ්‍යානහුගේ) චිරස්ථිතිය සිද්ධනොවේ; චිරට්ඨානං පන, චිරස්ථිතිය වනාහී; සමාධිපරිපන්ථානං ධම්මානං, සමාධියට පරිපන්ථවූ නීවරණදමුන්; සුවිසොධිතත්තා හොති, මනාකොට ශුද්ධකළබව හෙයින් වේ; යො හි භික්ඛු, යම් මහණෙක්; ("ඣානං සමාපජ්ජති" යනු හා යොදනු.) කාමාදීනවපච්චවෙක්ඛණාදීහි, කාමයෙහි ආදීනව පස්විකීම් ආදියෙන්; (ආදිග්‍රහණින් අශුභ මනස්කාර ගන්නා ලැබේ.) කාමච්ඡන්දං න සුට්ඨු වික්ඛම්භෙත්වා, කාමච්ඡන්දය මනාකොට විෂ්කම්භනය නොකොට; කායපස්සද්ධිවසෙන කායපස්සද්ධි විසින්; කායදුට්ඨුල්ලං, කාය පීඩාව; (කායදරථය) න සුප්පටිප්පස්සද්ධං කත්වා, මනාකොටම නොසංසිඳුවා; (මෙයින් කායචිත්තයන්ගේ සංරබ්ධභාවයට නිමිත්තවූ ව්‍යාපාදනීවරණහු අශොධිතබව කීහු.) ආරම්භධාතු මනසිකාරාදිවසෙන, ආරම්භධාතු මෙනෙහි කිරීම් ආදි විසින්; (ආදිග්‍රහණින් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයට නිමිත්තවූ ආලොකසංඥා ආදීන්ගේ සඞ්ග්‍රහය දතයුතු;) ථිනමිද්ධං න සුට්ඨු පටිවිනොදෙත්වා, ථිනමිද්ධය මනාකොට බහා නොතබා; සමථනිමිත්තමනසිකාරාදිවසෙන, සමථනිමිත්ත මෙනෙහි කිරීම් ආදි විසින්; (ආදි ග්‍රහණින් සමාධිසම්බොධ්‍යඞ්ගස්ථානීය දමුන්ගේ සඞ්ග්‍රහය දතයුතු.) උද්ධච්චකුක්කුච්චං, උදස් කුකුස්දෙක; න සුසමූහතං කත්වා, මනාකොට නොනසා; අඤ්ඤෙපි සමාධිපරිපන්ථෙ ධම්මෙ, සෙසු විචිකිත්සාස්ථානීය

ධම්මෙ න සුට්ඨු සොධෙත්වා ඣානං සමාපජ්ජති, සො අසොධිතං ආසයං පවිට්ඨභමරො විය අසුද්ධං උය්‍යානං පවිට්ඨරාජා විය ච ඛිප්පමෙව නික්ඛමති. යො පන සමාධිපරිපන්ථෙ ධම්මෙ සුට්ඨු විසොධෙත්වා ඣානං සමාපජ්ජති, සො සුවිසොධිතං ආසයං පවිට්ඨභමරො විය සුපරිසුද්ධං උය්‍යානං පවිට්ඨරාජා විය ච සකලම්පි දිවසභාගං අන්තොසමාපත්තියං යෙව හොති. තෙනාහු පොරාණා–

152 කාමෙසු ඡන්දං පටිඝං විනොදයෙ
උද්ධච්චමිද්ධං විචිකිච්ඡ පඤ්චමං,
විවෙකපාමුජ්ජකරෙන චෙතසා
රාජාව සුද්ධන්තගතො තහිං රමෙති–

(අ) තස්මා චිරට්ඨිතිකාමෙන පාරිපන්ථිකධම්මෙ සොධෙත්වා ඣානං සමාපජ්ජිතබ්බං, චිත්තභාවනා වෙපුල්ලත්ථඤ්ච යථා ලද්ධං පටිභාග

---

මදනිම්මදනාදිවූ සමාධිපරිපන්ථධර්මයන්; න සුට්ඨු සොධෙත්වා, මනා කොට පරිශුද්ධ නොකොට; ඣානං සමාපජ්ජති, ධ්‍යාන් සමවදීද; සො, හෙතෙම; අසොධිතං ආසයං පවිට්ඨභමරො විය, අශොධිතවූ ආසයටවන් බමරකු මෙන්; අසුද්ධං උය්‍යානං පවිට්ඨරාජා විය ච, අශුද්ධ උයනට වන් රජහුමෙන්ද; ඛිප්පමෙව නික්ඛමති, වහාම නික්මේ (ධ්‍යානින් නැගේ); යො පන, යමෙක් වනාහි; සමාධිපරිපන්ථෙ ධම්මෙ, සමාධියට පරිපන්ථවූ නීවරණධර්මයන්; සුට්ඨු විසොධෙත්වා, මනා කොට පිරිසුදුකොට; ඣානං සමාපජ්ජති, ධ්‍යානයට සමවදීද; සො, හෙතෙම; සුවිසොධිතං ආසයං පවිට්ඨභමරො විය, මනාකොටම පිරිසුදුකළ ආසයටවන් බමරකු මෙන්ද; සුපරිසුද්ධං උය්‍යානං පවිට්ඨරාජා විය ච, ඉතා පිරිසුදු උයනටවන් රජහුමෙන්ද; සකලම්පි දිවසභාගං, සියලු දිවසභාගය; අන්තොසමාපත්තියං යෙව හොති, ඇතුළු සමවත් හිම වෙයි; තෙනාහු පොරාණා, එහෙයින් කීහු පුරාතනයෝ–

152. කාමෙසු ඡන්දං, කාමච්ඡන්දයද; පටිඝං, ව්‍යාපාදයද; විනොදයෙ, දුරුකරන්නේයි; ("උද්ධච්චමිද්ධං" යනු යෙහි තදෙකසෙසබැවින් උද්ධච්චගහණින් කුක්කුච්චයද මිද්ධගහණින් ථිනයද ගන්නා ලැබෙයි දන්නේ.) උද්ධච්චකුක්කුච්ච දෙකද; ථිනමිද්ධ දෙකද; ("විචිකිච්ඡ පඤ්චමං" සී කීතැති.) පස්වනුවූ විචිකිත්සාවද; විනොදයෙ, දුරුකරන්නේය; විවෙකපාමුජ්ජකරෙන, විවෙකජවූ ප්‍රීතිය උපදවන; චෙතසා, සිතින්; තහිං, ඒ අර්පණාධ්‍යාන්හි; සුද්ධන්තගතො රාජාව, පිරිසුදුවූ කොණපර්‍ය්‍යන්ත ඇති උයනට වන් රජහුමෙන්; රමෙ, ඇලෙන්නේයි–

(අ) තස්මා, එහෙයින්; චිරට්ඨිතිකාමෙන, චිරස්ථිති කැමැත්තහු විසින්; පාරිපන්ථිකධම්මෙ සොධෙත්වා, පරිපන්ථදමුන් සෝද; ඣානං සමාපජ්ජිතබ්බං, ධ්‍යාන්සමවැද්ද යුතු; චිත්තභාවනා වෙපුල්ලත්ථඤ්ච, සමාධි භාවනාවගේ විපුලබව පිණිසද; (අභිඥාව විසින් මහත්බව පිණිසද යන අර්ථයි.) යථා ලද්ධං පටිභාගනිමිත්තං, (කුඩු මහත් විසින්

නිමිත්තං වඩ්ඪෙතබ්බං, තස්ස ද්වෙ වඩ්ඪනා භූමියො:- උපචාරං වා අප්පනා වා, උපචාරං පත්වා පි හි තං වඩ්ඪෙතුං වට්ටති, අප්පනං පත්වාපි එකස්මිං පන ඨානෙ අවස්සං වඩ්ඪෙතබ්බං. තෙන වුත්තං:- යථාලද්ධං පටිභාගනිමිත්තං වඩ්ඪෙතබ්බන්ති. තත්‍රායං වඩ්ඪනා නයො:- තෙන යොගිනා තං නිමිත්තං පත්තවඩ්ඪන පූවවඩ්ඪන භත්තවඩ්ඪන ලතාවඩ්ඪන දුස්සවඩ්ඪන යොගෙන අවඩ්ඪෙත්වා යථා නාම කස්සකො කසිතබ්බට්ඨානං නඞ්ගලෙන පරිච්ඡින්දිත්වා පරිච්ඡෙදබ්භන්තරෙ කසති, යථා වා පන භික්ඛූ සීමං බන්ධන්තා පඨමං නිමිත්තානි සල්ලක්ඛෙත්වා පච්ඡා බන්ධන්ති, එවමෙව තස්ස යථා ලද්ධස්ස නිමිත්තස්ස අනුක්කමෙන එකඞ්ගුල ද්වඞ්ගුල තිවඞ්ගුල චතුරඞ්ගුලමත්තං මනසා පරිච්ඡින්දිත්වා පරිච්ඡින්දිත්වා යථා පරිච්ඡෙදං වඩ්ඪෙතබ්බං, අපරිච්ඡින්දිත්වා පන න වඩ්ඪෙතබ්බං. තතො විදත්ථිරතනපමුඛපරිවෙණවිහාරසීමානං

---

හෝ උපචාරභූමි අර්පණාභූමි විසින් හෝ) ලද යම් පිළිබා නිමිත්තක්; වඩ්ඪෙතබ්බං, වැඩිය යුතු; තස්ස, ඒ පිළිබා නිමිත්හුගේ; වඩ්ඪනා භූමියො, වඩනා භූමීහු; ද්වෙ, දෙදෙනෙකි; උපචාරං වා, උපචාර හෝය; අප්පනා වා, අර්පණා හෝයි; (මෙසේ භූමි දෙදෙනෙකි.) උපචාරං පත්වාපි හි, උපචාරයට පැමිණැද; තං, හේ; වඩ්ඪෙතුං වට්ටති, වඩන්නට වටී; අප්පනං පත්වාපි, අර්පණාවට පැමිණැද වටී; එකස්මිං පන ඨානෙ, එක් තැනෙක වනාහි; අවස්සං වඩ්ඪෙතබ්බං, අවශ්‍යයෙන් වැඩියයුතු.... පෙ.... (තත්‍රායං වඩ්ඪනා නයො යනුයෙහි "තත්‍ර" යනු "තස්ස" යි ගන්නේ.) ඒ පිළිබා නිමිත්හුගේ මේ වඩනක්‍රමයයි; තෙන යොගිනා, ඒ යොගීහු විසින්; තං නිමිත්තං; ඒ නිමිත්ත; පත්තවඩ්ඪනයොගෙන, (පා උකහන කුඹල්හු පළමු නොපිරිසිඳ) මතුමත්තට පා වඩන යුක්තියෙන්; (සෙසු පෙදෙහි වෙනවෙන යොගශබ්ද යෙදියයුතුයි.) පූවවඩ්ඪන; (මැදසිට සිසාරා) පූව වඩනසෙයින්; භත්තවඩ්ඪන, (බත් මත්තෙහි බත්ලා) බත් වඩනුවනු සෙයින්; ලතාවඩ්ඪන, (කෙළවරකින් දික්ව) ලිය වැඩෙන සෙයින්; දුස්සවඩ්ඪනයොගෙන, (උපන් පිළී තෙත්කොට ලූහුබුකඩහයා) දික්වඩන්නාක් සෙයින්; අවඩ්ඪෙත්වා, නොවඩා; යථා නාම, යම්සේ; කස්සකො, සහනගොවි තෙමේ; කසිතබ්බට්ඨානං, සී සෑයුතු තැන; නඞ්ගලෙන පරිච්ඡින්දිත්වා, නගුලෙන් පිරිසිඳ (අතුරු අවුළුවා); පරිච්ඡෙදබ්භන්තරෙ කසති, පරිච්ඡෙදය ඇතුළත සෙහෙනෙද; යථා වා පන, යම්සේ; සීමං බන්ධන්තා භික්ඛූ, සිම් බඳනා මහණනු; පඨමං, පළමුකොට; නිමිත්තානි සල්ලක්ඛෙත්වා, නිමිත්සලකා; පච්ඡා බන්ධන්ති, පසුව බඳිද්ද; එවමෙව, එසේම; එතස්ස යථා ලද්ධස්ස නිමිත්තස්ස, මෙ යතලද නිමිත්හුගේ; අනුක්කමෙන, පිළිවෙළින්; එකඞ්ගුල, එකඟුලක්; ද්වඞ්ගුල, දෙඅඟුලක්; තිවඞ්ගුල, තුනඟුලක්; චතුරඞ්ගුලමත්තං, සතරඟුලක් පමණ; මනසා, සිතින්; පරිච්ඡින්දිත්වා පරිච්ඡින්දිත්වා, පිරිසිඳ පිරිසිඳ; යථාපරිච්ඡෙදං, පරිච්ඡෙද පමණින්; වඩ්ඪෙතබ්බං, වැඩියයුතු; අපරිච්ඡින්දිත්වා පන න වඩ්ඪෙතබ්බං, (නොපිරිසිඳ වඩවනු

ගාමනිගමජනපදරජ්ජසමුද්දසීමානඤ්ච පරිච්ඡෙදවසෙන වඩ්ඪෙන්තෙන චක්කවාළපරිච්ඡෙදෙන වා තතො වාපි උත්තරිං පරිච්ඡින්දිත්වා වඩ්ඪෙතබ්බං. යථා හි හංසපොතකා පක්ඛානං උට්ඨිතකාලතො පට්ඨාය පරිත්තං පරිත්තං පදෙසං උප්පතන්තා පරිචයං කත්වා අනුක්කමෙන චන්දිමසූරියසන්තිකං ගච්ඡන්ති, එවමෙව භික්ඛු වුත්තනයෙන නිමිත්තං පරිච්ඡින්දිත්වා වඩ්ඪෙන්තො යාව චක්කවාළපරිච්ඡෙදා තතො වා උත්තරිං වඩ්ඪෙති, අථස්ස තං නිමිත්තං වඩ්ඪිතවඩ්ඪිතට්ඨානෙ පථවියා උක්කූලවික්කූලනදීවිදුග්ගපබ්බතවිසමෙසු සඞ්කුසතසමබ්භාහතං වසභචම්මං විය හොති. තස්මිං පන නිමිත්තෙ පත්තපඨමජ්ඣානෙන ආදිකම්මිකෙන සමාපජ්ජනබහුලෙන භවිතබ්බං, න පච්චවෙක්ඛනබහුලෙන, පච්චවෙක්ඛනබහුලස්ස හි ඣානඞ්ගානි ථූලානි දුබ්බලානි

---

හට නොවඩනා බැවින්) නොපිරිසිඳ නොවැඩියයුතු; තතො, ඉක්බිත්තෙන්; විදත්ථි, වියතෙක; රතන, රියනෙක; පමුඛ,නිසවත්න; පරිවෙණ, පිරිවෙන; විහාරසීමානං, විහාරසීමා යන මොවුන්ගේද; ගාම, ගම්ය; නිගම, නියම්ගම්ය; ජනපද, දනව්ය; රජ්ජ, රජය; සමුද්දසීමානඤ්ච, සමුද්‍රසීමාය යන මොවුන්ගේද; පරිච්ඡෙදවසෙන, පරිච්ඡෙදවශයෙන්; වඩ්ඪෙන්තෙන, වඩන්නහු විසින්; චක්කවාළ පරිච්ඡෙදෙන වා, සක්වළපරිච්ඡෙදයෙන් හෝ; තතො වාපි උත්තරිං, එයින් මත්තෙහිදු; පරිච්ඡින්දිත්වා, පිරිසිඳ; වඩ්ඪෙතබ්බං, වැඩියයුතු; යථා හි, යම්සේ; හංසපොතකා, ජවනහංසපොතකයෝ; පක්ඛානං උට්ඨිතකාලතො පට්ඨාය, පියාපත් නැගිතැන් පටන්ගෙන; පරිත්තං පරිත්තං පදෙසං උප්පතන්තා, මඳ මඳ පෙදෙසක් නැගෙන්නාහු; පරිචයං කත්වා, පරිචයකොට; අනුක්කමෙන, ක්‍රමයෙන්; චන්දිමසූරිය සන්තිකං ගච්ඡන්ති, හිරසඳසමීපයට යෙත්ද; එවමෙව, එපරිද්දෙන්ම; භික්ඛු, මහණතෙමෙ; වුත්තනයෙන, කීනියෙන්; නිමිත්තං, නිමිත්ත; පරිච්ඡින්දිත්වා වඩ්ඪෙන්තො, පිරිසිඳවඩන්නේ; යාව චක්කවාළ පරිච්ඡෙදා, සක්වළපරිච්ඡෙදය දක්වා; තතො වා උත්තරිං, එයින් වැඩියක්ද; වඩ්ඪෙති, වඩන්නේය; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ යොගීහට; තං නිමිත්තං, ඒ නිමිත්; වඩ්ඪිතවඩ්ඪිතට්ඨානෙ, වැඩුවැඩූ තැන; පථවියා, පොළොව; උක්කූලවික්කූලනදීවිදුග්ගපබ්බතවිසමෙසු, ගොඩය වළය නදීවිෂමය පර්වතවිෂමය යන මෙහි; සඞ්කුසතසමබ්භාහතං, සඞ්කුසතයෙන් හයාපහරනලද; වසභචම්මං විය, වෘෂභචර්මයක් මෙන්; හොති, වන්නේය; තස්මිං පන නිමිත්තෙ, ඒ නිමිත්හි වනාහි; පත්තපඨමජ්ඣානෙන, පැමිණි ප්‍රථමධ්‍යාන ඇති; ආදිකම්මිකෙන, ආදි කර්මිකයා විසින්; සමාපජ්ජනබහුලෙන භවිතබ්බං, සමවැදුම් බහුලවිය යුතුය; න පච්චවෙක්ඛනබහුලෙන, පස්විකුම් බහුලනොවිය යුතු; පච්චවෙක්ඛනබහුලස්ස හි, පස්විකුම් බහුලයහට; ඣානඞ්ගානි, ධ්‍යානාඞ්ගහු; ථූලානි හුත්වා, (ප්‍රත්‍යවෙක්ෂාබලයෙන් විභූතවන බැවින්) ඖදාරිකව, දුබ්බලානි, (ප්‍රගුණබලව භාවයට නොපැමිණිහෙයින්)

හුත්වා උපට්ඨහන්ති. අථස්ස තානි එවං උපට්ඨිතත්තා උපරි උස්සුක්කනාය පච්චයතං ආපජ්ජන්ති, සො අප්පගුණෙ ඣානෙ උස්සුක්කමානො පඨමජ්ඣානා ච පරිහායති, න ච සක්කොති දුතියං පාපුණිතුං. තෙනාහ භගවා–

(අ) "සෙය්‍යථාපි භික්ඛවෙ ගාවී පබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං, තස්සා එවමස්ස:- යන්නූනාහං අගතපුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං, අඛාදිතපුබ්බානි චෙව තිණානි ඛාදෙය්‍යං, අපීතපුබ්බානි ච පානීයානි පිවෙය්‍යන්ති. සා පුරිමං පාදං න සුප්පතිට්ඨිතං පතිට්ඨපෙත්වා පච්ඡිමං පාදං උද්ධරෙය්‍ය, සා න චෙව අගතපුබ්බං දිසං ගච්ඡෙය්‍ය, න ච අඛාදිතපුබ්බානි තිණානි ඛාදෙය්‍ය, න ච අපීතපුබ්බානි පානීයානි පිවෙය්‍ය, යස්මිඤ්චස්සා පදෙසෙ ඨිතාය එවමස්ස යන්නූනාහං අගතපුබ්බඤ්චෙව–පෙ–පිවෙය්‍යන්ති තඤ්ච පදෙසං න සොත්ථිනා පච්චාගච්ඡෙය්‍ය,

---

දුර්වලව; උපට්ඨහන්ති, වැටහෙත්; අථ, ඉක්බිත්තෙන්; අස්ස, ඒ යොගීහට; තානි, ඒ ධ්‍යානාඞ්ගයෝ; එවං උපට්ඨිතත්තා, මෙසේ ඖදාරිකව දුර්වලව වැටහුණු බැවින්; උපරි උස්සුක්කනාය, (දොස්දුටු බැවින්) මතුයෙහි බවුනට නැඟෙන්නට; (දෙවන ධ්‍යන් උපදවනුවට) පච්චයතං ආපජ්ජන්ති, ප්‍රත්‍යයබවට පැමිණෙති; සො, ඒ යොගීතෙමෙ; අප්පගුණෙ ඣානෙ, ලද ධ්‍යන් නොපුහුණු කල්හි; උස්සුක්කමානො, උත්සාහකරනුයේ; පඨමජ්ඣානා ච පරිහායති: ප්‍රථමධ්‍යානින්ද පිරිහෙයි; න ච සක්කොති දුතියං පාපුණිතුං, ද්විතීයධ්‍යානයට පැමිණෙනුවටද නොපොහොසත් වේ; භගවා, භගවත්තෙමෙ; තෙනාහ, එහෙයින් කීහ–

(අ) භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ; පබ්බතෙය්‍යා, පියවි පර්වතයෙහි බොහෝසේ හැසිරෙන; බාලා, බාලවූ; අව්‍යත්තා, ව්‍යක්ත නොවූ; අඛෙත්තඤ්ඤූ, ගොචරභූමිනොහඳුනන; විසමෙ පබ්බතෙ චරිතුං, විෂමපර්වතයෙහි හැසිරෙන්නට; අකුසලා, අදක්ෂවූ; ගාවී, (යම්) දෙනක්ඇද්ද; තස්සා, ඒ දෙනට; එවමස්ස, මෙබඳු සිතෙක් වන්නේයි; අහං, මම; අගතපුබ්බඤ්චෙව දිසං ගච්ඡෙය්‍යං, නොගිය විරූ දිගකටගියෙම් නම්; අඛාදිතපුබ්බානි චෙව තිණානි ඛාදෙය්‍යං, නොකෑවිරූ තණ කෑම්නම්, අපීතපුබ්බානි ච පානීයානි පිවෙය්‍යං, නොපූවිරූ පැන් බොම්නම්; යන්නූන ඉති, යෙහෙකැයි; සා, ඒ දෙන් තොමෝ; පුරිමං පාදං, පෙරපය; න සුප්පතිට්ඨිතං පතිට්ඨපෙත්වා, සුප්‍රතිෂ්ඨිතකොට නොපිහිටුවා; පච්ඡිමං පාදං උද්ධරෙය්‍ය, පශ්චිම පාදය නගන්නී නම්; සා, හෝ තොමෝ–පෙ–යස්මිඤ්ච පදෙසෙ ඨිතාය, යම් ප්‍රදෙශයක සිටියාවූ; අස්සා, ඒ දෙනට; එවමස්ස, මෙසේවූ සිතෙක් වේනම්–පෙ–තඤ්ච පදෙසං, ඒ ප්‍රදෙශයටද; සොත්ථිනා න

තං කිස්සහෙතු? තථා හි සා භික්ඛවෙ ගාවී පබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුං, එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු බාලො අව්‍යත්තො අඛෙත්තඤ්ඤූ අකුසලො විවිච්චෙව කාමෙහි…පෙ…පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරිතුං, සො තං නිමිත්තං නාසෙවති න භාවෙති න බහුලී කරොති න ස්වාධිට්ඨිතං අධිට්ඨාති. තස්ස එවං හොති:-යන්නූනාහං විතක්කවිචාරානං වූපසමා…පෙ…දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො න සක්කොති විතක්කවිචාරානං වූපසමා…පෙ…දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරිතුං, තස්ස එවං හොති:-යන්නූනාහං විවිච්චෙව කාමෙහි…පෙ…පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො න සක්කොති විවිච්චෙව කාමෙහි…පෙ…පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරිතුං. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු උභතො භට්ඨො, උභතො පරිහීනො, සෙය්‍යථාපි භික්ඛවෙ සා ගාවී පබ්බතෙය්‍යා බාලා අව්‍යත්තා අඛෙත්තඤ්ඤූ අකුසලා විසමෙ පබ්බතෙ චරිතුන්ති…

(අ) තස්මා තෙන තස්මිං යෙව තාව පඨමජ්ඣානෙ පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා භවිතබ්බං. තත්‍රිමා පඤ්චවසියො:-ආවජ්ජනවසී සමාපජ්ජනවසී අධිට්ඨානවසී වුට්ඨානවසී පච්චවෙක්ඛනවසීති. පඨමජ්ඣානං

---

පච්චාගච්ඡෙය්‍ය, සුවයෙන් නැවත නො එන්නේයි…පෙ…එකච්චො භික්ඛු, එක් මහණෙක්; බාලො, (සමාධිපරිපන්ථයන්ගේ විශොධනය නොදන්මෙන්) බාලවූයේ; අව්‍යත්තො, (ධ්‍යානයාගේ ප්‍රගුණ භාවා පාදනයෙහි ව්‍යක්තබවක් නැති හෙයින්)අව්‍යක්තවූයේ; අඛෙත්තඤ්ඤූ, (මතුයෙහි ධ්‍යානයට පිහිටවන බව නොදන්මෙන්) ක්ෂෙත්‍රඥ නොවූයේ; අකුසලො, (සඣාකාරයෙන්ම සමාපත්තිකෞශල්‍ය නැති බැවින්) අකුසලවූයේ; සො, හෙතෙමේ; තං නිමිත්තං, ඒ සමාධි නිමිත්තය; නාසෙවති, සෙවනය නොකෙරේ; න භාවෙති, නොවඩා; න බහුලී කරොති, බහුල නොකෙරේ; න ස්වාධිට්ඨිතං අධිට්ඨාති, මනාව සිටියා කොට නොසිටුවාද; තස්ස, ඔහට; එවං හොති, මෙසේවූ සිතෙක් වේ…පෙ…

(අ) තස්මා, එහෙයින්; අනෙන, මේ යොගිහි විසින්; තස්මිං යෙව තාව පඨමජ්ඣානෙ, පළමුකොට ඒ ප්‍රථමධ්‍යන්හි; පඤ්චහාකාරෙහි, පස් පරිද්දෙකින්; චිණ්ණවසිනා, පුරුදුකරනලද වසි ඇත්තහු විසින්; භවිතබ්බං, වියයුතු; තත්‍ර, එහි; ඉමා, මොහු; පඤ්චවසියො, පස්වසීහුයි; (පස් පොහොසත් බැවුන පස් ඉසුරු බැවුන යන අර්ථයි. **"වසිභොති යථා රුචිපවත්තිභො"** යනු ටීකායි.) ආවජ්ජනවසී, ආවර්ජනයෙහි වසිය; සමාපජ්ජනවසී, සමවැදුනෙහි වසිය; අධිට්ඨානවසී, අධිෂ්ඨානයෙහි (සිටවීමෙහි) වසිය; වුට්ඨානවසී, නැගීමෙහි වසිය; පච්චවෙක්ඛන වසීති, පස්විකීමෙහි වසියයි; (පස්විසිහයි යොදනු.)

යත්ථිච්ඡකං යදිච්ඡකං යාවදිච්ඡකං ආවජ්ජති ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති ආවජ්ජනවසී. පඨමජ්ඣානං යත්ථිච්ඡකං...පෙ...සමාපජ්ජති සමාපජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති සමාපජ්ජනවසී, එවං සෙසාපි විත්ථාරෙතබ්බා, අයං පනෙත්ථ අත්ථප්පකාසනා:- තත්ථ පඨමජ්ඣානතො වුට්ඨාය පඨමං විතක්කං ආවජ්ජයතො භවඞ්ගං උපච්ඡින්දිත්වා උප්පන්නාවජ්ජනානන්තරං විතක්කාරම්මණානෙව චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති, තතො වෙ භවඞ්ගානි, තතො පුන විචාරාරම්මණං ආවජ්ජනං වුත්තනයෙනෙව ජවනානීති. එවං පඤ්චසු ඣානඞ්ගෙසු යදා නිරන්තරං චිත්තං පෙසෙතුං සක්කොති, අථස්ස ආවජ්ජනවසී

---

පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය; යත්ථිච්ඡකං, යම් යම් ප්‍රදෙශයක ආවර්ජනා කරනු කැමතිද; (ඒ ඒ ප්‍රදෙශයෙහි "ආවජ්ජති"යි යොදනු.) යදිච්ඡකං, යම් යම් කලෙක යම් යම් ධ්‍යානාඞ්ගයක හෝ ආවර්ජනා කරනු කැමතිද ඒ ඒ කල ඒ ඒ ධ්‍යානාඞ්ගයෙහි ආවර්ජනා කෙරේ; යාවදිච්ඡකං, යම්තාක්කල් ආවර්ජනා කරනු කැමතිද ඒතාක් කල්; ආවජ්ජති, ආවර්ජනා කෙරේ; ("යාවදිච්ඡකං" යනු බොහෝ ජවන වාරයන්ගෙ නිරන්තරයෙන් ප්‍රවෘත්තිය සඳහා කියනලද-එකම ජවනවාරයක් සඳහා නොවෙයි දතයුතු.) ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති, ආවර්ජනාකිරීමෙහි ලස්බවෙක් නැත්නුයි; ආවජ්ජනවසී, ආවර්ජනාවසිය සිඛනම් වේ...පෙ...සමාපජ්ජති, සමවදී; සමාපජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති, සමවැදීමෙහි ලස්බවෙක් නැත්නම්; සමාපජ්ජනවසී, සමාපජ්ජනවසිය සිඛනම් වේ; (යන අර්ථයි.) එවං, මෙසේ; සෙසාපි, සෙසු (වුට්ඨාන අධිට්ඨාන පච්චවෙක්ඛන) වසීහුද; විත්ථාරෙතබ්බා, විස්තරකටයුත්තාහුයි; අයං පන, මෙ වනාහි; එත්ථ, මෙහි; අත්ථප්පකාසනා, අර්ථයන් පහළකිරීමයි; තත්ථ, ඒ පස්විසින්කෙරෙහි; පඨමජ්ඣානතො වුට්ඨාය, ප්‍රථමධ්‍යානින් නැඟී; පඨමං, පළමුකොට; විතක්කං ආවජ්ජයතො විතර්කය ආවර්ජනාකරන්නහුට, භවඞ්ගං උපච්ඡින්දිත්වා, බවඟ සිඳගෙන, උප්පන්නාවජ්ජනානන්තරං, උපන් අවජුන්අනතුරෙහි; විතක්කාරම්මණානෙව, විතර්කයම අරමුණුකොට ඇති; චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති, (තීක්ෂ්ණෙන්ද්‍රිය නාතිතීක්ෂ්ණෙන්ද්‍රිය යන්ට යථා ක්‍රමයෙන්) සතරපස් ජවන්හු දිවෙති; තතො, ඉක්බිත්තෙන්; වෙ භවඞ්ගානි, දෙභවඟ සිත්හු වෙත්; තතො, ඒ දෙභවඟදෙසිතට ඉක්බිතිව; විචාරාරම්මණං, විචාරය අරමුණුකොට ඇති; ආවජ්ජනං, ආවර්ජනයද; වුත්තනයෙනෙව ජවනානීති, කීතියෙන්ම ජවනයෝ දිවන්නාහුයි; එවං, මෙසේ; පඤ්චසු ඣානඞ්ගෙසු, පස්ධ්‍යානාඞ්ගයන් කෙරෙහි; යදා, යම්කලෙක; නිරන්තරං, අතුරුනැතිකොට; චිත්තං

සිඛා හොති. අයං පන මත්‍ථකප්පත්තා වසී භගවතො යමකපාටිහාරියෙ ලබ්භති, අඤ්ඤෙසං වා එවරූපෙ කාලෙ, ඉතො පරං සීඝතරං ආවජ්ජනවසී නාම නත්‍ථි. ආයස්මතො පන මහාමොග්ගල්ලානස්ස නන්‍දොපනන්‍දනාගරාජදමනෙ විය සීඝං සමාපජ්ජනසමත්‍ථතා සමාපජ්ජනවසී නාම. අච්ඡරාමත්තං වා දසච්ඡරාමත්තං වා ඛණං ඨපෙතුං සමත්‍ථතා අධිට්ඨානවසී නාම. තථෙව ලහුං වුට්ඨාතුං සමත්‍ථතා වුට්ඨානවසී නාම.

---

පෙසෙතුං සක්කොති, සිත මෙහෙයන්නට පොහොසත්ද; අථ, එසමයෙහි; අස්ස, මේ යොගීහට; ආවජ්ජනවසී සිඛා හොති, ආවජ්ජනවසිතොමෝ සිඛනම් වේ; (මිහි ආවජ්ජනවසිය අභිමතවූවද ආවජ්ජනය උපන්සඳ වියයුතු ජවන්හු චිත්තාභිනීහාරය ආවජ්ජනයෙහි තත්පරබැවින් අසම්පූර්ණවෙත්නුයි "චත්තාරිපඤ්ච වා ජවනානි" යි කීහයි දතයුතු-විචාරය ආවජ්ජනාකෙරෙම් ප්‍රීතිය ආවජ්ජනාකෙරෙම් යන වෙන වෙන ආභොගයෙහි එකෙකි අඞ්ගයෙහි භවාඞ්ගයෙන් නැගි නැගී ආවජ්ජනය උපදනේ පස්ධ්‍යානාඞ්ගය ආවජ්ජනාකෙරෙම් යන පළමු උපන් ආභොගබලයෙම්ම උපදිතියි දතයුතු.) අයං පන මත්‍ථකප්පත්තා වසී, භවාඞ්ගසිත් දෙකකින් අතුරු ඇති සතරජවන් සිතක් ඇති මේ මස්තකප්‍රාප්තවසී තොමෝ; භගවතො, භගවත්හට; යමකපාටිහාරියෙ ලබ්භති, යමාමාපෙළහර ලැබේ; අඤ්ඤෙසං වා, සෙසු දම්සෙනෙවි ආදීන්ට හෝ; එවරූපෙ කාලෙ, ආවජ්ජනවසිය සැහැල්ලුකොට නිපයන කල්හි ලැබේ; (හෝද ස්වල්පකාලිකය යමාමහපෙළහර මෙන් බොහෝ වේලක් පවත්නී නොවේ එහෙයින්ම කීහ. ("සාවකෙහි අසාධාරණං"සි) ඉතො පරං, මෙයින් මතුයෙහි; සීඝතරං ආවජ්ජනවසී නාම නත්‍ථි, අතිශීඝ්‍ර ආවජ්ජනවසියෙක්නම් නැති; (බුදුනට ද එක භවාඞ්ගයන් නො උපදනා බැවිනි.) ආයස්මතො පන මහාමොග්ගල්ලානස්ස, ආවත් මහමුගලනුන්ගේ; නන්‍දොපනන්‍දනාගරාජදමනෙ විය, නන්‍දොපනන්‍ද නාගරාජයාගෙ දැමීමෙහි මෙන්; සීඝං සමාපජ්ජනසමත්‍ථතා, වහාම සම වදනට සමර්ථබව, සමාපජ්ජනවසී නාම, සමාපජ්ජනවසී නම්; (මිහි සමවදනා කැමති අනතුරෙහි භවාඞ්ගදෙසිතුන් උපන් කල්හි භාවාඞ්ගය සිඳ උපන් ආවජ්ජනා අනතුරෙහි සමවැද්දහෙන බව හා සමවදනට සමර්ථබව නම් වෙයි මේ මුදුන්පත් සමාපජ්ජනවසී බුදුන්ට ධර්මදෙශනා සමයෙහිම ලැබෙයි දන්නේ.) අච්ඡරාමත්තං වා, අසුරු ගසන පමණවූ හෝ; දසච්ඡරාමත්තං වා, දශඅසුරක් ගසනපමණ හෝ; ඛණං, ක්‍ෂණයක්; ඨපෙතුං සමත්‍ථතා, සිටුවන්නට සමර්ථවබ; අධිට්ඨානවසී නාම, අධිට්ඨානවසීනම්; තථෙව ලහුං වුට්ඨාතුං සමත්‍ථතා, එසේම අසුරක් දශඅසුරක්පමණකල් ධ්‍යන්හි සිට ලඝුව නැගෙන්

**තදුභයදස්සනත්ථං බුද්ධරක්ඛිතත්ථෙරස්ස වත්ථුං කථෙතුං වට්ටති, සො හායස්මා උපසම්පදාය අට්ඨවස්සිකො හුත්වා ථෙරම්බත්ථලෙ මහාරොහණගුත්තත්ථෙරස්ස ගිලානුපට්ඨානං ආගතානං තිංසමත්තානං ඉද්ධිමන්තසහස්සානං මජ්ඣෙ නිසින්නො ථෙරස්ස යාගුං පටිග්ගාහයමානං උපට්ඨාකනාගරාජානං ගහෙස්සාමීති ආකාසතො පක්ඛන්දන්තං සුපණ්ණරාජානං දිස්වා තාවදෙව පබ්බතං නිම්මිනිත්වා නාගරාජානං බාහාය ගහෙත්වා තත්ථ පාවිසි. සුපණ්ණරාජා පබ්බතෙ පහාරං දත්වා පලායි. මහාථෙරො ආහ:-සචෙ ආවුසො රක්ඛිතො නාභවිස්ස සබ්බෙව ගාරය්හා අස්සාමාති. පච්චවෙක්ඛනවසී පන ආවජ්ජනවසියා යෙව වුත්තා. පච්චවෙක්ඛනජවනා තෙව හි තත්ථ ආවජ්ජනානන්තරානීති.**

---

නට සමර්ථබව; වුට්ඨානවසීනාම, වුට්ඨානවසී නම්; තදුභයදස්සනත්ථං, වුට්ඨාන අධිට්ඨානවසීදෙක දක්වන පිණිස; බුද්ධරක්ඛිතත්ථෙරස්ස වත්ථුං, බුද්ධරක්ඛිත නම් තෙරුන්ගේ වත; කථෙතුං වට්ටති, කියන්නට වටී; සො හි අයස්මා, ඒ ආවත්තෙමේ; උපසම්පදාය අට්ඨවස්සිකො හුත්වා, උපසම්පත්තීන් අටවස් ඇතිව; ථෙරම්බත්ථලෙ, තෙර අම් තෙලෙහි; මහාරොහණගුත්තත්ථෙරස්ස, මහාරොහණගුත්ත නම් තෙරුන්ට; ගිලානුපට්ඨානං ආගතානං, ගිලන්උපස්ථානයට ආගතවූ; තිංසමත්තානං ඉද්ධිමන්තසහස්සානං මජ්ඣෙ, තිස්දහසක් සෘද්ධිමත්තයන් මැද; නිසින්නො, උන්නේ; ථෙරස්ස, තෙරුන්ට; යාගුං පටිග්ගාහයමානං, කැඳ පිළිගන්වන; උපට්ඨාකනාගරාජානං, උපස්ථානකරන නාරජහු; ගහෙස්සාමීති, ගන්මි යි; ආකාසතො පක්ඛන්දන්තං, අහසින් බස්නාවූ; සුපණ්ණරාජානං දිස්වා, ගුරුළුරජහු දැක; තාවදෙව, එකණෙහිම; පබ්බතං නිම්මිනිත්වා, (මැද) පර්වතයක් මවා, නාගරාජානං බාහාය ගහෙත්වා, නාරජහු අත්හි ගෙන; තත්ථ පාවිසි, ඒ මැවූ පර්වතයට වැදි; සුපණ්ණරාජා, ගුරුළුරජතෙමේ; පබ්බතෙ පහාරං දත්වා, පර්වතයෙහි පහරදී; පලායි, පලාගියේය; මහා ථෙරො ආහ, මහතෙරහු මෙසේ කීවු; ආවුසො, ඇවැත්නි; සචෙ රක්ඛිතො නාභවිස්ස, ඉදින් රක්ෂිතයා (මිහි) නොවීනම්; සබ්බෙවගාරය්හා අස්සාමාති, මෙතෙක් සෘද්ධිමත්හු; (එක උපස්ථායකයා ගුරුළු කෙරෙන් රැකගත නුහුනුහයි) ගර්හාවට පැමිණියම්හයි; පච්චවෙක්ඛනවසී පන, ප්‍රත්‍යවෙක්ෂාවශි වනාහි; ආවජ්ජනවසියා එව වුත්තා, ආවර්ජනාවශියෙහිම කියනලදූ; පච්චවෙක්ඛනජවනානෙව හි, ප්‍රත්‍යවෙක්ෂා ජවනයෝම; තත්ථ, ඒ ආවර්ජනවශියෙහි; ආවජ්ජනානන්තරානීති, ආවජ්ජනා අනතුරුවන්නාහුයි.

(මෙහි ආවජ්ජනවසියෙන්ම ප්‍රත්‍යවෙක්ෂාවශිය සිද්ධවත් අධිට්ඨාන වසියෙන්ම වුට්ඨානවසිය සිද්ධවත් ආවජ්ජනවසිය හා ප්‍රත්‍යවෙක්ෂා වශියෙහිද අධිට්ඨානවසිය හා වුට්ඨානවසියෙහිද වෙසෙස් කිමෙක්ද යත්? ජවනුන්ට ධ්‍යානාඞ්ගයන් සමුවම නොවැටහෙතුදු ධ්‍යානාඞ්ග

(අ) ඉමාසු පන පඤ්චසු වසීසු චිණ්ණවසිනො පගුණපඨමජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නනීවරණපච්චත්ථිකා විතක්කවිචාරානං ඔළාරිකත්තා අඞ්ගදුබ්බලා ති ච තත්ථ දොසං දිස්වා දුතියජ්ඣානං

---

යෙහි නිරන්තරකොට ආවජ්ජනය පැවැත්විය හෙන බව ආවජ්ජනාවසි නම් වෙයි. ධ්‍යානාඞ්ගයන් ස්වභාව විසින් සවුටව පස්විකනුකොට ජවන් පැවැත්විය හෙනබව ප්‍රත්‍යවෙක්ෂාවශිතම් වේ. සත්ජවනුන් දිවතුදු නිරන්තරකොට ආවජ්ජනය පැවැත්වියහෙනබැවි ආවජ්ජනා වසිනම් වෙයි. වශිතාබලයෙන් සත් ජවනුන් නොවැදී සතර හෝ පස් හෝ ජවන් කෙනෙකුන් ප්‍රත්‍යවෙක්ෂා කටහෙනබව ප්‍රත්‍යවෙක්ෂා වශිතානම් නොහොත් ඥනවිප්‍රයුක්ත චිත්තයෙන් ප්‍රත්‍යවෙක්ෂා නො කොට හෙතුදු ප්‍රත්‍යක්ෂකරමි යන ආවජ්ජනවිථියට ඉක්බිතිව භවාඞ්ග යෙහි නොලස්ව වහා ධ්‍යානාඞ්ගයන් ආවජ්ජනාකටහෙන බව ආවජ්ජ නාවසිතානම් වෙයි. වශිතාබලයෙන් ඥනවිප්‍රයුක්ත සිතිනුදු පස්විකිය හෙන බව ප්‍රත්‍යවෙක්ෂා වශිතා නම්වේ. තමා කැමැතිතෙක් කල් සමා පත්තිය පැවතහෙනබව අධිට්ඨානවසිනම්. පරිච්ඡින්නකාලය නොඉක් මවා ධ්‍යානයෙහි ආලය හැරියහෙන බව ළුඨානවසී නම් නොහොත් තමාවිසින් පරිච්ඡින්නකාලය නොඉක්ම පවතුදු පරිච්ඡින්නකාලය නො උත්නුකොට පැවැත්වියහෙනබව අධිඨානවසිනම් වෙයි. තමා පිරි සුන්කල් නොඉක්ම පිරිසුන්කල්හිම නැගෙනබව වුට්ඨානවසිනම්. සිලිසත්‍යයෙහි චනාහි යම් යම් කසිණාලම්බනයෙක ධ්‍යානසමවදනා කැමැත්තහු නොලස්ව ඒ ඒ කිසුණුවහා ආවජ්ජනය ඉපැදවියහෙන බවද ධ්‍යානයෙන් නැඟී ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නහු භවාඞ්ග යෙහි නොලස්ව භවාඞ්ගයෙන් නැගී විතර්කාදී ධ්‍යානාඞ්ගයෙහි වහා ආවජ්ජනා පැවැත්වියහෙනබව ආවජ්ජනාවසි නම. කිසුණෙහි වහා ආවජ්ජන ඉපදවුවද උපචාරයෙහි වහා ධ්‍යානයට සමවැද්දහෙන බව සමාපජ්ජනවසි නම. අසුරුපහරණා පමණ මදකලෙක්හිදු ධ්‍යාන යෙහි සිටිනු කැමැත්තහු නොඋත්නුකොට එතෙක්කල්ම සිටියහෙන බව අධිට්ඨානවසිනම්. පරිච්ඡින්නකාලය නොඉක්මවා තමා සමවත් සමාපත්තියෙන් තරව නැගෙනබව වුට්ඨානවසි නම්. ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂාකරන්නහු යටකීසෙයින්ම ඉපදවූ ආවජ්ජනයට ඉක්බිති සැහැල්හුකොට වහා ප්‍රත්‍යවෙක්ෂාජවන් පැවැත්වියහෙන බව ප්‍රත්‍යවෙක්ෂාවශි නම්වෙයි කීහු.

(අ) ඉමාසු පන පඤ්චසු වසීසු, මේ පඤ්චවශිතාවන් කෙරෙහි; චිණ්ණ වසිනා, පුරුදුකරනලද වශි ඇත්තහු විසින්; පගුණපඨමජ්ඣානතො වුට්ඨාය, පුහුණු ප්‍රථමධ්‍යානින් නැගී; අයං සමාපත්ති, මේ සමවත් තොමෝ; ආසන්න නීවරණපච්චත්ථිකා, නුදුරුවූ නීවරණ නමැති පස මිතුරන් ඇත්තීය; විතක්කවිචාරානං ඔළාරිකත්තා, විතර්කවිචාර දෙදෙනා ඖදාරික බැවින්; අඞ්ගදුබ්බලා ති ච, දුර්වල වූ අඞ්ගඇත්තීය සිදු; තත්ථ, ඒ ප්‍රථමධ්‍යානයෙහි; දොසං දිස්වා, අගුණු දැක; දුතියජ්ඣානං

සන්තතො මනසි කරිත්වා පඨමජ්ඣානෙ නිකන්තිං පරියාදාය දුතියාධිගමාය යොගො කාතබ්බො. අථස්ස යදා පඨමජ්ඣානා වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො විතක්කවිචාරා ඔළාරිකතො උපට්ඨහන්ති, පීතිසුඛඤ්ච චිත්තෙකග්ගතා ච සන්තතො උපට්ඨහන්ති, තදා ඔළාරිකඞ්ගප්පහානාය සන්තඞ්ගපටිලාභාය ච තදෙව නිමිත්තං පඨවී පඨවීති පුනප්පුනං මනසිකරොතො ඉදානි දුතියජ්ඣානං සම්පජ්ජිස්සතීති භවඞ්ගං උපච්ඡින්දිත්වා තදෙව පඨවීකසිණං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති. තතො තස්මිංයෙව ආරම්මණෙ චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති, යෙසං අවසානෙ එකං රූපාවචරං දුතියජ්ඣානිකං, සෙසානි වුත්තප්පකාරානෙව කාමාවචරානීති. එත්තාවතා චෙස. "විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං

---

සන්තතො මනසි කරිත්වා, (විතර්ක විචාරයන් නැති බැවින්) ද්විතීය ධ්‍යාන් ශාන්තහෙයින් මෙනෙහි කොට; පඨමජ්ඣානෙ නිකන්තිං පරියාදාය, ප්‍රථමධ්‍යානනිකෘන්තිය ගෙවා; (විෂ්කම්භනයකොට) දුතියාධිගමාය, දෙවන ධ්‍යානයාගේ අධිගමය පිණිස; යොගො කාතබ්බො, භාවනායොගය කටයුතු; අථ, ඉක්බිත්තෙන්; යදා, යම්වේලෙක; පඨමජ්ඣානා වුට්ඨාය, ප්‍රථම ධ්‍යානයෙන් නැගී; සතස්ස, සිහිඇතිව; සම්පජානස්ස, නුවණැතිව; ඣානඞ්ගානි පච්චවෙක්ඛතො, ධ්‍යානාඞ්ගයන් පස්විකන්නා වූ; අස්ස, ඒ යොගීහට; විතක්කවිචාරා ඔළාරිකතො උපට්ඨහන්ති, විතර්කවිචාරයෝ ඖදාරික විසින් වැටහෙද්ද; පීති; ප්‍රීතියද; සුඛඤ්ච, සුඛයද; චිත්තෙකග්ගතා ච, චිත්තෛකාග්‍රතාවද; සන්තතො උපට්ඨහන්ති, ශාන්තහෙයින් වැටහෙද්ද; තදා, එවෙලෙහි; ඔළාරිකඞ්ගප්පහානාය, ඖදාරික අඞ්ගයන්ගේ ප්‍රහානය පිණිසද; සන්තඞ්ගපටිලාභාය ච, ශාන්තාඞ්ගයන්ගේ ප්‍රතිලාභය පිණිසද; තදෙවනිමිත්තං, එම ප්‍රතිලාභනිමිත්ත; පඨවීපඨවීති, පඨවීපඨවී කියා; පුනප්පුන මනසිකරොතො, නැවත නැවත මෙනෙහි කරන්නාහට; ඉදානි දුතියජ්ඣානං සම්පජ්ජිස්සතීති, දැන් දෙවෙනි ධ්‍යාන් උපදින්නේයයි; භවඞ්ගං උපච්ඡින්දිත්වා, භවාඞ්ගපසිඳ; තදෙව පඨවිකසිණං, එම පඨවිකිසුණු; ආරම්මණං කත්වා, අරමුණුකොට; මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති, මනොද්වාරාවර්ජන සිත උපද්දී; තතො, ඒ ආවර්ජනයට ඉක්බිතිව; තස්මිංයෙවාරම්මණෙ, එම අරමුණෙහි; චත්තාරි පඤ්ච වා ජවනානි, සතරපස් ජවන්හු; ජවන්ති, දිවෙත්; යෙසං අවසානෙ, යම් සතර හෝ පස් හෝ ජවන් කෙනෙකුන්ගේ කෙළවර; (අවසන්හි;) එකං, එක්සිතෙක්, රූපාවචරං දුතියජ්ඣානිකං, රූපාවචර ද්විතීයධ්‍යාන ඇතිවේද; සෙසානි, සෙස්ස; වුත්තප්පකාරානෙව, කියන ලද පරිකර්මාදිප්‍රකාර ඇතිවූම; කාමාවචරානි, කාමාවචර වෙද්ද; (ඒ සතරපස් ජවන්හු දිවතියි යොදනු.) එත්තාවතා, මෙපමණෙකින්; දුවඞ්ගවිප්පහීණං, දෙඅඟින්ම පිරිහුණු;

දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති" එවමනෙන දුවඞ්ගවිප්පහීණං තිවඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං දුතියජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං—

(අ) තත්‍ථ විතක්කවිචාරානං වූපසමාති විතක්කස්ස ච විචාරස්ස ච ඉමෙසං ද්වින්නං වූපසමා සමතික්කමා, දුතියජ්ඣානක්ඛණෙ අපාතුභාවාති වුත්තං හොති, තත්‍ථ කිඤ්චාපි දුතියජ්ඣානෙ සබ්බෙපි පඨමජ්ඣානධම්මා න සන්ති අඤ්ඤෙ යෙව හි පඨමජ්ඣානෙ ඵස්සාදයො අඤ්ඤෙ ඉධ ඔළාරිකස්ස පන ඔළාරිකස්ස අඞ්ගස්ස සමතික්කමා පඨමජ්ඣානතො පරෙසං දුතියජ්ඣානාදීනං අධිගමො හොතීති දීපනත්‍ථං **විතක්කවිචාරානං වූපසමාති** එවං වුත්තන්ති වෙදිතබ්බං.

---

තිවඞ්ගසමන්නාගතං, තුන් අඟින් සමන්විතවූ; අවිතක්කං, විතර්කරහිතවූ; අවිචාරං, විචාර රහිත වූ; සමාධිජං, සමාධීන් උපන්; පීතිසුඛං, ප්‍රීති සුඛදෙකින් යුක්තවූ; එසො, මේ තෙම; විතක්කවිචාරානං වූපසමා, විතර්කවිචාරයන්ගේ ව්‍යුපසමහෙතුවෙන්; අජ්ඣත්තං, ස්වසන්තානයෙහි උපන්; සම්පසාදනං, සම්ප්‍රසාදනයෙන් යුක්තවූ; චෙතසො එකොදිභාවං, සිත්හුගේ එකොදිභාව සඞ්ඛ්‍යාත සමාධිය වඩන්නාවූ;අවිතක්කං,විතර්ක රහිතවූ;අවිචාරං,විචාර රහිතවූ;සමාධිජං, සමාධීන් උපන්; පීතිසුඛං, ප්‍රීති සුඛ දෙකින් යුක්තවූ; දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, ද්විතීයධ්‍යානය උපදවා වෙසේ—පෙ—

(අ) විතක්කස්සච, විතර්කයාගේ ද;විචාරස්ස ච, විචාරයාගේ ද; (යන) ඉමෙසං ද්වින්නං, මේ දෙදෙනාගේ; වූපසමා, සන්හිඳීමෙන්;(**හෙවත් ඉක්ම පසුවම්හි.**) සමතික්කමා, ප්‍රහානවශයෙන් ඉක්මීමෙන්; දුතියජ්ඣානක්ඛණෙ, ද්විතීයධ්‍යානක්ෂණයෙහි) අපාතුභාවාති වුත්තං හොති, අනුත්පාදයෙන් යයි කී නියායි; (මෙහි යම් විතර්ක විචාර කෙනෙකුන් විසින් ප්‍රථමධ්‍යානයාගේ ඖදාරිකබව වේද ඒ විතර්කවිචාරයන්ගේ සමතික්‍රමණය විතීය ධ්‍යානයාගේ සමධිගමයෙන් වෙයි යන මේ අර්‍ථය "විතක්කවිචාරානං වූපසමා" යනුයෙන් දක්වන ලදී. එහෙයින්ම කීහ. "**කිං පඨමජ්ඣානිකානං විතක්කවිචාරානං වූපසමො ඉධාධිප්පෙතො උදාහු දුතියජ්ඣානිකානං**" යන මෙබඳු චොද්‍යයට අනවකාශ වෙයි දතයුතු.) තත්‍ථ, එහි; කිඤ්චාපි, කිසිසේත්; දුතියජ්ඣානෙ, විතීයධ්‍යානයෙහි; සබ්බෙපි, පඨමජ්ඣානධම්මා න සන්ති, සියලු ප්‍රථමධ්‍යාන ධර්මයෝ නැත; අඤ්ඤෙයෙව හි පඨමජ්ඣානෙ ඵස්සාදයො,ප්‍රථමධ්‍යානයෙහි ස්පර්‍ශාදී ධර්මයෝ අන්හුමය;අඤ්ඤෙ ඉධ, මේ විතීයධ්‍යානයෙහි අන්හුමැයි;ඔළාරිකස්ස පන ඔළාරිකස්ස අඞ්ගස්ස සමතික්කමා, ඖදාරික ඖදාරිකාඞ්ගයාගේ වනාහි සමතික්‍රමණයෙන්; පඨමජ්ඣානතො පරෙසං, ප්‍රථමධ්‍යානයා කෙරෙන් පරවූ; දුතියජ්ඣානාදීනං, විතිය ධ්‍යානාදීන්ගේ; අධිගමො හොතීති, අධිගමයවෙයි; දීපනත්‍ථං,හඟවන පිණිස; විතක්කවිචාරානං වූපසමාති එවං වුත්තන්ති වෙදිතබ්බං, "විතක්කවිචාරානං වූපසමා" යන මේ වචනය කියන

**අජ්ඣත්තන්ති** ඉධ නියකජ්ඣත්තං අධිප්පෙතං, විභඞ්ගෙ පන **අජ්ඣත්තං පච්චත්තන්ති** එත්තකමෙව වුත්තං, යස්මා ච නියකජ්ඣත්තං අධිප්පෙතං, තස්මා අත්තනො ජාතං අත්තසන්තානෙ නිබ්බත්තන්ති අයමෙත්ථ අත්ථො. **සම්පසාදනන්ති** සම්පසාදනං වුච්චති සද්ධා, සම්පසාදනයොගතො ඣානම්පි සම්පසාදනං, නීලවණ්ණයොගතො නීලං වත්ථං විය, යස්මා වා තං ඣානං සම්පසාදනසමන්නාගතත්තා විතක්කවිචාරක්ඛොභවූපසමනෙන ච චෙතො සම්පසාදයති තස්මාපි සම්පසාදනන්ති වුත්තං, ඉමස්මිං ච අත්ථවිකප්පෙ සම්පසාදනං චෙතසොති එවං පදසම්බන්ධො වෙදිතබ්බො, පුරිමස්මිං පන අත්ථවිකප්පෙ චෙතසොති එතං එකොදිභාවෙන සද්ධිං යොජෙතබ්බං.

---

ලදූයි දතයුතු; (කුමක්කීයාද යත්? සියලු ප්‍රථමධ්‍යාන ධර්මයන්ම ද්විතීය ධ්‍යානයෙහි නැති බැවින් විතර්කාදීන්ගේ මෙන් තත්සහගත යන්ගේත් වූපසමාදිය කියයුත්තෙහි ඖදාරික ඖදාරික අඞ්ගයන්ගේ සමතික්‍රමණයෙන් ද්විතීයාදීන්ගේ අධිගමය වෙයි දක්වනු පිණිස “විතක්කවිචාරානං වූපසමා”යි කීහයි දතයුතු (මතු “පීතියා ච විරාගා” යනාදියෙහිදු මෙම නය දතයුතු.) අජ්ඣත්තන්ති ඉධ “අජ්ඣත්තං” යනමෙහි; නියකජ්ඣත්තං අධිප්පෙතං, තමා සන්තානයෙහි උපන්නේ යයි අභිමතයි;(අජ්ඣත්තපච්චත්තාදිය අභිමත නොවෙයි යන අර්ථයි.) විභඞ්ගෙ පන, විභඞ්ගයෙහි වනාහි; අජ්ඣත්තං පච්චත්තන්ති එත්තකමෙව වුත්තං “අජ්ඣත්තං පච්චත්තං”යි මෙපමණක් ම කියනලදී) (යම් හෙයකින් “අජ්ඣත්තං”යි කියා “පච්චත්තං”යි පර්‍යාය වචනය කිවුද එහෙයින්ම අජ්ඣත්තයයි නියකජ්ඣත්තයම අභිමතය අජ්ඣත්ත පච්චත්තාදී අභිමත නොවේ හැඟෙයි සේයි.) යස්මා ච නියකජ්ඣත්තං අධිප්පෙතං, යම් හෙයකින් නිජකාධ්‍යාත්මයම අභිමතද; තස්මා, එහෙයින්; අත්තනො, තමා කෙරෙන්; ජාතං, උපන්නේ; අත්තසන්තානෙ නිබ්බත්තන්ති, ආත්මසන්තානයෙහි නිවෘත්තවූයේය යනු අයමෙත්ථ අත්ථො, මේ මේ පෙදෙහි අර්ථයි; සම්පසාදනන්ති, සම්ප්‍රසාදනයයි; සද්ධාසම්පසාදනං වුච්චති, ශ්‍රද්ධාසම්ප්‍රසාදනය කියනු ලැබේ; සම්පසාදනයොගතො, සම්ප්‍රසාදන යොගයෙන්; ඣානම්පි සම්පසාදනං, ධ්‍යානයද සම්ප්‍රසාදනනම්; නීලවණ්ණයොගතො නීලං වත්ථං විය, නීලවර්ණයොගයෙන් වස්ත්‍රය නිලනම් වන්නාසේයි; (වස්ත්‍රය නොනිල්හෙතුදු තද්යොගයෙන් නීලය යන නම ලබන සෙයිනැයි සේයි.) යස්මා වා, යම්හෙයකින් හෝ; තං ඣානං, ඒ ධ්‍යානය; සම්පසාදනසමන්නාගතත්තා, සම්ප්‍රසාදනයෙන් යුක්ත හෙයින්; විතක්කවිචාරක්ඛොභවූපසමනෙන ච, විතර්කවිචාර දෙදෙනාගේ ක්ෂොභය සන්හුන් හෙයිනුදු; චෙතො සම්පසාදයති, සිත්හු පහදවාද; තස්මාපි, එහෙයිනුදු; සම්පසාදනන්ති වුත්තං, සම්ප්‍රසාදනයයි කියනලදී; ඉමස්මිං ච අත්ථවිකප්පෙ “චෙතො සම්පසාදයති” යන මේ අර්ථවිකල්පයෙහි; සම්පසාදනං චෙතසොති “සම්පසාදනං චෙතසො”යි කියා; එවං පදසම්බන්ධො වෙදිතබ්බො, මෙසේ පදසම්බන්ධය දතයුතු; (මේ පක්ෂයෙහි “චෙතසො” යනු උපයොගාර්ථයෙහි ෂෂ්ඨීයි.) පුරිමස්මිං පන අත්ථවිකප්පෙ “සම්පසාදනයොගතො” යන ප්‍රථම අර්ථවිකල්පනයෙහි වනාහි; චෙතසොති එතං, චෙතසො යන මේ; එකොදිභාවෙන සද්ධිං යොජෙතබ්බං, එකොදිභාවශබ්දය හා යෙදියයුතු.

(අ) තත්‍රායං අත්ථයොජනා එකො උදෙතීති එකොදි විතක්කවිචාරෙහි අනජ්ඣාරූළ්හත්තා අග්ගො සෙට්ඨො හුත්වා උදෙතීති අත්ථො, සෙට්ඨොපි හි ලොකෙ එකොති වුච්චති, විතක්කවිචාරවිරහිතො වා එකො අසහායො හුත්වා තිපි වට්ටති. අථ වා සම්පයුත්තධම්මෙ උදායතීති උදි, උට්ඨාපෙතීති අත්ථො, සෙට්ඨට්ඨෙන එකො ච සො උදි චාති එකොදි, සමාධිස්සෙතං අධිවචනං, ඉති ඉමං එකොදිං භාවෙති වඩ්ඪෙතීති ඉදං දුතියජ්ඣානං එකොදිභාවං, සො පනායං එකොදි යස්මා චෙතසො න සත්තස්ස න ජීවස්ස තස්මා එතං චෙතසො එකොදිභාවන්ති වුත්තං, නනු චායං සද්ධා පඨමජ්ඣානෙපි අත්ථි, අයඤ්ච එකොදිනාමකො සමාධි

---

(අ) තත්‍රායං අත්ථයොජනා, එහි මේ අර්ථයොජනායි; එකො, උතුම්ව; උදෙතීති, නැගේනුයි; එකොදි, එකොදි නම් වේ; විතක්කවිචාරෙහි අනජ්ඣාරූළ්හත්තා, විතර්කවිචාරයන් විසින් අධ්‍යාරූඪ නොවන බැවිනි; අග්ගො, අග්‍රව; සෙට්ඨො හුත්වා, ශ්‍රෙෂ්ඨව; උදෙතීති අත්ථො, නැගේය යන අර්ථයි; ලොකෙ, ලෙව්හි; ("යාව පරෙ එකභතෙ කරෙමි"යි යනාදියෙහි මෙන්) සෙට්ඨොපි හි, උත්තමද; එකොති වුච්චති; එකයයි කියනු ලැබෙයි; විතක්කවිචාරවිරහිතො වා, විතර්කවිචාර දෙදෙනාගේ විරහයෙන් හෝ; එකො, හුදකලාව; අසහායො හුත්වා, අසහායවයයි; ඉතිපි වට්ටති, මෙසේද වටී; අථ වා, නොහොත්; සම්පයුත්තධම්මෙ, ස්පර්ශාදී සම්ප්‍රයුක්ත ධර්මයන්; උදායතීති, නගානුයි; උදි, උදිනම්වේ; ("උට්ඨාපෙති" යනු එම අර්ථයි-අවික්ෂෙපලක්ෂණයෙහි ඉන්ද්‍රාර්ථයකරන බැවින් සමාධිය පම්ප්‍රයුක්ත ධර්මයන්ට විශෙෂයෙන් උපකාර කරනුයි ("සම්පයුත්ත ධම්මෙ උදායති" යනාදි කීහු;) සෙට්ඨට්ඨෙන, ශ්‍රෙෂ්ඨාර්ථයෙන්; එකො ච සො, එකනම් ඒමය; උදි චාති, උදි නම් වූයේ ඒමනුයි; එකොදි, එකොදි නම් වේ; එතං, එකොදි යන මේ; සමාධිස්ස අධිවචනං, සමාධියට නමෙකි; ඉති, මෙසේ; ඉමං එකොදිං, මේ එකොදිසඞ්ඛ්‍යාත සමාධිය; (භාවෙති යි-සේයි) වඩ්ඪෙතීති, වඩානුයි; ඉදං දුතියං ඣානං, මේ ද්විතීයධ්‍යානය; එකොදිභාවං; එකොදිභාව නම් වේ; සො පනායං එකොදි, ඒ එකොදිතෙමේ; යස්මා, යම් හෙයකින්; චෙතසො, සිත්හුගේද; න සත්තස්ස, සතක්හුගේ නොවේද; න ජීවස්ස, ජීවයක්හුගේ නොවේද; තස්මා, එහෙයින්; එතං, මේ ධ්‍යානය; චෙතසො එකොදිභාවන්ති වුත්තං, සිත්හුගේ උතුම්ව එකලාව හෝ උපදනා සමාධීහු වඩනුයේ නම් වෙයි කියනලදී; (නොහොත් උතුම්ව සම්ප්‍රයුක්තයන් වඩන සමාධීහු වඩනුයේනම් වෙයි කියන ලද අර්ථයි-"නනුච" යන නිපාත සමුද්දෙශචොද්‍යාවකාශයෙහි වැටේ) අයං සද්ධා, මේ ශ්‍රද්ධා තොමෝ; පඨමජ්ඣානෙපි, අත්ථි; ප්‍රථමධ්‍යානයෙහිදු ඇත; අයඤ්ච එකොදිනාමකො සමාධි, මේ එකොදිනම් සමාධියද ඇත; අථ වා,

අථ කස්මා ඉදමෙව සම්පසාදනං චෙතසො එකොදිභාවඤ්චාති වුත්තන්ති වුච්චතෙ:- අදුඤ්හි පඨමජ්ඣානං විතක්කවිචාරක්ඛොභෙන වීචිතරඞ්ග සමාකුලමිව ජලං න සුප්පසන්නං හොති, තස්මා සතියාපි සද්ධාය සම්ප සාදනන්ති න වුත්තං, න සුප්පසන්නත්තායෙව චෙත්ථ සමාධිපි න සුට්ඨු පාකටො තස්මා එකොදිභාවන්තිපි න වුත්තං, ඉමස්මිං පන ඣානෙ විතක්ක විචාරපලිබොධාභාවෙන ලද්ධොකාසා බලවතී සද්ධා බලවසද්ධා සහාය පටිලාභෙනෙව ච සමාධිපි පාකටො, තස්මා ඉද මෙව එවං වුත්තන්ති වෙදිතබ්බං, විභඞ්ගෙ පන "සම්පසාදනන්ති යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො, චෙතසො එකොදි භාවන්ති යා චිත්තස්ස ඨිති

---

එසේකල; ඉදමෙව, මේ ධ්‍යානයම; සම්පසාදනං, සම්ප්‍රසාදන නමුදු වෙයි; චෙතසො එකොදිභාවඤ්චාති, සිත්හුගේ එකොදිභාවනමුදුවෙයි; වුත්තං, කියනලදී; වුච්චතෙ, (පරිහාර) කියනුලැබේ; අදුඤ්හි පඨමජ්ඣානං, ඒ ප්‍රථමධ්‍යානය; විතක්කවිචාරක්ඛොභෙන, විතර්ක විචාර යන්ගේ ක්ෂොභයෙන්; (නීවරනප්‍රහාණයෙන් කෙලශකාලුෂ්‍යයාගේ ව්‍යපශමයවූවද ආහනන පරියාහන න වශයෙන් අනුමජ්ජන අනුයො ජන වශයෙන් පවත්නාවූ විතර්ක විචාර දෙදෙනා සම්ප්‍රයුක්තයන්ට කිසික්ෂොභයක් කරන්නවුන්මෙන් පවත්නාහෙයින යන අදහසි.) වීචිතරඞ්ගසමාකුලමිව ජලං, කුඩා මහත්රළින් ආකුලවූ ජලයක් මෙන්; න සුප්පසන්නං හොති, සුප්‍රසන්නනොවේද; තස්මා, එහෙයින්; සතියාපි සද්ධාය, ශ්‍රද්ධාව ඇතද; සම්පසාදනන්ති න වුත්තං, සම්ප්‍රසාදන යයි නොකියනලදී; න සුප්පසන්නත්තා යෙවච, සුප්‍රසන්නනොවන බව හෙයින්ම; එත්ථ, මේ ප්‍රථමධ්‍යානයෙහි; සමාධිපි, සමාධියද; න සුට්ඨු පාකටො, (ඉන්ද්‍රියසමත්වය ඇතද විතර්කවිචාරක්ෂොභයෙන් සම්ප්‍රසාදන යාගේ නැති බවහෙයින්ද කැලති දියෙහි මත්ස්‍යයකුමෙන් සමාධියද) මනාව ප්‍රකටනොවේ; තස්මා, එහෙයින්; එකොදිභාවන්තිපි න වුත්තං, එකොදිභාවයයිද නොකියන ලදී; ඉමස්මිං පන ඣානෙ, මේ ද්විතීය ධ්‍යානයෙහි වනාහි, විතක්කවිචාරපලිබොධාභාවෙන, විතර්කවිචාර ක්ෂොභසඞ්ඛ්‍යාත පලිබොධයාගේ අභාවයෙන්; ලද්ධොකාසා බලවතී, සද්ධා, ලබනලද අවකාශ ඇති බලවත් ශ්‍රද්ධාද; බලවසද්ධා සහාය පටිලාභෙනෙව, බලවත් ශ්‍රද්ධාසහායප්‍රතිලාභයෙන් ද; සමාධිපි පාකටො, සමාධියද ප්‍රකටවේ; තස්මා, එහෙයින්; ඉදමෙව, මේ ද්විතීය ධ්‍යානයම; එවං වුත්තන්ති, "සම්පසාදනං චෙතසො එකොදිභාවං"යි මෙසේ කියනලද්දැයි; වෙදිතබ්බං, දතයුතු; විභඞ්ගෙ පන, විභඞ්ගප්‍රක රණයෙහි වනාහි; සම්පසාදනන්ති, සම්ප්‍රසාදන නම්; යා සද්ධා, යම් ශ්‍රද්ධාවක් ඇද්ද සද්දහනා, යම් හැදහීමෙක් ඇද්ද; ඔකප්පනා, යම් වැදහැදහීමෙක් ඇද්ද; අභිප්පසාදො, යම් අධික ප්‍රසාදයක් ඇද්දැයි ද; චෙතසො එකොදිභාවන්ති, චෙතසො එකොදිභාවනම්, යා චිත්තස්ස ඨිති, යම් චිත්තයාගේ සිටීමෙක් ඇද්ද; සණ්ඨිති,

සණ්ඨිති...පෙ...සම්මා සමාධී"ති එත්තකමෙව වුත්තං එවං වුත්තෙන පන තෙන සද්ධිං අයං අත්ථවණ්ණනා යථා න විරුජ්ඣති අඤ්ඤදත්ථු සංසන්දති චෙව සමෙති ච එවං වෙදිතබ්බං...

(අ) **අවිතක්කං අවිචාරන්ති** භාවනාය පහීනත්තා එතස්මිං එතස්ස වා විතක්කො නත්ථීති අවිතක්කං, ඉමිනාව නයෙන අවිචාරං විභඞ්ගෙපි වුත්තං "ඉති අයඤ්ච විතක්කො අයඤ්ච විචාරො සන්තා හොන්ති සමිතා වූපසන්තා අත්ථංගතා අබ්භත්ථංගතා අප්පිතා ව්‍යප්පිතා සොසිතා විසොසිතා ව්‍යන්තිකතා," තෙන වුච්චති:-අවිතක්කං අවිචාරන්ති එත්ථාහ:-නනුච විතක්කවිචාරානං වූපසමාති ඉමිනාපි අයමත්ථො සිද්ධො,

---

යම් මනාකොට සිටීමෙක් ඇද්ද; සම්මාසමාධිති, යම් සම්‍යක් සමාධියෙක් ඇද්දැයිද; එත්තකමෙව වුත්තං, (පදාර්ථ නොකියා ධර්මමාත්‍රයම දක්වියටිව) මෙපමණක්ම කියනලදී; එවං වුත්තෙන පන, ශ්‍රද්ධා සමාධි දෙදෙනාගේ ප්‍රවෘත්ති ආකාර විශෙෂ විභාවනා වශයෙන් ප්‍රවෘත්තවූ වනාහි; තෙන සද්ධිං, (සද්දහනා ඔකප්පනා යනාදි) ඒ විභඞ්ගපාඨය හා සමග; අයං අත්ථවණ්ණනා **"සම්පසාදනයොගතො සම්පසාදනතො වා සම්පසාදනං එකොදිභාවමාවහතීති එකොදිභාවන්ති ඣානං වුත්තං"**යි මෙසේ ප්‍රවෘත්තවූ) මේ අර්ථවර්ණනාතොමෝ; යථා න විරුජ්ඣති, යම්සේ විරොධ නොවේද; අඤ්ඤදත්ථු, එකාන්තයෙන්; සංසන්දති චෙව, හැණේද; සමෙති ච, සමවේද; එවං වෙදිතබ්බං, එසේ දතයුතුයි; (පෙළහා අවිරුද්ධකොට දතමනා වීනම් මෙසේ දතයුතුයි යන අර්ථයි...

(අ) භාවනාය පහීනත්තා, භාවනායෙන් ප්‍රහීන බැවින්; එතස්මිං, මේ ධ්‍යානයෙහි; එතස්ස වා, මේ ධ්‍යානයට හෝ; විතක්කො නත්ථීති, විතර්කයෙක් නැත්තුයි; අවිතක්කං, අවිතර්ක නම්; ඉමිනාව නයෙන අවිචාරං, මෙම නයින් අවිචාර නම්; විභඞ්ගෙ'පි වුත්තං, විභඞ්ගයෙහිදු කියනලදී; ඉති, මෙසේ; අයඤ්ච විතක්කො, මේ විතර්කයද; අයඤ්ච විචාරො, මේ විචාරයද යන දෙදෙන; සන්තා හොන්ති, ශාන්තවෙද්ද; ("සමං නිරොධං ගතා"යන අර්ථයි.) සමිතා, භාවනාබෙලෙන් සමථයට පමුණුවන ලදහුද; වූපසන්තා, එහෙයින්ම මනාකොට ශාන්තවෙද්ද; අත්ථංගතා, විනාශයට ගියෝද; ("අබ්භත්ථංගතා" යනු උපසර්ගයෙන් පදවර්ධනමාත්‍රයි.) අප්පිතා, විනාශයට යවනලදහුද; ව්‍යප්පිතා, විශෙෂයෙන් විනාශයට යවනලදහුද; සොසිතා, වියළනලද හුද; (**"පවත්ති සඞ්ඛාතස්ස සන්දනස්ස අභාවෙන සොසං සුක්ඛභාවං ඉතාති සොසිතා"**යි ගන්නේ.)ව්‍යන්තිකතා, විගතාන්තකරනලද හුද; තෙන වුච්චති අවිතක්කං අවිචාරන්ති, එහෙයින් අවිතර්කය අවිචාරයයි කියනුලැබේ; එත්ථ, මෙතෙන; ආහ, (චොදක) කී; නනුච, කියග; විතක්කවිචාරානං වූපසමාති ඉමිනාපි "විතක්කවිචාරානං වූපසමා" යන මෙයිනුදු; අයමත්ථො සිද්ධො, විතක්කවිචාරාභාවසඞ්ඛ්‍යාත අර්ථය සිද්ධය.

(අ) අථ කස්මා පුන වුත්තං අවිතක්කං අවිචාරන්ති? වුච්චතෙ:-එව මෙතං සිද්ධො වායමත්ථො, න පනෙතං තදත්ථදීපකං, නනු අවොචුම්හ ඔළාරිකස්ස පන ඔළාරිකස්ස අඞ්ගස්ස සමතික්කමා පඨමජ්ඣානතො පරෙසං දුතියජ්ඣානාදීනං සමධිගමො හොතීති දස්සනත්ථං විතක්ක විචාරානං වූපසමා එවං වුත්තන්ති, අපිච:-විතක්කවිචාරානං වූපසමා ඉදං සම්පසාදනං න කිලෙසකාලුස්සියස්ස, විතක්කවිචාරානඤ්ච වූපසමා එකොදිභාවං, න උපචාරජ්ඣානමිව නීවරණප්පහානා, පඨමජ්ඣාන මිවච අඞ්ගපාතුභාවාති,එවං සම්පසාදන එකොදිභාවානංහෙතුපරිදීප කමිදං වචනං, තථා විතක්කවිචාරානං වූපසමා ඉදං අවිතක්කං අවිචාරං න තතිය චතුත්ථජ්ඣානානි විය චක්ඛුවිඤ්ඤාණාදීනි විය ච

---

(අ) අථ,එසේකල;කස්මා, කුමක්හෙයින්;පුන,නැවත;අවිතක්කං අවි චාරන්ති වුත්තං, "අවිතක්කං අවිචාරං"යි කියනලදයත්? වුච්චතෙ, කියනු ලැබේ; (චොදකයා විසින් කියනලද අර්ථය ගිවිස පරිහාර කියන්නේ "එවමෙතං සිද්ධො වා ය මත්ථො"යි කියා "න පනෙතං" යනාදි කී.)එවමෙතං,ඒ එසේය;සිද්ධො වා යමත්ථො,විතක්කවිචාරාභාව සඞ්ඛ්‍යාත අර්ථය සිද්ධමය; එතං පන "විතක්කවිචාරානං වූපසමා" යන මේ වචනය වනාහි; න තදත්ථදීපකං, විතර්කවිචාරාභාවමාත්‍ර සඞ්ඛ්‍යාත අර්ථය හඟවන්නේ නොවේ; (ද්විතීයධ්‍යානාදීන්ගේ අධිගමයට උපාය දීපකවූ අජ්ඣත්ත සම්පසාදන භාවයට හා චෙතසො එකොදිභාවයට හෙතුදීපකවූ අවිතර්ක අවිචාරභාවයෙහිදු හෙතුදීපකවූ විතර්කවිචාර වූපසම වචනයෙන් විතර්කවිචාරයන්ගේ අභාවය දීපිතනොවේ යන අර්ථයි-විතක්කවිචාරානං වූපසමා යන වචනය තදර්ථදීපක නොවන බව යට කී කාරණයෙන් දක්වන පිණිස "නනු අවොචුම්හ" යනාදි කීහු-යට කීමු චොදක යන අර්ථයි...පෙ...අපිච,අතික් අර්ථයකුදු ඇති; විතක්කවිචාරානං වූපසමා, විතර්ක විචාරයන්ගේ ව්‍යුපශම හෙතුවෙන්; ඉදං, මේ ද්විතීයධ්‍යානය; සම්පසාදනං, සම්ප්‍රසාදන නම්; න කිලෙස කාලුස්සියස්ස, ක්ලෙශකාලුෂ්‍යයාගේ ව්‍යුපශමයෙන් නොවේ; විතක්ක විචාරානඤ්ච වූපසමා එකොදිභාවං, විතර්කවිචාරයන්ගේම වූපසම යෙන් එකොදිභාවයද වෙයි; උපචාරජ්ඣානමිව, උපචාරධ්‍යානයා මෙන්; න නීවරනප්පහානා, නීවරනයන්ගේ ප්‍රහානයෙන් නොද වෙයි; පඨමජ්ඣානමිව ච අඞ්ගපාතුභාවාති, ප්‍රථමධ්‍යානය මෙන් අඞ්ග ප්‍රාදුර්භාවයෙන් නොදවෙයි; එවං, මෙසේ; සම්පසාදනඑකොදිභාවානං, සම්පසාදනය එකොදිභාවය යන මොවුන්ට; ඉදං වචනං, "මේ විතක්ක විචාරානං වූපසමා"යන වචනය; හෙතුපරිදීපකං හෙතුහඟවන්නේයි; තථා, එසේම; විතක්කවිචාරානං වූපසමා, විතර්කවිචාරයන්ගේ සංසිඳී මෙන්;ඉදං,මේ ධ්‍යානය;අවිතක්කං,අවිතර්ක නම්වෙයි;අවිචාරං,අවිචාර නම් වෙයි; දුතියතතියචතුත්ථජ්ඣානානි විය,ද්විතීයතෘතීයචතුර්ථ ධ්‍යාන යන් මෙන්ද; චක්ඛුවිඤ්ඤාණාදීනි විය ච, චක්ෂුර්විඥානාදීන්මෙන් ද;

අභාවාති එවං අවිතක්ක අවිචාරභාවස්ස හෙතුපරිදීපකඤ්ච, න විතක්කවිචාරාභාවමත්තපරිදීපකං, විතක්කවිචාරාභාවමත්ත පරිදීපක මෙව පන අවිතක්කං අවිචාරන්ති ඉදං වචනං, තස්මා පුරිමං වත්වා පි පුන වත්තබ්බමෙවාති.

(අ) සමාධිජන්ති-පඨමජ්ඣානසමාධිතො සම්පයුත්තසමාධිතො වා ජාතන්ති අත්ථො, තත්ථ කිඤ්චාපි පඨමම්පි සම්පයුත්තසමාධිතො ජාතං, අථඛො අයමෙවසමාධි සමාධීති වත්තබ්බතං අරහති, විතක්ක විචාරක්ඛොභවිරහෙන අතිවිය අචලත්තා සුප්පසන්නත්තා ච, තස්මා ඉමස්ස වණ්ණභණනත්ථං ඉදමෙව සමාධිජන්ති වුත්තං පීතිසුඛන්ති ඉදං වුත්තනයමෙව. දුතියන්ති ගණනානුපුබ්බතා දුතියං, දුතියං උප්පන්නන්ති පි දුතියං. ඉදං දුතියං සමාපජ්ජතීති පි දුතියං, යම්පන

---

න අභාවාති, නැතිහෙයින් නොවේ; එවං, එසේම; අවිතක්ක අවිචාර භාවස්ස, අවිතක්කඅවිචාරභාවයට; හෙතුපරිදීපකඤ්ච, හෙතුවද හඟවා; න විතක්කවිචාරාභාවමත්තපරිදීපකං, විතර්කවිචාරයන්ගේ අභාවමාත්‍රය හඟවන්නේ නොවේ; විතක්කවිචාරාභාවමත්තපරිදීපකමෙව පන, විතර්කවිචාරයන්ගේ අභාවමාත්‍රයම හඟවන්නේ වනාහි; අවිතක්කං අවිචාරන්ති ඉදං වචනං, "අවිතක්කං අවිචාරං" යන මේ වචනයයි; තස්මා, එහෙයින්; පුරිමං වත්වාපි, "විතක්කවිචාරානං" යන මේ පූර්ව වචනය කියාද; පුන වත්තබ්බමෙවාති "අවිතක්කං අවිචාරං" යන මේ වචනය නැවත කියයුතුමැයි.

(අ) සමාධිජන්ති, සමාධිජං යන්නෙහි; පඨමජ්ඣානසමාධිතො, (ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානයට උපනිශ්‍රයප්‍රත්‍යය වන බැවින්) ප්‍රථම ධ්‍යානසමාධිහු කෙරෙන් හෝ; සම්පයුත්තසමාධිතො වා, සම්ප්‍රයුක්ත සමාධිහු කෙරෙන් හෝ; ජාතන්ති අත්ථො, උපන්නේය යන අර්ථයි; තත්ථ, එහි; කිඤ්චාපි, කිසිසේත්; පඨමම්පි, ප්‍රථමධ්‍යානයද; සම්පයුත්ත සමාධිතො ජාතං, සම්ප්‍රයුක්තසමාධීන් උපන්නේය; අථඛො, එතකුදුවුවත්; අයමෙවසමාධි, මෙම සමාධිය; සමාධීති වත්තබ්බතං අරහති, සමාධියයි කියන්නට සුදුසුයි; විතක්කවිචාරක්ඛොභවිර හෙන, විතක්කවිචාරයන්ගේ ක්ෂොභ විරහයෙන්; අතිවිය අචලත්තා, අතිශයින් අචලහෙයින්; සුප්පසන්නත්තා ච, සුප්‍රසන්නහෙයිනි; තස්මා, එහෙයින්; ඉමස්ස වණ්ණභණනත්ථං, මේ ද්විතීයධ්‍යානයාගේ ගුණ කියනු පිණිස; ඉදමෙව, මේම; සමාධිජන්ති වුත්තං, සමාධිජයයි කියනලදී; පීතිසුඛන්ති ඉදං "පීතිසුඛං" යන මේ පදය; වුත්තනය මෙව,. කියනලද නය ඇත්තේමැයි; දුතියන්ති, දුතියං යි; ගණනානු පුබ්බතා දුතියං, ගණන පටිපාටි හෙයින් ද්විතීය නම්වේ; දුතියං උප්පන්නන්ති, දෙවෙනිව උපන්නුයි; දුතියං, යි කියන්නටද වටීමැයි; ඉදං, මේ ධ්‍යානයට; දුතියං සමාපජ්ජතීති පි, දෙවනුව සමවදීනුයි කියාද; දුතියං, ද්විතීයනම්වේ; වඞ්ගවිප්පහීණං, දෙයඟකින් විප්‍ර

වුත්තං "ද්වඞ්ගවිප්පහීණං තිවඞ්ගසමන්නාගත"න්ති. තත්ථ විතක්කවිචාරානං පහාණවසෙනෙව ද්වඞ්ගවිප්පහීණතා වෙදිතබ්බා. යථා ච පඨමජ්ඣානස්ස උපචාරක්ඛණෙ නීවරණානි පහීයන්ති, න තථා ඉමස්ස විතක්කවිචාරා. අප්පණාක්ඛණෙයෙව පනෙතං විනා තෙහි උප්පජ්ජති, තෙනස්ස තෙ පහාණඞ්ගන්ති වුච්චන්ති. පීතිසුඛචිත්තස්සෙකග්ගතාති ඉමෙසං පන තිණ්ණං උප්පත්තිවසෙන තිවඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා. තස්මායං හි විභඞ්ගෙ:- ඣානන්ති **සම්පසාදො පීති සුඛං චිත්තස්ස එකග්ගතා**ති වුත්තං, තං සපරික්ඛාරං ඣානං දස්සෙතුං පරියායෙන වුත්තං. ඨපෙත්වා පන සම්පසාදනං නිප්පරියායෙන උපනිජ්ඣාන ලක්ඛණප්පත්තානං අඞ්ගානං වසෙන තිවඞ්ගික

---

යුක්තවූ; තිවඞ්ගසමන්නාගතන්ති, තුන්අඟකින් යුක්තයයි; යම්පන වුත්තං, යමක් කියනලද්ද? තත්ථ, එහි; විතක්කවිචාරානං පහාණවසෙනෙව, විතර්කවිචාරයන්ගේම ප්‍රහාණවශයෙන්; ද්වඞ්ගවිප්පහීණතා, දෙඅඟකින් විප්‍රයුක්තබව; වෙදිතබ්බා, දතයුතු; යථා, යම්සේ; පඨමජ්ඣානස්ස උපචාරක්ඛණෙ, ප්‍රථමධ්‍යාන්හුගේ උපචාරක්‍ෂණයෙහි; නීවරණානි පහීයන්ති, නීවරණයෝ ප්‍රහීණවෙද්ද; න තථා ඉමස්ස විතක්කවිචාරා, මේ ද්විතීයධ්‍යානයාගේ උපචාරක්‍ෂණයෙහි විතර්කවිචාරයෝ එසේ ප්‍රහීණ නොවෙත්; (කරුණුකිමයත්? විතර්කවිචාරයන් අසඞ්ක්ලිෂ්ටස්වභාව බැවින් උපචාරභාවනාව ඔවුන්ගේ ප්‍රහාණයට නොපොහොසත් බැවිනි-ඉදින් උපචාරභාවනාවෙන් ඒ විතර්කවිචාරයෙහි තණ්හා පැහේනමුදු හේ විශෙෂ නොවෙයි-සවිශෙෂව ඉහි තෘෂ්ණප්‍රහාණිය අර්පණාවෙහිම වෙයි-එයින් කීහ. "අප්පණාක්ඛණෙ" යනාදී) අප්පණාක්ඛණෙයෙව පන, අර්පණාක්‍ෂණයෙහි ම වනාහි; එතං, හේ ද්විතීයධ්‍යානය; තෙහි විනා උප්පජ්ජති, ඒ විතර්කවිචාරයන් විනා උපදී; තෙන, ඒ ධ්‍යානක්‍ෂණයෙහි නොවන බැවින්; අස්ස, ඒ දෙවන ධ්‍යාන්හුගේ; තෙ පහාණඞ්ගන්ති වුච්චන්ති, විතර්ක විචාර දෙදෙන ප්‍රහාණාඞ්ගහයි කියනුලැබෙත්; පීතිසුඛ චිත්තස්සෙකග්ගතාති, ප්‍රීතිය සුඛය චිත්තෛකාග්‍රතාය යන; ඉමෙසං පන තිණ්ණං උප්පත්තිවසෙන, මේ තුන්දෙනාගේ උපැත් විසින්; තිවඞ්ග සමන්නාගතතා වෙදිතබ්බා, තුන්අඟින් සැදියයුතුබව දතයුතු; තස්මා, එහෙයින් (මේ ධ්‍යානය ත්‍ර්‍යඞ්ගිකද එහෙයින් "යං විභඞ්ගෙ වුත්තං"යි සම්බන්ධකරනු ) ඣානන්ති, ඣාන නම්; සම්පසාදො, සම්ප්‍රසාදය; පීති, පීතිය; සුඛං, සුඛය; චිත්තස්ස එකග්ගතාති, චිත්තෛකාග්‍රතායයි; වුත්තං, යමෙක් කියනලද්ද; තං, හේ විභඞ්ගවචනය; සපරික්ඛාරං ඣානං දස්සෙතුං, පරිවාරධ්‍යානය දක්වනු පිණිස; පරියායෙන වුත්තං, පර්යායයෙන් කියනලදී; (රථයට පාණ්ඩුකම්බලයමෙන් සම්ප්‍රසාදනය ධ්‍යානයට පරිවාරවෙයි ධ්‍යානාඞ්ග නොවෙයි කීවෙත්.) ඨපෙත්වා පන සම්පසාදනං, සම්පසාදනය තබා; නිප්පරියායෙන, නිෂ්පර්යායයෙන්; උපනිජ්ඣානලක්ඛණප්පත්තානං, උපනිධ්‍යානලක්‍ෂණ

මෙවෙතං හොති. යථාහ:- "කතමං තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති, පීති සුඛං චිත්තස්සෙකග්ගතා"ති සෙසං පඨමජ්ඣානෙ වුත්තනයමෙව...

(අ එවං අධිගතෙ පන තස්මිම්පි වුත්තනයෙනෙව පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා හුත්වා පගුණ දුතියජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නවිතක්කවිචාරපච්චත්ථිකා, යදෙව තත්ථ පීතිගතං චෙතසො උබ්බිල්ලාවිතං, එතෙනෙතං ඔළාරිකං අක්ඛායතීති වුත්තාය පීතියා ඔළාරිකත්තා අඞ්ගදුබ්බලාති ච තත්ථ දොසං දිස්වා තතියජ්ඣානං සන්තතො මනසිකරිත්වා දුතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය තතියාධිගමාය යොගො කාතබ්බො. අථස්ස යදා දුතියතො වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො පීතිඔළාරිකතො උපට්ඨාති, සුඛඤ්චෙව එකග්ගතා ච සන්තතො උපට්ඨාති, තදාස්ස ඔළාරිකඞ්ගප්පහානාය සන්තඞ්ගපටිලාභාය ච තදෙව නිමිත්තං පථවි පථවීති පුනප්පුන මනසිකරොතො ඉදානි තතියජ්ඣානං උප්පජ්ජිස්සතීති භවඞ්ගං උපච්ඡින්දිත්වා තදෙව පථවිකසිණං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති. තතො තස්මිඤ්ඤෙවාරම්මණෙ චත්තාරි පඤ්ච වා ජවනානි ජවන්ති, යෙසං අවසානෙ එකං රූපාවචරං තතියජ්ඣානිකං, සෙසානි වුත්තනයෙනෙව කාමාවචරානීති. එත්තා

---

යට පැමිණියාවූ; අඞ්ගානං වසෙන, අඞ්ගයන්ගේ වශයෙන්; එතං, මේ ධ්‍යානය; තිවඞ්ගිකමෙව හොති, ත්‍ර්‍යඞ්ගිකමවේ; යථාහ; වදාළේමය; කතමං තස්මිං සමයෙ තිවඞ්ගිකං ඣානං හොති, එසමයෙහි කවර තුන්අඟක් ඇති ධ්‍යානයවේද; පීති, ප්‍රීතිය; සුඛං, සුඛය; චිත්තස්සෙකග්ගතාති, චිත්තයාගේ එකාග්‍රතාය යන මේ තුන්අඟ ඇති ධ්‍යානය වේ; සෙසං, සෙස්ස; පඨමජ්ඣානෙ වුත්තනයමෙව, ප්‍රථමධ්‍යන්හි කියනලදමැයි...

(අ) එවං, මෙසේ; අධිගතෙ පන තස්මිම්පි, පැමිණෙනලද එ විතීය ධ්‍යන්හිදු; වුත්තනයෙනෙව, කීනයින්ම; පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා හුත්වා, පස්ප්‍රකාරයෙන්ම පුරුදුකරනලද වසි ඇත්තහු විසින්; පගුණ දුතියජ්ඣානතො වුට්ඨාය, ප්‍රගුණවූ විතීයධ්‍යානයෙන් නැගී; අයං සමාපත්ති, මේ සමවත් තොමෝ; ආසන්නවිතක්කවිචාරපච්චත්ථිකා, ආසන්නවූ විතර්කවිචාර යන සතුරන් ඇත්තේයයිදු; පීතියා ඔළාරිකත්තා, ප්‍රීතිය ඖදාරික බැවින්; අඞ්ගදුබ්බලාති ච; දුර්වලඅඞ්ග ඇත්තේයයිද; තත්ථ දොසං දිස්වා, ඒ දෙවනධ්‍යන්හි අයුණුදුක; තතියජ්ඣානං, තුන්වන ධ්‍යන්, සන්තතො මනසිකරිත්වා, (ප්‍රීතිනැති බැවින්) ශාන්තයයි මෙනෙහිකොට; දුතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය, ඒ දෙවනධ්‍යන්හි නිකෘන්තිය ගෙවා; තතියාධිගමාය, තුන්වන ධ්‍යන් හුගේ අධිගමයට; යොගො කාතබ්බො, භාවනායොග කටයුතු; අථ, ඉක්බිත්තෙන්; යදා, යම්කලෙක්හි; දුතියතො වුට්ඨාය, දෙවන ධ්‍යානින් නැගී...පෙ...එත්තාවතා ච පන, මෙපමණෙකින් චතාහි;

වතා ච "පතෙස පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරතීති" එවමනෙන එකඞ්ගවිප්පහීනං ද්වඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං තතියජ්ඣානං අධිගතං හොති පථවිකසිණං....

(අ) **තත්‍ථ පීතියා ච විරාගාති**-විරාගො නාම වුත්තප්පකාරාය පීතියා ජිගුච්ඡනං වා සමතික්කමො වා, උභින්නං පන අන්තරා චසද්දො සම්පිණ්ඩනත්ථො, සො වූපසමං වා සම්පිණ්ඩෙති විතක්කවිචාරානං වූපසමං වා, තත්‍ථ යදා වූපසමමෙව සම්පිණ්ඩෙති, තදා පීතියා විරාගා ච කිඤ්ච භිය්‍යො වූපසමා චාති එවං යොජනා වෙදිතබ්බා. ඉමිස්සා ච යොජනාය විරාගො ජිගුච්ඡනත්ථො හොති, තස්මා පීතියා ජිගුච්ඡනා ච සමතික්කමා චාති අයමත්ථො දට්ඨබ්බො, යදා පන විතක්කවිචාරානං වූපසමං සම්පිණ්ඩෙති, තදා පීතියා ච විරාගා කිඤ්ච

---

පීතියා ච විරාගා, ප්‍රීතියගේද විරාගයෙන්; උපෙක්ඛකො ච විහරති, උපෙක්ෂකවද වෙසේ; සතො ච, සිහිඇත්තේද; සම්පජානො, නුවණැත්තේද; සුඛඤ්ච, සුවද; කායෙන, කයින්; පටිසංවෙදෙති, විඳී; යං, යම් ධ්‍යානයක් හෙතුකොටගෙන; තං, හේ තෘතීයධ්‍යාන සමන්විත පුද්ගලයා; උපෙක්ඛකො, උපෙක්ෂකය; සතිමා, සිහි ඇත්තේය; සුඛවිහාරීති, සුඛවිහාර ඇත්තේයයි; අරියා, ආචික්ඛන්ති, ආර්‍ය්‍යයෝ කියද්ද; තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, ඒ තෘතීය ධ්‍යානය උපදවා වෙසේ....පෙ....

(අ) තත්‍ථ (පාළියෙහි) ඒ විරාගයන්නෙහි; විරාගො නාම, විරාගනම්; වුත්තප්පකාරාය පීතියා "යදෙව තත්‍ථ පීති ආභොගො" යි වූක්තප්‍රකාර ඇති ප්‍රීතියෙහි; ජිගුච්ඡනං වා, නිර්වේදමුඛයෙන් හීලනය (නින්දනය හෝ); සමතික්කමො වා, තත්ප්‍රතිබද්ධ රාගප්‍රහාණයෙන් ඉක්මීම හෝයි; උභින්නං පන අන්තරා, පීතියා විරාගා යන දෙපදයන්ගේ අතුරෙහි; චසද්දො, චශබ්දය; සම්පිණ්ඩනත්ථො, සමුච්චයාර්ථයි; සො, ඒ චශබ්දය තෙමේ; වූපසමං වා සම්පිණ්ඩෙති, වූපසමය හෝ පිඩු කෙරෙයි; විතක්කවිචාරානං වූපසමං වා, විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමය හෝ පිඩුකෙරේ; තත්‍ථ, එ දෙක්හි; යදා වූපසමමෙව සම්පිණ්ඩෙති, යම් කාලෙක ව්‍යුපශමයම පිඩුකෙරේද; තදා, එකල්හි; පීතියා විරාගා ච, ප්‍රීතියෙහි විරාගයෙන්ද; කිඤ්ච භිය්‍යො, නැවත කිමෙක්ද; වූපසමා චාති, වූපසමයෙන්දැයි; එවං යොජනා වෙදිතබ්බා, මෙසේ යොජනා දතයුතු; ඉමිස්සා යොජනාය, මේ යොජනාවෙහි; විරාගො ජිගුච්ඡනත්ථො හොති, විරාගශබ්දය ජුගුප්සාර්ථවේ; තස්මා, එහෙයින්; පීතියා, ප්‍රීතියෙහි; ජිගුච්ඡනා ච, ජුගුප්සායෙන්ද; සමතික්කමා චාති, ඉක්මීමෙන්දැයි; අයමත්ථො දට්ඨබ්බො, මේ අර්ථය දතයුතු; යදා පන, යම්කලෙක වනාහි; විතක්කවිචාරානං වූපසමං සම්පිණ්ඩෙති, විතක්ක විචාරයන්ගේ සංසිඳීම පිඩුකෙරේද; තදා, එකල්හි; පීතියා ච විරාගා,

හිය්‍යා විතක්කවිචාරානඤ්ච වූපසමාති එවං යොජනා වෙදිතබ්බා, ඉමිස්සා ච යොජනාය විරාගො සමතික්කමනත්ථො හොති, තස්මා පීතියා ච සමතික්කමා විතක්කවිචාරානඤ්ච වූපසමාති අයමත්ථො දට්ඨබ්බො. කාමඤ්චෙතෙ විතක්කවිචාරා දුතියජ්ඣානෙයෙව වූපසන්තා, ඉමස්ස පන ඣානස්ස මග්ගපරිදීපනත්ථං වණ්ණභණනත්ථඤ්චෙතං වුත්තං. විතක්කවිචාරානඤ්ච වූපසමාති හි වුත්තෙ ඉදං පඤ්ඤායති:- නූන විතක්කවිචාරානං වූපසමො මග්ගො ඉමස්ස ඣානස්සාති, යථා ච තතියෙ අරියමග්ගෙ අප්පහීනානම්පි සක්කායදිට්ඨාදීනං පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පහානාති එවං පහානං වුච්චමානං වණ්ණභණනං හොති තදධිගමාය උස්සුක්කානං

---

ප්‍රීතියගේ විරාගයෙන්ද; විතක්කවිචාරානඤ්ච වූපසමාති, විතක්ක විචාරයන්ගේ සංසිඳීමෙන්දැයි; එවං, මෙසේ; යොජනා වෙදිතබ්බා, යොජනා දතයුතු; ඉමිස්සා ච යොජනාය, මේ යොජනාවෙහි; විරාගො, විරාගශබ්දය; සමතික්කමනත්ථො හොති, සමතික්‍රමනාර්‍ථවේ; තස්මා, එහෙයින්; පීතියා ච සමතික්කමා, ප්‍රීතියගේ ඉක්මීමෙන්ද; විතක්ක විචාරානඤ්ච වූපසමාති, විතක්කවිචාරයන් සංසිඳීමෙන්දැයි; අයමත්ථො දට්ඨබ්බො, මේ අර්‍ථය දතයුතු; කාමඤ්ච, ඒකාන්තයෙන්ම; එතෙ විතක්කවිචාරා, මේ විතක්කවිචාරදෙදෙනා; දුතියජ්ඣානෙ යෙව වූපසන්තා, ද්විතීයධ්‍යානක්ෂණයෙහිම සන්හුන්හ; ඉමස්ස පන ඣානස්ස, මේ ධ්‍යානයට වනාහි; මග්ගපරිදීපනත්ථං, උපාය දක්වන පිණිසද; (ද්විතීයධ්‍යානය නොලදහොත් තෘතීයධ්‍යානය නොලදහැකි බැවින් විතර්‍කවිචාරයන්ගේ සමතික්‍රමණය තෘතීයධ්‍යානලාභයට මාර්‍ගවී.) වණ්ණභණනත්ථඤ්ච, ගුණ කියනපිණිසද; එතං වුත්තං, මේ "විතක්කවිචාර වූපසම" වචනය කියනලදී; විතක්කවිචාරානං ච වූපසමාතිහි වුත්තෙ, විතක්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙනැයි කීකල්හි; ඉදං පඤ්ඤායති, මේ පැනෙ; නූන, ඒකාන්තයෙන්; විතක්කවිචාරානං වූපසමො, විතක්කවිචාරයන්ගේ ව්‍යුපසමය; ඉමස්ස ඣානස්ස මග්ගොති, මේ ධ්‍යානයට මාර්‍ගයයි; (ඉදං පඤ්ඤායති යොදනු.) යථා ච, යම්සේ; තතියෙ අරියමග්ගෙ අප්පහීනානම්පි, තෘතීය ආර්‍ය්‍යමාර්‍ගක්ෂණයෙහි අප්‍රහීණදවූ; සක්කායදිට්ඨාදීනං, සත්කායදෘෂ්ටිය විචිකිත්සාය ශීලව්‍රතපරාමර්‍ශය කාමරාගය ව්‍යාපාදය යන; පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං, පඤ්චාවරම්භාගිය සංයොජනයන්ගේ; පහානාති, ප්‍රහාණයෙනැයි; එවං පහානං වුච්චමානං, මෙසේ ප්‍රහාණය කියනුලබන්නේ; වණ්ණභණනං හොති, (මෙහි නොපැහෙතුදු ප්‍රසංශාමාත්‍රයක් ගෙන කියනබැවින්) වර්‍ණභණනනම් වේද; තදධිගමාය උස්සුක්කානං, තෘතීයමාර්‍ගාධිගමය පිණිස උත්සාහකරන්නට;

උස්සාහජනකං, එවමෙව ඉධ අවූපසන්තානම්පි විතක්කවිචාරානං වූපසමො වුච්චමානො වණ්ණභණනං හොති, තෙනායමෙත්ථ වුත්තො-පීතියා ච සමතික්කමා විතක්කවිචාරානඤ්ච වූපසමාති.

(අ) **උපෙක්ඛකො ච විහරතීති** එත්ථ උපපත්තිතො ඉක්ඛතීති උපෙක්ඛා, සමං පස්සති අපක්ඛපතිතා හුත්වා පස්සතීති අත්ථො, තාය විසදාය විපුලාය ථාමගතාය සමන්නාගතත්තා තතියජ්ඣානසමඞ්ගී උපෙක්ඛකොති වුච්චති, උපෙක්ඛා පන දසවිධා හොති:-ඡළඞ්ගුපෙක්ඛා, බ්‍රහ්මවිහාරුපෙක්ඛා, බොජ්ඣඞ්ගුපෙක්ඛා, විරියුපෙක්ඛා, සඞ්ඛාරුපෙක්ඛා, වෙදනුපෙක්ඛා, විපස්සනුපෙක්ඛා, තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, ඣානුපෙක්ඛා, පාරිසුද්ධුපෙක්ඛාති. තත්ථ යා "ඉධ ඛීණාසවො භික්ඛු

---

උස්සාහජනකං, උත්සාහජනක වේද; එවමෙව, එපරිද්දෙන්ම; ඉධ, මේ තෘතීයධ්‍යානයෙහි; අවූපසන්තානම්පි, නොසන්හුන්නාවූද; විතක්කවිචාරානං, විතර්කවිචාරයන්ගේ; වූපසමො වුච්චමානො, සංසිඳීම කියනුලබන්නේ; වණ්ණභණනං හොති, ගුණකීම් නම්වේ; තෙන, එහෙයින්; අයමෙත්ථ වුත්තො, මේ අර්ථය කියනලදී; පීතියා ච සමතික්කමා, ප්‍රීතියගේ සමතික්‍රමනයෙන්ද; විතක්කවිචාරානඤ්ච වූපසමාති, විතර්කවිචාරයන්ගේ සංසිඳීමෙන්ද යන ("අයමෙත්ථ වුත්තො" යි යොදනු.

(අ) උපෙක්ඛකො ච විහරති, උපෙක්ඛකො ච විහරති යන්නෙහි; උපපත්තිතො, (සමවාහිත බැවින්) සුදුසුපරිද්දෙන්; ඉක්ඛතීති, බලානුයි; උපෙක්ඛා, උපෙක්ෂා නම්; සමං, සමකොට; පස්සති, බලා; (ධ්‍යානුපෙක්ෂාවද සමවාහිත අනෙතානීත කොට පවත්නෙන් "සමං පස්සති" යී යොදනු.) අපක්ඛපතිතා හුත්වා, පක්ෂපාතනොව; පස්සතීති අත්ථො, බලයි යන අර්ථයි; විසදාය, (සඞ්කලශවිගමයෙන්) පරිව්‍යක්තවූ; විපුලාය, (සාතිශය මහද්ගතභාවප්‍රාප්තින්) මහත්වූ; ථාමගතාය, (ප්‍රීතිවිගමයෙන්) ස්ථිරභාවයට පැමිණියාවූ; තාය සමන්නාගතත්තා,යි යොදනු.) උපෙක්ෂාවෙන් සමන්නාගත හෙයින්; තතියජ්ඣානසමඞ්ගී, තෘතියධ්‍යානයෙන් සමන්විත තෙමේ; උපෙක්ඛකොති වුච්චති, උපෙක්ෂකයයි කියනුලැබේ; උපෙක්ඛා පන, උපෙක්ෂාවනාහි; දසවිධා හොති, දශප්‍රකාරවේ; ඡළඞ්ගුපෙක්ඛා, ෂඩඞ්ගොපෙක්ෂාය; බ්‍රහ්මවිහාරුපෙක්ඛා, බ්‍රහ්මවිහාරොපෙක්ෂාය; බොජ්ඣඞ්ගුපෙක්ඛා, බොධ්‍යඞ්ගොපෙක්ෂාය; විරියුපෙක්ඛා, වීර්‍ය්‍යොපෙක්ෂාය; සඞ්ඛාරුපෙක්ඛා, සංස්කාරොපෙක්ෂාය; වෙදනුපෙක්ඛා, වෙදනොපෙක්ෂාය; විපස්සනුපෙක්ඛා, විදර්ශනොපෙක්ෂාය; තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාය; ඣානුපෙක්ඛා, ධ්‍යානොපෙක්ෂාය; පාරිසුද්ධිඋපෙක්ඛාති, පාරිශුද්ධිඋපෙක්ෂායයි; (උපෙක්ෂාවෙදනාව නැති නම් "උපෙක්ඛකො" යනු කුමට කීහයත්? උපෙක්ෂාවෙදනාව උපෙක්ෂානම් නොවෙයි උපෙක්ෂානම් දශවිධ වෙයි දක්වන පිණිස "උපෙක්ඛා පන දසවිධා" යි කියා දශවිධ උපෙක්ෂාවන් උද්දෙසකොට

චකඛුනා රූපං දිසවා නෙව සුමනො හොති න දුමමනො උපෙකඛකො ච විහරති සතො සමපජානො"ති. එවමාගතා ඛීණාසවසස ඡසු ද්වාරෙසු ඉට්ඨානිට්ඨඡළාරමමණාපාථෙ පරිසුදධපකතිභාවා විජහනාකාරභූතා උපෙකඛා අයං ඡළඞගුපෙකඛා නාම. යා පන "උපෙකඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිතවා විහරතී"ති. එවමාගතා සතෙතසු මජඣතතාකාරභූතා උපෙකඛා අයං බ්‍රහමවිහාරුපෙකඛා නාම෴

(අ) යා "උපෙකඛාසමෙබාජඣඞගං භාවෙති විවෙකනිසසිතනති" එවමාගතා සහජාතධමමානං මජඣතතාකාරභූතා උපෙකඛා අයං බොජඣඞගුපෙකඛා නාම. යා පන "කාලෙන කාලං උපෙකඛානිමිතතං

---

දුන් ඔවුන් සවරූපයෙන් දක්වනු පිණිස "තත්‍ථ" යනාදී කීහු.) තත්‍ථ, ඒ දශවිධ උපෙක්‍ෂාවන් කෙරෙහි; ("යා උපෙකඛා" යි යොදනු.) ඉධ, මේ ශාසනයෙහි; ඛීණාසවො භිකඛු, ක්‍ෂීණාශ්‍රව මහණතෙමේ; චකඛුනා රූපං දිසවා, චක්‍ෂුසින් රූපය දැක; නෙව සුමනො හොති, (රාගවශයෙන්) නොද සොම්නස්වෙයි; න දුමමනො, (ප්‍රතිඝවශයෙන්) නොද දොම්නස්වේ; උපෙකඛකො ච විහරති, උපෙක්‍ෂකව වෙසේ; සතො, සිහිඇත්තේ; සමපජානොති, නුවණැත්තේයයි; එවමාගතා, මෙසේ ආ; ඛීණාසවසස, ක්‍ෂීණාශ්‍රවයාගේ; ඡසු ද්වාරෙසු, ෂඩ්වාරයෙහි; ඉට්ඨානිට්ඨඡළාරමමණාපාථෙ, ඉෂ්ටානිෂ්ට ෂඩාලම්බනයන් හමුවූකල්හි; පරිසුදධපකතිභාවා, (නිකෙලශීබවයයි කියනුලබන) පරිශුද්ධප්‍රකෘති ඇතිබව; අවිජහනාකාරභූතා, නොහරනා ආකාරයෙන්වූ; යා පන උපෙකඛා, යම් උපෙක්‍ෂාවක් ඇද්ද; අයං, මේ තොමෝ; ඡළඞගුපෙකඛා නාම, ෂඩඞ්ගොපෙක්‍ෂා නම් වේ; උපෙකඛාසහගතෙන චෙතසා, උපෙක්‍ෂාසහගත චිත්තයෙන්; එකං දිසං ඵරිතවා විහරතීති, එක්දිගක් පතුරුවා වෙසෙයි; එවමාගතා, මෙසේ ආ; සතෙතසු මජඣතතා කාරභූතා, සත්ත්වයන්කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන්වූ; (සත්ත්වයන්කෙරෙහි කර්මස්වකෘතදර්ශිතයට හෙතුවූ දර්ශිතාකාරයෙන් වූ යනු අර්ථයි.) යා පන උපෙකඛා, යම් උපෙක්‍ෂාවක් ඇද්ද; අයං බ්‍රහමවිහාරුපෙකඛා නාම. මේ බ්‍රහමවිහාරොපෙක්‍ෂා නමු෴

(අ) උපෙකඛාසමෙබාජඣඞගං, උපෙක්‍ෂාසම්බොධ්‍යඞ්ගය; භාවෙති, වඩා; විවෙකනිසසිතනති, විවෙකනිශ්‍රිත වූයයි; එවමාගතා, මෙසේ ආ; සහජාතධමමානං මජඣතතාකාරභූතා, සහජාතධර්මයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නාවූ; යා උපෙකඛා, යම් උපෙක්‍ෂාවක් ඇද්ද; (භාවනාව වීථිප්‍රතිපන්නකල්හි අලීනානුද්ධත අනිරුස්වාදභාවයෙන් ප්‍රග්‍රහ නිග්‍රහ සම්ප්‍රහර්ශණයෙහි ව්‍යාපාරයක් නැතිහෙයින් සම්ප්‍රයුක්තධර්මයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නා වූ යනු අර්ථයි. **"සහජාතධමමානං"** යනු **නිර්ධාරණයෙහි ෂෂ්ඨියි.**) අයං බොජඣඞගුපෙකඛා නාම, මේ බොධ්‍යඞ්ගොපෙක්‍ෂා නම් වේ; කාලෙනකාලං, කලින්කල; උපෙකඛානිමිතතං මනසිකරොතීති,

මනසිකරෙතී"ති. එවමාගතා අනච්චාරද්ධා නාතිසිථිලා විරියසඞ්ඛාතා උපෙක්ඛා, අයං විරියුපෙක්ඛා නාම. යා "කති සඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති, කති සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති, අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති, දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්තී"ති.

---

උපෙක්ෂානිමිත්ත මෙනෙහිකෙරේනුයි; එවමාගතා, මෙසේ ආ; (සමවාහිතව පවත්නාසඳ මැදහත් වන බැවින් වීර්‍ය්‍යම උපෙක්ෂා නම්වේ. **"සමවාහිතකාලෙ උපෙක්ඛනතො ඤායූපෙක්ඛාඤායූවච්චනෙ විරියං"** යනු සන්නයයි. **"ලීනුද්ධච්චපක්ඛපාතරහිතං මජ්ඣත්තං විරියං උපෙක්ඛා"** යනු ටීකායි-මධ්‍යස්ථාකාරයෙන් පවත්නා වීර්‍ය්‍යයම ආකාරයගෙන පැවැත්විය යුතුවූ එබඳු වීර්‍ය්‍යයට නිමිත්ත වන බැවින් උපෙක්ෂානිමිත්තනම් වේ. **"භාවනාය සමප්පවත්තිකාලෙ උපෙක්ඛියතීති උපෙක්ඛා විරියමෙව උපෙක්ඛා විරියුපෙක්ඛා"**යි ගන්නේ.) අනච්චාරද්ධා, අත්‍යාරබ්ධ නොවූ; නාතිසිථිලා, අතිසිථිල නොවූ; විරියසඞ්ඛාතා, වීර්‍ය්‍යසංඛ්‍යාතවූ; යා පන උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං විරියුපෙක්ඛා නාම, මේ වීර්‍ය්‍යෝපෙක්ෂා නමු; කතිසඞ්ඛාරුපෙක්ඛා, සංස්කාරොපෙක්ෂා කීදෙනෙක්; සමාධිවසෙන උප්පජ්ජන්ති, සමාධිවශයෙන් උපදිද්ද; කතිසඞ්ඛාරුපෙක්ඛා, සංස්කාරොපෙක්ෂා කීදෙනෙක්; විපස්සනාවසෙන උප්පජ්ජන්ති, විදර්ශනාවශයෙන් උපදනාහුද; අට්ඨසඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති, සංස්කාරොපෙක්ෂාවෝ අටදෙනෙක් සමාධි විසින් උපදිත්; (ඔවුන් අටදෙනා මේ පාළිවිසින් දතයුතු.— **"පඨමජ්ඣානපටිලාභත්ථාය නීවරණෙ පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං දුතියජ්ඣානපටිලාභත්ථාය විතක්කවිචාරෙ තතියජ්ඣානපටිලාභත්ථාය පීතිං චතුත්ථජ්ඣානපටිලාභත්ථාය සුඛදුක්ඛෙ ආකාසානඤ්චායතනසඤ්ඤාසමාපත්තිපටිලාභත්ථාය රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං විඤ්ඤාණඤ්චායතනසමාපත්තිපටිලාභත්ථාය ආකාසානඤ්චායතනසඤ්ඤං ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිපටිලාභත්ථාය විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිපටිලාභත්ථාය ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං ඉමා අට්ඨසඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති.** "දසසඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති" යි කී දශදෙනාද පෙළින්ම දතයුත්තාහුයි.—

**"සොතාපත්තිමග්ගපටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සොකපරිදෙවං උපායාසං—පෙ—සොතාපත්තිඵලසමාපත්තත්ථාය උප්පාදං පවත්තං—පෙ—අරහත්තමග්ගපටිලාභත්ථාය උප්පාදං—පෙ—උපායාසං—පෙ—අරහත්තඵලසමාපත්තත්ථාය සුඤ්ඤතවිහාරසමාපත්තත්ථාය අනිමිත්තවිහාරසමාපත්තත්ථාය උප්පාදං**

එවමාගතා නීවරණාදිපටිසඞ්ඛාසන්තිට්ඨනා ගහණෙ මජ්ඣත්තභූතා උපෙක්ඛා අයං සඞ්ඛාරුපෙක්ඛා නාම. යා පන “යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛාසහගතන්ති.” එවමාගතා අදුක්ඛමසුඛසඤ්ඤිතා උපෙක්ඛා අයං වෙදනුපෙක්ඛා නාම. යා “යදත්ථි යං භූතං තං පජහති උපෙක්ඛං පටිලභතී”ති. එවමාගතා විචිනනෙ මජ්ඣත්තභූතා උපෙක්ඛා අයං විපස්සනුපෙක්ඛා නාම. යා පන ඡන්දාදීසු යෙවාපනකෙසු ආගතා සහජාතානං සමවාහිතභූතා උපෙක්ඛා, අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නාම. යා උපෙක්ඛකො ච විහරතීති එවමාගතා අග්ගසුඛෙපි තස්මිං අපක්ඛපාතජනනී උපෙක්ඛා

---

පවත්තිං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උප්පත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණන්ති ඉමා දස විපස්සනාවසෙන උප්පජ්ජන්ති”යි-එවමාගතා, මෙසේ ආ; නීවරණාදි, (ප්‍රථමධ්‍යානාදීන් විෂ්කම්භිතවූ, නීවරණ විතර්ක විචාරාදීන්; පටිසඞ්ඛා සන්තිට්ඨනා, (ස්වභාව හෙයින්) පරීක්ෂාකොට සිටිවූහුන් විසින් සිටුනාවූ; ගහණෙ මජ්ඣත්තභූතා, (දෘෂ්ටාදීනව ඇති හෙයින්) ඒ නීවරණාදීන්ගේ ග්‍රහණයෙහි (උත්පාදනයෙහි) මධ්‍යස්තව අධ්‍යුපෙක්ෂණය කරන; යා උපෙක්ඛා, යම් විදර්ශනාප්‍රඥාවෙක් ඇද්ද; අයං, මෝතොමෝ; සඞ්ඛාරුපෙක්ඛා නාම, සංස්කාරොපෙක්ෂා නමු; යස්මිං සමයෙ, යම් සමයෙක්හි; කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති; කාමාවචරවූ කුසලචිත්තය උත්පන්නවේද; උපෙක්ඛාසහගතන්ති, උපෙක්ෂා සහගතවූ යයි; එවමාගතා, මෙසේ ආ; අදුක්ඛමසුඛසඤ්ඤිතා, අදුක්ඛම සුඛසංඥිවූ; යා පන උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං වෙදනුපෙක්ඛා නාම, මේ වෙදනොපෙක්ෂා නමු; යදත්ථි, යමෙක් ඇද්ද; (අනිත්‍යාදි ලක්ෂණත්‍රය උව ලැබේද) යං භූතං, යමෙක් ප්‍රත්‍යය නිර්වෘත්ත බැවින් විද්‍යමානවූ යම් ස්කන්ධපඤ්චකයෙක් ඇද්ද; තං පජහති, අනිත්‍යානුදර්ශනාදීන් නිත්‍යසංඥාදීන් ප්‍රජහනය කරද්ද; (මනාකොටම දෘෂ්ටාදීනව ඇතිහෙයින් තත්ප්‍රතිබද්ධ ඡන්දරාගප්‍රහාණයෙන් දුරු කෙරෙද්ද යන අර්ථයි යම්සේ ආයතියෙහි ආදානය නොවේද එසේ පිළිපැදීමෙන් දුරුකෙරේ.) උපෙක්ඛං පටිලභතීති, (එවම්භූතවූ යොගී තෙමේ) එහි උපෙක්ෂාව පිළිලැබෙයි; එවමාගතා, මෙසේ ආ; විචිනනෙ මජ්ඣත්තභූතා, (අනිත්‍යාදිවශයෙන්) සම්මර්ශනයෙහි මධ්‍යස්ථවූ; යා උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං විපස්සනුපෙක්ඛා නාම, මෝතොමෝ විදර්ශනොපෙක්ෂා නමු; යා පන, යමක් වනාහි; ඡන්දාදීසු යෙවාපනකෙසු ආගතා, ඡන්දාදිවූ යෙවාපනකධර්මයන් අතුරෙහි ආවාවූ; සහජාතානං, එක්ව උපන් ධර්මයන්; සමවාහිතභූතා, සමව ඉසිලීමට කාරණවූ; උපෙක්ඛා, උපෙක්ෂාවක්වේද; අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නාම, මේ තත්‍රමධ්‍යස්ථොපෙක්ෂා නමු; යා, යමක්; උපෙක්ඛකො ච විහරතීති එවමාගතා, උපෙක්ෂකව වෙසෙයි මෙසේ ආද; අග්ගසුඛෙපි තස්මිං, ඒ අග්‍රවූ ධ්‍යාන සුවෙහිද; අපක්ඛපාත

අයං ඣානුපෙක්ඛා නාම. යා පන උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානන්ති එවමාගතා සබ්බපච්චනීකපරිසුද්ධා පච්චනීකවූපසමනෙපි අව්‍යාපාරභූතා උපෙක්ඛා අයං පාරිසුද්ධිඋපෙක්ඛා නාම.

(අ) තත්ථ ඡළඞ්ගුපෙක්ඛා ච බ්‍රහ්මවිහාරුපෙක්ඛා ච බොජ්ඣඞ්ගුපෙක්ඛා ච තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ච ඣානුපෙක්ඛා ච පාරිසුද්ධිඋපෙක්ඛා ච අත්ථතො එකා තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ව හොති, තෙන තෙන අවත්ථාභෙදෙන පනස්සා අයං භෙදො:- එකස්සාපි සතො සත්තස්ස කුමාරයුවථෙරසෙනාපතිරාජාදිවසෙන භෙදො විය, තස්මා තාසු යත්ථ ඡළඞ්ගුපෙක්ඛා, න තත්ථ බොජ්ඣඞ්ගුපෙක්ඛාදයො, යත්ථ වා පන බොජ්ඣඞ්ගුපෙක්ඛා, න තත්ථ ඡළඞ්ගුපෙක්ඛාදයො හොන්තීති වෙදිතබ්බා.

---

ජනනී, පක්ෂපාත නොකරන්නාවූ; යා උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං ඣානුපෙක්ඛා නාම, මේ ධ්‍යානොපෙක්ෂා නමු; උපෙක්ඛා සති පාරිසුද්ධිං, උපෙක්ෂාසමෘති පාරිශුද්ධි ඇති; චතුත්ථජ්ඣානන්ති, චතුර්ථධ්‍යානයයි; එවමාගතා, මෙසේ ආ; සබ්බපච්චනීකපරිසුද්ධා, (නීවරණ විතර්කවිචාරාදී සියලු ප්‍රතිපක්ෂයන් කෙරෙන් විමුක්ත හෙයින්) සර්වප්‍රත්‍යනීකයන් කෙරෙන් පරිශුද්ධවූ; පච්චනීකවූපසමනෙපි අව්‍යාපාරභූතා, (ප්‍රත්‍යනීකයන් සන්හුන් සෙයින්) ඒ ප්‍රත්‍යනීක ව්‍යුපශමයෙහිදු අව්‍යාපාරභාවයෙන් ප්‍රවෘත්තවූ; (අව්‍යාපාරබවට පැමිණි හෝ) යා පන උපෙක්ඛා, යම් උපෙක්ෂාවක් ඇද්ද; අයං පාරිසුද්ධි උපෙක්ඛා නාම, මේ පාරිශුද්ධ්‍යුපෙක්ෂා නම් වේ.

(අ) තත්ථ, ඒ දශවිධ උපෙක්ෂාවන් කෙරෙහි; ඡළඞ්ගුපෙක්ඛා ච, ෂඩඞ්ගොපෙක්ෂාව ද, බ්‍රහ්මවිහාරුපෙක්ඛා ච, බ්‍රහ්මවිහාරොපෙක්ෂාව ද; බොජ්ඣඞ්ගුපෙක්ඛා ච, බොධ්‍යඞ්ගොපෙක්ෂාව ද; තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ච, තත්‍ර මධ්‍යස්ථොපෙක්ෂාව ද; ඣානුපෙක්ඛා ච, ධ්‍යානොපෙක්ෂාව ද; පාරිසුද්ධිඋපෙක්ඛා ච, පාරිශුද්ධ්‍යුපෙක්ෂාව ද; අත්ථතො, අර්ථහෙයින්; එකා තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ව හොති, එක තත්‍රමධ්‍යස්ථොපෙක්ෂාම වේ; තෙන තෙන අවත්ථාභෙදෙන පන, ඒ ඒ අවස්ථාභෙදයෙන් වනාහි; අස්සා, මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවගේ; අයං භෙදො, මේ භෙදයයි; එකස්සාපි සතො සත්තස්ස, එකම සත්ත්වයෙකුගේ; කුමාරයුවථෙරසෙනාපතිරාජාදිවසෙන, කුමරුය ළදරුය මහලුය සෙනාපතිය රජය යනාදීන්ගේවශයෙන්; භෙදො විය, භෙදය මෙන්; තස්මා, එහෙයින්; (යම්හෙයකින් සවභාවයෙන් භෙදයෙක් නැතද යම් යම් ප්‍රත්‍යය විශෙෂයකින් මේ උපෙක්ෂාවන්ගේ මේ අවස්ථාභෙදය තෙමේ ඒ ප්‍රත්‍යයන්ගේ එක්ව පැවැත්මක් නැතිබැවින් ඒ උපෙක්ෂාවන්ගේද භෙදය වෙයි එක්වද නොපවති එහෙයින යන අර්ථයි.) තාසු, ඒ උපෙක්ෂාවන්කෙරෙහි; යත්ථ ඡළඞ්ගුපෙක්ඛා, යම්තැනෙක ෂඩඞ්ගොපෙක්ෂාව ද; තත්ථ, එතැන්හි; න බොජ්ඣඞ්ගුපෙක්ඛාදයො, බොධ්‍යඞ්ගොපෙක්ෂාදීහු නොවෙත්; යත්ථ වා පන බොජ්ඣඞ්ගුපෙක්ඛා, යම්තැනෙක වනාහි බොධ්‍යඞ්ගොපෙක්ෂාව ද; තත්ථ එහි; ඡළඞ්ගුපෙක්ඛාදයො, න හොන්තීති වෙදිතබ්බා, ෂඩඞ්ගොපෙක්ෂාදීහු නොවෙතියි දතයුත්තාහුයි.

(අ) යථා චෙතාසං අත්ථතො එකීභාවො, එවං සඞ්ඛාරුපෙක්ඛාවිපස්සනුපෙක්ඛානම්පි, පඤ්ඤා එව හි සා කිච්චවසෙන ද්විධා භින්නා, යථා හි පුරිසස්ස සායං ගෙහං පවිට්ඨසප්පං අජපදදණ්ඩං ගහෙත්වා පරියෙසමානස්ස තං ථුසකොට්ඨකෙ නිපන්නං දිස්වා සප්පො නු ඛො නොති අවලොකෙන්තස්ස සොවත්ථිකත්තයං දිස්වා නිබ්බෙමතිකස්ස සප්පො න සප්පොති විචිනනෙ මජ්ඣත්තතා හොති, එවමෙවං යා ආරද්ධවිපස්සකස්ස විපස්සනාඤාණෙන ලක්ඛණත්තයෙ දිට්ඨෙ සඞ්ඛාරානං අනිච්චභාවාදිවිචිනනෙ මජ්ඣත්තතා උප්පජ්ජති, අයං විපස්සනුපෙක්ඛා, යථා පන තස්ස පුරිසස්ස අජපදෙන දණ්ඩෙන ගාළ්හං සප්පං ගහෙත්වා කින්තාහං ඉමං සප්පං අවිහෙඨෙන්තො අත්තානඤ්ච ඉමිනා අඩංසාපෙන්තො මුඤ්චෙය්‍යන්ති මුඤ්චනාකාරමෙව පරියෙසතො ගහණෙ මජ්ඣත්තතා හොති එවමෙව යා ලක්ඛණත්තයස්ස දිට්ඨත්තා

---

(අ) යථා ච, යම්සේ; එතාසං, මොවුන්ගේ; අත්ථතො එකීභාවො, අර්ථහෙයින් එකීභාවයද; සඞ්ඛාරුපෙක්ඛාවිපස්සනුපෙක්ඛානම්පි, සංස්කාරොපෙක්ෂා විදර්ශනොපෙක්ෂාවන්ගේද; එවං, මෙසේම අර්ථහෙයින් එකීභාවය වේ; පඤ්ඤා එව හි සා, ප්‍රඥාවම හෝ වනාහි; කිච්චවසෙන ද්විධා භින්නා, කෘත්‍යවශයෙන් දෙපරිද්දෙකින් බිඳුනා ලද්දූ; යථා හි, යම්සේ; සායං, සවස්වේලෙහි; ගෙහං පවිට්ඨසප්පං, ගෙට වන් සප්හු; අජපදදණ්ඩං ගහෙත්වා, අජපදයකාටබඳුවූසටහන්ඇතිදණ්ඩ ගෙන; පරියෙසමානස්ස, සොයන්නාවූ; තං, ඒ සප්හු; ථුසකොට්ඨකෙ නිපන්නං, තෝ කොටුවෙහි හොත්තහු; දිස්වා, දැක; සප්පො නු ඛො, සර්පයෙක්දෝ හෝ; නොති, නොවේදෝ හෝයි; අවලොකෙන්තස්ස, බලන්නාවූ; සොවත්ථිකත්තයං දිස්වා, සෝවැතිතුන දැක; නිබ්බෙමතිකස්ස, විමතිනැතිවූ; පුරිසස්ස, (යි යොදනු.) පුරුෂයාගේ; සප්පො න සප්පොති විචිනනෙ, සර්පදෝ හෝයි නොවේදෝ හෝයි විචාරයෙහි; මජ්ඣත්තතා හොති, මැදහත්බව වේද; එවමෙවං, එපරිද්දෙන්ම; ආරද්ධවිපස්සකස්ස, ආරම්භකරනලද විදර්ශකයාගේ; විපස්සනාඤාණෙන ලක්ඛණත්තයෙ දිට්ඨෙ, විදර්ශනාඥානයෙන් අනිත්‍යාදීලක්ෂණත්‍රය දෘෂ්ටකල්හි; සඞ්ඛාරානං අනිච්චාදිභාවවිචිනනෙ, සංස්කාරයන්ගේ අනිත්‍යතාදි විචාරයෙහි; යා මජ්ඣත්තතා උප්පජ්ජති, යම් මැදහත්බවක් උපදීද; අයං, මේතොමෝ; විපස්සනුපෙක්ඛා, විදර්ශනොපෙක්ෂා නම්වේ; යථා පන, යම්සේ වනාහි; තස්ස පුරිසස්ස, ඒ පුරුෂයාගේ; අජපදෙන දණ්ඩෙන, අජපදසටහන් ඇති දණ්ඩෙන්; ගාළ්හං, දැඩිකොට; සප්පං ගහෙත්වා, සර්පයා ගෙන; කින්නු, කිසේ නම්; අහං, මම; ඉමං සප්පං, මේ සප්හු; අවිහෙඨෙන්තො, නොපෙළන්නෙම්; අත්තානඤ්ච, තමාද; ඉමිනා අඩංසාපෙන්තො, මේ සප්හු ලවා නොකවන්නෙම්; මුඤ්චෙය්‍යන්ති, මිදෙම්දෝ හෝයි; මුඤ්චනාකාරමෙව පරියෙසතො, මුදනආකාරයම සොයනුවහට; ගහණෙ මජ්ඣත්තතා හොති, උහුගේ ගැන්මෙහි මැදහත්බව වේද, එවමෙව, එපරිද්දෙන්ම; ලක්ඛණත්තයස්ස දිට්ඨත්තා, ලක්ෂණත්‍රය දුටුහෙයින්;

ආදිත්ත විය තයො භවෙ පස්සතො සඞ්ඛාරග්ගහණෙ මජ්ඣත්තතා, අයං සඞ්ඛාරුපෙක්ඛා, ඉති විපස්සනුපෙක්ඛාය සිද්ධාය සඞ්ඛාරුපෙක්ඛාපි සිද්ධාව හොති, ඉමිනා පනෙසා විචිනනගහණෙසු මජ්ඣත්තසඞ්ඛාතෙන කිච්චෙන ද්විධා භින්නාති, විරියුපෙක්ඛා පන වෙදනුපෙක්ඛා ච අඤ්ඤමඤ්ඤඤ්ච අවසෙසාහි ච අත්ථතො භින්නා එවාති. ඉති ඉමාසු උපෙක්ඛාසු ඣානුපෙක්ඛා ඉධ අධිප්පෙතා, සා මජ්ඣත්තතාලක්ඛණා, අනාභොගරසා අව්‍යාපාරපච්චුපට්ඨානා පීතිවිරාගපදට්ඨානාති එත්ථාහ:- නනු චායං අත්ථතො තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව හොති, සා ච පඨමදුතියජ්ඣානෙසුපි අත්ථි, තස්මා තත්‍රාපි උපෙක්ඛකො ච විහරතීති එවමයං වත්තබ්බා සියා සා කස්මා න වුත්තාති, අපරිව්‍යත්ත

---

ආදිත්ත විය තයො භවෙ පස්සතො, තුන්භවය ගිනිගත්ගෙයක් මෙන් බලනුව හට; සඞ්ඛාරග්ගහණෙ, සංස්කාරයන්ගේ ග්‍රහණයෙහි; යා මජ්ඣත්තතා, යම් මැදහත්බවෙක් වේද; අයං, මෝ තොමෝ; සඞ්ඛාරුපෙක්ඛා, සංස්කාරොපෙක්‍ෂා නමු; ඉති, මෙසේ; විපස්සනුපෙක්ඛාය සිද්ධාය, විදර්ශනොපෙක්‍ෂාව සිද්ධකල්හි; සඞ්ඛාරුපෙක්ඛාපි සිද්ධාව හොති, සංස්කාරොපෙක්‍ෂාද සිද්ධමවේ; (සෝවැනිතුන දුටුවහුට සජීලක්‍ෂණවිචාරයෙහි මෙන් තුන්ලකුණු දුටුවහුට සංස්කාරයන්ගේ අනිත්‍යාදිලක්‍ෂණ දෘෂ්ටහෙයින් සංස්කාරලක්‍ෂණ විචාරයෙහි උපෙක්‍ෂාම වෙයි සංස්කාරයන්ගේ ලක්‍ෂණවිචිනනයෙහි මැදහත්වූ විදර්ශනොපෙක්‍ෂාව සිද්ධකල්හි දෘෂ්ටාදීනවවූ ඒ සංස්කාරයන් ග්‍රහණයෙහි අධ්‍යාශය සජීසංස්කාර නිම්ත්තහෙයින් උපෙක්‍ෂාවද සිද්ධවෙයි දතයුතු.) එසා, මෝ ප්‍රඥතොමෝ; විචිනනගහණෙසු, විචිනන ග්‍රහණදෙක්හි; මජ්ඣත්තසඞ්ඛාතෙන, මැදහත්බවයයි කියනලද; ඉමිනා කිච්චෙන, මේ කෘත්‍යයෙන්; ද්විධා භින්නාති, දෙපරිද්දෙකින් භින්නයි; විරියුපෙක්ඛා පන, වීර්‍ය්‍යොපෙක්‍ෂාවද; වෙදනුපෙක්ඛා ච, වෙදනොපෙක්‍ෂාවද; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්වද; අවසෙසාහි ච, සෙසු උපෙක්‍ෂාවන් හාද; අත්ථතො භින්නා එවාති, අර්ථහෙයින් භින්නමවේ; ඉති, මෙසේ; ඉමාසු උපෙක්ඛාසු, මේ උපෙක්‍ෂාවන් කෙරෙහි; ඣානුපෙක්ඛා, ධ්‍යානොපෙක්‍ෂා තොමෝ; ඉධ, මෙතැන; අධිප්පෙතා, අධිප්‍රෙතයි; සා, හෝ තොමෝ; මජ්ඣත්තතාලක්ඛණා, මැදහත්බව ලකුණුකොට ඇත්තීයි; අනාභොගරසා, (ප්‍රහීණවූ ඒ සුවයෙහි) මනසිකාරයට ප්‍රතිපක්‍ෂකෘත්‍ය ඇත්තී යි; අව්‍යාපාරපච්චුපට්ඨානා, ප්‍රහීණවූ ඒ සුවෙහි ව්‍යාපාරයක් නැතිබව වැටහීම්කොට ඇත්තී යි; පීතිවිරාගපදට්ඨානා, ප්‍රීතියෙහි විරාගය ආසන්නකාරණකොට ඇත්තියි; එත්ථ, මෙහි; ආහ, (චොදක) කී; නනුව, කියග; අයං, මේ ධ්‍යානොපෙක්‍ෂාතොමෝ; අත්ථතො, අර්ථහෙයින්; තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව හොති, තත්‍රමජ්ඣත්තුපෙක්ඛාම වෙයි; සාච, හෝද; පඨමදුතියජ්ඣානෙසු පි අත්ථි, ප්‍රථමද්විතීයධ්‍යානයෙහිදු ඇති; තස්මා, එහෙයින්; තත්‍රාපි; ඒ පළමුවන දෙවන ධ්‍යානයෙහිදු; උපෙක්ඛකො ච

කිච්චතො. අපරිව්‍යත්තං හි තස්සා තත්ථ කිච්චං, විතක්කාදීහි අභිභූතත්තා, ඉධ පනායං විතක්කවිචාරපීතීහි අනභිභූතත්තා උක්ඛිත්තසිරා විය හුත්වා පරිව්‍යත්තකිච්චා ජාතා, තස්මා වුත්තාති. නිට්ඨිතා "උපෙක්ඛකො ච විහරතී"ති. එතස්ස සබ්බසො අත්ථවණ්ණනා.

(අ) ඉදානි **සතො ච සම්පජානො**ති එත්ථ සරතීති සතො, සම්පජානාතීති සම්පජානො, පුග්ගලෙන සති ච සම්පජඤ්ඤඤ්ච වුත්තං. තත්ථ සරණලක්ඛණා සති, අපම්මුස්සනරසා, ආරක්ඛපච්චුපට්ඨානා. අසම්මොහලක්ඛණං සම්පජඤ්ඤං, තීරණරසං, පවිචයපච්චුපට්ඨානං. තත්ථ කිඤ්චාපි ඉදං සතිසම්පජඤ්ඤං පුරිමජ්ඣානෙසු පි අත්ථි. මුට්ඨස්සතිස්ස හි අසම්පජානස්ස උපචාරමත්තම්පි න සම්පජ්ජති, පගෙව

---

විහරතීති, උපෙක්ඛකොව විහරති යි; එවං, මෙසේ; අයං මේ ධ්‍යානොපෙක්ෂාතොමෝ; වත්තබ්බා සියා කියයුතුවන්නීය; සා, හෝ තොමෝ; කස්මා න වුත්තාති, කුමක් හෙයින් නොකියනලද්දයත්? අපරිව්‍යත්තකිච්චතො, පරිව්‍යක්තනොවූ කෘත්‍ය හෙයිනි; තස්සා, ඒ තත්‍රමධ්‍යස්ථතාවගේ; තත්ථ, ඒ පළවුවන දෙවන ධ්‍යානයෙහි; කිච්චං, කෘත්‍යය; අපරිව්‍යත්තං හි, අපරිව්‍යක්තමැයි; (කුමක්හෙයිනයත්) විතක්කාදීහි අභිභූතත්තා, විතර්කවිචාර ප්‍රීතීන් විසින් මඩනාලදහෙයිනි; ඉධ පන, මේ තුන්වන ධ්‍යානයෙහි වනාහි; අයං, මේ තත්‍රමජ්ඣත්තතාතොමෝ; විතක්කවිචාරපීති හි අනභිභූතත්තා, විතර්කවිචාරාදීන් විසින් අනභිභූතහෙයින්; උක්ඛිත්තසිරා විය හුත්වා, නගනලද හිස් ඇත්තියකමෙන් වී; පරිව්‍යත්තකිච්චා ජාතා, පරිව්‍යක්තවූ කෘත්‍යඇතිවූ; තස්මා, එහෙයින්; වුත්තා, කියනලදූ. පෙ.

(ආ) ඉදානි-සතො ච සම්පජානො යනුයෙහි; සරතීති, සිහිකෙරේනුයි; සතො සති නම් වේ; සම්පජානාතීති, මනාකොට දනීනුයි; සම්පජානො, සම්පජාන නම් වේ; පුග්ගලෙන, පුද්ගල වශයෙනි; (පුද්ගලාධිෂ්ඨාන දෙසනාවෙන යන අර්ථයි.) සති ච, ස්මෘතිද; සම්පජඤ්ඤඤ්ච, නුවණද; වුත්තං, කියනලදී; තත්ථ, එ දෙක්හි; සරණලක්ඛණා, සිහිකිරීම ලකුණුකොට ඇත්තී; සති, සිහිනම්වේ; අපම්මුස්සනරසා, සිහි මුළා නොවීමකෘත්‍යකොට ඇත්තීයි; ආරක්ඛපච්චුපට්ඨානා, කෙලෙසුන් කෙරෙන් ආරක්ෂාව වැටහීම්කොට ඇත්තීයි; අසම්මොහලක්ඛණං සම්පජඤ්ඤං, නොමුළාබව ලක්ෂණකොට ඇත්තේ සම්පජඤ්ඤනම; තීරණරසං, කෘත්‍යයෙහි පාරයටයාම කෘත්‍යකොට ඇත්තේයි; පවිචයපච්චුපට්ඨානං,[1] විමංසාව වැටහීම්කොට ඇත්තේයි; තත්ථ, එහි; ඉදං සතිසම්පජඤ්ඤං, මේ සිහිනුවණ දෙක; පුරිමජ්ඣානෙසු පි, යටධ්‍යානයෙහිදු; කිඤ්චාපි අත්ථි, කිසිසේත් ඇත; (මුට්ඨස්සතිස්ස හි යනාදීන් එම සාධත්) මුට්ඨස්සතිස්ස, සිහිනැති; අසම්පජානස්ස, නුවණ නැත්තහුට; උපචාරමත්තම්පි න සම්පජ්ජති, උපචාරපමණකුදු සිද්ධ නොවෙයි; පගෙව අප්පණා, අර්පණාකැලමැයි; ඔළාරිකත්තා පන

---

1, පරිචය පච්චුපට්ඨානං-සන්න.

අප්පණා ඔළාරිකත්තා පන තෙසං ඣානානං භූමියං විය පුරිසස්ස චිත්තස්ස ගති සුඛා හොති. අබ්‍යත්තං[1] තත්‍ථ සති සම්පජඤ්ඤකිච්චං. ඔළාරිකඞ්ගප්පහානෙන පන සුඛුමත්තා ඉමස්ස ඣානස්ස, පුරිසස්ස ඛුරධාරායං විය සතිසම්පජඤ්ඤකිච්චපරිග්ගහීතා එව චිත්තස්ස ගති ඉච්ඡිතබ්බාති ඉධෙව වුත්තං. කිඤ්ච භිය්‍යො? යථා ධෙනුපගො වච්ඡො ධෙනුතො අපනීතො අරක්ඛියමානො පුනදෙව ධෙනුං උපගච්ඡති, එවමිදං තතියජ්ඣානසුඛං පීතිතො අපනීතං තං සතිසම්පජඤ්ඤාරක්ඛෙන අරක්ඛියමානං පුන දෙව පීතිං උපගච්ඡෙය්‍ය, පීති සම්පයුත්තමෙව සියා සුඛෙචාපි සත්තා සාරජ්ජන්ති, ඉදඤ්ච අතිමධුරං

---

තෙසං ඣානානං, ඒ ධ්‍යානයන් ඖදාරික බැවින්; (උපචාරධ්‍යානාදීන් නිසා ප්‍රථම ද්විතීයධ්‍යානයෝද සූක්ෂමයෝමය මේ ධ්‍යානය වනාහි මතුයෙහි ධ්‍යානය නිසා ඖදාරිකයයි කියනලදු ඖදාරිකබවද විතර්කාදී ස්ථූලාඞ්ගවිසිනැයි දතයුතු. සනාන්‍යයෙහි බොහෝ චෛතසිකයන් ඇති හෙයින් ඖදාරිකයයි කීහු.) භූමියං විය පුරිසස්ස, භූමියෙහි පුරුෂයාගේ (ගමන) මෙන්; චිත්තස්ස ගති සුඛා හොති, ඒ ධ්‍යානයෙහි චිත්තගතිය සුවවේ; අබ්‍යත්තං තත්‍ථ සතිසම්පජ්ජඤ්ඤකිච්චං (දුෂ්ප්‍රකාරයෙන් කරනලැබෙයි කියයුත්තක් නැතිබැවින්) ඒ ධ්‍යානයන්කෙරෙහි ස්මෘතිසම්ප්‍රජන්‍යකෘත්‍යය අසඵුටයි; ඔළාරිකඞ්ගප්පහාණෙන පන සුඛුමත්තා ඉමස්ස ඣානස්ස, මේ ධ්‍යානය ඖදාරිකාඞ්ග ප්‍රහාණයෙන් සූක්ෂමහෙයින්; (ඔළාරිකඞ්ගප්පහාණෙන සුඛුමත්තා යන මේ අර්ථය කිසිසේත් පළමුවන දෙවන ධ්‍යානාදියෙහිදු සම්භවෙයි එතකුදුවුවත් බොහෝසේ අවිප්‍රයොගභාවයෙන් පවත්නා ප්‍රීතිසුඛයන් කෙරෙහි ප්‍රීතිසඞ්ඛ්‍යාත ඖදාරිකාඞ්ගයාගේ ප්‍රහාණයෙන් සූක්ෂම බව මෙහි සාතිශය ස්මෘතිප්‍රඥාවන්ගේ ව්‍යාපාරනුයි පුරිසස්ස යනාදිය කියන ලදී.) පුරිසස්ස ඛුරධාරායං විය, පුරුෂයාගේ ක්ෂුරධාරායෙහි (ගමන) මෙන්; සතිසම්පජඤ්ඤකිච්චපරිග්ගහීතා එව, ස්මෘති සම්ප්‍රජන්‍යයෙන් පරිග්‍රහ කරනලදම; චිත්තස්ස ගති ඉච්ඡිතබ්බාති, චිත්තගති පැසැස්ස යුතුනුයි; ඉධෙව වුත්තං, (සිහිනුවණ දෙක) මෙහිම කියනලදී; කිඤ්ච භිය්‍යො, නැවත කිමෙක්ද යත්;? යථා, යම්සේ; ධෙනුපගො වච්ඡො, පොවන වසු; ධෙනුතො අපනීතො, දෙනකෙරෙන් පහරන ලද්දේ; අරක්ඛියමානො, නොරක්නා ලබන්නේ; පුනදෙව ධෙනුං උපගච්ඡති, නැවත දෙනකරම යේද; එවං, එපරිද්දෙන්ම; ඉදං තතියජ්ඣානසුඛං, මේ තෘතීයධ්‍යාන සුවය; පීතිතො අපනීතං, ප්‍රීතියෙන් වෙන්කරනලද්දේ; තං, එය; සතිසම්පජඤ්ඤාරක්ඛෙන අරක්ඛියමානං, සිහිනුවණ නැමති ආරක්ෂාවෙන් නොරකිනු ලබන්නේ; පුනදෙව පීතිං උපගච්ඡෙය්‍ය, නැවත ප්‍රීතියට පැමිණෙන්නේයි; (ද්විතීයධ්‍යානයට පැමිණෙන්නේයයි; සේයි.) පීතිසම්පයුත්තමෙවසියා, ප්‍රීතිසම්ප්‍ර

---

1, අපරිබ්‍යත්තං - සන්න.

සුඛං, තතො පරං සුඛාභාවා, සතිසම්පජඤ්ඤානුභාවෙන චෙත්ථ සුඛෙ අසාරජ්ජන්තො හොති නො අඤ්ඤථාති. ඉමම්පි අත්ථවිසෙසං දස්සෙතුං ඉදං ඉධෙව වුත්තන්ති වෙදිතබ්බං. ඉදානි "සුඛඤ්ච කායෙන පටිසංවෙදෙතී"ති එත්ථ කිඤ්චාපි තතියජ්ඣානසමඞ්ගිනො සුඛපටිසංවෙදනාභොගො නත්ථි, එවං සන්තෙපි යස්මා තස්ස නාමකායෙන සම්පයුත්තං සුඛං, යං වා තං නාමකායසම්පයුත්තං සුඛං, තංසමුට්ඨානෙනස්ස යස්මා අතිපණීතෙන රූපෙන රූපකායො ඵුටො. යස්ස ඵුටත්තා ඣානා වුට්ඨිතොපි සුඛං පටිසංවෙදෙය්‍ය, තස්මා එතමත්ථං දස්සෙන්තො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙතීති ආහ.

---

යුක්තම වේ; සුඛෙ වා පි, සුවයෙහිද; සත්තා සාරජ්ජන්ති, සත්වයෝ ඇලෙත්; ඉදඤ්ච, මේ (සප්‍රීතිකධ්‍යානයෙහි) සුවයද; අතිමධුරං සුඛං, (උග්‍රප්‍රීතියගේ අභාවයෙන්) අතිමධුර සුවයි; තතො පරං සුඛාභාවා, එයින් මතු සුවයෙක් නැතිබැවින්; සතිසම්පජඤ්ඤානුභාවෙන චෙත, සිහිනුවණ දෙදෙනාගේ ආනුභාවයෙන් වනාහි; එත්ථ, මේ තුන්වන ධ්‍යානයෙහි; සුඛෙ අසාරජ්ජන්තො හොති, සුවෙහි නොඇලීම වේ; නො අඤ්ඤථා, අතික්පරිද්දෙකින් නොවේ; ඉමම්පි අත්ථ විසෙසං දස්සෙතුං, මේ අර්ථවිශෙෂය දක්වනු පිණිස; ඉදං, මේ සිහිනුවණ දෙක; ඉධෙව වුත්තන්ති වෙදිතබ්බං, මෙහිම කියනලදැයි දතයුතු; ඉදානි, දැන්; සුඛඤ්ච කායෙන පටිසංවෙදෙතීති එත්ථ, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්නෙහි; කිඤ්චාපි, කිසිසේත්; තතියජ්ඣාන සමඞ්ගිනො, තෘතීයධ්‍යානසමන්විතයහට; සුඛපටිසංවෙදනා භොගො නත්ථි, සුවවිඳිමියි යන ආභොගයෙක් නැත; එවං සන්තෙපි, එතකුදුවුවත්; යස්මා, යම්හෙයකින්; තස්ස, ඒ ධ්‍යානසමන්විතයාගේ; නාමකායෙන සම්පයුත්තං සුඛං, නාමකාය හා සම්ප්‍රයුක්තවූ යම් සුවයෙක් ඇද්ද; (තං සො පටිසංවෙදෙය්‍ය යී යොදනු.) යං වා තං නාමකායසම්පයුත්තං සුඛං, නොහොත් යම් නාමකාය සම්ප්‍රයුක්තවූ සුවයෙක් ඇද්ද; තං සමුට්ඨානෙන, එයින් උපන්නාවූ; (තංසමුට්ඨානෙන තතො සමුට්ඨිතෙන යනු ටීකායි.) අස්ස, ඒ ධ්‍යානලාභිහුගේ; යස්මා, යම්හෙයකින්; අතිපණීතෙන රූපෙන, අතිප්‍රණීතවූ රූපයෙන්; රූපකායො ඵුටො, රූපකාය ස්පර්ශකරනලද්ද; යස්ස ඵුටත්තා, යම් රූපයෙකින් ස්පර්ශලදහෙයින්; ඣානා වුට්ඨිතොපි, ධ්‍යානයෙන් නැංගේද; සුඛං පටිසංවෙදෙය්‍ය, කායික සුවය අනුභව කෙරේ; තස්මා, එහෙයින්; එතමත්ථං දස්සෙන්තො, කායිකචෛතසික සුඛපටිසංවෙදනා යයි කියනලද අර්ථ දක්වන්නේ; සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති-යි කීයි; (නාමකායයෙන් චෛතසිකසුඛයද කායිකසුඛහෙතුවූ රූපය ඉපදවීමෙන් කායිකසුඛයද ධ්‍යානසමන්විතය අනුභවකෙරෙයි කියනු ලැබෙයි. මේ මෙහි සංක්ෂෙපාර්ථයි.

(අ) ඉදානි "යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති" එත්ථ යං ඣානහෙතු යං ඣානකාරණා තං තතියජ්ඣානසමඞ්ගිපුග්ගලං බුද්ධාදයො අරියා ආචික්ඛන්ති දෙසෙන්ති පඤ්ඤපෙන්ති පට්ඨපෙන්ති විවරන්ති විභජන්ති උත්තානීකරොන්ති පකාසෙන්ති පසංසන්තීති අධිප්පායො. කින්ති? උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහරතීති එවමෙත්ථ යොජනා වෙදිතබ්බා. කස්මා පන තං තෙ එවං පසංසන්තීති? පසංසාරහතො. අයං හි යස්මා අතිමධුරසුඛෙ සුඛපාරමිප්පත්තෙපි තතියජ්ඣානෙ උපෙක්ඛකො, න තත්ථ සුඛාභිසඞ්ගෙන ආකඩ්ඪීයති. යථා ච පීති න උප්පජ්ජති එවං උපට්ඨිතසතිතාය සතිමා; යස්මා ච අරියකන්තං අරියජනසෙවිතමෙව ච අසංකිලිට්ඨං සුඛං නාමකායෙන පටිසංවෙදෙති,

---

(අ) ඉදානි-'යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති,යන මෙහි; (යං යනු හෙතුඅර්ථයෙහි නිපාතය-යස්මා යන අර්ථයි. එහෙයින්ම "යං ඣානහෙතු" යි කීහු. යම් ධ්‍යානයක් හෙතුකොට ගෙන යන අර්ථයි "යං ඣානකාරණා" යනු හෙවත් අර්ථයෙහි පඤ්චමී යි යම් ධ්‍යානකාරණයෙකින් යන අර්ථයි-තං යිසේයි.) තතියජ්ඣානසමඞ්ගිපුග්ගලං, තෘතීයධ්‍යානසමන්විතපුද්ගලයා; බුද්ධාදයො අරියා, බුද්ධාදි ආර්‍ය්‍යයෝ; ආචික්ඛන්ති, කියද්ද; දෙසෙන්ති, දෙසද්ද; පඤ්ඤපෙන්ති, පනවද්ද; පට්ඨපෙන්ති, පිහිටුවද්ද; විවරන්ති, විවරනකෙරෙද්ද; විභජන්ති, විභාගකෙරෙද්ද; උත්තානීකරොන්ති, උත්තානකෙරෙද්ද; පකාසෙන්ති, ප්‍රකාශකෙරෙද්ද; පසංසන්තීති අධිප්පායො, ප්‍රශංසාකෙරෙති යි යන අභිප්‍රායයි; (ආචික්ඛන්ති යනාදි පදයෝ ප්‍රශංසාර්ථයහ යන අභිප්‍රායයෙන් 'පසංසන්තීති අධිප්පායො'යි කීහු.) කින්ති, කෙසේ ප්‍රශංසාකෙරෙද්ද යත්? "උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති"යි කියායි. තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහරතීති, ඒ තෘතීයධ්‍යානය උපදවා වෙසේ; එවං, මෙසේ; එත්ථ, මෙහි; යොජනා වෙදිතබ්බා, යොජනා දතයුතු; කස්මා පන, කුමක්හෙයින්? තං, ඒ තෘතීයධ්‍යන් ලදපුහුලා; තෙ, ඒ ආර්‍ය්‍යයෝ; එවං පසංසන්තීති, මෙසේ ප්‍රශංසාකෙරේද යත්? පසංසාරහතො, ප්‍රශංසාවට අර්හහෙයිනි; අයං හි, මේ තෘතීයධ්‍යානලාභී තෙමෙ; යස්මා, යම්හෙයකින්; අතිමධුරසුඛෙ, අතිමධුරවූ සුඛඇති; සුඛපාරමිප්පත්තෙපි, සුවෙහි කෙළවරට පැමිණියාවූද; තතියජ්ඣානෙ, තුන්වනධ්‍යානයෙහි; උපෙක්ඛකො, උපෙක්ෂකය; තත්ථ, ඒ ධ්‍යානයෙහි; සුඛාභිසඞ්ගෙන, සුවෙහි අභිලාෂයෙන්; න ආකඩ්ඪීයති, හයනු නොලැබේ; යථා ච, යම්සේ; පීති න උප්පජ්ජති, ප්‍රීතිය නොඋපදීද; එවං, එසේ; උපට්ඨිතසතිතාය, එළඹසිටි සිහි ඇතිබැවින්; සතිමා, සිහිඇති; යස්මා ච, යම්හෙයකිනුදු; අරියකන්තං, ආර්‍ය්‍යයන්ට කාන්තවූ; අරියජනසෙවිතමෙව, ආර්‍ය්‍යජනයන් විසින් සෙවුනාමලද; අසංකිලිට්ඨං සුඛං, අසංක්ලිෂ්ටවූ සුඛය; නාමකායෙන පටිසංවෙදෙති, නාමකායයෙන් අනුභව කෙරේද;

තස්මා පසංසාරහො, ඉති පසංසාරහතො නං අරියා තෙ එවං පසංසාහෙතුභූතෙ ගුණෙ පකාසෙන්තා උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති එවං පසංසන්තීති වෙදිතබ්බං. තතියන්ති-ගණනානුපුබ්බතා තතියං, ඉදං තතියං සමාපජ්ජතීතිපි තතියං෴

(අ) යං පන වුත්තං "එකඞ්ගවිප්පහීනං දුවඞ්ගසමන්නාගතං" ති. එත්ථ පන පීතියා පහානවසෙන එකඞ්ගවිප්පහීනතා වෙදිතබ්බා. සා පනෙසා දුතියජ්ඣානස්ස විතක්කවිචාරා විය අප්පණාක්ඛණෙයෙව පහීයති, තෙනස්ස සා පහානඞ්ගන්ති වුච්චති. සුඛං චිත්තෙකග්ගතාති ඉමෙසං පන ද්වින්නං උප්පත්තිවසෙන දුවඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා. තස්මා යං විභඞ්ගෙ "ඣානන්ති උපෙක්ඛා සතිසම්පජඤ්ඤං සුඛං චිත්තස්සෙකග්ගතා"ති වුත්තං, තං සපරික්ඛාරං ඣානං දස්සෙතුං පරියායෙන වුත්තං, ඨපෙත්වා පන උපෙක්ඛා සතිසම්පජඤ්ඤානි නිප්පරියායෙන උපනිජ්ඣානලක්ඛණප්පත්තානං අඞ්ගානං වසෙන දුවඞ්ගිකමෙවෙතං හොති. යථාහ:-"කතමං තස්මිං සමයෙ දුවඞ්ගිකං ඣානං හොති සුඛං චිත්තස්සෙකග්ගතා"ති. සෙසං පඨමජ්ඣානෙ වුත්තනයමෙව෴

(ආ) එවං අධිගතෙ පන තස්මිම්පි වුත්තනයෙනෙව පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා හුත්වා පගුණතතියජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නපීතිපච්චත්ථිකා යදෙව තත්ථ සුඛමිති චෙතසො ආභොගො

---

තස්මා, එහෙයින්; පසංසාරහො, ප්‍රශංසාවට අභියි; ඉති, මෙසේ; පසංසාරහතො, ප්‍රශංසාවට අභී හෙයින්; අරියා, ආය්‍ය්‍යීයෝ; තෙ එව පසංසාහෙතුභූතෙ ගුණෙ, එම ප්‍රශංසාවට හෙතුවූ ගුණයන්; පකාසෙන්තා, ප්‍රකාශකරන්නාහු; උපෙක්ඛකො සතිමා සුඛවිහාරී-යයි කියා; එවං පසංසන්තීති වෙදිතබ්බං, මෙසේ ප්‍රශංසාකෙරෙති යි දතයුතු෴පෙ෴

(අ) එත්ථ පන, මෙහි වනාහි; පීතියා පහාණවසෙන, ප්‍රීතියගේ ප්‍රහාණවශයෙන්; එකඞ්ගවිප්පහීණතා වෙදිතබ්බා, එක්අඟෙකින් විප්‍රයුක්තබව දතයුත්තීයි; සා පනෙ සා, ඒ මේ ප්‍රීතිතොමෝ; දුතියජ්ඣානස්ස විතක්කවිචාරා විය, ද්විතීයධ්‍යානයාගේ විතර්කවිචාරප්‍රහාණය මෙන්; අප්පණාක්ඛණෙයෙව පහීයති, අර්පණාක්ෂණයෙහිම ප්‍රහාණය කරනු ලැබේ; තෙන, එහෙයින්; අස්ස, මේ ධ්‍යානහුගේ; සා, ඒ ප්‍රීතිතොමෝ; පහාණඞ්ගන්ති වුච්චති, ප්‍රහාණාඞ්ගයයි කියනලද්දී; සුඛං, සුවය; චිත්තෙකග්ගතාති, චිත්තෙකාග්‍රතාය යන; ඉමෙසං පන ද්වින්නං උප්පත්තිවසෙන, මේ දෙදෙනාගේ උත්පත්ති විසින්; දුවඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා, දෙඅඟින් සම්ප්‍රයුක්තබව දතයුතු෴පෙ෴

(ආ)-අයං සමාපත්ති, මේ තෘතීයධ්‍යාන සමාපත්ති තොමෝ; ආසන්න පීති පච්චත්ථිකා, ආසන්නවූ ප්‍රීතිනැමැති ප්‍රත්‍යර්ථීන් ඇත්තීයයි දතයුතු;-සුඛස්ස ච ඔළාරිකත්තා, සුඛය ඖදාරිකබැවින්; අඞ්ගදුබ්බ

එතෙනෙතං ඔළාරිකමක්ඛායතීති එවං වුත්තස්ස සුඛස්ස ඔළාරිකත්තා අඞ්ගදුබ්බලාති ච තත්ථ දොසං දිස්වා චතුත්ථජ්ඣානං සන්තතො මනසිකරිත්වා තතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය චතුත්ථාධිගමාය යොගො කාතබ්බො. අථස්ස යදා තතියජ්ඣානතො වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො චෙතසිකසොමනස්සසඞ්ඛාතං සුඛං ඔළාරිකතො උපට්ඨාති, උපෙක්ඛාවෙදනාචෙව චිත්තෙකග්ගතා ච සන්තතො උපට්ඨාති, තදාස්ස ඔළාරිකඞ්ගප්පහාණාය සන්තඅඞ්ගපටිලාභාය ච තදෙව නිමිත්තං පඨවීපඨවීති පුනප්පුන මනසිකරොතො ඉදානි චතුත්ථජ්ඣානං උප්පජ්ජිස්සතීති භවඞ්ගං උපච්ඡින්දිත්වා තදෙව පඨවිකසිණං ආරම්මණං කත්වා මනොද්වාරාවජ්ජනං උප්පජ්ජති, තතො තස්මිඤ්ඤෙවාරම්මණෙ චත්තාරි පඤ්ච වා ජවනානි උප්පජ්ජන්ති, යෙසං අවසානෙ එකං රූපාවචරං චතුත්ථජ්ඣානිකං, සෙසානි වුත්තප්පකාරානෙව කාමාවචරානි. අයං පන විසෙසො:- යස්මා සුඛා වෙදනා අදුක්ඛමසුඛාය වෙදනාය ආසෙවනපච්චයෙන පච්චයො න හොති, චතුත්ථජ්ඣානෙ ච අදුක්ඛමසුඛාය වෙදනාය උප්පජ්ජිතබ්බං. තස්මා තානි උපෙක්ඛාවෙදනාසම්පයුත්තානි හොන්ති. උපෙක්ඛාසම්පයුත්තත්තායෙව චෙත්ථ පීති පරිහායතීති. එත්තාවතා චෙස සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. එවමනෙන එකඞ්ගවිප්පහීණං දුවඞ්ගසමන්නාගතං තිවිධකල්‍යාණං දසලක්ඛණසම්පන්නං චතුත්ථජ්ඣානං අධිගතං හොති පඨවිකසිණං...

---

ලාති ච, දුර්බලාඞ්ගයයිද ...පෙ... චෙතසික සොමනස්සසඞ්ඛාතං, චෛතසික සෞමනස්‍යයයි කියනලද; සුඛං, සුවය;- උපෙක්ඛා වෙදනා චෙව, උපෙක්‍ෂාවෙදනාද ...පෙ... අයං පන, මේ වනාහි; විසෙසො, වෙනසයි; යස්මා, යම්හෙයකින්; සුඛා වෙදනා, සුඛවෙදනා තොමෝ; අදුක්ඛමසුඛාය වෙදනාය, උපෙක්‍ෂාවෙදනාවට; ආසෙවනපච්චයෙන පච්චයො න හොති, (අතිෂටතැන්හි පදනන්තරයෙන් ගත්තහුගේ ආසෙවනප්‍රත්‍යය වනබව නැතිබැවින්) ආසෙවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නොවේ; චතුත්ථජ්ඣානෙ ච අදුක්ඛමසුඛායවෙදනාය උප්පජ්ජිතබ්බං, චතුර්ථධ්‍යානයෙහිදු උපෙක්‍ෂාවෙදනාව විසින් ඉපදවියයුතුය; තස්මා, එහෙයින්; තානි, ඒ සතරපස්ජවන්හු; උපෙක්ඛා වෙදනා සම්පයුත්තානි හොන්ති, උපෙක්‍ෂාවෙදනා සම්ප්‍රයුක්තවෙත්; උපෙක්ඛාසම්පයුත්තත්තායෙව, උපෙක්‍ෂාසම්ප්‍රයුක්ත බැවින්ම; එත්ථ, මෙහි; පීති පරිහායති, ප්‍රීතිය පිරිහේ ...පෙ... සුඛස්ස ච පහාණා, කායික සුඛයාගේ ප්‍රහාණයෙන්; දුක්ඛස්ස ච පහාණා, කායික දුක්ඛයාගෙද ප්‍රහාණයෙන්; පුබ්බෙව, පූර්වයෙහිම; සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා, සෞමනස්‍ය දෞර්මනස්‍යයන්ගේ අස්තඞ්ගමයෙන්; අදුක්ඛං, දුක් නොවූ; අසුඛං, සුඛනොවූ; උපෙක්ඛාසතිපාරිසුද්ධිං, උපෙක්‍ෂා ස්මෘතියෙන් පිරිසිදුවූ ...පෙ...

(අ) තත්ථ "සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා"ති-කායිකසුඛස්ස ච කායිකදුක්ඛස්ස ච පහාණා "පුබ්බෙවා"ති-තඤ්ච ඛො පුබ්බෙව, න චතුත්ථජ්ඣානක්ඛණෙ. "සොමනස්සදොමනස්සානං අත්ථගමා"ති චෙතසිකසුඛස්ස චෙතසිකදුක්ඛස්ස චාති ඉමෙසම්පි ද්වින්නං පුබ්බෙව අත්ථගමා පහාණා ඉච්චෙව වුත්තං හොති, කදා පන නෙසං පහාණං හොති? චතුන්නං ඣානානං උපචාරක්ඛණෙ. සොමනස්සං හි චතුත්ථජ්ඣානස්ස උපචාරක්ඛණෙයෙව පහීයති. දුක්ඛදොමනස්සසුඛානි පඨමදුතියතතියජ්ඣානානං උපචාරක්ඛණෙසු, එවමෙතෙසං පහාණක්කමෙන අවුත්තානං ඉන්ද්‍රියවිභඞ්ගෙ පන ඉන්ද්‍රියානං උද්දෙසක්කමෙනෙව ඉධාපි වුත්තානං සුඛදුක්ඛසොමනස්සදොමනස්සානං පහාණං වෙදිතබ්බං, යදි පනෙතානි තස්ස තස්ස ඣානස්ස උපචාරක්ඛණෙයෙව පහීයන්ති, අථ කස්මා "කත්ථචුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං

---

(අ)-තඤ්ච ඛො, ඒ ප්‍රහාණයද; පුබ්බෙව, පෙරමැයි; න චතුත්ථජ්ඣානක්ඛණෙ, චතුර්ථධ්‍යානක්ෂණයෙහි නොවේ "සොමනස්ස දොමනස්සානං අත්ථගමා" යන්නෙහි; චෙතසිකසුඛස්ස, චෛතසික සුඛයාගේද; චෙතසිකදුක්ඛස්ස චාති, චෛතසිකදුඃඛයාගේදැයි; ඉමෙසම්පි ද්වින්නං, මේ දෙදෙනාගේද; පුබ්බෙව අත්ථගමා, පූර්වයෙහිම අස්තඞ්ගමයෙන්; පහාණා ඉච්චෙව වුත්තං හොති, ප්‍රහාණයෙන් මැයි කී නියායි; කදා පන, කවර කලෙක; නෙසං පහාණං හොති, ඔවුන්ගේ ප්‍රහාණයවේද; චතුන්නං ඣානානං උපචාරක්ඛණෙ, සතරධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහි යි; සොමනස්සං හි, සෞමනස්‍යය; චතුත්ථජ්ඣානස්ස, චතුර්ථධ්‍යානයාගේ; උපචාරක්ඛණෙ යෙව පහීයති; උපචාරක්ෂණයෙහිම පහන ලැබේ; දුක්ඛදොමනස්සසුඛානි දුඃඛය දෞර්මනස්‍යය සුඛය යන මොහු; පඨමදුතිය තතියජ්ඣානානං, ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන්ගේ; උපචාරක්ඛණෙසු, උපචාරක්ෂණයන්හි ප්‍රහීණවෙත්;("එවං වෙදිතබ්බං"යි-සම්බන්ධ කරනු.) පහාණක්කමෙන අවුත්තානං, ප්‍රහාණක්‍රමයෙන් නොකියනලද; (ප්‍රහාණක්‍රමනම් ප්‍රහායක ධර්මයන්ගේ උත්පත්ති පටිපාටියි. ඒ පිළිවෙළින් කියන ලබන කල්හි "දුක්ඛං දොමනස්සං සුඛං සොමනස්සං"යි කියයුතුය කුමක් හෙයින් මෙහි අන්‍යථාවචනය දැයි යන චොද්‍යයට "ඉන්ද්‍රියවිභඞ්ග" යනාදී කීහු.) ඉන්ද්‍රියවිභඞ්ගෙ පන, ඉන්ද්‍රියවිභඞ්ගයෙහි වනාහි; ඉන්ද්‍රියානං උද්දෙසක්කමෙනෙව, ඉන්ද්‍රියයන්ගේ උද්දෙසක්‍රමයෙන්ම; ඉධාපි වුත්තානං, මෙහිදු කියනලද; සුඛදුක්ඛසොමනස්සදොමනස්සානං, සුඛය දුක්ඛය සොමනස්සය දොමනස්සය යන මොවුන්ගේ; එවමෙතෙසං පහාණං වෙදිතබ්බං, මෙසේ මොවුන්ගේ ප්‍රහාණය දතයුතු;යදි පන, ඉදින් වනාහි; එතානි, මොහු; තස්ස තස්ස ඣානස්ස උපචාරක්ඛණෙයෙව පහීයන්ති, ඒ ඒ ධ්‍යානයාගේ උපචාරක්ෂණයෙහිම පහන ලැබෙත් නම්; ("අථ කස්මා ඣානෙස්වෙව නිරොධො වුත්තො"යි සම්බන්ධ කරනු ) අථ, එසේකල්හි; කස්මා, කුමක් හෙයින්; උප්පන්නං දුක්ඛින්ද්‍රියං, (සවකීය ප්‍රත්‍යයෙන්) උපන් දුඃඛින්ද්‍රියය; කත්ථ ච අපරිසෙසං නිරුජ්ඣති, කොහි නිරවශෙෂ

නිරුජ්ඣති? ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි...පෙ...පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ චුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති, කත්ථ චුප්පන්නං දොමනස්සින්ද්‍රියං...පෙ...සුඛින්ද්‍රියං...පෙ...සොමනස්සින්ද්‍රියං...පෙ...අපරිසෙසං නිරුජ්ඣති. ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා...පෙ...චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ චුප්පන්නං සොමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣතී"ති. එවං ඣානෙසෙව නිරොධො වුත්තොති? අතිසයනිරොධත්තා. අතිසය නිරොධො හි තෙසං පඨමජ්ඣානාදිසු, න නිරොධො යෙව, නිරොධො යෙව පන උපචාරක්ඛණෙ නාතිසයනිරොධො, තථා හි නානාවජ්ජනෙ පඨමජ්ඣානුපචාරෙ නිරුද්ධස්සාපි දුක්ඛින්ද්‍රියස්ස ඩංසමකසාදි සම්ඵස්සෙන වා විසමාසනුපතාපෙන වා සියා උප්පත්ති, නත්වෙව අන්තො අප්පණායං. උපචාරෙ වා නිරුද්ධම්පෙතං න සුට්ඨු නිරුද්ධං හොති පටිපක්ඛෙන පන අවිහතත්තා, අන්තො අප්පණායං පන පීතිඵරණෙන සබ්බො කායො සුඛොක්කන්තො

---

යෙන් නිරුද්ධවේද...පෙ...උප්පන්නං දුක්ඛින්ද්‍රියං, ස්වකීය ප්‍රත්‍යයෙන් උපන් දුක්ඛින්ද්‍රිය; එත්ථ, මෙහි; අපරිසෙසං නිරුජ්ඣති, නිරවශෙෂයෙන් නිරුද්ධ වේ;(කත්ථ යනුයෙහිද එත්ථ යනුයෙහිද හෙතුයෙහි සප්තමී විභක්තියි-ධ්‍යානානුභාවය නිමිත්තකොටගෙන උපදනාවූ දුඃඛෙන්ද්‍රියය; ධ්‍යානයෙහි අපරිශෙෂයෙන් නිරුද්ධවෙයි කියනලදී...පෙ...එවං, මෙසේ; ඣානෙ සෙව නිරොධො වුත්තො, ධ්‍යානයෙහිම නිරොධය කියනලදී; අතිසයනිරොධත්තා, අතිශය නිරොධ හෙයිනි; අතිසයනිරොධො හි තෙසං, ඒ සුඛාදීන්ගේ අතිශය නිරොධය; පඨමජ්ඣානාදිසු, ප්‍රථම ධ්‍යාන් ආදියෙහි යි; (අතිශය නිරොධනම් සෘජුප්‍රතිපක්ෂයා විසින් ව්‍යුපශමයයි) න නිරොධො යෙව, නිරොධයම නොවේ; නිරොධො යෙව පන උපචාරක්ඛණෙ, උපචාරක්ෂණයෙහි වනාහි නිරොධයම් වෙයි; නාතිසය නිරොධො, අතිශය නිරොධය නොවේ; තථා හි, එසේමැයි; නානාවජ්ජනෙ පඨමජ්ඣානුපචාරෙ, (යම් ආවර්ජනයකින් අර්පණාව වේද එයින්) භින්නාවර්ජනවූ ප්‍රථමධ්‍යානොපචාරයෙහි; නිරුද්ධස්සාපි දුක්ඛින්ද්‍රියස්ස, නිරුද්ධවූ දුඃඛෙන්ද්‍රියයාගේ; ඩංසමකසාදි සම්ඵස්සෙන වා, මැසිමදුරු ආදීන්ගේ ස්පර්ශයෙන් හෝ; විසමාසනුපතාපෙන වා, විෂමනිෂද්‍යයෙන් උපන්නා කලමඳුව විෂමාසනුපතාප නම්-එයින් යන අර්ථයි; සියා උප්පත්ති, උත්පත්තිය වෙයි; නත්වෙව අන්තො අප්පණායං, ඇතුළු අර්පණාවෙහි උත්පත්ති නොවේ මැයි; උපචාරෙ වා නිරුද්ධම්පෙතං, උපචාරයෙහි හෝ නිරුද්ධවූ දුඃඛෙන්ද්‍රියය; න සුට්ඨු නිරුද්ධං හොති, මනා නිරුද්ධනම් නොවේ;(කුමක් හෙයින යත්?) පටිපක්ඛෙන පන අවිහතත්තා, ප්‍රතිපක්ෂයා විසින් අවිහත බැවිනි; අන්තො අප්පණායං පන, ඇතුළු අර්පණාවෙහි වනාහි; පීතිඵරණෙන සබ්බො කායො සුඛොක්කන්තො හොති, ප්‍රීතිය පැතිරීමෙන් සියලු කය සුවෙන් වදනාලදු වේ; (ප්‍රීතියඵරණ රස බැවින් හෝ තත්සමුට්ඨාන රූපයන්ගේ හෝ කායයෙහි පැතිරීමෙන් හෝ "පීතිඵරණෙන සබ්බො කායො සුඛොක්කන්තො හොති" යි කීවු.) සුඛොක්කන්ත

හොති. සුඛොක්කන්තකායස්ස ච සුට්ඨු නිරුද්ධං හොති දුක්ඛින්ද්‍රියං පටිපක්ඛෙන විහතත්තා, නානාවජ්ජනෙ යෙව ච දුතියජ්ඣානූපචාරෙ පහීණස්ස දොමනස්සින්ද්‍රියස්ස යස්මා එතං විතක්කවිචාරප්පච්චයෙපි කායකිලමථෙ චිත්තූපඝාතෙ ච සති උප්පජ්ජති, විතක්කවිචාරාභාවෙ ච නෙව උප්පජ්ජති, යත්ථ පන උප්පජ්ජති, තත්ථ විතක්කවිචාරභාවෙ අප්පහීණා එව ච දුතියජ්ඣානූපචාරෙ විතක්කවිචාරාති. තත්ථස්ස සියා උප්පත්ති නත්වෙව දුතියජ්ඣානෙ පහීණපච්චයත්තා. තථා තතියජ්ඣා

---

කායස්ස ච, සුවෙන් වදනාලද කය ඇත්තහුටද; සුට්ඨු නිරුද්ධං හොති දුක්ඛින්ද්‍රියං, දුඃඛෙන්ද්‍රියය මනාවම නිරුද්ධවේ; පටිපක්ඛෙන විහතත්තා, ප්‍රතිපක්ෂයා විසින් නසනලද්දබව හෙයිනි; නානාවජ්ජනෙයෙව ච (වුක්තලක්ෂණවූ) නානාවර්ජනවූම; දුතියජ්ඣානූපචාරෙ, ද්විතීය ධ්‍යානොපචාරයෙහි; ("විතක්කවිචාරප්පච්චයෙපි" යන තැන පි ශබ්දය අස්ථානප්‍රවෘත්ත බැවින් "පහීණස්සාපි දොමනස්සින්ද්‍රියස්ස"යි යොදනු.) එතං, ඒ දෞර්මනස්සෙන්ද්‍රියය; විතක්කවිචාරප්පච්චයෙ කායකිලමථෙ, විතර්කවිචාරප්‍රත්‍යයවූ කායක්ලමථවද; චිත්තූපඝාතෙ ච සති, චිත්තපීඩාවද ඇතිකල්හි; උප්පජ්ජති, උපදී; විතක්කවිචාරාභාවෙ ච, විතර්කවිචාරයන්ගේ අභාවයෙහිදු; නෙව උප්පජ්ජති, නොම උපදී; යත්ථ පන උප්පජ්ජති, යම් තැනෙක වනාහි උපදීද; තත්ථ විතක්කවිචාරභාවෙ, එහි විතර්කවිචාරයන්ගේ අභාවයෙහි යි; දුතියජ්ඣානූපචාරෙ, ද්විතීය ධ්‍යානූපචාරයෙහි; විතක්කවිචාරා, විතර්කවිචාරදෙදෙනා; අප්පහීණා එව, අප්‍රහීණම වෙත්නුයි; තත්ථ, ඒ ද්විතීය ධ්‍යානයාගේ උපචාරයෙහි; අස්ස, ඒ දොමනස්සින්ද්‍රියයාගේ; උප්පත්ති සියා, උත්පත්තිය වන්නේය; (තත්ථස්ස උප්පත්ති සියා යනුද අස්ස යනුද යට "දුතියජ්ඣානූපචාරෙ පහීණස්ස දොමනස්සින්ද්‍රියස්ස" යනු හා එක්කොට යොදනු. "තත්ථස්ස සියා උප්පත්ති" යනුදු පරිකල්ප වචනයි-උපචාරක්ෂණයෙහි දොම්නස් හුගේ අප්‍රහීණ භාවය දක්වන පිණිස කී බැවිනි. එහෙයින් "නත්වෙව අන්තො අප්පණායං"යි කීහු-ඉදින් එවේලෙහි දොම්නස උපදනේවී නම් ප්‍රථමධ්‍යානයෙනුදු පිරිහෙන්නේයි සමහරු අෂ්ටසමාපත්තිලාභී කාලදෙවලයන්ට දොම්නස උපන්හෙයින් ධ්‍යානලාභීන්ට දොම්නස නොවූපදනේ නොවෙයි යෙත්-ශේ නොමැනැයි. අනීවරණස්වභාව දොම්නසක් නැති බැවිනි-ඉදින්වේ නම් රූපාරූපාවචර සත්වයන්ටද උපදනේයි කාලදෙවලයන්ට උපන් හෙයින යනුදු අකාරණයි. උපදනා දොම්නස හා සමග ධ්‍යානයෙන් පිරිහෙන හෙයින් ලඝු ප්‍රත්‍යයෙන් පිරිහුණුධ්‍යානය එබඳු පුරුෂයෝ නිදුකින්ම නැවත ප්‍රකෘතිවත් කෙරෙතියි දතයුතු.) තථා, එසේම; තතියජ්ඣානූපචාරෙ, තෘතීයධ්‍යානූපචාරයෙහි; පහීණස්සාපි සුඛින්ද්‍රියස්ස, ප්‍රහීණවූ සුඛෙන්ද්‍රියයාගේ; පීතිසමුට්ඨානපණීතරූපඵුටකායස්ස, ප්‍රීතින් උපන්

නුපචාරෙ පහීණස්සාපි සුඛින්ද්‍රියස්ස පීතිසමුට්ඨානපණීතරූපඵුට්ඨකායස්ස සියා උප්පත්ති, න ත්වෙව තතියජ්ඣානෙ. තතියජ්ඣානෙ හි සුඛස්ස පච්චයභූතා පීති සබ්බසො නිරුද්ධාති…

(අ) තථා චතුත්ථජ්ඣානූපචාරෙ පහීණස්සාපි සොමනස්සින්ද්‍රියස්ස ආසන්නත්තා අප්පණාප්පත්තාය උපෙක්ඛාය අභාවෙන සම්මා අනතික්කන්තත්තා ච සියා උප්පත්ති, න ත්වෙව චතුත්ථජ්ඣානෙ. තස්මා යෙව ච එත්ථුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣතීති තත්ථ අපරිසෙසග්ගහණං කතන්ති. එත්ථාහ:- අථෙවං තස්ස තස්ස ඣානස්සූපචාරෙ පහීණාපි එතා වෙදනා ඉධ කස්මා සමාහටාති? සුඛග්ගහණත්ථං. යා හි "අදුක්ඛමසුඛං"ති. එත්ථ අදුක්ඛමසුඛා වෙදනා වුත්තා සා සුඛුමා දුවිඤ්ඤෙය්‍යා, න සක්කා සුඛෙන ගහෙතුං, තස්මා යථා නාම දුට්ඨස්ස යථා තථා වා උපසඞ්කමිත්වා ගහෙතුං අසක්කුණෙය්‍යස්ස ගොණස්ස

---

ප්‍රණීත රූපයෙන් පැතිරෙන ලද කය ඇත්තහුට; සියා උප්පත්ති, උත්පත්තිය වන්නේය; න ත්වෙව තතියජ්ඣානෙ, තෘතීයධ්‍යානයෙහි නොවේමැයි; තතියජ්ඣානෙ, තෘතීයධ්‍යානයෙයි; සුඛස්ස පච්චයභූතා පීති, සුඛයට ප්‍රත්‍යයවූ ප්‍රීතිතොමෝ; සබ්බසො නිරුද්ධාති, සර්වාකාරයෙන්ම නිරුද්ධවී…

(අ) තථා, එසේම; චතුත්ථජ්ඣානූපචාරෙ, චතුර්ථධ්‍යානයාගේ උපචාරයෙහි; පහීණස්සාපි සොමනස්සින්ද්‍රියස්ස, ප්‍රහීණද වූ සොමනස්සෙන්ද්‍රියයාගේ; ආසන්නත්තා, ආසන්නබව හෙයින්;(ප්‍රහීණද වූ සොමනස්සින්ද්‍රියය ප්‍රීතියසේ නුදුරුය ආසන්නබැව්න යන අර්ථයි.)අප්පණාප්පත්තාය උපෙක්ඛාය අභාවෙන, අර්පණාප්‍රාප්ත වූ උපෙක්ෂාවගේ අභාවයෙන්; සම්මා අනතික්කන්තත්තා ච, මනාකොට නොඉක්මුණුහෙයින් ද; සියා උප්පත්ති, උත්පත්තිය වෙයි; න ත්වෙව චතුත්ථජ්ඣානෙ, චතුර්ථධ්‍යානයෙහි නැත්මැයි; (යම්සේ මාර්ගවීථියෙන් පූර්වයෙහි සදෘශ විපස්සනා ජවනවාරයෝ දෙතුන්දෙනෙක් වෙද්ද එසේම මෙහිදු අර්පණාවාරයෙන් පූර්වයෙහි දෙතුන් ජවනකෙනෙක් උපෙක්ෂාසහගතවම පවති යෙත්.) තස්මා යෙව ච, එහෙයින්ම…පෙ…අපරිසෙසග්ගහණං කතං, අපරිශෙෂ ග්‍රහණය කරනලදී; එත්ථාහ, මෙහි (චොදක)කියා; අථෙවං, ඉදින් එසේවීනම්; තස්ස තස්ස ඣානස්සූපචාරෙ, ඒ ඒ ධ්‍යානයන්ගේ උපචාරයෙහි; පහීණාපි එතා වෙදනා, ප්‍රහීණදවූ මේ වෙදනාවෝ; ඉධ, මේ ධ්‍යානයෙහි; කස්මා සමාහටාති, කුමක්හෙයින් එක්කොට කියනලදහුද; සුඛග්ගහණත්ථං, සුවෙන් ගන්නා පිණිසයි; අදුක්ඛමසුඛන්ති එත්ථ, අදුක්ඛමසුඛං යන මෙහි; යා හි අදුක්ඛමසුඛා වෙදනා වුත්තා, යම් අදුක්ඛමසුඛවෙදනාවක් කියනලදද; සා, හෝ තොමෝ; සුඛුමා, සියුම්; දුවිඤ්ඤෙය්‍යා, දතනොහැකි; න සක්කා සුඛෙන ගහෙතුං, සුවෙන් ගන්නට නොපිළිවනි; තස්මා, එහෙයින්; යථා නාම, යම්සේ; දුට්ඨස්ස, නොදමුණු; යථා තථා වා උපසඞ්කමිත්වා, යම්තම් පරිද්දෙකින් එළඹ; ගහෙතුං අසක්කුණෙය්‍යස්ස, ගන්නට

ගහණත්ථං ගොපො එකස්මිං වජෙ සබ්බා ගාවො සමාහරති, අථෙකෙකං නීහරන්තො පටිපාටියා ආගතං අයං සො ගණ්හථ නන්ති තම්පි ගාහයති, එවමෙව භගවා සුඛගහණත්ථං සබ්බා එතා සමාහරි. එවං හි සමාහටා එතා දස්සෙත්වා යං නෙව සුඛං න දුක්ඛං න සොමනස්සං න දොමනස්සං අයං අදුක්ඛමසුඛා වෙදනාති සක්කා හොති එසා ගාහයිතුං. අපි චඃ-අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා පච්චය දස්සනත්ථඤ්චාපි එතා වුත්තාති වෙදිතබ්බා. සුඛ දුක්ඛප්පහානාදයො හි. තස්සා පච්චයා, යථාහඃ- චත්තාරො ඛො ආවුසො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියා, ඉධ ආවුසො භික්ඛු සුඛස්ස ච පහානා ...පෙ... චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, ඉමෙ ඛො ආවුසො චත්තාරො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියාති. යථා වා අඤ්ඤත්ථ පහීනාපි සක්කායදිට්ඨිආදයො තතියමග්ගස්ස වණ්ණභණනත්ථං තත්ථ පහීනාති වුත්තා, එවං වණ්ණභණනත්ථමෙපතස්ස

---

හොපිළිවන් වූ; ගොණස්ස, ගොන්හු; ගහණත්ථං, ගන්නාපිණිස; ගොපො, ගොපල්ලු; එකස්මිං වජෙ, එක ගොවුදෙහි; සබ්බා ගාවො සමාහරති, සියලු ගෙරින් රැස්කෙරේ ද; අථ, ඉක්බිත්තෙන්; එකෙකං නීහරන්තො, එකී එකී දෙන පිටතට හරණේ; පටිපාටියා ආගතං, පිළිවෙළින් ආවහු; අයං සො, මේ හේය; ගණ්හථ නංති, මොහු ගන්ව වයි; තම්පි, ඔහුද; ගාහයති, ගන්වා ද; එවමෙව, එපරිද්දෙන්ම; භගවා, භගවත්තෙමේ; සුඛගහණත්ථං, සුවෙන් ගන්නා පිණිස; එතා සබ්බා, මේ සියලු වේදනාවන්; සමාහරි, රැස්කෙළේ; (එකතැන කීය යන අර්‍ථයි.) එවං හි සමාහටා එතා දස්සෙත්වා, මෙසේ එක්කොට කී වෙදනාවන් දක්වා; යං, යමෙක්; නෙව සුඛං, නො සුව වේ ද; න දුක්ඛං, දුක් නොවේ ද; න සොමනස්සං, සොම්නස් නොවේ ද; න දොමනස්සං, දොම්නස් නොවේ ද; අයං, මෝ තොමෝ; අදුක්ඛමසුඛා වෙදනාති, උපෙක්‍ෂාවෙදනායයි; සක්කා හොති එසා ගාහයිතුං, හෝ ගන්වන්නට පිළිවන් වේ; අපි ච, අනිකෙකුදු ඇත; අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා, උපෙක්‍ෂා චෙතොවිමුක්තියට; පච්චයදස්සනත්ථඤ්චාපි, ප්‍රත්‍යය දක්වන පිණිස ද; එතා, මේ සියලු වේදනාවෝ; වුත්තාති, කියනලදහයි; වෙදිතබ්බා, දතයුත්තාහුයි; සුඛ දුක්ඛප්පහානාදයො හි, සුඛ දුඃඛප්‍රහාණාදීහු; තස්සා, ඒ උපෙක්‍ෂාවෙදනාවට; පච්චයා, ප්‍රත්‍යයෝයි; යථාහ, වදාළේමැයි; ආවුසො, ඇවැත්නි; අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා, චතුර්‍ථධ්‍යානසඞ්ඛ්‍යාත උපෙක්‍ෂාචෙතොවිමුක්තියගේ; සමාපත්තියා, සමාපත්තියට; චත්තාරො පච්චයා, ප්‍රත්‍යයෝ සතර දෙනෙකි; ඉධ, මේ සාසනයෙහි ...පෙ... යථා වා, යම් සේ හෝ; අඤ්ඤත්ථ පහීනාපි සක්කායදිට්ඨි ආදයො, සෙසු මඟ ප්‍රහීණ වූ සත්කායදෘෂ්ට්‍යාදීහු; තතියමග්ගස්ස වණ්ණභණනත්ථං, තෘතීය මාර්ගයාගේ වර්‍ණනාභණනය පිණිස; තත්ථ පහීනාති වුත්තා, තෘතීයමාර්ගයෙහි ප්‍රහීණයහයි කියනලදහු ද; එවං, එපරිද්දෙන්ම;

ඣානස්ස තා ඉධ වුත්තාති වෙදිතබ්බා. පච්චයඝාතෙන වා එත්ථ රාගදොසානං අතිදූරභාවං දස්සෙතුම්පෙතා වුත්තාති වෙදිතබ්බා. එතාසු හි සුඛං සොමනස්සස්ස පච්චයො, සොමනස්සං රාගස්ස, දුක්ඛං දොමනස්සස්ස පච්චයො, දොමනස්සං දොසස්ස, සුඛාදිඝාතෙන ච සප්පච්චයා රාගදොසා හතාති අතිදූරෙ හොන්තීති.

(අ) අදුක්ඛමසුඛන්ති-දුක්ඛාභාවෙන අදුක්ඛං, සුඛාභාවෙන අසුඛං, එතෙනෙත්ථ දුක්ඛසුඛපටිපක්ඛභූතං තතියවෙදනං දීපෙති, න දුක්ඛසුඛාභාවමත්තං, තතියවෙදනා නාම:-අදුක්ඛමසුඛා, උපෙක්ඛාතිපි වුච්චති. සා ඉට්ඨානිට්ඨවිපරීතානුභවනලක්ඛණා, මජ්ඣත්තරසා, අවිභූතපච්චුපට්ඨානා, සුඛනිරොධපදට්ඨානාති වෙදිතබ්බා. උපෙක්ඛාසති

---

එතස්ස ඣානස්ස වණ්ණභණනත්ථං, මේ ධ්‍යානයට වර්ණනාභණනය පිණිස; තත්ථ පහීණාති වුත්තා, තෘතීයමාර්ගයෙහි ප්‍රහීණහයි කියන ලදහයි දතයුත්තාහුයි; පච්චය ඝාතෙන වා, ප්‍රත්‍යය නාශයෙන් හෝ; එත්ථ, මේ චතුර්ථධ්‍යානයෙහි; රාගදොසානං, රාගද්වෙෂයන්; අතිදූර භාවං දස්සෙතුම්පි, ඉතා දුරැබව දක්වන්නට ද; එතා, මේ වේදනාවෝ; වුත්තාති, කියනලදහයි; වෙදිතබ්බා, දතයුක්තාහු යි; එතාසු හි, මොවුන්කෙරෙහි වනාහි; සුඛං, සුඛය; සොමනස්සස්ස පච්චයො, සෞමනස්‍යයට ප්‍රත්‍යය වේ; සොමනස්සං, සොම්නස; රාගස්ස "සුඛාය වෙදනාය ආවුසො විසාඛ රාගානුසයො"යි කීබැවින් රාගයට ප්‍රත්‍යය වේ; දුක්ඛං, දුක්ඛය; දොමනස්සස්ස පච්චයො, දොම්නසට ප්‍රත්‍යය වේ; දොමනස්සං, දොම්නස; දොසස්ස, "දුක්ඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය පටිඝානුසයො"යි කී බැවින් ද්වෙෂයට ප්‍රත්‍යය වේ; සුඛාදිඝාතෙන ච, සුඛාදීන්ගේනාශයෙන්, (ප්‍රහාණයෙන් ද) අස්ස, මේ චතුර්ථධ්‍යානයට; සප්පච්චයා රාගදොසා හතාති, ප්‍රත්‍යය සහිත වූ රාගද්වෙෂයෝ හතයෝනුයි; අතිදූරෙ හොන්ති, (සුඛාදීහු) ඉතා දුරැවෙත්.

(අ) අදුක්ඛමසුඛන්ති, අදුක්ඛමසුඛං යන්නෙහි; දුක්ඛාභාවෙන, දුක් නොවනබැවින්; අදුක්ඛං, දුක් නොවේ; සුඛාභාවෙන, සුව නොවන හෙයින්; අසුඛං, සුව නොවේ; එතෙන, මෙයින්; එත්ථ, මෙතෙන; දුක්ඛසුඛපටිපක්ඛභූතං, සුඛදුක්ඛවයට ප්‍රතිපක්ෂ වූ; තතියවෙදනං දීපෙති, තුන්වන වෙදනාව දක්වා; න දුක්ඛසුඛාභාවමත්තං, දුක්ඛසුඛයන්ගේ අභාවමාත්‍රය නොවේ; තතිය වෙදනා නාම, තෘතීය වෙදනානම්; අදුක්ඛමසුඛා, අදුක්ඛමසුඛවෙදනායි; උපෙක්ඛාතිපි වුච්චති, උපෙක්ෂායයිද කියනු ලැබේ; සා, හෝ තොමෝ; ඉට්ඨානිට්ඨවිපරීතානුභවනලක්ඛණා, ඉෂ්ටානිෂ්ටදෙකට විපරීතවූ මධ්‍යස්ථාලම්බනය අනුභවකිරීම ලක්ෂණකොට ඇත්තීයි; මජ්ඣත්තරසා, මැදහත්බව කෘත්‍යකොට ඇත්තීයි; අවිභූත පච්චුපට්ඨානා, (ගල්පිට මුවන් ගිය මං සේ සුවදුක්දෙකින් අනුමාන කටයුතු බැවින්) නොපහළ බව වැටහීම්කොට ඇත්ති යි; සුඛනිරොධපදට්ඨානාති වෙදිතබ්බා, චතුර්ථධ්‍යා

පාරිසුද්ධින්ති උපෙක්ඛාය ජනිතසතියා පාරිසුද්ධිං, ඉමස්මිං හි ඣානෙ සුපරිසුද්ධා සති, යා ච තස්සා සතියා පාරිසුද්ධි සා උපෙක්ඛාය කතා න අඤ්ඤෙන, තස්මා එතං උපෙක්ඛාසතිපාරිසුද්ධීති වුච්චති. විභඞ්ගෙපි වුත්තං:- අයං සති ඉමාය උපෙක්ඛාය විවටා හොති පරිසුද්ධා පරියොදාතා, තෙන වුච්චති උපෙක්ඛාසති පාරිසුද්ධීති යාය ච උපෙක්ඛාය එත්ථ සති පාරිසුද්ධි හොති, සා අත්ථතො තත්‍රමජ්ඣත්තතා වෙදිතබ්බා න කෙවලඤ්චෙත්ථ තාය සති යෙව පරිසුද්ධා, අපි ච ඛො සබ්බෙපි සම්පයුත්තධම්මා සතිසීසෙන පන දෙසනා වුත්තා. තත්ථ කිඤ්චාපි අයං උපෙක්ඛා හෙට්ඨාපි තීසු ඣානෙසු විජ්ජති, යථා පන දිවා සූරියප්පභාභිභවා සොම්මභාවෙන වා අත්තනො උපකාරකත්තෙන වා සභා

---

නොපවාරය සුඛනිරොධනම් ඒ ආසන්නකාරණකොට ඇත්තේය යන අර්ථයි; "උපෙක්ඛා සතිපාරිසුද්ධි" යන්නෙහි; උපෙක්ඛාය ජනිතසතියා පාරිසුද්ධිං, උපේක්ෂාවෙන්ජනිත වූ ස්මෘති පාරිසුද්ධි ඇති; ඉමස්මිං හි ඣානෙ, මේ ධ්‍යානයෙහි; සුපරිසුද්ධා සති, ස්මෘතිතොමෝ ඉතා පිරිසුදුයි; යාච තස්සා සතියා පාරිසුද්ධි, ඒ ස්මෘතියගේ යම් පාරිසුද්ධියෙක් ඇද්ද; සා, හෝ තොමෝ; උපෙක්ඛාය කතා, උපේක්ෂාවෙන් කරන ලදූ; (පාරිශුද්ධ්‍යුපෙක්ෂාව පවත්නාකල්හි චතුර්ථධ්‍යානයෙහි ස්මෘති තොමෝ සුවිසදවේනුයි "සා උපෙක්ඛාය කතා" යි කීහු.) න අඤ්ඤෙන, අනිකෙක් විසින් කරනලද නොවේ; තස්මා, එහෙයින්; එතං, මේ ධ්‍යානය; උපෙක්ඛා සතිපාරිසුද්ධීති, උපේක්ෂාස්මෘති පාරිසුද්ධියයි කියන ලදී; විභඞ්ගෙපි වුත්තං, විභඞ්ගයෙහිදු කියනලදී; අයං සති, මේ ස්මෘති තොමෝ; ඉමාය උපෙක්ඛාය, මේ උපේක්ෂාවෙන්; විවටා හොති, විවෘතවේ; පරිසුද්ධා, පිරිසිදුවේ; පරියොදාතා, නිර්මලවේ; තෙන, එහෙයින්; වුච්චති, කියනු ලැබේ; ("උපෙක්ඛා සතිපාරිසුද්ධි"යි) යාය ච උපෙක්ඛාය, යම් උපේක්ෂාවෙකින්; එත්ථ, මේ ධ්‍යානයෙහි; සතිපාරිසුද්ධිහොති, ස්මෘතියගේ පිරිසිදුබව වේද; සා, හෝ තොමෝ; අත්ථතො, අර්ථහෙයින්; තත්‍රමජ්ඣත්තතා වෙදිතබ්බා, තත්‍රමජ්ඣත්තතායයි දත යුතුවේ; කෙවලං, හුදෙක්; එත්ථ, මේ ධ්‍යන්හි; තාය, ඒ තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව විසින්; සති යෙව, සිහියම; න පරිසුද්ධා, පරිසුද්ධ නොවේ; අපි ච ඛො, වැලි කිමෙක් ද; සබ්බෙපි සම්පයුත්ත ධම්මා, සියලු සම්ප්‍රයුක්ත ධර්මයෝම (පිරිසිදුවෙත්); සතිසීසෙන පන දෙසනා වුත්තා, ස්මෘතිමුඛයෙන් දෙසනාකරනලදූ; තත්ථ කිඤ්චාපි, එහි කිසිසේත්; අයං උපෙක්ඛා, මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛා තොමෝ; හෙට්ඨා තීසුපි ඣානෙසු විජ්ජති, යට තුන්ධ්‍යානයෙහිම ඇත; යථා පන, යම්සේ; දිවාසූරියප්පභාභිභවා, දිවාභාගයෙහි සූර්‍ය්‍යප්‍රභාවයෙන් මඩනාලද හෙයින් ද; ("සූරියප්පභාය අභිභූයමානත්තා" යනු ටීකායි.) සොම්මභාවෙන වා, සෞම්‍ය බැවින් හෝ; අත්තනො උපකාරකත්තෙන වා, තමහට උපකාරභාවයෙන් හෝ; (අතීක්ෂණබැවින් චන්ද්‍රරේඛාව මෙන් රාත්‍රිද සෞම්‍ය ස්වභාව ඇත්තීය රාත්‍රියෙහිම චන්ද්‍රරේඛාව උජ්ජ්වලවනබැවින් චන්ද්‍රරේඛා තොමෝ රාත්‍රියවිසින් සඞ්ග්‍රාහ්‍යයයි

ගාය රත්තියා අලාභා දිවා විජ්ජමානාපි චන්දලෙඛා අපරිසුද්ධා හොති අපරියොදාතා. එවමෙවමයම්පි තත්‍රමජ්ඣත්තුපෙක්ඛා චන්දලෙඛා විතක්කාදිපච්චනීකධම්මතෙජාභිභවා සභාගාය ච උපෙක්ඛාවෙදනාරත්තියා අප්පටිලාභා විජ්ජමානාපි පඨමාදිඣානභෙදෙ අපරිසුද්ධා හොති අපරියොදාතා. තස්සා ච අපරිසුද්ධාය දිවා අපරිසුද්ධචන්දලෙඛාය පභා විය සහජාතාපි සතිආදයො අපරිසුද්ධාව හොන්ති, තස්මා තෙසු එකම්පි උපෙක්ඛාසතිපාරිසුද්ධීති න වුත්තං. ඉධ පන විතක්කාදිපච්චනීකතෙජාභිභවා භාවා සභාගාය ච උපෙක්ඛාවෙදනාරත්තියා පටිලාභා අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා චන්දලෙඛා අතිවිය පරිසුද්ධා. තස්සා පරිසුද්ධත්තා පරිසුද්ධචන්දලෙඛප්පභා විය සහජාතාපි සති ආදයො පරිසුද්ධා හොන්ති පරියොදාතා. තස්මා ඉදමෙව උපෙක්ඛාසතිපාරිසුද්ධීති වුත්තන්ති වෙදිතබ්බං.

---

දක්වනපිණිස "සොම්මභාවෙන වා අත්තනො උපකාරකත්තෙන වා"යි කීහු.) සභාගාය රත්තියා අලාභා, සභාගවූ රාත්‍රියගේ අලාභයෙන්; දිවා විජ්ජමානාපි චන්දලෙඛා, දහවල් විද්‍යමානවූ චන්ද්‍රරේඛා තොමෝ; අපරිසුද්ධා හොති, නොපිරිසුදුවේ; අපරියොදාතා, අනිර්මල වේ; එවං, එපරිද්දෙන්ම; අයම්පි තත්‍රමජ්ඣත්තුපෙක්ඛා චන්දලෙඛා, මේ තත්‍රමධ්‍යස්ථොපෙක්ෂා නැමති චන්ද්‍රලේඛාතොමෝ; විතක්කාදි පච්චනීකධම්මතෙජාභිභවා, විතර්කාදී ප්‍රතිපක්ෂධර්මයන්ගේ තෙජසින් මඩනාලදහෙයින්ද; සභාගාය ච උපෙක්ඛාවෙදනාරත්තියා අප්පටිලාභා, සභාගවූ උපෙක්ෂා වෙදනා නැමති රාත්‍රියගේ අප්‍රතිලාභයෙන්ද; විජ්ජමානාපි පඨමාදි ඣානභෙදෙ, ප්‍රථමාදි ධ්‍යානභෙදයෙහි විද්‍යමානවීද; අපරිසුද්ධා හොති, පිරිසිදුනොවේ; අපරියොදාතා, නිර්මල නොවේ; තස්සා ච අපරිසුද්ධාය දිවා, ඒ දහවල් අපරිශුද්ධකල්හි; අපරිසුද්ධචන්දලෙඛාය පභාවිය, දහවල් අපරිසුද්ධවූ චන්ද්‍රලෙඛාවගේ ප්‍රභාවමෙන්; සහජාතාපි සති ආදයො, සහජාතවූ සිහිආදීහු; අපරිසුද්ධාව හොන්ති, නොපිරිසුදුම වෙත්, තස්මා, එහෙයින්; තෙසු, ඒ ප්‍රථම ධ්‍යානාදීන් කෙරෙහි; එකම්පි, එක් ධ්‍යානයෙකුදු; උපෙක්ඛා සතිපාරිසුද්ධීති න වුත්තං, උපෙක්ඛා සතිපාරිසුද්ධියයි නොකියනලදී; ඉධ පන, මේ සතරවනධ්‍යානයෙහි වනාහි; විතක්කාදි පච්චනීකතෙජාභිභවා භාවා, විතර්කාදී ප්‍රතිපක්ෂයන්ගේ තෙජසින් මැඩීමක් නැතිබැවින්ද; සභාගාය ච උපෙක්ඛාවෙදනා රත්තියා පටිලාභා, සභාගවූ උපෙක්ෂාවෙදනා රාත්‍රියගේ ප්‍රතිලාභයෙන්ද; අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා චන්දලෙඛා, මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නැමති චන්ද්‍රලෙඛා තොමෝ; අතිවිය පරිසුද්ධා, ඉතා පිරිසුදුය; තස්සා පරිසුද්ධත්තා, ඔහු පිරිසුදුහෙයින්; පරිසුද්ධචන්දලෙඛප්පභා විය, පිරිසුදු චන්ද්‍රලෙඛාවෙහි ප්‍රභාව මෙන්; සහජාතාපි සති ආදයො, සහජාතවූ සිහිආදීහු; පරිසුද්ධා හොන්ති, පිරිසුදුවෙති; පරියොදාතා, නිර්මලවෙත්; තස්මා, එහෙයින්; ඉදමෙව, මේ චතුර්ථධ්‍යානයම; උපෙක්ඛාසතිපාරිසුද්ධීති වුත්තන්ති වෙදිතබ්බං, උපෙක්ඛා සතිපාරිසුද්ධියයි කියනලදැයි දතයුතු.෴පෙ෴

චතුත්ථන්ති ගණනානුපුබ්බතා චතුත්ථං, ඉදං චතුත්ථං සමාපජ්ජතීති චතුත්ථං. යං පන වුත්තං "එකඞ්ගවිප්පහීනං ද්වඞ්ගසමන්නාගතන්ති." තත්ථ සොමනස්සස්ස පහානවසෙන එකඞ්ගවිප්පහීනතා වෙදිතබ්බා. තඤ්ච පන සොමනස්සං එකවීථියං පුරිමජවනෙසු යෙව පහීයති, තෙනස්ස තං පහානඞ්ගන්ති වුච්චති. උපෙක්ඛාවෙදනා චිත්තෙකග්ගතාති ඉමෙසං පන ද්වින්නං උප්පත්තිවසෙන ද්වඞ්ගසමන්නාගතතා වෙදිතබ්බා. සෙසං පඨමජ්ඣානෙ වුත්තනයමෙව. එස තාව චතුක්කජ්ඣානෙ නයො…

(අ) පඤ්චකජ්ඣානං පන නිබ්බත්තෙන්තෙන පගුණපඨමජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නනීවරණපච්චත්ථිකා විතක්කස්ස ඔළාරිකත්තා අඞ්ගදුබ්බලාති ච තත්ථ දොසං දිස්වා දුතියං ඣානං සන්තතො මනසිකරිත්වා පඨමජ්ඣානෙ නිකන්තිං පරියාදාය දුතියාධිගමාය යොගො කාතබ්බො. අථස්ස යදා පඨමජ්ඣානතො වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො විතක්කමත්තං ඔළාරිකතො උපට්ඨාති, විචාරාදයො පන සන්තතො, තදාස්ස ඔළාරිකඞ්ගප්පහානාය සන්තඞ්ගපටිලාභාය ච තදෙව නිමිත්තං පථවී පථවීති පුනප්පුන මනසිකරොතො වුත්තනයෙනෙව දුතියං ඣානං උප්පජ්ජති. තස්ස විතක්කමත්තමෙව පහානඞ්ගං, විචාරාදීනි චත්තාරි සමන්නාගතඞ්ගානි. සෙසං වුත්තප්පකාරමෙව. එවං අධිගතෙ පන තස්මිම්පි වුත්තනයෙනෙව පඤ්චහාකාරෙහි චිණ්ණවසිනා හුත්වා පගුණදුතියජ්ඣානතො වුට්ඨාය අයං සමාපත්ති ආසන්නවිතක්කපච්චත්ථිකා විචාරස්ස ඔළාරිකත්තා අඞ්ගදුබ්බලාති ච තත්ථ දොසං දිස්වා තතියං ඣානං සන්තතො මනසිකරිත්වා දුතියජ්ඣානෙ නිකන්තිං පරියාදාය තතියාධිගමාය යොගො කාතබ්බො. අථස්ස යදා දුතියජ්ඣානතො

---

සොමනස්ස පහානවසෙන, සොම්නස් ප්‍රහාණීවිසින්; එකඞ්ගවිප්පහීනතා, එක්අඟෙකින් විප්‍රයුක්තබව; වෙදිතබ්බා, දතයුත්තීයි; තඤ්ච පන සොමනස්සං, ඒ සෞමනස්‍යයද; එකවීථියං, එකමවීථියෙහි; පුරිමජවනෙසු යෙව පහීයති, පළමු ජවනුන්කෙරෙහිම පැහේ; තෙන, එහෙයින්; තං, ඒ ධ්‍යානය; අස්ස, ඒ චතුර්ථධ්‍යාන්හුගේ; පහානඞ්ගන්ති වුච්චති, ප්‍රහාණාඞ්ගයයි කියනලදී…පෙ…තාව, පළමු කොට; එස; මේ කීයේ; චතුක්කජ්ඣානෙ නයො, චතුෂ්කධ්‍යානයෙහි නයයි…

(අ) පඤ්චකජ්ඣානං පන නිබ්බත්තෙන්තෙන, පස්වෙනි ධ්‍යාන් වනාහි උපදවන්නහු විසින්…පෙ…විතක්කමත්තං, විතර්කයපමණක්; ඔළාරිකතො උපට්ඨාති, ඖදාරිකහෙයින් වැටහේ; විචාරාදයො පන, විචාරාදීහු වනාහි; සන්තතො(උපට්ඨහන්ති), ශාන්තහෙයින් වැටහෙත්; …පෙ…තස්ස, ඔහුගේ; විතක්කමත්තමෙව පහානඞ්ගං, විතර්කමාත්‍රයෙක්ම ප්‍රහාණාඞ්ගය; විචාරාදීනි චත්තාරි, විචාරාදි සතරදෙන; සමන්නාගතඞ්ගානි, සම්ප්‍රයුක්ත අඞ්ගහුයි; සෙසං, සෙස්ස; වුත්තප්පකාරමෙව, කියනලද ප්‍රකාර ඇත්තේමැයි. …පෙ…තස්ස, ඒ තෘතීය

වුට්ඨාය සතස්ස සම්පජානස්ස ඣානඞ්ගානි පච්චවෙක්ඛතො විචාරමත්තං ඔළාරිකතො උපට්ඨාති, පීති ආදීනි සන්තතො. තදාස්ස ඔළාරිකඞ්ගප්පහානාය සන්තඅඞ්ගපටිලාභාය ච තදෙව නිමිත්තං පඨවී පඨවීති පුනප්පුන මනසිකරොතො වුත්තනයෙනෙව තතියං ඣානං උප්පජ්ජති. තස්ස විචාරමත්තමෙව පහාණඞ්ගං, චතුක්කනයස්ස දුතියජ්ඣානෙ විය පීති ආදීණි තීණි සමන්නාගතඞ්ගානි සෙසං වුත්තප්පකාරමෙව. ඉති යං චතුක්කනයෙ දුතියං තං ද්විධා භින්දිත්වා පඤ්චකනයෙ දුතියඤ්චෙව තතියඤ්ච හොති. යානි ච තත්ථ තතියචතුත්ථානි තානිධ චතුත්ථ පඤ්චමානි හොන්ති, පඨමං පඨමමෙවාති.

**ඉති සාධුජනපාමොජ්ජත්ථාය කතෙ විසුද්ධිමග්ගෙ**
**සමාධිභාවනාධිකාරෙ**

## පඨවිකසිණනිද්දෙසො නාම
### චතුත්ථො පරිච්ඡෙදො.

---

5

(අ) ඉදානි පඨවිකසිණානන්තරෙ ආපොකසිණෙ විත්ථාරකථා හොති:- යථෙව හි පඨවිකසිණං, එවං ආපොකසිණම්පි භාවෙතු කාමෙන සුඛනිසින්නෙන ආපස්මිං නිමිත්තං ගණ්හිතබ්බං, කතෙ වා අකතෙ වාති

---

ධ්‍යාන්හුගේ; විචාරමත්තමෙව පහාණඞ්ගං, විචාරයපමණෙක්ම ප්‍රහාණාඞ්ගය; චතුක්කනයස්ස, චතුෂ්කනයෙහි; දුතියජ්ඣානෙ විය, ද්විතීය ධ්‍යාන්හි මෙන්; පීතිආදීනි තීණි, ප්‍රීත්‍යාදී තුන්දෙන; සමන්නාගතඞ්ගානි, සම්ප්‍රයුක්ත අඞ්ගහුයි;-ඉති, මෙසේ; යං චතුක්කනයෙ දුතියං, චතුෂ්කනයෙහි යම් ද්විතීයධ්‍යානයෙක්ද; තං, හේ; ද්විධා භින්දිත්වා, අවිතර්කවිචාරමාත්‍රය අවිතර්ක අවිචාරයයි දෙකක්කොට බිඳ; පඤ්චකනයෙ දුතියඤ්චෙව තතියඤ්ච හොති, පඤ්චකනයෙහි දෙවනුද තුන්වනුද වෙයි; යානි ච තත්ථ තතියචතුත්ථානි, චතුෂ්කනයෙහිදු යම් තුන්වන සතරවන ධ්‍යානකෙනෙක්ද; තානි, ඔහු; ඉධ, මේ පඤ්චකනයෙහි; චතුත්ථපඤ්චමානි හොන්ති, සතරවනු පස්වනු වෙත්; පඨමං, චතුෂ්කනයෙහි ප්‍රථමධ්‍යානය; පඨමමෙව, පඤ්චකනයෙහිදු ප්‍රථම ධ්‍යානම වේ.

## පඨවිකසිණනිද්දෙසො චතුත්ථො.

---

5

(අ) ඉදානි, දැන්; පඨවිකසිණානන්තරෙ, පඨවිකසිණයට අනන්තර වූ; ආපොකසිණෙ, ආපොකසිණෙහි; විත්ථාරකථා හොති, විස්තරකථාව වෙයි; (යථා විස්තරිතයාගේ අතිදෙශයද විස්තරස්ථානයෙහිම සිටිනා බැවින් "විත්ථාරකථා හොති"යි කීහු.) යථෙව හි පඨවිකසිණං, යම්සේ පඨවිකසිණධ්‍යානය (කමටහන හෝ) බවනලද්ද; එවං, එපරිද්දෙන්ම; ආපොකසිණම්පි භාවෙතුකාමෙන, ආපොකසිණ ධ්‍යානදු (කමටහන හෝ) බවනු කැමැත්තාවූ; සුඛනිසින්නෙන, සුවෙන් හුන්නහු විසින්;

සබ්බං විත්ථාරෙතබ්බං. යථා ච ඉධ එවං සබ්බත්ථ, ඉතො පරං හි එත්තකම්පි අවත්වා විසෙසමත්තමෙව වක්ඛාම. ඉධාපි පුබ්බෙ කතාධිකාරස්ස පුඤ්ඤවතො අකතෙ ආපස්මිං පොක්ඛරණියා වා තළාකෙ වා ලොණියං වා සමුද්දෙ වා නිමිත්තං උප්පජ්ජති—චූළසිවත්ථෙරස්ස විය. තස්ස කිරායස්මතො ලාභසක්කාරම්පහාය විවිත්තවාසං වසිස්සාමීති මහාතිත්ථෙ නාවං අභිරුහිත්වා ජම්බුදීපං ගච්ඡතො අන්තරා මහාසමුද්දං ඔලොකයතො තප්පටිභාගං කසිණනිමිත්තං උදපාදි. අකතාධිකාරෙන චත්තාරො කසිණදොසෙ පරිහරන්තෙන නීලපීතලොහිතොදාතවණ්ණානං අඤ්ඤතරවණ්ණං ආපං අග්ගහෙත්වා යං පන භූමිං අසම්පත්තමෙව ආකාසෙ සුද්ධවත්ථෙන ගහිතං උදකං අඤ්ඤං වා තථාරූපං විප්පසන්නමනාවිලං, තෙන පත්තං වා කුණ්ඩිකං වා සමතිත්තිකං

---

කතෙ වා අකතෙ වා, කළ හෝ නොකළ හෝ; ආපස්මිං, ආපයෙහි; නිමිත්තං ගණ්හිතබ්බං ඉති, නිමිත්ත ගතයුතුය යනාදී; සබ්බං විත්ථාරෙතබ්බං, සියල්ල විස්තර කටයුතු; ඉධ, මේ ආපොකිසුණෙහි, යථා ච, යම්සේද; සබ්බත්ථ, (වායොකිසුණුආදී) හැමතැනම; එවං, මෙසේ මැයි; ඉතොපරං, මෙයින්මතු; එත්තකම්පි අවත්වා, මෙපමණකුදු නොකියා; ("කතෙ වා අකතෙ වාති සබ්බං විත්ථාරෙතබ්බං" යන මෙපමණක්ම නොකියාය යන අර්ථයි) විසෙසමත්තමෙව, විශෙෂ පමණක්ම; වක්ඛාම, කියමු; ඉධාපි, මෙහිදු; පුබ්බෙ කතාධිකාරස්ස, පූර්වයෙහි ආපොකසිණ භාවනා කළ විරූ; පුඤ්ඤවතො, පිණැත්තහුට; අකතෙ ආපස්මිං, නොකරනලද ආපයෙහි; පොක්ඛරණියා වා, පොකුණෙහි වත්; තළාකෙ වා, වැවෙහිවත්; ලොණියං වා, කලපුයෙහිවත්; සමුද්දෙ වා, මුහුදෙහිවත්; නිමිත්තං උප්පජ්ජති, නිමිත් උපදී—චූළසිවත්ථෙරස්ස විය, චූළසිවනම් තෙරුන්ට මෙනි; තස්ස කිරායස්මතො, ඒ ආවත්හු; ලාභසක්කාරම්පහාය, ලාභසත්කාර හැර; විවිත්තවාසං වසිස්සාමීති, විවෙකයෙහි වාසයකෙරෙමි යි; මහාතිත්ථෙ නාවං අභිරුහිත්වා, මාවටුයෙහි නැවුනැගී; ජම්බුදීපං ගච්ඡතො, දඹදිවට යන්නාහු; අන්තරා, අතුරෙහි; මහාසමුද්දං ඔලොකයතො, මහාසාගරය බලන්නවුන්ට; තප්පටිභාගං කසිණනිමිත්තං උදපාදි, තත්සදෘශවූ කසිණනිමිත් උපනී; අකතාධිකාරෙන, පෙර නොකරනලද අභියොග ඇත්තහුවිසින්; චත්තාරො කසිණදොසෙ පරිහරන්තෙන, සතර කිසුණුදෙස් දුරුකරන්නහු විසින්; නීලපීතලොහිතොදාතවණ්ණානං, නිලය පීතය ලොහිතය අවදාතය යන වර්ණඇති ආපයන් අතුරෙන්; අඤ්ඤතරවණ්ණං ආපං අග්ගහෙත්වා, එක්තරවර්ණයක් ඇති ආපය නොගෙන; භූමිං අසම්පත්තමෙව, භූමියට නොපැමිණියාමවූ; ආකාසෙ සුද්ධවත්ථෙන ගහිතං, අහස්හි ශුද්ධවස්ත්‍රයෙන් ගන්නාලද; යං පන උදකං, යම් ජලයෙක් ඇද්ද; අඤ්ඤං වා තථා රූපං, අනික් එබඳුවූ; විප්පසන්නමනාවිලං, ප්‍රසන්න නොකැලඹුණු ජලයෙක් ඇද්ද; තෙන, ඒ ජලයෙන්; පත්තං වා, පාත්‍රයක් හෝ; කුණ්ඩිකං වා, කැළියක්හෝ; සමතිත්තිකං පූරෙත්වා,

පූරෙත්වා විහාරපච්චන්තෙ වුත්තප්පකාරෙ පටිච්ඡන්නෙ ඔකාසෙ ඨපෙත්වා සුඛනිසින්නෙන න වණ්ණො පච්චවෙක්ඛිතබ්බො, න ලක්ඛණං මනසිකාතබ්බං, නිස්සය සවණ්ණමෙව කත්වා උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ චිත්තං ඨපෙත්වා අම්බු උදකං වාරි සලිලන්ති ආදීසු ආපොනාමෙසු පාකටනාමවසෙනෙව ආපො ආපොති භාවෙතබ්බං. තස්සෙවං භාවයතො අනුක්කමෙන වුත්තනයෙනෙව නිමිත්තද්වයං උප්පජ්ජති. ඉදං පන උග්ගහනිමිත්තං චලමානං විය උපට්ඨාති. සචෙ ඵෙණබුබ්බුලකසම්මිස්සං උදකං හොති, තාදිසමෙව උපට්ඨාති. කසිණදොසො පඤ්ඤායති, පටිභාගනිමිත්තං පන නිප්පරිප්ඵන්දං ආකාසෙ ඨපිතමණිතාලවණ්ටං විය මණිමයාදාසමණ්ඩලං විය ච හුත්වා උපට්ඨාති. සො තස්ස සහ උපට්ඨානෙනෙව උපචාරජ්ඣානං වුත්තනයෙනෙව චතුක්කපඤ්චකජ්ඣානානි ච, පාපුණාතීති.

## ආපොකසිණං.

---

සමකොට පුරා; විහාරපච්චන්තෙ, විහාර ප්‍රත්‍යන්තයෙහි; වුත්තප්පකාරෙ පටිච්ඡන්නෙ ඔකාසෙ, කියනලද ප්‍රකාරඇති මුවහවූ අවකාශයෙහි; ඨපෙත්වා, තබා; සුඛ නිසින්නෙන, සුවෙන් හුන්නහුවිසින්; න වණ්ණො පච්චවෙක්ඛිතබ්බො, වර්ණය නොසිතියයුතුය; න ලක්ඛණං මනසිකාතබ්බං, (දියෙහිද්‍රව) ලකුණු මෙනෙහිනොකටයුතුය; නිස්සයසවණ්ණමෙව කත්වා, වර්ණය තමහට ආශ්‍රයවූ ආපය හා සමානගතික කොටම; (එක්වනුකොට වර්ණය හා එක්කොටය යන අර්ථයි;) උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ චිත්තං ඨපෙත්වා, (ආපොධාතුවගේ උත්සන්නභාවයෙන් ශක්ති හෙයින් අධිකබැවින් සසම්භාර ආපයෙහි ආපය යන යම් ලොකව්‍යවහාරයෙක්ද) ඒ උපාදානපනත්හි සිත පිහිටුවා; අම්බු උදකං වාරි සලිලන්ති ආදීසු, අම්බුය උදකය වාරිය සලිලය යනාදී; ආපොනාමෙසු, ආපොනාමයන් කෙරෙහි; පාකට නාමවසෙනෙව, ප්‍රකට නාමවශයෙන්ම; ආපො ආපොති භාවෙතබ්බං, ආපො ආපොයි හැවියයුතුයි; ඒවං භාවයතො, මෙසේ භවන්නාවූ; තස්ස, ඔහට; අනුක්කමෙන, අනුක්‍රමයෙන්; වුත්තනයෙනෙව, පඨවි කසුණෙහි කී නයින්ම; නිමිත්තද්වයං උප්පජ්ජති, උද්ග්‍රහප්‍රතිභාගනිමිත් දෙක උපදී; ඉදං පන උග්ගහනිමිත්තං, මේ උද්ග්‍රහනිමිත්ත වනාහි; චලමානං විය උපට්ඨාති, සැලෙන්නාසේ වැටහේ; සචෙ ඵෙණබුබ්බුලකසම්මිස්සං උදකං හොති, ඉදින් පෙණබුබුලුමුසු දියෙක්වී නම්; තාදිසමෙව උපට්ඨාති, එබඳුවම වැටහේ; කසිණදොසො පඤ්ඤායති, (රැළනැගීම් පෙණමුසුබවුආදි) කසුණු දොස් පැනේ; පටිභාගනිමිත්තං පන, ප්‍රතිභාග නිමිත්තය වනාහි; නිප්පරිප්ඵන්දං, පරිස්පන්ද රහිතව; අචලං, නිශ්චලවූ; ආකාසෙ ඨපිත මණිතාලවණ්ටං විය, අහසතිබූ මිණිතල්වැටක් මෙන්වද; මණිමයාදාසමණ්ඩලං විය ච හුත්වා, මිණිමය කැටපත්තලයක් මෙන්වද; උපට්ඨාති, වැටහේ; සො, ඒ යොගාවචරතෙමේ; තස්ස, ඒ ප්‍රතිභාග නිමිත්හු; සහ උපට්ඨානෙනෙව, වැටහීමහා එක්වම; උපචාරජ්ඣානං, උපචාරධ්‍යානයටද; වුත්තනයෙනෙව, යටකී නයින්ම; චතුක්කපඤ්චකජ්ඣානානි ච පාපුණාති, චතුෂ්කපඤ්චකධ්‍යානයන්ටද පැමිණේ.

## ආපොකසුණි.

---

(අ) තෙජොකසිණං භාවෙතුකාමෙනාපි තෙජස්මිං නිමිත්තං ගණ්හෙතබ්බං. තත්‍ර කතාධිකාරස්ස පුඤ්ඤවතො අකතෙ නිමිත්තං ගණ්හන්තස්ස දීපසිඛාය වා උද්ධනෙ වා පත්තපචනට්ඨානෙ වා දවඩාහෙ වා යත්ථ කත්ථචි දෙව අග්ගිජාලං ඔලොකෙන්තස්ස නිමිත්තං උප්පජ්ජති චිත්තගුත්තත්ථෙරස්ස විය. තස්සායස්මතො ධම්මස්සවණදිවසෙ උපොසථාගාරං පවිට්ඨස්ස දීපසිඛං ඔලොකෙන්තස්සෙව නිමිත්තං උප්පජ්ජි. ඉතරෙන පන කාතබ්බං, තත්‍රිදං කරණවිධානං:- සිනිද්ධානි සාරදාරූනි ඵාලෙත්වා සුක්ඛාපෙත්වා ඝටිකං ඝටිකං කත්වා පතිරූපං රුක්ඛමූලං වා මණ්ඩපං වා ගන්ත්වා පත්තපචනාකාරෙන රාසිං කත්වා ආලිම්පෙත්වා කටසාරකෙ වා චම්මෙ වා පටෙ වා විදත්ථිචතුරඞ්ගුලප්පමාණං ඡිද්දං කාතබ්බං, තං පුරතො ඨපෙත්වා වුත්තනයෙන නිසීදිත්වා හෙට්ඨා තිණකට්ඨං වා උපරි ධූමසිඛං වා අමනසිකරිත්වා වෙමජ්ඣෙ ඝනජාලාය නිමිත්තං ගණ්හිතබ්බං, නීලන්ති වා

---

(අ) තෙජොකසිණං භාවෙතුකාමෙනාපි, තෙජොකසුණ භවනු කැමැත්තහුවිසින්ද; තෙජස්මිං නිමිත්තං ගණ්හෙතබ්බං, තෙජසෙහි නිමිත්ත ගතයුතු; තත්‍ර, එහි; කතාධිකාරස්ස, කෘතාධිකාරවූ; පුඤ්ඤවතො, පිණැතියහට; අකතෙ නිමිත්තං ගණ්හන්තස්ස, නොකරන ලද තෙජයෙහි නිමිත්ත ගන්නහුට; දීපසිඛාය වා, දීපසිඛායෙහිවත්; උද්ධනෙ වා, උදුනෙහිවත්; පත්තපචනට්ඨානෙ වා, පාත්‍රපිසනතැනවත්; දවඩාහෙ වා, ලැව්ගින්නෙහිවත්; යත්ථ කත්ථචි දෙව, යම්කිසි තෙනෙක; අග්ගිජාලං ඔලොකෙන්තස්ස, ගිනිසිළු බලනුවහට; නිමිත්තං උප්පජ්ජති, නිමිත් උපදී; චිත්තගුත්තත්ථෙරස්ස විය, චිත්තගුත්තනම් තෙරුන්ට මෙනි; තස්සායස්මතො, ඒ ආවත්හට; ධම්මස්සවණදිවසෙ, බණඅසන දවස්; උපොසථාගාරං පවිට්ඨස්ස, පොහෝගෙට වන්න වුන්ට; දීපසිඛං ඔලොකෙන්තස්සෙව, පහන්සිළ බලන්නහටම; නිමිත්තං උප්පජ්ජි, නිමිත් උපනී; ඉතරෙන පන, අකතාධිකාරයා විසින් වනාහි; කාතබ්බං, කසුණ කටයුතු; තත්‍ර, එහි; ඉදං, මේ; කරණවිධානං, කරන විධිසි; සිනිද්ධානි සාරදාරූනි ඵාලෙත්වා, සිනිදුවූ හරඇති දර පළා; සුක්ඛාපෙත්වා, වියළා; (සිනිදුවූ හරඇති දර ගැන්ම කලක් ජලාව සිටිනා සඳහායි දන්නේ;) ඝටිකං ඝටිකං කත්වා, කඩකඩකොට කපා; පතිරූපං, සුදුසු; රුක්ඛමූලං වා, රුක්මුලකට හෝ; මණ්ඩපං වා, මණ්ඩපයකට හෝ; ගන්ත්වා, ගොස්; පත්තපචනාකාරෙන, පාපිසනාකාරයෙන්; රාසිං කත්වා, රැස්කොට; ආලිම්පෙත්වා, දල්වා; කටසාරකෙ වා, හුණපැදුරෙක හෝ; චම්මෙ වා, සමෙක හෝ; පටෙ වා, පටෙක හෝ; විදත්ථිචතුරඞ්ගුලප්පමාණං, එක්වියත් සතරඟුලක් පමණ කොට; ඡිද්දං කාතබ්බං, සිදුරු කටයුතු; තං, හේ; පුරතො ඨපෙත්වා, අභිමුඛයේ තබා; වුත්තනයෙන නිසීදිත්වා, යටකී නයින් හිඳ; හෙට්ඨා තිණකට්ඨං වා, යට තණ දරවත්; උපරි ධූමසිඛං වා, මතුයෙහි දුම්සිළුවත් අමනසිකරිත්වා, මෙනෙහි නොකොට; වෙ

පීතන්ති වාති ආදිවසෙන වණ්ණො න පච්චවෙක්ඛිතබ්බො, උණ්හත්ත වසෙන ලක්ඛණං න මනසිකාතබ්බං, නිස්සයසවණ්ණමෙව කත්වා උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ චිත්තං ඨපෙත්වා පාවකො කණ්හවත්තනී ජාතවෙදෙ හුතාසනොති ආදිසු අග්ගිනාමෙසු පාකටනාම වසෙනෙව තෙජො තෙජොති භාවෙතබ්බං, තස්සෙවං භාවයතො අනුක්කමෙන වුත්තනයමෙව නිමිත්තද්වයං උප්පජ්ජති. තත්‍ථ උග්ගහ නිමිත්තං ජාලං ඡිජ්ජිත්වා ඡිජ්ජිත්වා පතනසදිසං හුත්වා උපට්ඨාති. අකතෙ ගණ්හන්තස්ස පන කසිණදොසො පඤ්ඤායති. අලාතඛණ්ඩං වා අඞ්ගාරපිණ්ඩො වා ඡාරිකා වා ධූමො වා උපට්ඨාති, පටිභාග නිමිත්තං නිච්චලං ආකාසෙ ඨපිතරත්තකම්බලඛණ්ඩං විය සුවණ්ණ

---

මජ්ඣෙ, මැද; ඝනජාලාය, (විරලනොව) ඝනව පවත්නා අග්නිජ්වාලායෙහි; නිමිත්තං ගණ්හිතබ්බං, නිමිත් ගතයුතු; නීලන්ති වා පීතන්ති වාති ආදිවසෙන, නීලය පීතය යනාදීවශයෙන්; වණ්ණො න පච්චවෙක්ඛිතබ්බො, වර්ණය නොසිතියයුතු; උණ්හත්තවසෙන, හුණුබව විසින්; ලක්ඛණං න මනසිකාතබ්බං, ලකුණු මෙනෙහි නොකටයුතු; නිස්සය සවණ්ණමෙව කත්වා, වර්ණයද නිශ්‍රයගතිකකොට (නිශ්‍රයහා එක්කොට); උස්සදවසෙන පණ්ණත්තිධම්මෙ චිත්තං ඨපෙත්වා, (තෙජෝ ධාතු අධිකබැවින් සසම්භාර අග්නියෙහි තෙජයය යන යම් ලෝක ව්‍යවහාරයෙක්ද) ඒ උපාදානපණත්හි සිත් පිහිටුවා; පාවකො, පාවකය; කණ්හවත්තනී, කණ්හවත්තනීය; ජාතවෙදෙ, ජාතවේදය; හුතාසනො, හුතාසනය; ඉති ආදිසු අග්ගිනාමෙසු, මේ ආදී වහ්නිනාමයන් අතුරෙන්; පාකටනාමවසෙනෙව, ප්‍රකට නාමවශයෙන්ම; තෙජො තෙජොති භාවෙතබ්බං, තෙජෝ තෙජෝ යි වැඩියයුතු; එවං, භාවයතො, මෙසේ භාවනාවඩන්නාවූ; තස්ස, ඒ යෝගාවචරයාහට; අනුක්කමෙන, පිළිවෙළින්; වුත්තනයමෙව, කියනලද නය ඇත්තාවූම; නිමිත්තද්වයං උප්පජ්ජති, උද්ග්‍රහ ප්‍රතිභාග යන නිමිත්තද්වය උපදී; තත්‍ථ, ඒ නිමිති අතුරෙහි; උග්ගහනිමිත්තං, උද්ග්‍රහ නිමිත්තය; ජාලං, ගිනිදළු; ඡිජ්ජිත්වා ඡිජ්ජිත්වා පතනසදිසං හුත්වා, සිඳ සිඳ හෙනු ලබන්නාක් මෙන්ව; උපට්ඨාති, වැටහේ; අකතෙ, (කියනලදක්‍රමයෙන් කිසුණුමඬුලු සංස්කාර) නොකරනලද කෙවල තෙජසෙහි; ගණ්හන්තස්ස පන, නිමිති ගන්නහුට වනාහි; කසිණ දොසො පඤ්ඤායති, කිසුණුදෙස් පැනේ; අලාතඛණ්ඩං වා, පෙනහෙළි කඩක් හෝ; අඞ්ගාරපිණ්ඩො වා, අඟුරුපිඩක්හෝ; ඡාරිකා වා, හලු හෝ; ධූමො වා, දුම හෝ; උපට්ඨාති, වැටහේ; පටිභාග නිමිත්තං, ප්‍රතිභාගනිමිත්තය; ආකාසෙ ඨපිත, අහස්හි තිබූ; රත්තකම්බලඛණ්ඩං විය, රත්කඹිලිකඩක් මෙන්වද; සුවණ්ණතාලවණ්ටං විය, රන්තල් වැටක් මෙන්වද; කඤ්චනත්ථම්භො විය ච, කසුන්ටැඹක් මෙන්වද;

තාලවණ්ටං විය කඤ්චනත්ථම්භො විය ච උපට්ඨාති. සො තස්ස සහ උපට්ඨානෙනෙව උපචාරජ්ඣානං වුත්තනයෙනෙව චතුක්කපඤ්චකජ්ඣානානි පාපුණාතීති.

## තෙජොකසිණං.

—+—

(අ) වායොකසිණං භාවෙතුකාමෙනාපි වායුස්මිං නිමිත්තං ගහෙතබ්බං, තඤ්ච ඛො දිට්ඨවසෙන වා ඵුට්ඨවසෙන වා, වුත්තංහෙතං අට්ඨකථාසු:- වායොකසිණං උග්ගණ්හන්තො වායුස්මිං නිමිත්තං ගණ්හාති, උච්ඡග්ගං වා එරිතං සමෙරිතං උපලක්ඛෙති, වෙළග්ගං වා...පෙ...රුක්ඛග්ගං වා කෙසග්ගං වා එරිතං සමෙරිතං උපලක්ඛෙති කායස්මිං වා ඵුට්ඨං උපලක්ඛෙතීති. තස්මා සමසීසට්ඨිතං ඝනපත්තං උච්ඡුං වා වෙළුං වා රුක්ඛං වා චතුරඞ්ගුලප්පමාණං ඝනකෙසස්ස

---

නිච්චලං උපට්ඨාති, නිශ්චලව වැටහේ; සො, ඒ යොගාවචරතෙමෙ; තස්ස සහ උපට්ඨානෙනෙව, ඒ පිළිබිඹුනිමිත්හුගේ වැටහීම හා සමගම; උපචාරජ්ඣානං, උපචාරධ්‍යානයද; වුත්තනයෙනෙව, යට කියනලද නියෙන්ම; චතුක්කපඤ්චකජ්ඣානානි, චතුෂ්කපඤ්චකධ්‍යානයන්ද; පාපුණාතීති, පැමිණෙන්නේයි.

## තෙජොකිසුණ.

—+—

(අ) වායොකසිණං, වායොකසිණය; භාවෙතුකාමෙනාපි, බවනු කැමති මහණ විසිනුදු; වායුස්මිං, වායොධාතුවෙහි; නිමිත්තං, ගහෙතබ්බං, නිමිත් ගතයුතු; තඤ්ච ඛො, ඒ ග්‍රහණයද; දිට්ඨවසෙන වා, සැලෙන තැන් බැලීමෙන් හෝ; ඵුට්ඨවසෙන වා, වෙර පැහැරමෙන් හෝ ගතයුතු; අට්ඨකථාසු, අටුවායෙහි; වුත්තංහෙතං, මේ කියනලදමැයි; වායොකසිණං උග්ගණ්හන්තො, වායොකිසුණ උගන්නා මහණ; වායුස්මිං, වායුවෙහි; නිමිත්තං ගණ්හාති, නිමිත් ගනී; එරිතං, (වාතයෙන්) සැලෙනලද; සමෙරිතං, හාත්පසින් සැලෙනලද; උච්ඡග්ගං වා, උග්ගස් අගක් හෝ; උපලක්ඛෙති, නිමිත්තකොට බලයි; වෙළග්ගං වා, හුණගස් අගක් හෝ; රුක්ඛග්ගං වා, වෘක්ෂාග්‍රයක් හෝ; එරිතං, පවනින් සැලෙනලද; සමෙරිතං, හාත්පසින් සැලෙනලද; කෙසග්ගං වා, කෙශාග්‍රයක් හෝ; උපලක්ඛෙති, නිමිත්තකොට බලයි; කායස්මිං, ශරීරයෙහි; ඵුට්ඨං වා, වැදගන්නාලද වාතය හෝ; උපලක්ඛෙතීති, නිමිත්තකොට බලන්නේයි; තස්මා, එහෙයින්; සමසීසට්ඨිතං, මුදුනෙහි පත්‍රවිසින් සමවූ හිස්ඇතිව සිටි; ඝනපත්තං, ඝනපත්ඇති; උච්ඡුං වා, උක්හෝ; වෙළුං වා, හුණහෝ; රුක්ඛං වා, රුකක්හෝ; චතුරඞ්ගුලප්පමාණ, සතරඟුලක් පමණවූ; ඝනකෙසස්ස පුරිසස්ස, ඝනවූ, කෙස්ඇති පුරුෂයක්හුගේ; සීසං වා,

පුරිසස්ස සීසං වා වාතෙන පහරියමානං දිස්වා අයං වාතො එතස්මිං ඨානෙ පහරතීති සතිං ඨපෙත්වා යං වා පනස්ස වාතපානන්තරිකාය වා භිත්තිච්ඡිද්දෙන වා පවිසිත්වා වාතො කායප්පදෙසං පහරති, තත්ථ සතිං ඨපෙත්වා වාතමාළුත අනිලාදීසු වාතනාමෙසු පාකටනාම වසෙනෙව **වායො වායොති** භාවෙතබ්බං. ඉධ උග්ගහනිමිත්තං උද්ධනතො ඔතාරිතමත්තස්ස පායාසස්ස උසුමවට්ටිසදිසං චලං හුත්වා උපට්ඨාති, පටිභාගනිමිත්තං සන්නිසින්නං හොති නිච්චලං, සෙසං වුත්තනයෙනෙව වෙදිතබ්බන්ති.

## වායොකසිණං.

(අ) තදනන්තරං පන “නීලකසිණං උග්ගණ්හන්තො නීලකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා”ති

---

හිසහෝ; වාතෙන පහරියමානං දිස්වා, වාතයෙන් පහරනලබන්නා දැක; අයං වාතො, මේ වාතය; එතස්මිං ඨානෙ පහරතීති, මෙතන පහරනේයයි; සතිං ඨපෙත්වා, සිහි පිහිටුවා; (“වාතො වාතොති භාවෙතබ්බං”යි සම්බන්ධකරනු.) වාතපානන්තරිකාය වා, කවුළු දෙරින් හෝ; භිත්තිච්ඡිද්දෙන වා, බිතක්සිදුරෙන් හෝ; පවිසිත්වා, වැද; වාතො, වාතයතෙමේ, අස්ස, මොහුගේ; යං වා පන කායප්පදෙසං පහරති, යම් ශරීරප්‍රදෙශයෙක්හි පහරීද; තත්ථ සතිං ඨපෙත්වා, ඒ කායප්‍රදෙශයෙහි (සඞ්ඝට්ටනවශයෙන් පවත්නා වාතපිණ්ඩයෙහි ඝට්ටනාකාර ග්‍රහණමුඛයෙන්) සමෘතිය පිහිටුවා; වාතමාළුත අනිලාදීසු වාතනාමෙසු, වාතය මාළුතය අනිලය යනාදී වාතනාමයන් කෙරෙහි; පාකටනාමවසෙනෙව, පතළ නම් විසින්ම; වායො වායොති, වාතය වාතයයි; භාවෙතබ්බං, (දුටුතැන් පහළතැන් නොහැරම අනත්ධම්හි සිත් පිහිටුවා) හැවිය යුතු; ඉධ, මෙහි; උග්ගහනිමිත්තං, උගෘනිමිත්; උද්ධනතො ඔතාරිතමත්තස්ස පායාසස්ස, උදුනෙන් බහාතුබූ මාත්‍ර කිරිබත; උසුමවට්ටිසදිසං, හුනුසුම් වැටියක් බඳුව; චලං හුත්වා උපට්ඨාති, චලවවැටහේ; පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්; සන්නිසින්නං හොති, එම් ආකාරයෙන් සන්හුන්නේවේ; නිච්චලං, නිශ්චලවේ; (නිච්චලං යන මෙයින් උද්ග්‍රහනිමිත්තින් ප්‍රතිභාගනිමිත්හුගේ වෙනස්නම් නිශ්චලබව හා ප්‍රතිභාගනිමිත්හු දුම්වැටිවනබවය යි කිවෙත්.) සෙසං, සෙස්ස; වුත්තනයෙනෙව වෙදිතබ්බං, කී නයින්ම දතයුතු.

## වායොකිසුණි.

(අ) තදනන්තරං පන, වායොකසිණයට අනන්තර වූ; නීලකසිණං උග්ගණ්හන්තො, නිල්කිසුණ උගන්නේ; නීලකස්මිං නිමිත්තං ගණ්හාති, නීලවර්ණයෙහි නිමිත්ගණී; පුප්ඵස්මිං වා, මල්හි හෝ; වත්ථස්මිං වා, වස්ත්‍රයෙහි හෝ; වණ්ණධාතුයා වාති, (අඳුන්රමඨආදී) වර්ණධාතු

වචනතො කතාධිකාරස්ස පුඤ්ඤවතො තාව තථාරූපං මාලාවච්ඡං වා පූජට්ඨානෙසු පුප්ඵසන්ථරං වා නීලවත්ථමණීනං වා අඤ්ඤතරං දිස්වාව නිමිත්තං උප්පජ්ජති ඉතරෙන නීලුප්පලගිරිකණ්ණිකාදීනි පුප්ඵානි ගහෙත්වා යථා කෙසරං වා වණ්ටං වා න පඤ්ඤායති, එවං චඞ්ගොටකං වා කරණ්ඩපටලං වා පත්තෙහියෙව සමතිත්තිකං පූරෙත්වා සන්ථරිතබ්බං නීලවණ්ණෙන වා වත්ථෙන භණ්ඩිකං බන්ධිත්වා පූරෙතබ්බං, මුඛවට්ටියං වාස්ස භෙරිතලමිව බන්ධිතබ්බං, කංසනීල පලාසනීල අඤ්ජනනීලානං අඤ්ඤතරෙන ධාතුනා පඨවිකසිණෙ වුත්තනයෙන සංහාරිමං වා භිත්තියං යෙව වා කසිණමණ්ඩලං කත්වා විසභාගවණ්ණෙන පරිච්ඡින්දිතබ්බං, තතො පඨවිකසිණෙ වුත්තනයෙන නීලං නීලන්ති මනසිකාරො පවත්තෙතබ්බො ඉධාපි උග්ගහනිමිත්තෙ කසිණදොසො

---

යෙහි හෝ යයි; වචනතො, (නිමිත්ගන්නී යි) වදාළබැවින්; කතාධිකාරස්ස කෘතාධිකාරවූ; පුඤ්ඤවතො තාව, පිනැත්තහුට; තථාරූපං මාලාවච්ඡං වා, එබඳු (අවිරල පිපුණු නිල්මලින් ගැවසීගත්)මල් ගසක් හෝ; පූජට්ඨානෙසු පුප්ඵසන්ථරං වා, පූජාකරන තැන්හි මල්ඇතිරියක් හෝ; නීලවත්ථමණීනං වා අඤ්ඤතරං, නිල්වත්මිණිආදීන් කෙරෙන් එක්තරා එකක් හෝ;දිස්වාව, දැකම; නිමිත්තං උප්පජ්ජති, නිමිත් උපදී; ඉතරෙන,අකෘතාධිකාරයා විසින්; නීලුප්පලගිරිකණ්ණිකාදීනි, නිලුපුල් නිල්කටරොළු ආදිවූ; පුප්ඵානි ගහෙත්වා, මල්ගෙන; යථා, යම්සේ; කෙසරං වා, කෙසරු හෝ; වණ්ටං වා, නුවටුහෝ; න පඤ්ඤායති, නොපැනෙද;එවං,එසේ;චඞ්ගොටකං වා, චඞ්ගොටකයක් හෝ;කරණ්ඩපටලං වා, කරඬුපියනක් හෝ;(දෙපියන සමවූයේ කරඬුනම යටපියන ගැඹුරුව මතුපියන ඇත්තේ චඞ්ගොටකය යෙත්.) පත්තෙහි යෙව, (කෙසරුනුවටුනැති) මල්පෙත්තෙන්ම; සමතිත්තිකං පූරෙත්වා, සම කොට පුරා; සන්ථරිතබ්බං, ඇතිරියයුතු; නීලවණ්ණෙන වා වත්ථෙන, නීලවණ්ණඇති වස්ත්‍රයකින්; භණ්ඩිකං බන්ධිත්වා, භණ්ඩිකයක්මෙන් බැඳ;(පිළියෙන් වටා බඳනාලද්දේ භණ්ඩිකනම) පූරෙතබ්බං,(චඞ්ගොටකයක්වත් කරඬුපියනක්වත්) පිරියයුතු; අස්ස වා, චඞ්ගොටකයාගේ හෝ කරණ්ඩපටලයාගේ හෝ; මුඛවට්ටියං, මුවවිට; භෙරිතලමිව බන්ධිතබ්බං, බෙරඇසක්මෙන් බැන්දයුතු; කංසනීල, ලොහොමල නිල්ය; පලාසනීල, කොළ නිල්ය, අඤ්ජනනීලානං, අඤ්ජන නිල්ය යන මොවුන්ගේ; අඤ්ඤතරෙන ධාතුනා, එක්තරා ධාතුවෙකින්; පඨවිකසිණෙ වුත්තනයෙන, පෘථිවිකසුණෙහි කී නයින්; සංහාරිමං වා, ගෙනයාහැකිකොට හෝ; භිත්තියං යෙව වා, භිත්තියෙහිම හෝ; කසිණමණ්ඩලං කත්වා, කිසුණුමඬුලු කොට; විසභාගවණ්ණෙන පරිච්ඡින්දිතබ්බං, අනික්වණ්ණයෙකින් පිරිසින්දයුතු; තතො, ඉක්බිත්තෙන්; පඨවිකසිණෙ වුත්තනයෙන, පඨවිකසුණෙහි කී නියෙන්; නීලං නීලන්ති, නීලං නීලං යි; මනසිකාරො පවත්තෙතබ්බො, මනස්කාර පැවැත්වියයුතු; ඉධාපි, මෙහිදු; උග්ගහනිමිත්තෙ කසිණ

පක්ඛායති කෙසරවණ්ටක පත්තන්තරිකාදීනි උපට්ඨහන්ති. පටිභාග නිමිත්තං කසිණමණ්ඩලතො මුඤ්චිත්වා ආකාසෙ මණිතාලවණ්ටසදිසං උපට්ඨාති. සෙසං වුත්තනයෙනෙව වෙදිතබ්බන්ති–

## නීලකසිණං.

—+—

(අ) පීතකසිණෙපි එසෙව නයො. වුත්තං හෙතං:– "පීතකසිණං උග්ගණ්හන්තො පීතකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"ති තස්මා ඉධාපි කතාධිකාරස්ස පුඤ්ඤවතො තාව තථා රූපං මාලාවච්ඡං වා පුප්ඵසන්ථරං වා පීතවත්ථධාතූනං වා අඤ්ඤතරං දිස්වාව නිමිත්තං උප්පජ්ජති, චිත්තගුත්තත්ථෙරස්ස විය. තස්ස කිරායස්මතො චිත්තලපබ්බතෙ පත්තඞ්ගපුප්ඵෙහි කතං ආසනපූජං පස්සතො සහදස්සනෙනෙව ආසනප්පමාණං නිමිත්තං උදපාදි. ඉතරෙන කණිකාරපුප්ඵාදීහි වා පීතවත්ථෙන වා ධාතුනා වා නීලකසිණෙ වුත්තනයෙනෙව කසිණං කත්වා පීතකං පීතකන්ති මනසිකාරො පවත්තෙතබ්බො, සෙසං තාදිසමෙවාති–

## පීතකසිණං.

—+—

---

දෙසො පක්ඛායති, උග්ගහනිමිත්තයෙහි කිසුණු දෙස් පැනේ; කෙසරවණ්ටක පත්තන්තරිකාදීනි, කෙසරු තුවටු පෙතිඅතුරුආදීහු; උපට්ඨහන්ති, වැටහෙත්; පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්; කසිණ මණ්ඩලතො මුඤ්චිත්වා, කිසුණුමඬුල්ලෙන් මිදී; ආකාසෙ, අහස; මණිතාලවණ්ටසදිසං, ඉඳුනීල මිණිතල් වැටක් මැනිව; උපට්ඨාති, වැටහේ–

## නිල්කිසුණ.

—+—

(අ) පීතකසිණෙපි එසෙව නයො, පීතකිසුණෙහිදු මෙම නයයි; වුත්තං හෙතං, මේ කියේමැනු–පෙ–තස්ස කිරායස්මතො, ඒ ආවත්හු; චිත්තලපබ්බතෙ, සිතුල්පවුවෙහි; පත්තඞ්ගපුප්ඵෙහි කතං, පතැඟි මලින් කරනලද; ආසනපූජං පස්සතො, අසුන් පුදලබනුව හට; සහදස්සනෙනෙව, දැක්මහා සමගම, ආසනප්පමාණං නිමිත්තං, අසුන්පමණ නිමිත්; උදපාදි, උපනී; ඉතරෙන, අකතාධිකාරයා විසින්; කණිකාරපුප්ඵාදීහි වා, කිණිහිරිමල්ආදියෙන් හෝ; පීතවත්ථෙන වා, රන්වන් වතෙකින් හෝ; ධාතුනා වා, රන්සිරියෙල් ආදී ධාතුවෙකින් හෝ–පෙ–

## පීතකිසුණ.

—+—

(අ) ලොහිතකසිණෙපි එසෙව නයො වුත්තං හෙතං:- "ලොහිතකසිණං උග්ගණ්හන්තො ලොහිතකස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"ති තස්මා ඉධාපි කතාධිකාරස්ස තාව පුඤ්ඤවතො තථා රූපං බන්ධුජීවකාදිමාලාවච්ඡං වා පුප්ඵසන්ථරං වා ලොහිතකවත්ථමණිධාතූනං වා අඤ්ඤතරං දිස්වාව නිමිත්තං උප්පජ්ජති. ඉතරෙන ජයසුමනබන්ධුජීවකරත්තකොරණ්ඩකාදි පුප්ඵෙහි වා රත්තවත්ථෙන වා ධාතුනා වා නීලකසිණෙ වුත්තනයෙනෙව කසිණං කත්වා **ලොහිතකං ලොහිතකන්ති** මනසිකාරො පවත්තෙතබ්බො. සෙසං තාදිසමෙවාති ...

## ලොහිතකසිණං.

---+---

(අ) "ඔදාතකසිණෙපි ඔදාතකසිණං උග්ගණ්හන්තො ඔදාතස්මිං නිමිත්තං ගණ්හාති පුප්ඵස්මිං වා වත්ථස්මිං වා වණ්ණධාතුයා වා"ති වචනතො කතාධිකාරස්ස තාව පුඤ්ඤවතො තථා රූපං මාලාවච්ඡං වා වස්සිකසුමනාදිපුප්ඵසන්ථරං වා කුමුදපදුමරාසිං වා ඔදාතවත්ථධාතූනං වා අඤ්ඤතරං දිස්වාව නිමිත්තං උප්පජ්ජති, තිපුමණ්ඩලරජතමණ්ඩලචන්දමණ්ඩලෙසුපි උප්පජ්ජති යෙව. ඉතරෙන වුත්තප්පකාරෙහි ඔදාතපුප්ඵෙහි වා ඔදාතවත්ථෙන වා ධාතුනා වා නීලකසිණෙ වුත්තනයෙනෙව කසිණං කත්වා **ඔදාතං ඔදාතන්ති** මනසිකාරො පවත්තෙතබ්බො. සෙසං තාදිසමෙවාති ...

## ඔදාතකසිණං.

---+---

---

(අ) ලොහිතකසිණෙපි, ලොහිතකසිණයෙහිදු ...පෙ... බන්ධුජීවක, බඳුවද;-ජයසුමන,වදමල්;-රත්තකොරණ්ඩකාදීහි පුප්ඵෙහි වා, රත්කරඹු ආදී මලින් හෝ; රත්තවත්ථෙන වා, රත්වස්ත්‍රයෙන් හෝ; ධාතුනා වා, (සුවගුරු දැහිගුල් ආදී) ධාතුවෙන් හෝ ...පෙ...

## ලොහිතකසුණ.

---+---

(අ) ඔදාතකසිණෙපි, අවදාතකසිණයෙහිදු ...පෙ... වස්සිකසුමනාදි, ඉද්ද දෑසමන්ආදීවූ; පුප්ඵසන්ථරං වා, මල්ඇතිරියක් හෝ; කුමුදපදුම රාසිං වා, හෙලැඹුල හෙලපියුම්රැසක් හෝ; ඔදාතවත්ථ, සුදුපිළී; ධාතූනං (මකුල් ආදී) ධාතූන්ගේ; අඤ්ඤතරං දිස්වාව, එක්තරඑකක් දැකම;-තිපුමණ්ඩල, හෙලතුඹමඬුලු; රජතමණ්ඩල,රිදීමඬුලු;චන්දමණ්ඩලෙසුපි, සඳමඬුලු යන මේහිදු; උප්පජ්ජති යෙව, උපදීමැයි; ඉතරෙන, අකතාධිකාරයා විසින්; වුත්තප්පකාරෙහි, කියනලදප්‍රකාර ඇති ...පෙ...

## ඔදාතකසුණ.

---+---

(ඇ) ආලොකකසිණෙ පන “ආලොකකසිණං උග්ගණ්හන්තො ආලොකස්මිං නිමිත්තං ගණ්හාති භිත්තිච්ඡිද්දෙ වා තාලච්ඡිද්දෙ වා වාතපානන්තරිකාය වා”ති වචනතො කතාධිකාරස්ස තාව පුඤ්ඤවතො යං භිත්තිච්ඡිද්දාදීනං අඤ්ඤතරෙන සුරියාලොකො වා චන්දාලොකො වා පවිසිත්වා භිත්තියං වා භූමියං වා මණ්ඩලං සමුට්ඨාපෙති, ඝනපණ්ණරුක්ඛසාඛන්තරෙන වා ඝනසාඛාමණ්ඩපන්තරෙන වා නික්ඛමිත්වා භූමියමෙව මණ්ඩලං සමුට්ඨාපෙති, තං දිස්වා නිමිත්තං උප්පජ්ජති. ඉතරෙනාපි තදෙව වුත්තප්පකාරං ඔභාසමණ්ඩලං ඔභාසො ඔභාසොති වා ආලොකො ආලොකොති වා භාවෙතබ්බං. තථා අසක්කොන්තෙන ඝටෙ දීපං ජාලෙත්වා ඝටමුඛං පිදහිත්වා ඝටෙ ඡිද්දං කත්වා භිත්තිමුඛං ඨපෙතබ්බං, තෙන ඡිද්දෙන දීපාලොකො නික්ඛමිත්වා භිත්තියා මණ්ඩලං කරොති. තං **ආලොකො ආලොකොති** භාවෙතබ්බං, ඉදං ඉතරෙහි චිරට්ඨිතිකං හොති. ඉධ උග්ගහනිමිත්තං භිත්තියං

---

(ඇ) ආලොකකසිණෙ පන, ආලොකකසිණයෙහි වනාහි....පෙ.... භිත්තිච්ඡිද්දෙ වා, බිතක්සිදුරෙහි හෝ; තාලච්ඡිද්දෙ වා, කෙසිළිද හෝ; වාතපානන්තරිකායවාති වචනතො, කවුළුදොරහෝයි වදාළබැවින්; කතාධිකාරස්ස තාව, කෘතාධිකාර ඇති; පුඤ්ඤවතො, පිනැත්තහුට; සුරියාලොකො වා, සූර්‍ය්‍යාලොකය හෝ; චන්දාලොකො වා, චන්ද්‍රාලොකය හෝ; භිත්තිච්ඡිද්දාදීනං අඤ්ඤතරෙන, බිතක්සිදුරුආදීන් කෙරෙන් එක්තරා එකෙකින්; පවිසිත්වා, වැද; භිත්තියං වා, බිතක වත්; භූමියං වා, බිමවත්; යං මණ්ඩලං සමුට්ඨාපෙති, යම් මඬුල්ලක් කෙරේද; ඝනපණ්ණරුක්ඛසාඛන්තරෙන වා, ඝනවූ පත්ඇති වෘක්ෂච්ඡායාවෙහි සාඛාඅතුරෙන් හෝ; ඝනසාඛාමණ්ඩපන්තරෙන වා, ගනකොට සාඛාවෙන්සෙවූ කොලමඬුයෙහි සිදුරෙන් හෝ; නික්ඛමිත්වා, නික්ම; භූමියමෙව, භූමියෙහිම; මණ්ඩලං සමුට්ඨාපෙති, මඬුලු කෙරේද; තං දිස්වා, ඒ දැක; නිමිත්තං උප්පජ්ජති, නිමිත් උපදී; ඉතරෙනා පි, අකෘතාධිකාරයා විසිනුදු; තදෙව වුත්තප්පකාරං ඔභාසමණ්ඩලං, එම වුක්තප්‍රකාරවූ අවභාෂ මඬුල්ල; ඔභාසො ඔභාසොති වා, ඔභාසො ඔභාසොයි කියා හෝ; ආලොකො ආලොකොති වා, ආලොකො ආලොකොයි කියා හෝ; භාවෙතබ්බං, හැවියයුතු; තථා අසක්කොන්තෙන, (ඒ මඬුලු නොබෝකල් සිටිනාබැවින්) එහි නිමිත්ත උපදවනුවහට නොපොහොසත් විසින්; ඝටෙ දීපං ජාලෙත්වා, කළයෙහි පහන්දල්වා; ඝටමුඛං පිදහිත්වා, කළමුඛය වසා; ඝටෙ ඡිද්දං කත්වා, කළයෙහි සිදුරුකොට, භිත්තිමුඛං ඨපෙතබ්බං, භිත්තියට අභිමුඛ කොට තිබියයුතු; තෙන ඡිද්දෙන, ඒ සිදුරෙන්; දීපාලොකො නික්ඛමිත්වා, පහන ආලොකය නික්ම; භිත්තියා මණ්ඩලං කරොති, බිතක මඬුලු කෙරේද; තං, ඒ; ආලොකො ආලොකොති භාවෙතබ්බං, ආලොකය ආලොකයයි හැවියයුතු; ඉදං, මේ; ඉතරෙහි, සෙස්සන්ට වඩා; චිරට්ඨිතිකං හොති, කලක් සිටුනේ වේ; ඉධ, මෙහි; උග්ගහ

වා භූමියං වා උට්ඨිත මණ්ඩලසදිසමෙව හොති. පටිභාගනිමිත්තං ඝනවිප්පසන්නආලොකපුඤ්ජසදිසං. සෙසං තාදිසමෙවාති.

## ආලොකකසිණං.

(අ) පරිච්ඡින්නාකාසකසිණෙපි "ආකාසකසිණං උග්ගණ්හන්තො ආකාසස්මිං නිමිත්තං ගණ්හාති භිත්තිච්ඡිද්දෙ වා තාලච්ඡිද්දෙ වා වාතපානන්තරිකාය වා"ති වචනතො කතාධිකාරස්ස තාව පුඤ්ඤවතො භිත්තිච්ඡිද්දාදීසු අඤ්ඤතරං දිස්වාව නිමිත්තං උප්පජ්ජති. ඉතරෙන සුච්ඡන්නමණ්ඩපෙ වා චම්මකටසාරකාදීනං වා අඤ්ඤතරස්මිං විදත්ථිචතුරඞ්ගුලප්පමාණං ඡිද්දං කත්වා තදෙව වා භිත්තිච්ඡිද්දාදිභෙදං ඡිද්දං **ආකාසො ආකාසො**ති භාවෙතබ්බං. ඉධ උග්ගහනිමිත්තං සද්ධිං භිත්තිපරියන්තාදීහි ඡිද්දසදිසමෙව හොති, වඩ්ඪියමානම්පි න වඩ්ඪති. පටිභාගනිමිත්තං ආකාසමණ්ඩලමෙව හුත්වා උපට්ඨාති, වඩ්ඪියමානඤ්ච වඩ්ඪති. සෙසං පථවිකසිණෙ වුත්තනයෙනෙව වෙදිතබ්බන්ති.

## පරිච්ඡින්නාකාසකසිණං.

---

නිමිත්තං, උද්ග්‍රහනිමිත්තය; භිත්තියං වා භූමියං වා උට්ඨිත මණ්ඩලසදිසමෙව හොති, බිතකවත් බිමවත් නැඟි මඬුලුවැනි වේ; පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්තය; ඝනවිප්පසන්න, (ඝනබැවින්) ප්‍රසන්නවූ; ආලොකපුඤ්ජසදිසං, ආලොකපුඤ්ජයක් වැනිවේ; සෙසං, සෙස්ස; තාදිසමෙව, යටකී බඳුමැයි.

## ආලොකකිසුණි.

(අ) පරිච්ඡින්නාකාස කසිණෙපි, පරිච්ඡින්නාකාසකිසුණෙහිදු — පෙ — සුච්ඡන්නමණ්ඩපෙ වා, ඝනකොට සෙවූ මඬුයෙහි හෝ; චම්මකටසාරකාදීනං අඤ්ඤතරස්මිං, සම් හුණපැදුරු ආදීන් කෙරෙන් හෝ එක්තරා එකෙක්හි; විදත්ථි චතුරඞ්ගුලප්පමාණං ඡිද්දං කත්වා, එක් වියත්සතරඟුල් පමණ සිදුරක්කොට; තදෙව වා භිත්තිච්ඡිද්දාදිභෙදං ඡිද්දං, එම බිතක්සිදුරුආදි සිදුරක්හෝ; ආකාසො ආකාසොති භාවෙතබ්බං. ආකාශය ආකාශයයි හැවියයුතු; ඉධ, මෙහි; උග්ගහනිමිත්තං, උද්ග්‍රහනිමිත්තය; සද්ධිං භිත්තිපරියන්තාදීහි, භිත්තිපරියන්තාදීන් හා සමග; (ආදිග්‍රහණීන් භිත්තිපරිච්ඡේදයෙහි කඩතැන් පැළුණුතැන් ගැණේ) ඡිද්දසදිසමෙව හොති, සිදුරුම වැනි වේ; වඩ්ඪියමානම්පි න වඩ්ඪති, වඩනාලබන්නේද නොවඩී; (මෙයින් මතු උද්ග්‍රහනිමිත්තම නොවඩනාසේ කීමෙත් භාවනාව දුර්ල බැවින් සියලුම උද්ග්‍රහ නිමිත්ත වඩනුලබන්නේද නොවඩනේ මැයි.) පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්; ආකාසමණ්ඩලමෙව හුත්වා, අහස්මඬුලුවම; උපට්ඨාති, වැටහේ; වඩ්ඪියමානඤ්ච, වඩනුලබන්නේද; වඩ්ඪති, වඩී; සෙසං, සෙස්ස; පථවිකසිණෙ වුත්තනයෙනෙව, පථවිකිසුණෙහි කී නයින්ම; වෙදිතබ්බන්ති, දතයුත්තේයි.

## පරිච්ඡින්නාකාසකිසුණි.

153 ඉති කසිණානි දසබලො දස යානි අවොච සබ්බධම්මදසො,
රූපාවචරම්හි චතුක්කපඤ්චකජ්ඣානහෙතූනි.

154 එවං තානි ච තෙසඤ්ච භාවනානය මිමං විදිත්වාන,
තෙසෙව අයං භිය්‍යො පකිණ්ණකකථාපි විඤ්ඤෙය්‍යා.

(ඇ) ඉමෙසු හි පඨවිකසිණවසෙන එකොපි හුත්වා බහුධා හොතීති ආදිභාවො ආකාසෙ වා උදකෙ වා පඨවිං නිම්මිණිත්වා පදසා ගමනං ඨානනිසජ්ජාදිකප්පනං වා පරිත්තඅප්පමාණනයෙන අභිභායතනපටිලාභොති එවමාදීනි ඉජ්ඣන්ති. ආපොකසිණවසෙන පඨවියං උම්මුජ්ජනං නිමුජ්ජනං උදකවුට්ඨිසමුප්පාදනං නදීසමුද්දාදි නිම්මාණං පඨවිපබ්බතපාසාදාදීනං කම්පනන්ති එවමාදීනි ඉජ්ඣන්ති. තෙජො

---

153. ඉති, මෙසේ; සබ්බධම්මදසො, සියලු දහම් දක්නාවූ; දසබලො, දසබලතෙම; රූපාවචරම්හි, රූපාවචරයෙහි; චතුක්කපඤ්චකජ්ඣානහෙතූනි, චතුෂ්කපඤ්චකධ්‍යානයට හෙතුවූ; (මෙයින් ලොවුතුරු චතුෂ්කපඤ්චකධ්‍යානයන් හළුවා වෙත්.) යානි දසකසිණානි අවොච, යම් දසකිසුණුකෙනෙක් කීද;

154. තානි ච, ඒ කිසුණන්ද; තෙසඤ්ච ඉමං භාවනානයං, චතුෂ්කපඤ්චකධ්‍යානයාගේ හෝ මේ භාවනාක්‍රමයද; එවං විදිත්වාන, මෙසේ දැන; තෙසෙව, ඒ දසකිසුණන්කෙරෙහිම; භිය්‍යො, නැවත; අයං පකිණ්ණකකථාපි, මේ ප්‍රකීර්ණකකථාද; විඤ්ඤෙය්‍යා, දතයුත්තීයි.

(ඇ) ඉමෙසුහි, මේ කිසුණන් කෙරෙහි; පඨවිකසිණවසෙන, පඨවිකිසුණු විසින්; එකොපි හුත්වා බහුධා හොතීති ආදිභාවො, එකෙකුව බොහෝ ප්‍රකාර වෙයි යනාදි බවය; ආකාසෙ වා උදකෙ වා පඨවිං නිම්මිණිත්වා, අහස හෝ දියෙහි හෝ පොළෝ නිමවා; පදසා ගමනං, ඒ පොළෝපිට පයින් යාමය; ඨානනිසජ්ජාදිකප්පනං වා, ඒ පොළව සිටුනා හිඳුනා ඉරියවු කිරීමය; පරිත්තඅප්පමාණනයෙන, පරිත්තය අප්‍රමාණය යන නයින්; අභිභායතන පටිලාභොති, (නිමිත්තොත්පත්තිය හා සමගම වන) අභිභායතනයන්ගේ පිළිලැබීමය යන; එවමාදීනි ඉජ්ඣන්ති, මේ ආදීහු සිද්ධවෙත්; (ප්‍රතිභාගනිමිත්තොත්පත්තීන් මතු දෙවන තුන්වන ජවනවීථියෙහි හෝ සතරවන පස්වන වීථියෙහි හෝ උපදවනලද ධ්‍යානයට අභිභායතන සංඥායයි දතයුතු ) ආපොකසිණවසෙන, ආපොකසිණවශයෙන්; පඨවියං, පොළව; උම්මුජ්ජනං, නැගීමය; නිමුජ්ජනං, කිමිදීමය; උදකවුට්ඨිසමුප්පාදනං, ජලවෘෂ්ටි ඉපදවීමය; නදීසමුද්දාදිනිම්මාණං, නදිය සමුද්‍රය යනාදීන්ගේ නිර්මාණය; පඨවිපබ්බතපාසාදාදීනං කම්පනන්ති, පෘථිවිය පර්වතය ප්‍රාසාදය යනාදීන්ගේ චලනයද; එවමාදීනි, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිද්ධවෙත්; (ආදිග්‍රහණයින් ශරීරයෙන් උදකධාරානිර්මාණාදීහු

කසිණවසෙන ධූමායනා පජ්ජලනා අඞ්ගාරවුට්ඨිසමුප්පාදනං තෙජසා තෙජොපරියාදානං යදෙව සො ඉච්ඡති තස්ස දහනසමත්ථතා දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථාය ආලොකකරණං පරිනිබ්බානසමයෙ තෙජොධාතුයා සරීරඣාපනන්ති එවමාදීනි ඉජ්ඣන්ති. වායොකසිණවසෙන වායුගතිගමනං වාතවුට්ඨිසමුප්පාදනන්ති එවමාදීනි ඉජ්ඣන්ති. නීලකසිණවසෙන නීලරූපනිම්මාණං අන්ධකාරකරණං සුවණ්ණදුබ්බණ්ණනයෙන අභිභායතනපටිලාභො සුභවිමොක්ඛාධිගමොති එවමාදීනි ඉජ්ඣන්ති. පීතකසිණවසෙන පීතකරූපනිම්මානං සුවණ්ණන්ති අධිමුච්චනා වුත්තනයෙනෙව අභිභායතනපටිලාභො සුභවිමොක්ඛාධිගමො චාති එවමාදීනි ඉජ්ඣන්ති. ලොහිතකසිණවසෙන ලොහිතකරූපනිම්මාණං වුත්තනයෙනෙව අභිභායතන

---

ගැනේ.) තෙජොකසිණවසෙන, තෙජොකිසුණු විසින්; ධූමායනා, දුමන බවය; පජ්ජලනා, දිලීමය; අඞ්ගාරවුට්ඨිසමුප්පාදනං, අඞ්ගාරවෂී ඉපදවීමය; තෙජසා තෙජොපරියාදානං, තමාගෙ තෙජසින් අනිකාගෙ තෙජස ක්ෂයකරනබවය; සො හෙතෙම; යදෙව ඉච්ඡති, (කපු පුළුන් සාරදාරුආදීන් එක්කොට රැස්ව තිබූකල) යමක් යමක් දවනු කැමතිද; තස්ස දහනසමත්ථතා, ඒ ඒ වස්තුහුම දව[illegible]ට සමර්ථබවය; දිබ්බෙන චක්ඛුනා, දිවඇසින්; රූපදස්සනත්ථාය, රූප දක්නා පිණිස; ආලොකකරණං, ආලොක කිරීමය; පරිනිබ්බානසමයෙ, පිරිනිවන සමයෙහි; තෙජොධාතුයා සරීරඣාපනන්ති, තෙජොධාතු විසින් සිරුරු දැවීමයයි යන; එවමාදීනි, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිද්ධවෙත්; (ආදිග්‍රහණින් අන්ධකාරවිධමනාදිය සඞ්ග්‍රහ වේ) වායොකසිණවසෙන වායුකිසුණු විසින්; වායුගතිගමනං, වායුවැනි සීඝ්‍රගමනය; වාතවුට්ඨිසමුප්පාදනන්ති, වාතවෘෂ්ටි ඉපැදවීමය; (ආලවකසූත්‍රහි සේ නිර්මිත වාතමණ්ඩලිකාවෝම වාතාවුට්ඨි නම් වෙත්.) එවමාදීනි, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිද්ධවෙත්; (ආදිග්‍රහණින් කැමති වස්තුවක් දෙශාන්තර ආදී යැවීම් ගැනේ). නීලකසිණ වසෙන, නිල්කිසුණු විසින්; නීලරූපනිම්මාණං නිල්රූ මැවීමය; අන්ධකාරකරණං, අඳුරුකිරීමය; සුවණ්ණදුබ්බණ්ණනයෙන, සවර්ණ දුර්වර්ණ නයින්; අභිභායතනපටිලාභො අභිභායතන ධ්‍යාන්පිළිලැබීමය; සුභවිමොක්ඛාධිගමො, ශුභ විමොක්ෂයාගේ අධිගමයයන; එවමාදීනි, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිද්ධවෙත්; පීතකසිණ වසෙන, පීතකිසුණු විසින්; පීතකරූපනිම්මානං, රන්වන් රූ නිර්මාණය; සුවණ්ණන්ති අධිමුච්චනා, සවර්ණවේවයි ඉටීමය; වුත්තනයෙනෙව, කී සවර්ණදුර්වර්ණ නයින්ම; අභිභායතනපටිලාභො, අභිභායතන ධ්‍යාන් පිළිලැබීමය; සුභවිමොක්ඛාධිගමො චාති, ශුභවිමොක්ෂයාගේ අධිගමයද යන; එවමාදීනි ඉජ්ඣන්ති, මේ ආදීහු සිද්ධවෙත්; ලොහිතකසිණවසෙන, ලොහිතකිසුණු විසින්; ලොහිතකරූපනිම්මාණං, ලොහිතකරූපයන්ගේ නිර්මාණය; වුත්තනයෙනෙව, කී නියෙන්ම; අභිභායතනපටිලාභො, අභිභායතන ධ්‍යාන්

පටිලාභො සුභවිමොක්ඛාධිගමොති එවමාදීනි ඉජ්ඣන්ති. ඔදාතකසිණවසෙන ඔදාතරූපනිම්මාණං ථිනමිද්ධස්ස දූරභාවකරණං අන්ධකාරවිධමනං දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථාය ආලොකකරණන්ති එවමාදීනි ඉජ්ඣන්ති. ආලොකකසිණවසෙන සප්පභාරූපනිම්මානං ථිනමිද්ධස්ස දූරභාවකරණං අන්ධකාරවිධමනං දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථං ආලොකකරණන්ති එවමාදීනි ඉජ්ඣන්ති. ආකාසකසිණවසෙන පටිච්ඡන්නානං විවටකරණං අන්තොපථවිපබ්බතාදිසුපි ආකාසං නිම්මිණිත්වා ඉරියාපථකප්පනං තිරොකුඩ්ඩාදිසු අසජ්ජමානෙන ගමනන්ති එවමාදීනි ඉජ්ඣන්ති෴

(අ) සබ්බානෙව උද්ධං අධො තිරියං අද්වයං අප්පමාණන්ති ඉමං පභෙදං ලභන්ති, වුත්තං හෙතං:- පථවිකසිණමෙකො සඤ්ජානාති උද්ධං අධොතිරියං අද්වයං අප්පමාණ''න්ති ආදි. තත්ථ උද්ධන්ති උපරි ගගනතලාභිමුඛං, අධොති හෙට්ඨාභූමිතලාභිමුඛං, තිරියන්ති ඛෙත්තමණ්ඩලමිව සමන්තා පරිච්ඡින්දිත්වා. එකච්චො හි උද්ධමෙව කසිණං

---

පිළිලැබීමය; සුභවිමොක්ඛාධිගමොති, ශුභවිමොක්ෂයාගේ අධිගමය යන; එවමාදීනි ඉජ්ඣන්ති, මේ ආදීහු සිඬවෙත්; ඔදාතකසිණවසෙන, ඔදාතකිසුණු විසින්; ඔදාතරූපනිම්මාණං, අවදාතරූපනිර්මාණය; ථිනමිද්ධස්ස දූරභාවකරණං, ථිනමිද්ධ දෙදෙනාගේ දුරැබව කිරීමය; අන්ධකාරවිධමනං, අඳුරු නැසීමය; දිබ්බෙන චක්ඛුනා රූපදස්සනත්ථාය, දිවඇසින් රූ දක්නාපිණිස; ආලොකකරණන්ති, ආලොක කිරීමය යන; එවමාදීනි ඉජ්ඣන්ති, මේ ආදීහු සිඬවෙත්; ආලොකකසිණ වසෙන, ආලොක කිසුණු විසින්; සප්පභාරූපනිම්මානං, ප්‍රභාස්වරරූපනිර්මාණය; ථිනමිද්ධස්ස ෴පෙ෴ ආකාසකසිණවසෙන, ආකාසකිසුණු විසින්; පටිච්ඡන්නානං විවටකරණං, මුවහවසිටි වස්තූන්ගේ පහළකිරීමය; අන්තොපථවිපබ්බතාදිසුපි, පෘථිවි පර්වතාදීන්ගේ අතුළත්හිදු; ආකාසං නිම්මිණිත්වා, අහස්නිමවා; ඉරියාපථකප්පනං, ඉරියවු කිරීමය; තිරොකුඩ්ඩාදිසු, තිරොකුඩ්ඩාදියෙහි; අසජ්ජමානෙන ගමනන්ති, නොපැකිළ යාමය යන; එවමාදීනි, මේ ආදීහු; ඉජ්ඣන්ති, සිඬවෙත්෴

(අ) සබ්බානෙව, සියලු කසිණයෝම; උද්ධං, උඩය; අධො, යටය; තිරියං, සරසය; අද්වයං, දෙකක් නොවෙයි; අප්පමාණන්ති, අප්‍රමාණ යයි; ඉමං පභෙදං ලභන්ති, මේ ප්‍රභෙදය ලැබෙත්; වුත්තං හෙතං, කියනලද මැයි; එකො, එකෙක්; පථවිකසිණං සඤ්ජානාති, පෘථිවිකිසුණු (භාවනාසංඥාවෙන්) දනී෴පෙ෴ (ආදිශබ්දයෙන් "ආපොකසිණං" යනාදි පෙළසඞ්ග්‍රහ කෙරෙත්.) තත්ථ, ඒ පාළියෙහි;- උපරි ගගනතලාභිමුඛං, මතුයෙහි ගගනතලයට අභිමුඛකොට;-හෙට්ඨාභූමිතලාභිමුඛං, යට භූමිතලයට අභිමුඛකොට;-ඛෙත්තමණ්ඩලමිව, ක්ෂෙත්‍ර මණ්ඩලයක් මෙන්; සමන්තා පරිච්ඡින්දිත්වා, හාත්පසින් පිරිසිඳ; එකච්චො හි, එකෙක්; උද්ධමෙව, උර්ධ්වාභිමුඛකොටම; කසිණං වඩ්ඪෙති,

වඩ්ඪෙති, එකච්චො අධො, එකච්චො සමන්තතො. තෙන තෙන වා කාරණෙන එවං පසාරෙති, ආලොකමිව දිබ්බචක්ඛුනා රූපදස්සනකාමො, තෙන වුත්තං. "උද්ධං අධො තිරියං"ති අද්වයන්ති ඉදං පන එකස්ස අඤ්ඤභාවානුපගමනත්ථං වුත්තං, යථාහි උදකං පවිට්ඨස්ස සබ්බදිසාසු උදකමෙව හොති න අඤ්ඤං, එවමෙව පඨවිකසිණං පඨවිකසිණමෙව හොති, නත්ථි තස්ස අඤ්ඤො, කසිණසම්භෙදොති. එසනයො සබ්බත්ථ; අප්පමාණන්ති ඉදං තස්ස ඵරණ අප්පමාණවසෙන වුත්තං, තංහි චෙතසා ඵරන්තො සකලමෙව ඵරති න අයමස්ස ආදි ඉදං මජ්ඣන්ති පමාණං ගණ්හාතීති.

---

කිසුණු වඩා; එකච්චො, එකෙක්; අධො, යට භූමිතලයට අභිමුඛ කොට වඩා; එකච්චො, එකෙක්; සමන්තතො, හාත්පසින් වඩා; ("උපරිගගනතලාභිමුඛං පඨවිකසිණ මෙකො සඤ්ජානාති" යි පාලිපද යන් ගෙනඅවුත් එම පෙදෙහිම සම්බන්ධකටයුතු-පූර්වයෙහි කිසුණ වඩනකල ප්‍රයොජනයක් අපෙක්ෂා නොකොට වඩන්නවුන්ගේ වශයෙන් කීහෙයින් දැන් "තෙන තෙන වා කාරණෙන එවං පසාරෙති"යි කීහු. ඒ ඒ කාරණයෙන් හෝ උද්ධං අධො යනාදී ක්‍රමයෙන් කිසුණු පතුරුවයි යන අර්ථයි.) දිබ්බචක්ඛුනා රූපදස්සනකාමො, දිව්‍යචක්ෂුසින් රූපදක්නා කැමාත්තහු; ආලොකමිව, ආලොකය මෙනි-(ඉදින් උඩරූ දක්නා කැමැත්තේවීනම් උඩුමුඛවකොට ආලොකය වඩයි යට රූ දක්නාකැමැත්තේවීනම් යට ආලොකය වඩයි හාත්පස රූ දක්නාකැමතිවීනම් හාත්පස වඩයි සේයි.) අද්වයන්ති ඉදං පන, අද්වයං යන මේ වනාහි; එකස්ස, එක්කිසුණක් හුගේ; අඤ්ඤභාවානුපගමනත්ථං, අන්‍යත්වයට නොඑළඹීම පිණිස; වුත්තං, කියනලදී; යථාහි, යම්සේ; උදකං පවිට්ඨස්ස, දියටවන්න හුට; සබ්බදිසාසු, සියලුදික්හිම; උදකමෙව හොති, උදකයම වේද; න අඤ්ඤං, අනිකෙක් නොවේද; එවමෙවං, එපරිද්දෙන්ම; පඨවිකසිණං, පෘථිවි කිසුණ; පඨවිකසිණමෙව හොති, පෘථිවිකිසුණම වේ; තස්ස, ඒ පෘථිවිකිසුණයාගේ; අඤ්ඤො කසිණ සම්භෙදො නත්ථි, ආපො කසිණාදීන් හා සඞ්කර නොවේ; (මුසුබව නොවේ යන අර්ථයි.) සබ්බත්ථ, සියලු ආපොකසිණාදීන් කෙරෙහි; එසනයො, මෙමනයයි; අප්පමාණන්ති ඉදං, අප්‍රමාණය යන මේ; තස්ස, ඒ කසිණයාගේ; ඵරණ අප්පමාණවසෙන වුත්තං, (එකදෙසයක නොසිට අනවශෙෂකොට ස්ඵරණ ප්‍රමාණයක් නොගන්නාහෙයින්) ඵරණය අප්‍රමාණනම් වෙයි; (තද්වශයෙන් කියනලද යන අර්ථයි.) තං හි, හේ කිසුණ; චෙතසා ඵරන්තො, භාවනාචිත්තයෙන් ආලම්බනකරන්නේ; (භාවනාචිත්තය තෙමෙ පරිත්තවූ හෝ විපුලවූ හෝ කිසුණ එකක්ෂණයෙහි සියල්ලම මෙනෙහිකෙරෙයි එකදෙශයක් අරමුණු නොකෙරේ එහෙයින්ම "චෙතසා ඵරන්තො සකලමෙව ඵරති"යි කීහු.) අයං, මෙ තෙම; අස්ස, මේ කසිණයාගේ; ආදි, ආදියය; ඉදං මජ්ඣන්ති, මේ මැදයයි; පමාණං න ගණ්හාති, පමණෙක් නොගණී.

(අ) "යෙ ච තෙ සත්තා කම්මාවරණෙන වා සමන්නාගතා කිලෙසාවරණෙන වා සමන්නාගතා විපාකාවරණෙන වා සමන්නාගතා අස්සද්ධා අච්ඡන්දිකා දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං"ති වුත්තා තෙසං එකස්සාපි එකකසිණෙපි භාවනා න ඉජ්ඣති. තත්‍ර **කම්මාවරණෙන සමන්නාගතා**ති ආනන්තරියකම්ම සමඞ්ගිනො, **කිලෙසාවරණෙන සමන්නාගතා**ති- නියතමිච්ඡාදිට්ඨිකා චෙව උභතොබ්‍යඤ්ජනකපණ්ඩකා ච, **විපාකාවරණෙන සමන්නාගතා**ති අහෙතුක විහෙතුක පටිසන්ධිකා, **අස්සද්ධා**ති බුද්ධාදීසු සද්ධාවිරහිතා, **අච්ඡන්දිකා**ති අපච්චනීකපටිපදායං ඡන්දවිරහිතා, **දුප්පඤ්ඤා**ති ලොකියලොකුත්තරසම්මාදිට්ඨියා විරහිතා, **අභබ්බා නියාමං ඔක්ක**

---

(අ) යෙ ච තෙ සත්තා, යම් ඒ සත්ත්වකෙනෙක්; (මත්තෙහි "වුත්තා" යනු හා යොදනු.) කම්මාවරණෙන වා සමන්නාගතා, කර්මාවරණයෙන් හෝ සමන්විතයෝද; කිලෙසාවරණෙන වා සමන්නාගතා, (නියත මිථ්‍යාදෘෂ්ට්‍යාදි) ක්ලේශාවරණයෙන් හෝ සමන්විතයෝද; විපාකාවරණෙන වා සමන්නාගතා, (අහෙතුක විහෙතුක විපාකාදි) විපාකාවරණයෙන් හෝ සමන්විතයෝද; අස්සද්ධා, (බුද්ධාදීන් කෙරෙහි) සැදැහැ නැත්තෝද; අච්ඡන්දිකා, (අප්‍රත්‍යනීක ප්‍රතිපත්තියෙහි) ඡන්ද නැත්තාහුද; දුප්පඤ්ඤා, ලෝවිලෝවුතුරු සම්‍යක්දෘෂ්ටි නැත්තාහුද; කුසලෙසු ධම්මෙසු, කුශලධර්මයෙහි; සම්මත්තං, සම්‍යක්ත්වයයි කියන ලද; නියාමං, ආර්‍යමාර්ගයට; ඔක්කමිතුං, පැමිණෙන්නට; අභබ්බාති, නුසුදුස්සෝයයි; වුත්තා, කියනලද්දාහුද; තෙසං, ඔවුන්කෙරෙන්; එකස්සාපි, එකක්හටද; එකකසිණෙපි, එක කසුණෙක්හිදු; භාවනා න ඉජ්ඣති, භාවනාව සිද්ධනොවේ; තත්‍ර, එහි; කම්මාවරණෙන සමන්නාගතාති, කර්මාවරණයෙන් සමන්වාගතයෝනම්; ආනන්තරිය කම්මසමඞ්ගිනො, පඤ්චානන්තරිය කර්මයන්කෙරෙහි යම් කිසිවෙකින් සමන්විතවූවෝයි; කිලෙසාවරණෙන සමන්නාගතාති, ක්ලේශාවරණයෙන් සමන්විතයෝනම්; නියත මිච්ඡාදිට්ඨිකාචෙව, අහෙතුක අක්‍රියනාස්තිකදිට්ඨීන් කෙරෙහි එක්තරා දෘෂ්ටියෙකින් යුක්තවූවෝද; උභතොබ්‍යඤ්ජනකපණ්ඩකාච, උභයව්‍යඤ්ජනකයන් හා පණ්ඩකයෝයි; විපාකාවරණෙන සමන්නාගතාති, විපාකාවරණයෙන් සමන්විතයෝනම්; අහෙතුක විහෙතුක පටිසන්ධිකා, අහෙතුක විහෙතුක පිළිසඳ ඇත්තාහුයි; අස්සද්ධාති, සැදැහැ නැත්තාහු නම්; බුද්ධාදීසු සද්ධාවිරහිතා, බුද්ධාදී තුනුරුවන් කෙරෙහි සැදැහැ නැත්තාහුයි; අච්ඡන්දිකාති, අච්ඡන්දිකයෝ නම්; අපච්චනීක පටිපදායං, මාර්ගානුලොම ප්‍රතිපත්තියෙහි; ඡන්දවිරහිතා, කත්තුකම්‍යතා ඡන්දනැත්තාහුයි; (උත්තරකුරුකයෝද මාරආදීන් මෙන් අච්ඡන්දිකයන් කෙරෙහිම ගිණියෙත්.) දුප්පඤ්ඤාති, නුවණ නැත්තාහු නම්; ලොකියලොකුත්තර සම්මාදිට්ඨියා විරහිතා, ලෝවී ලෝවුතුරු සම්මාදිට්ඨි නැත්තාහුයි; ("**දුප්පඤ්ඤාති භවඞ්ගපඤ්ඤාය පරිහීණා**" යනුදු "**භවඞ්ගපඤ්ඤාය පරිහීණාසාති යස්ස භවඞ්ගං ලොකුත්තරස්ස පාදකං න හොති සොපි දුප්පඤ්ඤො යෙව**" යනුදු විභඞ්ග අටුවායි. යම් භවාඞ්ග සන්තතියෙක

මිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තන්ති-කුසලෙසු ධම්මෙසු නියාම සම්මත්තං සම්මත්තසම්මත්තඤ්ච අරියමග්ගං ඔක්කමිතුං අභබ්බාති අත්ථො. න කෙවලඤ්ච කසිණෙයෙව අඤ්ඤෙසුපි කම්මට්ඨානෙසු එතෙසං එකස්සාපි භාවනා න ඉජ්ඣති. තස්මා විගතවිපාකාවරණෙනාපි කුලපුත්තෙන කම්මාවරණඤ්ච කිලෙසාවරණඤ්ච ආරකාපරිවජ්ජෙත්වා සද්ධම්මසවණසප්පුරිසූපනිස්සයාදීහි සද්ධඤ්ච ඡන්දඤ්ච පඤ්ඤඤ්ච වඩ්ඪෙත්වා කම්මට්ඨානානුයොගො කරණීයොති.

ඉති සාධුජනපාමොජ්ජත්ථාය කතෙ විසුද්ධිමග්ගෙ
සමාධිභාවනාධිකාරෙ

## සෙසකසිණ නිද්දෙසො නාම

පඤ්චමො පරිච්ඡෙදො.

---

6.

(අ) කසිණානන්තරං උද්දිට්ඨෙසු පන "උද්ධුමාතකං විනීලකං විපුබ්බකං විච්ඡිද්දකං වික්ඛායිතකං වික්ඛිත්තකං හතවික්ඛිත්තකං ලොහිතකං පුළවකං අට්ඨිකං"ති දසසු අවිඤ්ඤාණක අසුභෙසු භස්තා

---

ලොවුතුරුදහම් උපදීද ඒ භවඟසිත් ඒ ලොවුතුරු දහමුන්ට පාදක නම් වෙයි දන්නේ.) අභබ්බා...පෙ...සම්මත්තං යනුයෙහි; කුසලෙසු ධම්මෙසු නියාමසම්මත්තං, කුශලධර්මයන් කෙරෙහි නියාමයයි සම්මතවූ; සම්මත්තසම්මත්තඤ්ච, සම්‍යක්ත්වයයි සම්මතවූ; අරියමග්ගං ඔක්කමිතුං අභබ්බාති අත්ථො, අරිමඟට බස්නට අභව්‍යය යන අර්ථයි; කෙවලං, හුදෙක්; න කසිණෙයෙව, කසිණයෙහිම නොවෙයි; අඤ්ඤෙසුපි කම්මට්ඨානෙසු, සෙසු කමටහන්හිදු; එතෙසං, මොවුන් කෙරෙන්; එකස්සාපි භාවනා න ඉජ්ඣති, එකක්හටද භාවනා සිඬනොවෙයි; තස්මා, එහෙයින්; විගතවිපාකාවරණෙනාපි, (පූර්වකර්මවශයෙන්) පහකරනලද විපාකාවරණ ඇත්තාවූ; කුලපුත්තෙන, කුලපුත්හු විසින්; කම්මාවරණඤ්ච, කර්මාවරණයද; කිලෙසාවරණඤ්ච කිලෙසාවරණයද; ආරකා පරිවජ්ජෙත්වා, දුරින්ම දුරුකොට; සද්ධම්මසවණසප්පුරිසූපනිස්සයාදීහි, සද්ධර්මශ්‍රවණය සත්පුරුෂොපනිශ්‍රය යනාදීන්; සද්ධඤ්ච, සැදැහැද; ඡන්දඤ්ච, ඡන්දයද; පඤ්ඤඤ්ච, නුවණද; වඩ්ඪෙත්වා, වඩා; කම්මට්ඨානානුයොගො කරණීයො, කමටහන්හි නැවත නැවත යෙදීමෙහි අභියොග කටයුතු.

## සෙසකසිණනිද්දෙසො පඤ්චමො.

---

6.

(අ) කසිණානන්තරං උද්දිට්ඨෙසු පන, කිසුණට අනතුරුකොට උදෙසනලද...පෙ...දසසු අවිඤ්ඤාණක අසුභෙසු, දසවිධ අවිඤ්ඤාණක අශුභයන් කෙරෙහි; භස්තා විය වායුනා, වාතයෙන් පිරුණු

විය වායුනා උද්ධං ජීවිතපරියාදානා යථානුක්කමං සමුග්ගතෙන සූනභාවෙන උද්ධුමාතත්තා උද්ධුමාතං, උද්ධුමාතමෙව උද්ධුමාතකං, පටික්කූලත්තා වා කුච්ඡිතං උද්ධුමාතන්ති උද්ධුමාතකං, තථාරූපස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. විනීලං වුච්චති විපරිභින්නවණ්ණං, විනීලමෙව විනීලකං, පටික්කූලත්තා වා කුච්ඡිතං විනීලන්ති විනීලකං, මංසුස්සදට්ඨානෙසු රත්තවණ්ණස්ස පුබ්බසන්නිචයට්ඨානෙසු සෙතවණ්ණස්ස යෙභුය්‍යෙන ච නීලවණ්ණස්ස නීලට්ඨානෙ නීලපට[1] පාරුතස්සෙව ඡවසරීරස්සෙතං අධිවචනං. පරිභින්නට්ඨානෙසු විස්සන්දමානපුබ්බං විපුබ්බං, විපුබ්බමෙව විපුබ්බකං, පටික්කූලත්තා වා කුච්ඡිතං විපුබ්බන්ති විපුබ්බකං. තථාරූපස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. විච්ඡිද්දං වුච්චති විධා ඡින්දනෙන අපවාරිතං, විච්ඡිද්දමෙව විච්ඡිද්දකං, පටික්කූලත්තා වා කුච්ඡිතං විච්ඡිද්දන්ති විච්ඡිද්දකං. වෙමජ්ඣෙ ඡින්නස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. ඉතො ච එත්තො ච

---

සමක්මෙන්; උද්ධං ජීවිතපරියාදානා, ජීවිතක්ෂයින් (මරණින්) මතුයෙහි; යථානුක්කමං, ක්‍රමක්‍රමයෙන්; සමුග්ගතෙන, නැඟගාවූ; සූනභාවෙන, සූනභාවයෙන් (උද්ධුමාතභාවයෙන්); උද්ධුමාතත්තා, ඉදිමුණු බැවින්; උද්ධුමාතං, උද්ධුමාතනම; (මෙයින් "උද්ධං උද්ධං ධුමාතත්තා උද්ධුමාතං"යි කීවෙත්.) උද්ධුමාතමෙව උද්ධුමාතකං, උද්ධුමාතයම උද්ධුමාතකනම් වේ; (මෙයින් ස්වාර්ථයෙහි කප්‍රත්‍යය කීවෙත්.) පටික්කූලත්තා වා, පිළිකුල් බැවින් හෝ; කුච්ඡිතං උද්ධුමාතන්ති, කුත්සිතවූ උද්ධුමාතයෙක්නුයි; උද්ධුමාතකං, උද්ධුමාතකනම; (මෙයින් කුත්සාවෙහි කප්‍රත්‍යය කීවෙත්.) තථා රූපස්ස, එබඳුවූ උද්ධුමාතයට ගියාවූ; ඡවසරීරස්ස, මළසිරුරට; එතං, උද්ධුමාතකය යන මේ; අධිවචනං, නමෙකි; විනීලං, විනීලයයි; විපරිභින්නවණ්ණං වුච්චති, (සුදුරත්ආදි විසින්) මිශ්‍රවර්ණ ඇත්තේ කියනුලැබේ; නොහොත් පූර්වවර්ණයෙන් පෙරළිවර්ණ ඇත්තේ කියනු ලැබේ -පෙ- මංසුස්සදට්ඨානෙසු, මාංසය උස්තැන්හි; රත්තවණ්ණස්ස, රක්තවර්ණ ඇති, පුබ්බසන්නිචයට්ඨානෙසු, පූයා රැස්ව සිටිතැන්හි; සෙතවණ්ණස්ස, සේවතවර්ණඇති; යෙභුය්‍යෙන ච, බොහෝසේම; නීලවණ්ණස්ස, නීලවර්ණඇති; නීලට්ඨානෙ, නිල්තැන්හි; නීලපටපාරුතස්සෙව, නිල්පටක් පෙරවියා වැනිවූ; ඡවසරීරස්ස, මළසිරුරට; එතං අධිවචනං, මෙ නමෙකි; පරිභින්නට්ඨානෙසු, බුන්තැන්හි; විස්සන්දමානපුබ්බං, වැහෙන්නාවූ පූයා ඇත්තේ; විපුබ්බං, විපුබ්බනම් වේ; -පෙ- විධා ඡින්දනෙන, දෙකක්කොට කැපීමෙන්; අපවාරිතං, වෙන්කරන ලද්දේ; විච්ඡිද්දං වුච්චති, විච්ඡිද්දයයි කියනුලැබේ -පෙ- වෙමජ්ඣෙ ඡින්නස්ස, මැදින් දෙකක්කොට කැපූ;—සොණසිගාලාදීහි, බලු කැණහිල් ආදීන් විසින්; ඉතො ච එත්තො ච, ඔබින් ඔබ; විවිධාකාරෙන, නොයෙක් ආකාරයෙන්; ඛායිතං, කෑ ඝයනලද්දේ; වික්ඛායිතං, වික්ඛායිතනම් වේ; විවිධා, අනෙකප්‍රකාරයෙන්; ඛිත්තං,

---

1. නීලසාටක-ත්‍රි: මු:

විවිධාකාරෙන සොණසිඟාලාදීහි ඛායිතන්ති වික්ඛායිතං, වික්ඛායිතමෙව වික්ඛායිතකං පටික්කූලත්තා වා කුච්ඡිතං වික්ඛායිතන්ති වික්ඛායිතකං. තථාරූපස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. විවිධා ඛිත්තං වික්ඛිත්තං, වික්ඛිත්තමෙව වික්ඛිත්තකං, පටික්කූලත්තා වා කුච්ඡිතං වික්ඛිත්තන්ති වික්ඛිත්තකං අඤ්ඤෙන හත්ථං අඤ්ඤෙන පාදං අඤ්ඤෙන සීසන්ති එවං තතො තතො ඛිත්තස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. හතඤ්ච තං පුරිමනයෙනෙව වික්ඛිත්තකඤ්චාති හතවික්ඛිත්තකං, කාකපාදාකාරෙන අඞ්ගපච්චඞ්ගෙසු සත්ථෙන හනිත්වා සුත්තෙන වුත්තනයෙන[1] වික්ඛිත්තස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. ලොහිතං කිරති වික්ඛිපති ඉතො චිතො ච පග්ඝරතීති ලොහිතකං, පග්ඝරිතලොහිතමක්ඛිතස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. පුළවා වුච්චන්ති කිමයො, පුළවෙ කිරතීති පුළවකං, කිමිපරිපුණ්ණස්ස ඡවසරීරස්සෙතං අධිවචනං. අට්ඨියෙව අට්ඨිකං, පටික්කූලත්තා වා කුච්ඡිතං අට්ඨීති අට්ඨිකං, අට්ඨිකසඞ්ඛලිකායපි එකට්ඨිකස්සපි එතං අධිවචනං. ඉමානි ච පන උද්ධුමාතකාදීනි නිස්සාය උප්පන්ననිමිත්තානමපි නිමිත්තෙසු පටිලද්ධඣානානමපි එතානෙව නාමානි.

---

බලු කැණහිල් ආදීන් විසින් කෑ සිරුරින් වෙන්කොට ඒ ඒ තැන විසුරුවනලද්දේ; වික්ඛිත්තං, වික්ඛිත්තකනම් වේ; ...පෙ... අඤ්ඤෙන හත්ථං, අනික් තැනක අතය; අඤ්ඤෙන පාදං, අනික් තැනක පයය; අඤ්ඤෙන සීසන්ති, අනික් තැනෙක හිසයයි; එවං, මෙසේ; තතො තතො ඛිත්තස්ස, ඒ ඒ තැන විසුරුවනලද; ඡවසරීරස්ස, ශවශරීරයට; එතං අධිවචනං, මේ නමෙකි; හතඤ්ච තං, කොටනලද්දේ හේමය; පුරිමනයෙනෙව "විවිධා ඛිත්තං" යනාදී පෙරකීනයින්ම; වික්ඛිත්තකඤ්චාති, විසුරුවනලද්දේ හේමනුයි; හතවික්ඛිත්තකං, හතවික්ඛිත්තක නම් වේ; කාකපාදාකාරෙන, කාකපාදාකාරයෙන්; අඞ්ගපච්චඞ්ගෙසු අඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි; සත්ථෙන හනිත්වා, ශස්ත්‍රයෙන් කොටා; සුත්තෙන වුත්තනයෙන "අඤ්ඤෙන හත්ථං" යනාදී සූත්‍රයෙහි කී නියෙන්; වික්ඛිත්තස්ස, විසුරුවනලද; ඡවසරීරස්සෙතං අධිවචනං, ශවශරීරයට මෙ නමෙකි; ලොහිතං, ලෙහෙ; (කිරති,යි සේයි;) වික්ඛිපති වැගිරේ; ඉතො චිතො ච පග්ඝරතීති, ඔබින් ඔබ වැගිරේනුයි; ලොහිතකං, ලොහිතකනම්; පග්ඝරිතලොහිතමක්ඛිතස්ස, වැගිරෙන්නාවූ ලේ මුසුවූ; ඡවසරීරස්ස, ශවසරීරයට; එතං අධිවචනං, මෙ නමෙකි; කිමයො, කෑමිහු; පුළවා වුච්චන්ති, පුළවායයි කියනුලැබෙත්; පුළවෙ, පණුවන්; කිරතීති, මගුරුවානුයි; පුළවකං, පුළවකනම් වේ; කිමිපරිපුණ්ණස්ස, පණුවන් පිරුණාවූ; ඡවසරීරස්සෙතං අධිවචනං, ශව ශරීරයට මෙ නමෙකි; අට්ඨියෙව, ඇටම; අට්ඨිකං, අට්ඨිකනම්; පටික්කූලත්තා වා, පිළිකුල් හෙයින් හෝ; කුච්ඡිතං අට්ඨීති, කුත්සිත ඇටෙක්නුයි; අට්ඨිකං, අට්ඨිකනම්; අට්ඨිකසඞ්ඛලිකායපි, ඇටසැකිල්ලටද; එකට්ඨිකස්සපි, එක ඇටයකටද; එතං අධිවචනං, මේ නමෙකි; ඉමානි ච පන උද්ධුමාතකාදීනි නිස්සාය, (අමුසොහොන් ආදියෙහි දමනලද) මේ උද්ධුමාතකාදීන් නිසා; උප්පන්ននිමිත්තානමපි, උපන් උද්ග්‍රහ ප්‍රතිභාගනිමිත්තයනටද; නිමිත්තෙසු පටිලද්ධඣානානමපි, ඒ නිමිත්හි පි(ළි)ලද ධ්‍යානයනටද; එතානෙව නාමානි, මේ උද්ධුමාතක යනාදීහුම නාමයෝයි.

---

1. හනිත්වා සුත්තනයෙන—ත්‍රි. මු.

(අ) තත්ථ උද්ධුමාතකසරීරෙ උද්ධුමාතකනිමිත්තං උප්පාදෙත්වා උද්ධුමාතකසඞ්ඛාතං ඣානං භාවෙතුකාමෙන යොගිනා පඨවිකසිණෙ වුත්තනයෙනෙව වුත්තප්පකාරං ආචරියං උපසඞ්කමිත්වා කම්මට්ඨානං උග්ගහෙතබ්බං, තෙනස්ස කම්මට්ඨානං කථෙන්තෙන අසුභනිමිත්තත්ථාය ගමනවිධානං සමන්තා නිමිත්තුපලක්ඛණං එකාදසවිධෙන නිමිත්තග්ගාහො ගතාගතමග්ගපච්චවෙක්ඛණන්ති එවං අප්පනාවිධානපරියොසානං සබ්බං කථෙතබ්බං, තෙනාපි සබ්බං සාධුකං උග්ගහෙත්වා පුබ්බෙ වුත්තප්පකාරං සෙනාසනං උපගන්ත්වා උද්ධුමාතකනිමිත්තං පරියෙසන්තෙන විහාතබ්බං. එවං විහරන්තෙන ච අසුකස්මිං නාම ගාමද්වාරෙ වා අටවිමුඛෙ වා පන්ථෙ වා පබ්බතපාදෙ වා රුක්ඛමූලෙ වා සුසානෙ වා උද්ධුමාතකසරීරං නික්ඛිත්තන්ති කථෙන්තානං වචනං සුත්වාපි න තාවදෙව අතිත්ථෙන පක්ඛන්දන්තෙන විය ගන්තබ්බං, කස්මා

---

(අ) තත්ථ, එහි; උද්ධුමාතකසරීරෙ, උද්ධුමාතක ශරීරයෙහි; නිමිත්තං උප්පාදෙත්වා (විවිධ) නිමිත්තයන් උපදවා; උද්ධුමාතකසඞ්ඛාතං ඣානං, උද්ධුමාතක නම්වූ ධ්‍යානය; භාවෙතුකාමෙන යොගිනා, උපදවනු කැමති යොගීහු විසින්; පඨවිකසිණෙ වුත්තනයෙනෙව, පඨවිකසිණයෙහි කී නියෙන්ම; වුත්තප්පකාරං ආචරියං උපසඞ්කමිත්වා, (ප්‍රිය ගුරුභාවාදී) වූක්තප්‍රකාර ඇති ආචාරීන්කරා එළඹ; කම්මට්ඨානං උග්ගහෙතබ්බං, කමටහන උගතයුතු; අස්ස, ඒ යොගීහට; කම්මට්ඨානං කථෙන්තෙන, කමටහන් කියන්නාවූ; තෙන, ඒ ආචාරීහු විසින්; අසුභනිමිත්තත්ථාය, අශුභනිමිත්තය උගන්නාපිණිස; (අශුභයෙහි උද්ග්‍රහනිමිත්තය පිණිස හෝ;) ගමනවිධානං, යන විධියද; සමන්තා නිමිත්තුපලක්ඛණං, ශවයට හාත්පසින් නිමිත් සැලකීමද; එකාදසවිධෙන නිමිත්තග්ගාහො, එකොළොස් පරිද්දෙකින් නිමිත්තග්‍රහණයට, ගතාගතමග්ගපච්චවෙක්ඛණන්ති, යන එනමඟ පස්විකීමද යන; එවං, මෙසේ; අප්පනාවිධානපරියොසානං, අර්පණාවිධිය කෙළවරකොට ඇති; සබ්බං, සියල්ල; කථෙතබ්බං, කියයුතු; තෙනාපි, ඒ යොගීහු විසිනුදු; සබ්බං, සියල්ල; සාධුකං උග්ගහෙත්වා, මනාකොට උගෙන; පුබ්බෙ වුත්තප්පකාරං සෙනාසනං උපගන්ත්වා, නාතිදූරාදි පෙරකියනලද ප්‍රකාර ඇති සෙනස්නට එළඹ; උද්ධුමාතක නිමිත්තං, උද්ධුමාතක නිමිත්; පරියෙසන්තෙන, සොයන්නහු විසින්; විහාතබ්බං. විසියයුතු; එවං විහරන්තෙන, මෙසේ වසන්නහු විසින්; අසුකස්මිං නාම, අසවල්නම්; ගාමද්වාරෙ වා, ගම්දොරහෝ; අටවිමුඛෙ වා, අටවිමුඛයෙහි හෝ; (කැලෑ දොරෙහි යනු සන්නයයි.) පන්ථෙ වා, මඟ හෝ; පබ්බතපාදෙ වා, පර්වත පාදයෙහි හෝ; රුක්ඛමූලෙ වා, රුක්මුල හෝ සුසානෙ වා, සොහොනෙහි හෝ; උද්ධුමාතකසරීරං නික්ඛිත්තන්ති, ඉදිමුණු මළසිරුරෙක් දමනලදැයි; කථෙන්තානං වචනං සුත්වාපි, කියන්නවුන්ගේ තෙපුල් අසාද; තාවදෙව, ඇසූකෙණෙහිම; අතිත්ථෙන පක්ඛන්දන්තෙන විය, නොතොටින් (පරිපූර්ණ නදීආදියට) බස්නක්හු මෙන්; න ගන්තබ්බං,

අසුභං හි නාමෙතං වාළමිගාධිට්ඨිතම්පි අමනුස්සාධිට්ඨිතම්පි හොති. තත්‍රස්ස ජීවිතන්තරායොපි සියා. ගමනමග්ගො වා පනෙත්ථ ගාමද්වාරෙන වා නහානතිත්ථෙන වා කෙදාරකොටියා වා හොති, තත්ථ විසභාගරූපං ආපාථං ආගච්ඡති, තදෙව වා සරීරං විසභාගං හොති. පුරිසස්ස හි ඉත්ථිසරීරං ඉත්ථියා ච පුරිසසරීරං විසභාගං. තදෙතං අද්ධුනාමතං සුභතොපි උපට්ඨාති, තෙනස්ස බ්‍රහ්මචරියන්තරායොපි සියා. සචෙ පන නයිදං මාදිසස්ස භාරියන්ති අත්තානං තක්කයති, එවං තක්කයමානෙන ගන්තබ්බං. ගච්ඡන්තෙන ච සඞ්ඝත්ථෙරස්ස වා අඤ්ඤස්ස වා අභිඤ්ඤාතස්ස භික්ඛුනො කථෙත්වා ගන්තබ්බං. කස්මා? සචෙ හිස්ස සුසානෙ අමනුස්සසීහබ්‍යග්ඝාදීනං රූපසද්දාදිඅනිට්ඨාරම්මණාභිභූතස්ස අඞ්ගපච්චඞ්ගානි වා පවෙධෙන්ති, භුත්තං වා න පරිණමති, අඤ්ඤො වා ආබාධො හොති, අථස්ස සො විහාරෙ පත්ත

---

නොයායුතු; කස්මා, කුමක් හෙයින්දයත්? අසුභං හි නාමෙතං, මේ අසුභනාම් තෙමේ; වාළමිගාධිට්ඨිතම්පි, ව්‍යාලමෘගයන් විසින් පිහිටන ලද්දේ; අමනුස්සාධිට්ඨිතම්පි, අමනුෂ්‍යයන් විසින් පිහිටනලද්දේ; හොති, වන්නේය; තත්‍ර, එසේ කල්හි; අස්ස, මේහට; ජීවිතන්තරායොපි සියා, ජීවිතාන්තරායද වන්නේයි; එත්ථ පන, මේ ශ්මශානයෙහි වනාහි; ගමනමග්ගො, යන මඟ; ගාමද්වාරෙන වා, ගම් දොරින් හෝ; නහානතිත්ථෙන වා, නහනතොටින් හෝ; කෙදාරකොටියා වා, කුඹුරු කෙළවරින් හෝ; හොති, වන්නේයි; තත්ථ, එහි; විසභාගරූපං ආපාථං ආගච්ඡති, ගැල්ගෙවි ආදි විසභාග රූ හමුවන්නේයි; තදෙව වා සරීරං, එම ශරීරය හෝ; විසභාගං හොති, විසභාගවෙ; පුරිසස්ස හි පිරිමි හට; ඉත්ථිසරීරං, මාගම් සිරුරද; ඉත්ථියා ච, මාගමට; පුරිසසරීරං, පිරිමි සිරුරද; විසභාගං, විසභාග වේ; තදෙතං, ඒ සිරුර; අද්ධුනාමතං, අලුත මෙළේ; සුභතොපි උපට්ඨාති, ශුභවද වැටහෙන්නේය; තෙන, එහෙයින්; අස්ස, මොහුගේ; බ්‍රහ්මචරියන්තරායොපි සියා, බ්‍රහ්මචර්‍ය්‍යාවට අන්තරායද වේ; සචෙ පන, ඉදින් වනාහි; නයිදං මාදිසස්ස භාරියන්ති, මබන්දක්හට මේ බැරිනොවෙයි; අත්තානං තක්කයති, තමා තකානම්; එවං, මෙසේ; තක්කයමානෙන, තමා තකන්නහු විසින්; ගන්තබ්බං, යායුතු; ගච්ඡන්තෙන ච, යන්නහු විසිනුදු; සඞ්ඝත්ථෙරස්ස වා, සංඝතෙරනට හෝ; අඤ්ඤස්ස වා අභිඤ්ඤාතස්ස භික්ඛුනො, අනික් ප්‍රසිද්ධ මහණෙක්හට හෝ; කථෙත්වා ගන්තබ්බං, කියා යායුතු; කස්මා, කුමක් හෙයිනයත්? සචෙ හි, ඉදින්; සුසානෙ, සොහොන්හි; අමනුස්සසීහබ්‍යග්ඝාදීනං, අමනුෂ්‍යයන සිංහයන ව්‍යාඝ්‍රයන යනාදීන්ගේ; රූපසද්දාදිඅනිට්ඨාරම්මණාභිභූතස්ස, භයානකවූ රූපශබ්දය යනාදිවූ අනිෂ්ට අරමුණෙන් මඩනාලද; අස්ස, ඒ යොගීහිගේ; අඞ්ගපච්චඞ්ගානි වා පවෙධෙන්ති, අඞ්ගප්‍රත්‍යඞ්ගයෝ හෝ වෙවුලත්නම්; භුත්තං වා න පරිණමති, කෑදෙය හෝ (වීදුනවිසින් ආසයෙහි නොසිට) නැගී හෝ යේනම්; අඤ්ඤො වා ආබාධො හොති,

චීවරං සුරක්ඛිතං කරිස්සති දහරෙ වා සාමණෙරෙ වා පහිණිත්වා තං භික්ඛුං පටිජග්ගිස්සති. අපි ච සුසානං නාම නිරාසඞ්කට්ඨානන්ති මඤ්ඤමානා කතකම්මාපි අකතකම්මාපි චොරා සමොසරන්ති, තෙ මනුස්සෙහි අනුබද්ධා භික්ඛුස්ස සමීපෙ භණ්ඩකං ඡඩ්ඩෙත්වාපි පලායන්ති. මනුස්සා සහොඩ්ඪං චොරං අද්දසාමාති භික්ඛුං ගහෙත්වා විහෙඨෙන්ති, අථස්ස සො මා ඉමං විහෙඨයිත්ථ මමායං කථෙත්වා ඉමිනා නාම කම්මෙන ගතොති තෙ මනුස්සෙ සඤ්ඤාපෙත්වා සොත්ථිභාවං කරිස්සති. අයමානිසංසො කථෙත්වා ගමනෙ, තස්මා වුත්තප්පකාරස්ස භික්ඛුනො කථෙත්වා අසුභනිමිත්තදස්සනෙ සඤ්ජාතාභිලාසෙන යථා නාම ඛත්තියො අභිසෙකට්ඨානං යජමානො යඤ්ඤසාලං අධනො වා පන නිධිට්ඨානං පීතිසොමනස්සජාතො ගච්ඡති එවං පීතිසොමනස්සං උප්පාදෙත්වා අට්ඨකථාසු වුත්තෙන විධිනා ගන්තබ්බං.

---

අතික් ආබාධයෙක් හෝ වේනම්; අථ, එසේකල්හි; සො, ඒ භංතෙරහු හෝ අභිඤ්ඤාතමහණ හෝ; විහාරෙ, වෙහෙර තුබූ; අස්ස, ඒ යොගීහිගේ; පත්තචීවරං, පාසිවුරු; සුරක්ඛිතං කරොති, සුරක්ෂිත කෙරේ; දහරෙ වා, ළදරු මහණුන් හෝ; සාමණෙරෙ වා, හෙරණුන් හෝ; පහිණිත්වා, යවා; තං භික්ඛුං, ඒ මහණහු; පටිජග්ගිස්සති, පිළිදක්නේයි; අපි ච, අනිකෙකුදු; සුසානං නාම, සොහොන නම්; නිරාසඞ්කට්ඨානන්ති මඤ්ඤමානා, නිරාශඞ්ක තැනැයි සිතන්නාවූ; කතකම්මාපි අකතකම්මාපි චොරා, කළ සොරකම්ද නොකළ සොරකම්ද ඇති සොරහු; සමොසරන්ති, රැස්වෙත්; (මෙහිකළ සොරකම්ඇති සොරහු අභිමතයෝයි.) තෙ මනුස්සෙහි අනුබද්ධා, කළ සොරකම් ඇති ඒ සොරහු මිනිසුන් විසින් ලුහුබඳනාලද්දාහු; භික්ඛුස්ස සමීපෙ භණ්ඩකං ඡඩ්ඩෙත්වාපි පලායන්ති, මහණහු ආසන්නයෙහි බඩු හෙළාපියා පලායන්නාහුයි; මනුස්සා, මිනිස්හු; සහොඩ්ඪං චොරං අද්දසාමාති, බඩුහා එක්කොට සොරහු දුටුම්හයි; භික්ඛුං ගහෙත්වා විහෙඨෙන්ති, මහණහු ගෙන වෙහෙසෙන්නාහුයි; අථ, එසේකල්හි, සො, ඒ භං තෙරහු හෝ අභිඤ්ඤාත මහණ හෝ; ඉමං මා විහෙඨයිත්ථ; මොහු නහමක් වෙහෙසව; අයං, මෙතෙම; මෙ කථෙත්වා ඉමිනා නාම කම්මෙන ගතොති, මටකියා මෙනම්කැමෙකින් ගියේයයි; තෙ මනුස්සෙ සඤ්ඤාපෙත්වා, ඒ මිනිසුන් සංහිඳුවා; ("අස්ස සොත්ථිභාවං කරිස්සති"යි යොදනු.) ඒ මහණහට සුවබව කරන්නේයි; අයමානිසංසො කථෙත්වා ගමනෙ, කියා යාමෙහි මේ අනුසසි; තස්මා, එහෙයින්; වුත්තප්පකාරස්ස භික්ඛුනො කථෙත්වා, වුක්තප්‍රකාර මහණහට කියා; අසුභනිමිත්තදස්සනෙ සඤ්ජාතාභිලාසෙන, අශුභනිමිත්ත දැක්මෙහි උපන් අභිලාෂ ඇතියහු විසින්; යථා නාම, යම්සේ; ඛත්තියො, රජතෙමේ; අභිසෙකට්ඨානං, අභිෂෙකස්ථානයට යේද; යජමානො, යාගකරන යාගස්වාමිතෙමේ; යඤ්ඤසාලං, යාගශාලාවට යේද; අධනො වා පන, නිර්ධනී වනාහි; නිධිට්ඨානං, නිධානතුබූ තැනට; පීති සොමනස්සජාතො ගච්ඡති, ප්‍රීති සොම්නස් ඇතිව යේද; එවං, එපරිද්දෙන්ම; පීතිසොමනස්සං උප්පාදෙත්වා, ප්‍රීතිසෞමනස්‍ය උපදවා; අට්ඨකථාසු වුත්තෙන විධිනා, අටුවායෙහි කියනලද ක්‍රමයෙන්; ගන්තබ්බං, යායුතු.

(ආ) වුත්තං හෙතං:-උද්ධුමාතකං අසුභනිමිත්තං උග්ගණ්හන්තො එකො අදුතියො ගච්ඡති උපට්ඨිතාය සතියා අපම්මුට්ඨාය අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි අබහිගතෙන මානසෙන ගතාගතමග්ගං පච්චවෙක්ඛමානො. යස්මිං පදෙසෙ උද්ධුමාතකං අසුභනිමිත්තං නික්ඛිත්තං හොති, තස්මිං පදෙසෙ පාසාණං වා වම්මිකං වා රුක්ඛං වා ගච්ඡං වා ලතං වා සනිමිත්තං කරොති, සාරම්මණං කරොති. සනිමිත්තං කත්වා සාරම්මණං කත්වා උද්ධුමාතකං අසුභනිමිත්තං සභාවභාවතො උපලක්ඛෙති.

(ඇ) වණ්ණතොපි ලිඞ්ගතොපි සණ්ඨානතොපි දිසතොපි ඔකාසතොපි පරිච්ඡෙදතොපි සන්ධිතොපි විවරතො නින්නතො ථලතො සමන්තතො, සො තං නිමිත්තං සුග්ගහිතං කරොති සූපධාරිතං උපධා

---

(ආ) වුත්තං හෙතං, අටුවායෙහි මේ කියනලදුයේමැයි; උද්ධුමාතකං අසුභනිමිත්තං, උද්ධුමාතක අසුභනිමිත්තය; උග්ගණ්හන්තො, උගන්නා යොගාවචරතෙම; එකො, හුදකලාව; අදුතියො, තමාට දෙවැනියෙකු නැත්තේ; අපම්මුට්ඨාය, මුළානොවූ; උපට්ඨිතාය සතියා, එළඹසිටි සිහියෙන් යුක්තව; අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි, ඇතුළත්කරනලද ඉඳුරන් ඇතිව; අබහිගතෙන මානසෙන, පිටත්නොකරනලද සිහිඇතිව; ගතාගතමග්ගං පච්චවෙක්ඛමානො, යන එන මං පස්විකණුයේ; ("ගච්ඡති"යි යොදනු.) යස්මිං පදෙසෙ, යම් ප්‍රදෙශයෙක; උද්ධුමාතකං අසුභනිමිත්තං, උද්ධුමාතක අසුභනිමිත්තක්; නික්ඛිත්තං හොති, දමනලද්දේ වේද; තස්මිං පදෙසෙ, ඒ ප්‍රදෙශයෙහි; පාසාණං වා, පහණක් හෝ; වම්මිකං වා, තුඹසක් හෝ; රුක්ඛං වා, රුකක් හෝ; ගච්ඡං වා, ගසක් හෝ; ලතං වා, ලියෙක් හෝ; සනිමිත්තං කරොති, නිමිත්ත සමග කරන්නේයි; සාරම්මණං කරොති, අරමුණු සමග කෙරෙයි; සනිමිත්තං කත්වා, නිමිත්සමගකොට; සාරම්මණං කත්වා, අරමුණුසමග කොට; උද්ධුමාතකං අසුභනිමිත්තං, උද්ධුමාතක අශුභනිමිත්තය; සභාවභාවතො, සභාග හෙයින්; උපලක්ඛෙති, සලකුණු කරන්නේයි ෴

(ඇ) සො, ඒ යොගාවචරතෙම; වණ්ණතොපි, වර්ණහෙයින්ද; ලිඞ්ගතොපි, ලිඟුහෙයින්ද; සණ්ඨානතොපි, සටහන්වශයෙන්ද; දිසතොපි, දිශාවශයෙන්ද; ඔකාසතොපි, අවකාශහෙයින්ද; පරිච්ඡෙදතොපි, පිරිසෙහෙයින්ද; සන්ධිතොපි, සන්ධිවශයෙන්ද; විවරතොපි, සිදුරුහෙයින්ද; නින්නතො නිම්නස්ථාන වශයෙන්ද; ථලතො, උස්තැන්වශයෙන්ද; සමන්තතො, හාත්පසවශයෙන්ද; තං නිමිත්තං, ඒ අශුභනිමිත්තය; සුග්ගහිතං කරොති, මනාකොට ගන්නාලද කෙරෙයි; සූපධාරිතං උපධාරෙති, මනාවූ පරීක්ෂාවෙන්

රෙති සුවවත්ථිතං වවත්ථපෙති, සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා සුවවත්ථිතං වවත්ථපෙත්වා එකො අදුතියො ගච්ඡති උපට්ඨිතාය සතියා අපම්මුට්ඨාය අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි අබහිගතෙන මානසෙන ගතාගතමග්ගං පච්චවෙක්ඛමානො. සො චඞ්කමන්තොපි තබ්භාගියඤ්ඤෙව චඞ්කමං අධිට්ඨාති, නිසීදන්තොපි තබ්භාගියඤ්ඤෙව ආසනං පඤ්ඤපෙති. සමන්තා නිමිත්තුපලක්ඛණා කිමත්ථියා කිමානිසංසාති? සමන්තා නිමිත්තුපලක්ඛණා අසම්මොහත්ථා අසම්මොහානිසංසා. එකාදසවිධෙන නිමිත්තග්ගාහො කිමත්ථියො කිමානිසංසොති? එකාදසවිධෙන නිමිත්තග්ගාහො උපනිබන්ධනත්ථො උපනිබන්ධනානිසංසො, ගතාගතමග්ගපච්චවෙක්ඛනා කිමත්ථියා කිමානිසංසාති? ගතාගතමග්ගපච්චවෙක්ඛනා වීථිසම්පටිපාදනත්ථා වීථිසම්පටිපාදනානිසංසා. සො ආනිසංසදස්සාවී රතනසඤ්ඤී හුත්වා චිත්තීකාරං උපට්ඨපෙත්වා සම්පියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධති අද්ධා ඉමාය පටිපදාය ජරාමරණම්හා පරිමුච්චිස්සාමීති. සො විවිච්චෙව කාමෙහි෴පෙ෴පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. තස්සාධිගතං හොති රූපාවචරං පඨමජ්ඣානං දිබ්බො ච විහාරො භාවනාමයඤ්ච පුඤ්ඤකිරියවත්ථූ"ති෴

---

පරීක්‍ෂා කෙරේ; සුවවත්ථිතං වවත්ථපෙති, මනාවූ නිශ්චයෙන් නිශ්චය කෙරේ; සො, හෙතෙම; තං නිමිත්තං, ඒ අශුභනිමිත්තය; සුග්ගහිතං කත්වා, මනාව ඉගෙනීම කොට෴පෙ෴චඞ්කමන්තොපි, සක්මන්කරන්නේද; තබ්භාගියඤ්ඤෙව චඞ්කමං අධිට්ඨාති, අශුභනිමිත්ත මනසකාර සහිතවම සක්මන්කෙරේ; නිසීදන්තොපි, හිඳින්නේද; තබ්භාගියඤ්ඤෙව ආසනං පඤ්ඤපෙති, අශුභනිමිත්තමනසකාර සහිතවම නිෂද්‍යා කෙරේ; සමන්තා නිමිත්තුපලක්ඛණා,(උද්ධුමාතකයට) හාත්පස පාෂාණාදි සලකුණුකිරීම; කිමත්ථියා, කුමක් ප්‍රයොජනකොට ඇත්තීද; කිමානිසංසාති, කුමක් අනුසස්කොට ඇත්තීදයත්;? සමන්තා නිමිත්තුපලක්ඛණා, හාත්පස නිමිති සලකුණුකිරීම; අසම්මොහත්ථා, (උද්ග්‍රහනිමිත්ත එළඹිසිටිකල්හි උපදනා, මුළාබව දුරුකිරීම පිණිස වේ; අසම්මොහානිසංසා, එම නොමුළාබව අනුසස් කොට ඇත්තීය; එකාදසවිධෙන නිමිත්තග්ගාහො, එකොළොස් ආකාරයකින් නිමිත්තග්‍රහණය කිරීම෴පෙ෴උපනිබන්ධනත්ථො, (අශුභාරම්මණෙහි සිත එළඹ) බැඳීම පිණිස වේ෴පෙ෴වීථිසම්පටිපාදනත්ථා, කම්මට්ඨාන වීථියට මනාකොට පිළිපැදීම පිණිස වේ෴පෙ෴තස්ස, ඒ යොගාවචරයාහට; රූපාවචරං පඨමජ්ඣානං, රූපාවචර ප්‍රථමධ්‍යානයද; දිබ්බො ච විහාරො, දිව්‍යවූ ආයතීවිහාරයද; භාවනාමයඤ්ච පුඤ්ඤකිරියවත්ථූ, භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුවද; අධිගතං හොති, පැමිණෙන ලද්දේවේ.෴

(අ) තස්මා යො චිත්තසඤ්ඤත්තත්ථාය සීවථිකදස්සනං ගච්ඡති. සො ගණ්ඩිං පහරිත්වා ගණං සන්නිපාතෙත්වා පි ගච්ඡතු. කම්මට්ඨානසීසෙන පන ගච්ඡන්තෙන එකකෙන අදුතියෙන මූලකම්මට්ඨානං අවිජහිත්වා තං මනසිකරොන්තෙනෙව සුසානෙ සොණාදිපරිස්සයවිනොදනත්ථං කත්තරදණ්ඩකං වා යට්ඨිං වා ගහෙත්වා සූපට්ඨිතභාවසම්පාදනෙන අපම්මුට්ඨසතිං කත්වා මනච්ඡට්ඨානඤ්ච ඉන්ද්‍රියානං අන්තොගතභාවසම්පාදනතො අබහිගතමනෙන හුත්වා ගන්තබ්බං. විහාරතො නික්ඛමන්තෙනෙව අසුකදිසාය අසුකද්වාරෙන නික්ඛන්තොම්හීති ද්වාරං සල්ලක්ඛෙතබ්බං. තතො යෙන මග්ගෙන ගච්ඡති, සො මග්ගො වවත්ථපෙතබ්බො:– අයං මග්ගො පාචීනදිසාභිමුඛො වා ගච්ඡති පච්ඡිම...පෙ...උත්තරදක්ඛිණදිසාභිමුඛො වා විදිසාභිමුඛො

---

(අ) තස්මා, (යම්හෙයකින් අශුභනිමිත්ත උගැන්ම ආයතිමාර්ගයට ආසන්න කාරණ වේද) එහෙයින්; යො, යම් යොගාවචරයෙක් තෙම; චිත්තසඤ්ඤත්තත්ථාය, කෙලෙස් වශයෙන් අසංයතවූ චිත්තයාගේ දමනය පිණිස; සීවථිකදස්සනං, මළසිරුරු දක්මට; ගච්ඡති, යන්නේයි; සො, හෙතෙම; ගණ්ඩිං පහරිත්වා, ගෙඩිය ගසා; ගණං සන්නිපාතෙත්වාපි, ගණයා රැස්කරවාද; ගච්ඡතු, යේවා; කම්මට්ඨානසීසෙන, කමටහන් ප්‍රධානකොට; ගච්ඡන්තෙන පන, යන්නහු විසින්ද; එකකෙන, හුදකලාහු විසින්; අදුතියෙන, දෙවන්නෙකු නැත්තහු විසින්; මූලකම්මට්ඨානං අවිජහිත්වා, (ප්‍රකෘතීන් තමා විසින් කලින්කල පරිහරණය කරනලද බුද්ධානුස්මෘත්‍යාදී සබ්බත්ථක කම්මට්ඨාන නම්වූ) මුල් කමටහන නොහැර; තං මනසිකරොන්තෙනෙව, ඒ මුල් කමටහන මෙනෙහිකරන්නහු විසින්ම; සුසානෙ, සොහොන්හි; සොණාදිපරිස්සයවිනොදනත්ථං, බලුආදී උපද්‍රව වළකන පිණිස; කත්තරදණ්ඩකං වා, සැරයටියක් හෝ; යට්ඨිං වා, යටක් හෝ; ගහෙත්වා, ගෙන, සූපට්ඨිතභාවසම්පාදනෙන, මුල්කමටහන මනාකොට එළඹසිටිබව සැපයීමෙන්; අපම්මුට්ඨසතිං කත්වා, නොමුළා සිහිඇතිව; මනච්ඡට්ඨානං ඉන්ද්‍රියානඤ්ච, මනස සවනුකොට ඇති ඉන්ද්‍රියයන්ගේ; අන්තොගතභාව සම්පාදනතො,(පිටත්හි පෘථුත්වා රමුණෙහි නොපැවැත)ඇතුලු මුල්කමටහන්හි පවත්නාබව සැපයීමෙන්; අබහිගතමනෙන හුත්වා, පිටත්හි නොහැසිරෙන සිත් ඇත්තහු විසින්; ගන්තබ්බං, යායුතු; විහාරතො නික්ඛමන්තෙනෙව, වෙහෙරෙන් නික්මෙන්නහු විසින්ම; අසුකදිසාය, අසුවල් දිග්හි; අසුකද්වාරෙන නික්ඛමන්තොම්හීති, අසුවල්දොරින් නික්මිනිමියි; ද්වාරං සල්ලක්ඛෙතබ්බං, දොර සැලකියයුතු; තතො, ඉක්බිත්තෙන්; යෙන මග්ගෙන ගච්ඡති, යම් මඟෙකින් යේද; සො මග්ගො වවත්ථපෙතබ්බො, ඒ මඟ නියමකටයුතු; අයං මග්ගො පාචීනදිසාභිමුඛො වා ගච්ඡති, මේ මඟ නැගෙනහිරට අභිමුඛව ගියේයයිද; පච්ඡිම, පශ්චිමදිගට අභිමුඛව ගියේයයිද...පෙ...උත්තර, උතුරුදිගට අභිමුඛබව ගියේයයිද; දක්ඛිණදිසාභිමුඛො වා, දකුණුදිගට අභිමුඛව ගියේයයිද; විදිසාභිමුඛො

වාති. ඉමස්මිං වා පන ඨානෙ වාමතො ගච්ඡති, ඉමස්මිං ඨානෙ දක්ඛිණතො, ඉමස්මිඤ්චස්ස ඨානෙ පාසාණො, ඉමස්මිං වම්මිකො, ඉමස්මිං රුක්ඛො, ඉමස්මිං ගච්ඡො, ඉමස්මිං ලතාති එවං ගමනමග්ගං වවත්ථපෙන්තෙන නිමිත්තට්ඨානං ගන්තබ්බං. නො ච ඛො පටිවාතං, පටිවාතං ගච්ඡන්තස්ස හි කුණපගන්ධො ඝාණං පහරිත්වා මත්ථලුඞ්ගං වා සඞ්ඛොභෙය්‍ය ආහාරං වා ඡඩ්ඩාපෙය්‍ය විප්පටිසාරං වා ජනෙය්‍ය ඊදිසං නාම කුණපට්ඨානං ආගතොම්හීති. තස්මා පටිවාතං වජ්ජෙත්වා අනුවාතං ගන්තබ්බං. සචෙ අනුවාතමග්ගෙන න සක්කා හොති ගන්තුං, අන්තරා පපාතො වා පබ්බතො වා පාසාණො වා වති වා කණ්ටකාධානං වා උදකං වා චික්ඛල්ලං වා හොති, චීවරකණ්ණෙන නාසං පිදහිත්වා ගන්තබ්බං. ඉදමස්ස ගමනවත්තං. එවං ගතෙන පන න තාව අසුභනිමිත්තං ඔලොකෙතබ්බං, දිසා වවත්ථපෙතබ්බා, එකස්මිං හි දිසා

---

වාති, සතරඅනුදිගට අභිමුඛවගියේයයිද; ("වවත්ථපෙතබ්බං"යි යොදනු) ඉමස්මිං වා පන ඨානෙ, නොහොත් මෙතනදී; වාමතො ගච්ඡති, වමතයෙයි; ඉමස්මිං ඨානෙ, මෙතනදී; දක්ඛිණතො, දකුණතයෙයි; අස්ස, මේ මාර්ගයාගේ; ඉමස්මිං ඨානෙ, මෙතැන; පාසාණො, පහණෙක; ඉමස්මිං, මෙතැන; වම්මිකො, තුඹසෙක; ඉමස්මිං, මෙතැන; රුක්ඛො, රුකෙක; ඉමස්මිං, මෙතැන; ගච්ඡො, ගසෙක; ඉමස්මිං, මෙතැන; ලතාති, ලියෙකැයි; එවං, මෙසේ; ගමනමග්ගං වවත්ථපෙන්තෙන, යන මඟ නියමකරන්නහු විසින්; නිමිත්තට්ඨානං, අශුභ නිමිත් ගන්නාතැනට; ගන්තබ්බං, යායුතු; නො ච ඛො පටිවාතං, උඩුසුළඟට නොයායුතු; පටිවාතං ගච්ඡන්තස්සහි, උඩුසුළඟට යන්නහුට, කුණපගන්ධො ඝාණං පහරිත්වා, කුණපගඳය නාසාවෙහි පැහැර මත්ථලුඞ්ගං වා සඞ්ඛොභෙය්‍ය, හිස්මුල් හෝ අල ලන්නේය; ආහාරං වා ඡඩ්ඩාපෙය්‍ය, අහර හෝ හංවාපියන්නේයි; ඊදිසං නාම කුණපට්ඨානං ආගතොම්හීති, මෙබඳු කුණපය තිබූතැනට අයිම් යි; විප්පටිසාරං වා ජනෙය්‍ය, විපිළිසර හෝ උපදවන්නේයි; තස්මා, එහෙයින්; පටිවාතං වජ්ජෙත්වා, උඩුසුළඟට යන මඟහැර; අනුවාතං ගන්තබ්බං, යට සුළඟට යායුතු; සචෙ, ඉදින්; අනුවාතමග්ගෙන න සක්කා හොති ගන්තුං, යට සුළඟට යන මඟින් යන්නට නොපිළිවන්වීනම්; අන්තරා, අතුරෙහි; පපාතො වා, ප්‍රපාතයෙක් හෝ; පබ්බතො වා, පර්වතයෙක් හෝ; පාසාණො වා, පහණෙක් හෝ; වති වා, වැටෙක් හෝ; කණ්ටකාධානං වා, කටුඇති තැනෙක් හෝ; උදකං වා, දියෙක් හෝ; චික්ඛල්ලං වා, බොරෙක් හෝ; හොති, වේද; චීවරකණ්ණෙන, සිවුරු කණින්; නාසං පිදහිත්වා, නාසාව පියා; ගන්තබ්බං, යායුතු; ඉදං, මේ; අස්ස, මේ යොගීහිගේ; ගමනවත්තං, ගමනෙහි වත්; එවං ගතෙන පන, මෙසේ ගියාවූ ඒ යොගීහි විසින්; න තාව අසුභනිමිත්තං ඔලොකෙතබ්බං, තම අශුභනිමිත්තය නොබැලියයුතු; දිසා වවත්ථපෙතබ්බා, දිශාහු නියමකටයුත්තාහුයි; එකස්මිං හි දිසාභාගෙ ඨිතස්ස, එක්

භාගෙ ඨිතස්ස ආරම්මණඤ්ච න විභූතං හුත්වා ඛායති, චිත්තඤ්ච න කම්මනියං හොති, තස්මා තං වජ්ජෙත්වා යත්ථ ඨිතස්ස ආරම්මණඤ්ච විභූතං හුත්වා ඛායති, චිත්තඤ්ච කම්මනියං හොති, තත්ථ ඨාතබ්බං. පටිවාතානුවාතඤ්ච පහාතබ්බං, පටිවාතෙ ඨිතස්ස හි කුණපගන්ධෙන උබ්බාළ්හස්ස චිත්තං විධාවති. අනුවාතෙ ඨිතස්ස සචෙ තත්ථ අධිවත්ථා අමනුස්සා හොන්ති, තෙ කුජ්ඣිත්වා අනත්ථම්පි කරොන්ති, තස්මා ඊසකං උක්කම්ම නාති අනුවාතෙ ඨාතබ්බං. එවං තිට්ඨමානෙනාපි නාතිදූරෙ නාච්චාසන්නෙ නානුපාදං නානුසීසං ඨාතබ්බං. අතිදූරෙ ඨිතස්ස හි ආරම්මණං අවිභූතං හොති, අච්චාසන්නෙ භයං උප්පජ්ජති, අනුපාදං වා අනුසීසං වා ඨිතස්ස සබ්බං අසුභං සමං න පඤ්ඤායති, තස්මා නාතිදූරෙ නාච්චාසන්නෙ ඔලොකෙන්තස්ස ඵාසුකට්ඨානෙ සරීර

---

දිශාභාගයෙක්හි සිටියාවූ හට; ආරම්මණඤ්ච න විභූතං හුත්වා ඛායති, අරමුණද විභූතව නොවැටහෙයි; චිත්තඤ්ච න කම්මනියං හොති, සිතද භාවනාකර්මයට ක්ෂමනොවෙයි; තස්මා, එහෙයින්; තං වජ්ජෙත්වා, ඒ දිග හැර; යත්ථ ඨිතස්ස, යම් දිගක සිටියාවූ හට; ආරම්මණඤ්ච විභූතං හුත්වා ඛායති, අරමුණද විභූතව වැටහේද; චිත්තඤ්ච කම්මනියං හොති, සිතද කර්මණ්‍ය වේද; තත්ථ, එහි; ඨාතබ්බං, සිටිය යුතුය; පටිවාතානු වාතඤ්ච පහාතබ්බං, ප්‍රතිවාත අනුවාත දෙකද හැරියයුතු; (වාතයට මුහුණලාද පිටිපාද නොසිටිය යුතුය යන අර්ථයි.) පටිවාතෙ ඨිතස්ස, වාතයට මුහුණ ලා සිටියවුහට, කුණපගන්ධෙන උබ්බාළ්හස්ස, කුණපගන්ධයෙන් බාධිතය හට; චිත්තං, සිත; විධාවති, (නන් අරමුණෙහි) විසිර පවතී; (වාතයට මුහුණලා සිටියවුහට කුණපය උඩුසුළං වනබැවින් "කුණපගන්ධෙන බාධිතස්ස" යුහු.) අනුවාතෙ ඨිතස්ස, වාතයට අනුව සිටියාවූ හට; (වාතයට පිටිපාශවයට මුහුණු ලා සිටියාහට යන අර්ථයි.) සචෙ, ඉදින්; තත්ථ අධිවත්ථා අමනුස්සා හොන්ති, ඒ කුණපයෙහි අධිගෘහීත අමනුෂ්‍යයෝ වූනම්; තෙ, ඔහු; කුජ්ඣිත්වා අනත්ථම්පි කරොන්ති, (තමනට උඩුසුළඟ සිටිබැවින්) කිපී අනර්ථද කරන්නාහුයි; තස්මා, එහෙයින්; ඊසකං උක්කම්ම, (ඉඳුරා) මදක් අනුවාතයෙන් පහව; නාති අනුවාතෙ ඨාතබ්බං, මදක් අනුවාතයෙහි සිටියයුතුය යන අභිප්‍රායි; එවං තිට්ඨමානෙනාපි, මෙසේ සිටියහු විසිනුදු; නාතිදූරෙ ඨාතබ්බං, ඉතා දුරැවද නොසිටියයුතු; නාච්චාසන්නෙ ඨාතබ්බං, ඉතා ආසන්නයෙහිදු; නොසිටියයුතු; නානුපාදං ඨාතබ්බං, පාදයට සමීපයෙහිදු නොසිටියයුතු; නානුසීසං ඨාතබ්බං, හිසට සමීපයෙහිදු නොසිටියයුතු; අතිදූරෙ ඨිතස්සහි, ඉතා දුරසිටියහට; ආරම්මණං අවිභූතං හොති, අරමුණු පහළනොවේ; අච්චාසන්නෙ, ඉතා ආසන්නයෙහි (සිටියාහට); භයං උප්පජ්ජති, භය උපදී; අනුපාදං වා අනුසීසං වා ඨිතස්ස, පයට සමීපව හිසට සමීපව සිටියාහට; සබ්බං අසුභං සමං න පඤ්ඤායති, සියලු අශුභය සමව නොපැනේ; තස්මා, එහෙයින්; නාතිදූරෙ නාච්චාසන්නෙ, ඉතා නුදුරු ඉතා නොලඟ; ඔලොකෙන්තස්ස ඵාසුකට්ඨානෙ, බලනුව හට

වෙමජ්ඣභාගෙ ඨාතබ්බං. එවං ඨිතෙන "තස්මිං පදෙසෙ පාසාණං වා …පෙ… ලතං වා සනිමිත්තං කරොති" ති එවං වුත්තානි සමන්තා නිමිත්තානි උපලක්ඛෙතබ්බානි. තත්‍රිදං උපලක්ඛණවිධානං:-සචෙ තස්ස නිමිත්තස්ස සමන්තා චක්ඛුපථෙ පාසාණො හොති, සො අයං පාසාණො උච්චො වා නීචො වා ඛුද්දකො වා මහන්තො වා තම්බො වා කාළො වා සෙතො වා දීඝො වා පරිමණ්ඩලො වාති වවත්ථපෙතබ්බො. තතො ඉමස්මිං නාම ඔකාසෙ අයං පාසාණො ඉදං අසුභනිමිත්තං, ඉදං අසුභනිමිත්තං අයං පාසාණොති සල්ලක්ඛෙතබ්බං…

(අ) සචෙ වම්මිකො හොති, සොපි උච්චො වා නීචො වා ඛුද්දකො වා මහන්තො වා තම්බො වා කාළො වා දීඝො වා පරිමණ්ඩලො වාති වවත්ථපෙතබ්බො. තතො ඉමස්මිං නාම ඔකාසෙ අයං වම්මිකො ඉදං අසුභනිමිත්තන්ති සල්ලක්ඛෙතබ්බං. සචෙ රුක්ඛො හොති, සොපි අස්සත්ථො වා නිග්‍රොධො වා කච්ඡකො වා කපිත්ථකො වා උච්චො වා නීචො වා ඛුද්දකො වා මහන්තො වා කාළො වා සෙතො වාති වවත්ථපෙතබ්බො. තතො ඉමස්මිං නාම ඔකාසෙ අයං රුක්ඛො ඉදං අසුභනිමිත්තන්ති සල්ලක්ඛෙතබ්බං. සචෙ ගච්ඡො හොති සොපි

---

ඨාසුතැන; සරීරවෙමජ්ඣභාගෙ, ශරීරයාගේ මැද භාගයෙහි; ඨාතබ්බං, සිටියයුතු; එවං ඨිතෙන. එසේ සිටියහු විසින්; තස්මිං පදෙසෙ, ඒ ප්‍රදෙශයෙහි; පාසාණං වා, පහණක්වත්; ලතං වා; ලියෙක්වත්;- උපලක්ඛෙතබ්බානි, සැලකියයුත්තාහුය; තත්‍ර, එහි; ඉදං, මේ, උපලක්ඛණවිධානං, සලකන විධියි; සචෙ, ඉදින්; තස්ස නිමිත්තස්ස, ඒ උද්ධුමාතක නිමිත්තහට; සමන්තා, හාත්පස්හි; චක්ඛුපථෙ, ඇස් හමුයෙහි, පාසාණො හොති, පහණෙක්වී නම්; සො අයං පාසාණො, ඒ මේ පහණ; උච්චො වා, උසැයි හෝ; නීචො වා, මිටියයි හෝ; ඛුද්දකො වා, කුඩායයි හෝ; මහන්තො වා මහතැයි හෝ; තම්බො වා, තඹයයි හෝ; කාළො වා, කළුයයි හෝ; සෙතො වා, සුදුයයි හෝ දීඝො වා, දිගැයි හෝ; පරිමණ්ඩලො ව, පිරිමඬුලුයි හෝ; වවත්ථපෙතබ්බො, නියමකටයුතු; තතො, ඉක්බිත්තෙන්; ඉමස්මිං නාම ඔකාසෙ, මෙනම් අවකාශයෙහි; අයං පාසාණො. මේ පහණය; ඉදං අසුභනිමිත්තං, මේ අශුභනිමිත්තය;-අයං පාසාණො, මේ පහණයයි; සල්ලක්ඛෙතබ්බං, සැලකියයුතු…

(අ) සචෙ වම්මිකො හොති, ඉදින් තුඹසක්වී නම්; උච්චො වා, උසැයි හෝ; නීචො වා, මිටියයි හෝ; ඛුද්දකො වා, කුඩායයි හෝ; මහන්තො වා, මහතැයි හෝ; තම්බො වා, තඹයයි හෝ; කාළො වා; කළුයයි හෝ; දීඝො වා, දිගැයි හෝ; පරිමණ්ඩලො වා, වටැයි හෝ; වවත්ථපෙතබ්බො, නිශ්චයකටයුතු; …පෙ… සචෙ රුක්ඛො හොති, ඉදින් රුක්ෂයෙක්වී නම්; සොපි, හෙද; අස්සත්ථො වා, ඇසතුයෙකැයි හෝ; නිග්‍රොධො වා, නුගයෙකැයි හෝ; කච්ඡකො වා, කළුසුවෙකැයි හෝ; කපිත්ථකො වා, දිවුලුවෙකැයි හෝ …පෙ… සචෙ ගච්ඡො

සින්දී වා කරමන්දෝ වා කණවීරෝ වා කුරණ්ඩකෝ වා උළෙවා වා නීපෝ වා බුද්දකෝ වා මහන්තෝ වාති වවත්ථපෙතබ්බෝ. තතෝ ඉමස්මිං නාම ඔකාසේ අයං ගච්ඡෝ ඉදං අසුභනිමිත්තන්ති සල්ලක්ඛෙතබ්බං. සචේ ලතා හෝති, සාපි ලාබු වා කුම්භණ්ඩී වා සාමා වා කාළවල්ලී වා පූතිලතා වාති වවත්ථපෙතබ්බා. තතෝ ඉමස්මිං නාම ඔකාසේ අයං ලතා ඉදං අසුභනිමිත්තං ඉදං අසුභනිමිත්තං අයං ලතාති සල්ලක්ඛෙතබ්බං යං පන වුත්තං සනිමිත්තං කරෝති සාරම්මණං කරෝතීති, තං ඉධේව අනෝගධං. පුනප්පුනං වවත්ථපෙන්තෝ හි සනිමිත්තං කරෝති නාම. අයං පාසාණෝ ඉදං අසුභනිමිත්තං, ඉදං අසුභනිමිත්තං අයං පාසාණෝති එවං වෙ වෙ සමාසෙත්වා සමාසෙත්වා වවත්ථපෙන්තෝ සාරම්මණං කරෝති නාම. එවං සනිමිත්තං සාරම්මණඤ්ච කත්වා පන සභාවභාවතෝ වවත්ථපෙතීති වුත්තත්තා ය්වාස්ස සභාවභාවෝ අනඤ්ඤසාධාරණෝ අත්තනි යෝ උද්ධුමාතකභාවෝ, තේන මනසිකාතබ්බං. වනීතං උද්ධුමාතකන්ති එවං සභාවේන සරසේන වවත්ථපෙතබ්බන්ති අත්ථෝ. එවං වවත්ථපෙත්වා වණ්ණතෝපි ලිඞ්ගතෝපි

---

හෝති, ඉදින් ගසෙක් හෝ වී නම්; සෝපි, හෙද; සින්දී වා, හිඳෙකැයි හෝ; කරමන්දෝ වා, කරඹගසෙකැයි හෝ; කණවීරෝ වා, කණේරුවෙකැයි හෝ; කුරණ්ඩකෝ වා, කටුකරඹුවෙකැයි හෝ; ...පෙ... සචේ ලතා හෝති, ඉදින් ලියයෙක් වී නම්; සාපි, හේද; ලාබු වා, ලබුයයි හෝ; කුම්භණ්ඩී වා, කොමඩුයයි හෝ; සාමා වා, පූඩායයි හෝ; කාළවල්ලී වා කළුවැලයයි හෝ; පූතිලතා වා, කිඳියයි හෝ ...පෙ...[1] අයං පාසාණෝ, මේ පහණය; ඉදං අසුභනිමිත්තං, මේ අශුභනිමිත්ත; අයං පාසාණෝ, මේ පහණයයි; වෙ වෙ සමාසෙත්වා සමාසෙත්වා, පහණ අශුභනිමිත් යන දෙදෙනෙක් දෙදෙනෙක් එක්කොට; වවත්ථපෙන්තෝ, නියමකරන්නහු විසින්; (සමන්තා නිමිත්තානි උපලක්ඛෙතබ්බානි, හාත්පස්හි නිමිත්හු සැලකියයුත්තාහුයි; තතෝ, ඉක්බිත්තෙන්; අස්ස, මේ අශුභනිමිත්හුගේ; ("සෝ සභාවභාවෝ"යි පොත්හි ලියති. සභාගභාවෝතු, මාහැගිවී බවයි සන්නයෙහි කී බැවින් "සභාගභාවෝ" යනු මැනවි එහෙයින් "සෝ සභාගභාවෝ" යන අර්ථයි. යම් තමාගේ සභාගබවෙක් ඇද්ද කෙසේවූදයත්?) අනඤ්ඤ සාධාරණෝ, අන් විනීලකාදීන්ට අසාධාරණවූ; අත්තනි යෝ උද්ධුමාතකභාවෝ, තමාගේ යම් ඉදිමුණුබවෙක් ඇද්ද; තේන මනසිකාතබ්බං, ඒ ඉදිමුණු සටහන් විසින් මෙනෙහි කටයුතු; වනීතං උද්ධුමාතකන්ති, වනීතය උද්ධුමාතකයයි; (වනීතං යනු උද්ධුමාතකය යන අර්ථයි. "වනීතකන්ති සූනං" යනු ටීකායි.) එවං සභාවේන, (ඉදිමුණුබවයයි කියනලද) තමාගේ ලකුණෙන්ද; සරසේන (අනුන්ට පිළිකුල් උපයනබවය යන) තමාගේ කෘත්‍යයෙන්ද; (නොහොත් සවභාවයනු පිළිකුල් බැවින් රසයයි කියනු ලැබේ. **"සභාවෝ එව තස්ස නිස්සජ්ජනතෝ රසෝති වුත්තෝ"** යනු ටීකායි. වවත්ථපෙතබ්බන්ති අත්ථෝ, නියමකටයුතුය යන අර්ථයි; එවං වවත්ථ

---

1 ඉමිනාවනයෙන, මෙම නයින්:-සන්න.

සණ්ඨානතොපි දිසතොපි ඔකාසතොපි පරිච්ඡෙදතොපීති ඡබ්බිධෙන නිමිත්තං ගහෙතබ්බං. කථං? තෙනහි යොගිනා ඉදං සරීරං කාළස්ස වා ඔදාතස්ස වා මඞ්ගුරච්ඡවිනො වාති වණ්ණතො වවත්ථපෙතබ්බං.

(අ) ලිඞ්ගතො පන ඉත්ථිලිඞ්ගං වා පුරිසලිඞ්ගං වාති අවවත්ථපෙත්වා පඨමවයෙ වා මජ්ඣිමවයෙ වා පච්ඡිමවයෙ වා ඨිතස්සාති වවත්ථපෙතබ්බං සණ්ඨානතො උද්ධුමාතකසණ්ඨානවසෙනෙව ඉදමස්සසීස සණ්ඨානං ඉදං, ගීවාසණ්ඨානං, ඉදං හත්ථසණ්ඨානං, ඉදං උදරසණ්ඨානං, ඉදං නාභි සණ්ඨානං, ඉදං කටිසණ්ඨානං, ඉදං ඌරුසණ්ඨානං, ඉදං ජඞ්ඝාසණ්ඨානං, ඉදං පාදසණ්ඨානන්ති වවත්ථපෙතබ්බං. දිසතො පන ඉමස්මිං සරීරෙ ද්වෙ දිසා නාභියා අධො හෙට්ඨිමාදිසා උද්ධං උපරිමාදිසාති වවත්ථපෙතබ්බං, අථවා අහං ඉමිස්සා දිසාය ඨිතො අසුභ

---

පෙත්වා, මෙසේ නියම නොකොට; වණ්ණතොපි, වර්ණහෙයින්ද; ලිඞ්ගතොපි, ලිඞ්ගහෙයින්ද; සණ්ඨානතොපි, සටහන් හෙයින්ද; දිසතොපි දිසාහෙයින්ද; ඔකාසතොපි, අවකාශහෙයින්ද; පරිච්ඡෙදතොපි, පිරිසෙ හෙයින්දැයි; ඡබ්බිධෙන, සපරිද්දෙකින්; නිමිත්තං ගහෙතබ්බං උද්ධුමාතක අශුභනිමිත් ගතයුතු; කථං, කෙසේදයත්? තෙන යොගිනා, ඒ යොගීහු විසින්; ඉදං සරීරං, මේ සිරුර; කාළස්ස වා, කළුවක්හුගේයයි හෝ; ඔදාතස්ස වා, හෙළුවක්හුගේයයි හෝ; මඞ්ගුරච්ඡවිනො වාති, මගුරන්වැනි ඡවි ඇත්තියක්හුගේයයි හෝ; වණ්ණතො, වර්ණවිසින්; වවත්ථපෙතබ්බං, නියම කටයුතුය.

(අ) ලිඞ්ගතො පන, ලිඟුහෙයින් වනාහි; ඉත්ථිලිඞ්ගං වා, මාගම්ලිඟු යයි හෝ; පුරිසලිඞ්ගං වා, පිරිමිලිඟුයයි හෝ; අවවත්ථපෙත්වා, නියම නොකොට; පඨමවයෙ වා, පළමුවියෙහි හෝ; මජ්ඣිමවයෙ වා, මැදුම්වියෙහි හෝ; පච්ඡිමවයෙ වා, පැසුම්වියෙහි හෝ; ඨිතස්සාති, සිටියහුගේයයි; වවත්ථපෙතබ්බං, නියමකටයුතු; සණ්ඨානතො, සටහන්හෙයින්; උද්ධුමාතකසණ්ඨානවසෙන, උද්ධුමාතක අශුභ සටහන් විසින්ම; ඉදං, මේ; අස්ස, මොහුගේ; සීසසණ්ඨානං, ඉස සටහන; ඉදං, මේ; ගීවාසණ්ඨානං, ග්‍රීවයෙහි සටහන; ඉදං මේ; හත්ථ සණ්ඨානං, අතසටහන; ඉදං උදරසණ්ඨානං, මේ උදරසටහන; ඉදං නාභිසණ්ඨානං, මේ නාභිසටහන; ඉදං කටිසණ්ඨානං, මේ කටියෙහි සටහන; ඉදං ඌරුසණ්ඨානං, මේ කලවෙහි සටහන; ඉදං ජඞ්ඝා සණ්ඨානං, මේ ජඞ්ඝාවෙහි සටහන; ඉදං පාදසණ්ඨානන්ති, මේ පත්ළෙහි සටහනැයි; වවත්ථපෙතබ්බං, ව්‍යවස්ථාකටයුතු; දිසතො පන, දික්හෙයින් වනාහි; ඉමස්මිං සරීරෙ, මේ ශරීරයෙහි; ද්වෙ දිසා, දික්හු දෙදෙනෙකි; නාභියා අධො, නාභියෙන් යට; හෙට්ඨිමා දිසා, හෙට්ඨිමදික්නම් වේ; උද්ධං, මත්ත; උපරිමා දිසාති, උපරිමදික්නම් වෙයි; වවත්ථපෙතබ්බං, නියමකටයුතු; අථවා, නොහොත්; අහං ඉමිස්සා දිසාය ඨිතො, මම මේ දිග සිටියෙමි; අසුභනිමිත්තං ඉමිස්සාති, අශුභනිමිත්ත මේ දිගයයි; වවත්ථපෙතබ්බං, නිශ්චයකටයුතු;- ඔකාස

නිමිත්තං ඉමස්සාති වවත්ථපෙතබ්බං. ඔකාසතො පන ඉමස්මිං නාම ඔකාසෙ හත්ථො, ඉමස්මිං පාදො, ඉමස්මිං සීසං, ඉමස්මිං මජ්ඣිමකායො ඨිතොති වවත්ථපෙතබ්බං. අථවා අහං ඉමස්මිං ඔකාසෙ ඨිතො අසුභනිමිත්තං ඉමස්මින්ති වවත්ථපෙතබ්බං. පරිච්ඡෙදතොපි ඉදං සරීරං අධො පාදතලෙන උපරි කෙසමත්ථකෙන තිරියං තචෙන පරිච්ඡින්නං, යථා පරිච්ඡින්නෙ ච ඨානෙ ද්වත්තිංසකුණපභරිතමෙවාති වවත්ථපෙතබ්බං. අථ වා අයමස්ස හත්ථපරිච්ඡෙදො, අයං පාදපරිච්ඡෙදො. අයං සීසපරිච්ඡෙදො අයං මජ්ඣිමකායපරිච්ඡෙදොති වවත්ථපෙතබ්බං. යත්තකං වා පන ඨානං ගණ්හාති, තත්තකමෙව ඉදං ඊදිසං උද්ධුමාතකන්ති පරිච්ඡින්දිතබ්බං. පුරිසස්ස පන ඉත්ථිසරීරං ඉත්ථියා වා පුරිසසරීරං න වට්ටති. විසභාගෙ ආරම්මණං න උපට්ඨාති, විප්ඵන්දනස්සෙව පච්චයො හොති. උග්ඝාටිතාපි හි ඉත්ථී පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතී"ති.

---

තො පන, අවකාශයෙහින් වනාහි; ඉමස්මිං නාම ඔකාසෙ, මෙනම් භූමිප්‍රදෙශයෙහි; ("හත්ථො ඨපිතො" යි යොදනු.) අත් තුබූයේ; ඉමස්මිං පාදො, මේ අවකාශයෙහි පා තුබූයේ; ඉමස්මිං සීසං, මේ අවකාශයෙහි හිස් තුබූයේ; ඉමස්මිං මජ්ඣිමකායො ඨිතොති, මේ අවකාශයෙහි මධ්‍යමකාය තුබූයේයයි; වවත්ථපෙතබ්බං, ව්‍යවස්ථාකටයුතු;–පරිච්ඡෙදතොපි, පරිසෙවිසින්ද; ඉදං සරීරං මේ සිරුර; අධො පාදතලෙන, යට පත්ලෙන්ද; උපරි, මතුයෙහි; කෙසමත්ථකෙන, කෙස්මතුයෙන්ද; තිරියං, සරස; තචෙන, සමින්ද; පරිච්ඡින්නං, පිරිසිඳිනාලද්දැයි; යථා පරිච්ඡින්නෙ ච ඨානෙ, යථා පිරිසුන්තන්හි; ද්වත්තිංසකුණපභරිතමෙවාති, දෙතිස්කුණු කොටසින් පිරුණේමයයි; වවත්ථපෙතබ්බං, ව්‍යවස්ථාකටයුතු; අථ වා, නොහොත්; අස්ස, මේ අශුභනිමිත්හුගේ; අයං හත්ථපරිච්ඡෙදො, මේ අත්හි පරිච්ඡෙදය; (යටින් ඇඟිලිඅගින් මත්තෙන් දසරුසඳින් සරස සමින් අත්හි පිරිසෙ දතයුතු-පාද පරිච්ඡෙදදියෙහිදු මෙම නියෙන) අයං, මේ; පාදපරිච්ඡෙදො, පාදයෙහි පරිච්ඡෙදය; අයං, මේ; සීසපරිච්ඡෙදො, හිසපරිච්ඡෙදය; අයං, මේ; මජ්ඣිමකාය පරිච්ඡෙදොති, මැදුම්කාය පරිච්ඡෙදයයි; වවත්ථපෙතබ්බං, ව්‍යවස්ථාකටයුතු; යත්තකං වා පන ඨානං ගණ්හාති, (සිරුර පිරිසිඳගන්නට නොපොහොසත්හු විසින් හෝ නිමිත්හි ප්‍රදෙශයක් ඉදිමුණු බැවින් හෝ) යම් පමණ සිරුරු ප්‍රදෙශයක් උද්ධුමාතක විසින් නුවණින් පිරිසිඳගනීද; තත්තකමෙව, එපමණක්ම; ඉදං උද්ධුමාතකං, මේ අත්පාආදි උද්ධුමාතකය; ඊදිසන්ති, මෙබඳු ආකාරයයි; පරිච්ඡින්දිතබ්බං, පිරිසින්දයුතු; පුරිසස්ස පන, පිරිමිහට වනාහි; ඉත්ථිසරීරං, මාගම් සිරුරද; ඉත්ථියා වා, මාගමට; පුරිසසරීරං, පිරිමි සිරුරද; න වට්ටති, නොවටී; විසභාගෙ, විසභාග සිරුරෙහි; ආරම්මණං න උපට්ඨාති, කමටහන් පිළිකුල් ආකාරය නොවැටහේ (ශුභහෙයින් වැටහේ;) විප්ඵන්දනස්සෙව පච්චයො හොති, කෙලශ පරිස්ඵන්දනයටම නිමිත්වේ; (කෙලෙස් උපතටම කරුණුවේ යන අර්ථයි.) උග්ඝාටිතාපිහි ඉත්ථී, ඉදිමුණු මාගම්ද;(නොහොත් සජීකාර

මජ්ඣිමට්ඨකථායං වුත්තං, තස්මා සභාගසරීරෙයෙව එවං ඡබ්බිධෙන නිමිත්තං ගණ්හිතබ්බං. යො පන පුරිමබුද්ධානං සන්තිකෙ ආසෙවිතකම්මට්ඨානො පරිහටධුතඞ්ගො පරිමද්දිතමහාභූතො පරිග්ගහිතසඞ්ඛාරො වවත්ථාපිතනාමරූපො උග්ඝාටිතසත්තසඤ්ඤො කතසමනධම්මො වාසිතවාසනො භාවිතභාවනො සබීජො ඤාණුත්තරො අප්පකිලෙසො කුලපුත්තො, තස්ස ඔලොකිතඔලොකිතට්ඨානෙයෙව පටිභාගනිමිත්තං උපට්ඨාති. නො චෙ එවං උපට්ඨාති, අථෙවං ඡබ්බිධෙන නිමිත්තං ගණ්හතො උපට්ඨාති. යස්ස පන එවම්පි න උපට්ඨාති, තෙන සන්ධිතො විවරතො නින්නතො ථලතො සමන්තතොති පුනපි

---

යෙන් ඛචිත සිරුරු ඇති මහගම්ද;) පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති, පිරිමිහු සිත්ගෙන සිටිතියයි; මජ්ඣිමට්ඨකථායං වුත්තං, මැදුම්සඟි අටුවායෙහි කියනලද; තස්මා, එහෙයින්; සභාගසරීරෙයෙව, සභාග සිරුරෙහිම; එවං, මෙසේ; ඡබ්බිධෙන නිමිත්තං ගණ්හිතබ්බං, මේ සආකාරයෙන් නිමිත් ගතයුතු;("යො පන" යනු මතුයෙහි "කුලපුත්තො" යනු හා යොදනු.) පුරිමබුද්ධානං සන්තිකෙ, පෙර බුදුන් සමීපයෙහි; ආසෙවිතකම්මට්ඨානො, පුරුදුකරනලද අශුභ කම්මස්ථාන ඇතිවූ; (හැම කමටහන් සාමාන්‍ය විසින් කීහ යනු සත්‍යයි.) පරිහටධුතඞ්ගො, (සොසානිකාඞ්ග ආදි විසින්) පරිහරණය කරනලද ධුතාඞ්ගඇතිවූ; පරිමද්දිතමහාභූතො, පිරිමදනාලද මහාභූතයන් ඇතිවූ; පරිග්ගහිතසඞ්ඛාරො, (සවලක්ෂණ විසින් නුවණින්) පරිග්‍රහකරනලද සංස්කාරයන් ඇතිවූ; වවත්ථාපිත නාමරූපො, (ප්‍රත්‍යය පරිග්‍රහ විසින්) ව්‍යවස්ථාකරනලද නම් රූ ඇතිවූ, උග්ඝාටිත සත්තසඤ්ඤො, (ලක්ෂණාලම්බනික විදර්ශනාවගෙන් උත්කර්ෂයට යාමෙන්වූ ශූන්‍යතානුදර්ශනා බෙලෙන්) උගුළුවනලද සත්වසංඥා ඇතිවූ; කතසමණධම්මො, (විදර්ශනාප්‍රතිප්‍රතිපදාඥානදර්ශනයට පැමිණවීමෙන්) කරනලද මහණදම් ඇතිවූ; වාසිතවාසනො භාවිතභාවනො, (කළ මහණදම් ඇතිබැවින් හැමසෙයින්ම කුසලවාසනාවද කුසලභාවනාවද පිරීමෙන්) පරිභාවිත කුසලවාසනා ඇති-වඩනලද කුශලභාවනා ඇති; සබීජො, (නිවණට උපනිශ්‍රයවූ කුශලබීජ ඇතිබැවින්) සබීජවූ; ඤාණුත්තරො (මුහුකළ නුවණඇති බැවින්) අධික නුවණ ඇතිවූ; අප්පකිලෙසො, (යථොක්ත පිළිවෙතින්ම) තුනු කෙලෙසුන් ඇති; යො පන කුලපුත්තො, යම් කුලපුත්‍රයෙක් ඇද්ද; තස්ස, ඔහට; ඔලොකිත ඔලොකිතට්ඨානෙයෙව, බැලූ බැලූ තැන්හිම; පටිභාගනිමිත්තං උපට්ඨාති, ප්‍රතිභාගනිමිත් වැටහේ; නො චෙ එවං උපට්ඨාති, එසේ නොද වැටහේනම්; අථ, නැවත; එවං ඡබ්බිධෙන නිමිත්තං ගණ්හතො, මෙසේ කියනලද වර්ණාදිසපරිද්දෙන් නිමිත්ගන්නහුට; උපට්ඨාති, වැටහේ; යස්ස පන, යමක්හට වනාහි; එවම්පි න උපට්ඨාති, මෙසේ සපරිද්දෙකින් මෙනෙහිකරණුව හටද නොවැටහේ නම්; තෙන ඒ යොගිහි විසින්; සන්ධිතො, සන්ධිහෙයින්; විවරතො, විවරහෙයින්; නින්නතො, වළහෙයින්; ථලතො, ගොඩහෙයින්; සමන්තතො, හාත්

පඤ්චවිධෙන නිමිත්තං ගහෙතබ්බං. තත්‍ථ සන්‍ධිතොති-අසීති සත සන්‍ධිතො, උද්ධුමාතකෙ පන කථං අසීති සත සන්‍ධියො වවත්‍ථපෙස්සති, තස්මා තෙන තයො දක්‍ඛිණහත්‍ථසන්‍ධී, තයො වාමහත්‍ථසන්‍ධී තයො දක්‍ඛිණපාදසන්‍ධී, තයො වාමපාදසන්‍ධී, එකො ගීවාසන්‍ධී, එකො කටිසන්‍ධීති එවං චුද්දස මහාසන්‍ධි වසෙන සන්‍ධිතො වවත්‍ථපෙතබ්බං..

(අ) විවරතොති විවරං නාම හත්‍ථන්තරං පාදන්තරං උදරන්තරං කණ්ණන්තරන්ති එවං විවරතො වවත්‍ථපෙතබ්බං. අක්‍ඛීනම්පි නිමීලිතභාවො වා උම්මීලිතභාවො වා මුඛස්ස ච පිදහිතභාවො වා විවට භාවො වා වවත්‍ථපෙතබ්බො. නින්නතොති යං සරීරෙ නින්නට්ඨානං

---

පසතැයි; ඉති, මෙසේ; පුනපි, නැවතද; පඤ්චවිධෙන නිමිත්තං ගහෙතබ්බං, පස් පරිද්දෙකින් නිමිත් ගතයුතු; තත්‍ථ, ඒ පඤ්චවිධ නයෙහි; සන්‍ධිතොති, සන්‍ධිහෙයිනැයි සේයි; අසීති සත සන්‍ධිතො, එක්සියඅසූසන්‍ධි විසිනි; උද්ධුමාතකෙ පන, උද්ධුමාතක අශුභයෙහි වනාහි; කථං අසීතිසතසන්‍ධියො වවත්‍ථපෙස්සති, කෙසේ එක්සියඅසූ සන්‍ධීන් නියමකෙරේද; (ඉදිමුණු බැවින් බොහෝසේ සන්‍ධිහු නො පැනෙත්නුයි එක්සියඅසූසන්‍ධීන් නොනියමකොට හැක්ක;) තස්මා, එහෙයින්; අනෙන, මේ යොගීහිවිසින් (වවත්‍ථපෙතබ්බං”යි යොදනු.) තයො දක්‍ඛිණහත්‍ථසන්‍ධී, (දසරුවෙහි සන්‍ධියය වැලමිටසන්‍ධියය මණි බඬයෙහි සන්‍ධියයි) දකුණත සන්‍ධිහු තුන්දෙනෙකි; තයො වාමහත්‍ථ සන්‍ධී, වමතසන්‍ධිහුද එසේම තුන්දෙනෙකි; තයො දක්‍ඛිණපාදසන්‍ධී, (කටිසන්‍ධියය දණසන්‍ධියය බොලට සන්‍ධියය) දකුණුපය සන්‍ධිහු තුන්දෙනෙකි; තයො වාමපාදසන්‍ධී, වම්පය සන්‍ධිහුද එසේම තුන් දෙනෙකි; එකො ගීවාසන්‍ධී, එක්ග්‍රීවායෙහි සන්‍ධියෙක; එකො කටිසන්‍ධීති, (පිටකටුව කටියෙහි පිටතැන එක්තුවනතැන) කටිසන්‍ධි යෙකැයි; එවං, මෙසේ; චුද්දස මහාසන්‍ධිවසෙන, තුදුස් මහාසන්‍ධීන්ගේ වශයෙන්; සන්‍ධිතො වවත්‍ථපෙතබ්බං, සන්‍ධිහෙයින් නියමකටයුතු..

(අ) විවරතොති, විවරතො යන්නෙහි; විවරං නාම, විවරනම්; හත්‍ථන්තරං, දකුණත් දකුණැල දෙදෙනාගේද අතුරය වමත්වමැල දෙදෙනාගේද අතුරය; පාදන්තරං, දෙපා අතුරය; උදරන්තරං, බඩ හා පෙකණිඅතුරය; (උදර ඇතුළ හෝ) කණ්ණන්තරන්ති, කන් සිදුරයයි; එවං විවරතො වවත්‍ථපෙතබ්බං, මෙසේ විවරහෙයින් නියම කටයුතු; (ඉතිශබ්දය ආද්‍යර්ථබැවින් එයින් නාසාසිදුරු ආදීන්ගේ සඞ්ග්‍රහය දතයුතු.) අක්‍ඛිනම්පි, දෙඇසද; නිම්මීලිතභාවො වා, පිසී තුබූබව හෝ; උම්මීලිතභාවො වා, දල්වී තුබූබව හෝ; මුඛස්ස ච, මුඛයාගේද; පිදහිතභාවො, පිසීතුබූබවද; විවටභාවො වා, විවෘතව තුබූබවද; වවත්‍ථපෙතබ්බො, ව්‍යවස්ථාකටයුතු; නින්නතොති “නින්නතො” යන්නෙහි; සරීරෙ, සිරුරෙහි; අක්‍ඛිකූපො වා, ඇස්වළ හෝ අන්තො මුඛං වා, ඇතුළුමුඛය හෝ; කණ්ඨාවාටකො වා; ගලවළව

අක්ඛිකූපො වා අන්තො මුඛං වා ගලවාටකො වා, තං වවත්ථපෙතබ්බං, අථ වා:- අහං නින්නෙ ඨිතො සරීරං උන්නතන්ති වවත්ථපෙතබ්බං. ථලතොති. යං සරීරෙ උන්නතට්ඨානං ජණ්ණුකං වා උරො වා නලාටං වා, තං වවත්ථපෙතබ්බං. අථවා:- අහං ථලෙ ඨිතො සරීරං නින්නන්ති වවත්ථපෙතබ්බං. සමන්තතොති-සබ්බං සරීරං සමන්තතො වවත්ථපෙතබ්බං. සකලසරීරෙ ඤාණං චාරෙත්වා යං ඨානං විභූතං හුත්වා උපට්ඨාති, තත්ථ උද්ධුමාතකන්ති චිත්තං ඨපෙතබ්බං සචෙ එවම්පි න උපට්ඨාති, උදරපරියොසානං අතිරෙකඋද්ධුමාතකං හොති, තත්ථ උද්ධුමාතකං උද්ධුමාතකන්ති චිත්තං ඨපෙතබ්බං.

(අ) ඉදානි "සො තං නිමිත්තං සුග්ගහිතං කරොති" ආදිසු අයං විනිච්ඡයකථා:-එවං තෙන යොගිනා තස්මිං සරීරෙ යථා වුත්ත නිමිත්තග්ගාහවසෙන සුට්ඨු නිමිත්තං ගහෙතබ්බං, සතිං සුපට්ඨිතං කත්වා ආවජ්ජි

---

හෝ යන; යං නින්නට්ඨානං, යම් වළතැනක් ඇද්ද; තං, හේ; වවත්ථපෙතබ්බං, නියමකටයුතු; අථවා, නොහොත්; අහං නින්නෙ ඨිතො, මම වළතැන සිටියෙමි; සරීරං උන්නතන්ති, සිරුර ගොඩ තැන්හියයි; වවත්ථපෙතබ්බං, නියමකටයුතු; ථලතොති, ථලතො යන්නෙහි; සරීරෙ, සිරුරෙහි; ජණ්ණුකං වා, දණ හෝ; උරො වා, ළය හෝ; නලාටං වා, නළල හෝ; යං උන්නතට්ඨානං, යම් උස් තැනෙක් ඇද්ද; තං, හේ; වවත්ථපෙතබ්බං, නියමකටයුතු; අථවා, නොහොත්; අහං, මම; ථලෙ ඨිතො, ගොඩ සිටියෙමි; සරීරං, සිරුර; නින්නන්ති, මිටිතැනයයි; වවත්ථපෙතබ්බං, නියමකටයුතු; සමන්තතොති, "සමන්තතො" යන්නෙහි; සබ්බං සරීරං, සියලු සිරුර; සමන්තතො වවත්ථපෙතබ්බං, හාත්පසින් නියමකටයුතු (මෙසේ සන්ධි විවරාදීන් විසින් උද්ධුමාතකය නියමකරන්නාහට ඉදින් නිමිත් උපන්නම් යෙහෙක නො එසේවී නම් හාත්පසින් නියමකට යුතුයයි නියමකරන විධි දක්වනපිණිස "සකලසරීරෙ" යනාදි කීහු.) සකලසරීරෙ, සියලු සිරුරෙහි; ඤාණං, නුවණ; චාරෙත්වා; හසුරුවා (ඒ සිරුරෙහි පිළිකුල්ආකාර සහිත උද්ධුමාතකභාවය අරමුණුකොට නිරන්තරයෙන් භාවනාඤාණය හසුරුවා යන අර්ථයි.) යං ඨානං, යම් තැනෙක්; විභූතං හුත්වා උපට්ඨාති, (උද්ධුමාතකාකාරයෙන්)පහළව වැටහේද; තත්ථ, එහි; උද්ධුමාතකන්ති චිත්තං ඨපෙතබ්බං, උද්ධුමාතකයයි සිතපිහිටවියයුතු; සචෙ, ඉදින්; එවම්පි න උපට්ඨාති, මෙසේ සිත් එළවන්නාහටද නොවැටහේ නම්, උදරපරියොසානං, උදරකෙළවර කොට ඇති, (උපරිම ශරීරය); අතිරෙක උද්ධුමාතකං හොති, අධිකව ඉදිමෙන්නේය; තත්ථ, එහි; උද්ධුමාතකං උද්ධුමාතකන්ති චිත්තං ඨපෙතබ්බං, උද්ධුමාතකය උද්ධුමාතකයයි සිත තිබියයුතු.

(අ) එවං, මෙසේ; තෙන යොගිනා, ඒ යොගීහිවිසින්; තස්මිං සරීරෙ, ඒ සිරුර; යථා වුත්තනිමිත්තග්ගාහවසෙන, (වර්ණාදිවිසින්ද සන්ධිවිවරාදිවිසන්ද) කියනලද ප්‍රකාර ඇති උද්ධුමාතක නිමිත්ත ග්‍රාහවශයෙන්; සුට්ඨුනිමිත්තං ගහෙතබ්බං, මනාකොට උද්ග්‍රහනිමිත්

තබ්බං, එවං පුනප්පුනං කරොන්තෙන සාධුකං උපධාරෙතබ්බඤ්චෙව වවත්ථපෙතබ්බඤ්ච. ශරීරතො නාතිදූරෙ නාච්චාසන්නෙ පදෙසෙ ඨිතෙන වා නිසින්නෙන වා චක්ඛුං උම්මීලෙත්වා ඔලොකෙත්වා නිමිත්තං ගණ්හිතබ්බං, උද්ධුමාතකපටික්කූලං උද්ධුමාතකපටික්කූලන්ති සතක්ඛත්තුං සහස්සක්ඛත්තුම්පි උම්මීලෙත්වා ඔලොකෙතබ්බං, නිම්මීලෙත්වා ආවජ්ජිතබ්බං. එවං පුනප්පුනං කරොන්තස්ස උග්ගහනිමිත්තං සුග්ගහිතං හොති. කදා සුග්ගහිතං හොති? යදා උම්මීලෙත්වා ඔලොකෙන්තස්ස නිම්මීලෙත්වා ආවජ්ජෙන්තස්ස ච එකසදිසං හුත්වා ආපාථං ආගච්ඡති, තදා සුග්ගහිතං නාම හොති සො තං නිමිත්තං එවං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා සුවවත්ථිතං වවත්ථපෙත්වා

---

උපදනාසේ) අශුභනිමිත් ගතයුතු; සතිං සූපට්ඨිතං කත්වා, සතිය මනාකොට එළවා; ආවජ්ජිතබ්බං, ආවර්ජනා කටයුතු; එවං පුනප්පුන කරොන්තෙන,(යම්සේ මේ පිළිවෙතින් ජරාමරණින් මිදෙමි යි සඤ්ජාත ආදර ඇතිව සිහිනුවණ මනාකොට එළවා උද්ධුමාතක අශුභය පළමු කොට ආවර්ජනාකරනලද්ද) එසේම නැවත සිහිනුවණ එළවා ආවර්ජනා පවත්වනුවහු විසින්; සාධුකං උපධාරෙතබ්බඤ්චෙව වවත්ථපෙතබ්බඤ්ච, සකස්කොට (සමෘතියෙන් සැලකියයුතුද වෙසි (නුවණින්) නිශ්චයකටයුතුද වේ; සරීරතො; සිරුරෙන්; නාතිදූරෙ, ඉතා දුරුනොවූ; නාච්චාසන්නෙ, ඉතා ආසන්න නොවූ; පදෙසෙ, ප්‍රදෙශයෙහි; ඨිතෙන වා, සිටියහුවිසින් හෝ; නිසින්නෙන වා, හුන්නහුවිසින් හෝ; චක්ඛුං උම්මීලෙත්වා, ඇස දල්වා; ඔලොකෙත්වා බලා; නිමිත්තං ගණ්හිතබ්බං, නිමිත්ගතයුතු; උද්ධුමාතක පටික්කූලං උද්ධුමාතක පටික්කූලන්ති, උද්ධුමාතක පටික්කූලය උද්ධුමාතක පටික්කූලයයි; සතක්ඛත්තුං සහස්සක්ඛත්තුම්පි උම්මීලෙත්වා ඔලොකෙතබ්බං, සියක්වරද දහසක්වරද ඇසදල්වා බැලියයුතු; නිම්මීලෙත්වා ආවජ්ජිතබ්බං, ඇසපියාගෙන ආභොගකටයුතු; එවං පුනප්පුන කරොන්තස්ස, (මෙසේ ඇස දල්වා අවලොකනයද ඇස පියා ආවර්ජනයද) නැවත නැවත අනෙකවාරයෙහි ආවර්ජනය කරණුවහට; උග්ගහනිමිත්තං සුග්ගහිතං හොති, උද්ග්‍රහනිමිත්තය මනාකොට ගන්නාලද්දේ වේ; (යම්සේ නොනසීද සිහිනැතිනොවේද එසේ ගන්නාලැබේ යන අදහසි.) කදා සුග්ගහිතං හොති, කවරකලමනාකොට ගන්නාලද්දේ වේද; යදා, යම්කලෙක්හි; උම්මීලෙත්වා ඔලොකෙන්තස්ස, ඇස දල්වා බලන්නාහටද; නිම්මීලෙත්වා ආවජ්ජෙන්තස්ස ච, ඇස පියාගෙන (ඇසින්ගත් අරමුණෙහි) ආවර්ජනය කරන්නහුටද; එකසදිසං හුත්වා ආපාථං ආගච්ඡති, එකසදෘශව හමුබවට ඒද; තදා, එකල්හි; සුග්ගහිතං නාම හොති, මනාකොට ගන්නාලද්දේ වේ; සො, ඒ යොගීතෙමේ; තං නිමිත්තං, ඒ නිමිත; එවං සුග්ගහිතං කත්වා, මෙසේ මනාකොට ගන්නාලද්ද කොට; සූපධාරිතං උපධාරෙත්වා, (යම්සේ සලකනලද්දේ මනාකොට සලකනලද්දේනම් වේද) එසේ සලකා; සුවවත්ථිතං වවත්ථපෙත්වා, (යම්සේ නිශ්චයකරනලද්දේ මනාකොට

සචෙ තත්‍රෙව භාවනාපරියොසානං පත්තුං න සක්කොති, අථානෙන ආගමනකාලෙ වුත්තනයෙනෙව එකකෙන අදුතියෙන තදෙව කම්මට්ඨානං මනසිකරොන්තෙන සූපට්ඨිතං සතිං කත්වා අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි අබහිගතෙන මානසෙන අත්තනො සෙනාසනමෙව ගන්තබ්බං, සුසානතො නික්ඛමන්තෙනෙව ච ආගමනමග්ගො වවත්ථපෙතබ්බො:-යෙන මග්ගෙන නික්ඛමන්තොස්මි අයං මග්ගො පාචීනදිසාභිමුඛො වා ගච්ඡති, පච්ඡිම-උත්තර-දක්ඛිණදිසාභිමුඛො වා ගච්ඡති, විදිසාභිමුඛො වා ගච්ඡති, ඉමස්මිං පන ඨානෙ වාමතො ගච්ඡති, ඉමස්මිං දක්ඛිණතො, ඉමස්මිඤ්චස්ස ඨානෙ පාසාණො, ඉමස්මිං වම්මිකො, ඉමස්මිං රුක්ඛො, ඉමස්මිං ගච්ඡො, ඉමස්මිං ලතාති. එවං ආගමනමග්ගං වවත්ථපෙත්වා ආගතෙන චඞ්කමන්තෙනාපි තබ්භාගියොව චඞ්කමො අධිට්ඨාතබ්බො, අසුභනිමිත්ත දිසාභිමුඛභූමිප්පදෙසෙ

---

නිශ්චයකරනලද්දේ නම් වේද) එසේ නිශ්චයකොට; සචෙ, ඉදින්; තත්‍ර, එතැන්හි; භාවනා පරියොසානං පත්තුං න සක්කොති, භාවනාවෙහි පර්‍ය්‍යවසානයට නුවුවට නොපොහොසත්වේද; අථ, එසේ කල්හි; ආගමනකාලෙ වුත්තනයෙනෙව (වෙහෙරින් සොහොනට) එනකල කී නියායෙන්; එකකෙන, අසහායවූ; අදුතියෙන; දෙවන් නක්හු නැති; අනෙන, මේ යොගීහිවිසින්; තදෙව කම්මට්ඨානං මනසිකාරොන්තෙන, ඒ උද්ධුමාතක කමටහන මෙනෙහිකරනුවහු විසින්; සූපට්ඨිතං සතිං කත්වා, මනාකොට සිහිඑළිවා; අන්තොගතෙහි ඉන්ද්‍රියෙහි, (පිටතනන් අරමුණෙහි නොපැවැත්මෙන්) අන්තොගතවූ ඉඳුරන් ඇතිව; අබහිගතෙන මානසෙන, පිටත නන්අරමුණෙහි නොවිසුරුනු සිත් ඇතිව; අත්තනො සෙනාසනමෙව ගන්තබ්බං, තමාගෙ සෙනස්නටම යායුතු, සුසානතො නික්ඛමන්තෙනෙව ච, සොහොනෙන් නික්මෙන්නහුවිසිනුදු; ආගමනමග්ගො වවත්ථපෙතබ්බො, එනමග නිශ්චයකටයුතු වේ; යෙන මග්ගෙන නික්ඛන්තොස්මි, යම් මඟෙකින් නික්මුනෙම්ද; අයං මග්ගො, මේ මඟ; පාචීනදිසාභිමුඛො වා ගච්ඡති, නැගෙනහිරිදිගට අභිමුඛව හෝ යන්නේයි; පච්ඡිම, පැදුම්දිගට; උත්තර, උතුරුදිගට; දක්ඛිණදිසාභිමුඛො වා ගච්ඡති, දකුණුදිගට අභිමුඛව හෝ යන්නේයි; විදිසාභිමුඛො වා ගච්ඡති, සතරඅනුදිගට අභිමුඛව හෝ යන්නේයයිද; ඉමස්මිං පන ඨානෙ, මෙතනදී; වාමතො ගච්ඡති, වමත යන්නේය; ඉමස්මිං, මෙතනදී; දක්ඛිණතො, දකුණත යන්නේය; අස්ස, මේ මාර්ගයාගේ; ඉමස්මිං ඨානෙ, මෙතන; පාසාණො, පහණෙක; ඉමස්මිං වම්මිකො, මෙතන තුඹසෙක; ඉමස්මිං රුක්ඛො, මෙතන රුකෙක; ඉමස්මිං ගච්ඡො, මෙතන ගසෙක; ඉමස්මිං ලතාති, මෙතන ලියයෙකැයි; එවං, මෙසේ; ආගමනමග්ගං වවත්ථපෙත්වා, එනමඟ නිශ්චයකොට; ආගතෙන, ආවහු විසින්; චඞ්කමන්තෙනාපි, සක්මන්කරන්නහු විසිනුදු; තබ්භාගියොව චඞ්කමො අධිට්ඨාතබ්බො, ඒ භාගයෙහිම සක්මනෙක් ඉටියයුතු; (කුමක් කීනියාද යත්?) අසුභනිමිත්තදිසාභිමුඛ

චඞ්කමිතබ්බන්ති වුත්තං හොති, නිසීදන්තෙන ආසනම්පි තබ්භාගියමෙව පඤ්ඤපෙතබ්බං. සචෙ පන තස්සං දිසායං සොබ්භො වා පපාතො වා රුක්ඛො වා වති වා කලලං වා හොති, න සක්කා තං දිසාභිමුඛෙ භූමිප්පදෙසෙ චඞ්කමිතුං, ආසනම්පි අනොකාසත්තා න සක්කා පඤ්ඤපෙතුං, තං දිසං අනවලොකෙන්තෙනාපි ඔකාසානුරූපෙ ඨානෙ චඞ්කමිතබ්බඤ්චෙව නිසීදිතබ්බඤ්ච. චිත්තං පන තං දිසාභිමුඛමෙව කාතබ්බං෴

(අ) ඉදානි "සමන්තා නිමිත්තුපලක්ඛණා කිමත්ථියා"ති ආදිපඤ්හානං අසම්මොහත්ථාති ආදිමහි විස්සජ්ජනෙ අයමධිප්පායො:- යස්ස හි අවෙලායං උද්ධුමාතකනිමිත්තට්ඨානං ගන්ත්වා සමන්තා නිමිත්තුපලක්ඛණං කත්වා නිමිත්තග්ගහණත්ථං චක්ඛුං උම්මීලෙත්වා ඔලොකෙන්තස්සෙව තං සරීරං උට්ඨහිත්වා ඨිතං විය අජ්ඣොත්ථරමානං විය අනුබන්ධමානං විය ච හුත්වා උපට්ඨාති, සො තං බීභච්ඡං භෙරවාරම්මණං දිස්වා

---

භූමිප්පදෙසෙ, අශුභනිමිත්තට අභිමුඛවූ භූමිප්‍රදෙශයෙහි; චඞ්කමිතබ්බන්ති වුත්තං හොති, සක්මන් කටයුතුයයි යූ නියායි; නිසීදන්තෙන, හිඳිනහුවිසින්, ආසනම්පි, අස්නද; තබ්භාගියමෙව පඤ්ඤපෙතබ්බං, තබ්භාගියකොටම (ඒ නිමිත්තය අභිමුඛකොටම) පැනවියයුතු; සචෙ පන, ඉදින් වනාහි; තස්සං දිසායං, ඒ දිග; සොබ්භො වා, හෙබෙක් හෝ; පපාතො වා, ප්‍රපාතයෙක් හෝ; රුක්ඛො වා, රුකෙක් හෝ; වතිවා, වැටෙක් හෝ; කලලං වා හොති, කලලෙක් හෝ වීනම්; තං දිසාභිමුඛෙ භූමිප්පදෙසෙ ඒ දිගට අභිමුඛවූ භූමිප්‍රදෙශයෙහි; චඞ්කමිතුං න සක්කා, සක්මන් කරන්නට නොපිළිවන්වීනම්; ආසනම්පි, අස්නද; අනොකාසත්තා, අනවකාශහෙයින්; න සක්කා පඤ්ඤපෙතුං, පනවන්නට නොපිළිවන් වෙද; තං දිසං අනවලොකෙන්තෙනාපි, ඒ දිග නොබලන්නහු විසිනුදු; ඔකාසානුරූපෙ ඨානෙ, අවකාශානුරූපස්ථානයෙහි; (සක්මනට හා අසුන්පනවන අවකාශයට සුදුසු තැන;) චඞ්කමිතබ්බඤ්චෙව නිසීදිතබ්බඤ්ච, සක්මන් කටයුතුද වෙයි හින්දයුතු වෙයි; චිත්තං පන තං දිසාභිමුඛමෙව කාතබ්බං, සිත වනාහි ඒ දිගට අභිමුඛවම කටයුතු෴

(අ) සමන්තා නිමිත්තුපලක්ඛණා, (මේ උද්ධුමාතක නිමිත්හි) හාත්පසින් නිමිත් සැලකීම; කිමත්ථියා, කුමක්පිණිසයයත්?–අසම්මොහත්ථා, නොමුළාවන පිණිසයි෴පෙ෴යස්ස හි, යමක්හට; අවෙලායං, (සන්ධ්‍යාවෙලාදි) අයුක්තවෙලාවෙහි; උද්ධුමාතකනිමිත්තට්ඨානං ගන්ත්වා, උද්ධුමාතක නිමිත්ත තුබූතැනට ගොස්; සමන්තා නිමිත්තුපලක්ඛණං කත්වා, හාත්පසින් නිමිත් සලකා; නිමිත්තග්ගහණත්ථං චක්ඛුං උම්මීලෙත්වා, නිමිත් ගන්නාපිණිස ඇස දල්වා, ඔලොකෙන්තස්සෙව, බලන්නහුටම; තං සරීරං උට්ඨහිත්වා ඨිතං විය, ඒ සිරුර නැගීසිටියාක් මෙන්; අජ්ඣොත්ථරමානං විය, මැඩගෙනඑන්

---

1. අජ්ඣො-ත්‍රි. මූ.

වික්ඛිත්තවිත්තො උම්මත්තකො විය හොති, භයං ඡම්භිතත්තං ලොමහංසං පාපුණාති. පාළියං හි විභත්තඅට්ඨතිංසාරම්මණෙසු අඤ්ඤං එවරූපං භෙරවාරම්මණං නාම නත්ථි. ඉමස්මිං හි කම්මට්ඨානෙ ඣානවිබ්භන්තකො නාම හොති. කස්මා අතිභෙරවත්තා කම්මට්ඨානස්ස, තස්මා තෙන යොගිනා සන්ථම්භිත්වා සතිං සුපට්ඨිතං කත්වා "මතසරීරං උට්ඨහිත්වා අනුබන්ධන්තං නාම නත්ථි, සචෙ හි සො තස්ස සමීපෙ ඨිතො පාසාණො වා ලතා වා ආගච්ඡෙය්‍ය, සරීරම්පි ආගච්ඡෙය්‍ය. යථා පන සො පාසාණො වා ලතා වා නාගච්ඡති, එවං සරීරම්පි නාගච්ඡති. අයං පන තුය්හං උපට්ඨානාකාරො සඤ්ඤජො සඤ්ඤාසම්භවො, කම්මට්ඨානං තෙ අජ්ජ උපට්ඨිතං, මා භායි භික්ඛූ"ති

---

නාක් මෙන්; අනුබන්ධමානං විය ච හුත්වා, පසුපස්සේ ලුහුබඳනක්නු මෙන් වී; උපට්ඨාති, වැටහේ; සො, ඒ යොගීතෙම; තං, ඒ; බීභච්ඡං, විසුළුවූ; භෙරවාරම්මණං දිස්වා, (වෙතාලයක්හු වැනි) භයානක අරමුණ දැක; වික්ඛිත්තවිත්තො (පිසාචාදීන් දුටු භීරුක පුරුෂයා මෙන්) චිත්තවික්ෂෙපයට පැමිණ; උම්මත්තකො විය හොති, උම්මත්තකයෙකු වැනිවේ; භයං, භයට; ඡම්භිතත්තං, තැතිගත් බවට; ලොමහංසං, ලොමුදැහැගැන්මට; පාපුණාති, පැමිණේ; පාළියං හි විභත්තඅට්ඨතිංසාරම්මණෙසු, පෙළ විභාගකළ අටතිස් අරමුණන් කෙරෙහි; අඤ්ඤං එවරූපං භෙරවාරම්මණං නාම නත්ථි, අනික් මෙබඳු භයානක අරමුණෙක්නම් නැයි; ඉමස්මිං හි කම්මට්ඨානෙ, මේ කමටහන්හි; ඣානවිබ්භන්තකො නාම හොති, (ශීලයෙන් පිරිහුණුවන් මන්ත්‍රයෙන් පිරිහුණුවන් මෙන්) ධ්‍යානයෙන් පිරිහුණු නම් එකෙක් වන්නේයි (කිලියති තෙන පිරිහිතියයි යනු සත්‍යයි) කස්මා, කුමක්හෙයින යත්? අතිභෙරවත්තා කම්මට්ඨානස්ස, කමටහන ඉතා භයානක හෙයිනි; තස්මා, එහෙයින්; තෙන යොගිනා, ඒ යොගීහු විසින්; සන්ථම්භිත්වා, නිශ්චලව; සතිං සුපට්ඨිතං කත්වා, ස්මෘතිය මනාකොට එළවා; මතසරීරං උට්ඨහිත්වා, මළසිරුර නැගිට; අනුබන්ධන්තං නාම නත්ථි, (එබඳු මන්ත්‍රප්‍රයොගයක් නැතිව) ලුහුබඳනෙක් නම් නැති; (හෙද උද්ධුමාතකාදිභාවයට නොපැමිණි අවිනෂ්ටරූපයෙහිම සිද්ධ වෙයි. එබඳු දෙවතාධිග්‍රහයෙක් මෙහි නැත යන අභිප්‍රායි) සචෙ හි, ඉදින්; තස්ස සමීපෙ ඨිතො, ඒ මළශරීරය සමීපයෙහි සිටි; සො පාසාණො වා, ඒ පහණ හෝ; ලතා වා, ලිය හෝ; ආගච්ඡෙය්‍ය, එන්නේවී නම්; සරීරම්පි ආගච්ඡෙය්‍ය, මළශරීරයද එන්නේය; යථා පන, යම්සේ; සො පාසාණො වා, ඒ පහණ හෝ; ලතා වා, ලියය හෝ; නාගච්ඡති, නො ඒද; එවං, මෙසේම; සරීරම්පි නාගච්ඡති, මළශරීරයද නොඑන්නේය; අයං පන, මේ වනාහි; තුය්හං උපට්ඨානාකාරො, තට වැටහෙන ආකාරය; සඤ්ඤජො, (භාවනාවගේ) පරිකල්ප සංඥාවෙන් උපන්නේය; සඤ්ඤාසම්භවො, එහෙයින් සංඥාවෙන් සම්භවවූයේය; කම්මට්ඨානං තෙ අජ්ජ උපට්ඨිතං, අද තට කමටහන වැටහුණුයේය; මා භායි භික්ඛූති, මහණ තනමක් බියකරුයි; නාසං

තාසං විනොදෙත්වා හාසං උප්පාදෙත්වා තස්මිං නිමිත්තෙ චිත්තං සඤ්චාරෙතබ්බං, එවං විසෙසමධිගච්ඡති.

(අ) ඉද මෙතං සන්ධාය වුත්තං "සමන්තා නිමිත්තූපලක්ඛණා අසම්මොහත්ථා"ති එකාදසවිධෙන පන නිමිත්තග්ගාහං සම්පාදෙන්තො කම්මට්ඨානං උපනිබන්ධති, තස්ස හි චක්ඛූනි උම්මීලෙත්වා ඔලොකනපච්චයා උග්ගහනිමිත්තං උප්පජ්ජති, තස්මිං මානසං චාරෙන්තස්ස පටිභාගනිමිත්තං උප්පජ්ජති, තත්ථ මානසං චාරෙන්තො අප්පණං පාපුණාති, අප්පණාය ඨත්වා විපස්සනං වඩ්ඪෙන්තො අරහත්තං සච්ඡිකරොති. තෙන වුත්තං "එකාදසවිධෙන නිමිත්තග්ගාහො උපනිබන්ධනත්ථො"ති. "ගතාගතමග්ග පච්චවෙක්ඛනා වීථිසම්පටිපාදනත්ථා"ති එත්ථ පන:- යා ගතමග්ගස්ස ච පච්චවෙක්ඛනා වුත්තා, සා කම්මට්ඨානවීථියා සම්පටිපාදනත්ථාති අත්ථො. සචෙ හි ඉමං භික්ඛුං කම්මට්ඨානං ගහෙත්වා ආගච්ඡන්තං අන්තරාමග්ගෙ කෙචි අජ්ජ භන්තෙ කතමීති දිවසං වා පුච්ඡන්ති, පඤ්හං වා පුච්ඡන්ති, පටිසන්ථාරං වා කරොන්ති, අහං කම්මට්ඨානිකොති තුණ්හීභූතෙන ගන්තුං න වට්ටති.

---

විනොදෙත්වා, (නිමිත්හුතේ වැටහීම් නිමිත්තෙන් උපන්) චිත්ත සන්ත්‍රාසය කියනලද විධීන් සංහිඳුවා; හාසං උප්පාදෙත්වා, (තමාගේ පරිශ්‍රමය සඵලවීයයි) සතුටුඋපදවා; තස්මිං නිමිත්තෙ චිත්තං සඤ්චාරෙතබ්බං, ඒ නිමිත්හි භාවනාසිත පැවැත්වියයුතු; (මෙනෙහිකටයුතු) එවං, එසේකල්හි; විසෙසමධිගච්ඡති, විශෙෂයට පැමිණෙන්නේයි.

(අ) තස්ස හි, ඒ යොගීහට (උඩුමානන අශුභයාගේ හෝ); චක්ඛූනි උම්මීලෙත්වා ඔලොකනපච්චයා, ඇසදල්වා බැලීම හෙතුකොටගෙන; උග්ගහනිමිත්තං උප්පජ්ජති, උද්ග්‍රහනිමිති උපදනේය; තස්මිං මානසං චාරෙන්තස්ස, ඒ උද්ග්‍රහනිමිත්හි සිත හසුරුවන්නාහට; පටිභාග නිමිත්තං උප්පජ්ජති, ප්‍රතිභාග නිමිත් උපදී; තත්ථ, ඒ ප්‍රතිභාග නිමිත්හි; මානසංචාරෙන්තො, සිත් හසුරුවන්නේ; අප්පණං පාපුණාති, අර්පණාවට පැමිණෙයි; අප්පණාය ඨත්වා, අර්පණාවෙහි සිට; විපස්සනං වඩ්ඪෙන්තො, විදර්ශනා වඩනුයේ; අරහත්තං සච්ඡිකරොති, රහත්බව ප්‍රත්‍යක්ෂ කෙරේ; එතං පන, මේ වනාහි; ගතමග්ගස්ස ච, ගිය මාර්ගයාගේද; ආගතමග්ගස්ස ච, ආ මාර්ගයාගේද; යා පන පච්චවෙක්ඛනා වුත්තා, යම් ප්‍රත්‍යවෙක්ෂාවක් කියනලදද; සා, හෝ තොමෝ; කම්මට්ඨානවීථියා සම්පටිපාදනත්ථාති, කමටහන්වීථියගේ මනාව ප්‍රතිපාදනය අර්ථකොට ඇත්තීයයි; වෙදිතබ්බා, දතයුත්තීයි; සචෙ හි, ඉදින්; ඉමං භික්ඛුං, මේ භික්ෂූහු; කම්මට්ඨානං ගහෙත්වා ආගච්ඡන්තං, කමටහන් ගෙනඑන්නහු; අන්තරාමග්ගෙ, අතුරුමඟ; කෙචි, කිසිකෙනෙක්; අජ්ජ භන්තෙ කතමීති, වහන්ස අද කවරවක දැයි; පුච්ඡන්ති, විචාරද්දද; දිවසං වා පුච්ඡන්ති, දවස හෝ විචාරද්දද; පඤ්හං වා පුච්ඡන්ති, පැන හෝ පුළුවුසිද්දද; පටිසන්ථාරං වා කරොන්ති, පිළිසඳර කථා හෝ කෙරෙද්දද; අහං මම; කම්මට්ඨානිකොති, කමට

දිවසො කථෙතබ්බො, පඤ්හො විස්සජ්ජෙතබ්බො. සචෙ න ජනාති න ජානාමීති වත්තබ්බං, ධම්මිකො පටිසන්ථාරො කාතබ්බො. තස්සෙවං කරොන්තස්ස උග්ගහිතං තං තරුණනිමිත්තං නස්සති, තස්මිං නස්සන්තෙපි දිවසං පුට්ඨෙන කථෙතබ්බමෙව. පඤ්හං අජානන්තෙන නජානාමීති වත්තබ්බං, ජානන්තෙන එකදෙසෙන කථෙතුම්පි වට්ටති. පටිසන්ථාරොපි කාතබ්බො, ආගන්තුකං පන භික්ඛුං දිස්වා ආගන්තුකපටිසන්ථාරො කාතබ්බොව, අවසෙසානිපි චෙතියඞ්ගණවත්ත බොධියඞ්ගණවත්ත උපොසථාගාරවත්ත භොජනසාලජන්තාඝරආචරියුපජ්ඣාය ආගන්තුකගමිකවත්තාදීනි සබ්බානි ඛන්ධකවත්තානි පූරෙතබ්බානෙව තස්ස තානි පූරෙන්තස්සාපි තං තරුණනිමිත්තං නස්සති, පුන ගන්ත්වා නිමිත්තං ගණ්හිස්සාමීති ගන්තුකාමස්සාපි අමනුස්සෙහි වා වාළමිගෙහි වා අධිට්ඨිතත්තා සුසානම්පි ගන්තුං වා න සක්කා හොති,

---

හන්හි යෙදිනිම් යි; තුණ්හිභූතෙන ගන්තුං න වට්ටති, මූයෙන් නොබැණ යන්ට නොවටී; දිවසො කථෙතබ්බො, දවස්කියයුතුය; පඤ්හො විස්සජ්ජෙතබ්බො, පැන විසඳියයුතුය; සචෙ න ජානාති, ඉදින් (දවස්කියනසේවත් පැන විසඳන සේවත්) නොදනීනම්; න ජානාමීති වත්තබ්බං, නොදනිමියි කියයුතු; ධම්මිකො පටිසන්ථාරො කාතබ්බො, දැහැමින් යුත් පටිසන්ථාර කටයුතු; තස්සෙවං කරොන්තස්ස, මෙසේ කරන්නාවූ ඔහට; උග්ගහිතං තං තරුණනිමිත්තං නස්සති, ගත් ඒ තරුණනිමිත් නස්නේයි; තස්මිං නස්සන්තෙපි, ඒ නිමිත් නසතුදු; දිවසං පුට්ඨෙන කථෙතබ්බමෙව, දවස පුළුවුත්තහු විසින් කියයුතුම වේ; පඤ්හං අජානන්තෙන, පැන නොදන්නහු විසින්; න ජානාමීති වත්තබ්බං, නොදන්මියි කියයුතු; ජානන්තෙන, දන්නහු විසින්; එකදෙසෙන කථෙතුම්පි වට්ටති, එකදෙශයෙකිනුදු කියන්ට වටී; පටිසන්ථාරොපි කාතබ්බො, පටිසන්ථාරද කටයුතු; ආගන්තුකං පන භික්ඛුං දිස්වා, ආගන්තුක භික්ෂුහු දැක; ආගන්තුක පටිසන්ථාරො කාතබ්බොව, ආගන්තුක පටිසන්ථාරකටයුතුම වේ; චෙතියඞ්ගණවත්තං, දාගැප් අඟනෙහි වත; බොධියඞ්ගණ වත්තං, මහබෝ අඟනෙහි වත; උපොසථාගාරවත්තං, පොහෝගෙයි වත; භොජනසාල, බොජුන්හලවත; ජන්තාඝර, ගිනිහල්ගෙයි වත; ආචරිය, ඇජර වත; උපජ්ඣාය, උපාධ්‍යායයන්ට කරන වත; ආගන්තුක, අමුතුවන්ටකරන වත; ගමිකවත්තාදීනි, ගමික වත යනාදී ("අවසෙසානි පි සබ්බානි ඛන්ධකවත්තානි"යි යොදනු) සියලු ඛඳුවත්හුදු; පූරෙතබ්බානෙව, පිරියයුත්තාහු මැයි; තස්ස, ඔහු; තානි පූරෙන්තස්සාපි, එකී සියලු වත් පුරණුවහටද; තං තරුණනිමිත්තං නස්සති, ඒ තරුණනිමිත්ත නස්නේයි; පුන ගන්ත්වා නිමිත්තං ගණ්හිස්සාමීති, නැවත ගොස් නිමිත්ගන්නියි; ගන්තු කාමස්සාපි යනු කැමැත්තාහටද; අමනුස්සෙහි වා, අමනුෂ්‍යයන් විසින් හෝ; වාළමිගෙහි වා, ව්‍යාළමෘගයන් විසින් හෝ; අධිට්ඨිතත්තා, අධිෂ්ඨිත හෙයින්;

නිමිත්තං අනාරබ්භායති උද්ධුමාතකං හි එකමෙව වා ද්වෙ වා දිවසෙ, ඨත්වා විනීලකාදිභාවං ගච්ඡති. සබ්බකම්මට්ඨානෙසු එතෙන සමං දුල්ලභං කම්මට්ඨානං නාම නත්ථි. තස්මා එවං නට්ඨෙ නිමිත්තෙන තෙන භික්ඛුනා රත්තිට්ඨානෙ වා දිවාට්ඨානෙ වා නිසීදිත්වා අහං ඉමිනා නාම ද්වාරෙන විහාරා නික්ඛමිත්වා අසුකදිසාභිමුඛං මග්ගං පටිපජ්ජිත්වා අසුකස්මිං නාම ඨානෙ වාමං ගණ්හිං, අසුකස්මිං දක්ඛිණං, තස්ස අසුකස්මිං ඨානෙ පාසාණො, අසුකස්මිං වම්මිකරුක්ඛගච්ඡලතානං අඤ්ඤතරං සොහං තෙන මග්ගෙන ගන්ත්වා අසුකස්මිං ඨානෙ අසුභං අද්දසං, තත්ථ අසුකදිසාභිමුඛො ඨත්වා එවඤ්චෙවඤ්ච සමන්තා නිමිත්තානි සල්ලක්ඛෙත්වා එවං අසුභනිමිත්තං උග්ගහෙත්වා අසුකදිසාය සුසානතො නික්ඛමිත්වා එවරූපෙන නාම මග්ගෙන ඉදඤ්චිදඤ්ච කරොන්තො ආගන්ත්වා ඉධ නිසින්නොති එවං යාව පල්ලඞ්කං ආභු

---

සුසානමපි, සොහොනටද; ගන්තුං වා න සක්කොති, යන්නට හෝ නොදපිළිවන්වෙයි; නිමිත්තං වා අනාරබ්භායති, නිමිත්ත හෝ අනාරම්භනවෙයි; උද්ධුමාතකං හි, උද්ධුමාතක අශුභය වනාහි; එකමෙව වා ද්වෙ වා දිවසෙ ඨත්වා, එකමදවසක් හෝ දෙදවසක් හෝ සිට; විනීලකාදිභාවං ගච්ඡති, විනීලකාදීභාවයට පැමිණේ; සබ්බකම්මට්ඨානෙසු, සියලු කමටහනුන් කෙරෙහි; එතෙන සමං දුල්ලභං කම්මට්ඨානං නත්ථි, මේ කමටහන හා සමව දුර්ලභවූ කමටහනෙක් නැති; තස්මා, එහෙයින්; එවං නිමිත්තෙන නට්ඨෙ, මෙසේ ලද නිමිත් නටකල්හි; තෙන භික්ඛුනා, ඒ මහණහු විසින්; රත්තිට්ඨානෙ වා, දිවාට්ඨානෙ වා නිසීදිත්වා, රාත්‍රිස්ථානයෙහි වත් දිවාස්ථානයෙහි වත් හිඳ; අහං, මම; ඉමිනා නාම වාරෙන, මෙනම් දොරින්; විහාරා නික්ඛමිත්වා, වෙහෙරින් නික්මැ; අසුකදිසාභිමුඛමග්ගං පටිපජ්ජිත්වා, අසුවල්දිගට අභිමුඛවූ මඟට එළඹ; අසුකස්මිං නාම ඨානෙ, අසුවල් නම් තැනදී; වාමං ගණ්හිං, වමත ගියෙමි; අසුකස්මිං දක්ඛිණං, අසුවල් තැනදී දකුණට ගියෙමි; තස්ස, ඒ මාර්ගයාගේ; අසුකස්මිං ඨානෙ පාසාණො, අසුවල්තැන පහණෙක; අසුකස්මිං, අසුවල්තැන; වම්මිකරුක්ඛගච්ඡලතානං අඤ්ඤතරං, තුඹස් රුක්ගස් ලියයන් අතුරෙහි එක්තරා එකෙක; සො, හේ මම; තෙන මග්ගෙන ගන්ත්වා, ඒ මඟින් ගොස්; අසුකස්මිං නාම ඨානෙ, අසුවල්තැන; අසුභං අද්දසං අමයි, අශුභය දුටුයෙම්වීමි; තත්ථ, එහි; අසුකදිසාභිමුඛො ඨත්වා, අසුවල්දිගට අභිමුඛව සිට; එවමෙව සමන්තා නිමිත්තානි සල්ලක්ඛෙත්වා, මෙසේද මෙසේද හාත්පසින් නිමිත් සලකා; එවං අසුභනිමිත්තං උග්ගහෙත්වා, මෙසේ අශුභනිමිත්තය ඉගෙන; අසුකදිසාය සුසානතො නික්ඛමිත්වා, සොහොණින් අසුවල්දිගින් නික්මැ; එවරූපෙන නාම මග්ගෙන, මෙබඳු නම් මඟෙකින්; ඉදඤ්චිදඤ්ච කරොන්තො ආගන්ත්වා, මේ මේ දෙයක් කෙරෙමින් අවුත්; ඉධ නිසින්නොති, මෙතන හුන්නෙමියි; එවං, මෙසේ; යාව පල්ලඞ්කං ආභුජිත්වා නිසින්නට්ඨානං, යම්තාක්

ජ්ඣා නිසින්නට්ඨානං, තාව ගතාගතමග්ගො පච්චවෙක්ඛිතබ්බො. තස්සෙවං පච්චවෙක්ඛතො තං නිමිත්තං පාකටං හොති, පුරතො නික්ඛිත්තං විය උපට්ඨාති. කම්මට්ඨානං පුරිමාකාරෙනෙව වීථිපටිපජ්ජති. තෙන වුත්තං "ගතාගතමග්ග පච්චවෙක්ඛණා වීථි සම්පටිපාදනත්ථා"ති.

(අ) ඉදානි "ආනිසංසදස්සාවී රතනසඤ්ඤී හුත්වා චිත්තීකාරං උපට්ඨපෙත්වා සම්පියායමානො තස්මිං ආරම්මණෙ චිත්තං උපනිබන්ධතී"ති එත්ථ උද්ධුමාතකපටිකූලෙ මානසං චාරෙත්වා ඣානං නිබ්බත්තෙත්වා ඣානපදට්ඨානං විපස්සනං වඩ්ඪෙන්තො අද්ධා ඉමාය පටිපදාය ජරාමරණම්හා පරිමුච්චිස්සාමීති එවං ආනිසංසදස්සාවිනා භවිතබ්බං. යථා පන දුග්ගතො පුරිසො මහග්ඝං මණිරතනං ලභිත්වා දුල්ලභං වත මෙ ලද්ධන්ති තස්මිං රතනසඤ්ඤී හුත්වා ගාරවං ජනෙත්වා විපුලෙන පෙමෙන සම්පියායමානො තං රක්ඛෙය්‍ය එවමෙව දුල්ලභං මෙ ඉදං කම්මට්ඨානං ලද්ධං දුග්ගතස්ස මහග්ඝමණිරතනසදිසං, චතුධාතුකම්මට්ඨානිකො හි අත්තනො චත්තාරො මහාභූතෙ පරිග්ගණ්හාති, ආනාපානකම්මට්ඨානිකො අත්තනො නාසිකාවාතං පරිග්ගණ්හාති, කසිණකම්මට්ඨානිකො කසිණං කත්වා යථාසුඛං භාවෙති,

---

පළඟබැඳ හුන්තැනද; තාව, එතාක්; ගතාගතමග්ගො පච්චවෙක්ඛිතබ්බො, ගිය ආමග පස්විකියයුතු; තස්ස, ඔහු; එවං පච්චවෙක්ඛතො, මෙසේ පස්විකනුවහට; තං නිමිත්තං පාකටං හොති, ඒ නිමිත්තය පහළවේ; පුරතො නික්ඛිත්තං විය උපට්ඨාති, අභිමුඛයෙහි නික්ෂිප්තය මෙන් වැටහේ; කම්මට්ඨානං පුරිමාකාරෙනෙව වීථිං පටිපජ්ජති, කමටහන පෙර ආකාරයෙන්ම විථියට පිළිපදී; තෙන වුත්තං....පෙ....

(අ) ඉදානි ආනිසංසදස්සාවී....පෙ....යථා, යම්සේ; දුග්ගතො පුරිසො, දුගී පුරුෂයෙක්; මහග්ඝං මණිරතනං ලභිත්වා, මහඅගී මිණිරුවනක් ලදින්; දුල්ලභං වත මෙ ලද්ධන්ති, එකාන්තයෙන් දුලීභවූ රත්නයක් මාවිසින් ලබනලදැයි; තස්මිං, ඒ රුවන; රතනසඤ්ඤී හුත්වා, රත්න සංඥ ඇතිව; ගාරවං ජනෙත්වා, ගෞරව උපදවා; විපුලෙන පෙමෙන සම්පියායමානො, මහත් ප්‍රෙමයෙන් ප්‍රෙමකරනුයේ; තං රක්ඛෙය්‍ය, ඒ මිණිරුවන රක්නේද; එවමෙව, එපරිද්දෙන්ම; දුල්ලභං මෙ ඉදං කම්මට්ඨානං ලද්ධං, මාවිසින් මේ දුලීභවූ කමටහන ලබනලදැයි; දුග්ගතස්ස මහග්ඝමණිරතනසදිසං, දුගීහට මාහැගි මිණිරුවනක් වැනි; චතුධාතුකම්මට්ඨානිකො හි, චතුර්ධාතු ව්‍යවස්ථා කර්මස්ථානයෙහි යෙදුණේ; අත්තනො චත්තාරො මහාභූතෙ පරිග්ගණ්හාති, තමාගේ සතරමහාභූතයන් පරිග්‍රහකෙරෙයි; ආනාපානකම්මට්ඨානිකො, ආනාපානසති කර්මස්ථානයෙහි යෙදුණේ; අත්තනො නාසිකාවාතං පරිග්ගණ්හාති, තමාගේ නාසිකා වාතය පරිග්‍රහ කෙරෙයි; කසිණකම්මට්ඨානිකො. කිසුණුකමටහන්හි යෙදුණේ; කසිණං කත්වා, කිසුණුකොට; යථාසුඛං භාවෙති, සුවසේ භාවනා

එවං ඉතරීතරානි කම්මට්ඨානානි සුලභානි, ඉදං පන එකමෙව වා ද්වෙ වා දිවසෙ තිට්ඨති, තතො පරං විනීලකාදිභාවං පාපුණාතීති නත්ථි ඉතො දුල්ලභතරන්ති තස්මිං රතනසඤ්ඤිනා හුත්වා චිත්තීකාරං උපට්ඨපෙත්වා සම්පියායමානෙන තං නිමිත්තං රක්ඛිතබ්බං. රත්තිට්ඨානෙ ච. දිවාට්ඨානෙ ච උද්ධුමාතකපටික්කූලං උද්ධුමාතකපටික්කූලන්ති තත්ථ පුනප්පුනං චිත්තං උපනිබන්ධිතබ්බං, පුනප්පුනං තං නිමිත්තං ආවජ්ජිතබ්බං, මනසිකාතබ්බං, තක්කාහතං විතක්කාහතං කාතබ්බං, තස්සෙවං කරොතො පටිභාගනිමිත්තං උප්පජ්ජති. තත්‍රිදං නිමිත්තද්වයස්ස නානාකරණං උග්ගහනිමිත්තං විරූපං බීභච්ඡං භෙරවදස්සනං හුත්වා උපට්ඨාති, පටිභාගනිමිත්තං පන යාවදත්ථං භුඤ්ජිත්වා නිපන්නො ථූලඞ්ගපච්චඞ්ගපුරිසො විය. තස්ස පටිභාගනිමිත්තපටිලාභසමකාලමෙව බහිද්ධා කාමානං අමනසිකාරා වික්ඛම්භනවසෙන කාමච්ඡන්දො

---

කරන්නේයි; එවං, මෙසේ; ඉතරීති ඉතරානි කම්මට්ඨානානි, සෙසු සෙසු කමටහන්හු; සුලභානි, සුලභයහ; ඉදම්පන, මේ වනාහි; එකමෙව වා ද්වෙ වා දිවසෙ තිට්ඨති, එකම දවසක් හෝ දෙදවසක් සිටින්නේය; තතො පරං, එයින් මතුයෙහි; විනීලකාදිභාවං පාපුණාතීති, විනීලකාදිබවට පැමිණෙන්නේයයි; නත්ථි ඉතො දුල්ලභතරන්ති, මෙයට වඩා වෙසෙසින් දුලීභයෙක් නැතැයි; තස්මිං, එහි; රතනසඤ්ඤිනා හුත්වා, රතනසංඥ ඇතියාව; චිත්තීකාරං උපට්ඨපෙත්වා, ගෞරව එළවා; සම්පියායමානෙන, ප්‍රෙමකරන්නහු විසින්; තං නිමිත්තං රක්ඛිතබ්බං, ඒ නිමිත්ත රැක්කයුත්තේයි; රත්තිට්ඨානෙ ච, රෑ වසන තැන්හිද; දිවාට්ඨානෙ ච, දහවල් වසන තැන්හිද; උද්ධුමාතකපටික්කූලං උද්ධුමාතකපටික්කූලන්ති, ඉදිමුණු පිළිකුල ඉදිමුණු පිළිකුලැයි; පුනප්පුන චිත්තං උපනිබන්ධිතබ්බං, නැවත නැවත සිත එළවියයුතු; පුනප්පුන නිමිත්තං ආවජ්ජිතබ්බං, නැවත නැවත නිමිත්ත ආවජ්ජනාකටයුතු; මනසිකාතබ්බං, මෙනෙහිකටයුතු; තක්කාහතං විතක්කාහතං කාතබ්බං, තර්කයෙන් පහරනලද්දක් විතර්කයෙන් පහරනලද්දක් කටයුතු; තස්සෙවං කරොතො, මෙසේ කරන්නහුට; පටිභාගනිමිත්තං උප්පජ්ජති, ප්‍රතිභාගනිමිත් උපදී; තත්‍ර, එහි; ඉදං, මේ; නිමිත්තද්වයස්ස, උද්ග්‍රහ ප්‍රතිභාග නිමිත් දෙදෙනාගේ; නානාකරණං, වෙනසයි; උග්ගහනිමිත්තං, උද්ග්‍රහනිමිත්ත; විරූපං බීභච්ඡං භෙරවදස්සනං හුත්වා උපට්ඨාති, (මනස්කාරය අනුදුර බැවිනුදු අරමුණ අනුපශාන්ත බැවිනුදු) විරූපව පිළිකුල්ව භයානකව වැටහේ; පටිභාගනිමිත්තම්පන, පිළිබානිමිත වනාහි; යාවදත්ථං භුඤ්ජිත්වා නිපන්නො, යම්තාක් කුසපුරා කා හොත්; ථූලඞ්ගපච්චඞ්ගපුරිසො විය; සථූලවූ අඞ්ගප්‍රත්‍යඞ්ග පුරුෂයෙකු මෙන් වැටහේ; තස්ස, ඒ යොගීහට; පටිභාගනිමිත්ත පටිලාභසමකාලමෙව, ප්‍රතිභාගනිමිත්ත ප්‍රතිලාභය හා සමකාලයෙහිම; (පඤ්චනීවරණානි පහීයන්ති යි යොදනු.) පස්නීවරණයෝ පැහෙත්; බහිද්ධාකාමානං අමනසිකාරා, ගොචරජ්ඣත්තයෙන්

පහීයති, අනුනයප්පහානෙනෙව චස්ස ලොහිතප්පහානෙන පුබ්බං විය ව්‍යාපාදොපි පහීයති, තථා ආරද්ධ විරියතාය ථිනමිද්ධං, අවිප්පටිසාරකරසන්තධම්මානුයොගවසෙන උද්ධච්චකුක්කුච්චං, අධිගත විසෙසස්ස පච්චක්ඛතාය පටිපත්තිදෙසකෙ සත්ථරි පටිපත්තියං පටිපත්ති ඵලෙ ච විචිකිච්ඡාති පඤ්චනීවරණානි පහීයන්ති. තස්මිං යෙව ච නිමිත්තෙන චෙතසො අභිනිරොපන ලක්ඛණො විතක්කො, නිමිත්තානු

---

පීවත අශුභභාවනානුභාවයෙන් කාමසංඥාව දුරුවූ බැවින් කාමගුණ නිසා මනසකාර නොපැවැත්මෙන්; වික්ඛම්භනවසෙන කාමච්ඡන්දො පහීයති, විෂ්කම්භනවිසින් කාමච්ඡන්දය පහනලැබෙයි; (පිළිබානිමිත් අරමුණුකොට පවත්නාවූ බලවත් අශුභසංඥාසහගිය උපදනේම කාමච්ඡන්දය පහමින් උපදනේයි.) අනුනයප්පහානෙනෙව ච, අනුනය ප්‍රහාණයෙන්; අස්ස, ඒ යොගීහට; ලොහිතප්පහානෙන පුබ්බං විය, ලොහිත ප්‍රහාණයෙන් තන්මූලක පූයාව මෙන්; ව්‍යාපාදොපි පහීයති, (අනුනයමුල්කොට ඇති) ව්‍යාපාදය පහනලැබෙයි; (අශුභසංඥා සහගියාවූ ප්‍රීතිතොමෝ සාතිසයව පවත්නී ව්‍යාපාදයා විෂ්කම්භනය කෙරෙමින් උපද්දී දතයුතු.) තථා ආරද්ධ විරියතාය, (උපචාරධ්‍යාන් උපදනාපරිද්දෙන්) වඩනාලද වීර්‍ය්‍යඇති බැවින්; ථිනමිද්ධං පහීයති (සී යොදනු); ථිනමිද්ධ දෙක පහනු ලැබේ; (වීර්‍ය්‍යතෙමේ තමා වඩනාහුගේ වනාගි මිථ්‍යාසඞ්කල්පය පහන සම්‍යක්සඞ්කල්පයමෙන් සවිස්ථාරබැවින් ථිනමිද්ධයා විෂ්කම්භනයකෙරෙමින්ම උපදී) අවිප්පටි සාරකර සන්තධම්මානුයොගවසෙන, විප්‍රතිසාරයට ප්‍රතිපක්ෂ ශාන්ත ධර්මයන්ගේ අනුයොගවශයෙන්; උද්ධච්චකුක්කුච්චං පහීයති, (අවූප ශාන්තසවභාව) උද්ධච්චකුක්කුච්චය පහනලැබේ; (පශ්චාත්තාප සඞ්ඛ්‍යාත විප්‍රතිසාරය තත්ප්‍රතිපක්ෂවූද රථපරිදහභාවයෙන් සිත්හු නිවුණුබව අවිප්‍රතිසාර නම් වෙයි. ඒ අවිප්‍රතිසාරයට මුල්වූ සීලයද තත්සහගතවූ තදුපනිශ්‍රයවූ ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය සුඛයයනාදිහුදු සවභාව හෙයිනුදු හෙතුහෙයිනුදු ශාන්තසවභාවය ඔවුන්ගේ අනුයොග හෙයින් අව්‍යුපශම සවභාව ඇති උද්ධච්චකුක්කුච්ච දෙදෙන පැහෙති යන අර්ථයි. භාවනාව වනාහි පූර්වයෙන් අපරවිශෙෂය එළවමින් පවත්නා කල්හි සාතිසයව පවත්නාවූ සුඛය උද්ධච්චකුක්කුච්ච දෙදෙන විෂ්කම්භනය කෙරෙමින් උපදී) අධිගතවිසෙසස්ස පච්චක්ඛතාය, අධිගතවූ භාවනාවිශෙෂය යොගීහට ප්‍රත්‍යක්ෂබැවින්; පටිපත්ති දෙසකෙ සත්ථරි, "සම්මාසම්බුද්ධො වත භගවා" යනාදීන් ප්‍රතිපත්ති දෙශකවූ ශාස්තෲහුකෙරෙහිද; පටිපත්තියං, පිළිපදනාවූ ධ්‍යානප්‍රති පත්තියෙහිද; පටිපත්තිඵලෙ ච, ප්‍රතිපත්තීන් සෑදියයුතුවූ ලෞකි ලොවුතුරු ඵලයෙහිද; විචිකිච්ඡා, (ධර්මයන්ගේ අභිය විචාරයෙන් අහිතබල ඇති විචාරයා විසින්) විචිකිත්සාව පහනලැබෙයි; පඤ්ච නීවරණානි පහීයන්ති, පස්නීවරණයෝ පැහෙත්; තස්මිං යෙව ච නිමිත්තෙන, එම ප්‍රතිභාගනිමිත්හි; චෙතසො අභිනිරොපණලක්ඛණො, (තමා හා සැරියයුතු සිත්හු) අරමුණෙහි නැඟීම ලකුණුකොට ඇති;

මජ්ජනකිච්චං සාධයමානො විචාරො, පටිලද්ධවිසෙසාධිගමපච්චයා පීති, පීතිමනස්ස පස්සද්ධිසම්භවතො පස්සද්ධිනිමිත්තං සුඛං, සුඛිතස්ස චිත්තසමාධි සුඛනිමිත්තා එකග්ගතා චාති ඣානඞ්ගානි පාතුභවන්ති. එවමස්ස පඨමජ්ඣානපටිබිම්බභූතං උපචාරජ්ඣානම්පි තං ඛණංයෙව නිබ්බත්තති. ඉතො පරං යාව පඨමජ්ඣානස්ස අප්පණා චෙව වසිප්පත්ති ච, තාව සබ්බං පඨවිකසිණෙ වුත්තනයෙනෙව වෙදිතබ්බං…

(අ) ඉතොපරෙසු පන විනීලකාදිසුපි යං තං "උද්ධුමාතක අසුභනිමිත්තං උග්ගණ්හන්තො එකො අදුතියො ගච්ඡති උපට්ඨිතාය සතියා"ති ආදිනා නයෙන ගමනං ආදිං කත්වා ලක්ඛණං වුත්තං, තං සබ්බං විනීලකං අසුභනිමිත්තං උග්ගණ්හන්තො විපුබ්බකං අසුභනිමිත්තං උග්ගණ්හන්තොති එවං තස්ස තස්ස වසෙන තත්ථ උද්ධුමාතක පදමත්තං පරිවත්තෙත්වා වුත්තනයෙනෙව සවිනිච්ඡයාධිප්පායං වෙදිතබ්බං. අයං පන විසෙසො:- විනීලකෙ විනීලකපටික්කූලං විනීලකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. උග්ගහනිමිත්තඤ්චෙත්ථ කබරං කබරවණ්ණං හුත්වා උපට්ඨාති. පටිභාග

---

විතක්කො, විතර්කයද; නිමිත්තානුමජ්ජනකිච්චං සාධයමානො විචාරො, ප්‍රතිභාගනිමිත්හි (පියුම්මතුයෙහි බමරක්හු මෙන්) අනුවිචාරණ කෘත්‍යය සාධමින් උපදනා විචාරයද; පටිලද්ධවිසෙසාධිගමපච්චයා පීති, ප්‍රතිලබ්ධවිශෙෂාධිගමය හෙතුකොට ඇති ප්‍රීතියද; පීතිමනස්ස, ප්‍රීතිප්‍රයුක්ත සිත් ඇත්තහුට; පස්සද්ධිසම්භවතො, ප්‍රශ්‍රබ්ධිය සම්භවවන හෙයින්; පස්සද්ධිනිමිත්තං සුඛං, ප්‍රශ්‍රබ්ධි නිමිත්තකොට ඇති සුඛයද; සුඛිතස්ස චිත්තසමාධිසම්භවතො, සුවපත් හට චිත්තසමාධිය සම්භව වන හෙයින්; සුඛනිමිත්තා එකග්ගතා චාති, සුඛප්‍රත්‍යයවූ එකාග්‍රතාව යද යන; ඣානඞ්ගානි පාතුභවන්ති, මේ ධ්‍යානාඞ්ගයෝ පහළවෙත්; එවං, මෙසේ; අස්ස, ඒ යොගීහට; පඨමජ්ඣාන පටිබිම්බභූතං, ප්‍රථම ධ්‍යානයාගේ ප්‍රතිබිම්බවූ; උපචාරජ්ඣානම්පි, උපචාරධ්‍යානයද; තං ඛණංයෙව, ඒ ප්‍රතිභාගනිමිත්ත උපන් කෙණෙහිම; නිබ්බත්තති, නිපදී; ඉතො පරං, මෙයින්මතු; යාව, යම්තාක්; පඨමජ්ඣානස්ස, ප්‍රථමධ්‍යාන්හුගේ; අප්පණා චෙව, අර්පණාද; වසිප්පත්ති ච, වසිතාවට පැමිණීම වේද; තාව, ඒතාක්; සබ්බං, සියල්ල; පඨවිකසිණෙ වුත්තනයෙනෙව වෙදිතබ්බං, පඨවිකිසුණෙහි කී නියෙන්ම දතයුතු…

(අ) ඉතො පරෙසු පන විනීලකාදිසුපි, මේ උද්ධුමාතක අසුභයෙන් අන්‍යවූ විනීලකාදීන් කෙරෙහිදු;(උද්ධුමාතකයෙහි කී නියෙන්ම දතයුතුයි.) …පෙ… අයං පන, මේ වනාහි; විසෙසො, වෙනසයි; විනීලකෙ, විනීලක අශුභයෙහි; විනීලකපටික්කූලං විනීලකපටික්කූලන්ති, විනීලක පටික්කූලය විනීලකපටික්කූලයයි; මනසිකාරො පවත්තෙතබ්බො, මනස්කාරය පැවැත්විය යුතුයි; එත්ථ ච, මෙහිද; උග්ගහනිමිත්තං, උද්ග්‍රහනිමිත්තය; කබරං කබරවණ්ණං හුත්වා

නිමිත්තං පන උස්සදවසෙන උපට්ඨාති. විපුබ්බකෙ විපුබ්බකපටික්කූලං විපුබ්බකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො, උග්ගහනිමිත්තං පනෙත්ථ පග්ඝරන්තමිව උපට්ඨාති. පටිභාගනිමිත්තං නිච්චලං සන්නිසින්නං හුත්වා උපට්ඨාති. විච්ඡිද්දකං යුද්ධමණ්ඩලෙ වා චොරාටවියං වා සුසානෙ වා යත්ථ රාජානො චොරෙ ඡින්දාපෙන්ති, අරඤ්ඤෙ වා පන සීහබ්‍යග්ඝෙහි ඡින්නපුරිසට්ඨානෙ ලබ්භති, තස්මා තථාරූපං ඨානං ගන්ත්වා සචෙ නානාදිසායං පතිතම්පි එකාවජ්ජනෙන ආපාථං ආගච්ඡති, ඉච්චෙතං කුසලං නො චෙ ආගච්ඡති, සයං හත්ථෙන න පරාමසිතබ්බං, පරාමසන්තො හි විස්සාසං ආපජ්ජති, තස්මා ආරාමිකෙන වා සමණුද්දෙසෙන වා අඤ්ඤෙන වා කෙනචි එකට්ඨානෙ කාරෙතබ්බං. අලභන්තෙන කත්තරයට්ඨියා වා දණ්ඩකෙන වා එකඞ්ගු

---

උපට්ඨාති, බොහෝසේ කබරවර්ණව වැටහේ; පටිභාගනිමිත්තං පන, ප්‍රතිභාග නිමිත්තය වනාහි; උස්සදවසෙන උපට්ඨාති, (රක්ත නීල ශ්වේතවර්ණයන් කෙරෙහි) උත්සද වර්ණවශයෙන් වැටහේ; (සන්න්‍යයෙහි වනාහි උස්සදවසෙන, උසුවිසින් නීලවර්ණම වඩිතියි කීහු) විපුබ්බකෙ, විපුබ්බක අශුභයෙහි; විපුබ්බකපටික්කූලං විපුබ්බකපටික්කූලන්ති, විපුබ්බකපටික්කූලය විපුබ්බකපටික්කූලයයි; මනසිකාරො පවත්තෙතබ්බො, මනස්කාරය පැවැත්වියයුතු; උග්ගහනිමිත්තං පන, උද්ග්‍රහනිමිත්ත වනාහි; එත්ථ, මෙහි; පග්ඝරන්තමිව උපට්ඨාති (පූයා) වැගෙන්නාක්මෙන් වැටහේ; පටිභාගනිමිත්තං, ප්‍රතිභාග නිමිත්තය; නිච්චලං, නිශ්චලව; සන්නිසින්නං හුත්වා උපට්ඨාති, (නිශ්චල බැවින් සමාකාරයෙන්ම) පොපි නැතිව වැටහේ; විච්ඡිද්දකං, විච්ඡිද්දක අශුභය; යුද්ධමණ්ඩලෙ වා, යුද්ධාඞ්ගනයෙහි හෝ; චොරාටවියං වා; සොරුන් සිටිනා අටවියෙහි හෝ; සුසානෙ වා, සොහොන්හි හෝ, යත්ථ රාජානො චොරෙ ඡින්දාපෙන්ති, යම් ආඝාතනයෙක රජදරුවෝ සොරුන් අත්පා සිඳුවද්ද එහි හෝ; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; සීහබ්‍යග්ඝෙහි ඡින්න පුරිසට්ඨානෙ, සිංහ ව්‍යාඝ්‍රයන් විසින් අත් පා වෙන් කොට සිඳුනාලද පුරුෂයන් ඇතිතන්හි; ලබ්භති, ලැබේ; තස්මා, එහෙයින්; තථාරූපං ඨානං ගන්ත්වා, එබඳු තැනකට එළඹ; සචෙ, ඉදින්; නානාදිසායං පතිතම්පි, සිඳ වෙන වෙන ගැලවුණුයේද; එකාවජ්ජනෙන, එකාවර්ජනයෙන්ම; (ඇස නොඅඹරා එක බැල්මෙන්ම) ආපාථං ආගච්ඡති, හමුබවට ඒ නම්; ඉච්චෙතං කුසලං, හේ යෙහෙක; නො චෙ ආගච්ඡති, (එකාවර්ජනයෙන්) හමුනොවේ නම්; සයං හත්ථෙන න පරාමසිතබ්බං, තමා අතින් නොඇල්වීමයුතු; පරාමසන්තො හි, අතින් අල්වනුයේ; විස්සාසං ආපජ්ජති, විස්වාසයට පැමිණේ; තස්මා, එහෙයින්; ආරාමිකෙන වා, ආරාමිකයෙකු ලවා හෝ; සමණුද්දෙසෙන වා, හෙරණක්හු ලවා හෝ; අඤ්ඤෙන වා කෙනචි, අන්කිසිවෙක් ලවා හෝ; එකට්ඨානෙ කාරෙතබ්බං, එක තැන කැරවියයුතු; අලභන්තෙන, (ආරාමිකාදීන්) නොලබන්නහු විසින්; කත්තරයට්ඨියා වා, සැරයටියෙන් හෝ; දණ්ඩකෙන වා,

ලන්තරං කත්වා උපනාමෙතබ්බං. එවං උපනාමෙත්වා විච්ඡිද්දකපටික්කූලං විච්ඡිද්දකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. තත්ථ උග්ගහනිමිත්තං මජ්ඣෙ ඡිද්දං විය උපට්ඨාති, පටිභාගනිමිත්තං පන පරිපුණ්ණං හුත්වා උපට්ඨාති. වික්ඛායිතකෙ වික්ඛායිතකපටික්කූලං වික්ඛායිතකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. උග්ගහනිමිත්තං පනෙත්ථ තහිං තහිං ඛායිතසදිසමෙව උපට්ඨාති, පටිභාගනිමිත්තං පන පරිපුණ්ණං හුත්වා උපට්ඨාති. වික්ඛිත්තකම්පි විච්ඡිද්දකෙ වුත්තනයෙනෙව අඞ්ගුලඞ්ගුලන්තරං කාරෙත්වා වා කත්වා වා වික්ඛිත්තකපටික්කූලං වික්ඛිත්තකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. එත්ථ උග්ගහනිමිත්තං පාකටන්තරං හුත්වා උපට්ඨාති, පටිභාගනිමිත්තං පන පරිපුණ්ණං හුත්වා උපට්ඨාති. හතවික්ඛිත්තකම්පි විච්ඡිද්දකෙ වුත්තප්පකාරෙසු යෙව ඨානෙසු ලබ්භති. තස්මා තත්ථ ගන්ත්වා වුත්තනයෙනෙව අඞ්ගුලඞ්ගුලන්තරං කාරෙත්වා වා කත්වා වා හතවික්ඛිත්තකපටික්කූලං හතවික්ඛිත්තකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. උග්ගහනිමිත්තං පනෙත්ථ පඤ්ඤායමානපහාරමුඛං විය හොති. පටිභාගනිමිත්තං පරිපුණ්ණමෙව හුත්වා උපට්ඨාති. ලොහිතකං යුද්ධමණ්ඩලාදීසු

---

දණ්ඩකින් හෝ; එකඞ්ගුලන්තරං කත්වා, එක් අඟුල්අතුර ඇතිකොට; උපනාමෙතබ්බං, එළවියයුතු; ˝එවං, මෙසේ; උපනාමෙත්වා, එළවා ෴පෙ෴ විච්ඡිද්දක පටික්කූලයයි මනසකාර පැවැත්වියයුතු; උග්ගහ නිමිත්තං, උද්ග්‍රහ නිමිත්තය; මජ්ඣෙ ඡිද්දං විය උපට්ඨාති, මැදින් කැපුවාසේ වැටහේ; පටිභාගනිමිත්තම්පන, ප්‍රතිභාගනිමිත්තය වනාහි; පරිපුණ්ණං හුත්වා උපට්ඨාති, පරිපූර්ණව වැටහේ; වික්ඛායිතකෙ, වික්ඛායිතක අශුභයෙහි ෴පෙ෴ එත්ථ, මෙහි; උග්ගහනිමිත්තං, උද්ග්‍රහ නිමිත්තය; තහිං තහිං ඛායිතසදිස මෙව, ඒ ඒ තැන්හි කනලද අශුභයක් වැනිවම; උපට්ඨාති, වැටහේ; ෴පෙ෴ වික්ඛිත්තකම්පි, වික්ඛිත්තක අශුභයද; විච්ඡිද්දකෙ වුත්තනයෙනෙව, විච්ඡිද්දක අශුභයෙහි කී නයින්ම; අඞ්ගුලඞ්ගුලන්තරං, අඟුලක් අඟුලක් අතුරු ඇතියා; කාරෙත්වා, (අනුන් ලවා) කරවා හෝ;- වික්ඛිත්තකං ෴පෙ෴ තබ්බො, මනසකාර පැවැත්වියයුතු; එත්ථ, මෙහි; උග්ගහනිමිත්තං පාකටන්තරං හුත්වා උපට්ඨාති, උද්ග්‍රහනිමිත්තය ප්‍රකටවූ අතුරු ඇතිව වැටහෙයි; පටිභාගනිමිත්තම්පන, ප්‍රතිභාගනිමිත්ත වනාහි; පරිපුණ්ණං හුත්වා උපට්ඨාති, පරිපූර්ණව වැටහේ; ෴පෙ෴ හතවික්ඛිත්තකම්පි, හත වික්ඛිත්තකයද; විච්ඡිද්දකෙ වුත්තප්පකාරෙසු යෙව ඨානෙසු, විච්ඡිද්දක අශුභයෙහි කියනලද ප්‍රකාර ඇති තැන්හිම; ලබ්භති, ලැබේ; තස්මා, එහෙයින්; තත්ථ ගන්ත්වා, එතනට ගොස්; වුත්තනයෙනෙව, කී නයින්ම; අඞ්ගුලඞ්ගුලන්තරං කත්වා වා කාරෙත්වා වා, අඟුල් අඟුල් අතුර ඇතියා කරවා හෝ කොට හෝ ෴පෙ෴ හතවික්ඛිත්තකපටික්කූලයයි මෙනෙහි කටයුතු; උග්ගහනිමිත්තං පනෙත්ථ, උද්ග්‍රහනිමිත්තය මෙහි වනාහි; පඤ්ඤායමාන පහාරමුඛං විය හොති, පැණෙන්නාවූ ප්‍රහාරමුඛ ඇත්තාමෙන් වේ ෴පෙ෴ ලොහිතකං, ලොහිතක අශුභය; යුද්ධමණ්ඩලාදීසු,

ලද්ධප්පහාරානං හත්ථපාදාදීසු වා ජාතෙසු භින්නගණ්ඩපිළකාදීනං වා මුඛතො පග්ඝරමානකාලෙ ලබ්භති. තස්මා තං දිස්වා ලොහිතක පටික්කූලං ලොහිතකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. එත්ථ උග්ගහනිමිත්තං වාතප්පහටා විය රත්තපටාකා චලමානාකාරං උපට්ඨාති. පටිභාගනිමිත්තම්පන සන්නිසින්නං හුත්වා උපට්ඨාති. පුළවකං ද්වීහතීහච්චයෙන කුණපස්ස නවහි වණමුඛෙහි කිමිරාසිපග්ඝරණකාලෙ හොති. අපි ච තං සොනසිගාල මනුස්සගොමහිස හත්ථි අස්ස අජගරාදීනං සරීරප්පමාණමෙව හුත්වා සාලිභත්තරාසි විය තිට්ඨති. තෙසු යත්ථ කත්ථචි පුළවකපටික්කූලං පුළවකපටික්කූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. චූළපිණ්ඩපාතිකතිස්සත්ථෙරස්ස කාළදීඝවාපියා අන්තො හත්ථිකුණපෙ නිමිත්තං උපට්ඨාසි. උග්ගහනිමිත්තම්පනෙත්ථ චලමානාකාරං හුත්වා උපට්ඨාති. පටිභාගනිමිත්තං සාලිභත්තපිණ්ඩො විය සන්නිසින්නං හුත්වා උපට්ඨාති. අට්ඨිකං "සො

---

යුද්ධමණ්ඩලාදියෙහි; ("ලද්ධපහාරානං-ලද්ධානං පහාරානං"යි සම්බන්ධ කරනු) ලබ්ධවූ ප්‍රහාරයෙන්; හත්ථපාදාදීසුවා ජාතෙසු, හස්තපාදාදීන් කැපූකල්හිදු; භින්නගණ්ඩපිළකාදීනං වා, බිඳුන ගඩපොළ ආදීන්ගේද; මුඛතො, මුඛයෙන්; පග්ඝරමානකාලෙ, වැහෙනකල්හිද; ලබ්භති, ලැබේ; තස්මා, එහෙයින්; තං දිස්වා, ඒ ලොහිතකය දැක...පෙ... ලොහිතකපටික්කූලය ලොහිතක පටික්කූලයයි මෙනෙහි කටයුතු; එත්ථ, මේ ලොහිතකයෙහි; උග්ගහනිමිත්තං, උද්ග්‍රහනිමිත්තය; වාතප්පහටා විය රත්තපටාකා, වාතයෙන් පහරනලද රක්ත පතාක යක් මෙන්; චලමානකාරං, සැලෙන ආකාර ඇතිව; උපට්ඨාති, වැටහේ; පටිභාගනිමිත්තම්පන, ප්‍රතිභාගනිමිත්තය වනාහි; සන්නිසින්නං හුත්වා උපට්ඨාති, පොපිනැතිව වැටහේ; පුළවකං, පුළවක අශුභය; ද්වීහතීහච්චයෙන, දෙතුන් දවසක් ඇවෑමෙන්; කුණපස්ස, කුණපයාගේ; නවහිවණමුඛෙහි, නවව්‍රණමුඛයෙන්; කිමිරාසිපග්ඝරණකාලෙ හොති, පණුරුස් වැහෙනකල්හි වේ; අපිච, අනිකෙකුදු; තං, එය; සොනසිගාලමනුස්සගොමහිස හත්ථි අස්සඅජගරාදීනං, බලු කැණහිල් මිනිස් ගෙරි මී ඇත් අස් පිඹුරු ආදීන්ගේ; සරීරප්පමාණමෙව හුත්වා, සිරුර පමණවම; සාලිභත්තරාසි විය තිට්ඨති, හැල්බත් රැසක් මෙන් සිටී; තෙසු, ඔවුන් කෙරෙහි; යත්ථ කත්ථචි, යම්කිසි වෙක; පුළවකපටික්කූලං පුළවකපටික්කූලන්ති, පුළවක පටික්කූලය පුළවකපටික්කූලයයි...පෙ...චූළපිඩපාතික තිස්සත්ථෙරස්සහි, චූළපිඩපාතිකතිස්ස නම් තෙරුන්ට; කාළදීඝවාපියා, කළුදික්වැවේදී; අන්තොහත්ථිකුණපෙ නිමිත්තං උපට්ඨාසි, ඇතුළු ඇත්කුණපයෙහි නිමිත්තය වැටහිණි; උග්ගහනිමිත්තං පනෙත්ථ, මෙහි උද්ග්‍රහනිමිත්තය වනාහි; චලමානාකාරං හුත්වා, සැලෙන ආකාර ඇතිව; උපට්ඨාති, වැටහේ; පටිභාගනිමිත්තම්පන, ප්‍රතිභාග නිමිත්තය වනාහි; සාලිභත්ත පිණ්ඩො විය, හැල් බත්පිඩක් මෙන්; සන්නිසින්නං හුත්වා උපට්ඨාති,

පස්සෙය්‍ය සරීරං සීවථිකාය ඡඩ්ඩිතං අට්ඨිකසඞ්ඛලිකං සමංසලොහිතං නහාරුසම්බන්ධං"ති ආදිනා නයෙන නානප්පකාරතො වුත්තං. තස්මා යත්ථ තං නික්ඛිත්තං හොති, තත්ථ පුරිමනයෙනෙව ගන්ත්වා සමන්තා පාසාණාදීනං වසෙන සනිමිත්තං සාරම්මණං කත්වා ඉදං අට්ඨිකන්ති සභාවභාවතො උපලක්ඛෙත්වා වණ්ණාදිවසෙන එකාදසහාකාරෙහි නිමිත්තං උග්ගහෙතබ්බං. තං පන වණ්ණතො සෙතන්ති ඔලොකෙන්තස්ස න උපට්ඨාති, ඔදාතකසිණසම්භෙදො හොති, තස්මා අට්ඨිකන්ති පටික්කූලවසෙනෙව ඔලොකෙතබ්බං ෴

(අ) ලිඞ්ගන්ති ඉධ හත්ථාදීනං නාමං, තස්මා හත්ථපාද සීස උදර බාහුකටි ඌරුජඞ්ඝානං වසෙන ලිඞ්ගතො වවත්ථපෙතබ්බං. දීඝරස්ස වට්ටචතුරස්ස ඛුද්දකමහන්තවසෙන පන සණ්ඨානතො වවත්ථපෙතබ්බං. දිසොකාසා වුත්තනයා එව, තස්ස තස්ස අට්ඨිනො

---

පොපි නැතිව වැටහේ; (අට්ඨිකං වුත්තං යි යොදනු) අට්ඨිකං, අට්ඨික අශුභය; සො, හෙතෙම; සීවථිකාය ඡඩ්ඩිතං, සොහොන්හි දමනලද; සරීරං පස්සෙය්‍ය, ශරීරය දක්නේද; අට්ඨිකසඞ්ඛලිකං, ඇටසැකිලිවූ; සමංසලොහිතං, මස් ලේ සහිතවූ; නහාරුසම්බන්ධන්ති ආදිනා නයෙන, නහරින් බඳනාලද යනාදී නයින්; නානප්පකාරතො වුත්තං, අනෙක ප්‍රකාරයෙන් කියනලදී; තස්මා, එහෙයින්; යත්ථ, යම්තැනෙක; තං නික්ඛිත්තං හොති, ඒ අට්ඨිසඞ්ඛලිකය නික්ෂිප්ත වේද; තත්ථ, එතැනට; පුරිමනයෙනෙව ගන්ත්වා, උද්ධුමාතක අශුභයෙහි කී නයින්ම ගොස්; සමන්තා, හාත්පස්හි; පාසාණාදීනං වසෙන, පාසාණාදීන්ගේ වශයෙන්; සනිමිත්තං සාරම්මණං කත්වා, සනිමිත්ත සාරම්මණ කොට; ඉදං අට්ඨිකන්ති, මේ අට්ඨිකයයි; සභාව භාවතො උපලක්ඛෙත්වා, තමාගේ ස්වභාවයෙන් සලකා; වණ්ණාදිවසෙන, වර්ණාදිවශයෙන්; එකාදසහාකාරෙහි, එකොළොස් ආකාරයෙකින්; නිමිත්තං උග්ගහෙතබ්බං, නිමිත්තය උගතයුතු; තං පන, ඒ අට්ඨිකය වනාහි; වණ්ණතො සෙතන්ති ඔලොකෙන්තස්ස, වර්ණහෙයින් සුදුයයි බලන්නහුට; න උපට්ඨාති, ස්වභාවභාවයෙන් නොවැටහෙයි; (පිළිකුල් විසින් නොවැටහේ යන අර්ථයි) ඔදාතකසිණසම්භෙදො හොති, ඔදාතකසිණය හා මුසු වේ; තස්මා, එහෙයින්; අට්ඨිකන්ති පටික්කූලවසෙනෙව ඔලොකෙතබ්බං, අට්ඨිකයයි පිළිකුල්විසින්ම බැලියයුතු෴

(අ) ලිඞ්ගන්ති, ලිඟුයයි; ඉධ, මෙතන; හත්ථාදීනං නාමං, හස්තාදීන්ට නම්; තස්මා, එහෙයින්; හත්ථපාදසීස උදරබාහුකටි ඌරුජඞ්ඝානං වසෙන, අතය පයය හිසය බඩය බාහුය කටිය කලවය සිහින්කකුලය යන මොවුන්ගේ වශයෙන්; ලිඞ්ගතො වවත්ථපෙතබ්බං, ලිඟුහෙයින් ව්‍යවස්ථාකටයුතු; දීඝරස්සවට්ට චතුරස්ස ඛුද්දකමහන්තවසෙන පන, දිග ලුහුඬවට සතරැස කුඩාව මහත යන මොවුන්ගේවශයෙන් වනාහි; සණ්ඨානතො වවත්ථපෙතබ්බං, සටහන් හෙයින් ව්‍යවස්ථා කටයුතු; දිසොකාසා, දිශාය අවකාශය යන මොහු;

පරියන්තවසෙන පරිච්ඡෙදතො වවත්ථපෙත්වා යදෙවෙත්ථ පාකටං හුත්වා උපට්ඨාති, තං ගහෙත්වා අප්පණා පාපුණිතබ්බා. තස්ස තස්ස අට්ඨිනො නින්නට්ඨාන ථලට්ඨාන වසෙන පන නින්නතො ථලතො ච වවත්ථපෙතබ්බං. පදෙසවසෙනපි අහං නින්නෙ අට්ඨිථලෙ අහං වා ථලෙ අට්ඨිනින්නෙති පි වවත්ථපෙතබ්බං. ද්වින්නං පන අට්ඨිකානං ඝටිත ඝටිතට්ඨානවසෙන සන්ධිතො වවත්ථපෙතබ්බං. අට්ඨිකානං යෙව අන්තරවසෙන විවරවිවරතො වවත්ථපෙතබ්බං. සබ්බත්ථෙව පන ඤාණං චාරෙත්වා ඉමස්මිං ඨානෙ ඉදමට්ඨීති සමන්තතො වවත්ථපෙතබ්බං. එවම්පි නිමිත්තෙ අනුපට්ඨහන්තෙ නලාටට්ඨිම්හි චිත්තං ඨපෙතබ්බං. යථා චෙත්ථ එවං ඉදං එකාදසවිධෙන නිමිත්තග්ගහණං ඉතො පරෙසුපි පුළවකාදිසු යුජ්ජමානවසෙන සල්ලක්ඛෙතබ්බං.

---

වුත්තනයා එව, කියනලද නය ඇත්තාහු මැයි; තස්ස තස්ස අට්ඨිනො පරියන්තවසෙන, ඒ ඒ අස්ථිහුගේ පර්‍යන්තවශයෙන්; පරිච්ඡෙදතො වවත්ථපෙත්වා, පරිච්ඡෙද විසින් ව්‍යවස්ථාකොට; යදෙවෙත්ථ පාකටං හුත්වා උපට්ඨාති, මේ අට්ඨිසඞ්ඛලිකයෙහි යමෙක් පහළව වැටහේද; තං ගහෙත්වා, ඒ ගෙන, අප්පණා පාපුණිතබ්බා, අර්පණාතොමෝ පැමිණියයුතු වේ; තස්ස තස්ස අට්ඨිනො ඒ ඒ අස්ථිහුගේ නින්නට්ඨාන ථලට්ඨාන වසෙන පන, උස්තැන් මිටිතැන් විසින් වනාහි; නින්නතො ථලතො ච වවත්ථපෙතබ්බං, උස්හෙයින් මිටිහෙයින් නියමකටයුතු; පදෙසවසෙන පි, ප්‍රදෙශවිසිනුදු; අහං නින්නෙ, මම මිටිතැනය; අට්ඨිථලෙ, ඇට ගොඩතැනය; අහං වා ථලෙ, මම හෝ ගොඩතැනය; අට්ඨිනින්නෙති පි, ඇට මළුතැනයයි; වවත්ථපෙතබ්බං, නියමකටයුතු; ද්වින්නම්පන අට්ඨිකානං ඝටිත ඝටිතට්ඨාන වසෙන, දෙදෙඇට ගැළපුණුතැන් විසින්; සන්ධිතො, සන්ධිහෙයින් ("වවත්ථපෙතබ්බං" යනුයෙහි අර්ථ කී නයින්ම දතයුතු) අට්ඨිකානං යෙව, අස්ථින්ගේම; අන්තරවසෙන, අතුරු විසින් හෝ; විවරවිවරතො, විවර විවර හෙයින් ...පෙ... සබ්බත්ථෙව පන ඤාණං චාරෙත්වා, සියලු ඇටසැකිල්ලෙහිම සියලු ඇටයෙහිම හෝ නුවණ හසුරුවා; ඉමස්මිං ඨානෙ, මෙතන; ඉදමට්ඨීති, මේ ඇටයයි; සමන්තතො, හාත්පසින් ...පෙ... එවම්පි, මෙසේද මෙනෙහි කරන්නාහට; නිමිත්තෙ අනුපට්ඨහන්තෙ, නිමිත්තය නොවැටහෙනකල්හි; නලාටට්ඨිම්හි චිත්තං ඨපෙතබ්බං, නළල් ඇට සිත තිබියයුතු; එත්ථ, මෙහි; (අට්ඨික අශුභයෙහි) යථා, යම්සේද; එවං, එපරිද්දෙන්ම; ඉදං එකාදසවිධෙන නිමිත්තග්ගහණං, මේ එකාදශ ප්‍රකාරයෙන් නිමිත්තග්‍රහණය; ඉතො පරෙසුපි පුළවකාදිසු, මෙයින් අන්‍යවූ පුළවකාදීන් කෙරෙහිදු; යුජ්ජමාන වසෙන, (ඒ ඒ නිමිත්තයට) යෙදෙන යෙදෙන විසින්; සල්ලක්ඛෙතබ්බං, සැලකියයුතු; (යම් නිමිත්තග්‍රහණයෙක් යම්තැනෙක යෙදේද ඒ ඒ සැලකියයුතුය යන අර්ථයි) ඉදංච පන කම්මට්ඨානං, මේ කමටහන; සකලායපි අට්ඨිකසඞ්ඛලිකාය, සියලු ඇටසැකිල්ලෙහිදු;

ඉදඤ්ච පන කම්මට්ඨානං සකලායපි අට්ඨිකසඞ්ඛලිකාය එකස්මිම්පි අට්ඨිකෙ සම්පජ්ජති. තස්මා තෙසු යත්ථකත්ථචි එකාදසවිධෙන නිමිත්තං උග්ගහෙත්වා අට්ඨිකපටිකූලං අට්ඨිකපටිකූලන්ති මනසිකාරො පවත්තෙතබ්බො. ඉධ උග්ගහනිමිත්තම්පි පටිභාගනිමිත්තම්පි එකසදිසමෙව හොතීති වුත්තං, තං එකස්මිං අට්ඨිකෙ යුත්තං. අට්ඨිසඞ්ඛලිකාය පන උග්ගහනිමිත්තෙ පඤ්ඤායමාන විවරතා, පටිභාගනිමිත්තෙ පරිපුණ්ණභාවො යුජ්ජති, එකට්ඨිකෙපි ච උග්ගහනිමිත්තෙන බීභච්ඡෙන භයානකෙන භවිතබ්බං. පටිභාගනිමිත්තෙන පීතිසොමනස්සජනකෙන, උපචාරාවහත්තා. ඉමස්මිං ඔකාසෙ යං අට්ඨකථාසු වුත්තං, තං චාරං දත්වා ච වුත්තං, තථා හි. තත්ථ චතූසු බ්‍රහ්මවිහාරෙසු දසසුච අසුභෙසු පටිභාගනිමිත්තං නත්ථි, බ්‍රහ්මවිහාරෙසු හි සීමසම්භෙදො යෙව නිමිත්තං දසසුච අසුභෙසු නිබ්බිකප්පං කත්වා පටිකූලභාවෙ යෙව දිට්ඨෙ නිමිත්තං නාම හොතීති වත්වාපි පුන අනන්තරමෙව දුවිධං ඉධ නිමිත්තං උග්ගහනිමිත්තං පටිභාගනිමිත්තං උග්ගහනිමිත්තං විරූපබීභච්ඡං භයානකං හුත්වා උපට්ඨාතීති වුත්තං. තස්මා විචාරෙත්වා යං අවොචුම්හ, ඉදමෙව චෙත්ථ යුත්තං අපිච:- මහාතිස්සත්ථෙරස්ස දන්තට්ඨිකමත්තාලොකනෙන සකලිත්ථිසරීරස්ස අට්ඨිසඞ්ඛාටභාවෙන උපට්ඨානාදීනි චෙත්ථ නිදස්සනානීති.

---

එකස්මිම්පි අට්ඨිකෙ එකඇටෙකද, සම්පජ්ජති, සිඬවේ; තස්මා, එහෙයින්; තෙසු, අට්ඨිසඞ්ඛලිකය අට්ඨිකය යන මොවුන් කෙරෙහි; යත්ථකත්ථචි, යම් කිසිවෙක; එකාදසවිධෙන නිමිත්තං උග්ගහෙත්වා, එකොළොස් ප්‍රකාරයෙකින් නිමිත් උගෙන; අට්ඨික...පෙ...තබ්බො, අට්ඨිසඞ්ඛලිකය අට්ඨිසඞ්ඛලිකයයි මනසකාර පැවැත්වියයුතු; උග්ගහනිමිත්තං පටිභාගනිමිත්තම්පි, උද්ග්‍රහනිමිත්තයද ප්‍රතිභාග නිමිත්තයද; එකසදිසමෙව හොතීති, එක්වැනිමද වෙයි; වුත්තං, (අටුවායෙහි) කියනලදී; තං, හේ වචනය; එකස්මිං අට්ඨිකෙ යුත්තං, එකම ඇටහි යෙදේ; (යමසේ විනීලකාදියෙහි උභයනිමිත්තයන්ගේ යථායොගයෙන් වර්‍ණවිශෙෂ හෙයින් පරිපූර්‍ණාපරිපූර්‍ණ හෙයින් විවරාවිවර හෙයින් චලාචල හෙයින්ද විශෙෂය ලැබේද එසේ මෙහි නොලැබේනුයි "එකස්මිං අට්ඨිකෙ" යන වචනය කියනලද, හැම පරිද්දෙන්ම විශෙෂය නැති හෙයින් නොවෙයි දතයුතු. එහෙයින් "එක අට්ඨිකෙපි ච" යනාදි කීහු.) අට්ඨිසඞ්ඛලිකාය පන, ඇටසැකිල්ලෙහි වනාහි; උග්ගහනිමිත්තෙ, උද්ග්‍රහනිමිත්තයෙහි; පඤ්ඤායමාන විවරතා, පැනෙන්නාවූ විවර ඇතිබව; පටිභාගනිමිත්තෙ, ප්‍රතිභාග නිමිත්තයෙහි; පරිපුණ්ණභාවො යුජ්ජති, පරිපූර්‍ණබව යෙදේද; එක අට්ඨිකෙපි ච, එකඇටද; උග්ගහනිමිත්තෙන, උද්ග්‍රහනිමිත්තයා විසින්; බීභච්ඡෙන, විරූපවූවහු විසින් (සුවිභූත අට්ඨිරූපතා අට්ඨිභාවෙනෙව විරූපෙනා යන අර්‍ථයි.) භයානකෙන, එහෙයින්ම සෙසු සත්ත්වයන්ට භය එළවන්නහු විසින්ම; භවිතබ්බං, වියයුතු; පටිභාගනිමිත්තෙන, ප්‍රතිභාගනිමිත්තයා විසින්; උපචාරාවහත්තා, (භාවනාවිශෙෂයෙන් මටසිළුටුව වැටහි) උපචාරධ්‍යානය එළවන බැවින්; සොමනස්සජනකෙන භවිතබ්බං, ප්‍රීතිසෞමනස්‍ය උපයන්නහු විසින් වියයුතු...පෙ...

155 ඉති අසුභානි සුභ ගුණො දසසතලොචනෙන ථුතකිත්ති,
යානි අවොච දසබලො එකෙකජ්ඣානහෙතූනි.

156 එවං තානි ච තෙසඤ්ච භාවනානයමිමං විදිත්වාන,
තෙසෙවව අයං භිය්‍යො පකිණ්ණකකථාපි විඤ්ඤෙය්‍යා.

(අ) එතෙසු හි යත්ථ කත්ථචි අධිගතජ්ඣානො සුවික්ඛම්භිතරාගත්තා වීතරාගො විය නිල්ලොලුප්පචාරො හොති. එවං සන්තෙපි ය්වායං අසුභප්පභෙදො වුත්තො, සො සරීරසභාවප්පත්තිවසෙන ච රාගචරිතභෙදවසෙන චාති වෙදිතබ්බො. ඡවසරීරං හි පටික්කූලභාවං ආපජ්ජමානං උද්ධුමාතකසභාවප්පත්තං වා සියා, විනීලකාදීනං වා අඤ්ඤතරසභාවප්පත්තං. ඉති යාදිසං යාදිසං සක්කා හොති ලද්ධුං, තාදිසෙ

---

155. ඉති, මෙසේ; සුභගුණො, සවාසනා සර්වක්ලෙශ ප්‍රහාණයෙන් පරිශුද්ධ ගුණ ඇතිවූ; දසසතලොචනෙන, සහස්‍රාක්ෂ නම් දෙවෙන්ද්‍රයා විසින්; ථුතකිත්ති. සො ධීරො සබ්බධි දන්තො යනාදීන් ස්තුතිකරන ලද කීර්ති ඇතිවූ; දසබලො, දශබලතෙමේ; එකෙකජ්ඣාන හෙතූනි එකි එකි ධ්‍යානයට හෙතුවූ; යානි අසුභානි අවොච, යම් දශවිධ අශුභකෙනෙකුන් කීද.

156. තානි ච, ඒ දශඅශුභයන්ද; තෙසං, ඒ දශඅශුභයන්ගේ; ඉමං භාවනානයං ච, මේ භාවනානයද; එවං විදිත්වාන, මෙසේ දැන; තෙසෙවව, එම අශුභයන් කෙරෙහිම; භිය්‍යො, නැවත; අයං පකිණ්ණක කථාපි, මේ පකිණ්ණක කථාවද; විඤ්ඤෙය්‍යා, දතයුත්තීයි.

(අ) එතෙසු හි, මේ අශුභයන් කෙරෙහි; යත්ථ කත්ථචි අධිගතජ්ඣානො, යම් කිසිවෙක පැමිණෙනලද ධ්‍යාන් ඇත්තේ; සුවික්ඛම්භිත රාගත්තා, (සෘජු ප්‍රතිපක්ෂ අශුභධ්‍යානයෙන්) මනාවවික්ඛම්භිතවූ රාග ඇතිබැවින්; වීතරාගො විය, වීතරාගයකු මෙන්; නිල්ලොලුප්පචාරො හොති, අලොලභාවයෙන් හැසිරීමක් වේ; එවං සන්තෙපි, එසේවතුදු; ය්වායං අසුභප්පභෙදො වුත්තො, යම් මේ උද්ධුමාතකාදි අශුභභෙදයෙක් කියනලදද; සො, හෙතෙම; සරීර සභාවප්පත්තිවසෙන, ශරීරය තමාගේ උද්ධුමාතකාදි ස්වභාවයට පැමිණීම් වශයෙන්ද; රාගචරිතභෙද වසෙන ච, රාගචරිත විභාගවශයෙනුදු; වෙදිතබ්බො, දතයුතු; ඡවසරීරං හි, ශව ශරීරය; පටික්කූලභාවං ආපජ්ජමානං, පිළිකුල්බවට පැමිණෙන්නේ; උද්ධුමාතකසභාවප්පත්තං වා සියා, උද්ධුමාතකස්වභාවයට පැමිණියේ හෝ වන්නේය; විනීලකාදීනං අඤ්ඤතරසභාවප්පත්තං, විනීලකාදීන් කෙරෙන් එක්තරා ස්වභාවයකට පැමිණියේ හෝ වන්නේයි; ඉති, මෙසේ; යාදිසං යාදිසං සක්කා හොති ලද්ධුං, යම් යම් බඳු අශුභයක් ලබන්නට පිළිවන්වේද; තාදිසෙ තාදිසෙ, එබඳු එබඳුවූ අශුභයෙහි; උද්ධුමාතකපටික්කූලං විනීලකපටික්කූලන්ති, උද්ධුමාතකපටික්කූලය

තාදිසෙ උද්ධුමාතකපටික්කූලං විනීලකපටික්කූලන්ති එවං නිමිත්තං ගණ්හිතබ්බමෙවාති සරීරසභාවප්පත්තිවසෙන දසධා අසුභප්පභෙදො වුත්තොති වෙදිතබ්බො.

(අ) විසෙසතො චෙත්ථ උද්ධුමාතකං සරීරසණ්ඨානවිපත්තිප්පකාසනතො සණ්ඨානරාගිනො සප්පායං, විනීලකං ඡවිරාගවිපත්තිප්පකාසනතො සරීරවණ්ණරාගිනො සප්පායං, විපුබ්බකං කායවණ්ණපටිබද්ධස්ස දුග්ගන්ධභාවස්ස පකාසනතො මාලාගන්ධාදිවසෙන සමුට්ඨාපිත සරීරගන්ධරාගිනො සප්පායං, විච්ඡිද්දකං අන්තොසුසිරභාවප්පකාසනතො සරීරෙ ඝනභාවරාගිනො සප්පායං, වික්ඛායිතකං මංසූපචයසම්පත්ති විනාසප්පකාසනතො ථනාදිසු සරීරප්පදෙසෙසු මංසූපචයරාගිනො සප්පායං, වික්ඛිත්තකං අඞ්ගපච්චඞ්ගානං වික්ඛෙපප්පකාස

---

විනීලකපටික්කූලයයි; එවං, මෙසේ; නිමිත්තං ගණ්හිතබ්බමෙවාති, නිමිත්තය ගතයුතුම වෙයි; සරීරසභාවප්පත්තිවසෙන, ශරීරය තමාගේ උද්ධුමාතකාදිස්වභාවයට පැමිණීම විසින්; දසධා අසුභප්පභෙදො වුත්තොති, දශපරිච්ඡෙදකින් අශුභප්‍රභෙදය කියනලදැයි; වෙදිතබ්බො, දතයුතුයි.

(අ) එත්ථ ච, මෙහි වනාහි; විසෙසතො, වෙසෙසින්; උද්ධුමාතකං, උද්ධුමාතක අශුභය; සරීරසණ්ඨානවිපත්තිප්පකාසනතො, සූනභාවයෙන් මනාවූ ශරීරසංස්ථානභාවයාගේ විපත්තිය ප්‍රකාශකරන බැවින්; සණ්ඨානරාගිනො, සංස්ථාන සම්පත්තියෙහි රාග ඇත්තාහට; සප්පායං, (සංස්ථානරාගයාගේ විෂ්කම්භනයට උපායබැවින්) සැප වේ; විනීලකං විනීලක අශුභය; ඡවිරාගවිපත්තිප්පකාසනතො, ඡවිවර්ණයාගේ විපත්තිය ප්‍රකාශකරන බැවින්; සරීරවණ්ණරාගිනො සප්පායං, ශරීර වර්ණයෙහි රාග ඇත්තාහට සැපයි; විපුබ්බකං, විපුබ්බකය තෙමේ; කායවණ්ණපටිබද්ධස්ස, කායප්‍රතිබද්ධවූ; දුග්ගන්ධභාවස්ස පකාසනතො, දුර්ගන්ධබව ප්‍රකාශකරන බැවින්; ("කායො එව කායවණ්ණං"යි ගන්නේ) මාලාගන්ධාදිවසෙන, මාලාගන්ධාදි වශයෙන්; සමුට්ඨාපිත සරීරගන්ධරාගිනො, උපදවනලද ශරීරගන්ධයෙහි රාග ඇත්තාහට; සප්පායං, සැපයි; විච්ඡිද්දකං, විච්ඡිද්දක අශුභය; අන්තොසුසිරභාවප්පකාසනතො, ඇතුළෙහි විවර ඇතිබව ප්‍රකාශකරන බැවින්; සරීරෙ ඝනභාවරාගිනො, ශරීරයෙහි අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ ස්ථිරභාවය පිණිස උපදනා රාග ඇත්තාහට; සප්පායං, සැපවේ; වික්ඛායිතකං, වික්ඛායිතක අශුභය; මංසූපචය සම්පත්ති විනාසප්පකාසනතො, මාංසූපචය සම්පත්තියගේ විනාශය ප්‍රකාශකරන බැවින්; ථනාදිසු සරීරප්පදෙසෙසු, තන කලවා ආදී ශරීරප්‍රදෙශයෙහි; මංසූපචය රාගිනො සප්පායං, මස් වැඩීම පිණිස උපදනා රාග ඇත්තාහට සැප වේ; වික්ඛිත්තකං, වික්ඛිත්තක අශුභය; අඞ්ගපච්චඞ්ගානං වික්ඛෙපප්පකාසනතො, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ වික්ෂෙපය ප්‍රකාශකරන හෙයින්;

නතො අඞ්ගපච්චඞ්ගලීලාරාගිනො සප්පායං, හතවිච්ඡිද්දකං සරීරසඞ්ඝාතභෙදවිකාරප්පකාසනතො සරීරසඞ්ඝාතසම්පත්තිරාගිනො සප්පායං, ලොහිතකං ලොහිතමක්ඛිත පටික්කූලභාවප්පකාසනතො අලඞ්කාරජනිත සොභාරාගිනො සප්පායං, පුළවකං කායස්ස අනෙක කිමිකුලසාධාරණභාවප්පකාසනතො කායෙ මමත්තරාගිනො සප්පායං, අට්ඨිකං සරීරට්ඨීනං පටික්කූලභාවප්පකාසනතො දන්තසම්පත්ති රාගිනො සප්පායන්ති. එවං රාගචරිතප්පභෙදවසෙනාපි දසධා අසුභප්පභෙදො වුත්තොති වෙදිතබ්බො.

(අ) යස්මා පන දසවිධෙපි එතස්මිං අසුභෙ සෙය්‍යථාපි නාම අපරිසණ්ඨිතජලාය සීඝසොතාය නදියා අරිත්තබලෙනෙව නාවා තිට්ඨති, විනා අරිත්තෙන න සක්කා ඨපෙතුං, එවමෙව දුබ්බලත්තා ආරම්ම

---

අඞ්ගපච්චඞ්ගලීලාරාගීනො සප්පායං, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ ලීලාව පිණිස උපදනා රාග ඇත්තාහට සැපවේ; (මෙබඳු අනවස්ථිත ස්වරූප ඇති අවයවයන්ගේ කවර ලීලාවිලාසයෙක්දැයි විරාගය සම්භව වන බැවිනි) හතවිච්ඡිද්දකං, හතවිච්ඡිද්දක අශුභය; සරීරසඞ්ඝාතභෙද විකාරප්පකාසනතො, ශරීරසඞ්ඝාතයාගේ භෙදයන් පහළකරන බැවින් (භෙදෙ එව විකාරො ති ගන්නේ.) සරීරසඞ්ඝාතසම්පත්ති රාගිනො, ශරීරසඞ්ඝාතයාගේ සම්පත්තිරාගය ඇත්තාහට; සප්පායං, සැපවේ; ලොහිතකං, ලොහිතක අශුභය; ලොහිතමක්ඛිතපටික්කූල භාවප්පකාසනතො, ලෙහෙයෙන් වැකි පිළිකුල්බව පහළකරන බැවින්; අලඞ්කාරජනිතසොභාරාගිනො, අලඞ්කාරයෙන් ජනිත සොභායෙහි රාගඇත්තාහට; සප්පායං, සැපවේ; පුළවකං, පුළවක අශුභය; කායස්ස, ශරීරයාගේ; අනෙකකිමිකුල සාධාරණභාවප්ප කාසනතො, නොයෙක් පණුකුලයන්ට සාධාරණබව පහළකරන බැවින්; කායෙ, ශරීරයෙහි; මමත්තරාගිනො සප්පායං, මමත්වයෙන් ඇලුම්කරන්නාහට සැපවේ; අට්ඨිකං, අස්ථික අශුභය; සරීරට්ඨීනං පටික්කූලභාවප්පකාසනතො, ශරීරයෙහි ඇට පිළිකුල්බව පහළකරන බැවින්; දන්තසම්පත්තිරාගිනො සප්පායං, දන්තසම්පත්තියෙහි රාග ඇත්තාහට සැපයයි; එවං, මෙසේ; රාගචරිතප්පභෙදවසෙනාපි, රාගචරිතයාගේ ප්‍රභෙද විසිනුදු; දසධා අසුභප්පභෙදො වුත්තොති වෙදිතබ්බො, දශපරිද්දෙකින් අශුභවිභාගය කියනලදැයි දත යුත්තේයි.

(අ) යස්මා පන, යම්හෙයකින් වනාහි; දසවිධෙපි එතස්මිං අසුභෙ, දශප්‍රකාරවූ මේ අශුභයෙහි; සෙය්‍යථාපි නාම, යම්සේ; අපරිසණ්ඨිත ජලාය, නොසිටිනාවූ දිය ඇති; සීඝසොතාය නදියා, සීඝ්‍ර ශ්‍රොතස් ඇති නදියෙහි; අරිත්තබලෙනෙව නාවා තිට්ඨති, රිටිදණ්ඩහි බල යෙන්ම නැව සිටීද; විනා අරිත්තෙන, රිට නැතිව; න සක්කා ඨපෙතුං, සිටුවන්නට නොපිළිවන් වේද; එවමෙව, එපරිද්දෙන්ම; දුබ්බලත්තා

ණස්ස විතක්කබලෙනෙව චිත්තං එකග්ගං හුත්වා තිට්ඨති, විනා විතක්කෙන න සක්කා ඨපෙතුං, තස්මා පඨමජ්ඣානමෙවෙත්ථ හොති න දුතියාදීනි. පටික්කූලෙපිහි වෙ තස්මිං ආරම්මණෙ අද්ධා ඉමාය පටිපදාය ජරාමරණම්හා පරිමුච්චිස්සාමීති එවං ආනිසංසදස්සාවිතාය චෙව නීවරණසන්තාපප්පහානෙන ච පීතිසොමනස්සං උප්පජ්ජති බහුං දානි මෙ වෙතනං ලභිස්සාමීති ආනිසංසදස්සාවිනො පුප්ඵඡඩ්ඩකස්ස ගූථරාසිම්හි විය, උපසන්තබ්‍යාධිදුක්ඛස්ස රොගිනො වමනවිරෙචනප්පවත්තියං විය ච දසවිධම්පිචෙතං අසුභලක්ඛණතො එකමෙව හොති, දසවිධස්සාපි හි එතස්ස අසුචිදුග්ගන්ධජෙගුච්ඡපටික්කූලභාවො එව ලක්ඛණං, තදෙතං ඉමිනා ලක්ඛණෙන න කෙවලං මතසරීරෙ, දන්තට්ඨිකදස්සාවිනො පන චෙතියපබ්බතවාසී මහාතිස්සත්ථෙරස්ස විය, හත්ථික්ඛන්ධගතං රාජානං ඔලොකෙන්තස්ස සඞ්ඝ

---

ආරම්මණස්ස, (පිළිකුල් බැවින් තමාකෙරෙහි සිත පිහිටුවන්නට අසමර්ථව) අරමුණු දුබුල් බැවින්; විතක්කබලෙනෙව, (අභිනිරෝපන ලකුණු) විතර්ක බෙලෙන්ම; චිත්තං එකග්ගං හුත්වා තිට්ඨති, සිත එකඟව සිටී; විනා විතක්කෙන, විතර්ක නැතිව; න සක්කා ඨපෙතුං, සිටුවන්නට නොපිළිවන් වේ; තස්මා, එහෙයින්; පඨමජ්ඣානමෙවෙත්ථ හොති, මෙහි ප්‍රථමධ්‍යාන්හුම වෙයි; න දුතියාදීනි, (සිත්හු භාවනා බෙලෙන් යුක්තවූවද අරමුණු දුබුල්බැවින්) අවිතර්ක ද්විතීයාදි ධ්‍යාන්හු නොවෙත්; පටික්කූලෙපි එතස්මිං ආරම්මණෙ, පිළිකුල්ද වූ මේ අරමුණෙහි; අද්ධා, එකාන්තයෙන්; ඉමාය පටිපදාය, මේ පිළිවෙතින්; ජරාමරණම්හා පරිමුච්චිස්සාමීති, ජරාමරණින් මිදෙමියි; එවං ආනිසංසදස්සාවිතාය චෙව, මෙසේ අනුසස් දක්නා බැවින්ද; නීවරණසන්තාපප්පහානෙන ච, නීවරණසන්තාපය පැහීමෙන්ද; පීතිසොමනස්සං උප්පජ්ජති, ප්‍රීතිසෞම්නස් උපදී; බහුං දානි මෙ වෙතනං ලභිස්සාමීති, දැන් මා බොහෝමිල ලැබෙමියි; ආනිසංසදස්සාවිනො පුප්ඵඡඩ්ඩකස්ස, අනුසස්දක්නාවූ පුප්සඬුවාහට; ගූථරාසිම්හි විය, අසුචිරැස මෙන්; උපසන්තබ්‍යාධිදුක්ඛස්ස රොගිනො, සන්හුන් ව්‍යාධිදුක් ඇති රෝගීහට; වමනවිරෙචනප්පවත්තියං විය ච, වමනවිරේචන ප්‍රවෘත්තියෙහිදු මෙනි; දසවිධම්පිචෙතං, දශවිධවූ මේ අශුභය; අසුභලක්ඛණතො එකමෙව හොති, අශුභලක්‍ෂණ හෙයින් එකෙක්ම වේ; දසවිධස්සාපි හි එතස්ස, දශවිධවූ මේ අශුභයාගේ; අසුචි දුග්ගන්ධජෙගුච්ඡ පටික්කූලභාවො එව ලක්ඛණං, ශුචි නොවනබවම දුර්ගන්ධබවම නින්දිතබවම පිළිකුල්බවම ලකුණුයි; තදෙතං ලක්ඛණං, ඒ මේ අශුභ ලක්‍ෂණය; ඉමිනා ලක්ඛණෙන (අසුචිදුග්ගන්ධ ජෙගුච්ඡ පටික්කූලභාව සඞ්ඛ්‍යාත) මේ ලකුණෙන්; න කෙවලං මතසරීරෙ (උපට්ඨාති, (යි යොදනු.) හුදක් මළසිරුරම වැටහෙන්නේ නොවෙයි; දන්තට්ඨික දස්සාවිනො, දතැට දුටු; චෙතියපබ්බතවාසී මහාතිස්සත්ථෙරස්ස විය, සෑගිරියේ විසූ මහාතිස්සනම් තෙරුන්ට මෙන්ද; හත්ථික්ඛන්ධ ගතං රාජානං ඔලොකෙන්තස්ස, ඇත්කඳහුන් රජහු බලන; සඞ්ඝරක්ඛිත

රක්ඛිතථෙරුපට්ඨාකසාමණෙරස්ස විය ච ජීවමානක සරීරෙපි උපට්ඨාති. යථෙව හි මතසරීරං එවං ජීවමානකම්පි අසුභමෙව, අසුභලක්ඛණං පනෙත්ථ ආගන්තුකෙන අලඞ්කාරෙන පටිච්ඡන්නත්තා න පඤ්ඤායති. පකතියා පන ඉදං සරීරං නාම අතිරෙකතිසතඅට්ඨිකසමුස්සයං, අසීතිසතසන්ධිසඞ්ඝටිතං, නවන්හාරුසතනිබද්ධං, නවමංසපෙසිසතානුලිත්තං, අල්ලචම්මපරියොනද්ධං, ඡවියා පටිච්ඡන්නං, ඡිද්දාවඡිද්දං, මෙදකථාලිකා විය නිච්චුග්ඝරිතපග්ඝරිතං, කිමිසඞ්ඝනිසෙවිතං, රොගානං ආයතනං, දුක්ඛධම්මානං වත්ථු, පරිභින්නපුරාණගණ්ඩො විය නවහි වණමුඛෙහි සතතවිස්සන්දනං, යස්ස උභොහි අක්ඛීහි අක්ඛිගූථකො පග්ඝරති, කණ්ණබිලෙහි කණ්ණගූථකො, නාසාපුටෙහි සිඞ්ඝාණිකා, මුඛතො ආහාරපිත්තසෙම්හරුධිරානි

---

ථෙරුපට්ඨාක සාමණෙරස්ස විය ච, සඞ්ඝරක්ඛිත නම් තෙරුන්ට උපස්ථානකරන හෙරණහට මෙන්ද; ජීවමානක සරීරෙපි උපට්ඨාති, නොමළ සිරුරෙහිද වැටහේ; යථෙව හි මතසරීරං, යම්සේ මළසිරුරු අශුභවේද; එවං, එපරිද්දෙන්ම ජීවමානකම්පි අසුභමෙව, ජීවමානක ශරීරයද අශුභම වේ; එත්ථ පන, මෙහි වනාහි; අසුභලක්ඛණං, අශුභ ලක්ෂණය; ආගන්තුකෙන අලඞ්කාරෙන, (පරිජග්ගන පූර්වකවූ) අමුතු අලඞ්කාරයෙන්; පටිච්ඡන්නත්තා, මුවහකරනලද හෙයින්; න පඤ්ඤායති, නොපැණේ; පකතියා පන, පියවින් වනාහි; ඉදං සරීරං නාම, මේ සිරුරු නම් තෙමේ; අතිරෙකතිසතඅට්ඨිකසමුස්සයං, දතැටුන් අධිකකොට ඇති තුන්සියයක් ඇටින් නැගෙන ලද්දේය; අසීති සතසන්ධි සඞ්ඝටිතං, එක්සියඅසූ සන්ධියෙකින් සන්ධි ගත්වනුලද්දේය; නවන්හාරුසතනිබද්ධං, නවසියයක් නහරින් වෙළනලද්දේය; නව මංසපෙසිසතානුලිත්තං, නවසියයක් මංසපෙසියෙන් ඇලෙවනලද්දේය; අල්ලචම්මපරියොනද්ධං, අලුත් මිනිස් සමින් වළදන ලද්දේය; ඡවියා පටිච්ඡන්නං, ඡවියෙන් මුවහකරනලද්දේය; ඡිද්දාවඡිද්දං, කුඩා මහත් සිදුරු ඇත්තේය; මෙදකථාලිකා විය නිච්චුග්ඝරිතපග්ඝරිතං, මේ තෙල්පිරූ බඳුනක මෙන් නිත්‍යයෙන් උඩිනුදු යටිනුදු සිලිසෙන්නේය; (සතත්‍යයෙහි සිටියෙනක කියන රඟ කළසේ පුසු-පුස වැහෙනුවහට සිදුරු කළමස් පිරූ බඳුනයෙක්ම) කිමිසඞ්ඝනිසෙවිතං, කෘමි සමූහයා විසින් සෙවුනාලද්දේය; රොගානං ආයතනං, චක්ඛුරොගාදී රොගයන්ට ආකරය; දුක්ඛධම්මානං වත්ථු, සියලු දුඃඛධර්මයන්ට පිහිටය; පරිභින්නපුරාණගණ්ඩො විය, බිඳුණු පරණ ගඩක් මෙන්; නවහි වණමුඛෙහි සතතවිස්සන්දනං, නවව්‍රණ මුඛයෙන් හැමවේලෙහිම වැහෙන්නේය; යස්ස, යම් ශරීරයක්හුගේ; උභොහි අක්ඛීහි, දෙඇසින්; අක්ඛිගූථකො පග්ඝරති, ඇස් මල වැහේද; කණ්ණබිලෙහි, කන්බිලයෙන්; කණ්ණගූථකො, කන් මල වැහේද; නාසාපුටෙහි; නාසාපුටයෙන්; සිඞ්ඝාණිකා, මූකුණුවැහේද; මුඛතො, මුවෙන්; ආහාරපිත්තසෙම්හරුධිරානි, ආහාරය පිත්ය

අධො වාරෙහි උච්චාරපස්සාවා, නවනවුතියා ලොමකූපසහස්සෙහි අසුචිසෙදයූසො පග්ඝරති, නීලමක්ඛිකාදයො සම්පරිවාරෙන්ති. යං දන්තකට්ඨමුඛධොවන සීසමක්ඛන නහාන නිවාසන පාපුරණාදීහි අප්පටිජග්ගිත්වා යථාජාතොව ඵරුසවිප්පකිණ්ණකෙසො හුත්වා ගාමෙන ගාමං විචරන්තො රාජාපි පුප්ඵඡඩ්ඩකචණ්ඩාලාදීසු අඤ්ඤතරොපි සමසරීරපටික්කූලතාය නිබ්බිසෙසො හොති, එවං අසුචිදුග්ගන්ධජෙගුච්ඡපටික්කූලතාය රඤ්ඤො වා චණ්ඩාලස්ස වා සරීරෙ වෙමත්තතං නාම නත්ථි. දන්තකට්ඨමුඛධොවනාදීහි පනෙත්ථ දන්තමලාදීනි පමජ්ජිත්වා නානාවත්ථෙහි හිරිකොපීනං පටිච්ඡාදෙත්වා නානාවණ්ණෙන සුරභිවිලෙපනෙන විලිම්පිත්වා පුප්ඵාභරණාදීහි අලඞ්කරිත්වා අහන්ති මමන්ති ගහෙතබ්බාකාරප්පත්තං කරොන්ති. තතො ඉමිනා ආගන්තුකෙන අලඞ්කාරෙන පටිච්ඡන්නත්තා තදස්ස යථාවසරසං අසුභ

---

සෙම්ය ලෙයෙය යන මොහු වැහෙද්ද; අධො වාරෙහි, යට දෙදොරින්; උච්චාරපස්සාවා, මලමූත්‍ර දෙක වැහෙද්ද; නව නවුතියා ලොමකූපසහස්සෙහි, නවානූදහසක් ලොමකූපයෙන්; අසුචිසෙද යූසො පග්ඝරති, අශුචි සෙවදයුස වැගේද; නීලමක්ඛිකාදයො සම්පරිවාරෙන්ති, (වෙෂ්ටාං මදමත්ව) නිලමැසි ආදීහු හාත්පසින් පිරිවරද්ද; (යං යනු මතුයෙහි "ගහෙතබ්බා කාරප්පත්තං කරොන්ති" යනු හා යොදනු.) දන්තකට්ඨ, දැවිටු; මුඛධොවන, මුව දෙවීම්; සීසමක්ඛන, හිසතෙල් ගෑගීම්; නහාන, නැගීම්; නිවාසන පාපුරණාදීහි, හැඳීම් පෙරවීම් ආදීන්; අප්පටිජග්ගිත්වා, නොපිළිදැගැ; යථා ජාතොව, උපන්වනම්; ඵරුසවිප්පකිණ්ණකෙසො හුත්වා, අළුවූ අවුල්වූ කෙස් ඇතිව; ගාමෙන ගාමං විචරන්තො රාජාපි, ගමින්ගමට ඇවිදිනා රජද; පුප්ඵඡඩ්ඩක චණ්ඩාලාදීසු අඤ්ඤතරො පි, පුප්සඩු සැඬොල් ආදීන් කෙරෙන් එක්තරා එකෙකුදු; සමසරීර පටික්කූලතාය, සමවූ සිරුරු පිළිකුල්බව ඇති බැවින්; නිබ්බිසෙසො හොති, නිර්විශෙෂ වේ; (වෙනසක් නැතිවේ) එවං, මෙසේ; අසුචි දුග්ගන්ධ ජෙගුච්ඡ පටික්කූලතාය, අශුචිදුර්ගන්ධනින්දිතප්‍රතිකූලභාවයෙන්; රඤ්ඤො, රජහුගේ වත්; චණ්ඩාලස්ස වා, සැඬොල්හුගේ වත්; සරීරෙ වෙමත්තතං නාම නත්ථි, ශරීරයෙහි වෙනසෙක් නම් නැති; දන්තකට්ඨ මුඛධොවනාදීහි පන, දැවිටුමුවදෙවීම් ආදියෙන් වනාහි; එත්ථ, මේ සිරුරෙහි දන්තමලාදීනි පමජ්ජිත්වා, දන්තමල ආදීන් පිරිසිදුකොට; නානාවත්ථෙහි, නානාවර්ණ වස්ත්‍රයෙන්; හිරිකොපීනං පටිච්ඡාදෙත්වා, ලජ්ජා තැන අඞ්ග මුවහකොට; නානාවණ්ණෙන සුරභිවිලෙපනෙන, නොයෙක් වර්ණඇති සුවඳවිලවුන්නෙන්; විලිම්පිත්වා, විලවුන් ගෙන; පුප්ඵාභරණාදීහි අලඞ්කරිත්වා, පුෂ්පයෙන් ආභරණයෙන් සැදී; අහන්ති මමන්ති ගහෙතබ්බාකාරප්පත්තං කරොන්ති, මමය මාගේයයි ගතයුතු ආකාරයට පැමිණියා කෙරෙද්ද; තතො, එහෙයින්; ඉමිනා ආගන්තුකෙන අලඞ්කාරෙන, මේ අමුතු අලඞ්කාරයෙන්;

ලක්ඛණං අජානන්තා පුරිසා ඉත්ථීසු, ඉත්ථියො ච පුරිසෙසු රතිං කරොන්ති. පරමත්ථතො පනෙත්ථ රඤ්ජිතබ්බකයුත්තට්ඨානං නාම අණුමත්තම්පි නත්ථි, තථාහි:- කෙසලොමනඛදන්ත ඛෙලසිඞ්ඝාණිකා උච්චාරපස්සාවාදිසු එක කොට්ඨාසම්පි සරීරතො බහිපතිතං සත්තා හත්ථෙන ඵුසිතුම්පි න ඉච්ඡන්ති අට්ටීයන්ති හරායන්ති ජිගුච්ඡන්ති. යං යං පනෙත්ථ අවසෙසං හොති, තං තං පටික්කූලම්පි සමානං අවිජ්ජන්ධකාරපරියොනද්ධා අත්තසිනෙහරාගරත්තා ඉට්ඨං කන්තං නිච්චං සුඛං අත්තාති ගණ්හන්ති. තෙ එවං ගණ්හන්තා අටවියං කිංසුකරුක්ඛං දිස්වා රුක්ඛතො අපතිතං අපතිතං පුප්ඵං අයං මංසපෙසි අයං මංසපෙසීති විහඤ්ඤමානෙන ජරසිගාලෙන සමානතං ආපජ්ජන්ති.

තස්මා-

---

පටිච්ඡන්නත්තා, මුවහකරනලද හෙයින්; අස්ස, ඒ ශරීරයාගේ; තං යථාවසරසං අසුභලක්ඛණං, ඒ යථාස්වභාවවූ අශුභලක්ෂණය; අජානන්තා පුරිසා, නොදන්නාවූ පුරුෂයෝ; ඉත්ථීසු, ස්ත්‍රීන් කෙරෙහිද; ඉත්ථියො ච, ස්ත්‍රීහුද; පුරිසෙසු, පුරුෂයන් කෙරෙහිදු; රතිං කරොන්ති, ආලය කෙරෙත්; පරමත්ථතො පන, පරමාර්ථ හෙයින් වනාහි; රඤ්ජිතබ්බයුත්තකට්ඨානං නාම, ඇලියයුතු තැනෙක්නම්; අණුමත්තම්පි නත්ථි, අණුමාත්‍රයෙකුදු නැති; තථා හි, එසේ මැයි; කෙසලොමනඛදන්තඛෙලසිඞ්ඝාණිකාඋච්චාරපස්සාවාදිසු, කෙස් ලොම් නිය දත් කෙලමුකුණු මලමුත්‍ර යනාදීන්; එකකොට්ඨාසම්පි, එක කොටසකුදු; සරීරතො බහිපතිතං, ශරීරයෙන් පිටත හුණුවා; සත්තා හත්ථෙන ඵුසිතුම්පි න ඉච්ඡන්ති, සත්ත්වයෝ අතින් පහරණටදු නොකමැති වෙත්; අට්ටීයන්ති, පීඩිතවෙත්; හරායන්ති, ලජ්ජා කෙරෙති; ජිගුච්ඡන්ති, පිළිකුල් කෙරෙත්; යං යං පනෙත්ථ අවසෙසං හොති, යමෙක් යමෙක් වනාහි මේ සිරුරු වෙහි අවශිෂ්ට වේද; තං තං පටික්කූලම්පි සමානං, ඒ ඒ පිළිකුල්වූවද; අවිජ්ජන්ධකාර පරියොනද්ධා, අවිද්‍යාන්ධකාරයෙන් වළඳනාලද; අත්තසිනෙහ රාගරත්තා, ආත්මස්නෙහ නැමැතිරාගයෙන් රත්වූවාහු; ඉට්ඨං කන්තං නිච්චං සුඛං අත්තාති ගණ්හන්ති, ඉෂ්ටය කාන්තය නිත්‍යය සුඛය ආත්මයයි ගනිති, තෙ එවං ගණ්හන්තා, මෙසේ ගන්නාවූ ඒ සත්ත්වයෝ අටවියං කිංසුකරුක්ඛං දිස්වා, අටවියෙහි කැල රුකක් දැක; රුක්ඛතො අපතිතං අපතිතං පුප්ඵං, රුකින් නොහුණු නොහුණු මල්; අයං මංසපෙසි අයං මංසපෙසීති, මේ මාංසපෙසිය මේ මාංස පෙසියයි; විහඤ්ඤමානෙන, ඊප්සිතාලාභයෙන් දුක්ඛයට පැමිණෙන්නාවූ; ජරසිගාලෙන, ජරසිවල් හා; සමානතං, සමබවට; ආපජ්ජන්ති, පැමිණෙත්.

තස්මා, එහෙයින්;-

157 යථා හි පුප්ඵිතං දිස්වා සිගාලො කිංසුකං වනෙ,
මංසරුක්ඛො මයා ලද්ධො ඉති ගන්ත්වාන වෙගසා.

158 පතිතං පතිතං පුප්ඵං ඩසිත්වා අතිලොලුපො,
නයිදං මංසං අදුං මංසං යං රුක්ඛස්මින්ති ගණ්හති.

159 කොට්ඨාසං පතිතං යෙව අසුභන්ති තථා බුධො,
අගහෙත්වාන ගණ්හෙය්‍ය සරීරට්ඨම්පි තං තථා.

160 ඉමං හි සුභතො කායං ගහෙත්වා තත්‍ථ මුච්ඡිතා,
බාලා කරොන්තා පාපානි දුක්ඛා න පරිමුච්චරෙ.

161 තස්මා පස්සෙය්‍ය මෙධාවී ජීවිතො වා මතස්ස වා,
සභාවං පූතිකායස්ස සුභභාවෙන වජ්ජිතං.

වුත්තං හෙතං.

162 දුග්ගන්ධො අසුචිකායො කුණපො උක්කරූපමො,
නින්දිතො චක්ඛුභූතෙහි කායො බාලාභිනන්දිතො.

---

157–158. වනෙ, වෙනෙහි; පුප්ඵිතං කිංසුකං දිස්වා, පිපි සිටි කැල රුකක් දැක; සිගාලො, ජරසිවලෙක්; මයා, මා විසින්; මංසරුක්ඛො ලද්ධො ඉති, මස්රුකෙක් ලබන ලදැයි; වෙගසා ගන්ත්වාන, වහා ගොසින්; අතිලොලුපො, ඉතා ලොල්වූයේ; පතිතං පතිතං පුප්ඵං ඩසිත්වා, රුකින් හුණු හුණු කැලමල් ඩැහැ බලා; නයිදං මංසං, මේ මස් නොවෙයි; යං රුක්ඛස්මිං, යමෙක් රුකැද; අදුං මංසන්ති, හේ මසැයි; යථාහි ගණ්හති, (යි යොදනු) යම්සේ ගනීද.

159. බුධො, නුවණැත්තේ; පතිතං යෙව කොට්ඨාසං, සිරුරින් ගිලිහුණු කෙල සෙම් සොටු ආදි කොටස්ම; අසුභන්ති, අශුභයයි; තථා අගහෙත්වාන, ඒ සිමල්හු සේ නොගෙන; සරීරට්ඨම්පි තං, සරීරස්ථ වූ ඒ කොටසද තථා ගණ්හෙය්‍ය, එසේම අශුභයයි ගන්නේයි.

160. ඉමං හි කායං, මේ කය; සුභතො ගහෙත්වා, ශුභහෙයින් ගෙන; තත්‍ථ මුච්ඡිතා, එහි මුළාවූ; බාලා, අඥනයෝ; පාපානි කරොන්තා, නොයෙක් පාපයන්කරන්නාහු; දුක්ඛා න පරිමුච්චරෙ, දුකින් නොමිදෙන්නාහුයි.

161. තස්මා, එහෙයින්; මෙධාවී, නුවණැත්තේ; ජීවිතො වා පූතිකායස්ස, ජීවමානවූ පූතිකායයාගේද; මතස්ස වා, මළ පූතිකායයාගේද; සුභභාවෙන වජ්ජිතං, ශුභබැවින් වර්ජිතවූ; සභාවං, ප්‍රතිකූල ස්වභාවය; පස්සෙය්‍ය, බලන්නේයි.

එතං, මේ; වුත්තං හි, කියේමැනු;

162. කායො, කායතෙමේ; දුග්ගන්ධො, දුර්ගන්ධය; අසුචි, ශුචි නොවන්නේය; කුණපො, කුණුය; උක්කරූපමො, කසළගොඩක් බඳුය (වච්ස්කූපයන් බඳුය හෝ) කායො, කායතෙම; චක්ඛුභූතෙහි, පිළිලද

178 අල්ලචම්මපටිච්ඡන්නො නවවාරෙ මහාවණො,
සමන්තතො පග්ඝරති අසුචි පූතිගන්ධියො.

164 සචෙ ඉමස්ස කායස්ස අන්තො බාහිරතො සියා,
දණ්ඩං නූන ගහෙත්වාන් කාකෙ සොණෙ ච වාරයෙ.

(අ) තස්මා දබ්බජාතිකෙන භික්ඛුනා ජීවමානසරීරං වා හොතු මත සරීරං වා යත්ථ යත්ථ අසුභාකාරො පඤ්ඤායති, තත්ථ තත්ථෙව නිමිත්තං ගහෙත්වා කම්මට්ඨානං අප්පනං පාපෙතබ්බන්ති.

ඉති සාධුජනපාමොජ්ජත්ථාය කතෙ විසුද්ධිමග්ගෙ
සමාධිභාවනාධිකාරෙ

## අසුභකම්මට්ඨානනිද්දෙසො නාම

ඡට්ඨො පරිච්ඡෙදො.

---

නුවණැස් ඇත්තහු විසින් නොහොත් ලොවට ඇස්වැන්නහු විසින්) නින්දිතො, නින්දාකරනලද; බාලාභිනන්දිතො, නුවණ නැත්තන් විසින් (සප්‍රීතික තෘෂ්ණායෙන්) ඇලෙනලද.

163. අල්ලචම්මපටිච්ඡන්නො, අලුත් සමින් වසනලද; නව වාරො, නවදොරක් ඇත්තේය; මහාවණො, මහත් ව්‍රණයෙක; සමන්තතො, හාත්පසින්; පූතිගන්ධියො, කුණුගඳ ඇති; අසුචි, නොසකස්; පග්ඝරති, වැහෙන්නේයි.

164. සචෙ, ඉදින්; ඉමස්ස කායස්ස, මේශරීරයාගේ; අන්තො, ඇතුළ; බාහිරතො සියා, පිටත්හි වී නම්; නූන, ඒකාන්තයෙන්; දණ්ඩං ගහෙත්වාන, දඬුවක්ගෙන; කාකෙ, කවුඩන්ද; සොණෙච, බල්ලන්ද; වාරයෙ, වළකන්නේයි.

(අ) තස්මා, මෙසේ පිළිකුල් බව හෙයින්; දබ්බජාතිකෙන භික්ඛුනා, පණ්ඩිත සවභාව ඇති මහණහු විසින්; ජීවමානසරීරං වා හොතු, නොමළ සිරුරක් වුවමනාමය; මතසරීරං වා, මළසිරුරක් වුවමනාමය; යත්ථ යත්ථ, යම් යම් සිරුරෙක; (යම් යම් කොටසෙක හෝ) අසුභාකාරො පඤ්ඤායති, අශුභාකාරය පැනේද; තත්ථ තත්ථෙව, ඒ ඒ තන්හිම; නිමිත්තං ගහෙත්වා, නිමිත් ගෙන, කම්මට්ඨානං කමටහන; අප්පනං පාපෙතබ්බං; අර්පණාවට පැමිණිවිය යුතුයි.

## අසුභකම්මට්ඨාන නිද්දෙසො ඡට්ඨො.

---